# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

# වාර්ෂික වාර්තාව

# 2024

## විශ්වවිද්‍යාලයේ නිල ලංජනය

**විශ්වවිද්‍යාලයේ නිල ලාංජනය කහ පැහැති පසුබිමක වෘත්තාකාර ස්වරූපයකින් තිබෙන අතර එහි පරිවරණයෙහි ඒක කේන්ද්‍රිය වෘත්ත තුනක් එකිනෙකට සමීපව පිහිටා ඇත. මෙම වෘත්තය මධ්‍යයේ කුඩා ඒකකේනද්‍රිය වෘත්තයක නෙලුම් මලක් සටහන් වී ඇති අතර නෙලුම් මලේ එක් පෙති තට්ටුවක් යටින් තව පෙති තට්ටුවක් ආකාරයට පෙති තට්ටු දෙකක් වේ. වෘත්තය මධ්‍යයේ ඒකකේන්ද්‍රිය වෘත්ත දෙකට මැදිව මලේ කේශර පහිටා ඇත. නෙලුම් මල පිහිටි ඒකකේන්ද්‍රිය වෘත්තයන්ට පිටතින්ද ඒකකේනද්‍රිය වෘත්ත තුනට මැදිවන සේ පහතින් විශ්වවිද්‍යාලයේ නම සිංහල අක්ෂර වලින් දැක්වේ. එහි ඉහලින් පුරාණ බෞද්ධ ග්‍රන්ථයකින් උපුටාගත්**

**“ විජ්ජා උප්පතතං සෙට්ඨා ” (“සියල්ල අතරින් ප්‍රඥාව ශ්‍රේෂ්ඨය”)**

**යනුවෙන් ආදර්ශ පාඨය සඳහන් වේ.**

## විශ්වවිද්‍යාලයේ දැක්ම

**අධ්‍යාපනයෙන් ජීවිත සෞභාග්‍යවත් කිරීම**

## විශ්වවිද්‍යාලයේ මෙහෙවර

අපගේ සංස්කෘතික උරුමයන්ගෙන් හා ඥානයෙන් ප්‍රබෝධයට පත් වෙමින් අධ්‍යාපනය ඇසුරෙන් තිරසර අනාගතයක් උදෙසා ගෝලීයව සාර්ථක පුරවැසියන් නිර්මාණය කිරීම

## අපගේ අරමුණු

- ❖ අරමුණ 01: ඉගෙනීම හා අධ්‍යාපනය
- ❖ අරමුණ 02: පර්යේෂණ හා සංවර්ධනය
- ❖ අරමුණ 03: මිනිසුන්
- ❖ අරමුණ 04: යටිතල පහසුකම්
- ❖ අරමුණ 05: මූල්‍ය
- ❖ අරමුණ 06: කැපී පෙනෙන ශිෂ්‍ය අත්දැකීම්
- ❖ අරමුණ 07: යාවජීව ප්‍රජාව, සමාජ වගකීම හා ජාතික සංවර්ධනය

## අපගේ හර වටිනාකම්

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාල ප්‍රජාව විසින් කාර්යයන් සිය කාර්යයන් සාමූහිකව ඉටුකිරීමේ දී ඒ සඳහා දක්වනු ලබන කැපකිරීම අපගේ හර වටිනාකම වේ

- ❖ අධ්‍යයන විශිෂ්ටත්වය සහ කාර්ය සාධනය
- ❖ විශ්වීය ආදරය කරුණාව සහ දයාව
- ❖ නිහතමානිකම සහ අවංකභාවය
- ❖ සමාජ සංස්කෘතික හා ස්වභාවික උරුමයන් සුරක්ෂිත කිරීම
- ❖ බුද්ධිමය චින්තනයේ සහ නිර්මාණශීලීත්වයේ නිදහස
- ❖ වගවීම සහ සමාජ වගකීම

අධ්‍යාපනයෙන් ජීවිත සෞභාග්‍යවත් කිරීම

**අපගේ සංස්කෘතික උරුමයන්ගෙන් හා ඥානයෙන් ප්‍රබෝධයට පත් වෙමින් අධ්‍යාපනය ඇසුරෙන් තිරසර අනාගතයක් උදෙසා ගෝලීයව සාර්ථක පුරවැසියන් නිර්මාණය කිරීම**

<u>මූලික හරවටිනාකම</u>

- ▪ අධ්‍යයන විශිෂ්ටත්වය සහ කාර්ය සාධනය
- ▪ විශ්වීය ආදරය කරුණාව සහ දයාව
- ▪ නිහතමානිකම සහ අවංකභාවය
- ▪ සමාජ සංස්කෘතික හා ස්වභාවික උරුමයන් සුරක්ෂිත කිරීම
- ▪ බුද්ධිමය චින්තනයේ සහ නිර්මාණශීලීත්වයේ නිදහස
- ▪ වගවීම සහ සමාජ වගකීම

# උපකුලපතිතුමාගේ පණිවුඩය



ශ්‍රී ලංකාව තුළ වඩාත් කීර්තිමත් විශ්වවිද්‍යාලයක් මෙන්ම ශිෂ්‍ය සංඛ්‍යාව අතින් විශාලතම විශ්වවිද්‍යාලය ද වන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, පසුගිය වර්ෂයේ දී සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගැනීමට සමත්වී ඇත. නව වසරක් ආරම්භ කරන මෙවන් මොහොතක, ඉදිරි වසරේ කර්තව්‍යයන් සඳහා අපගේ උපරිම දායකත්වය අඛණ්ඩව යෙදවීමට හැකි වන පරිදි, පසුගිය වසර තුළ අත්පත් කරගත් දියුණුව පිළිබඳව අවලෝකනය කිරීම සඳහා මෙය සුදුසුම කාලය වේ.

2024 වසරේදී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය අධ්‍යයන ජයග්‍රහණ, පර්යේෂණ සහ ශිෂ්‍ය සංවර්ධනය යන ක්ෂේත්‍රයන්හි ආකර්ෂණීය ප්‍රගතියක් අත්කරගත්තේය. "අධ්‍යාපනය තුළින් සෞභාග්‍යමත් ජීවිතයක් උදාකර ගැනීම" යන අපගේ දැක්ම සහ "සංස්කෘතික උරුමයන්ගෙන් හා ප්‍රඥාවෙන් ආශ්වාදය ලබමින්, තිරසර අනාගතයක් සඳහා අධ්‍යාපනය තුළින් ගෝලීයව ප්‍රවීණතාවයෙන් හෙබි පුරවැසියන් බිහි කිරීම" යන අපගේ මෙහෙවර මඟ පෙන්වීම කොට ගනිමින්, ශාස්ත්‍රීය හැකියාවන්ගෙන් පමණක් නොව, අත්‍යවශ්‍ය නායකත්ව ගුණාංගවලින් සහ මෘදු කුසලතාවලින් ද සපිරි උපාධිධාරීන් බිහි කිරීම සඳහා විශ්වවිද්‍යාලය අඛණ්ඩව කැපවීමෙන් කටයුතු කර තිබේ.

කරුණු කිහිපයක් නිසාම 2024 වසර විශ්වවිද්‍යාලයට ඉතා වැදගත් වූ වසරක් විය. විශ්වවිද්‍යාලය සිය අධ්‍යයන විශිෂ්ටත්වය පවත්වා ගන්නා අතරම විෂය භාහිර ක්‍රියාකාරකම්වල ද ප්‍රගතියක් අත්කර ගැනීමට සමත් විය. එහිදී, සිසුන් 3,998 දෙනෙකුට උපාධි ප්‍රදානය කරනු ලැබූ 50 වන උපාධි ප්‍රදානෝත්සවය, විශ්වවිද්‍යාලයේ 47 වන වර්ණ ප්‍රදානෝත්සවය, වෙබොමෙට්‍රික්ස් (Webometrics) ශ්‍රේණිගත කිරීමේ ක්‍රමයට අනුව ශ්‍රී ලංකාවේ දෙවන හොඳම විශ්වවිද්‍යාලය ලෙස ශ්‍රේණිගත වීම, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ බහුකාර්ය ගොඩනැගිල්ලේ වැඩ නිම කිරීම, සහ 2024 අන්තර් විශ්වවිද්‍යාලයීය ශූරතාවලියේදී සමස්ත කාන්තා ශූරතාව, සමස්ත පිරිමි ශූරතාව සහ සමස්ත ශූරතාව දිනා ගැනීම කැපී පෙනෙන අවස්ථා විය. විශ්වවිද්‍යාලය විසින් අන්තර් විශ්වවිද්‍යාලයීය සමස්ත ශූරතාව අඛණ්ඩව සිව්වන වරටත් දිනාගැනීම විශේෂත්වයකි. ඊට අමතරව, විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පර්යේෂණ සහයෝගිතාකරුවන්ගේ සංඛ්‍යාවේ වර්ධනයක් ද පෙන්නුම් කෙරිණි.

පීඨ එකොළහක් පුරා විසිරී සිටින දාහත් දහසකට අධික සිසුන් සංඛ්‍යාවකට හැකි උපරිම ඉගෙනුම් අත්දැකීමක් ලබා දීම, යටිතල පහසුකම් අඛණ්ඩව පුළුල් කිරීම, සහ අධ්‍යයන වැඩසටහන් හා විෂය භාහිර වැඩසටහන් වැඩිදියුණු කිරීම සහතික කරමින් මේ සියල්ල සාක්ෂාත් කර ගැනීම විශ්වවිද්‍යාලයට මහත් අභිමානයට කරුණකි. මෙම ජයග්‍රහණ තුළින්, විශ්වවිද්‍යාලයේ උසස් ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහා අප දරන අඛණ්ඩ ප්‍රයත්නය මනාව පිළිබිඹු කරයි.

පසුගිය වසර දෙස ආපසු හැරී බලන විට, විශේෂයෙන්ම භෞතික යටිතල පහසුකම් සහ මූල්‍යමය ක්ෂේත්‍ර තුළ මතුවූ අභියෝග ජය ගනිමින්, විශ්වවිද්‍යාලය සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇති බව දැකීම සතුටට කරුණකි. එසේම, අපගේ සාමූහික ප්‍රයත්නය තුළින් අප තවත් ඉදිරි පියවරක් තබමින්, 2024 වසර විශ්වවිද්‍යාලයේ සාරවත් ඉතිහාසයේ සාර්ථක පරිච්ඡේදයක් බවට පත් කර ඇත. මෙම ජයග්‍රහණ, විශ්වවිද්‍යාලයේ දීප්තිමත් අනාගතය දෙස සුභවාදී බලාපොරොත්තුවකින් සහ විශ්වාසයකින් යුතුව බැලීමට අපව පොළඹවන බව 2024 වර්ෂය සඳහා වන මෙම වාර්ෂික වාර්තාවෙන් පෙන්නුම් කරයි.

මෙම වාර්තාව තුළින් විශිෂ්ටත්වය, නවෝත්පාදනය සහ සියල්ල ඇතුළත් පරිසරයක් පවත්වාගෙන යාම සඳහා අපගේ කැපවීම ඉස්මතු කරමින්, අප විසින් මේ දක්වා ලබා ඇති ප්‍රගතිය ද පිළිබිඹු කරයි. අපගේ ඉදිරි කටයුතු පවත්වාගෙන යාමේ දී, අධ්‍යාපනය සහ පර්යේෂණ ක්ෂේත්‍රවල ඉහළම ප්‍රමිතීන් පවත්වා ගැනීමට අපි කැපවීමෙන් කටයුතු කරන්නෙමු. අපගේ විශ්වවිද්‍යාලයේ සාර්ථකත්වය සඳහා තම දායකත්වය සපයන අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයට මෙන්ම කැපවීමෙන් කටයුතු කරන අපගේ සිසුකැළට ද මාගේ හෘදයාංගම කෘතඥතාව පුද කරමි. අපි එක්සත්ව, අනාගතය මනාව හැඩගස්වමින් අපගේ ජාතියට සහ ඉන් ඔබ්බට අර්ථවත් දායකත්වයක් ලබා දීමට අඛණ්ඩව කටයුතු කරමු.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එම්. එම්. පත්මලාල්
උපකුලපති
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

# පටුන

විශ්වවිද්‍යාලයේ නිල ලංජනය ........................................ I
විශ්වවිද්‍යාලයේ දැක්ම ........................................ I
විශ්වවිද්‍යාලයේ මෙහෙවර ........................................ I
අපගේ අරමුණු ........................................ II
අපගේ හර වටිනාකම් ........................................ II
උපකුලපතිතුමාගේ පණිවුඩය ........................................ III
විශ්වවිද්‍යාලය ........................................ 1
2024 වර්ෂයේ අත්කරගත් ප්‍රගතිය පිළිබඳ උපකුලපතිගේ විමසුම ........................................ 2
විශ්වවිද්‍යාලයේ පරිපාලනය ........................................ 6
2024 වර්ෂයේ විශ්වවිද්‍යාලයේ නිලධාරි මණ්ඩලය ........................................ 6
පරිපාලන ව්‍යුහය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ........................................ 7
විශ්වවිද්‍යාලයේ පාලන බල මණ්ඩල ........................................ 8
අගය නිර්මාණ ආකෘතිය ........................................ 16
ආයතනික පාලන රාමුව ........................................ 18
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආයතනික පාලනය ........................................ 18
තිරසරභාවයේ වාර්ෂික ජයග්‍රහණ – 2024 ........................................ 21
තත්ත්ව සහතික මධ්‍යස්ථානය ........................................ 29
විගණන කමිටු වාර්තාව ........................................ 39
ශිෂ්‍ය හා සම්පත් විස්තරය ........................................ 41
දේශිය සිසුන් පිළිබඳ තොරතුරු ........................................ 41
විදේශීය සිසුන්ගේ විස්තර ........................................ 43
විදේශීය ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන් ලියාපදිංචිය - 2024 ........................................ 43
විදේශීය පශ්චාත් උපාධි අපේක්ෂක සිසුන් ලියාපදිංචිය - 2024 ........................................ 43
විදේශ සිසුන්ගේ ආදායම් - 2024 ........................................ 43
නව ශිෂ්‍ය ලියාපදිංචිය ........................................ 44
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2022/2023අධ්‍යයන වර්ෂයට අදාල ව බඳවා ගත් අභ්‍යන්තර ප්‍රථම උපාධි අපේක්ෂකයින් පිළිබඳ තොරතුරු ........................................ 44
පසුගිය වසර පහ තුළ අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින්ගේ නව ලියාපදිංචි කිරීම් පිළිබඳ තොරතුරු .. 44
උපාධිධාරීන් පිළිබඳ තොරතුරුඋපාධිධාරීන් පිළිබඳ තොරතුරු - 2024 ........................................ 46
උපාධිධාරී සේවා නියුක්තිය ........................................ 47
ශිෂ්‍ය සුභසාධන පහසුකම් ........................................ 48
කාර්යය මණ්ඩල විස්තර ........................................ 50
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අයත් පීඨ ........................................ 59
මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය ........................................ 60
පීඨය විසින් පිරිනමනු ලබන උපාධි හා ඩිප්ලෝමා - 2024 ........................................ 61
යටිතල පහසුකම් සංවර්ධනය ........................................ 63
අධ්‍යාපන හා සේවා නියුක්ති කුසලතා සංවර්ධනය ........................................ 65

ඩිප්ලෝමා සහ විස්තීරණ පාඨමාලා....66
විශේෂ වැඩසටහන් ....70
සම්මන්ත්‍රණ සහ පර්යේෂණ හා සම්බන්ධ වැඩසටහන් ....71
2023 හා **2024** යන වසර වල ප්‍රතිඵල සන්සන්දනය ....81
ශිෂ්‍ය හා සම්පත් විස්තරය - **2024**....81
අධ්‍යයන කාර්යය මණ්ඩලය පිළිබඳ තොරතුරු - **2024**....82
සිදු කරන ලද පර්යේෂණ නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු - **2024** ....83
ව්‍යවහාරික විද්‍යා පීඨය ....84
පීඨය විසින් පිරිනමනු ලබන උපාධි....85
අධ්‍යාපනය හා සංවර්ධනය ....86
යටිතල පහසුකම් සංවර්ධනය ....86
**2023** හා **2024** යන වසර වල ප්‍රතිඵල සන්සන්දනය ....87
ශිෂ්‍ය හා සම්පත් විස්තරය....88
අධ්‍යයන කාර්යය මණ්ඩලය - **2024**....88
සිදු කරන ලද පර්යේෂණ නවෝත්පාදන හා ප්‍රකාශන - **2024**....89
කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා පීඨය ....90
පීඨය විසින් පිරිනමන උපාධි ,පශ්චාද් උපාධි, ඩිප්ලෝමා ,ශාස්ත්‍රපති ඩිප්ලෝමා, උසස් ඩිප්ලෝමා හා සහතිකපත්‍ර පඨමාලා - **2024**....92
ඉගෙනීම, අධ්‍යාපනය සහ සේවා නියුක්ති කුසලතා සංවර්ධනය ....93
යටිතල පහසුකම් සංවර්ධනය ....95
පර්යේෂණ හා සංවර්ධනය....96
කාර්මික සහයෝගීතාව ....98
තත්ත්ව සහතිකරණය ....101
මානව ප්‍රාග්ධන සංවර්ධනය (අධ්‍යයන, අනධ්‍යයන, ශිෂ්‍ය)....102
ප්‍රජා සේවා, සමාජ වගකීම සහ ජාතික සංවර්ධනය ....104
**2023** හා **2024** වර්ෂ වල ප්‍රතිඵල සන්සන්දනය ....105
දේශීය සිසුන් පිළිබඳ විස්තර - **2024**....106
කාර්යය මණ්ඩල විස්තරය....107
ස්ථිර අධ්‍යයන කාර්යය මණ්ඩලය ....107
පර්යේෂණ නවොත්පාදන හා ප්‍රකාශන පිළිබඳ විස්තර - **2024**....108
වෛද්‍ය විද්‍යා පීඨය ....108
පීඨය මඟින් පිරිනමන උපාධි හා පශ්චාද් උපාධි ....110
ඉගෙනීම සහ අධ්‍යාපනය ....111
පර්යේෂණ සහ සංවර්ධන....111
යටිතල පහසුකම් සංවර්ධනය ....112
**2023** හා **2024** වසර වල ප්‍රතිඵල සැසඳීම ....114
ශිෂ්‍ය හා සම්පත් විස්තරය **2024** ....114
දේශිය ශිෂ්‍ය විස්තරය **2024** ....115
අධ්‍යයන කාර්යය මණ්ඩලය ....115

අනධ්‍යයන කාර්යය මණ්ඩලය ....................116
පර්යේෂණ නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු - 2024 ....................116
පශ්චාද් උපාධි පීඨය ....................117
පීඨය විසින් පිරිනමනු ලබන අධ්‍යයන වැඩසටහන් ....................117
**2024.12.31** දිනට පශ්චාත් උපාධි ශිෂ්‍යයින් පිළිබඳ තොරතුරු ....................119
පර්යේශන සහ ප්‍රකාශන ....................123
බහු-විෂයාත්මක ප්‍රවේශයන් පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය ....................123
උපාධි අධ්‍යයන පීඨයේ ජර්නලය ....................124
පීඨයේ තත්ත්ව සහතිකකරණ ඒකකය ....................124
තාක්ෂණ පීඨය ....................125
පීඨය විසින් පිරිනමනු ලබන උපාධි සහ ඩිප්ලෝමා ....................127
අධ්‍යාපනය හා සංවර්ධනය ....................128
පර්යේෂණ සහ සම්මන්ත්‍රණ ....................128
කාර්ය මණ්ඩල පර්යේෂණ ....................130
අධ්‍යාපනය සහ රැකියා නිපුණතා සංවර්ධනය ....................131
2023 හා 2024 වසර වල ප්‍රතිඵල සැසඳීම ....................131
ශිෂ්‍ය සම්පත් විස්තරය 2024 ....................132
අධ්‍යයන කාර්යය මණ්ඩලය ....................132
පර්යේෂණ නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු - 2024 ....................132
ඉන්ජිනේරු පීඨය ....................133
පීඨය මඟින් ප්‍රදානය කරනු ලබන උපාධි ....................133
**2023** හා **2024** වසර වල ප්‍රතිඵල සැසඳීම ....................134
ශිෂ්‍ය සම්පත් විස්තරය ....................134
දේශිය සිසුන් පිළිබඳ විස්තරය ....................135
අධ්‍යයන කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තරය ....................135
පර්යේෂණ නවොත්පාදන හා ප්‍රකාශන පිළිබඳ විස්තර - 2024 ....................135
සම සෞඛ්‍ය විද්‍යා පීඨය ....................136
පීඨය මගින් පිරිනමනු ලබන උපාධි පාඨමාලා ....................136
පර්යේෂණ හා ප්‍රකාශන ....................137
ශිෂ්‍ය හා සම්පත් විස්තරය 2024 ....................137
දේශිය සිසුන් පිළිබඳ විස්තරය ....................138
අධ්‍යයන කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තරය 2024 ....................138
පර්යේෂණ නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු - 2024 ....................138
දන්ත වෛද්‍ය විද්‍යා පීඨය ....................139
පීඨය මඟින් පිරිනමනු ලබන උපාධි ....................140
පර්යේෂණ නවොත්පාදන හා ප්‍රකාශන පිළිබඳ විස්තර - 2024 ....................140
නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨය ....................141
පීඨය මඟින් පිරිනමනු ලබන උපාධි ....................141
අධ්‍යයන වැඩසටහන් ....................142

පර්යේෂණ හා බාහිර ක්‍රියාකාරකම් ....................................................................................142
ජාත්‍යන්තර සහයෝගිතා ........................................................................................................142
ප්‍රජාව/සමාජයීය වගකීම හා ජාතික දායකත්වය ...................................................................143
පර්යේෂණ නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ විස්තර - 2024 ................................................143
පරිගණක පීඨය .............................................................................................. 144
පීඨය විසින් පිරිනමනු ලබන උපාධි ......................................................................................145
ඉගෙනුම්, අධ්‍යාපන සහ සේවා නියුක්ති කුසලතා සංවර්ධනය ...................................................145
යටිතල පහසුකම් සංවර්ධනය .............................................................................................146
කර්මාන්ත සහයෝගිතා .......................................................................................................147
පර්යේෂණ සහ සංවර්ධන .....................................................................................................150
ශිෂ්‍ය හා සම්පත් විස්තරය 2024 ...........................................................................................151
පර්යේෂණ නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ විස්තර - 2024 ................................................152
ශාරීරික අධ්‍යාපන අංශය ..................................................................................... 153
තොරතුරු තාක්ෂණ සේවා මධ්‍යස්ථානය ................................................................ 164
පුස්තකාලය .................................................................................................... 166
බාහිර උපාධි සහ විස්තීරණ පාඨමාලා ඒකකය ......................................................... 168
විශ්වවිද්‍යාල වෛද්‍ය මධ්‍යස්ථානය ........................................................................ 176
පර්යේෂණ සභාව .............................................................................................. 178
වාර්ෂික ගිණුම් වාර්තා ...................................................................................... 186
2024 වර්ෂයේ පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තරය ..............................................................186
මූල්‍ය කාර්ය සාධන විශ්ලේෂණය - පීඨය ශිෂ්‍ය අනුව 2024 (උපාධි නොලත් අභ්‍යන්තර සිසුන්) ........187
ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර 2021 - 2024 .......................................................................187
මූල්‍ය කාර්යය සාධන විශ්ලේෂණය - 2024 ............................................................................188
පෙර වසර 05 තුල කැපී පෙනෙන මූල්‍යමය අවස්ථා (අගයන් රුපියල් වලින් දක්වා ඇත රු.'000) ....188
පෙර වසර 05 තුල කැපී පෙනෙන මූල්‍යමය අවස්ථා (අගයන් රුපියල් වලින් දක්වා ඇත රු.'000) ....188
පෙර වසර 05 තුල කැපී පෙනෙන මූල්‍යමය අවස්ථා (අගයන් රුපියල් වලින් දක්වා ඇත රු.'000) ....189
දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය ...........................190
මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය 2024 දෙසැම්බර් ....................................................................192
ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීමේ ප්‍රකාශනය- 2024 ....................................................................194
2024.12.31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය ........................................196
සටහන් ..............................................................................................................................221
2024.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව ................................ 259
මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු .................................... 267

# විශ්වවිද්‍යාලය



කොළඹ නගර මධ්‍යයේ පිහිටි ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය දීර්ඝ හා කීර්තිමත් ඉතිහාසයකට හිමිකම් කියයි. 1959 දී ගංගොඩවිල ආරම්භ කළ එහි මූලාරම්භය 1873 දී අතිපූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන් විසින් මාලිගාකන්දේ ස්ථාපිත කරන ලද විද්‍යෝදය පිරිවෙන දක්වා දිව යයි. අද විශ්වවිද්‍යාලය වසර 65 ක ඉතිහාසය පසුකරන අතරම වසර 151 ක ගමනට උපහාර පුදකරයි.

ශ්‍රී ලාංකේය අධ්‍යාපනයේ පුනර්ජීවනයේ හරය වූයේ විද්‍යෝදය පිරිවෙන නමින් අතීතයේ හැඳින්වූ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයි. එය ශ්‍රී ලංකාවේ දෙවන පැරණිතම විශ්වවිද්‍යාලය වන අතර ස්වාධීන ලංකාවේ ස්ථාපිත ප්‍රථම විශ්වවිද්‍යාලය වේ.

අද විශ්වවිද්‍යාලය පීඨ නවයකින් සමන්විත වේ, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, ව්‍යවහාරික විද්‍යා පීඨය, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය, වෛද්‍ය විද්‍යා පීඨය, පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයකින්ද ශක්තිමත්ව පවතී. තාක්ෂණ පීඨය, ඉංජිනේරු පීඨය, සම සෞඛ්‍ය විද්‍යා පීඨය සහ එහි නවතම එකතු කරන ලද දන්ත වෛද්‍ය පීඨයකින්ද ශක්තිමත්ව පවතී. විශ්වවිද්‍යාලය උපාධි අපේක්ෂකයින් 17,000 කට අධික සංඛ්‍යාවක් සහ පශ්චාත් උපාධි සිසුන් 4000 කට අධික සංඛ්‍යාවකට නිවහන වේ. එය ශ්‍රී ලංකාවේ ශිෂ්‍ය ජනගහනය අනුව විශාලතම විශ්වවිද්‍යාලය ලෙස සැලකේ.

තවද විශ්වවිද්‍යාලය පර්යේෂණ මධ්‍යස්ථාන 22කට අධික සංඛ්‍යාවකින් යුත් පර්යේෂණ සභාවක් සහ 50කට අධික ව්‍යවසායකයින් සහ පාර්ශවකරුවන් 15කට අධික පේටන්ට් බලපත්‍ර සහිත නව නිපැයුම්, නවෝත්පාදන සහ ව්‍යාපාර නිර්මාණ කවුන්සිලයක් සමඟින් පර්යේෂණ හා නවෝත්පාදනයන් අතින්ද ඉදිරියෙන්ම සිටී.

විශ්වවිද්‍යාලය බොහෝ ජාත්‍යන්තර අධ්‍යාපන ආයතන සමඟ සුහද සබඳතාවක් පවත්වා ඇති අතර පිළිගත් ජාත්‍යන්තරව පිළිගත් විශ්වවිද්‍යාල සමඟ අවබෝධතා ගිවිසුම් (MoUs) 60 කට අධික ප්‍රමාණයක් අත්සන් කර ඇත. තවද ස්ථාපිත ජාත්‍යන්තර සහ දේශීය සමාගම් සමඟ අවබෝධතා ගිවිසුම් 60කට අධික ප්‍රමාණයක් අත්සන් කර ඇත. එමෙන්ම විශ්වවිද්‍යාලය තම සිසුන්ට ජාත්‍යන්තර අත්දැකීමක් ලබා දීමට උත්සාහ කරන අතර, ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් සහ සීමාවාසික පුහුණුව ලබා දෙයි.

වසර ගණනාවක් පුරා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සිය නිම් වළලු පුළුල් කරමින් බොහෝ ක්ෂේත්‍රවල සංවර්ධනයට සමත් වී ඇත. එය අපගේ මාතෘභූමියේ සංවර්ධනයට උපකාරී වන බුද්ධිමත්, කාර්යක්ෂම, දක්ෂ සහ වෘත්තීය පුද්ගලයින් බිහි කිරීම සහතික කරන බොහෝ සන්ධිස්ථාන කරා ළඟා වීමේ මෙම ගමන දිගටම කරගෙන යනු ඇත.

# 2024 වර්ෂයේ අත්කරගත් ප්‍රගතිය පිළිබඳ උපකුලපතිගේ විමසුම

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ රාජ්‍ය විශ්වවිද්‍යාලයක් ලෙස ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සිය විශ්වවිද්‍යාලීය සාරවත් ඉතිහාසයේ තවත් එක් සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් 2024 වසර ඉතා සාර්ථකව නිමා කර ඇත. විශ්වවිද්‍යාලයේ උපකුලපති, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පත්මලාල් එම්. මානගේ මහතාගේ නායකත්වයෙන් යුත් අධ්‍යයන කාර්ය මණ්ඩලය, අනධ්‍යයන කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍ය ප්‍රජාව මෙම වසරේදී විශිෂ්ට ජයග්‍රහණ රැසක් අත්කර ගත්හ.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය වනාහි දාහත් දහසකට අධික ශිෂ්‍ය සංඛ්‍යාවකින් සමන්විත ශිෂ්‍ය ගහණය අතින් මෙරට විශාලතම විශ්වවිද්‍යාලය වේ. විවිධ අභියෝග මධ්‍යයේ වුවද 2024 වසරේදී විශ්වවිද්‍යාලය ශිෂ්‍යයින් 17,135 දෙනෙකුට අධ්‍යයන අවකාශ සලසමින්, රටේ ප්‍රගතියට දායක වෙමින්, තරුණ පරපුරට ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීමේ සිය අසමසම වගකීම විශ්වවිද්‍යාලය යළි තහවුරු කළේය. 2023 වසරේ සිටි 16,215 ක ශිෂ්‍ය සංඛ්‍යාව හා සැසඳීමේ දී මෙය සැලකිය යුතු වර්ධනයකි. තවද, විශ්වවිද්‍යාලයේ වර්ධනය පිළිබිඹු කරමින්, ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව 733 සිට 2024 දී 754 දක්වා ඉහළ ගියේය. ඊට අමතරව, 2024 වසර අවසන් වන විට, බාහිර උපාධි අපේක්ෂකයෝ 50,171 ක් සහ පශ්චාත් උපාධිධාරීහු 4,442 ක් විශ්වවිද්‍යාලය තුළ අධ්‍යාපනය ලබමින් සිටියහ.

පීඨ 11 කින් සමන්විත ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය 2024 ජනවාරි 1 වන දින සිය කටයුතු ආරම්භ කළේය. සෑම පීඨයක්ම නානාකාරවූ ශිෂ්‍ය ප්‍රජාවකට සේවා සපයමින් පුළුල් පරාසයක අධ්‍යයන වැඩසටහන් ඉදිරිපත් කරයි. විශ්වවිද්‍යාලයේ පැරණිතම පීඨය වන මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය 1959 දී ආරම්භ කරන ලද අතර, ඉන් අනතුරුව 1961 දී ව්‍යවහාරික විද්‍යා පීඨය සහ 1972 දී කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය ස්ථාපිත කරන ලදී. වෛද්‍ය ක්ෂේත්‍රය දක්වා ව්‍යාප්ත වෙමින්, 1993 දී වෛද්‍ය විද්‍යා පීඨය ද, අනතුරුව පශ්චාත් උපාධි අධ්‍යාපනයට සහාය වීම සඳහා 1996 දී පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය ද ස්ථාපිත කෙරිණි. මෑත වසරවලදී, තාක්ෂණික හා ඉංජිනේරුමය ක්ෂෙත්‍රවල ඇතිවූ අභිවෘද්ධියත් සමඟ 2016 වර්ෂයේ දී ඉංජිනේරු පීඨය සහ තාක්ෂණවේද පීඨය පිහිටුවන ලදී. සෞඛ්‍ය සේවා වෘත්තිකයන් සඳහා පවතින ඉහළ ඉල්ලුම හඳුනා ගනිමින්, 2018 දී සම සෞඛ්‍ය විද්‍යා පීඨය ආරම්භ කරන ලදී. 2023 දී හඳුන්වා දුන් නවතම ව්‍යාප්ත කිරීම් ලෙස දන්ත වෛද්‍ය විද්‍යා පීඨය, නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨය, සහ පරිගණක පීඨය ඇතුළත් වන අතර, විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රීය වැඩසටහන් විවිධාංගීකරණය කිරීමට ඇති කැපවීම එමගින් මනාව පිළිබිඹු කරයි . මෙම වර්ධනයන්, අධ්‍යාපනය සහ පර්යේෂණ යන දෙඅංශයෙන්ම රටේ ඉහළම විශ්වවිද්‍යාලයක් ලෙස සිය ස්ථානය පවත්වා ගැනීමට විශ්වවිද්‍යාලයට උපකාරී වී ඇත.

විශ්වවිද්‍යාලයේ විශිෂ්ටත්වය යළි තහවුරු කරමින්, වෙබොමෙට්‍රික්ස් (Webometrics) ශ්‍රේණිගත කිරීම 2024 ට අනුව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ආයතන අතර සිය දෙවන ස්ථානය පවත්වා ගැනීමට සමත් විය. මෙම ජයග්‍රහණය අධ්‍යයන කාර්ය මණ්ඩලය, සිසුන් සහ පරිපාලන කාර්ය මණ්ඩලයේ පුළුල් පර්යේෂණ දායකත්වය සහ කැපවීම තුළින් ලබාගත හැකි විය.

2024 වසර අවසන් වන විට ශාස්ත්‍රීය වර්ධනය සහ ආයතනික සංවර්ධනය සහතික කරමින් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පීඨ, ඒ ඒ ක්ෂේත්‍රවල සම්භාවනීය විශේෂඥයින් විසින් මෙහෙයවනු ලැබීය. මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ පීඨාධිපති ලෙස මහාචාර්ය ශිරන්ත හීන්කෙන්ද මහතා කටයුතු කළ අතර ව්‍යවහාරික විද්‍යා පීඨය මහාචාර්ය උපුල් සුභසිංහ මහතා විසින් මෙහෙයවන ලදී. කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය ආචාර්ය දූෂාන් ජයවික්‍රම මහතාගේ මඟ පෙන්වීම යටතේ පැවති අතර, වෛද්‍ය විද්‍යා පීඨය මහාචාර්ය මනෝරි ගමගේ මහත්මිය විසින් මෙහෙයවන ලදී. උපාධි අධ්‍යයන පීඨයේ ප්‍රධානියා ලෙස මහාචාර්ය රසික පෙරේරා මහතා කටයුතු කළ අතර, තාක්ෂණවේද පීඨය මහාචාර්ය ඒ.එල්.ආර්.එච්. නිල්මිණි මහත්මිය විසින් මෙහෙයවන ලදී. ඉංජිනේරු පීඨය ආචාර්ය නිශාන් ධර්මවීර මහතා විසින් ද, සම සෞඛ්‍ය විද්‍යා පීඨය මහාචාර්ය ඩී.අයි. උළුවඩුගේ මහතා විසින් ද මෙහෙයවන ලදී. දන්ත වෛද්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රයේ, දන්ත වෛද්‍ය විද්‍යා පීඨය ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුරංගි ජී. යසවර්ධන මහත්මිය විසින් ද, නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨය ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ප්‍රදීප් ජයවීර මහතා විසින් ද මෙහෙයවන ලදී. අවසාන වශයෙන්, පරිගණක පීඨය මහාචාර්ය ප්‍රසාද් එම්. ජයවීර මහතාගේ නායකත්වය යටතේ පැවතුණි. මෙම කීර්තිමත් විද්වතුන් පිරිස තම පීඨ තුළ නවෝත්පාදනය, පර්යේෂණ සහ ශාස්ත්‍රීය විශිෂ්ටත්වය අරභයා කටයුතු මෙහෙයවීමේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළ අතර, විශ්වවිද්‍යාලයේ කීර්තියට සැලකිය යුතු දායකත්වයක් ලබා දුන්හ.

පීඨ 11 ට අමතරව, කළමනාකරණ ක්ෂේත්‍රයේ වෘත්තිකයන්ගේ වෘත්තීය දියුණුවට පහසුකම් සැලසීමේ අරමුණින් යුතුව, කළමනාකරණය පිළිබඳ උසස් අධ්‍යාපනය ලබා දෙන කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය (PIM) ද විශ්වවිද්‍යාලයට ඇතුළත් ආයතනයකි. කළමනාකරණ සහ පරිපාලන අධ්‍යයනයේ විවිධ අංශයන්ට අදාළව පශ්චාත් උපාධි උපදෙස්, පුහුණුව, පර්යේෂණ සහ සංවර්ධනය ලබා දෙමින් ශ්‍රී ලංකාව පුරා කළමනාකරණ අධ්‍යාපනය සහ වෘත්තීයභාවය ඉහළ නැංවීම සඳහා එම ආයතනය කැපවීමෙන් කටයුතු කරයි. එය වෘත්තීය කළමනාකරණ අධ්‍යාපනය සහ පුහුණුව පිළිබඳ ජාතික අවශ්‍යතා ඉටු කරමින්, ජ්‍යෙෂ්ඨ මට්ටමේ කළමනාකරුවන් සහ පරිපාලකයින් දහස් ගණනකට සාර්ථක වීමට අවශ්‍ය දැනුම හා කුසලතා ලබා දෙයි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, වඩා හොඳ ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම සඳහා තම සිසුන්ට අති නවීන පහසුකම් සැපයීමට ඇප කැපවී කටයුතු කරයි. එහි පහසුකම් වැඩිදියුණු කිරීමට සහ ශාස්ත්‍රීය වර්ධනයට සහාය වීම සඳහා, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය (FHSS), කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය (FMSC), ඉංජිනේරු පීඨය (FoE) සහ ආසාත්මිකතා විද්‍යා හා ප්‍රතිශක්ති විද්‍යා ආයතනය (IAI) සඳහා බහුකාර්ය ගොඩනැගිලි ඉදිකිරීම 2024 ට පෙර ආරම්භ කරන ලදී. මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයට එක්වූ නවතම ගොඩනැගිල්ල වන බහුකාර්ය ගොඩනැගිල්ලේ වැඩ නිමවා 2024 දී සිසුන් සඳහා නිල වශයෙන් විවෘත කරන ලද අතර, අනෙකුත් ව්‍යාපෘති තුන 2025 පළමු කාර්තුවේදී නිම කිරීමට නියමිතය. 2025 දී ස්ථාපිත කිරීමට නියමිත ආසාත්මිකතා විද්‍යා හා ප්‍රතිශක්ති විද්‍යා ආයතනය, ශ්‍රී ලංකාවේ ආසාත්මිකතා සහ ප්‍රතිශක්ති විද්‍යා අධ්‍යාපනයේ සහ පර්යේෂණවල සැලකිය යුතු දියුණුවක් ඇති කරයි. 2024 වන විට එහි ඉදිකිරීම්වලින් 80%ක් අවසන් කර, පූර්ණ රාජ්‍ය අයවැය අනුමැතිය ලබාගෙන ඇති මෙම ආයතනය, ආසාත්මිකතා සහ ප්‍රතිශක්ති විද්‍යාව පිළිබඳ විශේෂිත වැඩසටහන් පිරිනැමීම සඳහා බිහිවූ වූ මෙරට පළමු සහ එකම ආයතනය වනු ඇත. මෙම පුරෝගාමී කර්තව්‍යයන්, මෙම වැදගත් ක්ෂේත්‍රවල වෛද්‍ය අධ්‍යාපන, පර්යේෂණ සහ රෝගී

සත්කාර කටයුතු විප්ලවීය වෙනසකට ලක් කරනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, එය ජාතියේ සෞඛ්‍ය සේවා සහ විද්‍යාත්මක සංවර්ධනයේ සන්ධිස්ථානයක් වනු ඇත.

නිසැකයෙන්ම විශ්වවිද්‍යාලය අධ්‍යයන ක්ෂේත්‍රයේ පෙරමුණේ සිටින අතර ඒ බව යළි තහවුරු කරමින්, 2024 වසරේදී, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය ශිෂ්‍යයෙකු වන දිනුල් දොළුවීර, 2016/17 අධ්‍යයන වර්ෂය සඳහා වූ MBBS උපාධිධාරීන්ගේ ජාතික කුසලතා අනුපිළිවෙළ ලැයිස්තුවේ ප්‍රථම ස්ථානය දිනා ගත්තේය. ඔහුගේ සුවිශේෂී දක්ෂතාව, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ පවතින උසස් වෛද්‍ය අධ්‍යාපන ප්‍රමිතීන් මනාව පිළිබිඹු කරයි.

ජාත්‍යන්තර සහයෝගිතා සහ හවුල්කාරිත්වයන් සම්බන්ධයෙන් 2024 වසර විශ්වවිද්‍යාලය සඳහා තවත් සුවිශේෂී කාල පරිච්ඡේදයක් සනිටුහන් කළේය. විශ්වවිද්‍යාලයේ ගෝලීය පැවැත්ම තවදුරටත් ශක්තිමත් කරමින් සහ අධ්‍යයන සහ පර්යේෂණ සහයෝගීතාව ප්‍රවර්ධනය කරමින් ප්‍රධාන වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. අධ්‍යාපනික හා සංස්කෘතික හුවමාරුව වැඩිදියුණු කිරීම අරමුණු කරගත් උපායමාර්ගික ක්‍රියාකාරකමක් වන සේද මාවත අධ්‍යයන ආයතනය ඒකාබද්ධව ස්ථාපිත කිරීම විශ්වවිද්‍යාලය තුළ වූ වැදගත් වර්ධනයන් අතර විය. ඊට අමතරව, චීනයේ Zhejiang Shuren විශ්වවිද්‍යාලය සමඟ සහයෝගයෙන්, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය තුළ ජාත්‍යන්තර චීන භාෂා අධ්‍යාපන ප්‍රධාන විෂය සඳහා සීමාවාසික පුහුණු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම මගින් අධ්‍යයන සහයෝගීතාව තවදුරටත් ඉදිරියට ගෙන යාම සඳහා විශ්වවිද්‍යාලයට ඇති කැපවීම අවධාරණය කළේය. වාග්විද්‍යාමය හා සංස්කෘතික අධ්‍යයනයන් තවදුරටත් පුළුල් කරමින්, රුසියාවේ Ural රාජ්‍ය ආර්ථික විද්‍යා විශ්වවිද්‍යාලය සමඟ සහයෝගයෙන්, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය තුළ රුසියානු භාෂා මධ්‍යස්ථානයක් ස්ථාපිත කරන ලදී. රුසියානු භාෂාවෙන් අධ්‍යයන කටයුතු සිදුකිරීමට උනන්දුවක් දක්වන අභ්‍යන්තර සහ බාහිර සිසුන්ගේ භාෂා ප්‍රවීණතාව සහ සාක්ෂරතාවය වැඩිදියුණු කිරීම මෙම මධ්‍යස්ථානයේ ස්ථාපිත කිරීමේ අරමුණ විය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විශ්වවිද්‍යාලය, චීනයේ Zhejiang Shuren විශ්වවිද්‍යාලය සමඟ එක්ව, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය තුළ ආයෝජන, ඩිජිටල් වෙළෙඳාම සහ ව්‍යවසායකත්වය සඳහා වූ මධ්‍යස්ථානය (CIDE) ස්ථාපිත කළේය. මෙම ප්‍රයත්නය තුළින් දෙරටේම සංවර්ධන අරමුණු සමඟ අනුකූල වන සහයෝගී පර්යේෂණ දිරිමත් කරන අතරම එමගින් ආයෝජන, ඩිජිටල් වෙළෙඳාම සහ ව්‍යවසායකත්වය පිළිබඳ මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. තවද, චීනයේ Zhejiang Shuren විශ්වවිද්‍යාලය සමඟ එක්ව, ව්‍යවහාරික විද්‍යා පීඨය තුළ පාරිසරික නිරාවරණය සහ සෞඛ්‍යය පිළිබඳ ජාත්‍යන්තර ඒකාබද්ධ පර්යේෂණාගාරයක් ස්ථාපිත කිරීම තුළින් විශ්වවිද්‍යාලය පාරිසරික පර්යේෂණ සඳහා වැදගත් පියවරක් තැබීය. මෙම පර්යේෂණාගාරය, විශ්වවිද්‍යාල දෙකෙහිම ආයතනික සංවර්ධනය සඳහා සහාය වන අතරම පාරිසරික නිරාවරණය සහ සෞඛ්‍ය අධ්‍යයනයන්හි ශාස්ත්‍රීය දියුණුවක් ඇති කරමින්, ඒකාබද්ධ පර්යේෂණ ව්‍යාපෘති සහ ඒවායේ භාවිතයන් සඳහා පහසුකම් සැලසීම අරමුණු කරයි.

තවද, විශ්වවිද්‍යාලය අධ්‍යයන අංශයෙන් පමණක් නොව, විෂය බාහිර ක්‍රියාකාරකම්වලින් ද සුවිශේෂී වන බව ඔප්පු කරමින්, 2024 දී තවත් සන්ධිස්ථානයකට ළඟා විය. ඒ අනුව, 2024 අන්තර් විශ්වවිද්‍යාලයීය ශූරතාවලියේදී සමස්ත කාන්තා ශූරතාව සහ සමස්ත පිරිමි ශූරතාව දිනා ගැනීමට විශ්වවිද්‍යාලය සමත් විය.

තවද, විශ්වවිද්‍යාලය අඛණ්ඩව සිව්වන වරටත් 2024 අන්තර් විශ්වවිද්‍යාලයීය සමස්ත ශූරතාව ද දිනා ගත්තේය. මෙය ශාස්ත්‍රීය ක්ෂේත්‍රයෙන් ඔබ්බට විශ්වවිද්‍යාලයේ ප්‍රමුඛත්වය ඉස්මතු කරන තවත් ජයග්‍රහණයකි. 2023 වසරේ ජාතික හා ජාත්‍යන්තර තලයේ සුවිශේෂී දක්ෂතා දැක්වූ විශ්වවිද්‍යාලයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් අගයමින්, විශ්වවිද්‍යාලීය 47 වන වර්ණ ප්‍රදානෝත්සවය 2024 මාර්තු 27 වන දින අභිමානවත් ලෙස පවත්වන ලදී. එම අවස්ථාවේදී, විවිධ ක්‍රීඩා විෂයයන් ඔස්සේ සුවිශේෂී කැපවීමක් සහ දක්ෂතාවක් විදහා පෑ දක්ෂතාපූර්ණ සම්මානලාභීන් 502 දෙනෙකුගේ විශිෂ්ට ජයග්‍රහණ ඇගයීමට ලක්විය. ඔවුන් අතරින් 37 දෙනෙකු දක්ෂතම ක්‍රීඩකයන් ලෙස ගෞරවයට පාත්‍ර වූ අතර, 28 දෙනෙක් ක්‍රීඩාවට දැක්වූ සුවිශේෂී දායකත්වය වෙනුවෙන් විශේෂ සම්මාන ලබා ගත්හ.

වසර අවසානයේදී, විශ්වවිද්‍යාලයේ අතිශය අලංකාරවත් සහ විචිත්‍රවත් උත්සවය වන උපාධි ප්‍රදානෝත්සවය පැවැත්විණි. විශ්වවිද්‍යාලයේ 50 වන උපාධි ප්‍රදානෝත්සවය සනිටුහන් කළ මෙම වසර වශ්වවිද්‍යාලයට විශේෂයෙන් වැදගත් වර්ෂයක් විය. මෙම උත්සවය 2024 ඔක්තෝබර් 28 සිට 30 දක්වා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වුණු අතර, එහිදී සිසුන් 3,998 දෙනෙකුට උපාධි ප්‍රදානය කරන ලදී. මෙම මහා මංගල්‍යයේදී උපාධි අපේක්ෂකයින් 3,631 දෙනෙකුට, පශ්චාත් උපාධිධාරීන් 339 දෙනෙකුට සහ ආචාර්ය උපාධිධාරීන් 28 දෙනෙකුට උපාධි පිරිනමන ලදී.

විශ්වවිද්‍යාලය තුළ විවිධ ක්ෂේත්‍රයන්හි ජයග්‍රහණ, අභිවෘද්ධිය සහ විවිධ සාර්ථකත්වයන් සනිටුහන් කිරීමට සමත් වූ බැවින් 2024 වසර ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සඳහා ස්වර්ණමය වසරක් ලෙස සැලකිය හැකිය. මූල්‍ය හා භෞතික සීමාවන් ඇතුළු අභියෝගවලට මුහුණ දීමට සිදුවූයේ වුවද, විශ්වවිද්‍යාලය මතකයෙන් ගිලිහී නොයන සාර්තක වසරක් පසුකර ඇත. මෙම සාර්ථකත්වය අධ්‍යයන කාර්ය මණ්ඩලයේ, අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහ ශිෂ්‍ය ප්‍රජාවගේ සාමූහික ප්‍රයත්නයේ ප්‍රතිඵලයකි. පසුගිය වසර විශ්වවිද්‍යාලයට අපූර්වත්වයක් එක්කළ සාර්ථක වසරක් වූ බැවින්, ඉදිරි වසර ඊටත් වඩා සාර්ථක සහ ඵලදායී වසරක් වනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි. මෙම විශ්වවිද්‍යාලය මෙරට රාජ්‍ය විශ්වවිද්‍යාල අතර ඉහළම ස්ථානයට ගෙන යමින්, විශිෂ්ටත්ව ළඟාකර ගැනීම සඳහා අඛණ්ඩව ප්‍රයත්න දැරීමට සමස්ත විශ්වවිද්‍යාල ප්‍රජාවට අවශය ශක්තිය, ධෛර්යය, අධිෂ්ඨානය ලැබේවායි මම ප්‍රාර්ථනා කරමි.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එම්. එම්. පත්මලාල්
උපකුලපති


## 2024 වර්ෂයේ විශ්වවිද්‍යාලයේ නිලධාරි මණ්ඩලය

| | |
|---|---|
| කුලපති | ඉත්තෑපානේ ධම්මාලංකාර මහ නායක නාහිමි |
| උප කුලපති | ජ්‍යෙෂ්ඨ මහාචාර්යය එම්.එම්.පත්මලාල් මහතා |

**පීඨාධිපතින්**

| | |
|---|---|
| මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨ | මහාචාර්යය එස්.සී.බී.හීන්කෙන්ද මහතා |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | මහාචාර්යය එස්.එම්.සී.යූ.පී. සුභසිංහ මහතා |
| කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | ආචාර්යය ජේ.ඩබ්ලිව්.ඩී වාමින්ද මහතා |
| වෛද්‍ය විද්‍යා පීඨය | මහාචාර්යය එම්.ඒ.එම්.එන් ගමගේ මහත්මිය |
| පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය | මහාචාර්යය පී.පී.ආර්.පෙරේරා |
| ඉන්ජිනේරු පීඨය | ආචාර්යය එම්.එන්.ධර්මවීර |
| තාක්ෂණ පීඨය | මහාචාර්යය ඒ.එච්.එල්.ආර්. නිල්මිණි මහත්මිය |
| සම සෞඛ්‍ය පීඨය | මහාචාර්යය ඩී.අයි.උළුවඩුගේ මහත්මිය |
| දන්ත වෛද්‍ය විද්‍යා පීඨය | ජ්‍යෙෂ්ඨ මහාචාර්යය එස්.ජී.යසවර්ධන මහත්මිය |
| නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨය | ජ්‍යෙෂ්ඨ මහාචාර්යය පී.පී.එම් ජයවීර මහතා |
| පරිගණක පීඨය | මහාචාර්යය ප්‍රසාද් එම්. ජයවීර |

| | |
|---|---|
| ලේඛකාධිකාරී | ඩබ්ලිව්.එම්.ආර්.ඒ.බී. වැලිවිට මහතා |
| පුස්තකාලාධිපති | අචාර්යය ඩබ්ලිව්.ඩී.ඒ.එන්.ඩී. විජයසුන්දර මහත්මිය |
| මූල්‍යාධිකාරී | කේ.ටී.සී.ප්‍රියංගනි මහත්මිය |




| | | | | |
|---|---|---|---|---|
| **PIM** | පශ්චාද් උපාධි කළමනාකරණ ආයතනය | | **FUAB** | නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨය |
| **FHSS** | මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය | | **FOC** | පරිගණක පීඨය |
| **FAS** | ව්‍යවහාරික විද්‍යා පීඨය | | **DR** | නියෝජ්‍ය ලේඛකාධිකාරී |
| **FMSC** | කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | | **SAR** | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී |
| **FMS** | වෛද්‍ය විද්‍යා පීඨය | | **AR** | සහකාර ලේඛකාධිකාරී |
| **FGS** | පශ්චාද් උපාධි පීඨය | | **DB** | නියෝජ්‍ය මූල්‍යාධිකාරී |
| **FT** | තාක්ෂණ පීඨය | | **SAB** | ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී |
| **FE** | ඉන්ජිනේරු පීඨය | | **SAL** | ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලායාධිපති |
| **FAHS** | සම සෞඛ්‍ය පීඨය | | **AL** | සහකාර පුස්තකාලායාධිපති |
| **FOD** | දන්ත වෛද්‍ය පීඨය | | | |

**පාලක සභාව**

1985 අංක 7 දරන විශ්වවිද්‍යාල සංශෝධන පනත මගින් සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ VII වැනි වගන්තියේ 44 වැනි ඡේදය යටතේ විශ්වවිද්‍යාල සභාව 2023 වර්ෂයේදී පහත සඳහන් සමාජිකයිනගෙන් සමන්විත විය.

**නිල බලයන්**

උපකුලපති (සභාපති)



ජ්‍යෙෂ්ඨ මහාචාර්යය එම්.එම්.පත්මලාල් මහතා
Ph.D. (Japan)
B. Sc. (USJP), M.Sc. (Japan)

**ලේඛකාධිකාරී (ලේකම්)**



ඩබ්ලිව්.එම්.ආර්.ඩබ්ලිව්. වැලිවිට මහතා
B.Sc. (USJP) M.Sc. (USJP)
MAAT

## පීඨාධිපතිවරුන්

### මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය



මහාචාර්යය එස්.සී.බී.හීන්කෙන්ද
BA (Hons); PGD in Statistics (USJ);
MSSc (Kelaniya); MA (GRIPS-Tokyo);
Ph.D. (Nagoya)

### ව්‍යවහාරික විද්‍යා පීඨය



මහාචාර්යය එස්.එම්.සී.යු.පී.සුබසිංහ
B.Sc. (USJP), Ph.D. (Wales)
C.I. Biol (Sri Lanka)

### කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා



ආචාර්යය ජේ.ඩබ්ලිව්.ඩී වාමින්ද මහතා
B.Sc in Marketing (Special) (SJP)
MSc (SJP), Ph.D. (Australia)

### වෛද්‍ය විද්‍යා පීඨය පීඨය



මහාචාර්යය එම්.ඒ.එම්.එන් ගමගේ මහත්මිය
MD (Paediatrics) & DCH (COL)

### පශ්චාද් උපාධි පීඨය



මහාචාර්යය පී.පී.ආර් පෙරේරා මහතා
MBBS (USJP) Ph.D. (USJP)

### තාක්ෂණ පීඨය



මහාචාර්යය ඒ.එච්.එල්.ආර්.නිල්මිණි මහත්මිය
B.Sc., Ph.D. (Cardiff)

**ඉන්ජිනේරු පීඨය**



අචාර්යය එම්.එන්.ධර්මවීර මහතා
Ph.D. (Monash, Australia)

**සම සෞඛ්‍ය පීඨය**




මහචාර්යය ඩී.අයි.උළුවඩුගේ මහත්මිය
Bsc Hons (USJP), Ph.D. (USJP)

**දන්ත වෛද්‍ය විද්‍යා පීඨය**



ජ්‍යෙෂ්ඨ මහාචාර්යය. එස්.ජී.යසවර්ධන මහත්මිය
MBBS (University of Colombo),
Ph.D. (University of Colombo)

**නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨය**



ජ්‍යෙෂ්ඨ මහාචාර්යය.පී.පී.එම්.ජයවීර මහතා
B.Sc. (SJP), Ph.D. (Belfast),
M.I.Chem.C.

**පරිගණක පීඨය**



මහාචාර්යය ප්‍රසාද් එම්. ජයවීර මහතා
B.Sc. (Hons), Ph.L. and Ph.D. (Stockhol

**සනාතන සභා නියෝජිතයින්**



ජ්‍යෙෂ්ඨ මහාචාර්යය මයුර සමරකෝන් මහතා
සමාජ විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්යය
Chair Professor
BA (Hons), MA (USJ)



මහාචාර්යය එස්.ටී.ඩබ්.එස් යාපා මහතා
MBA (PIM- SJP); Ph.D. (Sheffield Hallam)
BSc Industrial Management (Special) (Kelaniya)

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද පාලක සභා නියෝජිතයන්**




අචාර්යය කිරින්දේ අස්සජි හිමි
Ph.D. University of India
M.A of Arts (India Delhi)
ගංගාරාම විහාරස්ථානයේ විහාරාධිපති



අචාර්යය බලංගොඩ සෝභිත හිමි
Ph.D (SJP) රාජකීය පණ්ඩිත
MPhil (Col) BAT (Col)



අචාර්යය ඒ.එම්.මුබාරක් මහතා
Bsc. Chemistry (Hons) UOM PhD
Oraganic Chemistry Uni of Cambridge
හිටපු අධ්‍යක්ෂ, ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ (CISIR)ආයතනය



අචාර්යය රවි ලියනගේ
B.Sc.(SJP),
MBA (Col), Ph.DMft (USA)
Mktg (SL), CGEM (MOR)
FSLIM, MAAT
සභාපති, රයිගම් සමූහ ව්‍යාපාරය



සුජීව රාජපක්ෂ මහතා
ජ්‍යෙෂ්ඨ වරලත් ගණකාධිකාරී
MBA (PIM) (හිටපු මහජන බැංකු සභාපති)



රෝලන්ඩ් මුණසිංහ මහතා
Attorney at Law



ඒ.ඒ.ආරියරත්න මහතා
B.Sc. In Estate Mng. &Val
Dip in Personnel Mgt
Diploma in General Admin
උප සභාපති - මාර්ග සංවර්ධන අධිකාරිය



දර්ශනා සේනානායක මහත්මිය
M.A. in Econ (COL) M.A.in
Buddhist Studies (KEL)
B.A. (Special)Economics
(SJP), විශ්‍රාමික SLAS නිලධාරිනි



ප්‍රදීප් යාපාරත්න මහතා
B.A (Special) (USJP)
PG Dip (USJP)
M.A (Socialogy) (USJP)
ලේකම්, රාජ්‍ය පරිපාලන ස්වදේශිය කටයුතු
හා පළාත් පාලන අමාත්‍යංශය.



සජීව මැදවත්ත මහතා
B.A (Special) (USJP)
PG Dip (USJP) (Criminology)
M.A (Criminology) (USJP)
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති



අචාර්යය අතුල පතිනායක මහතා
Attorney at Law
Legal Practitioner (Victoria)
Phd, LLM, MBA
විදුහල්පති, ශ්‍රී ලංකා නීති විද්‍යාලය



ඉන්ජිනේරු අනුර ගුණරත්න මහතා
Bsc.Eng.
Consultant MEP Engineer
ASG



සම්මානිත මහාචාර්යය අරියරත්න කළුආරච්චි මහතා
BFA (Kelaniya), MAQ (USJP)
MA (Kalkata)
හිටපු උපකුලපති
සෞන්දර්යය කලා විශ්වවිද්‍යාලය



Mr. H.C.D.L.Silva
MPM, Bsc.Pub.Admin (Hon)
FPFA, CBA, MAAT, CIPFA
අධ්‍යක්ෂ ජෙනරාල්
භාණ්ඩාගාර මෙහෙයුම්
දෙපාර්තමේන්තුව

**පාලක සභාවේ අනු කමිටු**

**(i) විශ්වවිද්‍යාල මූල්‍ය කමිටුව**

| | | |
|---|---|---|
| සභාපති | - | උපකුලපති |
| ලේකම් | - | මූල්‍යාධිකාරී |
| සමාජිකයින් | - | පාලක සභා නියෝජිතයින් 04 දෙනෙකු |
| | | ලේඛකාධිකාරී |
| | | සියලුම පීඨ වල පීඨාධිපතිවරුන් |
| ආරාධිත | - | නියෝජ්‍ය මූල්‍යාධිකාරී (වැටුප්) |
| | | නියෝජ්‍ය මූල්‍යාධිකාරී (තාක්ෂන පීඨය) |
| | | නියෝජ්‍ය මූල්‍යාධිකාරී (සැපයුම්) |
| | | නියෝජ්‍ය මූල්‍යාධිකාරී (මානව ශාස්ත්‍ර පීඨය) |
| | | ජ්‍යෙෂ්ඨ සහාකාර මූල්‍යාධිකාරී (වෛද්‍ය පීඨය) |
| | | ජ්‍යෙෂ්ඨ සහාකාර මූල්‍යාධිකාරී (කළමනාකරණ පීඨය) |
| | | ජ්‍යෙෂ්ඨ සහාකාර මූල්‍යාධිකාරී (ගෙවීම්) |
| | | ජ්‍යෙෂ්ඨ සහාකාර මූල්‍යාධිකාරී (ව්‍යවහාරික විද්‍යා පීඨය) |
| | | සහාකාර මූල්‍යාධිකාරී ( බාහිර විභාග) |
| | | ජ්‍යෙෂ්ඨ සහාකාර අභ්‍යන්තර විගණක |

**(ii) නිවාඩු සහ ප්‍රදාන කමිටුව**

| | | |
|---|---|---|
| සභාපති | - | උපකුලපති |
| ලේකම් | - | නියෝජ්‍ය ලේඛකාධිකාරී (අධ්‍යයන ආයතන අංශය) |
| සමාජිකයින් | - | ලේඛකාධිකාරී |
| | | සියලුම පීඨ වල පීඨාධිපතිවරුන් |

**(iii) විගණන හා කළමනාකරණ කමිටුව**

| | | |
|---|---|---|
| සභාපති | - | නම් කරන ලද පාලක සභා නියෝජිතයකු |
| සමාජිකයින් | - | නම් කරන ලද පාලක සභා නියෝජිතයින් 04 දෙනෙකු |
| ආරාධිත | - | උපකුලපති |
| | | ලේඛකාධිකාරී |
| | | මූල්‍යාධිකාරී |
| කැඳවුම්කරු | - | ජ්‍යෙෂ්ඨ සහාකාර අභ්‍යන්තර විගණක |
| නිරීක්ෂක | - | විගණන අධිකාරී – ජාතික විගණන කාර්යයාලය |
| | | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |

**(iv) සැලසුම් හා සංවර්ධන කමිටුව**

| | | |
|---|---|---|
| සභාපති | - | උපකුලපති |
| සමාජිකයින් | - | ලේඛකාධිකාරී |
| | | මූල්‍යාධිකාරී |
| | | සියලුම පීඨ වල පීඨාධිපතිවරුන් |
| | | අධ්‍යනාංශපති/ සිවිල් ඉන්ජිනේරු අධ්‍යයනාංශය |
| | | අධ්‍යනාංශපති / යාන්ත්‍රික ඉන්ජිනේරු අධ්‍යයනාංශය |
| | | අධ්‍යනාංශපති / විදුලි හා විද්‍යුත් ඉන්ජිනේරු අධ්‍යයනාංශය |
| | | වැඩ ඉන්ජිනේරු |
| | | ව්‍යාපෘති ඉන්ජිනේරු (ප්‍රාග්ධන හා සැලසුම් අංශය) |
| කැඳවුම්කරු | - | නියෝජ්‍ය ලේඛකාධිකාරී (ප්‍රාග්ධන හා සැලසුම් අංශය) |
| නිරීක්ෂක | - | නම් කරන ලද පාලක සභා නියෝජිතයකු |

## සනාතන සභාව

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 46 වැනි ඡේදය යටතේ පත්කළ සාමාජිකයන්ගෙන් සනාථන සභාව සමන්විත වේ.

**සනාතන සභාවේ අනු කමිටු**

**(i)** බාහිර උපාධි කමිටුව

**(ii)** පර්යේෂණ සහ ප්‍රකාශන කමිටුව

**(iii)** පරිගණක කමිටුව

## 2024 වර්ෂයේ පැවති රැස්වීම්

පාලක සභාව, සනාථන සභාව ඇතුළු නම් කරන ලද කමිටු ඇතුළු අනෙකුත් බලධාරීන් 2024 වර්ෂය තුළ පහත පරිදි රැස්වී ඇත

| රැස්වීම | රැස්වීම් ගණන |
|---|---|
| පාලක සභා | 12 |
| සනාතන සභා | 12 |
| මුදල් හා ප්‍රාග්ධන කිමිටු | 12 |
| නිවාඩු හා ප්‍රදාන කමිටු | 12 |
| පර්යේෂණ සභා කමිටුව | 12 |
| බාහිර විභාග කමිටුව | 12 |
| සැලසුම් සහ සංවර්ධන කමිටුව | 12 |
| විගණන සහ කළමනාකරණ කමිටුව | 03 |

## අගය නිර්මාණ ආකෘතිය

**යෙදවුම්**

මානව ප්‍රාග්ධනය

ශිෂ්‍යයින්
කාර්ය මණ්ඩලය



**හවුල්කාරීත්වය සහ ජාල සහයෝගීතාව**

සේවා යෝජකයින්
ආදි විද්‍යාර්ථීන්



**මූල්‍ය ප්‍රාග්ධනය**

මුළු වත්කම්
රුපියල් බිලියන 29 යි
සමුච්චිත අරමුදල්
රුපියල් බිලියන 22 යි



**යටිතල පහසුකම්**
විශ්වවිද්‍යාල යටිතල පහසුකම්
තාක්ෂණ



**ස්වභාවික ප්‍රාග්ධනය**

අපගේ මෙහෙයුම් ක්‍රියාකාරකම් සිදු කිරීමේදී පරිභෝජනය කරන ස්වභාවික සම්පත් එනම් බලශක්තිය, කඩදාසි, විමෝචන සහ අපද්‍රව්‍ය



අපගේ පාර්ශවකරුවන්ගේ ප්‍රයෝජනය උදෙසා උසස් අධ්‍යාපනය සහ පර්යේෂණ

අවස්ථා සඳහා පහසුකම් සැලසීම පිණිස ලෝක මට්ටමේ අධ්‍යයන පරිසරයක් නිර්මාණය කිරීම

දක්ෂ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සහ අධ්‍යයන විශිෂ්ටත්වය පිළිබඳ වාර්තාවක් සහිත විශේෂඥ සංචිතයක් තබා ගැනීම.

ආරාධිත දෙසුම් හරහා කර්මාන්තයේ ප්‍රවීණයන් විසින් අදාළ කර්මාන්ත/ක්ෂේත්‍ර දැනුම ලබාදීම.

වර්තමාන දේශීය හා ගෝලීය අභියෝග සහ ගැටළු විසඳීම කෙරෙහි පර්යේෂණවල අවධානය යොමු කිරීම. එමගින් සමාජයට සැලකිය යුතු දායකත්වයක් ලබා දීම


සිසුන්ගේ දැනුම හුවමාරුව සහ පර්යෙයේෂණවල නියැලීම සහතික කිරීම සඳහා නවීන සහ පර්යේෂණ මූලික ඉගැන්වීම් ශිල්පීය ක්‍රම ක්‍රියාත්මක කිරීම

මූලිකව රජයේ ප්‍රදාන හරහා අරමුදල් සපයනු ලැබේ. එමෙන්ම උපකාරක පන්ති ගාස්තු, පරිත්‍යාග සහ ආයෝජන ආදායම හරහාද ආදායම් උත්පාදනය කරනු ලැබේ.

ප්‍රජාව මුහුණ දෙන අභියෝග/ප්‍රශ්න විසඳීමට සහ උපාධිධාරීන් සඳහා අවශ්‍ය කුසලතා අවශ්‍යතා සහ සිසුන්ගේ අධ්‍යයන අවශ්‍යතා සඳහා හඳුනාගැනීම සඳහා පාර්ෂවකරුවන් සමඟ එක්ව කටයුතු කිරීම.

| ප්‍රතිදාන | ප්‍රතිඵල |
| --- | --- |
| ශිෂ්‍යයින්ගේ තෘප්තිමත් බව<br>• සියලුම විෂයධාරා හරහා තම අදාළ පාඨමාලා සඳහා තරඟ වදින ඉහළ සිසුන් සංඛ්‍යාවක් සිටීම.<br>• ශිෂ්‍ය තෘප්තිමත් බව පිළිබඳ සමීක්ෂණයේ විශිෂ්ට ලකුණු ලැබීම<br>**උපාධියේ ගමනාන්ත**<br>• වෘත්තීය ක්ෂේත්‍රයේ උපාධිධාරී රැකියා සඳහා ඉහළ අනුපාත සහතික කිරීම හෝ උසස් අධ්‍යයන කටයුතුවල අඛණ්ඩව නියැලීම.<br>**පර්යේෂණ නිමැවුම්**<br>• පර්යේෂණ ප්‍රකාශන වැඩි සංඛ්‍යාවක් පළකිරීම.<br>• පර්යේෂණ ප්‍රදාන වැඩි වශයෙන් වෙන් කිරීම.<br>**කීර්තිය**<br>• ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනයේ පුරෝගාමියෙකු ලෙස පිළිගැනීමට ලක්වීම.<br>• ජාත්‍යන්තර සහයෝගීතා වැඩි ප්‍රමාණයක් හරහා ගෝලීය අවධානය වැඩි කිරීම.<br>• ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්වල ඉහළට පැමිණීම.<br>මූල්‍ය ස්ථාවරත්වය<br>**• විශිෂ්ට ඉගැන්වීම් සහ ඉගෙනුම් අත්දැකීමක් ලබාදීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් පවතින බවට සහතික කිරීම සඳහා ශක්තිමත් ශේෂ පත්‍රයක් සකස් කිරීම.** | **මානව ප්‍රාග්ධනය**<br>**ශිෂ්‍යයින්**<br>**• සිසුන්ගේ පසුබිම නොතකා ඔවුන්ට අවස්ථා ලබාදීම**<br>**• විශිෂ්ට සම්පත් සමඟ ගුණාත්මක ඉගෙනුම් අත්දැකීමක් ලබාදීම**<br>කාර්ය මණ්ඩලය<br>• ඔවුන්ගේ විශේෂඥතාව සහ හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා වෘත්තීය සංවර්ධන අවස්ථා ලබා දීම.<br>• ආකර්ශනීය වේතන ලබාදීම.<br>**හවුල්කාර සංවිධාන**<br>• අමතර වටිනාකමක් ලබා ගැනීම සඳහා සේවා යෝජකයන් සහ අනෙකුත් විශ්ව විද්‍යාල සමඟ සමීප හවුල්කාරිත්වයන් ගොඩනගාගැනීම සහ වර්ධනය කිරීම<br>**ආදි සිසුන්**<br>**• වෘත්තීය රැකියා අවස්ථා හෝ අනාගත අධ්‍යයන කටයුතු සම්බන්ධයෙන් උපාධිධාරීන්ට සහාය ලබා දීම. වෘත්තීන්හි නියැලී සිටින ආදි සිසුන්ගේ ගෝලීය ජාලයක් වත්වාගෙන යාම.**<br>**ප්‍රාදේශීය ප්‍රජාව**<br>• ප්‍රජාව සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය නිපුණතා සහිත දක්ෂ උපාධිධාරීන් බිහි කිරීම.<br>• රැකියා අවස්ථා ලබා දීම.<br>• වත්මන් දේශීය හා ගෝලීය අභියෝග හා ගැටලු විසඳීම කෙරෙහි පර්යේෂණවල අවධානය යොමු කිරීම.<br>අරමුදල් සපයන්නන් සහ නියාමකයින්<br>• රජයේ අරමුදල් සහ පරිත්‍යාග වගකීමෙන් යුතුව භාවිතා කිරීම.<br>• ධනාත්මක සමාජ ප්‍රතිඵලවල සාක්ෂාත් කර ගැනීමට සහය දැක්වීමට අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක සබඳතාවයක් පවත්වාගෙන යාම. |

## ආයතනික පාලන රාමුව




## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආයතනික පාලනය

2024 වර්ෂය තුළ සිදු කරන ලද සියලුම කාර්යයන්හි ඉහළම ප්‍රමිතීන්ට අනුකූලව යහ පාලන පිළිවෙත් ක්‍රියාත්මක කිරීමට විශ්වවිද්‍යාලය කැපවී සිටී. මෙමගින් අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදනවලට අනුකූල වීම, ගනුදෙනුවල විනිවිදභාවය, වගවීම සහ රජයේ අරමුදල් පිළිබඳ වගකීම වැඩි දියුණු කරයි.

1) අංක 16 1978 දරන විශ්වවිද්‍යාල පනතට අනුකූල වීම.

- කවුන්සිලය, සනාතන සභාව සහ පීඨ මණ්ඩල සංයුතිය පනත මගින් තීරණය කර ඇති අතර ඒ අනුව විශ්වවිද්‍යාල පාලන ආයතන සඳහා සියලුම පත්වීම් විශ්වවිද්‍යාල පනතේ දක්වා ඇති විධිවිධාන අනුව සිදු කර ඇත.

- විශ්වවිද්‍යාල කවුන්සිලය විශ්වවිද්‍යාලයේ විධායක සහ පාලන අධිකාරිය ලෙස ක්‍රියා කරයි. සාමාන්‍ය පරිපාලන, අධ්‍යයන සහ මූල්‍ය ප්‍රතිපත්ති තීරණ ගනු ලබන්නේ සෙනෙට් සභාවේ, මූල්‍ය කමිටුවේ සහ විශ්වවිද්‍යාලයේ අනෙකුත් අනු කමිටුවල නිර්දේශයෙනි.

- විශ්වවිද්‍යාලයේ අධ්‍යයන අධිකාරිය ලෙස සෙනෙට් සභාව පත් කර ක්‍රියා කරයි .සෙනට් කවචයට විශ්වවිද්‍යාලයේ උපදෙස්, අධ්‍යාපනය, පර්යේෂණ සහ විභාග පාලනය සහ සාමාන්‍ය මඟ පෙන්වීම යනාදිය ඇතුළත්ය.

- කවුන්සිලයේ සහ සෙනෙට් සභාවේ ගණපූරණය, පැවැත්විය යුතු අවම රැස්වීම් සංඛ්‍යාව, කවුන්සිලයෙහි කාලසීමාව, සභා බලතල විෂය පථය සහ මණ්ඩලවල කාර්යයන් ද පනතේ දක්වා ඇත. විශ්වවිද්‍යාලය නිශ්චිත අවශ්‍යතාවලට අනුකූල වී ඇත.

- සාමාන්‍ය පරිපාලන, අධ්‍යයන පරිපාලන සහ මූල්‍ය පරිපාලන පනතේ විධිවිධාන අනුව සිදු කෙරේ

- සියලුම උපාධි පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා වෙන් කරන ලද අතර සියලුම උපාධි වැඩසටහන් සඳහා විෂයමාලා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ලබා දී ඇති අයවැය ප්‍රතිපාදන සහ වියදම් වාර්ෂික අයවැයේ දක්වා ඇති නිශ්චිත අයවැය රේඛාව ලෙස  සලකා වියදම් දරා ඇත.

2) රජයේ මූල්‍ය රෙගුලාසි සහ රජයේ ක්‍රියා පටිපාටිවලට අනුකූල වීම.

ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා භාණ්ඩාගාරයෙන් අරමුදල් සපයන රාජ්‍ය ආයතනයක් ලෙස, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද මූල්‍ය රෙගුලාසි, භාණ්ඩාගාර චක්‍රලේඛ සහ ගිල්ඩ් ලයින් සහ චක්‍රලේඛවලට අනුකූලව විශ්වවිද්‍යාලයේ සියලුම මූල්‍ය ගනුදෙනු සිදු කර වාර්තා කරනු ලැබේ.

3) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූල වීම.

ශ්‍රී ලංකාවේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුකූලව 2024 වර්ෂය තුළ සියලුම භාණ්ඩ හා සේවා, වැඩ, ඉදිකිරීම් සහ උපදේශන ලබාගෙන ඇත. උපකුලපතිවරයාගේ නිර්දේශය ඇතිව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ප්‍රසම්පාදන කමිටු පත් කරනු ලැබේ. ප්‍රසම්පාදන කමිටුවල නිර්දේශ ඇතිව තාක්ෂණික ඇගයීම් කමිටු පත් කෙරේ. ලංසු ලේඛන සකස් කිරීම, ලංසු විවෘත කිරීම, ලංසු ලියකියවිලි, ලංසු ඇගයීම, ප්‍රසම්පාදන කමිටු සහ තාක්ෂණික ඇගයීම් කමිටු සංයුතිය, කමිටු වෙත ගෙවීම් ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල විධිවිධාන අනුව සිදු කෙරේ.

4) ආයතන සංග්‍රහය සහ බඳවා ගැනීමේ පරිපාටියට අනුකූල වීම.

වැටුප්, පත්වීම්, උසස්වීම්, වර්ධක, නිවාඩු, විනය ක්‍රියාමාර්ග ඇතුළු සියලුම කාර්ය මණ්ඩල කටයුතු විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ සහ බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන මගින් පාලනය කරයි. කිසියම් කරුණක් විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයෙන් ආවරණය නොවන්නේ නම්, එය ශ්‍රී ලංකාවේ රජයේ ආයතන සංග්‍රහය වෙත යොමු වේ. වැටුප් හා දීමනා ප්‍රමාණය තීරණය කරනු ලබන්නේ භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ මගින් වන අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සම්මත කරනු ලැබේ.

5) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS), ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (IFRS)

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඉදිරිපත් කෙරේ. ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් රාජ්‍ය අංශයේ ගනුදෙනු හඳුන්වා දී නොමැති අවස්ථාවල ගනුදෙනු වාර්තා කිරීම සඳහා භාවිත වේ.

6) අනෙකුත් ව්‍යවස්ථාපිත විධිවිධාන මගින් ආවරණය නොවන සහ ව්‍යවස්ථාපිත විධිවිධාන මගින් දක්වා ඇති විෂය පථය තුළ, සභාවේ අනුමැතිය ඇතිව අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සම්මත කර ඇත. උදා:- රාජකාරි වෙන් කිරීම, අනුමැතිය, අවසරය සහ සහතික කිරීමේ සීමාවන් ආදිය.

විධායක සාරාංශය

2024 වසරේදී, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තිරසරභාවය සඳහා වූ මධ්‍යස්ථානය, පාරිසරික සංරක්ෂණය, විද්‍යාත්මක පර්යේෂණ සහ ප්‍රජා සහභාගීත්වය යන ක්ෂේත්‍රවල සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගැනීමට සමත් විය. වන ප්‍රතිස්ථාපන ව්‍යාපෘති, කඩොලාන පරිසර පද්ධති පර්යේෂණ සහ නාගරික වෘක්ෂ කළමනාකරණය පිළිබඳ වැඩමුළු පැවැත්වීම මෙන්ම, සිසුන් සහ වෘත්තිකයන් සඳහා වූ ඵලදායී දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම මෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් අතර විය. තවද, තිරසරභාවය සඳහා වූ මධ්‍යස්ථානය (CFS) විසින් 17.68 kW සූර්ය බලශක්ති පද්ධතියක් ස්ථාපනය කරමින් පුනර්ජනනීය බලශක්ති භාවිතය පුළුල් කළ අතර, එමගින් විශ්වවිද්‍යාලයේ කාබන් විමෝචනය අඩු කරන ලදී. පෞද්ගලික සහ රාජ්‍ය අංශයේ ආයතන සමඟ ඇති ශක්තිමත් හවුල්කාරිත්වය මගින් ජෛව විවිධත්ව සංරක්ෂණය, දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දීමේ හැකියාව සහ තිරසර සම්පත් කළමනාකරණය ප්‍රවර්ධනය කරමින්, තිරසර විසඳුම් ක්‍රියාත්මක කිරීමට මධ්‍යස්ථානයට හැකියාව ලබා දුන්නේය. මෙම ක්‍රියාකාරකම් තුළින්, ශ්‍රී ලංකාවේ තිරසරභාවය සහ පාරිසරික භාරකාරත්වය ඉදිරියට ගෙන යාමේ පුරෝගාමියෙකු ලෙස තිරසරභාවය සඳහා වූ මධ්‍යස්ථානය අඛණ්ඩව සිය මෙහෙවරෙහි යෙදෙයි.

## *හරිත සරසවි පරිශ්‍රයක් සඳහා පුනර්ජනනීය බලශක්තිය ප්‍රවර්ධනය කිරීම*

තිරසරභාවය සඳහා වූ මධ්‍යස්ථානය (CFS), ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 17.68 kW සූර්ය බලශක්ති පද්ධතියක් ස්ථාපනය කිරීම සාර්ථකව නිම කර ඇත. මෙම සන්ධිස්ථානය, විශ්වවිද්‍යාලය ප්‍රමුඛ පෙළේ හරිත සරසවි පරිශ්‍රයක් බවට පරිවර්තනය කිරීමේදී මෙන්ම, එහි කාබන් පියසටහන සහ බලශක්ති පිරිවැය සක්‍රීයව අඩු කිරීමේදී ද වැදගත් පියවරක් වනු ඇත.

සූර්ය බලශක්තිය උපයෝගී කර ගැනීමෙන්, මෙම මුලපිරීම පිරිසිදු හා පුනර්ජනනීය බලශක්ති විසඳුම් ප්‍රවර්ධනය කරනවා පමණක් නොව, විශ්වවිද්‍යාල මෙහෙයුම් සඳහා තිරසරභාවය ඒකාබද්ධ කිරීම සඳහා ආදර්ශයක් ලෙස ද ක්‍රියා කරයි. මෙම ව්‍යාපෘතිය, පාරිසරික වශයෙන් වගකීම් සහගත යටිතල පහසුකම් පෝෂණය කිරීම සහ උසස් අධ්‍යාපන ආයතනවල තිරසර බලශක්ති භාවිතය දිරිමත් කිරීම යන තිරසරභාවය සඳහා වූ මධ්‍යස්ථානයේ (CFS) පුළුල් මෙහෙවර සමඟ සමපාත වේ.

## *වැඩමුළු සහ පුහුණු වැඩසටහන්*

2024 පෙබරවාරි මාසයේදී, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තිරසරභාවය සඳහා වූ මධ්‍යස්ථානය (CFS) විසින් නගර සභා සහ පළාත් සභා වල වෘත්තිකයන්, තිරසර නාගරික ගස් කළමනාකරණය පිළිබඳ ප්‍රායෝගික දැනුමෙන් සවිබල ගැන්වීම අරමුණු කරගනිමින් දින දෙකක නාගරික ගස් රැකවරණය සහ කළමනාකරණය පිළිබඳ වැඩමුළුවක් සංවිධානය කරන ලදී. පෙබරවාරි 16 සහ 17 යන දිනවල පැවති මෙම වැඩමුළුවේදී පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරන ලදී:

- නාගරික හරිතකරණයේ පාරිසරික හා සමාජීය වැදගත්කම.
- නාගරික ගස්වල සෞඛ්‍යය හා ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීමේ ක්‍රමවේද.
- දීර්ඝකාලීන පාරිසරික ප්‍රතිලාභ සඳහා තිරසර භාවිතයන් ප්‍රවර්ධනය කිරීම.

ව්‍යවහාරික විද්‍යා පීඨයේ පීඨාධිපති මහාචාර්ය උපුල් සුභසිංහ සහ වන විද්‍යා හා පරිසර විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය හේමන්ති රණසිංහ යන සම්භාවනීය සම්පත් දායකයින්, න්‍යායාත්මක දැනුම ප්‍රායෝගික අත්දැකීම් සමඟ ඒකාබද්ධ කරමින් මේ සම්බන්ධයෙන් චිත්තාකර්ෂණීය දේශන පැවැත්වූහ. මේ සඳහා රාජ්‍ය සහ පෞද්ගලික අංශ දෙකෙම නියෝජනය කරමින් සහභාගිවූ පිරිස්, තම අදහස් සහ හොඳම භාවිතයන් බෙදාහදා ගනිමින් සාකච්ඡා සඳහා සක්‍රියව දායක වූහ. මෙම වැඩමුළුවට යහපත් ප්‍රතිචාර ලැබුණු අතර, සහභාගිවවූ පිරිස් හරිතවත් හා සුරක්ෂිත නාගරික අවකාශයන් ගොඩනැගීම සඳහා අධිෂ්ඨානයෙන් හා උනන්දුවෙන් යුතුව පිටත්ව ගියහ. මෙම වැඩසටහන, අනාගත පරපුර උදෙසා නාගරික හරිත අවකාශයන් සුරක්ෂිත කිරීම සහතික කරමින්, දැනුම බෙදාහදා ගැනීම සහ කුසලතා සංවර්ධනය ආදී කාර්යයන් සඳහා වේදිකාවක් නිර්මාණය කරන ලදී.



### *සීමාවාසික පුහුණු අවස්ථා ලබා දීම*

2024 වසරේදී, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තිරසරභාවය සඳහා වන මධ්‍යස්ථානය (CFS), ජර්මනියේ තිරසර සංවර්ධනය සඳහා වූ Eberswalde විශ්වවිද්‍යාලයේ (HNEE) ශිෂ්‍යයෙකු, කොළඹ විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ උපාධි අපේක්ෂකයෙකු සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වන විද්‍යා හා පරිසර විද්‍යා අධ්‍යයනාංශයේ සිසුන් පස් දෙනෙකු ඇතුළු විවිධ උපාධි අපේක්ෂකයින් පිරිසකට සීමාවාසික පුහුණුව ලබා දීමට කටයුතු කළේය. මෙම වැඩසටහන මගින්, ක්‍රියාත්මක වෙමින් පවතින තිරසරභාවය සඳහා වූ මධ්‍යස්ථානයේ (CFS) ව්‍යාපෘති සඳහා සක්‍රියව සහභාගී වීම තුළින් ඔවුනට න්‍යායාත්මක දැනුම සහ ප්‍රායෝගික වශයෙන් සම්මිශ්‍රිත පුළුල් අත්දැකීමක් ලබා දෙන ලදී.

සීමාවාසික පුහුණු වැඩසටහන අතරතුර, සහභාගිවන්නන් තිරසර සංවර්ධනය, පාරිසරික සංරක්ෂණය සහ නව්‍ය තාක්ෂණයන් පිළිබඳ සම්මන්ත්‍රණ සහ වැඩමුළු සඳහා සහභාගී වූ අතර, පාරිසරික තක්සේරු කිරීම්, නාගරික වෘක්ෂ කළමනාකරණය සහ ප්‍රජා මූලික සංරක්ෂණ වැඩසටහන් වැනි ප්‍රායෝගික ක්ෂේත්‍ර ව්‍යාපෘති මගින් එය තවදුරටත්

පෝෂණය විය. එය සීමාවාසිකයින්ගේ විවිධ පසුබිම්, අදහස් හුවමාරුව සඳහා සාරවත් ඉඩහසරක් නිර්මාණය කළ අතර, ඉගෙනුම් අත්දැකීම වැඩිදියුණු කරමින් තිරසර ප්‍රයත්නයන්හි ජාත්‍යන්තර සහයෝගීතාව ද එමගින් ප්‍රවර්ධනය කළේය.

### *පාරිසරික අධ්‍යාපනය සහ දැනුවත්භාවය*

2024 වසරේදී, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තිරසරභාවය සඳහා වන මධ්‍යස්ථානය (CFS) විසින් විවිධ කණ්ඩායම් අතර පාරිසරික සංරක්ෂණය පිළිබඳ සංකල්පය ප්‍රවර්ධනය කිරීම සඳහා අධ්‍යාපනික සහ දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් පවත්වන ලදී.

වෙරළබඩ ආරක්ෂාව, ජෛව විවිධත්වයට සහාය වීම සහ කාබන් තිර කර ගැනීම සඳහා කඩොලාන වනාන්තරවල ඇති තීරණාත්මක කාර්යභාරය පිළිබඳව අවධානය යොමු කරමින්, තිරසරභාවය සඳහා වූ මධ්‍යස්ථානය විසින් පරිසරය පළිබඳ උනන්දුවක් දක්වන්න ජපන් කණ්ඩායමක් සඳහා දැනුවත් කිරීමේ සැසියක් සංවිධානය කරන ලදී. දේශගුණික විපර්යාස අවම කිරීම සහ සමුද්‍ර පරිසර පද්ධති සුරැකීම සඳහා කඩොලාන වල වැදගත්කම මෙම සැසියේදී අවධාරණය කෙරිණි.

තරුණ සත්ත්ව විද්‍යාඥයින්ගේ සංගමයේ (YZA) සාමාජිකයින් සහ හොරණ, උඩුව කනිෂ්ඨ විද්‍යාලයේ සිසුන් පිරිසක් සඳහා දියකඳුරු ආශ්‍රිත පරිසර විද්‍යාව සම්බන්ධ විශේෂිත වැඩමුළුවක් පවත්වන ලදී. සහභාගීවූ පිරිස මිරිදිය පරිසර පද්ධති අවබෝධ කර ගැනීම සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නිරත වූ අතර, දියකඳුරු සංරක්ෂණය කිරීමේ වැදගත්කම සහ මෙම වැදගත් ජල සම්පත් කෙරෙහි මානව ක්‍රියාකාරකම්වල බලපෑම පිළිබඳව අවබෝධයක් ලබා ගත්හ.

තිරසරභාවය සඳහා වන මධ්‍යස්ථානය විසින් දියකඳුරු පිළිබඳ පරිසර විද්‍යා වැඩමුළුවට සමගාමීව, යගිරල වන රක්ෂිතයේ රුක් රෝපණ වැඩසටහනක් ද සංවිධානය කරන ලදී. තරුණ සත්ත්ව විද්‍යාඥයින්ගේ සංගමයේ (YZA) සාමාජිකයින් සහ උඩුව කනිෂ්ඨ විද්‍යාලයේ සිසුන් ඊට සක්‍රියව සහභාගී වෙමින්, ජෛව විවිධත්වය වැඩිදියුණු කිරීම සහ පාරිසරික භාරකාරත්වය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් වන වගා වර්ධන වැඩසටහන්වලට දායක වූහ.

ස්වභාවික පරිසර පද්ධති ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම සඳහා පාරිසරික දැනුවත්භාවය වර්ධනය කිරීමට සහ විවිධ ප්‍රජාවන් තිරසර භාවිතයන් සඳහා යොමු කිරීමට තිරසරභාවය සඳහා වන මධ්‍යස්ථානයේ ඇති කැපවීම මෙම වැඩසටහන් මගින් මනාව පිළිබිඹු කරයි.

### *විද්‍යාත්මක පර්යේෂණ අධ්‍යයන*

2024 වසරේදී, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තිරසරභාවය සඳහා වූ මධ්‍යස්ථානය (CFS), ශ්‍රී ලංකාවේ අද්විතීය පරිසර පද්ධති පිළිබඳ අවබෝධය සහ පාරිසරික සංරක්ෂණය ඉහළ නැංවීම අරමුණු කරගත් විද්‍යාත්මක පර්යේෂණ ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී.

### *ඉත්තෑපාන කඩොලාන පරිශ්‍රය පිළිබඳ පුරා-උද්භිද විද්‍යාත්මක අධ්‍යයනය*

ඕස්ට්‍රේලියාවේ ඩීකින් විශ්වවිද්‍යාලය සමඟ සහයෝගයෙන් යුතුව තිරසර පැවැත්ම සඳහා වූ මධ්‍යස්ථානය විසින් ඉත්තෑපාන කඩොලාන පරිශ්‍රය ආශ්‍රිතව පුරා-උද්භිද විද්‍යාත්මක අධ්‍යයනයක් ආරම්භ කරන ලදී. මෙම පර්යේෂණය මගින් ඓතිහාසික වෘක්ෂලතා රටා ප්‍රතිනිර්මාණය කිරීම සඳහා භූ විද්‍යාත්මක නියැදි විශ්ලේෂණය කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලද අතර, එමගින් කඩොලාන පරිසර පද්ධතියේ පරිණාමය පිළිබඳ අවබෝධයක් ලබා දෙමින් අනාගත සංරක්ෂණ ක්‍රමෝපායන් පිළිබඳ අවබෝධයක් ලබා දෙන ලදී.



### *කිරල ගස ප්‍රචාරණය පිළිබඳ පර්යේෂණ*

දේශීය කිරල ගස (*Sonneratia caseolaris*) ප්‍රචාරණය කිරීමේදී මුහුණ දීමට සිදුවන අභියෝගවලට පිළියම් ලෙස, තිරසරභාවය සඳහා වන මධ්‍යස්ථානය විසින් ඵලදායී ප්‍රචාරණ ක්‍රම හඳුනාගැනීම සඳහා අධ්‍යයනයන් සිදු කරන ලදී. මහා පරිමාණ වගා වැඩසටහන්වලට සහාය වීම, මෙම ශාක විශේෂය සංරක්ෂණය කිරීමට දායක වීම සහ දේශීය ප්‍රජාවන් තුළ එහි තිරසර භාවිතය ප්‍රවර්ධනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ විය.

### *ඉත්තෑපාන කඩොලාන පරිසර පද්ධතිය ආශ්‍රිත ජලයේ ගතික තත්ත්වයන් සහ වෘක්ෂලතා ව්‍යුහය පිළිබඳ තක්සේරු කිරීම*

ජල චලනය සහ ශාක ව්‍යාප්තිය අතර අන්තර්ක්‍රියාකාරිත්වය පිළිබඳ අවබෝධ කර ගැනීම පිණිස තිරසරභාවය සඳහා වන මධ්‍යස්ථානය විසින් ඉත්තෑපාන කඩොලාන පරිසර පද්ධතියේ ජල ගතික තත්ත්වයන් සහ වෘක්ෂලතා ව්‍යුහය පිළිබඳව අධ්‍යයනය කරන ලදී. මෙම අධ්‍යයනයේ සොයාගැනීම් මගින් කඩොලාන වාසස්ථානවල ඔරොත්තු දීමේ හැකියාව සහ පාරිසරික ක්‍රියාකාරිත්වය ඉහළ නංවන කළමනාකරණ පිළිවෙත් පිළිබඳව දැනුවත් භාවයක් ඇතිකිරීම අපේක්ෂා කෙරේ.

### *කඩොලාන පරිසර පද්ධතිවල පාෂාණ කාබන් විශ්ලේෂණය*

කාබන් තිර කිරීමේදී කඩොලාන පරිසර පද්ධතිවල ඇති තීරණාත්මක භූමිකාව හඳුනා ගනිමින් තිරසරභාවය සඳහා වන මධ්‍යස්ථානය විසින් මෙම පරිසර පද්ධති තුළ පසෙහි ඇති කාබන් ප්‍රමාණය ගණනය කිරීම සඳහා අධ්‍යයනයන්

සිදු කරන ලදී. මෙම පර්යේෂණය මගින් දේශගුණික විපර්යාස අවම කිරීමේ ගෝලීය ප්‍රයත්නයන්ට දායක වෙමින් කඩොලානවල කාබන් ගබඩා කිරීමේ විභවය පිළිබඳ වටිනා දත්ත සපයනු ලැබේ.

## නියමුවන් රහිත ගුවන් යානා සහ භූගෝලීය තොරතුරු පද්ධතිය භාවිතයෙන් පොළොවට ඉහළ නීල කාබන් සංචිත ඇස්තමේන්තු කිරීම

නියමුවන් රහිත ගුවන් යානා සහ භූගෝලීය තොරතුරු පද්ධතිය උපයෝගී කරගනිමින් තිරසරභාවය සඳහා වන මධ්‍යස්ථානය විසින් ඉත්තෑපාන කඩොලාන වනාන්තරයේ පොළොවට ඉහළ නිල් කාබන් සංචිත ඇස්තමේන්තු කිරීම සිදු කරන ලදී. මෙම නව්‍ය ප්‍රවේශය මගින් කඩොලාන ජෛව ස්කන්ධයේ ගබඩා වී ඇති කාබන් ප්‍රමාණය නිවැරදිව හා කාර්යක්ෂමව තක්සේරු කිරීමට ඉඩ සලසන අතර ඵලදායී සංරක්ෂණ ක්‍රමෝපායන් සංවර්ධනය කිරීමට ද එය උපකාරී වේ.

## ඉත්තෑපාන කඩොලාන වනාන්තරයේ පොළොව අභ්‍යන්තරයේ ඇති කාබන් සංචිත ඇස්තමේන්තු කිරීම

පොළොවට ඉහළ තක්සේරුවලට අනුපූරකයක් ලෙස තිරසරභාවය සඳහා වන මධ්‍යස්ථානය විසින් ඉත්තෑපාන කඩොලාන වනාන්තරයේ පොළොවට පහළ කාබන් සංචිත ද ඇස්තමේන්තු කරන ලදී. පරිසර පද්ධතියේ කාබන් තිර කිරීමේ ධාරිතාව පිළිබඳ පුළුල් ඇගයීමක් සඳහා මූල පද්ධතිවල සහ පසෙහි ගබඩා වී ඇති කාබන් ප්‍රමාණය පිළිබඳ අවබෝධ කර ගැනීම අත්‍යවශ්‍ය වේ.

විවිධ අනුප්‍රාප්තික අවධීන්හි පවතින කඩොලාන වනාන්තරවලින් සමන්විත ඉත්තෑපාන කඩොලාන පරිශ්‍රය, විද්‍යාත්මකව බොහෝ දුරට ගවේෂණය නොවූ ස්ථානයකි. මෙම විවිධත්වය, කඩොලාන පරිසර පද්ධතිවල පාරිසරික ක්‍රියාවලීන් සහ අනුප්‍රාප්තික රටා අධ්‍යයනය කිරීමට සුවිශේෂී අවස්ථාවක් උදා කරයි. ශ්‍රී ලංකාවේ කඩොලාන පරිසර පද්ධති සඳහා ඵලදායී තිරසර වැඩසටහන් නිර්මාණය කිරීමටත්, පාරිසරික වෙනස්කම්වලට එරෙහිව ඒවායේ පැවැත්ම සහ ඔරොත්තු දීමේ හැකියාව සහතික කිරීමටත් මෙම පෞරාණික පරිශ්‍රයේ විද්‍යාත්මක පර්යේෂණ පැවැත්වීම අත්‍යවශ්‍ය වේ.

මෙම පර්යේෂණ වැඩසටහන් මගින් විද්‍යාත්මක දැනුම වර්ධනය උදෙසා සහ පාරිසරික සංරක්ෂණය සඳහා සාක්ෂි මත පදනම් වූ පිළිවෙත් ක්‍රියාත්මක කිරීම සඳහා තිරසරභාවය සඳහා වන මධ්‍යස්ථානය හි කැපවීම මනාව පිළිබිඹු කරයි.

## වැසි වනාන්තර ප්‍රතිෂ්ඨාපනය සඳහා වූ හවුල්කාරිත්වය

2024 වසරේදී, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තිරසර පැවැත්ම සඳහා වූ මධ්‍යස්ථානය ශ්‍රී ලංකාවේ හායනයට ලක් වූ වන බිම් ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා සීමා සහිත කොමර්ෂල් බැංකු පොදු සමාගම සහ නෝර්ත් මැනුෆැක්චරින් පුද්ගලික සමාගම සමඟ වැදගත් අවබෝධතා ගිවිසුම් දෙකකට අත්සන් තැබීය.

2024 අගෝස්තු 28 වන දින, සීමා සහිත කොමර්ෂල් බැංකු පොදු සමාගම සමඟ අත්සන් තැබූ අවබෝධතා ගිවිසුම මගින් යගිරල වන රක්ෂිතයේ ප්‍රධාන ප්‍රතිෂ්ඨාපන වැඩසටහනක් දියත් කරන ලද අතර, එහිදී හායනයට ලක් වූ ප්‍රදේශ පුනරුත්ථාපනය කිරීම, ජෛව විවිධත්වය වැඩි දියුණු කිරීම සහ තිරසර ඉඩම් පරිහරණ පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කෙරිණි. මෙම පස් අවුරුදු ව්‍යාපෘතිය, ප්‍රජා සහභාගීත්වය සහ විද්‍යාත්මක අධීක්ෂණය තුළින් දිගුකාලීන තිරසරභාවය සහතික කරමින්, ජෛව විවිධත්ව සංරක්ෂණය, පර්යේෂණ හා අධ්‍යාපනය, සහ මහජන දැනුවත් කිරීම යන අංශ ඒකාබද්ධ කරයි.

එමෙන්ම, 2024 අගෝස්තු 7 වන දින, නෝර්ත් මැනුෆැක්චරින් පුද්ගලික සමාගම, වන්නියගම රක්ෂිත වනාන්තරයේ හායනයට ලක් වූ අක්කරයක භූමි ප්‍රමාණයක් ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා තිරසරභාවය සඳහා වන මධ්‍යස්ථානය සමඟ හවුල්කාරිත්වයක් ගොඩනගාගනු ලැබීය. මෙම වැඩසටහන දේශීය ශාක විශේෂ යොදා ගනිමින් වන වගාව සිදුකිරීම පිළිබඳ අවධාරණය කරන අතර, එය නෝර්ත් මැනුෆැක්චරින් සමාගමේ පාරිසරික තිරසරභාවය සඳහා වූ හිප්‍රායට ද අනුකූල වේ.

මෙම හවුල්කාරිත්වයන් මගින් කර්මාන්ත-විශ්වවිද්‍යාල අතර සහයෝගීතාවයේ සාර්ථක පිළිබඳ නිදසුන් සපයන අතර, ශ්‍රී ලංකාවේ පර්යේෂණ, අධ්‍යාපනය, සහ පාරිසරික ප්‍රතිසංස්කරණයන් ඉදිරියට පවත්වාගෙන යමින්, සංරක්ෂණ ප්‍රයත්නයන් සඳහා පෞද්ගලික අංශයේ මැදිහත්වීමේ විභවය පෙන්නුම් කරයි.



රූපය: යගිරල වන රක්ෂිතයේ ප්‍රතිෂ්ඨාපන වැඩසටහන සඳහා සීමා සහිත කොමර්ෂල් බැංකු පොදු සමාගම සමඟ අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම

## තිරසරභාවය පිළිබඳ අනාගත දැක්ම

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය තිරසරභාවය සඳහා අඛණ්ඩව කැපවී කටයුතු කරන අතර, ඉදිරි වසර කිහිපය තුළ සිය තිරසර ඉලක්ක තවදුරටත් සාක්ෂාත් කර ගැනීම සඳහා උපායමාර්ගික වැඩසටහන් කිහිපයක් සැලසුම් කර ඇත.

### කාබන් උදාසීනත්වය සහ හරිත බලශක්ති ව්‍යාප්තිය

"දකුණු ආසියාවේ ප්‍රථම කාබන් උදාසීන විශ්වවිද්‍යාලය" බවට පත්වීමේ අභිලාෂය මත ගොඩනැගෙමින්, 2030 වන විට අතිරේක වන අක්කර 500ක් ආවරණය වන පරිදි සිය කාබන් අවම කිරීමේ ව්‍යාපෘති පුළුල් කිරීමට විශ්වවිද්‍යාලය සැලසුම් කරයි. මීට අමතරව, 2030 වන විට විශ්වවිද්‍යාල පරිශ්‍රයේ බලශක්ති අවශ්‍යතාවයෙන් 10%ක් පුනර්ජනනීය ප්‍රභවයන්ගෙන් (සූර්ය බලශක්තිය) ලබා ගැනීමට ද ඉලක්ක කර ඇත.

### හරිත විශ්වවිද්‍යාල පරිශ්‍රයක් ස්ථාපිත කිරීම සඳහා පුනර්ජනනීය බලශක්තිය ප්‍රවර්ධනය

විශ්වවිද්‍යාලයේ තිරසර පැවැත්ම සඳහා වන මධ්‍යස්ථානයේ ද සහාය ඇතිව කිලෝ වොට් 17.68 ක සූර්ය බලශක්ති පද්ධතියක් විශ්වවිද්‍යාල පරිශ්‍රයේ ස්ථාපිත කිරීම සාර්ථකව නිම කර ඇත. මෙම සන්ධිස්ථානය, විශ්වවිද්‍යාලය ප්‍රමුඛ පෙළේ හරිත පරිශ්‍රයක් බවට පරිවර්තනය කිරීමේ වැදගත් පියවරක් සනිටුහන් කරන අතර එය විශ්වවිද්‍යාලයේ කාබන් විමෝචනය සහ බලශක්ති පිරිවැය සක්‍රියව අඩු කිරීමට දායක වේ. මෙම වැඩසටහන මගින් පිරිසිදු හා පුනර්ජනනීය බලශක්ති විසඳුම් ප්‍රවර්ධනය කරනවා පමණක් නොව, විශ්වවිද්‍යාල මෙහෙයුම් තුළ තිරසරභාවය ඒකාබද්ධ කිරීම සඳහා ආදර්ශයක් ලෙස ද ක්‍රියා කරයි. මෙම ව්‍යාපෘතිය මගින් පාරිසරිකව වගකීම් සහගත යටිතල පහසුකම් පුළුල් ලෙස වර්ධනය කරනු ඇති අතරම උසස් අධ්‍යාපන ආයතන තුළ තිරසර බලශක්ති භාවිතය දිරිමත් කරනු ඇතැයි ද අපි අපේක්ෂා කරමු.

### 2030 වර්ෂය වන විට අපද්‍රව්‍යවලින් තොර විශ්වවිද්‍යාල පරිශ්‍රයක් බවට පත්වීම

ප්‍රතිචක්‍රීකරණය, කොම්පෝස්ට් කිරීම, සහ ප්ලාස්ටික් එක්වරක් පමණක් භාවිතා කිරීම සහ භාවිතය අවම කිරීම වැනි අපද්‍රව්‍ය කළමනාකරණ පිළිවෙත් වැඩිදියුණු කිරීම තුළින්, 2030 වර්ෂය වන විට අපද්‍රව්‍යවලින් තොර ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමට විශ්වවිද්‍යාලය අදහස් කරයි. අපද්‍රව්‍ය අවම කිරීම සහ චක්‍රීය ආර්ථික මූලධර්ම පිළිබඳව කාර්ය මණ්ඩලය සහ සිසුන් දැනුවත් කිරීම සඳහා වැඩසටහන් ද හඳුන්වා දෙනු ලැබේ.

### තිරසර පර්යේෂණ සහ සංවර්ධනය

2030 වර්ෂය වන විට, දේශගුණික අනුවර්තනය, ජෛව විවිධත්ව සංරක්ෂණය, සහ තිරසර නාගරික සැලසුම්කරණය කෙරෙහි විශේෂයෙන් අවධානය යොමු කරමින්, තිරසරභාවය හා සම්බන්ධ පර්යේෂණ ප්‍රකාශන සංඛ්‍යාව 10% කින් වැඩි කිරීමට අපි ඉලක්ක කරමු. ගෝලීය තිරසර කතිකාවතට දායක වීමේ අරමුණින් ජාත්‍යන්තර ආයතන සමඟ අපගේ සහයෝගීතා පර්යේෂණ වැඩසටහන් ද පුළුල් කරනු ඇත.

## අධ්‍යාපනය තුළ තිරසරභාවය

2030 වර්ෂය වන විට සෑම සිසුවෙකුම තිරසර පිළිවෙත් පිළිබඳ මනා අවබෝධයක් සහිතව උපාධි ලබා ගැනීම සහතික කරමින්, අපගේ විෂය මාලාවට විවිධ විෂය ක්ෂේත්‍ර හරහා තිරසරභාවය කේන්ද්‍ර කරගත් පාඨමාලා ඒකක තවදුරටත් ඒකාබද්ධ කරනු ඇත. තිරසරභාවය සහ හරිත තාක්ෂණයන් පිළිබඳව අවධානය යොමු කරන නව උපාධි පාඨමාලා 2026 වන විට හඳුන්වා දීමට කටයුතු කරනු ලැබේ.

## ප්‍රජා වැඩසටහන් සහ හවුල්කාරිත්වයන්

පෞද්ගලික සහ රාජ්‍ය අංශයේ හවුල්කරුවන් සමඟ සහයෝගයෙන් සිය ප්‍රජා සත්කාරක වැඩසටහන් පුළුල් කිරීමට විශ්වවිද්‍යාලය සැලසුම් කරයි. දැනුම හුවමාරුව තුළින් ප්‍රදේශයේ ප්‍රජාවන් සවිබල ගැන්වීම අරමුණු කරගෙන 2025 වන විට, තිරසර කෘෂිකර්මය, පුනර්ජනනීය බලශක්තිය, සහ පාරිසරික ප්‍රතිසංස්කරණය සම්බන්ධ නව ප්‍රජා ව්‍යාපෘති 10ක් ආරම්භ කිරීමට අපි ඉලක්ක කරමු.

## තිරසර යටිතල පහසුකම් සංවර්ධනය

2030 වන විට, විශ්වවිද්‍යාල පරිශ්‍රයේ සියලුම නව ගොඩනැගිලි හරිත ගොඩනැගිලි ප්‍රමිතීන්ට අනුකූලව නිර්මාණය කරනු ලබන අතර, වත්මන් ප්‍රමිතීන්ට සාපේක්ෂව බලශක්ති පරිභෝජනය 30% කින් සහ ජල භාවිතය 20% කින් අඩු කිරීම එහි ඉලක්කය වේ. බලශක්ති කාර්යක්ෂමතාව සහ ජල සංරක්ෂණය වැඩි දියුණු කිරීම සඳහා පැරණි ගොඩනැගිලි නවීකරණය කිරීම ප්‍රමුඛතාවයක් වනු ඇත.

## නිගමනය

2024 වසරේදී පාරිසරික සංරක්ෂණය, පර්යේෂණ, සහ ප්‍රජා මූලික තිරසර වැඩසටහන් ඉදිරියට ගෙන යාම සඳහා තිරසර පැවැත්ම සඳහා වන මධ්‍යස්ථානය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කර ඇත. වන ප්‍රතිෂ්ඨාපනය, විද්‍යාත්මක පර්යේෂණ, පුනර්ජනනීය බලශක්ති භාවිතය, සහ අධ්‍යාපනික වැඩසටහන් තුළින්, තිරසර පැවැත්ම සඳහා වන මධ්‍යස්ථානය ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්ව සංරක්ෂණය, දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දීමේ හැකියාව, සහ තිරසර සංවර්ධනය සඳහා දායක වී ඇත. ශක්තිමත් හවුල්කාරිත්වයන් වර්ධනය කරමින් සහ නව්‍ය විසඳුම් ඒකාබද්ධ කරමින්, තිරසර පැවැත්ම සඳහා වන මධ්‍යස්ථානය තිරසරභාවය පිළිබඳව නායකයෙකු ලෙස අඛණ්ඩව කටයුතු කරන අතර අනාගත පරම්පරාවන් සඳහා වඩා තිරසර හරිත අනාගතයක් සහතික කරයි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය රාජ්‍ය ආයතනයක් වශයෙන් එහි ගුණාත්මකභාවය සහ ප්‍රමිතීන් පවත්වාගෙන යාමේ වගකීම ඉටු කිරීම සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. ගුණාත්මකභාවය තහවුරු කිරීම යනු, විශ්වවිද්‍යාලයක් මගින් පිරිනමනු ලබන සම්මානවල ප්‍රමිතියත්, අධ්‍යාපන ලබාදීමේ සහ දැනුම උත්පාදනය කිරීමේ ගුණාත්මකභාවයත් පවත්වාගෙන යන බවට විශ්වාසයෙන් හා ස්ථිරව සහතික විය හැකි ක්‍රමවේදයයි.

මෙම සන්දර්භය තුළ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතික කිරීමේ සභාව (QAC) විසින් ස්ථාපිත කර ඇති ජාතික තත්ත්ව තහවුරු කිරීමේ කාර්ය රාමුවට අනුකූලව, තත්ත්ව සහතික කිරීමේ ක්‍රියාකාරකම් සිදුකිරීම සහ එම ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම විශ්වවිද්‍යාලයේ තත්ත්ව සහතිකකරණ මධ්‍යස්ථානය (CQA) සතු වගකීම වේ. මහාචාර්ය ආර්. බී. මාරසිංහ මහතා විශ්වවිද්‍යාලයේ තත්ත්ව සහතිකකරණ මධ්‍යස්ථානයේ (CQA) අධ්‍යක්ෂ වශයෙනුත්, ආචාර්ය එස්. වීරසිංහ මහතා එහි නියෝජ්‍ය අධ්‍යක්ෂ වශයෙනුත් අඛණ්ඩව කටයුතු කරන ලදී.

2024 වර්ෂය තුළ තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් පහත දැක්වේ.

## 1. විෂයමාලා සමාලෝචන කමිටුව (CRC):

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සනාතන සභා අනුකමිටුවක් ලෙස ස්ථාපිත කරන ලද විෂයමාලා සමාලෝචන කමිටුව, ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවේ මාර්ගෝපදේශවලට අනුකූලව බොහෝ උපාධි සහ පශ්චාත් උපාධි අධ්‍යයන වැඩසටහන් සමාලෝචනය කර ඇත. නව පීඨ මෙන්ම නව අධ්‍යයනාංශ පිහිටුවීම සඳහා වන යෝජනා ද එමගින් සමාලෝචනය කෙරේ. 2024 වර්ෂය තුළ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ විෂයමාලා සමාලෝචන කමිටුව විසින් සමාලෝචනය කරන ලද අධ්‍යයන වැඩසටහන් පහත දැක්වේ.

| අනු අංකය | අධ්‍යයන වැඩසටහනේ නම | ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවේ මට්ටම | අදාළ පීඨය | විෂයමාලා සමාලෝචන කමිටු දිනය |
|---|---|---|---|---|
| නව උපාධි වැඩසටහන් වල විෂය මාලාව: | | | | |
| | විද්‍යාපති/ ශාස්ත්‍රපති /කළමනාකරණපති උපාධිය | | | |
| 1 | ව්‍යවහාරික භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය | 10 වන මට්ටම | උපාධි අධ්‍යයන පීඨය | 18.01.2024 |
| 2 | අලෙවිකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය | 10 වන මට්ටම | ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධි | 18.01.2024 |

| | | | | |
|---|---|---|---|---|
| | | | මධ්‍යස්ථානය - කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨය | |
| 3 | තාක්ෂණය කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය | 10 වන මට්ටම | උපාධි අධ්‍යයන පීඨය | 18.07.2024 |
| 4 | ව්‍යවහාරික මූල්‍ය පිළිබඳ විද්‍යාපති උපාධිය | 10 වන මට්ටම | ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධි මධ්‍යස්ථානය - කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨය | 19.09.2024 |

| | | | | |
|---|---|---|---|---|
| | ශාස්ත්‍රපති උපාධි | | | |
| 1 | ව්‍යවහාරික භෞතික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 9 වන මට්ටම | උපාධි අධ්‍යයන පීඨය | 18.01.2024 |
| 2 | අලෙවිකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 9 වන මට්ටම | ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධි මධ්‍යස්ථානය - කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨය | 18.01.2024 |
| 3 | රාජ්‍ය පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 9 වන මට්ටම | කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය | 21.03.2024 |
| 4 | තාක්ෂණ කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 9 වන මට්ටම | උපාධි අධ්‍යයන පීඨය | 18.07.2024 |
| | විද්‍යාවේදී උපාධි (ගෞරව) | | | |
| 1 | පොලිමර් නිපැයුම් නිෂ්පාදනය සහ කාර්මික කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (ගෞරව) | 5 වන මට්ටම | බාහිර උපාධි සහ ව්‍යාප්ති පාඨමාලා ඒකකය (අධ්‍යාපන) – ව්‍යවහාරික විද්‍යා පීඨය | 18.01.2024 |
| 2 | තිර මාධ්‍ය අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති ගෞරව උපාධිය | 6 වන මට්ටම | මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය | 21.03.2024 |
| 3 | දත්ත විද්‍යාව සහ කෘතිම බුද්ධිය පිළිබඳ විද්‍යාවේදී | 6 වන | ව්‍යවහාරික විද්‍යා පීඨය | 19.12.2024 |

| | | | | |
|---|---|---|---|---|
| | ගෞරව උපාධිය | මට්ටම | | |
| | ප්‍රථම උපාධි | | | |
| 1 | ආහාර විද්‍යාව සහ තත්ත්ව කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | 5 වන මට්ටම | බාහිර උපාධි සහ ව්‍යාප්ති පාඨමාලා ඒකකය (අධ්‍යාපන) ව්‍යවහාරික විද්‍යා පීඨය | 16.10.2024 |
| | ප්‍රථම උපාධි (සංශෝධිත විෂයමාලා) | | | |
| 1 | භූ තාක්‍ෂණය පිළිබඳ විශේෂවේදී - (සිවිල් හා පාරිසරික තාක්ෂණ අධ්‍යයනාංශය) | 6 වන මට්ටම | ඉංජිනේරු පීඨය | 21.03.2024 |
| 2 | බලශක්තිය හා පාරිසරික තාක්ෂණය පිළිබඳ විශේෂවේදී – (සිවිල් හා පාරිසරික තාක්ෂණ අධ්‍යයනාංශය) | 6 වන මට්ටම | ඉංජිනේරු පීඨය | 21.03.2024 |
| 3 | ඉදිකිරීම් සහ ගොඩනැගිලි සේවා තාක්ෂණය පිළිබඳ විශේෂවේදී - (සිවිල් හා පාරිසරික තාක්ෂණ අධ්‍යයනාංශය සිවිල් හා පාරිසරික තාක්ෂණ අධ්‍යයනාංශය) | 6 වන මට්ටම | ඉංජිනේරු පීඨය | 21.03.2024 |
| 4 | මෝටර් රථ තාක්ෂණය පිළිබඳ විශේෂවේදී - ද්‍රව්‍ය හා යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනාංශය (ද්‍රව්‍ය හා යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනාංශය) | 6 වන මට්ටම | ඉංජිනේරු පීඨය | 21.03.2024 |
| 5 | පොලිමර් සැකසුම් තාක්ෂණය පිළිබඳ විශේෂවේදී - (ද්‍රව්‍ය හා යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනාංශය) | 6 වන මට්ටම | ඉංජිනේරු පීඨය | 21.03.2024 |
| 6 | යාන්ත්‍රික තාක්‍ෂණය පිළිබඳ විශේෂවේදී - (ද්‍රව්‍ය හා යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනාංශය) | 6 වන මට්ටම | ඉංජිනේරු පීඨය | 21.03.2024 |
| 7 | කාර්මික ජෛව පද්ධති තාක්ෂණය පිළිබඳ විශේෂවේදී – (ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යයනාංශය ) | 6 වන මට්ටම | ඉංජිනේරු පීඨය | 21.03.2024 |
| 8 | කෘෂිකර්ම සහ පාරිසරික තාක්ෂණය පිළිබඳ විශේෂවේදී - ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යයනාංශය- (ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යයනාංශය) | 6 වන මට්ටම | ඉංජිනේරු පීඨය | 21.03.2024 |
| 9 | ආහාර සැකසුම් තාක්ෂණය පිළිබඳ විශේෂවේදී – (ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යයනාංශය) | 6 වන මට්ටම | ඉංජිනේරු පීඨය | 21.03.2024 |

## 2. තත්ත්ව සහතිකකරණයය පිළිබඳ සනාතන සහා ස්ථාවර කමිටුව (NCQA)

තත්ත්ව සහතිකකරණය පිළිබඳ සනාතන සභා ස්ථාවර කමිටුව, නිවාඩු දිනයක් නොවූයේනම් මිස, සෑම මසකම අවසාන බ්‍රහස්පතින්දා දින ප.ව. 1.00 ට රැස්වූ අතර. 2024 වර්ෂයේ රැස්වීම් විස්තර පහත පරිදි වේ.

| රැස්වීම් අංකය | දිනය | සහභාගිවූ සංඛ්‍යාව |
|---|---|---|
| 33 | 24.01.2024 | 21 |
| 34 | 06.03.2024 | 18 |
| 35 | 28.03.2024 | 16 |
| 36 | 25.04.2024 | 16 |
| 37 | 30.05.2024 | 08 |
| 38 | 25.07.2024 | 15 |
| 39 | 29.08.2024 | 17 |
| 40 | 26.09.2024 | 18 |
| 41 | 24.10.2024 | 16 |
| 42 | 28.11.2024 | 15 |
| 43 | 19.12.2024 | 21 |

## 3. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආයතනික සමාලෝචනය (IR):

ආයතනික සමාලෝචනය පැවැත්වීමට පෙර ස්වයං ඇගයීම් වාර්තාවක් (SER) ලිවීම අනිවාර්ය වන බැවින්, ස්වයං ඇගයීම් වාර්තාවේ එක් එක් නිර්ණායකය ලිවීම සඳහා කමිටු දහයක් (10) පත් කිරීමට තීරණය කරන ලදී. 2024 වර්ෂය සඳහා යාවත්කාලීන කරන ලද එක් එක් කමිටුවේ සභාපති සහ සාමාජිකයින් පහත දක්වා ඇත. කමිටුවල සභාපතිවරුන්ගේ සහ සාමාජිකයින්ගේ නිර්දේශ්‍ය විෂය (TOR) මෙයට අමුණා ඇත.

### නිර්ණායකය 1 - පාලනය සහ කළමනාකරණය

1. ජ්‍යෝෂ්ඨ මහාචාර්ය කේ.ඩී. ගුණවර්ධන – ක.අ.වා.පීඨය (නියෝජිත) (සභාපති)
2. මහාචාර්ය ඒ.එම්.බී. ප්‍රියදර්ශනී – ස.සෞ.වි. පීඨය (නියෝජිත)
3. ආචාර්ය ජනිත වල්පිට – නා. ජ. ජෛව.පීඨය (නියෝජිත)
4. නිශාන්ති පලහසිංහ මිය, ජ්‍යෝෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/විභාග
5. ඒ.ඒ.කේ.එන්. රණසිංහ මිය, නියෝජ්‍ය මූල්‍යාධිකාරී/මුදල්
6. වී.බී. ලැබ්රෝයි මිය – පරි. පීඨය (නියෝජිත)
7. එච්.එල්.එල්. දිලංකාර මහතා – ශා. අ. ඒකකය (නියෝජිත)

## නිර්ණායකය 2 - කාර්ය මණ්ඩලයේ ශක්තිය සහ ගුණාත්මකභාවය

1. මහාචාර්ය එස්.ටී.ඩබ්.එස්. යාපා –කා. ම. සං. ම. (නියෝජිත) (සභාපති)
2. ආචාර්ය එරන්දි පතිරණ – නා. ජ. ජෛව.පීඨය (නියෝජිත)
3. ආචාර්ය සකුරා බෝගොඩ – තා.පීඨය (නියෝජිත)
4. නිරෝෂා මධුවන්ති මහත්මිය –වෘ. මා. ඒකකය (නියෝජිත)

## නිර්ණායකය 3 – විෂය මාලා සැලසුම් කිරීම සහ වැඩසටහන් සංවර්ධනය

1. මහාචාර්ය දිනිති පීරිස් –ව්‍යා. වි. පීඨය (නියෝජිත) (සභාපතිනිය)
2. ආචාර්ය තිළිණි කළුආරච්චි – වෛද්‍ය වි. පීඨය (නියෝජිත)
3. ආචාර්ය තිළිණි කළුආරච්චි – වෛද්‍ය වි. පීඨය (නියෝජිත)
4. ආචාර්ය දුලිනි මුදුන්කොටුව –ඉංජි. පීඨය (නියෝජිත)
5. ආචාර්ය ප්‍රියකේ පාලිපාන – ද. වෛ. පීඨය (නියෝජිත)

## නිර්ණායකය 4 - ඉගැන්වීම්-ඉගෙනුම්

1. ආචාර්ය මහීකා සෙනෙවිවික්‍රම – වෛද්‍ය වි. පීඨය (නියෝජිත) (සභාපතිනිය)
2. ආචාර්ය චන්දන හේවාගේ – වෛද්‍ය වි. පීඨය (නියෝජිත)
3. ආචාර්ය ධනුෂ්ක උදයංග – තා.පීඨය (නියෝජිත)
4. බී.එන්.එම්. පෙරේරා මහතා – ශා. අ. ඒකකය (නියෝජිත)

## නිර්ණායකය 5 – ඉගෙනුම් සම්පත්, ශිෂ්‍ය සහාය සහ ප්‍රගතිය

1. මහාචාර්ය බී.ඩබ්.ආර්. දමයන්ති – මා.ශා.ස.වි.පීඨය (නියෝජිත) (සභාපතිනිය)
2. ආචාර්ය මනෝජා සමරදිවාකර – පුස්තකාලය (නියෝජිත)
3. ශිරාණි රණසිංහ මහත්මිය – පුස්තකාලය (නියෝජිත)
4. චතුරංගනී තෙන්නකෝන් මහත්මිය – වෘ. මා. ඒකකය (නියෝජිත)
5. එන්.එන්. විදානගේ මහත්මිය – ශා. අ. ඒකකය (නියෝජිත)
6. ජේ.එම්.ආර්.එම්. කුලතිලක මහත්මිය – ශා. අ. ඒකකය (නියෝජිත)

## නිර්ණායකය 6 – ශිෂ්‍ය ඇගයීම සහ ප්‍රදානයන්

1. මහාචාර්ය එම්.ඒ.කේ. ශ්‍රීලතා – ක.අ.වා.පීඨය (නියෝජිත) (සභාපතිනිය)
2. ආචාර්ය සමුදි කළුබෝවිල – ද. වෛ. පීඨය (නියෝජිත)
3. ආචාර්ය සුරනි චතුරිකා – නා. ජ. ජෛව.පීඨය (නියෝජිත)

## නිර්ණායකය 7 – පශ්චාත් උපාධි අධ්‍යයන, පර්යේෂණ, නවෝත්පාදන සහ වාණිජකරණය

1. මහාචාර්ය සුනේත්‍රා තෙන්නකෝන් – උ.අ.පීඨය (නියෝජිත) (සභාපතිනිය)
2. මහාචාර්ය රසික පෙරේරා – උ.අ.පීඨය (නියෝජිත)
3. ආචාර්ය නිලූෂි නුගාරා – උ.අ.පීඨය (නියෝජිත)
4. ආචාර්ය එල්.ජී.ඩී. දර්ශන – සම.සෞ.වි.පීඨය (නියෝජිත)

## නිර්ණායකය 8 – දූරස්ථ අධ්‍යාපනය

1. ආචාර්ය ශාන්ත විජේසිංහ – මා.ශා.ස.වි.පීඨය (නියෝජිත) (සභාපති)
2. ආචාර්ය ප්‍රබානි ලියනගේ – තා.පීඨය (නියෝජිත)
3. ආචාර්ය ඩී.ජී.එන්.ඩී. ජයරත්න – පරි. පීඨය (නියෝජිත)
4. ජේ.ජී. චාන්දනී මහත්මිය – පුස්තකාලය (නියෝජිත)

## නිර්ණායකය 9 – ප්‍රජා සහභාගීත්වය, උපදේශනය සහ ව්‍යාප්තිය

1. ආචාර්ය නිශාන් ධර්මවීර – ඉංජි. පීඨය (නියෝජිත) (සභාපති)
2. මහාචාර්ය චායනිකා පදුමදාස – ව්‍යා. වි. පීඨය (නියෝජිත)
3. තුෂාරි මල්කාන්ති මිය (නියෝජ්‍ය ලේඛකාධිකාරී/සුබසාධන)
4. ශෂිකා නිරෝෂණී මහත්මිය – වෘ. මා. ඒකකය (නියෝජිත)

## නිර්ණායකය 10 – තත්ත්ව සහතික කිරීම

1. මහාචාර්ය කේ.පී.එල්. චන්ද්‍රලාල් – වෛද්‍ය වි. පීඨය (නියෝජිත) (සභාපති)
2. ආචාර්ය සාෂි වීරසිංහ – නියෝජ්‍ය අධ්‍යක්ෂ-ත.ස.ම/ ව්‍යා. වි. පීඨය (නියෝජිත)
3. ආචාර්ය ඒ.එච්.ටී.එස්. කුලරත්න – ඉංජි. පීඨය – (නියෝජිත)
4. ආචාර්ය ආර්.එම්.ටී.බී. අබේරත්න – සම.සෞ.වි.පීඨය – (නියෝජිත)

ස්වයං ඇගයීම් වාර්තාව කඩිනම් කර සම්පූර්ණ කිරීම සඳහා, අදාළ පීඨවල පීඨාධිපතිවරුන් විසින් ඉදිරිපත් කරන ලද නාමයෝජනා සහිතව එක් එක් පීඨය සඳහා නව සාමාජිකයින් පත් කිරීමට සහ සාක්ෂි රැස් කිරීමේ කමිටුවක් ආරම්භ කිරීමට ලේඛන කමිටුව තීරණය කර ඇත. පහත දැක්වෙන්නේ පත් කරන ලද සාමාජිකයින්ගේ ලැයිස්තුව වන අතර අනෙකුත් පීඨවල කටයුතු සිදුවෙමින් පවතී.

**<u>පීය මගින් ඉදිරිපත් කරන ලද නාමයෝජනා අනුව සාක්ෂි රැස් කිරීමේ කමිටුව සඳහා පත් කරන ලද සාමාජිකයින්.</u>**

## 1. වෛද්‍ය විද්‍යා පීඨය

- ආචාර්ය එන්.එල්.ආර්. ඉන්දික - ජෛව රසායන විද්‍යා අධ්‍යයනාංශය
- ඩී. මොරවක මහතා - තොරතුරු තාක්ෂණ ඒකකය
- ආචාර්ය අබ්‍රත්න අමිස් - ප්‍රතිශක්තිකරණවේද හා අණුක වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය
- ආචාර්ය ටී.එන්.ඩී. අල්විස් - ප්‍රතිශක්තිකරණවේද හා අණුක වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය
- ආචාර්ය පී.වී. ලෝගෙන්තිරන් - කායික විද්‍යා අධ්‍යයනාංශය
- කාවින්ද්‍යා මානවි මිය – අභ්‍යන්තර තත්ත්ව සහතික මධ්‍යස්ථානයේ නිදර්ශක

## 2. තාක්ෂණවේද පීඨය

- උදානි ගුණවර්ධන මිය - BST අධ්‍යයනාංශය
- ඉංජිනේරු යහදිසි පෙරේරා - CET අධ්‍යයනාංශය
- මධුෂිකා හංසමාලි පෝල් මිය - ICT අධ්‍යයනාංශය
- හිරාන් රාජසූරිය මහතා - MTT අධ්‍යයනාංශය
- ගිත්මා මිය - SFT අධ්‍යයනාංශය

## 3. පරිගණක පීඨය

- තිළිණ ජයතිලක මහතා - කථිකාචාර්ය- කොන්ත්‍රාත් පදනම මත
- එම්.එම්.වී. සේනානායක මිය - ආධුනික කථිකාචාර්ය
- ආර්.ජේ.පී.කේ. රාජකරුණා මිය - ආධුනික කථිකාචාර්ය

## 4. සම සෞඛ්‍ය විද්‍යා පීඨය

- ආචාර්ය එල්.ජී.ටී. ධාරණා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, MLS අධ්‍යයනාංශය
- ටී. එම්. ඩී. වයි. ඩී. විමලජීව මිය, ආධුනික කථිකාචාර්ය, හෙද අධ්‍යයනාංශය
- පී. එම්. රණසිංහ මිය, ආධුනික කථිකාචාර්ය, දෘෂ්ටිමිතිය අධ්‍යයනාංශය
- හංසනී හේමගේ මිය, ආධුනික කථිකාචාර්ය, ඖෂධවේද අධ්‍යයනාංශය

## 5. ව්‍යවහාරික විද්‍යා පීඨය

- කේ.ඒ.එස්.කේ. සෝමරත්න මහතා, භෞතික විද්‍යා අධ්‍යයනාංශය

- ඩී.එස්.එල්. පෙරේරා මහතා, ක්‍රීඩා විද්‍යා අධ්‍යයනාංශය
- තර්කා මන්දකිනි මිය, උද්භිද විද්‍යා අධ්‍යයනාංශය
- ආචාර්ය ටී. ජී. ජී. උත්පලා, ආහාර විද්‍යා අධ්‍යයනාංශය
- ආචාර්ය සඳලි දිසානායක, වන හා පාරිසරික විද්‍යා අධ්‍යයනාංශය

## 4. විෂයමාලා, සවිස්තරාත්මක විෂය නිර්දේශ සහ පාඨමාලා පිරිවිතරවල හිමිකාරිත්වය සඳහා ප්‍රතිපත්ති සහ අතුරු ව්‍යවස්ථා සකස් කිරීම

තත්ත්ව සහතික කිරීම සඳහා වූ සනාතන සභා ස්ථාවර කමිටුවේ පැවති සාකච්ඡාවකට අනුව, විෂයමාලා, සවිස්තරාත්මක විෂය නිර්දේශ සහ පාඨමාලා පිරිවිතරවල හිමිකාරිත්වය සඳහා ප්‍රතිපත්ති සහ අතුරු ව්‍යවස්ථා සකස් කිරීමට කමිටුව තීරණය කරන ලදී. ප්‍රතිපත්ති සකස් කිරීම ආරම්භ කිරීම සඳහා පහත සාමාජිකයින් තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය විසින් පත් කරනු ලැබේ.

1. මහාචාර්ය චාමලි නාහල්ලගේ, සම්බන්ධීකාරක/IQAC –FHSS (සභාපතිනිය)
2. මහාචාර්ය උපුල් සුබසිංහ, පීඨාධිපති/FAS
3. මහාචාර්ය ප්‍රසාද් ජයවීර, පීඨාධිපති/FOC
4. ආචාර්ය තුසිත බී. අබේසේකර - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/නීති අධ්‍යයන ඒකකය – FMSC
5. මහාචාර්ය ආර්.බී. මාරසිංහ, අධ්‍යක්ෂ/CQA
6. ආචාර්ය සාෂි වීරසිංහ, නියෝජ්‍ය අධ්‍යක්ෂ, සම්බන්ධීකාරක/IQAC-FAS

## 5. විශ්වවිද්‍යාලයේ පවතින ප්‍රතිපත්ති සහ අතුරු ව්‍යවස්ථා සමාලෝචනය

තත්ත්ව සහතිකකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ මහාචාර්ය මාරසිංහ සහ විද්‍යා පීඨයේ අභ්‍යන්තර තත්ත්ව සහතිකකරණ මධ්‍යස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ආචාර්ය සාෂි වීරසිංහ විසින් පවතින ප්‍රතිපත්ති සමාලෝචනය කර අවශ්‍ය වෙනස්කම් සිදු කිරීම අඛණ්ඩව සිදු කරන ලදී.

## 6. නව ප්‍රතිපත්ති සම්පාදනය:

අවශ්‍යතාවය පැන නැඟුණු විට ප්‍රතිපත්ති සකස් කිරීම කළ යුතුය. මේ සඳහා, නව ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම පිණිස පුද්ගලයින් සහ කණ්ඩායම් වෙත වගකීම් භාර දෙන ලදී. පහත දැක්වෙන පරිදි අදාළ වගකිවයුතු පුද්ගලයින් එක් එක් ප්‍රතිපත්තිය සංවර්ධනය කිරීමේ ක්‍රියාවලියෙහි නිරතව සිටී.

1. කර්මාන්ත පාදක පුහුණුව පිළිබඳ ප්‍රතිපත්තිය - මහාචාර්ය සඳුන් සෙනරත්, ව්‍යවහාරික විද්‍යා පීඨය
2. මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ප්‍රතිපත්තිය - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය හේමන්ත කොට්ටවත්ත, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨය

3. සම වයස් ඇගයීම පිළිබඳ ප්‍රතිපත්තිය, ඉගැන්වීම් සහ ඉගෙනුම් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රතිපත්තිය (ඉගැන්වීම් සහ ඉගෙනුම් පිළිබඳ පවතින ප්‍රතිපත්තිය ආරම්භ කිරීම හෝ යාවත්කාලීන කිරීම), විශේෂ අවශ්‍යතා ඇති සිසුන් සඳහා ඉගැන්වීම්-ඉගෙනුම් සහ ඇගයීම පිළිබඳ ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ, ඉගෙනුම්කරුගේ ප්‍රගතියට පහසුකම් සැලසීම පිළිබඳ ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ, විවෘත අධ්‍යාපනික සම්පත් භාවිතය පිළිබඳ ප්‍රතිපත්තිය, ඉගෙනුම් ද්‍රව්‍ය නිෂ්පාදනය සහ හිමිකාරිත්වය පිළිබඳ ප්‍රතිපත්තිය, කෘත්‍රිම බුද්ධිය (AI) - තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය (CQA) පිළිබඳ ප්‍රතිපත්තිය
4. දුරස්ථ අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්තිය – මහාචාර්ය ආර්.බී. මාරසිංහ/අධ්‍යක්ෂ ත.ස. මධ්‍යස්ථානය වින්දිතයින්ට සහාය වීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම පිළිබඳ ප්‍රතිපත්තිය - ආචාර්ය තුසිත අබේසේකර
5. පශ්චාත් උපාධි අධීක්ෂණය පිළිබඳ ප්‍රතිපත්තිය / අතුරු ව්‍යවස්ථා - මහාචාර්ය රසික පෙරේරා/පීඨාධිපති –උපාධි අධ්‍යයන පීඨය
6. බඳවා ගැනීමේදී සම්බන්ධ වන අය විසින් ළබැඳියාවන් අතර ගැටුම් ප්‍රකාශ කිරීමේ ක්‍රියා පටිපාටිය පිළිබඳ ප්‍රතිපත්ති ලේඛනය - මහාචාර්ය ආර්.බී. මාරසිංහ/අධ්‍යක්ෂ ත.ස.ම, ආචාර්ය සාෂි වීරසිංහ නියෝජ්‍ය අධ්‍යක්ෂ- ත.ස.මධ්‍යස්ථානය, මහාචාර්ය රසික පෙරේරා - පීඨාධිපති/උ.අ.පීඨය, ආචාර්ය සංඛ විදිසිංහ - සම්බන්ධීකාරක/ත.ස.ඒකකය – තාක්ෂණ පීඨය සහ ආචාර්ය ටී.බී. අබේසේකර - නීති අධ්‍යයන ඒකකය

## 7. වැඩසටහන් සමාලෝචනය:

පහත දැක්වෙන වැඩසටහන් සමාලෝචනය කරන ලදී.

**(i) බාහිර උපාධි හා විස්තීරණ පාඨමාලා ඒකකය (EDECU):**

පහත උපාධි වැඩසටහන් සඳහා වන ස්ථානීය පරීක්ෂාව මෙසේ පවත්වන ලදී:

1. **වාණිජවේදී (සාමාන්‍ය) උපාධිය** – 2024 ඔක්තෝබර් 03 සහ 04.

   මෙම වැඩසටහන සඳහා 'A' ශ්‍රේණිය හිමි විය.

**(ii) ව්‍යවහාරික විද්‍යා පීඨය:**

පහත උපාධි වැඩසටහන් සඳහා වන ස්ථානීය පරීක්ෂාව මෙසේ පවත්වන ලදී:

1. **ක්‍රීඩා විද්‍යා හා කළමනාකරණ විද්‍යාවේදී ගෞරව උපාධිය** - 2024 ඔක්තෝබර් 23, 24 සහ 25.

   මෙම වැඩසටහන සඳහා 'A' ශ්‍රේණිය හිමි විය.

2. **භෞතික විද්‍යා 'C'** cluster **විද්‍යාවේදී ගෞරව උපාධිය** - 2024 දෙසැම්බර් 18 සහ 19.

මෙම වැඩසටහන සඳහා 'A' ශ්‍රේණිය හිමි විය.

## **8. තත්ත්ව සහතිකකරණ මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබන වැඩමුළු/රැස්වීම්**

| අනු අංකය | දිනය | මාතෘකාව | සම්පත්දායක | සහභාගීවූවන් |
|---|---|---|---|---|
| 1 | 04.01.2024 | ජාත්‍යන්තර සබඳතා පිළිබඳ 2023 ස්වයං ඇගයීම් වාර්තා සකස් කිරීමේ ප්‍රගති සමාලෝචන රැස්වීම | මහාචාර්ය කල්‍යාණි පෙරේරා/ අධ්‍යක්ෂක තත්ත්ව සහතික මධ්‍යස්ථානය | ස්වයං ඇගයීම් වාර්තා ලේඛක කණ්ඩායම්වල සභාපතිවරු |
| 2. | 21.01.2025 | වෛද්‍ය විද්‍යාවේදී* වැඩසටහනට අදාළ විකල්ප අවස්ථා සඳහා අයදුම්පතේ කටයුතු සම්පූර්ණ කිරීම | ආචාර්ය මංජුල වීරසේකර - වැඩසටහන් සම්බන්ධීකාරක | මහාචාර්ය මාරසිංහ පර්යේෂණ සහකාර - තත්ත්ව සහතිකකරණ මධස්ථානය සහ යෝජනා ලිවීමේ කමිටුවේ සාමාජිකයින් |
| 3. | 21.01.2025 | බෞද්ධ අධ්‍යයනය / බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය* සඳහා අයදුම්පතේ කටයුතු සම්පූර්ණ කිරීම | මහාචාර්ය පනහඳුවේ යසස්සි හිමි. | පර්යේෂණ සහකාර තත්ත්ව සහතිකකරණ මධස්ථානය නිදර්ශක- fgs – qa incarge සහ යෝජනා ලිවීමේ කමිටුවේ සාමාජිකයි |
| 4. | 07.04.2025 | අධීක්ෂණය සහ ඇගයීම* පිළිබඳ විද්‍යාපති උපාධිය සඳහා අයදුම්පත්වල කටයුතු සම්පූර්ණ කිරීම | ආචාර්ය මහීකා සෙනෙවිවික්‍රම - වැඩසටහන් සම්බන්ධීකාරක | මහාචාර්ය මාරසිංහ/ තත්ත්ව සහතිකකරණ මධස්ථානයේ අධ්‍යක්ෂ, පර්යේෂණ සහකාර සහ යෝජනා ලිවීමේ කමිටුවේ සාමාජිකයින් |

* අදාළ සම්බන්ධීකාරකවරුන් විසින් රැස්වීම් සංවිධානය කරන ලදී.

## හැඳින්වීම

යහපාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශවල 7.4.1 ඡේදයේ විධිවිධාන යටතේ, 2024 වර්ෂය සඳහා පත් කරන ලද විගණන කමිටුව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ විධායක නොවන, ස්වාධීන පාලක සභා සාමාජිකයින්ගෙන් සමන්විත වේ.

2024 වර්ෂයේදී, ලේඛකාධිකාරී, මූල්‍යාධිකාරී සහ ශ්‍රී ලංකාවේ විගණකාධිපතිවරයාගේ නියෝජිතයා වන විශ්වවිද්‍යාලයේ විගණන අධිකාරීගේ සහභාගීත්වයෙන් විගණන කමිටු රැස්වීම් තුනක් (03) පවත්වන ලදී. විගණන කමිටුව, යහපාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශවල නිශ්චිතව දක්වා ඇති විෂය පථයට අනුව සිය රාජකාරි ඉටු කරන අතර, මූල්‍ය කළමනාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධති ශක්තිමත් කිරීමට සහ විශ්වවිද්‍යාලයේ පරිපාලන ක්‍රියා පටිපාටි වැඩිදියුණු කිරීමට නිර්දේශ ඉදිරිපත් කරයි.

## ප්‍රගතිය

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ, විගණන කමිටුව විසින් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලන සහ ක්‍රියාවලීන් ශක්තිමත් කිරීම සඳහා මග පෑදූ නිර්දේශ සහ යෝජනා කිහිපයක් ඉදිරිපත් කර ඇති අතර, පහත සඳහන් කරුණු ද ඒවාට ඇතුළත් වේ.

අ) මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි බව තහවුරු කිරීම,

ආ) විශ්වවිද්‍යාලයේ වත්කම් සුරක්ෂිත කිරීම සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන පද්ධතියක් පවතින බවට සහතික වීම,

ඇ) අදාළ ගිණුම්කරණ සහ මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් ඇතුළුව, නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල වීම පිළිබඳව නිරීක්ෂණය කිරීම සඳහා විශ්වවිද්‍යාලය විසින් ක්‍රමවේදයක් පවත්වාගෙන යන බවට සහතික වීම,

ඈ) අභ්‍යන්තර විගණන කාර්යයන් පිළිබඳ සමස්ත අධීක්ෂණය සහ වර්ෂය සඳහා වූ අභ්‍යන්තර විගණන සැලැස්ම අනුමත කිරීම,

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ සිදු කරන ලද වැදගත් ක්‍රියාකාරකම් පහත පරිදි සාරාංශ කර ඇත,

- විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් නිකුත් කරන ලද පීය හතේ වාර්තා ඇතුළුව, සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ අභ්‍යන්තර විගණන වාර්තා මත පදනම්ව සමාලෝචන සිදු කිරීම, ඇගයීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.

- විගණකාධිපතිවරයාගේ නියෝජිතයා සමඟ සම්බන්ධීකරණය කරමින්, විගණකාධිපතිවරයාගේ විගණන විමසුම් සහ වාර්තාවල ඉස්මතු කර ඇති දුර්වලතා සහ අඩුපාඩු සම්බන්ධයෙන් පසු විපරම් ක්‍රියාමාර්ග ගන්නා ලෙස විශ්වවිද්‍යාලයේ නිලධාරීන්ට සහ අභ්‍යන්තර විගණකවරයාට උපදෙස් දීම,

- විගණන විමසුම්වලට අදාළව ඉදිරිපත් කරන ලද පිළිතුරු සහ එහි පසු විපරම් ක්‍රියාමාර්ග අඛණ්ඩව නිරීක්ෂණය කිරීම,

- බැඳුම්කර සහ ගිවිසුම් කඩකිරීම් සම්බන්ධ අයකර ගැනීමේ ක්‍රියාවලිය අඛණ්ඩව නිරීක්ෂණය කිරීම

- මානව සම්පත් සංවර්ධනය, සේවක පැමිණීම, ගබඩා භාණ්ඩ සත්‍යාපනය, නේවාසිකාගාර ගාස්තු සහ හිඟ මුදල්, ප්‍රාග්ධන කොන්ත්‍රාත් පරිපාලනය, පර්යේෂණ ප්‍රදාන, ප්‍රසම්පාදන, වැටුප් කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය, වත්කම් කළමනාකරණය, කොන්ත්‍රාත් සේවා බඳවා ගැනීම්, උසස්වීම්, විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම, බැඳුම්කර සහ ගිවිසුම් කඩකිරීම්, පාරිසරික කළමනාකරණය යනාදිය පිළිබඳ පද්ධති සහ අභ්‍යන්තර පාලන වැඩිදියුණු කිරීම සඳහා සමාලෝචනය, ඇගයීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.

- පහත සාරාංශ කර ඇති පරිදි අභ්‍යන්තර විගණන අංශය 2024 වර්ෂය සඳහා සිය අනිවාර්ය පූර්ව-විගණන ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීමට අමතරව, සිය වාර්ෂික විගණන සැලැස්ම ද සම්පූර්ණ කර ඇත.

| විස්තර | ලිපිගොනු ගණන |
|---|---|
| විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල (ස්ථිර) | 90 |
| විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල (තාවකාලික) | 909 |
| විශ්‍රාම පාරිතෝෂික ගෙවීම | 84 |
| විශ්‍රාම වැටුප් නිදහස් කිරීම | 43 |
| බැඳුම්කර සහ ගිවිසුම් ගණනය කිරීම | 76 |
| වැටුප් හිඟ මුදල් | 11 |
| ඉදිකිරීම් කොන්ත්‍රාත් සඳහා ගෙවීම් | 107 |
| කොන්ත්‍රාත් සේවා සඳහා ගෙවීම් (ආරක්ෂක සේවය, පිරිසිදු කිරීමේ සේවය, භාරකරු සහ සනීපාරක්ෂක කම්කරු, උද්‍යාන නඩත්තු සේවය, ගලි පිරිසිදු කිරීම) | 162 |

### රාජ්‍ය විගණන විමසුම් සඳහා පිළිතුරු

විගණකාධිපතිවරයා විසින් නිකුත්කරන ලද සියලුම විගණන විමසුම් සඳහා නියමිත කාලය තුළ පිළිතුරු ලබා දී ඇත.

### අභ්‍යන්තර විගණන විෂය පථයේ ආවරණය

අභ්‍යන්තර විගණන අංශය, අනුමත කරන ලද අභ්‍යන්තර විගණන සැලැස්මෙන් ඔබ්බට සිය අභ්‍යන්තර විගණන කටයුතු පුළුල් කර ඇත. වර්තමානයේදී, අභ්‍යන්තර විගණන අංශය සිය අභ්‍යන්තර විගණන රාජකාරි විශ්වවිද්‍යාලයට පමණක් නොව, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය දක්වා (PIM) ද ව්‍යාප්ත කර ඇත.

### අනාගත ප්‍රගතිය

විශ්වවිද්‍යාලයේ පද්ධති සහ පාලනයන්හි අඛණ්ඩ වැඩිදියුණු කිරීම්වල ප්‍රතිඵලයක් ලෙස, විශ්වවිද්‍යාලයේ මූල්‍ය හා පරිපාලන ක්‍රියා පටිපාටි වැඩිදියුණු කිරීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධති තවදුරටත් ශක්තිමත් කිරීමට නිර්දේශ ඉදිරිපත් කිරීම සහ පද්ධති හා පාලනයන් සමාලෝචනය කිරීම සඳහා සිය අරමුණු තවදුරටත් පුළුල් කිරීම සඳහා විගණන කමිටුව සැලසුම් කරමින් සිටී.

.

සුජීව රාජපක්ෂ
සභාපති, විගණන කමිටුව

**අත්සන ඉංග්‍රීසි පිටපතෙහි දැක්වේ**

**සම්පත් සහ සිසුන් පිළිබඳ විස්තර - 2024 දෙසැම්බර් 31 දිනට**

| පීඨය | අධ්‍යයනාංශ සංඛ්‍යාව | මුළු උපාධි අපේක්ෂකසංඛ්‍යාව (අභ්‍යන්තර) | මුළු අධ්‍යයන සේවක සංඛ්‍යාව | | මුළු අනධ්‍යයන සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | | | ස්ථිර සේවක සංඛ්‍යාව | කොන්ත්‍රාත් සේවක | |
| මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය | 16 | 4080 | 152 | 62 | 57 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 11 | 2758 | 145 | 114 | 126 |
| කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | 12 | 5205 | 192 | 54 | 80 |
| වෛද්‍ය විද්‍යා පීඨය | 17 | 1162 | 105 | 65 | 137 |
| තාක්ෂණ පීඨය | 5 | 1806 | 60 | 61 | 60 |
| ඉන්ජිනේරු පීඨය | 5 | 646 | 20 | 42 | 41 |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | 5 | 796 | 38 | 18 | 34 |
| දන්ත වෛද්‍ය විද්‍යා පීඨය | 9 | 113 | 13 | 4 | 1 |
| නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨය | 3 | 278 | 8 | 3 | 1 |
| පරිගණක පීඨය | 3 | 291 | 8 | 6 | 2 |

## දේශීය සිසුන් පිළිබඳ තොරතුරු

| උපාධි පාඨමාලාව/පීඨය | නව ලියාපදිංචි සංඛ්‍යාව | මුළු ලියාපදිංචි සංඛ්‍යාව | උපාධිධාරීන් ගණන |
|---|---|---|---|
| ***අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින්*** | | | |
| මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය | 1286 | 4080 | 941 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 845 | 2758 | 711 |
| කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | 1301 | 5205 | 1136 |
| වෛද්‍ය විද්‍යා පීඨය | 196 | 1149 | 165 |
| තාක්ෂණ පීඨය | 473 | 1806 | 282 |
| ඉන්ජිනේරු පීඨය | 167 | 641 | 111 |

| | | | |
|---|---|---|---|
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | 199 | 796 | 83 |
| දන්ත වෛද්‍ය පීඨය | 33 | 113 | - |
| නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨය | 92 | 278 | - |
| පරිගණක පීඨය | 150 | 291 | - |
| *බාහිර උපාධි අපේක්ෂකයින්* | 4742 | 17117 | 3429 |
| ***බාහිර උපාධි අපේක්ෂකයින්*** | | | |
| ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | 2577 | 20027 | 292 |
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාව (සාමාන්‍ය) බාහිරඋපාධිය | - | 5345 | 475 |
| සමාජ විද්‍යාවේදී උපාධිය (සාමාන්‍ය) පාරිසරික හා සංවර්ධන අධ්‍යයනය පිළිබඳ බාහිර උපාධිය | 116 | 1041 | 62 |
| ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි (සාමාන්‍ය) බාහිර උපාධිය | - | 3180 | 153 |
| විද්‍යාවේදි ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධිය | - | 6177 | 265 |
| විද්‍යාවේදි රාජ්‍ය කළමනාකරණ (සාමාන්‍ය) බාහිර උපාධිය | 462 | 6704 | 264 |
| වාණිජවේදි (සාමාන්‍ය) බාහිර උපාධිය | 457 | 6681 | 394 |
| විද්‍යාවේදි ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධිය | 214 | 866 | 42 |
| ව්‍යවහාරික පොලිස් අධ්‍යයනය (සාමාන්‍ය) බාහිර උපාධිය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය | 150 | 150 | |
| **මුළු බාහිර උපාධි අපේක්ෂකයින්** | 3976 | 50171 | 1947 |
| ***පශ්චාද් උපාධි අපේක්ෂකයින්*** | | | |
| පශ්චාද් ඩිප්ලෝමා පාඨමාලාව | 21 | 217 | 31 |
| පශ්චාද් උපාධි | 1041 | 2652 | 663 |
| දර්ශනපති උපාධි | 60 | 344 | 30 |
| ආචාර්යය උපාධි | 51 | 322 | 28 |
| මුළු පශ්චාද් උපාධි | 1173 | 3535 | 752 |
| **මුළු සිසුන් සංඛ්‍යාව** | **9891** | **70823** | **6128** |

## විදේශීය සිසුන්ගේ විස්තර

### විදේශීය ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන් ලියාපදිංචිය - 2024

(විදේශීය කාණ්ඩය යටතේ තෝරාගත් සිසුන්)

| පීඨය | අධ්‍යයන වැඩසටහන | අධ්‍යයන වර්ෂය | බඳවාගත් වර්ෂය | ලියාපදිංචි මුළු සිසුන් සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|
| | | | | පුරුෂ | ස්ත්‍රී | මුළු ගණන |
| වෛද්‍ය විද්‍යා පීඨය | එම්.බී.බී.එස්. විද්‍යාවේදී ඉන්ජිනේරු | පළමු වසර | 2022/2023 | 1 | 2 | 3 |
| | | දෙවන වසර | 2021/2022 | 2 | 2 | 4 |
| | | තුන් වන වසර | 2020/2021 | 3 | 2 | 5 |
| | | සිව් වන වසර | 2018/2019 | 1 | | 1 |
| ඉන්ජිනේරු පීඨය | විද්‍යාවේදී ඉන්ජිනේරු | පළමු වසර | 2021/2022 | 2 | | 2 |
| | | දෙවන වසර | 2020/2021 | 3 | | 3 |
| **මුළු සංඛ්‍යාව** | | | | **12** | **6** | **18** |

### විදේශීය පශ්චාත් උපාධි අපේක්ෂක සිසුන් ලියාපදිංචිය - 2024

| අධ්‍යයන වැඩසටහන | රට | ලියාපදිංචි මුළු සිසුන් සංඛ්‍යාව | | |
|---|---|---|---|---|
| | | පුරුෂ | ස්ත්‍රී | මුළු ගණන |
| ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාද් උපාධිය | චීනය | 20 | 9 | 29 |
| බෞද්ධ දර්ශනය පිළිබඳ දර්ශනපති උපාධිය | මියන්මාරය | 1 | 1 | 2 |
| | චීනය | 1 | | 1 |
| බෞද්ධ දර්ශනය පිළිබඳ ආචාර්යය උපාධිය | මියන්මාරය | 0 | 1 | 1 |
| | කාම්බෝජියාව | 2 | 0 | 2 |
| | ඉන්දියාව | 1 | 0 | 1 |
| බෞද්ධ හා පාලි පිළිබඳ ආචාර්යය උපාධිය | මියන්මාරය | 1 | 0 | 1 |
| **මුළු සංඛ්‍යාව** | | **26** | **11** | **37** |

### විදේශ සිසුන්ගේ ආදායම් - 2024

| වැඩසටහන | වාර්ෂික අදායම (රුපියල්) |
|---|---|
| අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින් | 44,443,192.04 |
| පශ්චාද් උපාධි අපේක්ෂකයින් | 1,788,112.63 |
| **මුළු සංඛ්‍යාව** | **46,231,304.67** |

# නව ශිෂ්‍ය ලියාපදිංචිය


## විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2022/2023අධ්‍යයන වර්ෂයට අදාල ව බඳවා ගත් අභ්‍යන්තර ප්‍රථම උපාධි අපේක්ෂකයින් පිළිබඳ තොරතුරු

| පීඨය | බඳවා ගැනීමට එකඟ වූ සංඛ්‍යාව | ලියාපදිංචි වූ සංඛ්‍යාව | අධ්‍යයන වර්ෂය ආරම්භ කල දිනය |
|---|---|---|---|
| මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය | 1130 | 1286 | 2024 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 902 | 845 | 2024 |
| කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | 1260 | 1301 | 2024 |
| වෛද්‍ය විද්‍යා පීඨය | 194 | 196 | 2024 |
| තාක්ෂණ පීඨය | 472 | 473 | 2024 |
| ඉන්ජිනේරු පීඨය | 170 | 167 | 2024 |
| සම සෞඛ්‍ය පීඨය | 240 | 199 | 2024 |
| දන්ත වෛද්‍ය විද්‍යා පීඨය | 30 | 33 | 2024 |
| නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨය | 100 | 92 | 2024 |
| පරිගණක පීඨය | 150 | 150 | 2024 |
| **මුළු ගණන** | **4648** | **4742** | |


## පසුගිය වසර පහ තුළ අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින්ගේ නව ලියාපදිංචි කිරීම් පිළිබඳ තොරතුරු

| ලියාපදිංචි වර්ෂය | වි.ප්‍ර කො.ස අධ්‍යයන වර්ෂය | පීඨය | | | | | | | | | | මුළු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා | ව්‍යවහාරික විද්‍යා පීඨය | කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | වෛද්‍ය විද්‍යා පීඨය | තාක්ෂණ පීඨය | ඉන්ජිනේරු පීඨය | සම සෞඛ්‍ය | දන්ත වෛද්‍ය පීඨය | නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨය | පරිගණක පීඨය | |
| 2020 | 2018/2019 | 939 | 781 | 1216 | 248 | 323 | 120 | | - | - | - | 3627 |
| 2021 | 2019/2020 | 981 | 870 | 1348 | 195 | 493 | 172 | 144 | - | - | - | 4203 |
| 2022 | 2020/2021 | 1022 | 861 | 1395 | 197 | 441 | 169 | 225 | 32 | 104 | - | 4446 |
| 2023 | 2021/2022 | 1166 | 807 | 1306 | 199 | 436 | 147 | 231 | 28 | 96 | 138 | 4554 |
| 2024 | 2022/2023 | 1286 | 845 | 1301 | 196 | 473 | 167 | 199 | 33 | 92 | 150 | 4742 |

අභ්‍යන්තර උපාධි අපේක්ෂක නව ලියාපදිංචිය





**අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින් බඳවා ගැනීම (ලියාපදිංචි වූ සංඛ්‍යාව) : 2019-2024**



## උපාධිධාරීන් පිළිබඳ තොරතුරුඋපාධිධාරීන් පිළිබඳ තොරතුරු - 2024

| **පීඨය** | **පළමු පෙළ** | **දෙවන පෙළ ඉහල** | **දෙවන පෙළ පහල** | **සමත් සාමාර්ථ** | **මුළු උපාධිධාරීන් සංඛ්‍යාව** |
|---|---|---|---|---|---|
| මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය | 67 | 506 | 255 | 113 | 941 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 88 | 246 | 100 | 277 | 711 |
| කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | 150 | 313 | 281 | 392 | 1136 |
| වෛද්‍ය විද්‍යා පීඨය | 8 | 29 | 54 | 74 | 165 |
| තාක්ෂණ පීඨය | 29 | 111 | 82 | 60 | 282 |
| ඉන්ජිනේරු පීඨය | 15 | 59 | 30 | 7 | 111 |
| සම සෞඛ්‍ය පීඨය | 3 | 18 | 19 | 43 | 83 |
| **මුළු ගණන** | **360** | **1282** | **821** | **966** | **3429** |

*සටහන: සම සෞඛ්‍ය විද්‍යා පීඨය යටතේ ඉදිරිපත් කරන ලද උපාධිධාරීන්ට වෛද්‍ය විද්‍යා පීඨය විසින් උපාධිය ප්‍රදානය කරනු ලැබේ, මන්ද මෙම සිසුන් වෛද්‍ය විද්‍යා පීඨය යටතේ ලියාපදිංචි වී ඇති බැවිනි.*




## උපාධිධාරී සේවා නියුක්තිය

| පීඨය | සේවා නියුක්ති | වෙනත් | සේවා වියුක්ත | මුළු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය | 61.56% | 31.16% | 7.28% | 100% |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 80.94% | 13.23% | 5.83% | 100% |
| කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | 94.30% | 5.34% | 0.36% | 100% |
| වෛද්‍ය විද්‍යා පීඨය | 87.50% | 10.89% | 1.61% | 100% |
| තාක්ෂණ පීඨය | 75.54% | 21.58% | 2.88% | 100% |
| ඉන්ජිනේරු පීඨය | 72.48% | 25.69% | 1.83% | 100% |
| **සමස්ත** | **79.79%** | **16.47%** | **3.74%** | **100%** |

සටහන :

**(1)** ඉහත සංඛ්‍යා පදනම් වී ඇත්තේ 2024 වර්ෂයේ පවත්වන ලද උපාධි ප්‍රධානොත්සවයේදි පවත්වන ලද සේවා නියුක්ති සමික්ෂණය මතය

**(2)** වෙනත් කාණ්ඩයට උසස් අධ්‍යාපනයේ යෙදී සිටින උපාධිධාරීන් සහ කිසිදු රැකියාවක් අපේක්ෂා නොකරන සිසුන් ඇතුලත් වේ



## ශිෂ්‍ය සුභසාධන පහසුකම්

### මහපොළ ශිෂ්‍යාධාර

**මහපොළ ශිෂ්‍යත්ව ගෙවීම් - 2024 දෙසැම්බර් දක්වා**

UGC දායකත්වය පමණි. (49%)
සියලුම වාරික ගෙවූ සිසුන් ඇතුළත් වේ.

| අධ්‍යයන වර්ෂය | FHSS | FMSC | FMS | FOE | FOT | FAS | FAHS | FOD | FUAB | FOC | වාර්ෂික වියදම (රුපියල්) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2018/2019 | 649 | 974 | 79 | 61 | 129 | 296 | 41 | - | - | - | 5,941,250.00 |
| 2019/2020 | 560 | 961 | 81 | 71 | 366 | 287 | 76 | - | - | - | 58,880,850.00 |
| 2020/2021 | 599 | 919 | 81 | 63 | 330 | 323 | 101 | 10 | 33 | - | 64,550,150.00 |
| මුළු ගෙවීම් (රුපියල්) | **1808** | **2854** | **241** | **195** | **825** | **906** | **218** | **10** | **33** | **0** | **129,372,250.00** |
| මුළු ගෙවීම් | | | | | | | | | | | |
| 2021/2022 | 623 | 898 | 72 | 56 | 332 | 242 | 117 | 10 | 30 | 31 | 108,532,550.00 |

### ශිෂ්‍යාධාර

**2024 වර්ෂය තුළ ශිෂ්‍යාධාර ගෙවීම පහත දැක්වේ (අධ්‍යයන වර්ෂය සහ පීඨ අනුව)**

| අධ්‍යයන වර්ෂය | මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය | කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා | වෛද්‍ය විද්‍යා පීඨය | . ඉන්ජිනේරු පීඨය | තාක්ෂණ පීඨය | හාරික විද්‍යා පී | සම සෞඛ්‍ය විද්‍යා පීඨය | දන්ත වෛද්‍ය විද්‍යා පීඨය | නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨය | පරිගණක පීඨය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2018/2019 | - | - | 5 | - | 10 | 58 | - | - | - | - |
| 2019/2020 | 109 | 76 | 3 | 7 | 9 | 59 | 18 | - | - | - |
| 2020/2021 | 117 | 83 | 6 | 1 | 20 | 86 | 26 | 1 | 17 | |
| 2021/2022 | 145 | 46 | 2 | 5 | 8 | 75 | 16 | | 15 | 8 |
| 2022/2023 | 81 | 24 | 5 | - | 5 | 72 | 14 | 1 | 16 | 8 |
| මුළු ගණන | 452 | 229 | 21 | 13 | 52 | 350 | 74 | 2 | 48 | 16 |
| මුළු ගෙවීම් (රු.) | 21,396,000.00 | 10,848,000.00 | 820,000.00 | 780,000.00 | 2,076,000.00 | 13,240,000.00 | 2,872,000.00 | 68,000.00 | 1,984,000.00 | 592,000.00 |
| මහපොළ ශිෂ්‍යත්වය සඳහා තෝරාගත් සිසුන්ගේ නාමලේඛනය ලබා ගැනීමට පෙර අත්තිකාරම් ගෙවීම්. | | | | | | | | | | |
| 2022/2023 | 669 | 599 | 50 | 39 | 198 | 241 | 91 | 5 | 29 | 43 |
| මුළු ගෙවීම් (රු.) | 5,152,000.00 | 4,604,000.00 | 396,000.00 | 296,000.00 | 1,544,000.00 | 1,800,000.00 | 720,000.00 | 44,000.00 | 180,000.00 | 328,000.00 |

## නේවාසිකාගාර පහසුකම්

විශ්වවිද්‍යාල සිසුන් සඳහා නේවාසිකාගාර පහසුකම් ලබාදීම සහ සිසුන් සඳහා ලබාදී ඇති නවාතැන් පහසුකම් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| පීඨය | ස්ත්‍රී | පුරුෂ | එකතුව |
|---|---|---|---|
| මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය | 1875 | 320 | 2195 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 216 | 408 | 624 |
| කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | 1427 | 383 | 1810 |
| වෛද්‍ය විද්‍යා පීඨය | 202 | 139 | 341 |
| සම සෞඛ්‍ය පීඨය | 367 | 84 | 451 |
| තාක්ෂණ පීඨය | 519 | 667 | 1186 |
| ඉන්ජිනේරු පීඨය | 81 | 127 | 208 |
| දන්ත වෛද්‍ය පීඨය | 19 | 06 | 25 |
| නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨය | 115 | 20 | 135 |
| පරිගණක පීඨය | 33 | 32 | 65 |

**විශ්වවිද්‍යාලය සතු නේවාසිකාගාර**

| මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා | ව්‍යවහාරික විද්‍යා පීඨය | කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා | වෛද්‍ය විද්‍යා පීඨය | සම සෞඛ්‍ය පීඨය | තාක්ෂණ පීඨය | ඉන්ජිනේරු පීඨය | දන්ත වෛද්‍ය පීඨය | නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨය | පරිගණක පීඨය | මුළු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1790 | 448 | 1453 | 189 | 178 | 1186 | 0 | 13 | 90 | 47 | 5394 |

**කුලී පදනම මත ලබාගත් නේවාසිකාගාර**

| මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා | ව්‍යවහාරික විද්‍යා පීඨය | කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | වෛද්‍ය විද්‍යා පීඨය | සම සෞඛ්‍ය පීඨය | තාක්ෂණ පීඨය | ඉන්ජිනේරු පීඨය | දන්ත වෛද්‍ය පීඨය | නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨය | පරිගණක පීඨය | මුළු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 405 | 176 | 357 | 152 | 273 | 0 | 208 | 12 | 45 | 18 | 1646 |

# කාර්යය මණ්ඩල විස්තර

## කාර්ය මණ්ඩල සාරාංශය (සේවා කාණ්ඩ ලෙස ) 2024 දෙසැම්බර් 31 දිනට

| සේවා කාණ්ඩය | වැටුප් කේතය | අනුමත සේවක ගණන | සැබෑ සේවක ගණන | පුරප්පාඩු |
|---|---|---|---|---|
| **1. ප්‍රාථමික මට්ටම** | | | | |
| ප්‍රාථමික ශ්‍රේණිය - නුපුහුණු | U - PL 1 | 576 | 309 | 83 |
| ප්‍රාථමික ශ්‍රේණිය - අර්ධ පුහුණු | U - PL 2 | | 91 | |
| ප්‍රාථමික ශ්‍රේණිය - පුහුණු | U - PL 3 | | 93 | |
| **2 ද්විතියික මට්ටම** | | | | |
| කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන | U - MN 1 | 612 | 271 | 62 |
| කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන | U - MT 1 | | 135 | |
| සහකාර නිලධාරීන් - 2 කොටස | U - MN 2 | | 9 | |
| සහකාර නිලධාරීන් - 1 කොටස | U - MN 3 | | 19 | |
| මාණ්ඩලික සහකාර | U- MN 4 | | 116 | |
| ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය සහකාර | | | | |
| **3 තෘතීයික මට්ටම** | | | | |
| තාවකාලික උපදේශක/තාවකාලික ආදර්ශක | Fixed | 404 | 404 | 0 |
| තාවකාලික උපදේශක / තාවකාලික සහය කථිකාචාර්යය | | | | |
| තාවකාලික පර්යේෂණ සහකාර/ තාවකාලික කථිකාචාර්යය | | | | |
| අධ්‍යයන සහාය - 2 කොටස | U - AS 1 | 41 | 19 | 22 |
| කනිෂ්ඨ විධායක / කළමනාකරුවන් | U - EX 1 | 29 | 11 | 18 |
| අධ්‍යයන සහාය - 1 කොටස | U - AS 2 | 39 | 28 | 11 |
| **4. ජ්‍යෙෂ්ඨ මට්ටම** | | | | |
| වෛද්‍ය නිලධාරී | U - MO 1 | 9 | 7 | 2 |
| ප්‍රධාන වෛද්‍ය නිලධාරී | U - MO 2 | 0 | 0 | 0 |
| මධ්‍යයම මට්ටමේ විධායකයින් | U - EX 2 | 32 | 32 | 0 |
| ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් | U - EX 3 | 2 | 2 | 0 |
| සහකාර පුස්තකාලාධිපති/ කථිකාචාර්යය (පරිවාස) | U - AC 3 | 1010 | 788 | 222 |
| කථිකාචාර්යය / කථිකාචාර්යය ( කොන්ත්‍රාත් පදනම) | | | | |
| ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති | | | | |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය/ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය (කොන්ත්‍රාත් පදනම) | | | | |
| සහකාර මහාචාර්යවරුන්/ නියෝජ්‍ය පුස්තකාලයාධිපති | U - AC 4 | | | |
| ජ්‍යොෂ්ඨ මහාචාර්ය / මහාචාර්ය / පුස්තකාලයාධිපති | U - AC 5 | | | |

## 2024 වර්ෂය තුළ අධ්‍යයන, පරිපාලන, අධ්‍යයන සහය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

**අධ්‍යයන, පරිපාලන, අනෙකුත් විධායක සහ අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලයේ විස්තර**

| | අනුමත සේවක සංඛ්‍යාව | වත්මන් සේවක සංඛ්‍යාව (2021 දෙසැම්බර් 31 දිනට) | | | | | | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|---|---|
| | | ස්ථිර | | | කොන්ත්‍රාත් / තාවකාලික | | | |
| | | පුරුෂ | ස්ත්‍රී | එකතුව | පුරුෂ | ස්ත්‍රී | එකතුව | |
| **අධ්‍යයන කාර්යය මණ්ඩලය** | | | | | | | | |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්යය | | 25 | 16 | 41 | | | | |
| මහාචාර්යය | | 86 | 77 | 163 | | | | |
| සහාය මහාචාර්යය | | 3 | 7 | 10 | | | | |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය I වැනි ශ්‍රේණිය | | 70 | 71 | 141 | | | 0 | |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය II වැනි ශ්‍රේණිය | 996 | 113 | 126 | 239 | 2 | 5 | 7 | 217 |
| කථිකාචාර්යය | | 22 | 28 | 50 | 14 | 14 | 28 | |
| කථිකාචාර්යය (පරිවාස) | | 39 | 58 | 97 | | | | |
| තාවකාලික කථිකාචාර්යය | | | | | 2 | | 2 | |
| තාවකාලික සහාය කථිකාචාර්යය / Tutor/ ප්‍රදර්ශක/ උපදේශක | 390 | | | | 156 | 235 | 391 | -1 |
| පුස්තකාලයාධිපති | 1 | | 1 | 1 | | | | |
| නියෝජ්‍ය පුස්තකාලයාධිපති | 1 | | 1 | 1 | | | | |
| ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති I ශ්‍රේණිය | | 1 | 3 | 4 | | | | |
| ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති II ශ්‍රේණිය | 12 | 1 | 3 | 4 | | | | 2 |
| සහකාර පුස්තකාලයාධිපති | | 1 | 1 | 2 | | | | |
| තාවකාලික පර්යේෂණ සහකාර | 14 | | | | 5 | 6 | 11 | 3 |
| **අධ්‍යයන කාර්ය මණ්ඩල උප එකතුව** | **1414** | **361** | **392** | **753** | **179** | **260** | **439** | **221** |
| **පරිපාලන නිලධාරීන්** | | | | | | | | |
| ලේඛකාධිකාරි | 1 | 1 | | 1 | | | | |
| මූල්‍යාධිකාරි | 1 | | 1 | 1 | | | | |
| නියෝජ්‍ය ලේඛකාධිකාරි | 11 | 3 | 4 | 7 | 1 | 1 | 2 | |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි | | | 4 | 4 | | | 0 | 6 |
| සහකාර ලේඛකාධිකාරි | 14 | | 6 | 6 | | | 0 | |
| නියෝජ්‍ය මූල්‍යාධිකාරි | 7 | | 3 | 3 | | 2 | 2 | |
| ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි | | 2 | 1 | 3 | | | 0 | 5 |
| සහකාර මූල්‍යාධිකාරි | 10 | | 4 | 4 | | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| නියෝජ්‍ය අභ්‍යන්තර විගණක | 1 | 0 | | 0 | 1 | | 1 | |
| නියෝජ්‍ය සහකාර ලේඛකාධිකාරී/ නීති | 1 | | 1 | 1 | | | | |
| සහකාර ලේඛකාධිකාරී/පුස්තකාල සේවා | 1 | | | 0 | | | | 1 |
| **පරිපාලන කාර්ය මණ්ඩල උප එකතුව** | **47** | **6** | **24** | **30** | **2** | **3** | **5** | **12** |
| **අනෙකුත් විධායක කාර්යය මණ්ඩලය** | | | | | | | | |
| තොරතුරු පද්ධති කළමනාකරු | 1 | 1 | | 1 | | | | |
| අධ්‍යක්ෂක / ශාරීරික අධ්‍යාපන | 1 | | 1 | 1 | | | | |
| ව්‍යාපෘති කළමනාකරු | 1 | | | 0 | | 1 | 1 | 0 |
| ප්‍රධාන විනයාරක්ෂක | 1 | | | 0 | | | | 1 |
| නියෝජ්‍ය විනයාරක්ෂක | 1 | | | 0 | | | | 1 |
| ප්‍රධාන ආරක්ෂක නිලධාරී | 1 | 1 | | 1 | | | | 0 |
| වැඩ ඉන්ජිනේරු | 1 | 1 | | 1 | | | | |
| වැඩහල් ඉන්ජිනේරු | 3 | | | 0 | | | | 3 |
| උද්‍යාන පාලක | 2 | 1 | | 1 | 1 | | 1 | 0 |
| කෞතුකාගාර පාලක | 2 | 1 | 1 | 2 | | | | |
| සංඛ්‍යාලේඛන නිලධාරී | 2 | 1 | | 1 | | | | 1 |
| **අනෙකුත් විධායක කාර්ය මණ්ඩල උප එකතුව** | **16** | **6** | **2** | **8** | **1** | **1** | **2** | **6** |
| **වෛද්‍ය නිලධාරීන්** | | | | | | | | |
| ජ්‍යෙෂ්ඨ වෛද්‍ය නිලධාරී / වෛද්‍ය නිලධාරී | 8 | | 2 | 2 | 1 | 3 | 4 | 2 |
| දන්ත ශල්‍ය වෛද්‍ය | 1 | 1 | | 1 | | | | |
| **වෛද්‍ය නිලධාරීන්ගේ උප එකතුව** | **9** | **1** | **2** | **3** | **1** | **3** | **4** | **2** |
| **අධ්‍යයන සහායක** | | | | | | | | |
| උපදේශක (පරිගණක තාක්ෂණය) - I ශ්‍රේණිය | 21 | 8 | | 8 | | | 0 | 8 |
| උපදේශක (පරිගණක තාක්ෂණය) - II ශ්‍රේණිය | | 3 | 2 | 5 | | | | |
| සහකාර සංඛ්‍යාලේඛනඥ - I ශ්‍රේණිය | 1 | 1 | | 1 | | | | |
| සහකාර ජාල කළමනාකරු I ශ්‍රේණිය | 6 | 2 | | 2 | | | 0 | 3 |
| සහකාර ජාල කළමනාකරු II ශ්‍රේණිය | | | | 0 | 1 | | 1 | |
| සමාජ වැඩ පිළිබඳ උපදේශක | 1 | 1 | | 1 | | | | |
| වෘත්තීය මාර්ගෝපදේශ උපදේශකවරුන් | 4 | 1 | 3 | 4 | | | | 0 |
| වැඩ සටහන් සහ පද්ධති විශ්ලේෂක - I ශ්‍රේණිය | 1 | 1 | | 1 | | | | 0 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| වැඩ සටහන් සහ පද්ධති විශ්ලේෂක - II ශ්‍රේණිය | 3 | 2 | 1 | 3 | | | | 0 |
| ජ්‍යෙෂ්ඨ උපදේශක - ඉංග්‍රීසි භාෂා | 1 | | 1 | 1 | | | | |
| උපදේශක - ඉංග්‍රීසි භාෂා | 21 | 1 | 1 | 2 | | | | 19 |
| ශාරීරික අධ්‍යාපනය පිළිබඳ උපදේශක - I ශ්‍රේණිය | 7 | | 1 | 1 | | | | 2 |
| ශාරීරික අධ්‍යාපනය පිළිබඳ උපදේශක - II ශ්‍රේණිය | | 2 | | 2 | | 2 | 2 | |
| උපදේශක | 3 | 2 | 1 | 3 | | | | |
| ක්‍රීඩාගාර උපදේශක | 2 | | | 0 | 2 | | 2 | 0 |
| පරිගණක වැඩසටහන්කරු | 8 | 5 | | 5 | 2 | | 2 | 1 |
| විද්‍යාත්මක සහකාර - II ශ්‍රේණිය | 1 | 1 | | 1 | | | | 0 |
| **අධ්‍යයන සහයක කාර්යය මණ්ඩල උප එකතුව** | **80** | **30** | **10** | **40** | **5** | **2** | **7** | **33** |
| **මුළු එකතුව** | **1566** | **404** | **430** | **834** | **188** | **269** | **457** | **274** |

**අනධ්‍යයන සේවක කාර්යය මණ්ඩලය**

| තනතුර | | වැටුප් කේතය | අනුමත සේවක සංඛ්‍යාව | වත්මන් සේවක සංඛ්‍යාව ( 2024 දෙසැම්බර් 31 වන දිනට) | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ස්ථිර | | | කොන්ත්‍රාත්/තාවකාලික | | | |
| | | | | පුරුෂ | ස්ත්‍රී | එකතුව | පුරුෂ | ස්ත්‍රී | එකතුව | පුරප්පාඩු |
| 1 | විනයාරක්ෂක | U - MN 3 | 7 | 7 | | 7 | | | | 0 |
| 2 | පූර්ණ කාලීන උප ශාලාධිපති | U - MN 3 | 14 | 5 | 7 | 12 | | | | 2 |
| 3 | උපාධිධාරී භාෂා පරිවර්තක | U - MN 3 | 1 | | | 0 | | | | 1 |
| 4 | නියෝජ්‍ය ප්‍රධාන ආරක්ෂක නිලධාරි | U - MN 2 | 1 | | | 0 | | | | 1 |
| 5 | වැඩ අධිකාරී | U - MN 2 | 3 | | | 0 | | | | 3 |
| 6 | වැඩ අධිකාරී (සිවිල්) | U - MN 2 | 6 | 4 | | 4 | | | | 2 |
| 7 | වැඩ අධිකාරී (විදුලි) | U - MN 2 | 1 | 1 | | 1 | | | | 0 |
| 8 | වැඩ අධිකාරී (භූ දර්ශන) | U - MN 2 | 1 | 1 | | 1 | | | | 0 |
| 9 | විගණන සහකාර | U - MN 1 | 5 | 1 | 4 | 5 | | | | 0 |
| 10 | කළමනාකරණ සහකාර | U - MN 1 | 310 | 76 | 192 | 268 | 3 | 32 | 35 | 7 |
| 11 | කළමනාකරණ සහකාර (පොත් තබන්නා) | U - MN 1 | 8 | 5 | 3 | 8 | | | | 0 |


| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 12 | කළමනාකරණ සහකාර (සරප්) | U - MN 1 | 5 | 1 | | 1 | | | | 4 |
| 13 | කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු) | U - MN 1 | 8 | 5 | | 5 | | | | 3 |
| 14 | දුරකථන යන්ත්‍ර ක්‍රියාකරු/පිළිගැනිමේ නිලධාරි | U - MN 1 | 2 | | 2 | 2 | | | | 0 |
| 15 | පුස්තකාල තොරතුරු සහකාර | U - MN 1 | 34 | 13 | 11 | 24 | | 6 | 6 | 4 |
| 16 | ආරක්ෂක පරික්ෂක | U - MN 1 | 5 | 4 | | 4 | | | | 1 |
| 17 | පිහිණුම් තටාක අධීක්ෂක | U - MN 1 | 1 | | | 0 | | | | 1 |
| 18 | ශිල්පීය නිදර්ශක (යාන්ත්‍රික) | U - MN 1 | 3 | 3 | | 3 | | | | 0 |
| 19 | වැඩ අධීක්ෂක (සිවිල්) | U - MT 1 | 5 | 4 | | 4 | | | | 1 |
| 20 | වැඩ අධීක්ෂක (විදුලි) | U - MT 1 | 3 | 0 | | 0 | | | | 3 |
| 21 | වැඩ අධීක්ෂක (භූ දර්ශ) | U - MT 1 | 1 | | | 0 | | | | 1 |
| 22 | ශ්‍රව්‍ය දෘශ්‍ය කාර්මික නිලධාරි | U - MT 1 | 5 | 3 | | 3 | | | | 2 |
| 23 | දන්ත හෙද නිලධාරි | U - MT 1 | 1 | | 1 | 1 | | | | 0 |
| 24 | සැලසුම් ශිල්පි | U - MT 1 | 4 | 1 | 1 | 2 | | | | 2 |
| 25 | හෙද නිලධාරි | U - MT 1 | 11 | | 6 | 6 | | 1 | 1 | 4 |
| 26 | ඖෂධවේදී | U - MT 1 | 4 | 1 | 1 | 2 | 1 | | 1 | 1 |
| 27 | භෞත චිකිත්සක | U - MT 1 | 1 | | | 0 | | | 0 | 1 |
| 28 | මහජන සෞඛ්‍ය පරීක්ෂක | U - MT 1 | 2 | 2 | | 2 | | | | 0 |
| 29 | කාර්මික නිලධාරි | U - MT 1 | 126 | 47 | 53 | 100 | 10 | 6 | 16 | 10 |
| 30 | කාර්මික නිලධාරි (තොරතුරු තාක්ෂණ) | U - MT 1 | 22 | 14 | 4 | 18 | 1 | | 1 | 3 |
| 31 | කාර්මික නිලධාරි (සිවිල්) | U - MT 1 | 4 | 2 | 2 | 4 | | | 0 | 0 |
| 32 | කාර්මික නිලධාරි (විදුලි) | U - MT 1 | 3 | 2 | | 2 | | | | 1 |
| 33 | කාර්මික නිලධාරි (යාන්ත්‍රික | U - MT 1 | 4 | 2 | 1 | 3 | | | | 1 |
| 34 | කාර්මික නිලධාරි (X-Ray/Dexa Scan) | U - MT 1 | 1 | | | 0 | | | | 1 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 35 | රියදුරු | U - PL 3 | 41 | 33 | | 33 | 3 | | 3 | 5 |
| 36 | පොත් බඳින්නා | U - PL 3 | 2 | 2 | | 2 | | | | 0 |
| 37 | විදුලි කාර්මික | U - PL 3 | 9 | 9 | | 9 | | | | 0 |
| 38 | වඩු කාර්මික | U - PL 3 | 8 | 7 | | 7 | | | | 1 |
| 39 | සවි කරන්නා (Fitter) | U - PL 3 | 1 | | | 0 | | | | 1 |
| 40 | යාන්ත්‍රිකයා | U - PL 3 | 1 | | | 0 | | | | 1 |
| 41 | පෙදරේරු | U - PL 3 | 8 | 6 | | 6 | | | | 2 |
| 42 | යන්ත්‍ර ක්‍රියාකරු | U - PL 3 | 1 | 1 | | 1 | | | | 0 |
| 43 | ජල නල කාර්මික | U - PL 3 | 8 | 6 | | 6 | 1 | | 1 | 1 |
| 44 | ඇලුමිනියම් ෆැබ්රික්ටර් | U - PL 3 | 1 | | | 0 | | | | 1 |
| 45 | වැද්දුම්කරු | U - PL 3 | 1 | | | 0 | | | | 1 |
| 46 | පෑස්සුම්කරු | U - PL 3 | 2 | 1 | | 1 | | | | 1 |
| 47 | ට්‍රැක්ටර් ක්‍රියාකරු | U - PL 2 | 1 | | | 0 | 1 | | 1 | 0 |
| 48 | රෝද දෙකේ ට්‍රැක්ටර් ක්‍රියාකරු | U - PL 2 | 0 | | | 0 | | | | 0 |
| 49 | වායු උත්පාදක ක්‍රියාකරු | U - PL 2 | 1 | | | 0 | | | | 1 |
| 50 | විද්‍යාගාර සහයක | U - PL 2 | 105 | 58 | 16 | 74 | 6 | 18 | 24 | 7 |
| 51 | විද්‍යාගාර සහයක (ඇදීම්) | U - PL 2 | 1 | | | 0 | | | | 1 |
| 52 | සෞඛ්‍ය සේවා උපස්ථායක | U - PL 2 | 2 | | 1 | 1 | | | | 1 |
| 53 | ජිම්නීසියම් සහයක | U - PL 2 | 2 | | | 0 | | | 0 | 2 |
| 54 | පට්ටල යන්ත්‍ර ක්‍රියාකරු | U - PL 2 | 1 | | | 0 | | | | 1 |
| 55 | පින්තාරුකරු | U - PL 2 | 3 | 2 | | 2 | | | | 1 |
| 56 | පොලිෂ් කරන්නා | U - PL 2 | 2 | 2 | | 2 | | | | 0 |
| 57 | පොම්ප ක්‍රියාකරු | U - PL 2 | 0 | | | 0 | | | | 0 |
| 58 | එන්ජින් හා පොම්ප ක්‍රියාකරු | U - PL 2 | 1 | 1 | | 1 | | | | 0 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 59 | නිදර්ශක එකතු කරන්නා | U - PL 2 | 2 | 1 | | 1 | 1 | | 1 | 0 |
| 60 | නේවාසිකාගාර භාරකරු | U - PL 2 | 2 | 1 | | 1 | | | | 1 |
| 61 | ගාඩ්නර් | U - PL 1 | 2 | 1 | | 1 | | | | 1 |
| 62 | ග්‍රවුන්ඩ්ස්මන් | U - PL 1 | 1 | | | 0 | | | | 1 |
| 63 | සෞඛ්‍ය සේවා කම්කරු | U - PL 1 | 18 | 8 | | 8 | | | | 10 |
| 64 | වැඩ සහයක | U - PL 1 | 224 | 161 | 16 | 177 | 37 | 5 | 42 | 5 |
| 65 | මරණ පරීක්ෂක කම්කරු | U - PL 1 | 2 | 1 | | 1 | | | | 1 |
| 66 | කාර්යාල යන්ත්‍ර ක්‍රියාකරු | U - PL 1 | 5 | 5 | | 5 | | | | 0 |
| 67 | පුස්තකාල සේවක | U - PL 1 | 24 | 8 | 5 | 13 | 2 | 5 | 7 | 4 |
| 68 | ලොරි පවිත්‍රක | U - PL 1 | 1 | 1 | | 1 | | | | 0 |
| 69 | තණකොළ කපන යන්ත්‍ර ක්‍රියාකරු | U - PL 1 | 1 | | | 0 | | | | 1 |
| 70 | ආරක්ෂක නිලධාරී | U - PL 1 | 88 | 35 | | 35 | 21 | | 21 | 32 |
| 71 | ගබඩා කරු | U - PL 1 | 2 | 1 | | 1 | | | | 1 |
| 72 | පිහිනුම් තටාක වැඩ සහයක | U - PL 1 | 2 | 2 | | 2 | | | | 0 |
| **එකතුව** | | | **1188** | **557** | **326** | **883** | **87** | **73** | **160** | **145** |

## තනතුරු අනුව අධ්‍යයන කාර්යය මණ්ඩලය 2020 - 2024

| වර්ෂය | ජ්‍යෙෂ්ඨ මහාචාර්යයවරුන් | මහාචාර්යයවරුන් | සහකාර මහාචාර්යවරු | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්යය / ආධුනික කථිකාචාර්යය | එකතුව |
|---|---|---|---|---|---|---|
| 2020 | 36 | 95 | 8 | 403 | 148 | 690 |
| 2021 | 41 | 126 | 9 | 395 | 151 | 722 |
| 2022 | 38 | 145 | 11 | 399 | 144 | 737 |
| 2023 | 39 | 160 | 10 | 383 | 141 | 733 |
| 2024 | 41 | 163 | 10 | 380 | 147 | 741 |





## තනතුරු අනුව පීඨ අනුව ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලය - 2024


| තනතුර | පීඨය | | | | | | | | | | මුළු ගණන |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මානව ශාස්ත්‍ර හා සමාජීය | ව්‍යවහාරික විද්‍යා පීඨය | කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා | වෛද්‍ය විද්‍යා පීඨය | තාක්ෂණ පීඨය | ඉංජිනේරු පීඨය | සම සෞඛ්‍ය පීඨය | දන්ත වෛද්‍ය විද්‍යා පීඨය | නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨය | පරිගණක පීඨය | |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්යය | 10 | 10 | 11 | 10 | | | | | | | 41 |
| මහාචාර්යය | 39 | 33 | 38 | 38 | 3 | 1 | 8 | 2 | | 1 | 163 |
| සහය මහාචාර්යය | 6 | | 2 | 2 | | | | | | | 10 |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය | 71 | 84 | 90 | 38 | 46 | 18 | 15 | 6 | 8 | 4 | 380 |
| කථිකාචාර්යය / කථිකාචාර්යය (පරිවාස) | 26 | 18 | 51 | 17 | 11 | 1 | 15 | 5 | | 3 | 147 |
| **මුළු සංඛ්‍යාව** | **152** | **145** | **192** | **105** | **60** | **20** | **38** | **13** | **8** | **8** | **741** |

## විශ්ව විද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සුදුසුකම්:2020 - 2024

### පීඨවලට අනුයුක්ත කර ඇති ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින්

| වර්ෂය | පළමු උපාධි හා පශ්චාද් උපාධි ඩිප්ලෝමා ලාභීන් | පශ්චාද් උපාධි පශ්චාද් උපාධි | දර්ශනපති උපාධි | MD/MS උපාධි | ආචාර්යය උපාධි ලාභීන් | එකතුව |
|---|---|---|---|---|---|---|
| 2020 | 74 | 149 | 43 | 63 | 361 | 690 |
| 2021 | 69 | 149 | 41 | 65 | 398 | 722 |
| 2022 | 67 | 154 | 41 | 73 | 402 | 737 |
| 2023 | 75 | 146 | 40 | 71 | 401 | 733 |
| 2024 | 90 | 134 | 40 | 69 | 408 | 741 |


අධ්‍යයන කාර්ය මණ්ඩල සුදුසුකම්- 2024
First Degrees & PG Dip.
11%
Masters
20%
M.Phil
6%
MD/MS
9%
Doctoral Degrees
54%
First Degrees & PG Dip.
Masters
M.Phil
MD/MS
Doctoral Degrees


මුළු කාර්ය මණ්ඩලයේ ප්‍රතිශතයක් ලෙස ආචාර්ය උපාධි
60.0%
50.0%
40.0%
30.0%
20.0%
10.0%
0.0%
52.4%
54.5%
54.8%
54.1%
54.4%
2020
2021
2022
2023
2024

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අයත් පීඨ

විශ්වවිද්‍යාලය පහත සඳහන් පීඨ එකොළහකින් යුක්ත වේ.

1. මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය
2. ව්‍යවහාරික විද්‍යා පීඨය
3. කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය
4. වෛද්‍ය විද්‍යා පීඨය
5. පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය
6. තාක්ෂණ පීඨය
7. ඉන්ජිනේරු පීඨය
8. සම සෞඛ්‍ය විද්‍යා පීඨය
9. දන්ත වෛද්‍ය විද්‍යා පීඨය
10. නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨය
11. පරිගණක පීඨය

# මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය



1959 ජනවාරි 01 වැනි දින මාලිගාකන්ද විද්‍යෝදය පිරිවෙනේ විද්‍යෝදය විශ්වවිද්‍යාලය ආරම්භ වීමත් සමඟ ශාස්ත්‍ර පීඨය ආරම්භ විය. පසුව එම පීඨය ගංගොඩවිල වත්මන් පරිශ්‍රයට ගෙන යන ලදී. 1979 දී විද්‍යෝදය පිරිවෙන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ලෙස පරිවර්තනය කරන ලද්දේ පුළුල් ප්‍රජාවකට දැනුම බෙදා හැරීමේ තවත් පියවරක් ඉදිරියට යමිනි.

මේ වන විට කලා පීඨය මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය නමින් ස්ථාපිත වී ඇත.

රටේ සංස්කෘතික උරුමය හා ප්‍රජා සංවර්ධනය හා ජාතියේ පුනර්ජීවනය, දැනුම බෙදා හැරීම මගින් වැඩිදියුණු කිරීම මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය එහි දැක්ම අනුව පීඨයේ වගකීමයි.

වාර්ෂිකව සිසුන් 1200 ක් පමණ ඇතුළත් කර ගන්නා විද්‍යාවේදී ගෞරව උපාධිය, ශාස්ත්‍රවේදී උපාධිය සහ ශාස්ත්‍රවේදී ගෞරව උපාධි සඳහා වන උපාධි වැඩසටහන් 34 ක අධ්‍යයන කටයුතු සිදු කෙරේ. පීඨය අධ්‍යයන දෙපාර්තමේන්තු දහසයකින් සමන්විත වේ..

| | |
|---|---|
| **පීඨාධිපති** | මහාචාර්යය එස්.සී.බී. හීන්කෙන්ද |
| **අධ්‍යයනාංශය** | **අධ්‍යයනාංශ ප්‍රධාන** |
| 1. සිංහල හා ජන සන්නිවේදන අධ්‍යයනාංශය | මහාචාර්යය කුසුමලතා ලංකාමුල්ලගේ මහත්මිය |
| 2 ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය | පූජ්‍ය දඹර අමිල හිමි |
| 3. භූගෝලවිද්‍යා අධ්‍යයනාංශය | ආචාර්යය එච්.එම්.බී.එස්. හේරත් මහත්මිය |
| 4. සමාජවිද්‍යා අධ්‍යයනාංශය | මහාචාර්යය එම්.ජේ.එන්.ආර්.එම් පෙරේරා මහත්මිය (.01.07.2024 දින සිට)<br>මහාචාර්යය ඩබ්ලිව්.ජේ.එස්. විජේකෝන් ( 30.06.2024 දක්වා) |

5. මානව විද්‍යා අධ්‍යයනාංශය — මහාචාර්යය සී.ඒ.ඩී. නහල්ලගේ මහත්මිය

6. භාෂා , සංස්කෘතික අධ්‍යයන හා ප්‍රසංගික කලා අධ්‍යයනාංශය — මහාචාර්යය ආර්.කේ.ඩී.එන්.කේ. රාජපක්ෂ

7. ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය — මහාචාර්යය කේ.ජී.ජී. වීරසිංහ

8. සමාජ සංඛ්‍යාන අධ්‍යයනාංශය — සී.එල්.කේ.නවරත්න මහතා ( 01.07.2024 සිට) ආචාර්යය එච්.පී.ටී.එන්. සිල්වා (30.06.2024 දක්වා)

9. ඉංග්‍රීසි හා වාග් විද්‍යා අධ්‍යයනාංශය — ආචාර්යය ඩබ්ලිව්.ඒ.කේ.සී.පී. වර්ණපාල මහත්මිය

10. පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය — මහාචාර්යය එලමල්දෙනියේ සාරානන්ද හිමි

11. දර්ශනය හා මනෝ විද්‍යා අධ්‍යයනාංශය — මහාචාර්යය ඩබ්ලිව්.එම් යාපාරත්න මහතා

12 දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය — වී.එස්.සූරියබණ්ඩාර මහත්මිය

13. අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය — මහාචාර්යය ඩබ්ලිව්.එම්. ධනපාල

14. ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ අධ්‍යයනාංශය — අචාර්යය පී.බී.එස්.එල්. පුෂ්පකුමාර (01.07.2024 සිට) ඩී.එල්.එස්.ආනන්ද මහතා ( 01.07.2024 දක්වා)

15. සංගීතය හා නිර්මාණාත්මක තාක්ෂණ අධ්‍යයනාංශය — අචාර්යය කේ.ආර්.පී. තිලකසිරි මහතා

16. තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන අධ්‍යයනාංශය — අචාර්යය බී.ඩබ්ලිව්.ආර්. දමයන්ති මහත්මිය

## පීඨය විසින් පිරිනමනු ලබන උපාධි හා ඩිප්ලෝමා - 2024

උපාධි පාඨමාලා

01. ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය
02. ශාස්ත්‍රවේදී පුරාවිද්‍යා ගෞරව උපාධිය
03. ශාස්ත්‍රවේදී අපරාධ විද්‍යාව හා අපරාධ යුක්තිය ගෞරව උපාධිය
04. ශාස්ත්‍රවේදී මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ගෞරව උපාධිය
05. ශාස්ත්‍රවේදී ආර්ථික විද්‍යා ගෞරව උපාධිය
06. ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි ගෞරව උපාධිය

07. ශාස්ත්‍රවේදී දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම ගෞරව උපාධිය

08. ශාස්ත්‍රවේදී භූගෝලවිද්‍යා ගෞරව උපාධිය

09. විද්‍යාවේදී භූ අවකාශ තාක්ෂණ ගෞරව උපාධිය

10. ශාස්ත්‍රවේදී ඉතිහාසය ගෞරව උපාධිය

11. ශාස්ත්‍රවේදී මානවවිද්‍යා ගෞරව උපාධිය

12. විද්‍යාවේදී තොරතුරු තාක්ෂණ ගෞරව උපාධිය

13. ශාස්ත්‍රවේදී නර්ථනය ගෞරව උපාධිය

14. ශාස්ත්‍රවේදී සංස්කෘත ගෞරව උපාධිය

15. ශාස්ත්‍රවේදී හින්දි ගෞරව උපාධිය

16. ශාස්ත්‍රවේදී ප්‍රංශ භාෂා ගෞරව උපාධිය

17. ශාස්ත්‍රවේදී චීන භාෂා ගෞරව උපාධිය

18. ශාස්ත්‍රවේදී ජපන් භාෂා ගෞරව උපාධිය

19. ශාස්ත්‍රවේදී සංගීතය ගෞරව උපාධිය

20. ශාස්ත්‍රවේදී නිර්මාණාත්මක සංගීත තාක්ෂණය හා නිෂ්පාදනය පිළිබඳ උපාධිය

21. ශාස්ත්‍රවේදී පාලි ගෞරව උපාධිය

22. ශාස්ත්‍රවේදී බෞද්ධ ශිෂ්ටාචාරය ගෞරව උපාධිය

23. ශාස්ත්‍රවේදී බෞද්ධ දර්ශනය ගෞරව උපාධිය

24. ශාස්ත්‍රවේදී බෞද්ධ උරුමය සහ සංචාරක ව්‍යාපාරය පිළිබඳ උපාධිය

25. ශාස්ත්‍රවේදී දර්ශනය පිළිබඳ ගෞරව උපාධිය

26. ශාස්ත්‍රවේදී මනෝවිද්‍යාව ගෞරව උපාධිය

27. ශාස්ත්‍රවේදී දේශපාලන විද්‍යා ගෞරව උපාධිය

28. ශාස්ත්‍රවේදී සිංහල ගෞරව උපාධිය

29. ශාස්ත්‍රවේදී ජන සන්නිවේදනය ගෞරව උපාධිය

30. ශාස්ත්‍රවේදී සමාජවිද්‍යා ගෞරව උපාධිය

31. ශාස්ත්‍රවේදී සමාජ වැඩ ගෞරව උපාධිය

32. ශාස්ත්‍රවේදී සමාජ සංඛ්‍යානය ගෞරව උපාධිය

33. ශාස්ත්‍රවේදී ව්‍යාපාර සංඛ්‍යානය ගෞරව උපාධිය

34. ශාස්ත්‍රවේදී තොරතුරු තාක්ෂණ ගෞරව උපාධිය

**සහතික පත්‍ර පාඨමාලා**

1. ගම්පොර පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව
2. සංචාරක කර්මාන්තය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
3. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව
4. පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

5. සමාජ විද්‍යාව සඳහා දත්ත විශ්ලේෂණය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව

**ඩිප්ලෝමා පාඨමාලා**

1. ව්‍යවහාරික දෙමළ ඩිප්ලෝමාව
2. ඇබ්බැහි වීමේ මනෝවිද්‍යාව සහ පුනරුත්ථාපනය පිළිබඳ ඩිප්ලෝමාව
3. බෞද්ධ උපදේශන ඩිප්ලෝමාව
4. බෞද්ධ අධ්‍යාපනය සහ මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමාව
5. බෞද්ධ අධ්‍යයන ඩිප්ලෝමාව
6. චීන භාෂාව පිළිබඳ ඩිප්ලෝමාව
7. අපරාධ විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව
8. අපරාධ මනෝවිද්‍යාව සහ උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව
9. ආර්ථික විද්‍යාව සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව
10. ඉංග්‍රීසි ඩිප්ලෝමාව
11. භූගෝලීය තොරතුරු පද්ධති සහ දුරස්ථ සංවේදනය පිළිබඳ ඩිප්ලෝමාව
12. ඉතිහාසය පිළිබඳ ඩිප්ලෝමාව
13. තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව
14. ජපන් ඩිප්ලෝමාව
15. මනෝවිද්‍යා ඩිප්ලෝමාව
16. ග්‍රාමීය සංවර්ධන ඩිප්ලෝමාව
17. සමාජ විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව
18. සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමාව
19. ලේඛන හා සන්නිවේදන ඩිප්ලෝමාව

## යටිතල පහසුකම් සංවර්ධනය

**නව විමලධම්ම මන්දිරයේ නව නර්තනාගාරය විවෘත කිරීම**

2024 සැප්තැම්බර් 12 වන දින, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය විසින් නව විමලධම්ම මන්දිරයේ නව නර්තනාගාරයක් විවෘත කරන ලදී. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අතර ඇති විශාලතම නර්තනාගාරයන්ගෙන් එකක් වන මෙය අති නවීන පහසුකම්වලින් යුක්ත වන අතර එය, පුහුණු ශාලා දෙකක්, ඇඳුම් මාරු කරන කාමර සහ ගබඩා කාමර වලින් සමන්විත වේ. පීඨාධිපතිතුමා සහ සම්භාවනීය අමුත්තන්ගේ සහභාගීත්වයෙන් පැවති මෙම විවෘත කිරීමේ උත්සවය, භාෂා, සංස්කෘතික අධ්‍යයන හා ප්‍රසංග කලා අධ්‍යයන අංශය සඳහා සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. මෙම නර්තනාගාරය නර්තන ගෞරව, සාමාන්‍ය උපාධි වැඩසටහන් සහ නාට්‍ය හා රංග කලා හදාරන සිසුන්ට ප්‍රතිලාභ අත්කර දෙන අතර, එමගින් විශ්වවිද්‍යාල ප්‍රජාවගේ අධ්‍යාපනික අත්දැකීම් වැඩි දියුණු කරනු ඇත.

**විමලධම්ම මන්දිරයේ අධ්‍යයන අංශ ස්ථාපිත කිරීම**

විමලධම්ම මන්දිරයේ නව අධ්‍යයන අංශ කිහිපයක් ස්ථාපිත කළ බව අපි සතුටින් දැනුම් දෙමු. මෙම ව්‍යාප්තිය, විවිධ සහ පුළුල් අධ්‍යාපන අවස්ථා පිරිණැමීම සඳහා අපගේ පීඨයේ ඇති කැපවීමෙහි වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරයි. මෙහි අලුතින් ස්ථාපිත කරන ලද අධ්‍යයන අංශ පහත පරිදි වේ:

- මානව විද්‍යා අධ්‍යයන අංශය
- ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් අධ්‍යයන අංශය (DELT)
- මනෝවිද්‍යා අධ්‍යයන අංශය
- භාෂා, සංස්කෘතික අධ්‍යයන හා ප්‍රසංග කලා අධ්‍යයන අංශය
- සංගීත අධ්‍යයන අංශය




**භාෂා විද්‍යාගාර සහ සංස්කෘතික මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම**

**චීන භාෂා විද්‍යාගාරය**

සේද මාවත අධ්‍යයන කාර්යරාමු ගිවිසුමේ කොටසක් වශයෙන් නියෝජිත පිරිස විසින් මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ චීන භාෂා සහ සංස්කෘතික මධ්‍යස්ථානය විවෘත කරන ලදී. මෙම මධ්‍යස්ථානය මගින් සංස්කෘතික හුවමාරුව සහ භාෂා ඉගෙනීම ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන අතර එමගින් ශ්‍රී ලංකා-චීන සබඳතා තවදුරටත් ශක්තිමත් කරයි. මෙම සහයෝගීතාවය, 'එක් තීරයක් - එක් මාවතක්' වැඩසටහනේ සාමය, සහයෝගීතාව සහ සියල්ල ඇතුළත් කර ගැනීමේ ස්වභාවයට අනුගත වෙමින්, විද්‍යාත්මක පර්යේෂණ, දක්ෂතා හුවමාරුව, සංස්කෘතික හුවමාරු සහ අන්‍යෝන්‍ය ප්‍රතිලාභ ප්‍රවර්ධනය කරයි.

**රුසියානු භාෂා මධ්‍යස්ථානය**

රුසියානු යූරල් ආර්ථික විද්‍යා විශ්වවිද්‍යාලය සමඟ සහයෝගීතාවයෙන් යුතුව මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ රුසියානු භාෂා මධ්‍යස්ථානය ස්ථාපිත කර ඇත. මෙය අධ්‍යයන හා සංස්කෘතික සබඳතා ශක්තිමත් කිරීමට

මූලාරම්භය සැපයූ අතර, එමගින්රුසියානු භාෂා අධ්‍යාපනය සහ ජාත්‍යන්තර සහයෝගීතාව සඳහා වැඩි අවස්ථා විවෘත කර දෙනු ලබයි.

### විෂය නිර්දේශ සංවර්ධනය

සිය විෂය නිර්දේශ, විශ්වවිද්‍යාල ප්‍රතිපත්ති සහ තත්ත්ව ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කිරීම පිණිස මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ විෂය නිර්දේශ ඉදිරි වසර 5 සඳහා සංවර්ධනය කර ඇත. එහිදී ඉගැන්වීම් ක්‍රම, විෂයමාලා සහ විභාග ක්‍රියා පටිපාටි කෙරෙහි අවධානය යොමු කරමින් නව පාඨමාලා, සංශෝධන සහ ඉවත් කිරීම් සඳහා වූ යෝජනා සමාලෝචනය කරන ලදී. විෂය නිර්දේශ සංවර්ධනය සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම සඳහා පීඨය විසින් වැඩමුළු කිහිපයක් පවත්වන ලදී.

| දිනය | වැඩමුළුව | සම්පත්දායක |
|---|---|---|
| 2023.11.22 | I වන වැඩමුළුව – පෞද්ගලික අංශය | සැම් ත්‍රිමාවිතාරණ මහතා |
| 2024.01.17 | II වන වැඩමුළුව – රාජ්‍ය අංශය | කේ. ඩී. එන්. රංජිත් අශෝක මහතා |
| 2024. 01.31 | III වන වැඩමුළුව – ශ්‍රම වෙළඳපොළ ප්‍රවණතා – විදේශ අංශය | සිංහ- සී. පී. ද සිල්වා මහතා |
| 2024.12.02 | IV වන වැඩමුළුව – අන්තර්ගත විෂය මාලාව | ආනන්ද වික්‍රමසිංහ මහතා |
| 2024. 11. 11/12 | අවසාන වැඩමුළුව | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චාමලී නාහල්ලගේ සහ මහාචාර්ය ඩී.පී.එස්. චන්ද්‍රකුමාර |

මෙම වැඩමුළු පැවැත්වීම මගින්, විෂය නිර්දේශය පිළිබඳ පීඨ කාර්ය මණ්ඩලයේ දැනුවත්භාවය ඉහළ නංවන ලදී. ඉන් අනතුරුව, පවතින විෂය නිර්දේශයන්හි ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම පිණිස අධ්‍යයනාංශ මට්ටමින් විෂය නිර්දේශ සංශෝධනය සිදු කරන ලදී. මෙම වැඩසටහනේ අවසන් අදියර වත්තල, පෙගාසීස් රීෆ් හෝටලයේදී දින දෙකක වැඩමුළුවක් ලෙස පවත්වන ලදී.

**අධ්‍යාපන හා සේවා නියුක්ති කුසලතා සංවර්ධනය**

*සුභාෂා –සිංහල භාෂා අභියෝගතා තරගාවලිය 2024*

මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය විසින් සිසුන්ගේ භාෂාමය දක්ෂතා ප්‍රදර්ශනය කරමින් සිංහල භාෂා තරගයක් සංවිධානය කරන ලදී. එහිදී, එන්. එච්. ඉසුරු උශාන්ත ද සිල්වා පළමු ස්ථානය ද, ඩබ්. කවිඳු දිල්ශාන් දෙවන ස්ථානය ද, නලින්දු දිල්ශාන් ජයවර්ධන තෙවන ස්ථානය ද දිනා ගන්නා ලදී. මෙම වැඩසටහන මගින් භාෂාමය හා සංස්කෘතික විශිෂ්ටත්වය සඳහා පීඨයේ ඇති කැපවීම මනාව පිළිඹිබු විය.

## ඩිප්ලෝමා සහ විස්තීරණ පාඨමාලා

### ස්කිල්ස් එක්ස්පෝ වැඩසටහන

මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය සැප්තැම්බර් 10 සිට 12 දක්වා පැවති ‘Skills Expo 2024’ වැඩසටහනේ දී සිය විවිධ ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර පාඨමාලා පිළිබඳ ප්‍රචාරණයක් සිදු කරන ලදී. වෘත්තීය අපේක්ෂාවන් සහ පුද්ගල සංවර්ධනය පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීම සඳහා ප්‍රජාව සමඟ සම්බන්ධ වෙමින්, මනෝවිද්‍යාව, සමාජ විද්‍යාව, ආර්ථික විද්‍යාව සහ සංස්කෘතික අධ්‍යයනය වැනි වැඩසටහන් පිළිබඳව එහිදී විශේෂ පැහැදිළි කිරීම් සිදු කරන ලදී. අනාගතයේ මෙහි අධ්‍යාපනික ක්‍රියාවලියට එක්වීමට අපේක්ෂිත සිසුන් සමඟ අන්තර් ක්‍රියා කිරීමට සහ සිය අධ්‍යාපනික පාඨමාලාවන්හි වටිනාකම ප්‍රදර්ශනය කිරීමට මෙම ප්‍රදර්ශනය විශිෂ්ට වේදිකාවක් වූ අතර, එය අධ්‍යයන හා වෘත්තීය වර්ධනය සඳහා ඔවුන්ගේ කැපවීම තවදුරටත් ශක්තිමත් කළේය.

### *රුසියානු භාෂාව පිළිබඳ වෘත්තීය ඩිප්ලෝමාව*

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ රුසියානු භාෂා මධ්‍යස්ථානය සහ යූරල් රාජ්‍ය ආර්ථික විද්‍යා විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන රුසියානු භාෂාව පිළිබඳ වෘත්තීය ඩිප්ලෝමාව, කියවීම, ලිවීම, කථා කිරීම සහ සවන්දීම ඇතුළුව රුසියානු භාෂා ප්‍රවීණතාවය සඳහා පුළුල් පුහුණුවක් ලබා දෙයි. එමගින් රුසියාවේ අනාගත අධ්‍යයන කටයුතු සඳහා සිසුන් සූදානම් කරමින්, ඔවුන්ට සංස්කෘතික අත්දැකීම් සහ අධ්‍යයන සහාය ද ලබා දෙයි.

### *ව්‍යාවහාරික දෙමළ භාෂාව පිළිබඳ ඩිප්ලෝමාව*

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ පවත්වනු ලබන ව්‍යාවහාරික දෙමළ භාෂා ඩිප්ලෝමාව, ව්‍යාකරණ, සාහිත්‍යය සහ සංස්කෘතික දැනුවත්භාවය යනාදී අංශයන් ඇතුළුව දෙමළ භාෂා ප්‍රවීණතාවය ඇතිකිරීම කෙරෙහි අවධානය යොමු කරයි. එය ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂා අවශ්‍යතා සපුරාලීමට සිසුන්ට සහාය වන අතර වෘත්තීය හා අධ්‍යයන වර්ධනය සඳහා අවශ්‍ය  සන්නිවේදන කුසලතා ද එමගින් වැඩි දියුණු කරයි.

### *පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව*

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය විසින් පවත්වනු ලබන පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව, අත්‍යවශ්‍ය පුස්තකාල කළමනාකරණය, නාමාවලීකරණය සහ පර්යේෂණ කුසලතා වලින් සිසුන් සන්නද්ධ කරනු ලබන අතර එමගින් පුස්තකාල, ලේඛනාගාර සහ තොරතුරු මධ්‍යස්ථානවල වෘත්තීන් සඳහා උපාධිධාරීන් සූදානම් කරයි.



Russian Language Center
University of Sri Jayewardenepura
Professional Diploma in
RUSSIAN LANGUAGE
Earn a World-Recognized
PROFESSIONAL DIPLOMA IN RUSSIAN LANGUAGE
Now in Sri Lanka
At the Russian Language Center of the University of Sri Jayewardenepura in collaboration with the Ural State University of Economics, Russia
Duration : 1 Year (Full Time)
Course Fee – ~~$1450~~ $750
* A concessionary fee for first batch
Trainers From
Ural State University of Economics, Russia
The Russian Language Training Program is designed to provide students with a comprehensive understanding of the Russian language and culture, as well as prepare them for further studies in Russia. This program offers intensive language courses, cultural immersion activities, and academic support to help students develop their language skills and adapt to the Russian educational system. Additionally, students will have the oportunity to learn from native speakers.
SPECIALIZED RUSSIAN LANGUAGE COURSES
Humanities
Medical Field
Technical Field
Aircraft Industry
Natural Sciences
Russian Language
Oil and Gas Business
Transport Operations
Transport Infrastructure
Railway Operations Field
Culture, Creativity, Art Streams
Benefits
Opportunity to study at any university in the Russian Federation across various fields.
Exemption from the first-year Russian language course requirement.
Eligibility to apply for scholarships at any university in the Russian Federation across various fields.
Entry Qualifications
A minimum of three Simple Passes (S) in the A/L examination in any stream.
Or
Qualification of NVQ Level 4 or above
1st intake starts from JUNE
APPLY NOW!
More Details
Contact : +94778779413 E mail : coordinator.rlc@fhss.sjp.ac.lk
Russian Language Center
Faculty of Humanities and Social Sciences
University of Sri Jayewardenepura.
VISIT OUR WEB
rlc.fhss.sjp.ac.lk
Russian Language Center
FHSS, USJ

*අධ්‍යයනාංශ ක්‍රියාකාරකම්*

| ක්‍රියාකාරකම | විස්තරය |
|---|---|
| පියානෝ් සහ ස්වර පුවරු (කී බෝඩ්) ශිල්පීය ක්‍රම පිළිබඳ ප්‍රායෝගික වැඩමුළුව | 2023 මාර්තු 7 වන දින, සංගීත හා නිර්මාණශීලී තාක්ෂණ අධ්‍යයනාංශයේදී පියානෝ් සහ ස්වර පුවරු (කී බෝඩ්) වාදන ශිල්පීය ක්‍රම පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලද අතර එහිදී, දෙවන වසරේ උපාධි අපේක්ෂකයින් සඳහා ඉතා අගනා ඉගෙනුම් අත්දැකීමක් ලබා දෙන ලදී. සචිත්ත ප්‍රනාන්දු මහතා විසින් මෙහෙයවන ලද මෙම වැඩමුළුවේදී, සිසුන් ප්‍රායෝගික ක්‍රියාකාරකම් තුළින් උසස් පියානෝ් සහ ස්වර පුවරු (කී බෝඩ්) වාදන ශිල්පීය ක්‍රම ගවේෂණය කරමින්, ඒවා ප්‍රායෝගිව භාවිතා කිරීමට අවස්ථාව උදාකර ගත්හ. |
| සාමාන්‍ය පෙළ ඉතිහාසය පුණරීක්ෂණ සම්මන්ත්‍රණය II | ඉතිහාසය සහ පුරාවිද්‍යා ශිෂ්‍ය සංගමය විසින් සංවිධානය කරන ලද අ.පො.ස. සාමාන්‍ය පෙළ ඉතිහාසය පිළිබඳ දෙවන පුනරීක්ෂණ සම්මන්ත්‍රණය 2024 මැයි 2 වන දින දෙහිඕවිට, හිඟුරලකන්ද මහා විද්‍යාලයේදී පවත්වන ලදී. සිසුන් 60කට අධික පිරිසක් සහභාගී වූ මෙම වැඩසටහනේදී විභාග උපක්‍රම සහ පාඩම් පිළිබඳව දැනුවත් කිරීම් සිදු කරන ලද අතර, පාසල් පුස්තකාලය වැඩිදියුණු කිරීම සඳහා පොත් පරිත්‍යාගයක් ද සිදු කරන ලදී. කථිකාචාර්ය දමිත් රණගල මහතා සහ උපාධි අපේක්ෂකයින් විසින් මෙහෙයවන ලද මෙම සම්මන්ත්‍රණය, ඊට සම්බන්ධ වූ සියලු දෙනාට වටිනා අත්දැකීමක් විය. |
| උරුමය ප්‍රතිෂ්ඨාපනය කිරීම | 2022 වසරේදී ආචාර්ය ඕෂන් වෙදගේ මහතා සහ ඔහුගේ සගයන් විසින් ස්විට්සර්ලන්ත කෞතුකාගාරවල ඇති වැදි පරපුරට අයත් පුරාවස්තු නැවත මෙරටට ගෙන්වා ගැනීමේ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. එම පුරාවස්තු වැදි ජනතාවට අයත් බව තහවුරු වීමෙන් අනතුරුව, 2024 මැයි මාසයේදී ඒවා නැවත භාර දෙන ලදී. මෙම අවස්ථාව සනිටුහන් කරමින් බාසල් නුවරදී විධිමත් භාරදීමේ උත්සවයක් ද පැවැත්විණි. එම පුරාවස්තු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් සංරක්ෂණය කිරීමට නියමිත අතර, 'වරිග මහගෙදර' නම් වූ වැදිජන කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තැබෙනු ඇත |

| | |
|---|---|
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ මානව පුස්තකාල වැඩසටහන | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය විසින් සංවිධානය කරන ලද මානව පුස්තකාල වැඩසටහන 2024 ඔක්තෝබර් 9 වන දින සාර්ථකව නිම විය. ප්‍රධාන පුස්තකාලයේදී පැවති මෙම වැඩසටහන, සිසුන්ට, ආචාර්ය මණ්ඩලයට සහ ප්‍රජාවට අර්ථවත් සංවාදවල නිරත වීමට සහ පෞද්ගලික අත්දැකීම් බෙදා ගැනීමට කදිම වේදිකාවක් සපයන ලදී. මෙහිදී සහභාගී වූවන් "මානව පුස්තක" ලෙස ක්‍රියා කරමින්, ඒකාකාරී කෘති අභියෝගයට ලක් කරමින් සහ අන්‍යෝන්‍ය අවබෝධය ප්‍රවර්ධනය කිරීම සඳහා තම ජීවිත කතා බෙදාහදා ගත්හ. |
| **2**වන බොන් ඔදොරි | භාෂා අධ්‍යයනාංශය සහ ජපන් භාෂා සංගමය විසින් සංවිධානය කරන ලද දෙවන බොන් ඔදොරි (Bon Odori) උත්සවය 2024 ඔක්තෝබර් 8 වන දින පවත්වන ලදී. විවිධ ප්‍රසංග වලින් සමන්විත වූ මෙම උත්සවයේ ආහාර සහ ක්‍රීඩා අංග ද ඇතුළත් විය. ජයිකා ආයතනයේ ප්‍රධාන නියෝජිත යමඩා තෙත්සුයා මහතා මෙහි ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගී වූ අතර, මෙම වැඩසටහන සාම්ප්‍රදායික ජපන් ක්‍රියාකාරකම් තුළින් සංස්කෘතික දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීම සිදුකරන ලදී. |
| හිනමත්සුරි (බාලිකා දිනය) | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ ජපන් භාෂා අධයයන අංශය, ජපාන තානාපති කාර්යාලයේ සහ ජයිකා ශ්‍රී ලංකා කාර්යාලයේ සම්භාවනීය අමුත්තන්ගේ සහභාගීත්වයෙන්, මාර්තු 3 වන දින හිනමත්සුරි (Hinamatsuri) නමින් බාලිකා දිනය සමරන ලදී. ජපන් සම්ප්‍රදායන් ප්‍රවර්ධනය කරමින් සහ ගැහැනු ළමුන්ට සතුට ප්‍රාර්ථනා කරමින් පැවති මෙම උත්සවය, සංස්කෘතික ප්‍රසංග, ඉදිරිපත් කිරීම් සහ ඔරිගාමි නිරූපණයකින් සමන්විත විය. |

## විදේශීය විශ්වවිද්‍යාල සමග අධ්‍යයන සහයෝගීතාවලට එළඹීම

**විශ්වවිද්‍යාලය තුළ රුසියානු භාෂා මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සහ යූරල් රාජ්‍ය විශ්වවිද්‍යාලය අතර හවුල්කාරිත්වයක් ගොඩනගා ගැනීම**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ රුසියානු භාෂා මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා රුසියාවේ යූරල් රාජ්‍ය ආර්ථික විද්‍යා විශ්වවිද්‍යාලය සමඟ ඇති කරගත් හවුල්කාරිත්වය පිළිබඳව අපි සතුටින් දැනුම් දෙමු. තානාපති ලෙවන් එස්. දාගර්යාන් මහතාගේ සහයෝගය ඇතිව පැවති මෙම අවස්ථාව සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපති, පීඨාධිපතිවරුන්, අධ්‍යයනාංශ ප්‍රධානීන්, සිසුන් ඇතුළු සම්භාවනීය අමුත්තන් සහභාගී වූහ. මෙහිදී මහාචාර්ය රෝමන් ක්‍රස්නොව් සහ මරියා එල්. පොපෝවා මහත්මියගේ පුරෝගාමී මෙහෙවර විශේෂ ඇගයීමට ලක්විය. මෙම වැඩපිළිවෙළ රුසියානු භාෂාව සහ සංස්කෘතිය සමඟ ගැඹුරු සබඳතාවක් ඇතිකර ගැනීමට ඉවහල් වනු ඇත.

**බර්යාට් රාජ්‍ය විශ්වවිද්‍යාල සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය අතර අධ්‍යයන සහයෝගීතා පිළිබඳ පැවැති සාකච්ඡාව**

2024 සැප්තැම්බර් 24 වන දින, රුසියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, බර්යාට් රාජ්‍ය විශ්වවිද්‍යාලය, දශි චොයින්කොර්ලින් බෞද්ධ විශ්වවිද්‍යාලය, බර්යාට් රාජ්‍ය කෘෂිකාර්මික ඇකඩමිය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය අතර පැවති සූම් (Zoom) හමුවකදී ගොඩනගා ගත හැකි සහයෝගීතා පිළිබඳව සාකච්ඡා කරන ලදී. මෙහිදී ප්‍රමුඛ පෙළේ විද්වතුන් සහ රාජ්‍ය තාන්ත්‍රිකයින් අධ්‍යයන හා සංස්කෘතික හුවමාරු, බෞද්ධ දර්ශනය ප්‍රවර්ධනය කිරීම සහ යෝජිත ගිම්හාන කඳවුරක් වැනි වැඩසටහන් හරහා අන්තර් සංස්කෘතික සබඳතා වර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කළහ.

### හිරෝෂිමා විශ්වවිද්‍යාලය සමඟ ගුරු පුහුණු වැඩසටහනක් පැවැත්වීම

ශ්‍රී ලංකාව සහ ජපානය අතර සබඳතා ශක්තිමත් කිරීමත්, දෙරට අතර සංස්කෘතික හා අධ්‍යාපනික අත්දැකීම් හුවමාරු කර ගැනීමත් අරමුණු කරගනිමින් මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය හිරෝෂිමා විශ්වවිද්‍යාලය සමඟ එක්ව සති 3ක ගුරු පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

## විශේෂ වැඩසටහන්

### විදෝදය සාහිත්‍ය සම්මාන උළෙල

විවිධ සාහිත්‍ය කෘති හරහා සුවිශේෂී දස්කම් දැක්වූවන් ඇගයීමට ලක්කරමින් විදෝදය සාහිත්‍ය සම්මාන 2024 උළෙල පැවැත්විණි. මෙහිදී හොඳම නවකතාව සඳහා එරික් ඉලයප්ආරච්චි, හොඳම කෙටිකතා සංග්‍රහය සඳහා ප්‍රභාත් ජයසිංහ, හොඳම කාව්‍ය සංග්‍රහය සඳහා රුවන් බඳුජීව, හොඳම තීරු ලිපි සඳහා අරුණ ප්‍රදීප් කුමාර,

හොඳම ගීත රචනය සඳහා සමුද්‍ර වෙත්තසිංහ සහ හොඳම ශාස්ත්‍රීය ග්‍රන්ථය සඳහා ධර්මරත්න හේරත් යන මහත්වරු සම්මානයට පාත්‍ර වූහ. මෙම සම්මාන උළෙලේ දී එම කතුවරුන්ගේ සුවිශේෂී දක්ෂතා ඉස්මතු කෙරිණි.

### දෙමළ ආහාර උත්සවය සහ දෙමළ භාෂා දිනය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය සහ ඩිජිටල් අධ්‍යාපනය සහ වෘත්තීය සංවර්ධනය සඳහා වූ මධ්‍යස්ථානය (CDEPD) එක්ව සංවිධානය කරන ලද දෙමළ ආහාර උත්සවය සහ දෙමළ භාෂා දිනය, 2024 දෙසැම්බර් 30 වන දින විශ්වවිද්‍යාලීය සුමංගල ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.

### මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ වාර්ෂික ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය 2024

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ වාර්ෂික ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය 2024 මාර්තු 3 වන දින පවත්වන ලද අතර එහිදී උපාධිධාරීන් 1,000කට අධික සංඛ්‍යාවක් ගෞරවයට පාත්‍ර විය. විවිධ විෂය ධාරා ඔස්සේ ඩිප්ලෝමා සහතික පත්‍ර ප්‍රදානය කෙරුණු අතර, මෙහිදී ශ්‍රී ලංකාවේ බුද්ධිමය වර්ධනය හා වෘත්තීය වර්ධනය සඳහා අධ්‍යාපනය මගින් සිදුකෙරෙන කාර්යභාරය පිළිබඳව සම්භාවනීය ආරාධිත කථිකයන් විසින් අවධාරණය කරන ලදී.

### පීඨ ප්‍රකාශන දිනය

පීඨ ප්‍රකාශන දිනය සාර්ථකව අවසන් වූ අතර එය අධ්‍යයන, අනධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයින්ට සහ සිසුන්ට ඔවුන්ගේ 2023 වසරේ ප්‍රකාශන ප්‍රදර්ශනය කිරීමට නිර්මාණය වූ වේදිකාවක් විය. මෙම අවස්ථාවේදී ඔවුන්ගේ ජයග්‍රහණ සම්මානයට පාත්‍රවූ අතර, අධ්‍යයන කටයුතු ඉදිරියට ගෙන යාමේ ප්‍රයත්නයන් ඇගයීමට ලක් කරන ලදී. දැනුම බෙදා ගැනීමේ වැදගත්කම ඉස්මතු කරමින්, සහභාගිවන්නන්ගේ දායකත්වය වෙනුවෙන් ඔවුන්ව ඇගයීමට ලක් කෙරිණි. මෙම වැඩසටහන සහයෝගීත්වයේ ශක්තිය වර්ධනය කළ අතර, පුද්ගල ජයග්‍රහණ ඇගයීමට ලක්කරමින් සහ අධ්‍යාපනය, පර්යේෂණ සහ බුද්ධිමය වර්ධනය ප්‍රවර්ධනය කරමින් අධ්‍යයන විශිෂ්ටත්වය අත්කර ගැනීම සහ අඛණ්ඩව දැනුම  වර්ධනය කිරීමෙහිලා වූ කැපවීම නැවත තහවුරු කළේය.

### සම්මන්ත්‍රණ සහ පර්යේෂණ හා සම්බන්ධ වැඩසටහන්

### විද්‍යෝදය උපාධි අපේක්ෂක පර්යේෂණ දිනය - 2024

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය විසින් සංවිධානය කරන ලද 2024 විද්‍යෝදය උපාධි අපේක්ෂක පර්යේෂණ දිනය වැඩසටහන මගින්, උපාධි අපේක්ෂකයින්ගේ කුසලතා වැඩි දියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කර තිබුණි. "අනාගතයට මඟ පෙන්වීම: මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යාවන්හි මතු පරම්පරාවේ පර්යේෂකයන් දිරිමත්  කිරීම" යන තේමාව යටතේ පැවති මෙම වැඩසටහන

මගින් නව දැනුම බෙදාහදා ගැනීමට සහ ශාස්ත්‍රීය ක්‍රියාකාරකම්වල නිරත වීමට සිසුන්ට වේදිකාවක් නිර්මාණය කරන ලදී.

### අපරාධ විද්‍යාව සහ අපරාධ යුක්තිය පිළිබඳ පළමු ජාත්‍යන්තර සම්මන්ත්‍රණය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය විසින් අපරාධ විද්‍යාව සහ අපරාධ යුක්තිය පිළිබඳ පළමු ජාත්‍යන්තර සම්මන්ත්‍රණය පවත්වන ලදී. මෙම වැඩසටහන මගින් අපරාධ විද්‍යාවේ සහ අපරාධ යුක්තියේ සමකාලීන ගැටලු පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා විද්වතුන්, පර්යේෂකයන් සහ වෘත්තිකයන් එකට එක් කළේය. ප්‍රධාන දේශන, මණ්ඩප සාකච්ඡා සහ පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම් ඇතුළත් වූ මෙම සම්මන්ත්‍රණය, අදහස් හුවමාරු කර ගැනීමට සහ ක්ෂේත්‍රයේ අභිවෘද්ධියට මඟ පෑදීය. අධ්‍යයන විශිෂ්ටත්වය සහ ගෝලීය සහයෝගීතාවය සඳහා වන විශ්වවිද්‍යාලයේ කැපවීම එමගින් මනාව ඉස්මතු විය.

### පාලි හා බෞද්ධ අධ්‍යයන පිළිබඳ 17 වන ජාත්‍යන්තර සම්මන්ත්‍රණය

පාලි හා බෞද්ධ අධ්‍යයන පිළිබඳ 17 වන ජාත්‍යන්තර සම්මන්ත්‍රණය, බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයේ නව පර්යේෂණ සහ ප්‍රධාන ගැටලු පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා විද්වතුන්ට වේදිකාවක් නිර්මාණය කරන ලදී. එය දැනුම හුවමාරුව, අන්තර් ක්‍රියාකාරීත්වය සහ පාලි හා බෞද්ධ අධ්‍යයනයන්හි ශුද්ධත්වය ආරක්ෂා කිරීමටත්, එහි විශ්වීය අදාළත්වය පිළිබඳව කරුණු අනාවරණය කිරීමටත් උපකාරී විය. මෙම සම්මන්ත්‍රණය මගින් ජාත්‍යන්තරව පිළිගත් ශාස්ත්‍රීය සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම සිදුවූ අතර බෞද්ධ දර්ශනය, ශිෂ්ටාචාරය, මනෝවිද්‍යාව, අධ්‍යාපනය, උරුමය සහ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාවන්හි ආශ්‍රිත ක්ෂේත්‍ර වැනි විවිධ මාතෘකා එහිදී ආවරණය කෙරුණි.

## <u>තත්ත්ව සහතික මධ්‍යස්ථානය</u>

| මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයෙහි තත්ත්ව සහතික මධ්‍යස්ථානය විසින් පවත්වන ලද වැඩමුළු | | |
|---|---|---|
| දිනය | වැඩමුළුවේ මාතෘකාව | ඉලක්කගත කණ්ඩායම |
| 2024.03.27 | අධ්‍යයනාංශ අනුව ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන- ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඩී. බී. පී. එච්. දිසාබණ්ඩාර | මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය |
| 2024.11.27 | අධ්‍යයන රෙගුලාසි (නිවාඩු, උසස්වීම් සහ අවසර පත්‍ර ඇතුළුව) සම්බන්ධ චක්‍රලේඛ පිළිබඳ දැනුවත් කිරීමේ සැසිය- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ | මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය |

| | | |
|---|---|---|
| | ලේඛකාධිකාරී ඒ. බී. වැලිවිට මහතා | |
| 2024.12.23 | සංශෝධිත වැඩසටහන් සමාලෝචන අත්පොත පිළිබඳ වැඩමුළුව- ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චාමලී නාහල්ලගේ | මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ කළමනාකරණ සහකාර කාර්ය මණ්ඩලය |

<u>ව්‍යවසායකත්ව සමාජය</u>

| දිනය | ව්‍යාපෘතියේ නම | මෙහෙයවන ලද ආයතනය | කෙටි පැහැදිලි කිරීමක් |
|---|---|---|---|
| **2024** අප්‍රේල් **29** | තීර්ථ **24** සංගීත සන්ධ්‍යාව | මා.ශා හා ස.වි.පීඨයේ ව්‍යවසායකත්ව සමාජය | සිසුන්ගේ සංගීත සහ නර්තන අංග ඇතුළත් සංගීත ප්‍රසංගයක්. |
| **2024** මැයි **23** | **CIGNO '24** අදියර-**I** | මා.ශා හා ස.වි.පීඨයේ ව්‍යවසායකත්ව සමාජය | ව්‍යවසායකත්ව කුසලතා වැඩි දියුණු කිරීම සඳහා ව්‍යාපාර යෝජනා ලිවීමේ වැඩමුළුවක්. සම්පත් දායකයින්: බවන්ත රණසිංහ මහතා (ප්‍රධාන විධායක නිලධාරී, සිලෝන් මීඩියා හෝල්ඩින්ග්ස්), අමල් ගුරුසිංහ මහතා (ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු නිලධාරී, කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය, කොළඹ), චමෝද් කාවින්ද මහතා (Power BI Data Analyst & Organic Marketing Strategist). |
| **2024** මැයි **6** | **CIGNO '24** අදියර **II** | මා.ශා හා ස.වි.පීඨයේ ව්‍යවසායකත්ව සමාජය | ව්‍යාපාර ප්‍රවර්ධනය සඳහා ග්‍රැෆික් නිර්මාණය සහ වීඩියෝ සංස්කරණය පිළිබඳ මාර්ගගත වැඩමුළු. සම්පත් දායකත්වය: ස්පෙෂල් ග්‍රැෆික් සමාගම (ග්‍රැෆික් නිර්මාණ වැඩමුළුව), ලර්නියම් |

| | | | |
|---|---|---|---|
| | | | ආයතනය<br>(වීඩියෝ සංස්කරණ වැඩමුළුව). |
| ක්‍රියාත්මක | ජපන් ජබරවලින් අත්කම් නිර්මාණ | මා.ශා හා ස.වි.පීයයේ ව්‍යවසායකත්ව සමාජය | ලක්සල සමග සහයෝගයෙන් ජපන් ජබර භාවිතයෙන් අත්කම් භාණ්ඩ නිර්මාණය කිරීම. |
| ක්‍රියාත්මක | නෙළුම් ශාඛය ආශ්‍රිත රෙදි | මා.ශා හා ස.වි.පීයයේ ව්‍යවසායකත්ව සමාජය | ග්‍රාමීය ව්‍යවසායකයින් සවිබල ගැන්වීම සඳහා තිරසාර නෙළුම් රෙදි තාක්ෂණය සංවර්ධනය කිරීම. මේවන විට අනුග්‍රාහකත්වයන් සෙවීමේ සහ ප්‍රජා පුහුණු වැඩසටහන් පැවැත්වීමේ අදියරේ පවතී. |
| **2024** සැප්තැම්බර් **26** | ව්‍යවසායකත්ව සමුළුව **24 -**<br>ස්ථාපන උත්සවය | ආරම්භක කණ්ඩායම , මා.ශා හා ස.වි.පීයයේ ව්‍යවසායකත්ව සමාජය | කළමනාකරණ මණ්ඩල සාමාජිකයින් 19 දෙනෙකුට සහ කණ්ඩායම් සාමාජිකයින් 32 දෙනෙකුට ඔවුන්ගේ කැපවීම අගයමින් ලාංඡන ප්‍රදානය කිරීම පිණිස පවත්වන ලද වාර්ෂික කණ්ඩායම් උත්සවය |
| **2024** සැප්තැම්බර් **7** (අදියර **1), 2024** ඔක්තෝබර් **4** (අදියර **2)** | ස්ටාර්ට් අප් පල්ස් **2024** | මානව සම්පත් කළමනාකරණ කණ්ඩායම, මා.ශා හා ස.වි.පීයයේ ව්‍යවසායකත්ව සමාජය | මුෂ්තාක් ඉද්‍රොස් මහතා (සම-නිර්මාතෘ, ලොකු බිස්නස්) විසින් මෙහෙයවන ලද ව්‍යවසායකත්වය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන. පළමු අදියරේදී ව්‍යවසායකත්ව මූලික කරුණු ආවරණය කරන ලද අතර, දෙවන අදියරේදී තෝරාගත් සිසුන්ට පෞද්ගලිකව මගපෙන්වීම් සිදුකරන ලදී. |
| **2024** සැප්තැම්බර් **4 – 2024** සැප්තැම්බර් **26** | බිස් බැට්ල් **2024** | මාධ්‍ය කණ්ඩායම, මා.ශා හා ස.වි.පීයයේ ව්‍යවසායකත්ව සමාජය | හොඳම ශිෂ්‍ය ව්‍යාපාර හිමිකරු සහ හොඳම ව්‍යාපාර අදහස යන කාණ්ඩ දෙකකින් යුත් මාර්ගගත ව්‍යාපාර අදහස් තරඟය. |

| | | | |
|---|---|---|---|
| **2024** ඔක්තෝබර් **16** | ඔන්ට්‍ර මොමෙන්ටම් **- අදියර 01** | වැඩසටහන් කණ්ඩායම, මා.ශා හා ස.වි.පීඨයේ ව්‍යවසායකත්ව සමාජය | කළමනාකරණ මණ්ඩල සාමාජිකයින් සඳහා නායකත්වය සහ කණ්ඩායම් වැඩ කුසලතා වර්ධනය කිරීම පිණිස පවත්වන ලද බාහිර පුහුණුව. සම්පත්දායකයා: සමීර ජයවර්ධන මහතා. මෙය විශ්වවිද්‍යාල ක්‍රීඩා පිටියේදී (ගල්පිට්ටනියෙදී) පැවැත්විණි. |
| **2024** ඔක්තෝබර් **22** | ව්‍යවසායකත්ව ප්‍රදර්ශනය **'24** | ව්‍යවසායකත්ව කණ්ඩායම, මා.ශා හා ස.වි.පීඨයේ ව්‍යවසායකත්ව සමාජය | උපාධි අපේක්ෂක ව්‍යවසායකයින්ට තම නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීමට සහ අලෙවි කිරීමට ඉඩ සලසමින් ශිෂ්‍ය ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා පැවැති එක්දින ප්‍රදර්ශනයක්. බොහෝ ව්‍යවසායකයෝ මේ සඳහා සහභාගී වූහ. |
| **2024** ඔක්තෝබර් **3, 10, 16, 23, 29** | ඉන්සයිට්**'24 -** ඉංග්‍රීසි වැඩමුළු මාලාව | ව්‍යාපාර මනෝවිද්‍යා කණ්ඩායම, මා.ශා හා ස.වි.පීඨයේ ව්‍යවසායකත්ව සමාජය | කථන ඉංග්‍රීසි ප්‍රවීණතාවය, ස්වයං ප්‍රකාශනය සහ සන්නිවේදන කුසලතා වැඩි දියුණු කිරීම අරමුණු කරගත් වැඩමුළු මාලාවක්. මෙය මා.ශා හා ස.වි.පීඨයේ Entre Club හිදී පැවැත්විණි. |

<u>ප්‍රකාශන කමිටුව</u>

| අනු කමිටුව | සම්බන්ධීකාරකගේ නම | වැඩසටහන | පැවැත්වූ දිනය |
|---|---|---|---|
| සංකතන | මහාචාර්ය පූජ්‍ය විතාරන්දෙණියේ චන්දසිරි හිමි | එළදායී බ්ලොග් අඩවි රචනය චතුස්කි ජයසිංහ, ඉංග්‍රීසි කථිකාචාර්ය සහ නිදහස් ලේඛක, සේගිස් විශ්ව විද්‍යාලය | 2024 පෙබරවාරි 6 |
| | | ආචාර්ය පබිලිස් සිල්වා | 2024 ඔක්තෝබර් 9 |

| | | | |
|---|---|---|---|
| | | විසින් පවත්වන ලද මානව පුස්තකාලය වැඩසටහන | |
| විද්‍යුත්- සුරක්ෂිතාගාරය (E- repository) | ආචාර්ය නිලූකා ප්‍රියදර්ශනී | සම්පාදනය කරන ලද පොත්, ලිපි ආදිය (27) සිංහල භාෂාවෙන් ප්‍රකාශයට පත් කර මා.ශා හා ස.වි.පීඨයේ විද්‍යුත්- සුරක්ෂිතාගාරයට උඩුගත කරන ලදී. | |
| මා.ශා හා ස.වි.පීඨයේ බ්ලොග් අඩවිය | ආචාර්ය පූජ්‍ය නෙල්ලිවල මෙත්තානන්ද හිමි | 2024 වර්ෂයේදී බ්ලොග් ලිපි 09ක් උඩුගත කරන ලදී. | |
| විද්‍යෝදය සාහිත්‍ය සම්මාන | භාග්‍යා දිල්හානි මහත්මිය | හොඳම නවකතාව, කෙටිකතා එකතුව, තීරු ලිපි එකතුව, මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පොත, කවි සහ ගීත | 2024 සැප්තැම්බර් 3 |
| පීඨ ප්‍රකාශන දිනය | ආචාර්ය කෞශල්‍යා හේවාවසම් | ප්‍රකාශන සඳහා කථිකාචාර්යවරුන් 42 දෙනෙකුට සහ ප්‍රකාශන සඳහා සිසුන් 12 දෙනෙකුට සහතිකපත්‍ර සහ මුදල් ත්‍යාග පිරිනමන ලදී.. | 2024 සැප්තැම්බර් 25 |

<u>සංස්කෘතික කමිටුව</u>

| | |
|---|---|
| m%;Hjf,dalk p;=¾udk udkjYdia;% yd iudÔhúoHd mSGh b;sydi l:dj | lD;sh t<s oelaùu |
| හෙරිටේජ් ප්ලස් අන්තර් විශ්ව විද්‍යාල කෙටි වීඩියෝ තරඟය | uQ,sl jgh yd wjidk jgh meje;aùu |
| හෙරිටේජ් ප්ලස් කෙටි වීඩියෝ තරඟය - වැඩමුළු | jevuq¿ 4la meje;aùu |

| | |
|---|---|
| rka riq ;kq ks¾udK yd .S; ks¾udK ;r.h | jevuq¿ meje;aùu yd .S; ks¾udK wdrïN lsÍu |

<u>සම අවස්ථා ඒකකය</u>

| | ක්‍රියාකාරකම | පැවැත්වූ දිනය | වෙබ් පුවත්/ පීඨ ෆේස්බුක් සම්බන්ධතාවය |
|---|---|---|---|
| 01 | ශ්‍රී ලංකා පවුල් සැලසුම් සංගමය සමඟ සහයෝගයෙන් යුතුව කාන්තා දින සැමරුම පැවැත්වීම. මේ සඳහා කොළඹ විශ්ව විද්‍යාලය, කැලණිය විශ්ව විද්‍යාලය සහ රත්මලාන අන්ධ විද්‍යාලය නියෝජනය කරමින් විශේෂ අවශ්‍යතා ඇති ශිෂ්‍යාවන් 75 ක් පමණ සහභාගී වූහ. | 2024.03.26 | https://www.facebook.com/profile/100057463480341/search/?q= |
| 02 | විශේෂ අවශ්‍යතා සහිත සිසුන්ගේ රැකියා පුහුණුව පිළිබඳව b-සම්බන්ධිත ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයක් සමඟ සාකච්ඡාවක් පැවැත්වීම | 2024.08.30 | https://www.facebook.com/share/8FrHo2M1cXmxPZK5/?mibextid=xfxF2i |
| 03 | සාමාන්‍ය පෙළ විභාගයට සූදානම් වන රත්මලාන අන්ධ විද්‍යාලයේ සිසුන් සඳහා වැඩමුළු මාලාවක් පැවැත්වීම. | 2024 ඔක්තෝම්බර් | https://fhss.sjp.ac.lk/eoc/2024/10/21/%e0%b6%bb%e0%b6%ad%e0%b7%8a%e0%b6%b8%e0%b6%bd%e0%b7%8f%e0%b6%b1-%e0%b6%85%e0%b6%b1%e0%b7%8a%e0%b6%b0-%e0%b7%80%e0%b7%92%e0%b6%af%e0%7%8a%e%6%ba%e0%b7%8f%e0%b6%bd%e0%b6%ba%e0%b7%9a/ |
| 04 | ‘නේරංජනා’ නමින් යුත් සිසු කුසලතා සංදර්ශනය සුමංගල ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. | 2024.10.29 | https://www.youtube.com/live/2E0_Gb_1ieU |
| 05 | ශ්‍රව්‍ය පොත් පුස්තකාල ඊ-සේවාව සඳහා ශ්‍රව්‍ය පොත් 51ක් (පිටු 6645) සකස් කරන ලදී. | 2024 ජනවාරි සිට දෙසැම්බර් | 2025 ජනවාරි මාසයේදී පැවැති පීඨ මණ්ඩල රැස්වීමේදී පටිගත කරන ලදී. |

| | | | |
|---|---|---|---|
| | | දක්වා | |
| 06 | ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අධ්‍යයන 'පුමිතිරි' විද්‍යුත් සඟරාවේ කලාප දෙකක් පළකිරීම | මාර්තු 08 සහ නොවැම්බර් 19 | https://www.facebook.com/photo/?fbid=860798345845607&set=a.572678797990898 |
| 07 | මා.ශා හා ස.වි.පීඨයේ සිසුන් 12 දෙනෙකු සඳහා මාස 12ක් 'සිහින' ශිෂ්‍යත්ව ගෙවීම (මුළු මුදල රු. 288,000/-) | ජනවාරි සිට දෙසැම්බර් දක්වා | 2025 පෙබරවාරි මාසයේදී පැවැති පීඨ මණ්ඩල රැස්වීමේදී පටිගත කරන ලදී. |

<u>බහුවිධ විෂය අධ්‍යයන සඳහා වන ජාත්‍යන්තර මධ්‍යස්ථානය</u>

**1.** ජාත්‍යන්තර පර්යේෂණ සහයෝගීතා (අවබෝධතා ගිවිසුම්)

| | සහයෝගීතාවයේ ස්වභාවය | ජාත්‍යන්තර |
|---|---|---|
| 1. | සම්මන්ත්‍රණ | ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාණ්තයේ සිවකාසිහි මිත්‍ර දේවි ප්‍රකාශන සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹීම<br>ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාණ්තයේ තිරුනෙල්වේලිහි මනෝන්මනියම් සුන්දරනාර් විශ්වවිද්‍යාලය සමග අවබෝධතා ගිවිසුමකට එළඹීම |
| | | දර්ශන හා මනෝවිද්‍යා අධ්‍යයනාංශය සහ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය<br>බහුවිධ විෂය අධ්‍යයන සඳහා වන ජාත්‍යන්තර මධ්‍යස්ථානය, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව |
| 2. | සම්මන්ත්‍රණ | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශක ඒකකය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ බහුවිධ විෂය අධ්‍යයන සඳහා වන ජාත්‍යන්තර මධ්‍යස්ථානය සහ ස්විට්සර්ලන්තයේ ජිනීවාහි Living Values Education සංගමය (ALIVE) සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹීම. |

1. ජාතික පර්යේෂණ සහයෝගීතා (අවබෝධතා ගිවිසුම්)

| | සහයෝගීතාවයේ ස්වභාවය | ජාතික |
|---|---|---|
| 1. | සම්මන්ත්‍රණ | ජාත්‍යන්තර දැනුම කළමනාකරණ ආයතනය (TIIKM) සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹීම |

| | | |
|---|---|---|
| 2. | සහයෝගීතා පර්යේෂණ | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය සහ බහුවිධ විෂය අධ්‍යයන සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය අතර අවබෝධතා ගිවිසුමකට එළඹීම |

## 2. පවත්වන ලද සම්මන්ත්‍රණ

| | සම්මන්ත්‍රණ | සහභාගිවූවන් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අධ්‍යාපනය පිළිබඳ 10 වන ජාත්‍යන්තර සමුළුව (ICEDU 2024)<br><br>පැවැති දිනයන්: 2024 මැයි 2, 3, 4<br>ස්ථානය: කොළඹ ගාලු මුවදොර හෝටලය | 700 කට අධික ප්‍රමාණයක් සහභාගි වූ අතර සාරාංශ 150 ට වඩා ඉදිරිපත් කරන ලදී. |
| 2 | උසස් අධ්‍යාපනය බලගැන්වීම පිළිබඳ ගෝලීය සම්මන්ත්‍රණය: 21 වන සියවසේ කුසලතා විවිධ විෂයධාරා හරහා ඒකාබද්ධ කිරීම (දෙමුහුන් ආකාරයෙන් පැවැත්වේ).<br>පැවැති දිනයන්: 2024 ජූලි 3 සහ 4<br>ස්ථානය: බෙනඩික්ට් XVI කතෝලික ආයතනය [BCI කැම්පස්], මීගමුව, ශ්‍රී ලංකාව | සාරාංශ 80ක් |
| 3 | ජීවන හර පද්ධති අධ්‍යාපනය පිළිබඳ දෙවන ජාත්‍යන්තර සමුළුව<br><br>දිනය: 2024 ඔක්තෝබර් 15<br>ස්ථානය: ගාලු මුවදොර හෝටලය, කොළඹ | කර්මාන්ත වෘත්තිකයන් ඇතුළුව සහභාගිවන්නන් 100ක් වූ අතර සාරාංශ 30ක් ඉදිරිපත් කරන ලදී. |

## 1. පවත්වන ලද වැඩමුළු

| | වැඩමුළු | දිනය ස්ථානය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. | වෘත්තීය සංවර්ධනය සඳහා ජීවන හර පද්ධතිවල වැදගත්කම.<br>(පූර්ව සම්මන්ත්‍රණ වැඩමුළුව 01_ICLVE 2024) | සම්පත්දායක: ඩොරිනි ද සිල්වා මහත්මිය<br>දිනය: 2024 මාර්තු 27<br>ස්ථානය: සත්ව විද්‍යා ශ්‍රවණාගාරය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය<br>වේලාව: ප.ව. 2.00 සිට ප.ව. 5.00 දක්වා | 50 |
| 2. | හාර්ට් රෙසිලියන්ස්. | සම්පත්දායක: බාර්කවි ශාන්තිකුමාර් මහත්මිය සහ | 35 |

| | | | |
|---|---|---|---|
| | (පූර්ව සම්මන්ත්‍රණ වැඩමුළුව 02_ICLVE 2024) | මාර්ක් ත්‍රිමාවිතාන මහතා<br>දිනය: 2024 අප්‍රේල් 03<br>ස්ථානය: සුහුරු පන්ති කාමරය, සමාජ විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය<br>වේලාව: ප.ව. 3.00 සිට ප.ව. 6.00 දක්වා | |
| 3. | සර්පයා වලිගයෙන් අල්ලා ගැනීම: උසස් අරමුණක් නොමැති අධ්‍යාපනයේ අනතුර. (පූර්ව සම්මන්ත්‍රණ වැඩමුළුව 3_ICLVE 2024) | සම්පත් දායක: ආචාර්ය ඉන්දුජීව පීරිස්<br>දිනය: 2024 අප්‍රේල් 6<br>ස්ථානය: Zoom තාක්ෂණය හරහා<br>වේලාව: පෙ.ව. 10.00 සිට 11.00 දක්වා<br>සබැඳිය:<br>https://www.youtube.com/watch?v=Uzatc94cixo | 50 |
| 4. | ජීවන හර පද්ධති අධ්‍යාපනය හඳුන්වාදීම (මාර්ගගත වැඩසටහන) | සම්පත්දායක: ටී.ටී. මයුරන් මහතා<br>දිනය: 2024 අප්‍රේල් 27<br>ස්ථානය: Zoom තාක්ෂණය හරහා<br>වේලාව: පෙ.ව. 10.00 - පෙ.ව. 11.00<br>සබැඳිය:<br>https://www.youtube.com/watch?v=FLwrTEsMGzc&t=2s | 40 |
| 5. | සමාලෝචන ලිපි ලිවීම පිළිබඳ වැඩමුළුව | සම්පත්දායකයින්: ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එම්.එම්. පත්මලාල් සහ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය දිනිති ගමගේ<br>දිනය: 2024 දෙසැම්බර් 20 ස්ථානය: සෙනෙට් මණ්ඩල ශාලාව<br>වේලාව: පෙ.ව. 9.00 - පෙ.ව. 12.30 | 60 |

## පර්යේෂණ විශ්වකෝෂය

පීඨයේ සහ සිසුන්ගේ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම සහ පර්යේෂණ හා සම්බන්ධ වාග් මාලාව වැඩිදියුණු කිරීම සඳහා බහුවිධ විෂය අධ්‍යයන සඳහා වන ජාත්‍යන්තර මධ්‍යස්ථානය යටතේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය විසින් පර්යේෂණ විශ්වකෝෂයේ 2 වන වෙළුම මුද්‍රිත අනුවාදයකින් සම්පූර්ණ කරන ලදී.

## 2023 හා 2024 යන වසර වල ප්‍රතිඵල සන්සන්දනය

| උපාධි වැඩසටහන | පළමු පෙළ | | දෙවන පෙළ ඉහළ | | දෙවන පෙළ පහළ | | සමත් | | මුළු සමත් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2023 වසර | 2024 වසර | 2023 වසර | 2024 වසර | 2023 වසර | 2024 වසර | 2023 වසර | 2024 වසර | 2023 වසර | 2024 වසර |
| ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි | 60 | 60 | 410 | 409 | 147 | 147 | 38 | 40 | 655 | 656 |
| ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි | - | - | 44 | 44 | 72 | 78 | 35 | 39 | 151 | 161 |
| ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි -නැවත | - | - | 5 | 5 | 4 | 4 | 18 | 21 | 27 | 30 |
| ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි නැවත | - | - | 3 | 3 | 4 | 4 | 10 | 10 | 17 | 17 |
| විද්‍යාවේදී (තොරතුරු තාක්ෂණ) විශේෂවේදී | 2 | 2 | 14 | 14 | 11 | 11 | - | - | 27 | 27 |
| භූ අවකාශීය තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | 5 | 5 | 30 | 31 | 11 | 11 | 3 | 3 | 49 | 50 |
| **මුළු සංඛ්‍යාව** | **67** | **67** | **506** | **506** | **249** | **255** | **104** | **113** | **926** | **941** |

## ශිෂ්‍ය හා සම්පත් විස්තරය - 2024

<table>
<tr><th rowspan="3">අධ්‍යයනාංශය</th><th colspan="6">ශිෂ්‍ය ලියාපදිංචිය - 2024</th><th colspan="2" rowspan="2">අධ්‍යයන සේවක සංඛ්‍යාව</th><th rowspan="3">අනධ්‍යයන කාර්යය මණ්ඩලය</th></tr>
<tr><th rowspan="2">1වන වසර</th><th colspan="2">සාමාන්‍ය උපාධි</th><th colspan="3">විශේෂවේදී උපාධි</th></tr>
<tr><th>2 වන වසර</th><th>3 වන වසර</th><th>2 වන වසර</th><th>3 වන වසර</th><th>4 වන වසර</th><th>ස්ථිර</th><th>තාවකාලික</th></tr>
<tr><td>සිංහල හා ජන සන්නිවේදනය අධ්‍යයනාංශය</td><td rowspan="6">1274</td><td rowspan="6">305</td><td rowspan="6">156</td><td>40</td><td>55</td><td>57</td><td>16</td><td rowspan="6">62</td><td rowspan="6">61</td></tr>
<tr><td>ඉතිහාසය හා පුරාවිද්‍යාව අධ්‍යයනාංශය</td><td>36</td><td>55</td><td>65</td><td>12</td></tr>
<tr><td>භූගෝල විද්‍යා අධ්‍යයනාංශය</td><td>97</td><td>111</td><td>133</td><td>12</td></tr>
<tr><td>සමාජවිද්‍යාව අධ්‍යයනාංශය</td><td>46</td><td>55</td><td>47</td><td>7</td></tr>
<tr><td>මානව විද්‍යාව අධ්‍යයනාංශය</td><td>36</td><td>27</td><td>49</td><td>8</td></tr>
<tr><td>භාෂා, සංස්කෘතික අධ්‍යයන හා</td><td>42</td><td>39</td><td>33</td><td>15</td></tr>
</table>

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රසංගික කලා අධ්‍යයනාංශය | | | | | | | | | |
| ආර්ථික විද්‍යාව අධ්‍යයනාංශය | | | | 91 | 50 | 67 | 13 | | |
| සමාජ සංඛ්‍යානය අධ්‍යයනාංශය | | | | 59 | 45 | 17 | 9 | | |
| ඉංග්‍රීසි හා වාග් විද්‍යා අධ්‍යයනාංශය | | | | 1 | 6 | 7 | 7 | | |
| පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය | | | | 76 | 65 | 49 | 16 | | |
| දර්ශනය හා මනෝවිද්‍යාව අධ්‍යයනාංශය | | | | 85 | 71 | 86 | 7 | | |
| දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය | | | | 30 | 38 | 34 | 7 | | |
| අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය | | | | 63 | 69 | 61 | 9 | | |
| ඉංග්‍රීසි භාෂා හා ඉගැන්වීම් අධ්‍යයනාංශය | | | | 22 | 17 | 9 | 6 | | |
| සංගීතය හා නිර්මාණාත්මක තාක්ෂණය අධ්‍යයනාංශය | | | | 44 | 8 | 11 | 6 | | |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය අධ්‍යයනාංශය | | | | 46 | 72 | 23 | 2 | | |
| පීඨ කාර්යයාලය | | | | | | | - | | |
| **මුළු සංඛ්‍යාව** | **1274** | **305** | **156** | **814** | **783** | **748** | **152** | **62** | **61** |

## අධ්‍යයන කාර්යය මණ්ඩලය පිළිබඳ තොරතුරු - 2024

| අධ්‍යයනාංශය | ජ්‍යෙෂ්ඨ මහාචාර්යය | මහාචාර්යය | සහාය මහාචාර්යය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය | කථිකාචාර්යය (පරිවාස) | මුළු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| සිංහල හා ජන සන්නිවේදනය අධ්‍යයනාංශය | 2 | 2 | 1 | 8 | 3 | 16 |
| ඉතිහාසය හා පුරාවිද්‍යාව අධ්‍යයනාංශය | 0 | 5 | 1 | 5 | 1 | 12 |
| භූගෝල විද්‍යා අධ්‍යයනාංශය | 1 | 2 | 0 | 7 | 2 | 12 |
| සමාජවිද්‍යාව අධ්‍යයනාංශය | 1 | 1 | 1 | 0 | 4 | 7 |
| මානව විද්‍යාව අධ්‍යයනාංශය | 2 | 2 | 1 | 3 | | 8 |
| භාෂා, සංස්කෘතික අධ්‍යයන හා ප්‍රසංගික කලා අධ්‍යයනාංශය | 1 | 2 | | 8 | 4 | 15 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ආර්ථික විද්‍යාව අධ්‍යයනාංශය | 1 | 5 | 0 | 4 | 3 | 13 |
| සමාජ සංඛ්‍යානය අධ්‍යයනාංශය | 0 | 0 | 0 | 8 | 1 | 9 |
| ඉංග්‍රීසි හා වාග් විද්‍යා අධ්‍යයනාංශය | 0 | 2 | 1 | 4 | | 7 |
| පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය | 1 | 10 | 0 | 2 | 3 | 16 |
| දර්ශනය හා මනෝවිද්‍යාව අධ්‍යයනාංශය | 1 | 2 | | 3 | 1 | 7 |
| දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය | 0 | 2 | 0 | 5 | 0 | 7 |
| අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය | | 3 | 1 | 5 | | 9 |
| ඉංග්‍රීසි භාෂා හා ඉගැන්වීම් අධ්‍යයනාංශය | 0 | 0 | 0 | 4 | 2 | 6 |
| සංගීතය හා නිර්මාණාත්මක තාක්ෂණය අධ්‍යයනාංශය | | 1 | | 5 | | 6 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය අධ්‍යයනාංශය | | | | 0 | 2 | 2 |
| **මුළු සංඛ්‍යාව** | **10** | **39** | **6** | **71** | **26** | **152** |

## සිදු කරන ලද පර්යේෂණ නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු - 2024

| | ප්‍රකාශන කාණ්ඩය | | සංඛ්‍යාව | | වෙනත් |
|---|---|---|---|---|---|
| | | | දේශිය ප්‍රකාශිත | විදේශිය ප්‍රකාශිත | |
| 1 | තීරක සුවිගත ජර්නල ප්‍රකාශන ගණන | | 2 | 13 | |
| 2 | තීරක නොවන සුවිගත ජර්නල ප්‍රකාශන ගණන | | 16 | 5 | |
| 3 | සම්මන්ත්‍රණ කටයුතු | 3.1 සම්පූර්ණ පත්‍රිකා | 2 | 4 | |
| | | 3.2 සාරාංශ | 27 | 5 | |
| 4 | ප්‍රකාශිත පොත් පරිච්ඡේද ගණන | | | 1 | |
| 5 | ප්‍රකාශිත පොත්/පෙළ පොත් ගණන | 5.1 ප්‍රකාශකයකු විසින් | | | |
| | | 5.2 කතුවරයා විසින් | | | |
| | **මුළු සංඛ්‍යාව** | | 47 | 28 | |

# ව්‍යවහාරික විද්‍යා පීඨය




1962 දී ආරම්භ කරන ලද මෙම විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨය ශ්‍රී ලංකාවේ විද්‍යා පීඨ අතරින් පැරණිතම එකකි. ආරම්භයේ සිට එය බුද්ධිමය ධාරිතාව, ඉගැන්වීම් සහ පර්යේෂණ පහසුකම්, විෂයමාලා පරාසය සහ ශිෂ්‍ය සංඛ්‍යාව අතින් බොහෝ වර්ධනය වී ඇත. වර්තමානය වන විට එහි අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 150 කට අධික සංඛ්‍යාවක්, උපාධි අපේක්ෂකයින් 2500 කට අධික සංඛ්‍යාවක් සහ පශ්චාත් උපාධි සිසුන් 200 කට ආසන්න සංඛ්‍යාවක් සිටින අධ්‍යයන දෙපාර්තමේන්තු 11 කින් සමන්විතය..

මත්ස්‍ය ජීව විද්‍යාව, ආහාර විද්‍යාව සහ තාක්‍ෂණය, බහුඅවයවික විද්‍යාව සහ තාක්‍ෂණය වැනි විද්‍යාවේ ව්‍යවහාරික අංශ අවධාරණය කරමින් සිංහලෙන් විද්‍යාව ඉගැන්වීම ඇතුළුව ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල විද්‍යා පිළිබඳ අධ්‍යාපනයේ අභියෝගාත්මක සහ පුරෝගාමී වර්ධනයන් කිහිපයක් සිදු කිරීමට පීඨය පෙරමුණෙන් සිටී. වන විද්‍යාව සහ පාරිසරික විද්‍යාව, පරිගණක විද්‍යාව, සංඛ්‍යාලේඛන සහ කළමනාකරණය ආදිය විද්‍යා විෂයමාලාවේ ඉන් සමහරකි.

ව්‍යවහාරික විද්‍යා පීඨය පහත පරිදි අධ්‍යයන දෙපාර්තමේන්තු එකොළහකින් (11) සමන්විත වේ.

| | |
|---|---|
| **පීඨාධිපති** | මහාචාර්යය උපුල් සුභසිංහ මහතා |
| **අධ්‍යයනාංශය** | **අධ්‍යයනාංශ ප්‍රධානීන්** |
| 1. උද්භිද විද්‍යා අධ්‍යයනාංශය | අචාර්යය එම්.එල්.ඒ.එම්.එස් මුනසිංහ |
| 2. රසායන විද්‍යා අධ්‍යයනාංශය | මහාචාර්යය චම්පා ජයවීර |
| 3. පරිගණක විද්‍යා අධ්‍යයනාංශය | අචාර්යය පී.ආර්.එස්.ද සිල්වා |
| 4. ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය | ආචාර්යය පියුමි ද අබේසුන්දර |

5. වන හා පාරිසරික විද්‍යා අධ්‍යයනාංශය — මහාචාර්යය ඩී.ටී. ජයවර්ධන
6. ගණිතවිද්‍යා අධ්‍යයනාංශය — ආචාර්යය ආර්.සංජීව
7. භෞතික විද්‍යා අධ්‍යයනාංශය — මහාචාර්යය එන්.ජී.එස්.එස් ගමගේ
8. සංඛ්‍යාන විද්‍යා අධ්‍යයනාංශය — අචාර්යය චතුරි ජයසිංහ මහත්මිය
9. සත්ත්ව විද්‍යා අධ්‍යයනාංශය — මහාචාර්යය පී.ආර්.එම්.පී.කේ.රණතුංග
10. ක්‍රීඩා විද්‍යා අධ්‍යයනාංශය — ආචාර්යය එච්.පී.එන්.පෙරේරා
11. බහු අවයවික විද්‍යා අධ්‍යයනාංශය — අචාර්යය එම්.ඒ.එම්. මද්දුමආරච්චි

| ඒකකය | සම්බන්ධීකරණය |
| --- | --- |
| 1. ජාන හා අනුකජීව විද්‍යා ඒකකකය | අචාර්යය හිරුණි හරස්චන්ද්‍ර |

## පීඨය විසින් පිරිනමනු ලබන උපාධි

### උපාධි

1. විද්‍යාවේදි සාමාන්‍ය උපාධිය
2. විද්‍යාවිදි සාමාන්‍ය තොරතුරු සන්නිවේදන තාක්ෂණ උපාධිය
3. විද්‍යාවේදි (ගෞරව) අහාර විද්‍යා හා තාක්ෂණ උපාධිය
4. විද්‍යාවේදි (ගෞරව ) රසායන විද්‍යා උපාධිය
5. විද්‍යාවේදි (ගෞරව ) කර්මාන්ත රසායනවිද්‍යා උපාධිය
6. විද්‍යාවේදි (සාමාන්‍ය) ජීවවිද්‍යා උපාධිය
7. විද්‍යාවේදි (සාමාන්‍ය) ශාක ජෛව තාක්ෂණ උපාධිය
8. විද්‍යාවේදි (ගෞරව) ශාක ජෛව තාක්ෂණ උපාධිය
9. විද්‍යාවේදි (ගෞරව) ක්ෂුද්‍ර ජීව විද්‍යා
10. විද්‍යාවේදි (ගෞරව) ජලජ සම්පත් කළමනාකරණ
11. විද්‍යාවේදි (ගෞරව) සත්ත්ව විද්‍යා
12. විද්‍යාවේදි (ගෞරව) පාරිසරික කළමනාකරණ හා වන විද්‍යා උපාධිය
13. විද්‍යාවේදි (ගෞරව) ගණිතවිද්‍යා උපාධිය
14. විද්‍යාවේදි (ගෞරව) ව්‍යවහාරික ගණිතය උපාධිය
15. විද්‍යාවේදි (ගෞරව) පරිගණක විද්‍යා උපාධිය
16. විද්‍යාවේදි (ගෞරව) භෞතික විද්‍යා උපාධිය
17. විද්‍යාවේදි (ගෞරව) සංඛ්‍යාන උපාධිය
18. විද්‍යාවේදි (ගෞරව) බහු අවයවක විද්‍යා උපාධිය
19. විද්‍යාවේදි (ගෞරව) ක්රීඩා විද්‍යා හා කළමනාකරණ උපාධිය
20. විද්‍යාවේදි (ගෞරව) ජාන හා අනුකජීව විද්‍යා උපාධිය
21. විද්‍යාවේදි (ගෞරව) ව්‍යවහාරික විද්‍යා උපාධිය

## අධ්‍යාපනය හා සංවර්ධනය

<u>වන විද්‍යා හා පරිසර විද්‍යා අධ්‍යයනාංශය</u>

යෝජිත නව උපාධි පාඨමාලා

- නව උපාධි අපේක්ෂකයන් සඳහා යෝජිත පරිසර තිරසාරත්වය සහ වන විද්‍යාව පිළිබඳ B.Sc (ගෞරව) උපාධි පාඨමාලාව 2025 වර්ෂයේ සිට ආරම්භ කෙරේ.
- කෙටි කාලීන පාඨමාලා 2025 වර්ෂයේ දී ආරම්භ කිරීමට නියමිතය.
- පහත දැක්වෙන පශ්චාත් උපාධි අධ්‍යයන වැඩසටහන් 2025 වර්ෂයේ සිට ආරම්භ කෙරේ.
    - වන විද්‍යා හා පරිසර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව.
    - වන විද්‍යා හා පරිසර කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය (වසර 1 - පාඨමාලා පාදක/ පර්යේෂණ සංරචකයකින් තොරව)
    - වන විද්‍යා හා පරිසර කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය (වසර 2 - පර්යේෂණ සංරචකය සහිතව)
- යෝජිත නව උපාධි අපේක්ෂක පාඨමාලාවක් වන බහුඅවයවික විද්‍යාව සහ කාර්මික කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධි පාඨමාලාව ආරම්භ කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇත.
- උපාධි අපේක්ෂකයින් සඳහා යෝජිත බාහිර උපාධි පාඨමාලාවක් වන ආහාර විද්‍යාව සහ තත්ත්ව කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය අනුමැතිය සඳහා සමාලෝචන ක්‍රියාවලියේ පවතී.

## යටිතල පහසුකම් සංවර්ධනය

**ජාන විද්‍යා සහ අණුක ජීව විද්‍යා ඒකකය**

ජාන විද්‍යා හා අණුක ජීව විද්‍යා ගොඩනැගිල්ලේ වැඩ නිම කරන ලදී.

**වන විද්‍යා හා පරිසර විද්‍යා අධ්‍යයනාංශය**

වන විද්‍යා හා පරිසර විද්‍යා **අධ්‍යයනාංශයේ** නව ගොඩනැගිල්ලේ දැව විද්‍යා නවෝත්පාදන විද්‍යාගාරය සහ තිරසාරත්වය සඳහා වූ මධ්‍යස්ථානය (CFS) ස්ථාපිත කිරීම.

**බහුඅවයවික විද්‍යා අධ්‍යයනාංශය**

බහුඅවයවික විද්‍යා **අධ්‍යයනාංශයේ** දේශන ශාලාව පාර්ටිෂන් කිරීම.

**රසායන විද්‍යා අධ්‍යයනාංශය**

රසායන විද්‍යා අධයයනාංශයට අන්තර්ජාල පහසුකම් සැපයීම සඳහා අවශ්‍ය ‘‘ස්විච් පුවරුව’’ (Switch board) 2024 වර්ෂයේ දී ස්ථාපනය කරන ලදී.

## 2023 හා 2024 යන වසර වල ප්‍රතිඵල සන්සන්දනය

| උපාධි පාඨමාලාව | පළමු පෙළ සාමාර්ථ | | දෙවන පෙළ ඉහළ | | දෙවන පෙළ පහළ | | සමත් | | මුළු සමත් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2023 වසර | 2024 වසර | 2023 වසර | 2024 වසර | 2023 වසර | 2024 වසර | 2023 වසර | 2024 වසර | 2023 වසර | 2024 වසර |
| විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධි | - | - | 19 | 6 | 61 | 24 | 237 | 246 | 317 | 276 |
| විද්‍යාවේදී (ගෞරව) ව්‍යවහාරික විද්‍යා උපාධිය | - | 1 | 56 | 86 | 59 | 42 | 6 | 6 | 121 | 135 |
| විද්‍යාවේදී (ගෞරව) ජලජ සම්පත් කළමනාකරණ | - | 2 | 10 | 8 | 1 | - | - | - | 11 | 10 |
| විද්‍යාවේදී (ගෞරව ) රසායන විද්‍යා උපාධිය | 2 | 4 | 21 | 15 | 1 | 6 | 1 | - | 25 | 25 |
| විද්‍යාවේදී (ගෞරව) පරිගණක විද්‍යා උපාධිය | 1 | 2 | 12 | 19 | 4 | 3 | 1 | - | 18 | 24 |
| විද්‍යාවේදී (ගෞරව) අහාර විද්‍යා හා තාක්ෂණ උපාධිය | 22 | 19 | 25 | 27 | 3 | 9 | 3 | - | 53 | 55 |
| විද්‍යාවේදී (ගෞරව) පාරිසරික කළමනාකරණ හා වන විද්‍යා උපාධිය | 5 | 9 | 10 | 4 | - | - | - | - | 15 | 13 |
| විද්‍යාවේදී (ගෞරව) ගණිතවිද්‍යා උපාධිය | 2 | 7 | 5 | 5 | 2 | - | 1 | - | 10 | 12 |
| විද්‍යාවේදී (ගෞරව) භෞතිකවිද්‍යා උපාධිය | 1 | 4 | 7 | 9 | 5 | 3 | 1 | - | 14 | 16 |
| විද්‍යාවේදී (ගෞරව) ශාක ජීව විද්‍යා උපාධිය | - | 3 | 5 | 5 | - | - | - | - | 5 | 8 |
| විද්‍යාවේදී (ගෞරව) ශාක ජීව විද්‍යා උපාධිය | 1 | - | - | 1 | - | - | - | - | 1 | 1 |
| විද්‍යාවේදී (ගෞරව) ජීව විද්‍යා උපාධිය | - | 1 | 5 | 8 | - | - | - | - | 5 | 9 |
| විද්‍යාවේදී (ගෞරව) සංඛ්‍යාන උපාධිය | 3 | 5 | 7 | 5 | 2 | - | - | - | 12 | 11 |
| විද්‍යාවේදී (ගෞරව) සත්ත්ව විද්‍යා | 1 | 1 | 6 | 10 | 2 | - | - | - | 9 | 12 |
| විද්‍යාවේදී (ගෞරව) ක්ෂුද්‍ර ජීව විද්‍යා | 2 | 3 | 8 | 6 | - | - | - | - | 10 | 9 |
| විද්‍යාවේදී (ගෞරව) ව්‍යවහාරික ගණිත විද්‍යා උපාධිය | 1 | 3 | 5 | 5 | - | - | - | - | 6 | 8 |
| විද්‍යාවේදී (ගෞරව) ක්‍රීඩා විද්‍යා හා කළමනාකරණ උපාධිය | 9 | 5 | 15 | 17 | 10 | 11 | 15 | 24 | 49 | 57 |
| විද්‍යාවේදී (ගෞරව) බහු අවයවික විද්‍යා උපාධිය | 3 | 8 | 9 | 6 | 1 | - | - | - | 13 | 14 |
| විද්‍යාවේදී (ගෞරව ) කර්මාන්ත රසායනවිද්‍යා උපාධිය | 2 | 4 | 6 | 4 | - | - | - | 1 | 8 | 9 |
| විද්‍යාවේදී (ගෞරව) ජාන හා අනුකජීව විද්‍යා උපාධිය | 4 | 7 | 7 | - | - | - | - | - | 11 | 7 |
| මුළු සංඛ්‍යාව | **59** | **88** | **238** | **246** | **151** | **100** | **265** | **277** | **713** | **711** |

## ශිෂ්‍ය හා සම්පත් විස්තරය

| උපාධි පාඨමාලාව | ශිෂ්‍ය ලියාපදිංචිය | | | | | මුළු අධ්‍යයන කාර්යය මණ්ඩලය | | අනධ්‍යයන කාර්යය මණ්ඩලය |
|---|---|---|---|---|---|---|---|---|
| | **1** වන වසර | **2** වන වසර | **3** වන වසර | **4** වන වසර | මුළු සංඛ්‍යාව | ස්ථිර | තාවකාලික | |
| ජීව විද්‍යාව (සාමාන්‍ය) | 301 | 266 | 182 | | 749 | 145 | 65 | 144 |
| භෞතික විද්‍යා (සාමාන්‍ය) | 314 | 254 | 220 | | 788 | | | |
| ආහාර විද්‍යාව හා තාක්ෂණය | 63 | 47 | 53 | 68 | 231 | | | |
| ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය | 91 | 86 | 81 | 84 | 342 | | | |
| භෞතික විද්‍යා (තොරතුරු තාක්ෂණ) | 78 | 60 | 61 | | 199 | | | |
| විද්‍යාවේදී ගෞරව ව්‍යවහාරික විද්‍යා | | | | 102 | 102 | | | |
| අනෙකුත් ගෞරව උපාධි | | | 168 | 179 | 347 | | | |
| මුළු සංඛ්‍යාව | **847** | **713** | **765** | **433** | **2758** | **145** | **65** | **144** |

## අධ්‍යයන කාර්යය මණ්ඩලය - 2024

| අධ්‍යයනාංශය | **Senior Professor** | **Professor** | **Assiocate Professor** | **Senior Lecturer** | **Lecturer/ Lecturer (Prob.)** | **Total** |
|---|---|---|---|---|---|---|
| පීඨ කාර්යයාලය හා වෙනත් ඒකක | 0 | 1 | 0 | 6 | 2 | 9 |
| ක්‍රීඩා විද්‍යා හා කළමනාකරණය | 0 | 0 | 0 | 7 | 3 | 10 |
| ගණිතය විද්‍යා | 0 | 3 | 0 | 12 | 1 | 16 |
| භෞතික විද්‍යා | 0 | 5 | 0 | 5 | 3 | 13 |
| රසායන විද්‍යා | 2 | 7 | 0 | 13 | 0 | 22 |
| බහු අවයවික විද්‍යා | 1 | 1 | 0 | 4 | 1 | 7 |
| සංඛ්‍යානය | 0 | 1 | 0 | 10 | 1 | 12 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| පරිගණක විද්‍යා | 1 | 1 | 0 | 7 | 1 | 10 |
| උද්භිද විද්‍යා | 1 | 1 | 0 | 7 | 3 | 12 |
| වන හා පාරිසරික විද්‍යා | 1 | 5 | 0 | 3 | | 9 |
| සත්ත්ව විද්‍යා | 4 | 2 | 0 | 4 | 3 | 13 |
| ආහාර විද්‍යාව හා තාක්ෂණය | | 6 | 0 | 6 | | 12 |
| **මුළු සංඛ්‍යාව** | **10** | **33** | **0** | **84** | **18** | **145** |

## සිදු කරන ලද පර්යේෂණ නවෝත්පාදන හා ප්‍රකාශන - 2024

| ප්‍රකාශන කාණ්ඩය | | | සංඛ්‍යාව | | වෙනත් |
|---|---|---|---|---|---|
| | | | දේශීය ප්‍රකාශිත | දේශීය ප්‍රකාශිත | |
| 1 | තීරක සුවිගත ජර්නල ප්‍රකාශන ගණන | | 7 | 138 | |
| 2 | තීරක නොවන සුවිගත ජර්නල ප්‍රකාශන ගණන | | 17 | 54 | |
| 3 | සම්මන්ත්‍රණ කටයුතු | 3.1 සම්පූර්ණ පත්‍රිකා | 22 | 3 | |
| | | 3.2 සාරාංශ | 182 | 30 | |
| 4 | ප්‍රකාශිත පොත් පරිච්ඡේද ගණන | | | 12 | |
| 5 | ප්‍රකාශිත පොත්/පෙළ පොත් ගණන | 5.1 ප්‍රකාශකයකු විසින් | | 1 | |
| | | 5.2 කතුවරයා විසින් | 1 | 1 | |
| | මුළු සංඛ්‍යාව | | 229 | 239 | |



ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨය (FMSC) ශ්‍රී ලංකාවේ කළමනාකරණ අධ්‍යාපනයේ විශිෂ්ඨ මධ්‍යස්ථානය ලෙස සැලකේ. පීඨය 1959/60 දී හඳුන්වා දුන් ව්‍යාපාර පරිපාලනය සහ රාජ්‍ය පරිපාලනය පිළිබඳ උපාධි පාඨමාලා ඇතුළුව කළමනාකරණය සහ වාණිජ්‍ය පිළිබඳ ගෝලීය වශයෙන් තරඟකාරී උපාධි වැඩසටහන් ඉදිරිපත් කරයි. කළමනාකරණ අධ්‍යයන දෙපාර්තමේන්තුව 1968 දී ආරම්භ කරන ලද අතර පසුව කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨය පිහිටුවීමත් සමඟ 1972 දී පීඨ තත්ත්වය දක්වා උසස් කරන ලදී. අද, පීඨයේ අධ්‍යයනාංශ 12 ක් හා පාඨමාලා ඒකක 03 ක් ඇති අතර උපාධි, පශ්චාත් උපාධි සහ වෘත්තීය සංවර්ධන වැඩසටහන් ඉදිරිපත් කරයි.

කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨය විශේෂයෙන් වාණිජ විෂය ධාරාවේ උසස් පෙළ සමත් සිසුන් අතර ජනප්‍රිය වේ . MBA, MPA සහ M.Sc. වැනි ඉහළ පිළිගත් පශ්චාත් උපාධි වැඩසටහන් සමඟ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සහ අඛණ්ඩ ඉගෙනීම සඳහා පීඨය කැපවී සිටී. කළමනාකරණය තුල උපාධි අධ්‍යයන පීඨය සමඟ සහයෝගයෙන්, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨය ආචාර්ය උපාධි වැඩසටහනක් ඉදිරිපත් කරයි.

මීට අමතරව, උසස් අධ්‍යාපනය සඳහා ශ්‍රී ලාංකේය සමාජයේ පුළුල් අවශ්‍යතා සපුරාලීම සඳහා පීඨය විසින් බාහිර/අර්ධකාලීන උපාධි, උසස් ඩිප්ලෝමා, ඩිප්ලෝමා සහ කළමනාකරණ සහතික පත්‍ර වැඩසටහන් පවත්වයි

**පීඨාධිපති** **ආචාර්යය දූෂාන් ජයවික්‍රම**

2024 වර්ෂය තුළ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨයෙහි අධ්‍යයනාංශ සහ අදාළ අධ්‍යයනාංශ ප්‍රධානීන් පහත පරිදි වේ:

| **අධ්‍යයනාංශය** | **අධ්‍යයනාංශ ප්‍රධානීන්** |
|---|---|
| [1] ව්‍යාපාර පරිපාලන අධ්‍යයනාංශය | අචාර්යය කේ.ඒ.එස්.කේ. කාරියප්පෙරුම 30.09.2024 දක්වා<br>2024.10.01 දින සිට ආචාර්ය ටී.එන්.එස්. ද පීරිස් |

| | |
|---|---|
| [2] රාජ්‍ය පරිපාලන අධ්‍යයනාංශය | ආචාර්ය ආර්.පී.සී.කේ. ජයසිංහ මහත්මිය 2024.06.30 දක්වා<br>ඩබ්ලිව්.ජී.ටී.එස්. සේනානායක මහතා 2024.07.01 සිට |
| [3] වාණිජ විද්‍යා අධ්‍යයනාංශය | අචාර්යය කේ.එම්.වී. සචිත්‍රා |
| [4] දේපල කළමනාකරණය හා තක්සේරු විද්‍යා ආධ්‍යයනාංශය | අචාර්යය පී.සි.කළුතන්ත්‍රි |
| [5] ගණකාධිකරණ අධ්‍යයනාංශය | ජ්‍යෂ්ඨ මහාචාර්යය කේ.ඩී.ගුණවර්ධන |
| [6] අලෙවි කළමනාකරණ අධ්‍යයනාංශය | මහාචාර්යය බී.එස් .ගල්දොල්ගේ |
| [7] මානව සම්පත් කළමනාකරණ අධ්‍යයනාංශය | ජ්‍යෂ්ඨ මහාචාර්යය කේ.එච්. හේමන්ත කුමාර |
| [8] මූල්‍ය කළමනාකරණ අධ්‍යයනාංශය | මහාචාර්යය ඒ.ජී.සී. ගුණතිලක |
| [9] ව්‍යාපාර ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය | අචාර්යය පී.ජේ.එස්.ෆර්නැන්ඩු |
| [10] තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය | මහාචාර්යය කේ.එස්.එල්. ගුණවර්ධන |
| [11] තීරණ විද්‍යා අධ්‍යයනාංශය | එම්.ඩබ්ලිව්.අමාලි ද සිල්වා මහත්මිය 2024.02.14 දක්වා<br>එල්.එච්.ටී.ඩී. එස්.වික්‍රමසූරිය මහතා 2024.02.15 සිට |
| [12 ව්‍යවසායකත්ව අධ්‍යයන අධ්‍යයනාංශය | අචාර්යය ආර්.ජී.කේ.එස්.රණසිංහ |

| **ඒකකය** | **ඒකකයේ සම්බන්ධිකාරක** |
|---|---|
| තොරතුරු තාක්ෂණ සම්පත් මධ්‍යස්ථානය (ITRC) | පී.එච්.ඒ.බී. ශාන්තය |
| ව්‍යාපාර සන්නිවේදන ඒකකය (BCU) | අචාර්යය එල්.විජේවර්ධන |
| නීති අධ්‍යයන ඒකකය | ආචාර්ය තුසිත බී අබේසේකර |

**පීඨය විසින් පිරිනමන උපාධි ,පශ්චාද් උපාධි, ඩිප්ලෝමා ,ශාස්ත්‍රපති ඩිප්ලෝමා, උසස් ඩිප්ලෝමා හා සහතිකපත්‍ර පාඨමාලා - 2024**

**උපාධි**

1. විද්‍යාවේදි (ගෞරව) ව්‍යාපාර පරිපාලන උපාධිය
2. විද්‍යාවේදි (ගෞරව) රාජ්‍ය පරිපාලන  උපාධිය
3. විද්‍යාවේදි (ගෞරව) වාණිජ්‍ය උපාධිය
4. විද්‍යාවේදි (ගෞරව) දේපළ කළමනාකරණය හා තක්සේරු විද්‍යා උපාධිය
5. විද්‍යාවේදි (ගෞරව) ගණකාධිකරණ උපාධිය
6. විද්‍යාවේදි (ගෞරව) අලෙවි කළමනාකරණ උපාධිය
7. විද්‍යාවේදි (ගෞරව) මානව සම්පත් කළමනාකරණ උපාධිය
8. විද්‍යාවේදි (ගෞරව) මූල්‍ය කළමනාකරණ උපාධිය
9. විද්‍යාවේදි (ගෞරව) ව්‍යාපාර පරිපාලන ව්‍යාපාර ආර්ථික විද්‍යා උපාධිය
10. විද්‍යාවේදි (ගෞරව) මෙහෙයුම් කළමනාකරණය හා තාක්ෂණ උපාධිය
11. විද්‍යාවේදි (ගෞරව) ව්‍යාපාර තොරතුරු පද්ධති කළමනාකරණ උපාධිය
12. විද්‍යාවේදි (ගෞරව) ව්‍යවසායකත්ව උපාධිය

**පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලා**

1. MBA/MPM/MSc. කළමනාකරණ පශ්චාද් උපාධි
2. වෘත්තිය ගණකාධිකරණය පිළිබඳ පශ්චාද් උපාධි පාඨමාලාව
3. ව්‍යවහාරික මූල්‍ය පිළබඳ පශ්චාද් පශ්චාද් උපාධි
4. ව්‍යාපාර ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාද් උපාධි පාඨමාලාව
5. රාජ්‍ය කළමනාකරනය පිළබඳ පශ්චාද් උපාධි පාඨමාලාව
6. ව්‍යවසායකත්වය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
7. අලෙවිකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
8. වාණිජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
9. ව්‍යවහාරික මූල්‍ය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
10. ව්‍යාපාර ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
11. රාජ්‍ය ප්‍රතිපත්ති සහ කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
12. අලෙවිකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
13. දේපළ කළමනාකරණය හා තක්සේරු විද්‍යා පිළිබඳ පශ්චාද් උපාධි පාඨමාලාව
14. අපද්‍රව්‍ය කළමනාකරණය සහ චක්‍රලේඛ ආර්ථිකය පිළිබඳ පිළිබඳ පශ්චාද් උපාධි පාඨමාලාව
15. දේපළ කළමනාකරණය හා තක්සේරු විද්‍යා පිළිබඳ පශ්චාද් ඩිප්ලෝමා පාඨමාලාව

**ඩිප්ලෝමා පාඨමාලා**

1. රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව
2. පරිගණක පාදක ගිණුම්කරණය පිළිබඳ ඩිප්ලෝමාව
3. ව්‍යවසායකත්වය පිළිබඳ ඩිප්ලෝමාව
4. ව්‍යවසායකත්වය පිළිබඳ උසස් ඩිප්ලෝමාව

- 2024 වර්ෂයේ දී, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය, B.Sc. විශේෂ උපාධිලාභීන් 1,136 ක් සහ පශ්චාත් උපාධිධාරීන් 203 ක් ඇතුළුව, 1,400කට අධික සිසුන් සංඛ්‍යාවකට උපාධි පිරිනමමින් උපාධි ප්‍රදානෝත්සවය පවත්වන ලදී. විශේෂයෙන්ම, විශිෂ්ටතා දක්වන ලද සිසුන්ගේ අධ්‍යයන ජයග්‍රහණ ඇගයීමට ලක්කරමින් එවන් දක්ෂ සිසුන් 31 දෙනෙකුට රන් පදක්කම් පිරිනමන ලදී.

- වසර පුරා පීඨය සිය අදාළ අධ්‍යයනාංශ සමඟ එක්ව බාහිර පුහුණු වැඩසටහන් නවයක් සංවිධානය කළ අතර ක්ෂේත්‍ර චාරිකා 15ක් සඳහා පහසුකම් සලසන ලදී. සිසුන්ගේ විෂයයන් පිළිබඳ ප්‍රායෝගික අවබෝධය වැඩිදියුණු කරන අතරම අත්‍යවශ්‍ය සේවා නියුක්ති කුසලතා ඔවුන් තුළ වර්ධනය කිරීම මෙම වැඩසටහන්වල අරමුණ විය. පළමු වසරේ සිසුන් 1,300කට අධික සංඛ්‍යාවක් ඇතුළුව, 5,000කට අධික උපාධි අපේක්ෂකයින්ගෙන් සමන්විත ශිෂ්‍ය ප්‍රජාවක් සිටින බැවින්, මෙවැනි අත්දැකීම් පාදක ඉගෙනුම් අවස්ථා ඔවුන්ගේ අධ්‍යයන හා වෘත්තීය වර්ධනයට අත්‍යවශ්‍ය වේ.

- තවද, පීඨය විසින් කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සමඟ එක්ව, වැඩමුළු සහ ආරාධිත දේශන 150කට අධික සංඛ්‍යාවක් පවත්වන ලද අතර, එමඟින් සැබෑ ලෝකයේ ව්‍යාපාරික දැනුම අධ්‍යයන විෂය මාලාවට ඒකාබද්ධ කිරීමට කටයුතු කරන ලදී. මෙම සැසිවාර මගින් සිසුන්ට කර්මාන්තයේ ප්‍රවණතා, සිද්ධි අධ්‍යයන සහ න්‍යායාත්මක සංකල්පවල ප්‍රායෝගික යෙදීම් පිළිබඳව වටිනා අවබෝධයක් ලබා දුන් අතර, එමඟින් ගතික සහ අදාළ ඉගෙනුම් අත්දැකීමක් ලබාගැනීමට ඔවුන්ට අවස්ථාව උදාවුනි.
- සිසුන්ගේ වෘත්තීය සංවර්ධනයට තවදුරටත් සහාය වෙමින්, 2024 වර්ෂයේ දී ආයතනික උපදේශන වැඩසටහන්දෙකක් පවත්වන ලදී. එමඟින් උපාධි අපේක්ෂකයින්ට ස්වයං-අවබෝධය, වෘත්තීයභාවය සහ ආත්ම විශ්වාසය වැනි අත්‍යවශ්‍ය මෘදු කුසලතා වැඩිදියුණු කරගනිමින් වෘත්තීය මාර්ග ගවේෂණය කිරීමට අවස්ථාව ලැබිණි. ඊට අමතරව, වෘත්තීය ප්‍රදර්ශන තුනක් පවත්වමින් ඒ සඳහා සහභාගීවන්නන් 1,500ක් ආකර්ෂණය කරගත් අතර, සිසුන් සහ අභිලාෂකාමී සේවා යෝජකයින් අතර අර්ථවත් අන්තර්ක්‍රියා සඳහා පහසුකම් සලසන ලදී.

- 2024 වර්ෂයේ දී, කර්මාන්ත සම්බන්ධතා කාර්යාලය (ILO) විසින් කර්මාන්ත සහභාගීත්වය සහ ශිෂ්‍ය වෘත්තීය සංවර්ධනය වැඩිදියුණු කිරීම සඳහා ප්‍රධාන වැඩසටහන් කිහිපයක් පැවැත්වීමට මූලිකත්වය ගෙන කටයුතු කරන ලදී. එහි එක් කැපී පෙනෙන ජයග්‍රහණයක්

වූයේ, මානව සම්පත් කළමනාකරණ අධ්‍යයනාංශයේ උපාධි අපේක්ෂකයින් සඳහා TeeJay Lanka සහ Global Leading Conferences (GLC) ආයතන සමඟ එක්ව ආරාධිත දේශන මාලාවක් සංවිධානය කිරීමයි. එමගින් ඔවුන්ගේ අධ්‍යයන හා වෘත්තීය වර්ධනයට සහාය වීම සඳහා කර්මාන්ත පිළිබඳ වටිනා දැනුමක් ලබා දෙන ලදී.

- තවද, කර්මාන්ත සම්බන්ධතා කාර්යාලය, වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය සමඟ එක්ව, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ සිසුන් සඳහා වූ විශාලතම රැකියා ප්‍රදර්ශනය වන "Touch the Peak" ප්‍රදර්ශනය සාර්ථකව සංවිධානය කළ අතර, එමඟින් පුළුල් සම්බන්ධතා ජාලයක් ගොඩනගා ගැනීමට සහ රැකියා අවස්ථා නිර්මාණය කිරීමට ඉඩ සැලසිණි.

- කර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳ අවබෝධය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා, කර්මාන්ත සම්බන්ධතා කාර්යාලය විසින් සීමාවාසික පුහුණු අවස්ථා 50කට අධික සංඛ්‍යාවක් ලබා ගැනීමට සමත් වූ අතර, සිසුන්ට සහ වෘත්තිකයින්ට ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීම සඳහා විවිධ ප්‍රවේශයන් විවෘත කරන ලදී. මේ අතර, සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය කරන ලද විශේෂිත සීමාවාසික පුහුණු වැඩසටහනක් ද වූ අතර එය කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ උපාධි අපේක්ෂකයින්ට ප්‍රායෝගික දැනුම සහ සේවා ස්ථාන පළපුරුද්ද ලබා දීම සඳහාම විශේෂයෙන් නිර්මාණය කරන ලද්දක් විය.

- මීට අමතරව, කීර්තිමත් McKinsey Consulting Fellowship වැඩසටහන සඳහා ශිෂ්‍ය සහභාගීත්වය සඳහා කර්මාන්ත සම්බන්ධතා කාර්යාලය පහසුකම් සලසන ලද අතර, එමගින් ප්‍රමුඛ පෙළේ කර්මාන්ත වෘත්තිකයන් සමඟ සම්බන්ධ වීමට සිසුන්ට අවස්ථාවක් ලබා දෙන ලදී. එම කාර්යාලය නෙස්ලේ ආයතනය සමඟ එක්ව "Campus to Corporate" සැසිය ද සංවිධානය කළ අතර එමගින් ආයතනික ලෝකයට සාර්ථකව පිවිසීමට අවශ්‍ය අත්‍යවශ්‍ය කුසලතා වලින් සිසුන් සන්නද්ධ කරන ලදී.

- තවද, ADVANTIS ආයතනය විසින් පවත්වන ලද උපාධි අපේක්ෂක පෞරුෂ සංවර්ධන වැඩසටහන සඳහා ශිෂ්‍ය සහභාගීත්වය සම්බන්ධීකරණය කිරීමටත්, කැපිටල් එලයන්ස් ආයතනය විසින් සංවිධානය කරන ලද CFA කර්මාන්ත පිළිබඳ දැනුවත් කිරීමේ සැසියට සහභාගී වීමටත් කර්මාන්ත සම්බන්ධතා කාර්යාලය පහසුකම් සලසන ලදී. මෙම සියලු වැඩසටහන් එක්ව, සිසුන්ගේ සේවා නියුක්තිය, වෘත්තීය සූදානම සහ කර්මාන්ත සහභාගීත්වය වැඩිදියුණු කිරීමට දායක විය.

- 2024 වර්ෂයේ දී, පීඨය නව වැඩසටහන් කිහිපයක් හඳුන්වා දෙමින් සිය පශ්චාත් උපාධි පාඨමාලා පුළුල් කරන ලදී. අපද්‍රව්‍ය කළමනාකරණය සහ චක්‍රීය ආර්ථිකය පිළිබඳ විද්‍යාපති, ව්‍යවහාරික මූල්‍ය පිළිබඳ ශාස්ත්‍රපති, අලෙවිකරණය පිළිබඳ ශාස්ත්‍රපති, සහ අලෙවිකරණය පිළිබඳ විද්‍යාපති යන පාඨමාලා මෙම වසරේ ආරම්භ වූ අතර, ඒවායේ පළමු කණ්ඩායම 2024 ඔක්තෝබර් මාසයේදී බඳවා ගන්නා ලදී. වෙනස් වන කර්මාන්ත ඉල්ලීම් සපුරාලීමට සහ වෘත්තිකයන්ට ඔවුන්ගේ අදාළ ක්ෂේත්‍රවල විශේෂිත ප්‍රවීණතාව ලබා දීම සඳහා මෙම වැඩසටහන් සංවිධානය කර තිබුණි.

- තවද, කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව - දෙවන විකල්පය සඳහා වූ යෝජනාව විශ්වවිද්‍යාල සනාතන සභාව සහ පාලක සභාව විසින් අනුමත කර ඇති අතර, වැඩිදුර අනුමැතිය සඳහා එය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.

## යටිතල පහසුකම් සංවර්ධනය

2024 වර්ෂයේදී, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ භෞතික සහ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්වල සැලකිය යුතු සංවර්ධනයක් දක්නට ලැබිණි:

- **බහුකාර්ය ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම:** අරමුදල් සම්බන්ධයෙන් සීමා පැවතියේ වුවද, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය සඳහා වන මහල් හතකින් යුත් බහුකාර්ය ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව සිදු වූ අතර, 2025 මැද භාගය වන විට එය නිම කිරීමට ඉලක්ක කර ඇත.
- **තොරතුරු පද්ධතිව වැඩිදියුණු කිරීම:** පීඨයේ මෙහෙයුම් වැඩිදියුණු කිරීම සඳහා නව තොරතුරු පද්ධති කිහිපයක් හඳුන්වා දී ඇති අතර ඒවා අඛණ්ඩව සංවර්ධනය වෙමින් පවතී. ඒවාට පහත සඳහන් අංග ඇතුළත් විය:
  - කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨ දේශක පැතිකඩ කළමනාකරණ පද්ධතිය
  - ලේඛන කළමනාකරණ පද්ධතිය
  - සම්පත් කළමනාකරණ පද්ධතිය
  - කාර්ය භාරය පැවරීමේ පද්ධතිය
  - විභාග සඳහා වන ගෙවීම් පද්ධතිය
  - විභාගවලට පෙනීසිටීම සම්බන්ධ මාර්ගගත පද්ධතිය
  - උපාධි ප්‍රදානෝත්සව කළමනාකරණ පද්ධතිය

- **ශිෂ්‍ය පැමිණීම් සටහන් කිරීමේ ඩිජිටල් පද්ධතිය:** ශිෂ්‍යයින්ගෙ පැමිණීම නිරීක්ෂණය විධිමත් කිරීම සඳහා OTP සහ QR කේත මත පදනම් වූ ක්‍රමවේද ඇතුළත් නව ඩිජිටල් ශිෂ්‍ය පැමිණීමේ පද්ධතියක් ක්‍රියාත්මක කරන ලදී.

- **ආදි ශිෂ්‍ය සම්බන්ධීකරණය - " බැක්ටු ජපුර " වැඩසටහන්:** පීඨය කෙරෙහි පවතින සිය නොසැලෙන කැපවීම ප්‍රදර්ශනය කරමින්, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ ආදි ශිෂ්‍යයින් "බැක්ටු ජපුර" වැඩසටහන් පහක් සංවිධානය කළ අතර, පීඨය සහ වත්මන් සිසුන් සමඟ නැවත සම්බන්ධ වෙමින් ඊට නොමසුරු දායකත්වයක් ලබා දුන්හ. ස්මාර්ට් පුවරු, ලැප්ටොප් පරිගණක සහ පොත්පත් ඇතුළු ද්‍රව්‍ය ප්‍රදානය කිරීමෙන් අනාගත පරපුරේ ඉගෙනුම් අත්දැකීම් ඉහළ නැංවීම ඔවුන්ගේ ඉලක්ක විය.

**පර්යේෂණ හා සංවර්ධනය**

• විද්‍යෝදය කළමනාකරණ සඟරාව යනුවෙන් පැවැති සඟරාවේ නම, ජාත්‍යන්තර සම්මත ශ්‍රේණිගත අංකන අත්පොතෙහි නියම කර ඇති පරිදි, Journal of Business Research and Insights (JBRI) ලෙස වෙනස් කරන ලද අතර එහි 10 වන වෙළුමේ 01 වන කලාපය (2024) 2025 ජූලි 28 වන දින ප්‍රකාශයට පත් කරන ලදී.

• මීට අමතරව, පහත දැක්වෙන සම සමාලෝචිත ද්වි-වාර්ෂික ශාස්ත්‍රීය සඟරා අදාළ අධ්‍යයනාංශ මගින් ප්‍රකාශයට පත් කරන ලදී:
  - අලෙවිකරණ කළමනාකරණ අධ්‍යයනාංශය මගින් ආසියානු අලෙවිකරණ කළමනාකරණ සඟරාව පළකිරීම
  - ගිණුම්කරණ අධ්‍යයනාංශය මගින් මගින් ගිණුම්කරණය සහ ඩිජිටල්කරණය පිළිබඳ සමකාලීන ඉදිරිදර්ශන සඟරාව පළකිරීම
  - රාජ්‍ය පරිපාලන අධ්‍යයනාංශය මගින් ජාත්‍යන්තර පාලන සහ රාජ්‍ය ප්‍රතිපත්ති විශ්ලේෂණය පිළිබඳ සඟරාව පළකිරීම
  - මූල්‍ය අධ්‍යයනාංශය මගින් ආසියානු මූල්‍ය සමාලෝචන සඟරාව පළකිරීම

• 2024 වර්ෂයේදී, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ විද්වතුන් විසින් සුවිශේෂී ශාස්ත්‍රීය දායකත්වයක් ලබා දෙන ලදී. ඔවුන් විද්‍යුත් සඟරා ඇතුළු විවිධ ප්‍රකාශනවල සඟරා ලිපි 100කට අධික සංඛ්‍යාවක් රචනා කර ඇති අතර, දේශීය හා ජාත්‍යන්තර සමුළුවලදී සම්මන්ත්‍රණ පත්‍රිකා 100කට අධික ප්‍රමාණයක් ඉදිරිපත් කර ඇත. තවද, ඔවුන් පිළිගත් ප්‍රකාශකයින් සමඟ පොත් පරිච්ඡේද 5කට අධික ප්‍රමාණයක් ප්‍රකාශයට පත් කර ඇති අතර වසර පුරා පොත් 20ක් රචනා කර ඇත. මීට අමතරව, පීඨයේ විද්වතුන් 10 දෙනෙකුට අධික සංඛ්‍යාවක් දේශීය හා ජාත්‍යන්තර සඟරාවල සංස්කාරකවරුන් ලෙස සේවය කරමින් ශාස්ත්‍රීය ප්‍රජාව තුළ ඔවුන්ගේ බලපෑම තවදුරටත් ඉහළ නංවා ඇත.

• 24 වන කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨ පර්යේෂණ සැසිවාරය 2024 දෙසැම්බර් 18 වන දින ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාල පරිශ්‍රයේදී පැවැත්විණි. මෙම සැසිය විද්‍යාර්ථීන්ට, විශේෂයෙන්ම තරුණ විද්‍යාර්ථීන්ට, පීඨය තුළ ඔවුන්ගේ පර්යේෂණ දැනුම හුවමාරු කර ගැනීමට වේදිකාවක් සැලසීමට නිර්මාණය කරන ලද අතර, එමඟින් පීඨය තුළ ශක්තිමත් පර්යේෂණ සංස්කෘතියක් ඇති කිරීම අරමුණු විය.
  - විවිධ පීඨවල පර්යේෂකයන් එකම වේදිකාවකට රැගෙන ඒම මගින් අන්තර් පීඨ සහයෝගීතාව වර්ධනය කිරීම අන්තර්විෂයීක පර්යේෂණ සහයෝගීතා සැසියයේ අරමුණ විය. මෙම වේදිකාව නව්‍ය අදහස්, ක්‍රමවේද සහ අන්තර්විෂයීක ප්‍රවේශයන් හුවමාරු කර

ගැනීමට පහසුකම් සැලසූ අතර, විශ්වවිද්‍යාලයේ සමස්ත පර්යේෂණ නිමැවුම ඉහළ නැංවීම එහි ඉලක්කය විය.

- පර්යේෂණ මගින් ව්‍යාපාර සවිබල ගැන්වීම: සැබෑ ලෝකයේ අභියෝග සහ අවස්ථා පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ව්‍යවසායකයින් සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හිමිකරුවන් ආරාධනා කරමින් ශාස්ත්‍රීය ක්ෂේත්‍රය කර්මාන්තය සමඟ සම්බන්ධ කරන ලදී. මෙම අන්තර්ක්‍රියාකාරී සංවාදය පර්යේෂණ සහ භාවිතය අතර පරතරය පියවීම සහ ශාස්ත්‍රීය අවබෝධය කර්මාන්ත අවශ්‍යතා සමඟ පෙළගැස්වීම කෙරෙහි අවධානය යොමු කළේය. විභව හවුල්කාරිත්වයන් පෝෂණය කරමින් සහ ව්‍යාපාර වර්ධනය සඳහා පර්යේෂණයේ අදාළත්වය ඉස්මතු කරමින් සහභාගිවන්නන් 70කට අධික සංඛ්‍යාවකගේ සහභාගීත්වයෙන් පැවැති මෙම මෙය ඉතා ඵලදායී සැසියක් විය.

- දේපළ කළමනාකරණය සහ තක්සේරුව පිළිබඳ ජාත්‍යන්තර සමුළුව (ICREMV) 2024 ඔක්තෝබර් 24 වන දින කොළඹ ගෝල්ෆේස් හෝටලයේදී සහ සූම් තාක්ෂණය ඔස්සේ දෙමුහුන් (Hybrid) ක්‍රමයට පවත්වන ලදී. දේපළ වෙළඳාම් කළමනාකරණය සහ තක්සේරුකරණ විෂයයන් හරහා සහභාගී වූවන්ට විශේෂඥ දැනුමක් ලබා දෙමින් විශිෂ්ට කථිකයින් පිරිසක් මෙහිදී සිය දේශන ඉදිරිපත් කළහ. මෙම අවස්ථාව සඳහා මාර්ගගතව සහභාගිවන්නන් 400කට අධික සංඛ්‍යාවක් සහ භෞතිකව සහභාගිවන්නන් 200කට අධික සංඛ්‍යාවක් ආකර්ෂණය කර ගන්නා ලදී. ප්‍රකාශිත ලිපි 52කින් යුත් සමුළු ග්‍රන්ථයක් මගින් සමුළුවේ ශාස්ත්‍රීය බලපෑම අවධාරණය කරන ලද අතර එය දේපළ වෙළඳාම් කළමනාකරණය සහ තක්සේරු අංශයේ සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. 2024 ඔක්තෝබර් 10 වන දින පැවති පූර්ව සම්මන්ත්‍රණය සඳහා වැඩමුළු මාලාවේ ප්‍රධාන කථිකයෝ දෙදෙනෙක් සහභාගී වූහ.

- 2024 වර්ෂය තුළ පීඨයේ විද්වතුන් විසින් දේශීයව සහ ජාත්‍යන්තරව පිළිගත් සම්මන්ත්‍රණවලදී ප්‍රධාන දේශන අටක් (8) පවත්වා ඇත.

- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ පර්යේෂණ සතිය 2024 පෙබරවාරි 26 සිට 2024 මාර්තු 01 දක්වා පැවැත්විණි. එයට පහත වැඩසටහන් ඇතුළත් විය;
    - පූර්ව-සමුළු වැඩමුළු – 2024 පෙබරවාරි 26 සහ 27
    - උපාධි අපේක්ෂක පර්යේෂණ සමුළුව – 2024 පෙබරවාරි 28- අදාළ අධ්‍යයනාංශ විසින් උපාධි අපේක්ෂක පර්යේෂණ සම්මන්ත්‍රණ එකොළහක් සම්බන්ධීකරණය කරන ලදී.
    - ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ 20 වන ජාත්‍යන්තර සමුළුව (ICBM) – 2024 පෙබරවාරි 29 - " අස්ථාවර, අවිනිශ්චිත, සංකීර්ණ සහ අපැහැදිලි ලෝකය තුළ තිරසාර සංවර්ධනය සඳහා ඔරොත්තු දීමේ හැකියාව සහ නවෝත්පාදනය" යන තේමාව යටතේ පැවති මෙම සමුළුව, ව්‍යාපාර කළමනාකරණයේ දැවෙන ගැටළු සාකච්ඡා කිරීමට සහ අස්ථාවර, අවිනිශ්චිත, සංකීර්ණ සහ අපැහැදිලි (VUCA) ලෝකයක තිරසාර සංවර්ධනයක් අත්කර ගැනීම සඳහා විසඳුම් ගවේෂණය කිරීමට ලොව පුරා සිටින විද්වතුන් එකම වේදිකාවක එක් කළේය.

    - ආචාර්ය උපාධි සංවාද මණ්ඩපය – 2024 මාර්තු 01
    - මෙම අවස්ථාව ආචාර්ය උපාධි අපේක්ෂකයින් හය දෙනෙකු විසින් සිය ආචාර්ය උපාධි අධ්‍යයනයන් පිළිබඳව ඉදිරිපත් කිරීම් සිදුකළ පර්යේෂණ සැසියකින් සමන්විත විය. ඉදිරිපත් කිරීම්වලින් අනතුරුව, විශේෂඥ සාකච්ඡාකරුවන් හය දෙනෙකු විසින් අදාළ

සංකල්ප පත්‍රිකා වැඩිදියුණු කිරීම සඳහා නිර්මාණාත්මක ප්‍රතිපෝෂණ සහ වටිනා යෝජනා ලබා දෙන ලදී. සංවාද මණ්ඩපයේ ක්‍රියාදාම ග්‍රන්ථයේ විද්‍යුත් පිටපත දියත් කරන ලද අතර මේ වන විට එය ICBM 2024 වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

- ව්‍යාපාරික සංසදය – 2024 මාර්තු 01
- " අස්ථාවර, අවිනිශ්චිත, සංකීර්ණ සහ අපැහැදිලි ලෝකය තුළ තිරසාර සංවර්ධනය සඳහා ඔරොත්තු දීමේ හැකියාව සහ නව්‍යකරණය" යන තේමාව යටතේ පැවති මෙම සංසදය සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ ආරාධිත සහභාගිවන්නන් 122 දෙනෙකු, කර්මාන්ත ක්ෂේත්‍රයේ ආරාධිතයින් 35 දෙනෙකු සහ බාහිර පීඨ මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු ඇතුළුව කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය විසින් නම් කරන ලද පිරිසක් ඊට සහභාගී වූහ. තෝරාගත් සමාගම්වල අත්දැකීම් ඉස්මතු කරමින්, අස්ථාවර, අවිනිශ්චිත, සංකීර්ණ සහ අපැහැදිලි ලෝකය තුළ තිරසාර සංවර්ධනය සඳහා ඔරොත්තු දීමේ හැකියාව සහ නව්‍යකරණය පිළිබඳව අවධානය යොමු කරන ලද කථා සංග්‍රහයක් වන ICBM සිද්ධි අධ්‍යයන ග්‍රන්ථය දියත් කිරීමත් සමඟ මෙම සැසිය ආරම්භ විය.

- ඕස්ට්‍රේලියාවේ, ආසියානු සමාජ විද්‍යා පර්යේෂණ සභා සංගමයේ අරමුදල් යටතේ 2024 වර්ෂයේදී ආරම්භ කරන ලද, ‘‘අවිධිමත් අධ්‍යාපනය තුළින් දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම: ශ්‍රී ලංකාවේ ග්‍රාමීය කුඩා තේ වතු හිමියන් ආශ්‍රිත සිද්ධි අධ්‍යයනයක්’’ නම් පර්යේෂණ ව්‍යාපෘතිය මඟින්, කුඩා තේ වතු හිමියන් අතර පවතින අවිධිමත් දේශගුණික විපර්යාස පිළිබඳ අධ්‍යාපන වැඩසටහන් විමර්ශනය කරනු ලබයි. වැදගත් පර්යේෂණ අවශ්‍යතාවයක් සපුරාලමින්, මෙම අධ්‍යයනය මඟින් වෙනත් අවදානම් කලාපවල, විශේෂයෙන්ම ආසියා-ශාන්තිකර කලාපයේ දේශගුණික විපර්යාසවලට අනුවර්තනය වීමේ ප්‍රයත්නයන් සඳහා තොරතුරු සැපයීම අරමුණු කරයි. මෙම ව්‍යාපෘතිය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සහ ඉන්දියාවේ පරිවර්තනය සඳහා වූ ජාතික ආයතනයේ විශේෂඥයින්ගේ සහයෝගීත්වයෙන් ක්‍රියාත්මක කෙරේ.

- 2024 වර්ෂයේදී ආරම්භ කරන ලද, ‘‘ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල මෙහෙයුම් සඳහා තිරසාර භාවිතයන් ඒකාබද්ධ කිරීම: වත්මන් තත්ත්වය, අභියෝග සහ අනාගත අපේක්ෂා’’ නම් පර්යේෂණ ව්‍යාපෘතිය මඟින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාලවල පාරිසරික තිරසාර භාවිතයන් පිළිබඳ විමර්ශනය කරන අතරම එය වැඩිදියුණු කිරීම සඳහා පවතින බාධක සහ අවස්ථා ද හඳුනා ගනී. මෙම සොයාගැනීම්, ආයතනික ශ්‍රේණිගත කිරීම්ද ඉහළ නංවමින් තිරසාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා විශ්වවිද්‍යාල නායකයින්ට, ප්‍රතිපත්ති සම්පාදකයින්ට සහ වෘත්තිකයින්ට සහය වනු ඇත. මෙම අධ්‍යයනය ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ, ඕස්ට්‍රේලියානු ජාතික විශ්වවිද්‍යාලයේ සහ ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ පර්යේෂකයන්ගේ සහයෝගීත්වයෙන් සිදු කෙරේ.

## කාර්මික සහයෝගීතාව

- 2024 වර්ෂයේදී, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ **කර්මාන්ත සම්බන්ධීකරණ කාර්යාලය විසින්** කර්මාන්ත හවුල්කාරිත්වයන් ශක්තිමත් කිරීමේදී සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගන්නා ලදී. එම කාර්යාලය මගින් **නව අවබෝධතා ගිවිසුම් (MOUs) හයක්** අත්සන් කිරීමට පහසුකම් සලසා ඇති අතර, එක් ගිවිසුමක් අලුත් කර, තවත් එක් ගිවිසුමක් අලුත් කිරීමට නියමිතව ඇත. මීට අමතරව තවත් අවබෝධතා ගිවිසුම් 12ක් දැනට ක්‍රියාත්මක වෙමින් පවතී.

- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ ORCID ගෝලීය සහභාගීත්ව අරමුදල් (GPF) **ව්‍යාපෘතිය** මගින් ශ්‍රී ලංකාවේ සහ මාලදිවයිනේ ORCID ගෝලීය සහභාගීත්ව අරමුදල් භාවිතය සහ ඒ පිළිබඳ දැනුවත්භාවය වැඩි දියුණු කරන ලදී. ප්‍රජා සත්කාර, පුහුණුව සහ ධාරිතා ගොඩනැගීම තුළින් පර්යේෂකයන්, පරිපාලකයින් සහ පුස්තකාලාධිපතිවරුන් සම්බන්ධ කර ගනිමින්, ආයතනික ක්‍රියා පටිපාටි ශක්තිමත් කරමින් සහ දේශීයකරණය වූ ORCID සම්පත් සංවර්ධනය කරමින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක විය. මෙම වැඩසටහන මගින් කලාපීය සහයෝගීතාව වර්ධනය කරමින්, වඩාත් සම්බන්ධිත සහ විනිවිද පෙනෙන පර්යේෂණ පරිසර පද්ධතියක් ප්‍රවර්ධනය කළේය.

- **ජපුර එක්ස්පෝ** 2024, "කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සවිබල ගැන්වීම සහ ගෝලීය වශයෙන් අපනයන ඉහළ නැංවීම" යන තේමාව යටතේ, ව්‍යාපාර ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය විසින් නොවැම්බර් 24-25 දිනවල විශ්වවිද්‍යාලයේ දී සහ කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී සංවිධානය කරන ලදී. ලංකා බැංකුව නිල උපායමාර්ගික සහකරු ලෙසත්, සිනමන් ග්‍රෑන්ඩ් නිල ජීවන රටා සහකරු ලෙසත් සහාය වූ අතර, මාතර ෆ්‍රීලන්, ජීඑම්සී හෝල්ඩින්ග්ස් සහ එක්ස්පෝ ලංකා හෝල්ඩින්ග්ස් ලිමිටඩ් ඇතුළු ප්‍රධාන අනුග්‍රාහකයින්ගේ දායකත්වය ද මේ සඳහා ලැබිණි. ADA, දේශය, සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව වැනි මාධ්‍ය හවුල්කරුවන් පුළුල් ප්‍රචාරයක් ලබා දුන්හ. අධ්‍යයන සහ කර්මාන්ත සහයෝගීතාවය තුළින්, මෙම ප්‍රදර්ශනය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ගෝලීය අපනයන වෙළඳපොළ තුළ ව්‍යාප්ත වීමට වටිනා අවස්ථා උදාකර දුන්නේය.

- **දේපළ කළමනාකරණය සහ තක්සේරුව පිළිබඳ ජාත්‍යන්තර සමුළුව (ICREMV)** ඔක්තෝබර් 24 වන දින කොළඹ ගෝල්ෆේස් හෝටලයේදී සහ සූම් තාක්ෂණය ඔස්සේ දෙමුහුන් ක්‍රමයට පැවැත්විණි. හිටපු රජයේ ප්‍රධාන තක්සේරුකරු පී. ඩබ්. සේනාරත්න මහතා, වත්මන් රජයේ ප්‍රධාන තක්සේරුකරු ඒ. එස්. ඩබ්. කේ. නානායක්කාර මහතා, වරලත් ව්‍යාපෘති කළමනාකරු හේමන්ත බණ්ඩාර මහතා, වරලත් තක්සේරුකරු එස්. සිවස්කාන්ත මහතා, සහ කොළඹ මහ නගර සභාවේ තක්සේරු නිලධාරීන් වන චමිලා සිරිසේන මහත්මිය සහ එස්. අයි. පී. ඉන්දික මහතා වැනි ප්‍රමුඛ පෙළේ පුද්ගලයින්ගේ සහභාගිත්වයෙන් පැවති ක්ෂේත්‍රීය සංවාදයක් ද ඇතුළත් මෙම අවස්ථාව, වැදගත් ක්ෂේත්‍රීය සහයෝගීතාවයන්ගෙන් සමන්විත විය..

- 5 වන ව්‍යාපාර ආර්ථික විද්‍යා වාර්ෂික සමුළුව (ACBE) 2024, "ආර්ථික ප්‍රකෘතිය සඳහා ඩිජිටල් පරිවර්තනය උපයෝගී කර ගැනීම" යන තේමාව යටතේ, ව්‍යාපාර ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුවේ ව්‍යාපාර ආර්ථික විද්‍යා හා සංවර්ධන අධ්‍යයන පර්යේෂණ මධ්‍යස්ථානය

(RCBEDS) විසින් 2024 පෙබරවාරි 28 වන දින ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේදී සංවිධානය කරන ලදී.

- "ආර්ථික පුනර්ජීවනය සඳහා ඩිජිටල් පරිවර්තනය උපයෝගී කර ගැනීම" යන තේමාව යටතේ පැවති 5 වන වාර්ෂික ව්‍යාපාරික ආර්ථික විද්‍යා සමුළුව 2024, ව්‍යාපාරික ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ, ව්‍යාපාරික ආර්ථික විද්‍යා හා සංවර්ධන අධ්‍යයන පර්යේෂණ මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලදී. 2024 පෙබරවාරි 28 වන දින ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේදී පැවති මෙම සමුළුව, ආසියානු සංවර්ධන බැංකුවේ ඩිජිටල් තාක්ෂණ විශේෂඥ, බියොංජෝ කොං (ByeongJo Kong) මහතා විසින් "සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා කෘත්‍රිම බුද්ධිය" මැයෙන් පැවැත්වූ මාර්ගගත දේශනයක් ඇතුළත් පූර්ණ සැසියකින් ආරම්භ විය.

- 2024 වර්ෂයේදී, පීඨය විවිධ ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම් (MOUs) සඳහා එළඹුණු අතර, එහි මූලික අරමුණ වූයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ උපාධි අපේක්ෂකයින් සඳහා **සීමාවාසික පුහුණුව** ලබා දීම, ආරාධිත දේශන, වැඩමුළු සංවිධානය, සහයෝගී පර්යේෂණ සහ විෂය මාලා සංවර්ධනය සඳහා සහාය වීමයි.

2024 දී සමාගම් සමඟ අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම් (MOU) පිළිබඳ විස්තර පහත දැක්වේ.:

- ❖ සියම් සිටි සිමෙන්ති (ලංකා) සමාගම
- ❖ ඩයලොග් ආසියාටා පීඑල්සී
- ❖ සේවක අර්ථසාධක අරමුදල
- ❖ ශ්‍රී ලංකා මහ බැංකුව
- ❖ ඉන්ෆොමේට් (පුද්ගලික) සමාගම
- ❖ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය
- ❖ ලංකා සේවායෝජකයින්ගේ සම්මේලනය
- ❖ කන්තර් ලංකා (පුද්ගලික) සමාගම
- ❖ මහජන බැංකුව
- ❖ සම්පත් බැංකුව පීඑල්සී
- ❖ යුනිලීවර් ශ්‍රී ලංකා සමාගම
- ❖ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කර්මාන්ත කුසලතා කවුන්සිලය
- ❖ ශ්‍රී ලංකා සහතික කළ කළමනාකරණ ගිණුම් ආයතනය
- ❖ ටීජේ ලංකා පීඑල්සී
- ❖ කාගිල්ස් සිලෝන් පීඑල්සී
- ❖ ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය ශ්‍රී ලංකාව (අයිසීසී)

❖ ජාතික සංවර්ධන බැංකුව පීඑල්සී
❖ ඩෙලොයිට් ශ්‍රී ලංකා
❖ සීබීඑල් සමූහය
❖ සිංගර් ශ්‍රී ලංකා
❖ පැකේජස් ලංකා (පුද්) සමාගම

**ක්‍රියාත්මක වෙමින් පවතින අවබෝධතා ගිවිසුම් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ:**

❖ පෑන් ඒෂියා බැංකුව
❖ CAL
❖ මාස් හෝල්ඩින්ග්ස්
❖ බ්‍රැන්ඩික්ස්
❖ ගුඩ්හෝප් ඒෂියා හෝල්ඩින්ග්
❖ ග්ලොබල් ලීඩින් කොන්ෆරන්ස් (GLC)
❖ ඩීඑම්එස් සොෆ්ට්වෙයාර් ඉංජිනියරින්
❖ නෙස්ලේ
❖ ශ්‍රී ලංකා ටෙලිකොම්
❖ Lassana.com
❖ ශ්‍රී ලංකා වරාය අධිකාරිය
❖ හේමාස්

- වෘත්තීය ගිණුම්කරණ ශාස්ත්‍රපති, ව්‍යාපාර ආර්ථික විද්‍යා ශාස්ත්‍රපති, අලෙවිකරණ ශාස්ත්‍රපති, ව්‍යවහාරික මූල්‍ය ශාස්ත්‍රපති, සහ රාජ්‍ය කළමනාකරණ ශාස්ත්‍රපති ඇතුළු කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ පශ්චාත් උපාධි වැඩසටහන් කිහිපයක් වීන සිසුන් සඳහා පිරිනැමීමට මූලික විධිවිධාන සලසා ඇත.

**තත්ත්ව සහතිකරණය**

- **කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ උපාධි අපේක්ෂකයින් සඳහා සේවා ස්ථානය පදනම් කරගත් පුහුණුව පිළිබඳ ප්‍රතිපත්තිය:**

මෙම වර්ෂය තුළ, පීඨය විසින් සියලුම උපාධි පාඨමාලාවලට ප්‍රායෝගික පුහුණු කටයුතු ඒකාබද්ධ කරමින්, අධ්‍යයන අරමුණු සහ කර්මාන්ත ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි, සේවා ස්ථානය පදනම් කරගත් පුහුණු ප්‍රතිපත්තිය සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. පුහුණු කටයුතු සඳහා සේවා ස්ථානගත කිරීම් පහසු කිරීම, ශක්තිමත් කර්මාන්ත සම්බන්ධතා ඇති කිරීම සහ සිසුන්ගේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා සීමාවාසික සම්බන්ධීකාරකවරුන් පත් කරන ලදී. විශේෂ අවශ්‍යතා ඇති සිසුන්ට සහාය වීම සඳහා විශේෂ විධිවිධාන සලසා ඇති අතර, පුහුණුවේ

ඵලදායීතාවය සහතික කිරීම සඳහා නිතිපතා අධීක්ෂණය, ප්‍රතිපෝෂණ සහ තක්සේරුව සඳහා යාන්ත්‍රණ හඳුන්වා දෙන ලදී.මෙමගින්, න්‍යායාත්මක දැනුම සහ ප්‍රායෝගික අත්දැකීම් යන දෙකින්ම සන්නද්ධ, **රැකියා සඳහා සූදානම්, දක්ෂ උපාධිධාරීන්** බිහි කිරීමට පීඨයේ කැපවීම තහවුරු කර ඇත.

- **කෘත්‍රිම බුද්ධිය (AI) භාවිතය පිළිබඳ ප්‍රතිපත්තිය:**

කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය (FMSC) විසින්, ශිෂ්‍ය ඇගයීම් සඳහා කෘත්‍රිම බුද්ධිය (AI) සදාචාරාත්මකව සහ වගකීමෙන් යුතුව භාවිත කිරීමට මගපෙන්වීම සඳහා ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කර ඇත. මෙම ප්‍රතිපත්තිය මගින්, නැගී එන AI තාක්ෂණයන්ගෙන් ශිෂ්‍යයින් ප්‍රතිලාභ ලබන අතරතුර, ඔවුන්ගේ පෞද්ගලික කුසලතා සංවර්ධනය සහ ශාස්ත්‍රීය කටයුතුවල අවංකභාවය කිසිසේත් අඩපණ නොවන බවට සහතික කෙරේ. සාමාන්‍ය රීතියක් ලෙස, පාඨමාලා සම්බන්ධීකාරක විසින් පැහැදිලිවම අවසර ලබා දී ඇත්නම් මිස, ඇගයීම් සඳහා වන ඉදිරිපත් කිරීම් නිර්මාණය කිරීමට ජනනීය කෘතිම බුද්ධි මෙවලම් භාවිත කිරීම තහනම් වේ. කෘතිම බුද්ධි මෙවලම් භාවිතය සඳහා අනුමත කරන ලද ඕනෑම අවස්ථාවකදී, විනිවිදභාවය සහ ශාස්ත්‍රීය ප්‍රමිතීන්ට අනුකූල වීම ප්‍රවර්ධනය කිරීම සඳහා, එය භාවිත කළ බව පැහැදිලිව සඳහන් කළ යුතු අතර නිසි පරිදි මූලාශ්‍ර ද දැක්විය යුතුය.

**මානව ප්‍රාග්ධන සංවර්ධනය (අධ්‍යයන, අනධ්‍යයන, ශිෂ්‍ය)**

- පීඨයේ කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන මගින් ඔවුන්ගේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනයේ කොටසක් ලෙස 2024 වසර තුළ විද්වතුන් සඳහා වැඩමුළු පහක් සංවිධානය කරන ලදී.

- 2024 වර්ෂයේදී ආරම්භ කරන ලද, මොනෑෂ් විශ්වවිද්‍යාලයේ සත්කාරකත්වයෙන් පැවති කීර්තිමත් ඕස්ට්‍රේලියානු සම්මාන අධිශිෂ්‍යත්ව (AAF) වැඩසටහන සඳහා කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ ආචාර්ය මණ්ඩල සාමාජිකයින් හත් දෙනෙකු තෝරා ගන්නා ලදී. 2024 නොවැම්බර් මාසයේදී, ඔවුන් සිය වෘත්තීය සංවර්ධනය සහ ශාස්ත්‍රීය විශේෂඥතාව වැඩි දියුණු කිරීම සඳහා සැලසුම් කරන ලද සති තුනක පුළුල් වැඩසටහනකට සහභාගී විය. ඕස්ට්‍රේලියානු රජයේ අරමුදල් යටතේ සහ එහි විදේශ කටයුතු සහ වෙළඳ දෙපාර්තමේන්තුව මගින් පහසුකම් සපයන ලද මෙම අධිශිෂ්‍යත්ව වැඩසටහන මොනෑෂ් විශ්වවිද්‍යාලයේ සහ බටහිර සිඩ්නි විශ්වවිද්‍යාලයේ සමගාමීව පවත්වන ලදී. "ශ්‍රී ලංකාවේ විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව සහ ගණිතය (STEM) පදනම් කරගත් ආයතනවල ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ සමාජ අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම" යන තේමාව යටතේ මෙම වැඩසටහන පැවැත්විණි.

- 2024 වර්ෂයේදී ආරම්භ කරන ලද, කළමනාකරණ අධ්‍යයන හා වානිජ පීඨ ශිෂ්‍ය උපකාරක මධ්‍යස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ (USJ) කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය සමග එක්ව, , කළමනාකරණ අධ්‍යයන හා වානිජ පීඨයේ ආචාර්ය මණ්ඩලය සඳහා 'ශාස්ත්‍රීය උපදේශනය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව' ආරම්භ කරන ලද අතර, ඒ සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයින් 30 දෙනෙකු සහභාගී විය. ජාතික අධ්‍යාපන ආයතනයේ (NIE) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මෙහෙයවන ලද මෙම වැඩසටහනේ අරමුණ, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ නවක සිසුන් සඳහා පුළුල් ශාස්ත්‍රීය මගපෙන්වීමක් සහතික කරමින්, ඔවුන්ගේ ශාස්ත්‍රීය හා පෞද්ගලික සංවර්ධනය සඳහා ඵලදායී ලෙස සහාය වීමට අවශ්‍ය උපාය මාර්ග සහ ප්‍රවේශයන් ලබා දීම තුළින් පීඨයේ ශාස්ත්‍රීය උපදේශකවරුන්ගේ උපදේශන කුසලතා වැඩි දියුණු කිරීමයි.

- 2024 වර්ෂයේදී, පීඨයේ ආචාර්ය මණ්ඩල සාමාජිකයින් කිහිප දෙනෙකුම තම ක්ෂේත්‍රයන්ට දැක්වූ දායකත්වය වෙනුවෙන් විශේෂ ඇගයීම්වලට ලක් විය. දේපළ කළමනාකරණ සහ තක්සේරු අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය චමීර උඩවත්ත මහතා, ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් සංවිධානය කරන ලද ජනාධිපති සම්මාන ප්‍රදානෝත්සවයේදී කීර්තිමත් ජනාධිපති සම්මාන දෙකකින් පිදුම් ලැබීය. මීට අමතරව, 2024 නොවැම්බර් මාසයේදී, ශ්‍රී ලංකා පරිගණක සංගමය (CSSL) විසින් සංවිධානය කරන ලද 42 වන ජාතික තොරතුරු තාක්ෂණ සමුළුවේදී, තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශයේ මහාචාර්ය ලසිත් ගුණවර්ධන මහතා 2023 වසරේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපනඥයා ලෙස සම්මානයට පාත්‍ර විය.

- 2024 වර්ෂයේදී, වෘත්තීය විභාග සහ දේශීය හා ජාත්‍යන්තර තරඟාවලිවලට සහභාගී වීම ඇතුළුව, ශිෂ්‍ය ජයග්‍රහණ 40කට අධික සංඛ්‍යාවක් සටහන් විය. විශේෂයෙන්ම, 2024 ජූනි මාසයේදී, තොරතුරු තාක්ෂණ අධයයනාංශයේ තෙවන වසරේ ඉගෙනුම ලබන තරිඳු ප්‍රනාන්දු ශිෂ්‍යයා, SLASSCOM ජාතික නිපුණතා සම්මාන 2024 හිදී, සිය නව්‍ය ව්‍යාපාරය වන “IdeaCipher” වෙනුවෙන් හොඳම ආරම්භක ව්‍යාපාරය සඳහා වන සම්මානය (මධ්‍යම පළාත) දිනා ගත්තේය. මෙම ව්‍යාපාරය යටතේ 100,000කට අධික බාගත කිරීම් සංඛ්‍යාවක් සහිත ආදායම් උත්පාදනය කරන ජංගම යෙදුම් කිහිපයක් පවතී. එම උත්සවයේදීම ප්‍රනාන්දු මහතා වසරේ ශිෂ්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යවසායකයා සම්මානයෙන්ද පිදුම් ලැබීය. 2024 ඔක්තෝබර් මාසයේදී, ව්‍යාපාර තොරතුරු පද්ධති උපාධි පාඨමාලාවේ තෙවන වසරේ සිසුන් කණ්ඩායමක් විසින් වැඩි දියුණු කරන ලද SpokenMaster ව්‍යාපෘතිය, ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ තරඟය වන ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්මාන – NBQSA උළෙලේදී තෘතීයික ශිෂ්‍ය ව්‍යාපෘති (ව්‍යාපාර) කාණ්ඩය යටතේ ලෝකඩ සම්මානය දිනා ගන්නා ලදී.

- පීඨයේ ශිෂ්‍ය උපකාරක මධ්‍යස්ථානය විසින් වෘත්තීය උපදේශකයින් තිදෙනෙකුගේ මගපෙන්වීම යටතේ උපාධි අපේක්ෂකයින් සඳහා පුද්ගල මානසික උපදේශන සැසි 180කට අධික සංඛ්‍යාවක්

පවත්වන ලදී. මීට අමතරව, පීඨය විසින් ස්වේච්ඡා පදනම මත පත් කරන ලද ශාස්ත්‍රීය උපදේශකයින් 40 දෙනෙකු විසින් වසර පුරා සිසුන්ට අඛණ්ඩ මගපෙන්වීම ලබා දෙන ලදී.

- උපාධි අපේක්ෂකයින්ගේ සෞන්දර්යාත්මක කුසලතා වර්ධනය කිරීම අරමුණු කරගනිමින්, දක්ෂතා ප්‍රදර්ශනය කිරීමේ ප්‍රසංග ඇතුළු සෞන්දර්යාත්මක වැඩසටහන් පහළොවකට අධික සංඛ්‍යාවක් ද පීඨය විසින් සංවිධානය කරන ලදී.

**ප්‍රජා සේවා, සමාජ වගකීම සහ ජාතික සංවර්ධනය**

- 2024 වර්ෂයේදී, පීඨයේ සිසුන් 46 දෙනෙකුට දෙපාර්තමේන්තු මට්ටමේ ප්‍රතිපාදනවලට අමතරව **පීඨ ශිෂ්‍යාධාර අරමුදල** හරහා මූල්‍ය ආධාර ලැබුණු අතර, මූල්‍ය දුෂ්කරතාවලට මුහුණ දී සිටින සිසුන් සඳහා එමගින් ඉතා අගනා සහායක් ලබා දෙන ලදී.

- කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ ආදි ශිෂ්‍යයින්, තම අධ්‍යාපන ආයතනය වෙත ඇති සහයෝගය සහ කැපවීම විශිෂ්ට ලෙස ප්‍රදර්ශනය කරමින්, වැඩසටහන් පහකින් යුතු **"Back to Japura" වැඩසටහන් මාලාවක්** සංවිධානය කරන ලදී. මෙම අවස්ථා වලදී, ඔවුන් පීඨය සහ වත්මන් සිසුන් සමඟ යළි සම්බන්ධ වූ අතර, සිසුන්ගේ ඉගෙනුම් අත්දැකීම් වැඩිදියුණු කිරීමේ අරමුණින් ස්මාර්ට් රූපවාහිනියක් ඇතුළු ඉගැන්වීම් සහ ඉගෙනුම් උපකරණ කිහිපයක් නොමසුරුව පරිත්‍යාග කරන ලදී.

- කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ ශිෂ්‍ය සංගම් විසින් ස්වේච්ඡාවෙන් **පාසල් මට්ටමේ වැඩසටහන් 15කට අධික** සංඛ්‍යාවක් සංවිධානය කරන ලද අතර, උසස් පෙළ සිසුන් ඉලක්ක කරගත් සම්මන්ත්‍රණ සහ පාසල් දරුවන් විශ්වවිද්‍යාල ජීවිතය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් ඊට ඇතුළත් විය.

- පීඨයේ ආචාර්ය මණ්ඩලය, සිසුන් සමඟ එක්ව, වසර පුරා **ප්‍රජා ව්‍යාපෘති 30කට අධික** සංඛ්‍යාවකට සක්‍රියව සහභාගී විය. මෙම ව්‍යාපෘතිවලට ලේ දන්දීමේ වැඩසටහන්, ප්‍රාදේශීය පාසල් වෙත පුස්තකාල පොත් පරිත්‍යාග කිරීම, අධ්‍යාපන පහසුකම් අලුත්වැඩියා කිරීම සහ පරිසර සංරක්ෂණය ඉලක්ක කරගත් වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන් වැනි විවිධ ක්‍රියාකාරකම් ඇතුළත් විය.

- කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ ශාස්ත්‍රඥයින් විසින් **රූපවාහිනී වැඩසටහන් 30කට අධික** සංඛ්‍යාවකට පෙනී සිටිමින් ප්‍රජා සහභාගීත්වය සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දෙන ලදී. මෙම වැඩසටහන් හරහා, ඔවුන් තම විශේෂඥ දැනුම පුළුල් ප්‍රජාව සමඟ බෙදා ගනිමින් විවිධ වැදගත් කරුණු පිළිබඳ දැනුවත්භාවය සහ අවබෝධය ලබා දෙන ලදී.

- පීඨය විසින් පුළුල් පරාසයක බාහිර පාර්ශ්වකරුවන් වෙත දැනුම ව්‍යාප්ත කිරීම සඳහා වටිනා අවස්ථා ලබා දෙමින් **වැඩමුළු සහ සම්මන්ත්‍රණ** 25**කට අධික** සංඛ්‍යාවක් පවත්වන ලදී. මෙම වැඩසටහන් දැනුම බෙදා ගැනීමට, අදහස් හුවමාරු කර ගැනීමට සහ සහභාගිවන්නන් අතර සහයෝගීතාවය වර්ධනය කිරීමට වේදිකා නිර්මාණය කළේය.

- පීඨයේ ආචාර්ය මණ්ඩල සාමාජිකයින්ට බාහිර වැඩසටහන් අවස්ථාවන්හිදී **ආරාධිත දේශන** 15**කට අධික** සංඛ්‍යාවක් පැවැත්වීම සඳහා ආරාධනා ලැබුණ අතර එමගින් ඔවුන්ට විවිධ අයවලුන් සමඟ ඔවුන්ගේ විශේෂඥතාව සහ ඉදිරිදර්ශන බෙදා ගැනීමට හැකි විය. තවද, එමගින් පීඨයේ දැනුමේ ව්‍යාප්ති පරාසය තවදුරටත් පුළුල් විය.

**2023 හා 2024 වර්ෂ වල ප්‍රතිඵල සන්සන්දනය**

| උපාධි පාඨමාලාව | පළමු පෙළ | | දෙවන පෙළ ඉහළ | | දෙවන පෙළ පහළ | | සාමාන්‍ය සමත් | | සමත් මුළු සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2023 වසර | 2024 වසර | 2023 වසර | 2024 වසර | 2023 වසර | 2024 වසර | 2023 වසර | 2024 වසර | 2023 වසර | 2024 වසර |
| විද්‍යාවේදී ගණකාධිකරණ (විශේෂවේදී) | 52 | 40 | 66 | 65 | 51 | 46 | 43 | 39 | 212 | 190 |
| විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (ව්‍යාපාර ආර්ථික විද්‍යා) විශේෂවේදී | 20 | 9 | 25 | 14 | 16 | 20 | 13 | 20 | 74 | 63 |
| විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (විශේෂවේදී) | 35 | 28 | 67 | 82 | 57 | 62 | 66 | 65 | 225 | 237 |
| වාණිජවේදී (විශේෂවේදී) | 9 | 8 | 30 | 22 | 32 | 27 | 47 | 57 | 118 | 114 |
| විද්‍යාවේදී මෙහෙයුම් තාක්ෂණ කළමනාකරණය (විශේෂවේදී) | 7 | 8 | 17 | 14 | 14 | 10 | 17 | 16 | 55 | 48 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| විද්‍යාවේදි දේපල කළමනාකරණ හා තක්සේරු විද්‍යා (විශේෂවේදි) | 1 | 2 | 4 | 6 | 17 | 12 | 31 | 35 | 53 | 55 |
| විද්‍යාවේදි ව්‍යවසායකත්ව (විශේෂවේදි) | 1 | 2 | 5 | 5 | 0 | 5 | 9 | 11 | 15 | 23 |
| විද්‍යාවේදි මූල්‍ය කළමනාකරණ (විශේෂවේදි) | 34 | 19 | 35 | 37 | 39 | 45 | 44 | 46 | 152 | 147 |
| විද්‍යාවේදි මානව සම්පත් කළමනාකරණය (විශේෂවේදි)) | 10 | 1 | 10 | 21 | 18 | 20 | 18 | 15 | 56 | 57 |
| විද්‍යාවේදි ව්‍යාපාර පද්ධති කළමනාකරණය (විශේෂවේදි) | 3 | 7 | 5 | 6 | 10 | 9 | 27 | 19 | 45 | 41 |
| විද්‍යාවේදි අලෙවි කළමනාකරණය (විශේෂවේදි) | 7 | 18 | 29 | 28 | 24 | 13 | 33 | 28 | 93 | 87 |
| විද්‍යාවේදි රාජ්‍ය කළමනාකරණ (විශේෂවේදි) | 3 | 8 | 14 | 13 | 14 | 12 | 41 | 41 | 72 | 74 |
| **මුළු සංඛ්‍යාව** | **182** | **150** | **307** | **313** | **292** | **281** | **389** | **392** | **1170** | **1136** |

## දේශීය සිසුන් පිළිබඳ විස්තර - 2024

| උපාධි වැඩසටහන් (ඉංග්‍රීසි මාධ්‍යය) | වසර | | | | මුළු උපාධි අපේක්ෂක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | |
| කළමනාකරණ පොදු වැඩසටහන | 937 | | | | 937 |
| විද්‍යාවේදි ගණකාධිකරණ (විශේෂවේදි) | | 210 | 208 | 209 | 627 |
| විද්‍යාවේදි ව්‍යාපාර පරිපාලන (ව්‍යාපාර ආර්ථික විද්‍යා) විශේෂවේදි | | 72 | 72 | 66 | 210 |
| විද්‍යාවේදි ව්‍යාපාර පරිපාලන (විශේෂවේදි) | | 239 | 245 | 255 | 739 |
| වාණිජවේදි (විශේෂවේදි) | 124 | 117 | 126 | 130 | 497 |
| විද්‍යාවේදි මෙහෙයුම් හා තාක්ෂණ කළමනාකරණ (විශේෂවේදි) | | 56 | 53 | 57 | 166 |

| | | | | | |
|---|---|---|---|---|---|
| විද්‍යාවේදි දේපල කළමනාකරණ හා තක්සේරු විද්‍යා (විශේෂවේදි) | 66 | 59 | 97 | 80 | 302 |
| විද්‍යාවේදි ව්‍යවසායකත්ව (විශේෂවේදි) | | 25 | 21 | 28 | 74 |
| විද්‍යාවේදි මූල්‍ය කළමනාකරණ (විශේෂවේදි) | | 157 | 157 | 155 | 469 |
| විද්‍යාවේදි මානව සම්පත් කළමනාකරණ (විශේෂවේදි) | | 55 | 51 | 59 | 165 |
| විද්‍යාවේදි ව්‍යාපාර තොරතුරු පද්ධති කළමනාකරණය (විශේෂවේදි) | 76 | 72 | 95 | 74 | 317 |
| විද්‍යාවේදි අලෙවි කළමනාකරණ (විශේෂවේදි) | | 93 | 94 | 88 | 275 |
| විද්‍යාවේදි කළමනාකරණ (රාජ්‍ය) විශේෂවේදි | 97 | 102 | 124 | 104 | 427 |
| **මුළු සංඛ්‍යාව** | **1300** | **1257** | **1343** | **1305** | **5205** |

## කාර්යය මණ්ඩල විස්තරය

| අධ්‍යයන කාර්යය මණ්ඩලය | | පරිපාලන කාර්යය මණ්ඩලය | අධ්‍යයන සහායක කාර්යය මණ්ඩලය | අනධ්‍යයන කාර්යය මණ්ඩලය) |
|---|---|---|---|---|
| ස්ථිර | තාවකාලික | | | |
| **192** | **54** | **4** | **10** | **80** |

## ස්ථිර අධ්‍යයන කාර්යය මණ්ඩලය

| අධ්‍යයනාංශය | ජ්‍යෙෂ්ඨ මහාචාර්යය | මහාචාර්යය | සහාය මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය | කථිකාචාර්යය / කථිකාචාර්යය (ආධුනික) | මුළු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| පීඨ කාර්යයාලය | 0 | 0 | 0 | 7 | | 7 |
| ව්‍යාපාර පරිපාලන | 0 | 4 | 0 | 16 | 4 | 24 |
| රාජ්‍ය පරිපාලන | 1 | 2 | 0 | 7 | 2 | 12 |
| වාණිජ්‍ය | | 1 | | 4 | 6 | 11 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| දේපල කළමනාකරණ හා තක්සේරු විද්‍යා | 2 | 2 | 0 | 3 | 5 | 12 |
| ගණකාධිකරණ අධ්‍යයන | 2 | 5 | 0 | 9 | 6 | 22 |
| අලෙවි කළමනාකරණ | 2 | 4 | 1 | 5 | 2 | 14 |
| මානව සම්පත් කළමනාකරණ | 2 | 4 | 1 | 5 | 1 | 13 |
| මූල්‍ය කළමනාකරණ | 1 | 4 | 0 | 5 | 6 | 16 |
| ව්‍යපාර ආර්ථික විද්‍යා | 1 | 4 | 0 | 9 | 5 | 19 |
| තොරතුරු තාක්ෂණ | 0 | 4 | 0 | 8 | 5 | 17 |
| නීති අධ්‍යයන අංශය | | 2 | 0 | 8 | 5 | 15 |
| ව්‍යාපාර සන්නිවේදන අංශය | 0 | 2 | 0 | 4 | 4 | 10 |
| මුළු සංඛ්‍යාව | **11** | **38** | **2** | **90** | **51** | **192** |

## පර්යේෂණ නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ විස්තර - 2024

| | ප්‍රකාශන කාණ්ඩය | | සංඛ්‍යාව | | වෙනත් |
|---|---|---|---|---|---|
| | | | දේශියව ප්‍රකාශයට පත් කරන ලද | දේශියව ප්‍රකාශයට පත් කරන ලද | |
| 1 | තීරක සුවිගත ජර්නල ප්‍රකාශන ගණන | | 6 | 34 | |
| 2 | තීරක නොවන සුවිගත ජර්නල ප්‍රකාශන ගණන | | 7 | 5 | |
| 3 | සම්මන්ත්‍රණ කටයුතු | සම්පූර්ණ පත්‍රිකා | 6 | 1 | |
| | | සාරාංශ | 91 | 6 | |
| 4 | ප්‍රකාශිත පොත් පරිච්ඡේද ගණන | | 6 | 3 | |
| 5 | ප්‍රකාශිත පොත්/පෙළ පොත් ගණන | 5.1 ප්‍රකාශකයකු විසින් | 3 | | |
| | | 5.2 කතුවරයා විසින් | 10 | | |
| | **මුළු සංඛ්‍යාව** | | 129 | 49 | |

## වෛද්‍ය විද්‍යා පීඨය



ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිව්වන පීඨය ලෙස 1993 දී වෛද්‍ය විද්‍යා පීඨය ආරම්භ කරන ලදී. 2023 වසර වන විට, පීඨය වෛද්‍ය ක්ෂේත්‍රවල ඉගෙනීම, ඉගැන්වීම සහ පර්යේෂණ සඳහා විශිෂ්ට අධ්‍යාපන පරිසරයක් ලබා දෙන දෙපාර්තමේන්තු 17 කින් සමන්විත අංගසම්පූර්ණ පීඨයක් බවට වර්ධනය විය.

2024 වසර තුළ වෛද්‍ය විද්‍යා පීඨයේ අධ්‍යයන දෙපාර්තමේන්තු සහ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් පහත පරිදි වේ.

| අධ්‍යයනාංශය | අධ්‍යයනාංශ ප්‍රධානීන් |
|---|---|
| 1. ව්‍යුහ විද්‍යා අධ්‍යයනාංශය | වෛද්‍ය සිතාරා දිසානායක මහත්මිය |
| | වෛද්‍ය පී.එච්.දිසානායක (31.03.2024 දක්වා) |
| 2. කායික විද්‍යා අධ්‍යයනාංශය | වෛද්‍ය එච්. වෛද්‍යසේකර |
| 3. ජෛව රසායන විද්‍යා අධ්‍යයනාංශය | වෛද්‍ය සනත් මහවිතානගේ |
| | මහාචාර්යය යූ .පී.කේ. හෙට්ටිආරච්චි (30.11.2024 දක්වා) |
| 4. පරපෝෂ විද්‍යා අධ්‍යයනාංශය | වෛද්‍ය ටී.ඩී.ජේ.කළුආරච්චි |
| 5. ක්ෂුද්‍ර ජීව විද්‍යා අධ්‍යයනාංශය | මහාචාර්යය එස්.එන් එන් ෆර්නැන්ඩු |
| | වෛද්‍ය ඩී.එම්.බී.ටී. දිසානායක (30.06.2024 දක්වා) |
| 6. ව්‍යාධි විද්‍යා අධ්‍යයනාංශය | වෛද්‍ය කේ.එච්.බී.පී.ප්‍රනාන්දුපුල්ලේ |

| | |
|---|---|
| 7. භිෂග්වේද අධ්‍යයනාංශය | ජ්‍යෙෂ්ඨ මහාචාර්යය චාන්දනි වනිගතුංග<br>වෛද්‍ය ජී.වී.එන්.සඳකුමාරි<br>(31.08.2024 දක්වා) |
| 8. ප්‍රජා වෛද්‍ය විද්‍යා අධයයනාංශය | මහාචාර්යය කේ.එල්.එම්.ඩී.සෙනවිවික්‍රම |
| 9. අධිකරණ වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය | මහාචාර්යය සංජය ආර් හුලන්තුඩුව |
| 10. වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය | වෛද්‍ය ජී.එන්.ඩී. පෙරේරා |
| 11. ප්‍රසව හා නාරීවේද විද්‍යා අධ්‍යයනාංශය | වෛද්‍ය ආර්.සී.හුණුකුඹුරේ |
| 12. ළමා රෝග විද්‍යා අධ්‍යයනාංශය | මහාචාර්යය ඩී.එස්. විජේසේකර |
| 13. ශල්‍ය වෛද්‍ය විද්‍යා අධයනාංශය | වෛද්‍ය මලිත් නන්දසේන |
| 14. මනෝ වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය | වෛද්‍ය එස්.එම්.පී.සෙනවිරත්න ඇලස් |
| 15. පවුල් වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය | මහාචාර්යය ටී.එස්.පී. සමරනායක<br>වෛද්‍ය හිරන්ති ද සිල්වා<br>(02.04.2024 දක්වා) |
| 16. වෛද්‍ය අධ්‍යාපන අධ්‍යයනාංශය | මහාචාර්යය ආර්. බී. මුණසිංහ |
| 17. ප්‍රතිශක්තිකරණ හා අණුක වෛද්‍ය | මහාචාර්යය චන්දිම ජීවන්දර |

## පීඨය මඟින් පිරිනමන උපාධි හා පශ්චාද් උපාධි

**උපාධි**

- වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධිය
- විද්‍යාවේදි මානව ජීව විද්‍යා (විශේෂ) උපාධිය
- විද්‍යාවේදි මානව ජීව විද්‍යා උපාධිය

**ඩිප්ලෝමා**

- උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා
- අධිකරණ වෛද්‍ය විද්‍යාව හා විෂ වේදය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

**සහතික පත්‍ර පාඨමාලා**

- අධීක්ෂණ හා ඇගයීම් පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව

**කෙටි කාලීන පාඨමාලා**

- ජෛව සුරක්ෂිතතාව සහ ජෛව ආරක්ෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- නිවර්තන වෛද්‍ය විද්‍යාව පිළිබඳ කෙටි කාලීන පාඨමාලාව

## ඉගෙනීම සහ අධ්‍යාපනය

ඉගෙනුම් සහ අධ්‍යාපනය

- වෛද්‍ය පීඨයේ 2016/17 අධ්‍යයන කණ්ඩායමට අයත් උපාධි අපේක්ෂකයෙකු වන දිනුල් දොළවීර ශිෂ්‍යයා, 2024 වසරේදී සියලුම රාජ්‍ය වෛද්‍ය පීඨ වලින් සමත් වූ MBBS උපාධිධාරීන් අතර සමස්ත ලංකා කුසලතා ලැයිස්තුවේ පළමු ස්ථානය ලබා ගන්නා ලදී. එම කුසලතා ලැයිස්තුවේ පළමු සිසුන් 100 දෙනා අතරට ස්ථාන 14ක් හිමි කර ගැනීමට වෛද්‍ය පීඨය සමත් විය.

- 2022/2023 අධ්‍යයන කණ්ඩායමේ මූලික පිළිගැනීමේ වැඩසටහනේ සමාරම්භක උත්සවය 2024 පෙබරවාරි මස 01 වන දින පවත්වන ලදී. එම සිසුන් කණ්ඩායම සඳහා වන 2024 සමාරම්භක දේශනය 2024 මාර්තු මස 01 වන දින ව්‍යුහ විද්‍යා ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. එය මෙම වෛද්‍ය විද්‍යා පීඨයේ තෙවන කණ්ඩායමෙන් උපාධිය ලබාගත් කීර්තිමත් ආදි ශිෂ්‍යයෙකු වන වෛද්‍ය ශාන්ත ඉන්ද්‍රලාල් දේවගේ (MBBS, MD, MCCP, MRACP) මහතා විසින් පවත්වන ලදී.

## පර්යේෂණ සහ සංවර්ධන

- වෛද්‍ය විද්‍යාව පිළිබඳ වාර්ෂික පර්යේෂණ සමුළුව (ARC 2024) 2024 ඔක්තෝබර් මස 25 වන දින පවත්වන ලදී.

### පර්යේෂණ සහයෝගිතා

- මහාචාර්ය එස්. ඩබ්. විමලසේකර මහතාගේ මූලිකත්වයෙන්, වෛද්‍ය විද්‍යා පීඨයේ කායික විද්‍යා අධ්‍යයන අංශය සහ එඩින්බර්ග් විශ්ව විද්‍යාලයේ RESPIRE 2 පර්යේෂණ සමූහය අතර බහු-ජාතික පර්යේෂණ සහයෝගිතාවක් ක්‍රියාත්මක වේ.

- ලෝක සෞඛ්‍ය සංවිධානයේ අරමුදල් යටතේ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨය සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසින් 'ශ්‍රී ලංකාවේ ආහාර වල අඩංගු ට්‍රාන්ස් මේදය පිළිබඳ පුළුල් විශ්ලේෂණය' මැයෙන් සිදු කරන ලද සහයෝගීතා පර්යේෂණයේ ප්‍රතිඵලයක් ලෙස, 2024 ජනවාරි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා රජය විසින් ආහාර (ට්‍රාන්ස් මේද)වලට අදාළ රෙගුලාසි ඇතුළත් ගැසට් පත්‍රය නිකුත් කරන ලදී.

  මෙය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ ජෛව රසායන විද්‍යා අධ්‍යයන අංශය සහ ප්‍රජා වෛද්‍ය අධ්‍යයන අංශය, සහ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ ආහාර විද්‍යා අධ්‍යයන අංශය අතර සහයෝගීතාවයක් විය. අවසන් වාර්තාව සම්පාදනය කිරීම කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ජෛව රසායන විද්‍යා අධ්‍යයන අංශය විසින් සිදු කරන ලදී. මහාචාර්ය සාගරිකා ඒකනායක මහත්මිය වෛද්‍ය විද්‍යා පීඨයේ ව්‍යාපෘති නායිකාව විය.

## යටිතල පහසුකම් සංවර්ධනය

1. පිළිකා පිළිබඳ හොඳම පර්යේෂණ පත්‍රිකාව සඳහා වන ඩැෆ්නි ආටිගල ත්‍යාගය - ශ්‍රී ලංකා වෛද්‍ය සංගමයේ (SLMA) සැසිවාරය - වෛද්‍ය එම්. ඩී. ධර්මකරන්.
2. හොඳම පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම සඳහා වන නිකලස් ආටිගල ත්‍යාගය - ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය (SLMA) - වෛද්‍ය එම්. ඩී. ධර්මකරන්.
3. හොඳම පෝස්ටර් ඉදිරිපත් කිරීම - ශ්‍රී ලංකා ස්නායු විශේෂඥ වෛද්‍යවරුන්ගේ වාර්ෂික සමුළුව - වෛද්‍ය එන්. එල්. ආර්. ඉන්දික.
4. ආචාර්ය උපාධි (PhD) කාණ්ඩය යටතේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් හය දෙනෙකු විසින් 2023 SUSRED සම්මාන ලබා ගන්නා ලදී.
5. ඉන්දියාවේ Minimal Access surgery සංගමය විසින් සංවිධානය කරන ලද "**අමාසි ක්ලික්**" වීඩියෝ තරඟයේ ලෝකඩ සම්මානය - මහාචාර්ය බවන්ත ගමගේ.
6. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් සංවිධානය කරන ලද "සහසක් නිමැවුම් 2023" තරඟයේදී වෛද්‍ය පීඨයේ අධයයන කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් රන් පදක්කමක් සහ ලෝකඩ පදක්කමක් දිනා ගන්නා ලදී.
7. ඉගැන්වීම් සහ ශිෂ්‍ය උපදේශනය සඳහා වන විශිෂ්ටතා සම්මාන ප්‍රදානෝත්සවය 2024 අප්‍රේල් මස 09 වන දින පවත්වන ලදී.

### ශිෂ්‍ය ජයග්‍රහණ

- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ, වෛද්‍ය විද්‍යා පීඨයේ 29 වන කණ්ඩායමේ උපාධි අපේක්ෂකයින් දෙදෙනෙකු වන හිරාන් චමුදිත මුණසිංහ සහ කවීෂ අකලංක විසින් කළමනාකරණය කරනු ලබන Medtalks.lk සෞඛ්‍ය අධ්‍යාපනික වෙබ් අඩවිය, BestWeb.LK 2024 තරඟයේදී සෞඛ්‍ය සහ සුවතාව කාණ්ඩය යටතේ වඩාත්ම ජනප්‍රිය වෙබ් අඩවියට හිමි සම්මානය සහ හොඳම වෙබ් අඩවිය සඳහා වන ලෝකඩ සම්මානය මෑතකදී දිනා ගන්නා ලදී. 2024 අගෝස්තු 14 වන දින LK Domain Registry ආයතනය විසින් පවත්වන ලද මෙම උත්සවය, ශ්‍රී ලංකාවේ වෙබ් නිර්මාණකරණයේ විශිෂ්ටත්වය ඇගයීමට ලක් කරන ලදී.

- ශ්‍රී ලංකා ස්නායු විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංගමය විසින් සංවිධානය කරන ලද අන්තර්-විශ්වවිද්‍යාලයීය ස්නායු විද්‍යා ප්‍රශ්න විචාරාත්මක තරඟය 2024 අගෝස්තු මස 03 වන දින කොළඹ කෝට්යාඩ් බයි මැරියට් හෝටලයේදී පවත්වන ලදී. එහිදී 27 වන කණ්ඩායමට අයත් දිනුල් දොළුවීර, ලම්හෝදරන් යෝහානාදන්, රශ්මි මුණසිංහ, සහ හසිනී ගල්හේන ගෙන් සමන්විත ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයීය කණ්ඩායම, තරඟයේ පළමු අර්ධය පුරා පෙරමුණ ගනිමින්, විශිෂ්ට දක්ෂතා දක්වමින් තරඟයේ අනුශූරතාවය දිනා ගන්නා ලදී.

## ප්‍රජා ව්‍යාපෘති

- පීඨයේ 31 වන කණ්ඩායම විසින් පවත්වන ලද 'දිරිය අරුණ 25' පුණ්‍ය ව්‍යාපෘතිය 2024 ජනවාරි 20 වන දින දෙල්මැල්ල කනිෂ්ඨ විද්‍යාලයේදී සාර්ථකව නිම කරන ලදී.

- පීඨයේ 32 වන කණ්ඩායම විසින් 'දිරිය අරුණ' 26 වන අදියර යටතේ මතුගම, පාලින්ද මහා විද්‍යාලයේ සංගීත කාමරය සහ විද්‍යා විද්‍යාගාරය අලුත්වැඩියා කරන ලදී. මෙසේ අලුත්වැඩියා කරන ලද සංගීත කාමරය, පොදු කාමරය සහ විද්‍යා විද්‍යාගාරය 2024 ඔක්තෝබර් 19 වන දින සිසු අයිතියට පවරා දෙන ලදී.

- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ කලා කවයේ සාමාජිකයින් 2024 ජූලි 13 වන දින මහරගම අපේක්ෂා රෝහලට අනුබද්ධ ශාන්ත සෙවණ සහන සත්කාර මධ්‍යස්ථානයේ රෝගීන් සහ කාර්ය මණ්ඩලය සමඟ සුහදශීලී කාලයක් ගත කරන ලදී.

- 2024 ලේ දන්දීමේ වැඩසටහන 2024 අප්‍රේල් 08 වන දින පවත්වන ලද අතර, ලියාපදිංචි වූ සාමාජිකයින් 87 දෙනෙකුගෙන් රුධිර පයින්ට් 70ක් ලබා ගන්නා ලදී.

## වෙනත් වැඩසටහන්

- කලා කවය විසින් සංවිධානය කරන ලද 'Talents 2024' ප්‍රසංගය 2024 ජූනි 30 වන දින මහරගම ජාතික තරුණ සේවා සභා ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.

- වෛද්‍ය විද්‍යා පීඨයේ 2024 වාර්ෂික පිරිත් සජ්ඣායනාව අගෝස්තු මස 30 වන දින පවත්වන ලද අතර, ඉන් අනතුරුව අගෝස්තු 31 වන දින දානමය පිංකමක් ද පවත්වන ලදී.

- 2024 වර්ෂය සඳහා වන වාර්ෂික පොත් ශිෂ්‍යත්ව වැඩසටහන, වෛද්‍ය පීඨ ශිෂ්‍ය සංගමයේ මගපෙන්වීම යටතේ වෛද්‍ය විද්‍යා පීඨයේ සහ දන්ත වෛද්‍ය විද්‍යා පීඨයේ තෙවන වසර සිසුන් විසින් 2025 අප්‍රේල් 08 වන දින සංවිධානය කරන ලදී.

## 2023 හා 2024 වසර වල ප්‍රතිඵල සැසඳීම

| උපාධි පාඨමාලාව | පළමු පෙළ | | දෙවන පෙළ ඉහළ | | දෙවන පෙළ පහළ | | සාමාන්‍ය සාමාර්ථ | | මුළු සමත් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2023 වසර | 2024 වසර | 2023 වසර | 2024 වසර | 2023 වසර | 2024 වසර | 2023 වසර | 2024 වසර | 2023 වසර | 2024 වසර |
| වෛද්‍යවේදි ශල්‍යවේදි උපාධිය | 8 | 7 | 32 | 26 | 56 | 54 | 56 | 74 | 152 | 161 |
| විද්‍යාවේදි මානව ජීව විද්‍යා (සාමාන්‍ය) උපාධිය | - | 1 | 1 | 3 | - | - | 1 | - | 2 | 4 |
| ඖෂධවේදී ගෞරව උපාධිය | 3 | 2 | 7 | 5 | 5 | 8 | 16 | 12 | 31 | 27 |
| විද්‍යාවේදි හෙද ගෞරව උපාධිය | 0 | 1 | 7 | 7 | 3 | 3 | 16 | 17 | 26 | 28 |
| විද්‍යාවේදි වෛද්‍ය රසායනාගාර විද්‍යා ගෞරව උපාධිය | 0 | 0 | 7 | 6 | 5 | 8 | 10 | 14 | 22 | 28 |
| **මුළු සංඛ්‍යාව** | 11 | 11 | 54 | 47 | 69 | 73 | 99 | 117 | 233 | 248 |

සටහන: **2021** ට පෙර ලියාපදිංචි වී ඇති සම සෞඛ්‍ය සිසුන් සඳහා විභාග වෛද්‍ය විද්‍යා පීඨය විසින් පවත්වනු ලැබේ.

## ශිෂ්‍ය හා සම්පත් විස්තරය 2024

| පාඨමාලාව | ශිෂ්‍ය සංඛ්‍යාව | අධ්‍යයන කාර්යය මණ්ඩලය | | අනධ්‍යයන කාර්යය |
|---|---|---|---|---|
| | | ස්ථිර | කොන්ත්‍රාත් | |
| වෛද්‍යවේදි ශල්‍යවේදි | 1145 | 105 | 65 | 144 |
| විද්‍යාවේදි මානව ජීව විද්‍යා (විශේෂ) උපාධිය | 17 | | | |
| මුළු සංඛ්‍යාව | **1162** | **105** | **65** | **144** |

## දේශිය ශිෂ්‍ය විස්තරය 2024

| පාඨමාලාව | මාධ්‍යය | සිසුන් සංඛ්‍යාව | | | | | උපාධිධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| | | 1 වන වසර | 2 වන වසර | 3 වන වසර | 4 වන වසර | 5 වන වසර | |
| වෛද්‍යවේදී ශල්‍යවේදී | ඉංග්‍රීසි | 200 | 201 | 195 | 158 + 162 | 159 | 152 |
| විද්‍යාවේදී මානව ජීව විද්‍යා (විශේෂ) උපාධිය | | 6 | 4 | 3 | 4 | | 2 |
| මුළු සංඛ්‍යාව | | **206** | **205** | **198** | **324** | **159** | **154** |

## අධ්‍යයන කාර්යය මණ්ඩලය

| අධ්‍යයනාංශය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | සහාය මහාචාර්යය | ජ්‍යෙෂ්ඨ මහාචාර්යය I ශ්‍රේණිය | ජ්‍යෙෂ්ඨ මහාචාර්යය II ශ්‍රේණිය | කථිකාචාර්යය | කථිකාචාර්යය (ආධුනික) | මුළු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යුහ විද්‍යා | 1 | 2 | 0 | 1 | 3 | 1 | | 8 |
| කායික විද්‍යා | 1 | 2 | 0 | | 5 | 0 | 2 | 10 |
| ජෛව රසායන විද්‍යා | 1 | 4 | 0 | 1 | 0 | 1 | 1 | 8 |
| පරපෝෂ විද්‍යා | 1 | 2 | | 0 | 1 | 1 | 1 | 6 |
| ක්ෂුද්‍ර ජීව විද්‍යා | 1 | 3 | 1 | 1 | 1 | 0 | | 7 |
| ව්‍යාධි විද්‍යා | 0 | 4 | 1 | 2 | 2 | 0 | | 9 |
| භිෂග්වේද | 1 | 1 | 0 | 1 | | 1 | 1 | 5 |
| ප්‍රජා වෛද්‍ය | 0 | 3 | 0 | 1 | | | 0 | 4 |
| අධිකරණ වෛද්‍ය විද්‍යා | 1 | 2 | 0 | 2 | 0 | 1 | 0 | 6 |
| වෛද්‍ය විද්‍යා | 1 | 1 | 0 | 2 | 1 | 0 | 0 | 5 |
| ප්‍රසව හා නාරිවේද | 0 | 3 | 0 | 1 | 1 | 0 | 0 | 5 |
| ළමා රෝග විද්‍යා | 0 | 4 | 0 | | 1 | 1 | 0 | 6 |
| ශල්‍ය වෛද්‍ය විද්‍යා | 2 | 3 | 0 | 0 | 2 | 0 | 0 | 7 |
| මනෝ වෛද්‍ය විද්‍යා | 0 | 0 | 0 | 2 | 4 | | 0 | 6 |
| පවුල් වෛද්‍ය විද්‍යා | 0 | 1 | 0 | 0 | | 1 | 1 | 3 |
| වෛද්‍ය අධ්‍යාපන | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| ප්‍රතිශක්තිකරණ හා අණුක වෛද්‍ය විද්‍යා | | 2 | 0 | 1 | 1 | 0 | 1 | 5 |
| වෙනත් මධ්‍යස්ථාන හා | 0 | 0 | 0 | 0 | 1 | 1 | 2 | 4 |
| **මුළු සංඛ්‍යාව** | **10** | **38** | **2** | **15** | **23** | **8** | **9** | **105** |

## අනධ්‍යයන කාර්යය මණ්ඩලය

| පරිපාලන නිලධාරීන් | අධ්‍යයන සහායක නිලධාරීන් | ලිපිකරු, තාක්ෂණික හා ප්‍රාථමික ශ්‍රේණි |
|---|---|---|
| 3 | 3 | 138 |

## පර්යේෂණ නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු - 2024

| ප්‍රකාශන කාණ්ඩය | | | සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|
| | | | දේශියව ප්‍රකාශයට පත් කරන ලද | විදේශියව ප්‍රකාශයට පත් කරන ලද | |
| 1 | තීරක සුවිගත ජර්නල ප්‍රකාශන ගණන | | 6 | 86 | |
| 2 | තීරක නොවන සුවිගත ජර්නල ප්‍රකාශන ගණන | | 31 | 20 | |
| 3 | සම්මන්ත්‍රණ කටයුතු | 3.1 සම්පූර්ණ පත්‍රිකා | 28 | 3 | |
| | | 3.2 සාරාංශ | 176 | 38 | |
| 4 | ප්‍රකාශිත පොත් පරිච්ඡේද ගණන | | 9 | 12 | |
| 5 | ප්‍රකාශිත පොත් පරිච්ඡේද ගණන | 5.1 ප්‍රකාශකයකු විසින් | | | |
| | | 5.2 කතුවරයා විසින් | 9 | | |
| මුළු සංඛ්‍යාව | | | 259 | 159 | |

# පශ්චාද් උපාධි පීඨය



1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 48A වගන්තිය යටතේ, 1996 ජනවාරි මාසයේදී විශ්වවිද්‍යාලය තුළ උපාධි අධ්‍යයන පීඨය ස්ථාපිත කරන ලදී. එම පනතට අනුව, උසස් උපාධි සහ අනෙකුත් ශාස්ත්‍රීය සුදුසුකම් සඳහා මඟ පෙන්වන පාඨමාලා සැපයීම සහ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සඳහා වන ප්‍රධාන පරිපාලන මධ්‍යස්ථානය මෙම පීඨයයි.

'පුළුල් ප්‍රජාවගේ සුබසාධනය සඳහා දේශීය හා ගෝලීය හවුල්කාරීත්වයන් හරහා ඉගැන්වීම, පර්යේෂණ සහ ශාස්ත්‍රීය කටයුතු වල විශිෂ්ටත්වය අත්කර ගනිමින්, නව්‍ය පාඨමාලා සැලසුම් කිරීමෙන් සහ සැපයීමෙන් දැනුමෙන් හා කුසලතාවයෙන් යුත් ඉහළම මට්ටමේ වෘත්තිකයන් බිහි කිරීම' පීඨයේ මෙහෙවර වේ.

උපාධි අධ්‍යයන පීඨය, එහි අධ්‍යයන හා පරිපාලනමය කාර්යයන් සඳහා මඟ පෙන්වන පීඨාධිපතිවරයෙකුගේ අධීක්ෂණය යටතේ පවතී. පීඨයේ පරිපාලන කටයුතු සඳහා ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරයෙකු සිටින අතර, පශ්චාත් උපාධි මට්ටමේ ගාස්තු අය කරන වැඩසටහන්වල මූල්‍ය කටයුතු විධිමත් කිරීම සඳහා නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරයෙකු සහිත මූල්‍ය අංශයක් ද විධිමත් ලෙස ස්ථාපිත කර ඇත.

## පීඨය විසින් පිරිනමනු ලබන අධ්‍යයන වැඩසටහන්

උපාධි අධ්‍යයන පීඨයේ අධ්‍යයන වැඩසටහන්, විශ්වවිද්‍යාලයේ අනෙකුත් පීඨ සහ අධ්‍යයනාංශ සමඟ සමීප සහයෝගයෙන් කටයුතු කරන පහත සඳහන් අධ්‍යයන මණ්ඩල 09 හරහා මෙහෙයවනු ලැබේ.

1. මානව ශාස්ත්‍ර අධ්‍යයන මණ්ඩලය
2. සමාජීය විද්‍යා අධ්‍යයන මණ්ඩලය
3. ජීව විද්‍යා අධ්‍යයන මණ්ඩලය
4. භෞතික විද්‍යා අධ්‍යයන මණ්ඩලය
5. කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ විද්‍යා අධ්‍යයන මණ්ඩලය

6. වෛද්‍ය විද්‍යා අධ්‍යයන මණ්ඩලය
7. බහුවිධ විෂය අධ්‍යයන මණ්ඩලය
8. ඉංජිනේරු විද්‍යා අධ්‍යයන මණ්ඩලය
9. කාර්මික තාක්ෂණ අධ්‍යයන මණ්ඩලය

පීඨය විසින් පිරිනමනු ලබන වැඩසටහන්, මෙරට උසස් අධ්‍යාපනයේ මිණුම් ලකුණ වන ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව සමඟ අනුගත කර ඇත.

උපාධි අධ්‍යයන පීඨය විසින් පිරිනමනු ලබන පාඨමාලා සඳහා වන ශ්‍රී ලංකා සුදුසුකම් රාමු මට්ටම් සහ ලියාපදිංචිය සඳහා වන සුදුසුකම් නිර්ණායකයන් පහත දැක්වෙන පරිදි වේ.

| **SLQF මට්ටම** | **ප්‍රදානය කරන ලද සුදුසුකම්** | **සම්මාන ගණන / කාල සීමාව** | **සුදුසුකම්** |
|---|---|---|---|
| 7 | පශ්චාත් උපාධි සහතිකපත්‍ර | 20 | SLQF 5 හෝ 6 |
| 8 | පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 25 | SLQF 5 හෝ 6 |
| 9 | පාඨමාලා අනුව ශාස්ත්‍රපති උපාධිය (එක් වසරක්) | 30 | SLQF 5 හෝ 6 |
| 10 | පාඨමාලා කටයුතු සහ පර්යේෂණ අනුව ශාස්ත්‍රපති උපාධිය | 60 | SLQF 5 හෝ 6 |
| 11 | පර්යේෂණ මගින් ශාස්ත්‍රපති උපාධිය (MAR) | පූර්ණ කාලීනව වසර 2ක් | SLQF 5 හෝ 6 |
| 11 | දර්ශනපති (M Phil) උපාධිය | පූර්ණ කාලීනව වසර 2ක් | SLQF 6 සහ ඊට වැඩි |
| 12 | දර්ශනශූරී (PhD) උපාධිය | පූර්ණ කාලීනව වසර 3ක් | SLQF 6 සහ ඊට වැඩි |

උපාධි අධ්‍යයන පීඨය මඟින් පිරිනමනු ලබන සියලුම පාඨමාලා, ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවට (SLQF-15) අනුකූල වන පරිදි සම්පාදනය කර ඇත. දැනුම , කුසලතා, ආකල්ප සහ මානසිකත්වය , සහ සුසමාදර්ශය යන ප්‍රධාන ඉගෙනුම් ක්ෂේත්‍ර හතර, K-SAM ආකෘතිය මඟින් සංලක්ෂිත කෙරේ. සියලුම පාඨමාලා, අදාළ අධ්‍යයන වැඩසටහනේ ඉගෙනුම් ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සඳහා සකස් කර තිබේ. මූලික අංශ සහ ඉගෙනුම් ප්‍රතිඵලවල ප්‍රවර්ග පහත දැක්වේ.

| ප්‍රධාන ක්ෂේත්‍ර | ප්‍රතිඵලවල ප්‍රවර්ග |
|---|---|
| දැනුම | විෂය / න්‍යායාත්මක දැනුම |
| | ප්‍රායෝගික දැනුම සහ භාවිතය |
| | සන්නිවේදනය |

| | |
|---|---|
| කුසලතා | කණ්ඩායම් වැඩ සහ නායකත්වය |
| | නිර්මාණශීලීත්වය සහ ගැටළු විසඳීම |
| | කළමනාකරණය සහ ව්‍යවසායකත්වය |
| | තොරතුරු භාවිතය සහ කළමනාකරණය |
| | ජාලකරණය සහ සමාජ කුසලතා |
| | අනුවර්තනය වීමේ හැකියාව සහ නම්‍යශීලීභාවය |
| ජීවිතය පිළිබඳ ආකල්ප, වටිනාකම්, වෘත්තීයභාවය සහ දැක්ම | ආකල්ප, වටිනාකම් සහ වෘත්තීයභාවය |
| | ජීවිතය සඳහා දැක්ම |
| මානසිකත්වය සහ සුසමාදර්ශය | ස්වයං / ජීවිත කාලය පුරාම ඉගෙනීම යාවත්කාලීන කිරීම |

## 2024.12.31 දිනට පශ්චාත් උපාධි ශිෂ්‍යයින් පිළිබඳ තොරතුරු

| අධ්‍යයන වැඩසටහන | එකතුව |
|---|---|
| සහතික පත්‍ර පාඨමාලා | |
| ව්‍යවහාරික සංඛ්‍යානය පිළිබඳ පශ්චාත් උපාධි සහතිකපත්‍ර පාඨමාලාව | 52 |
| | |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | |
| අපරාධ විද්‍යාව සහ අපරාධ යුක්තිය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 58 |
| ව්‍යවහාරික සංඛ්‍යානය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 21 |
| අලෙවි කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 21 |
| අධීක්ෂණ සහ ඇගයීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 13 |
| ව්‍යවහාරික මූල්‍ය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව / විද්‍යාපති උපාධිය | 38 |
| සමාජ සංඛ්‍යාලේඛන පිළිබඳ පශ්චාත් උපාධිය | 10 |
| | |
| පශ්චාත් උපාධි (විද්‍යාපති, ශාස්ත්‍රපති, එම්.බී.ඒ.) | |
| කාර්මික කාබනික රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය | 8 |

| | |
|---|---|
| අපරාධ යුක්තිය සහ විශෝධනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 103 |
| සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 122 |
| ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (වීන බඳවා ගැනීම) | 29 |
| පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය | 230 |
| ධීවර හා ජලජ සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය | 6 |
| ආහාර විද්‍යාව සහ තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය | 70 |
| වන විද්‍යාව සහ පාරිසරික කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය | 46 |
| භූගෝලීය තොරතුරු පද්ධතිය සහ දුරස්ථ සංවේදනය පිළිබඳ විද්‍යාපති උපාධිය | 52 |
| කාර්මික විශ්ලේෂණ රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය | 69 |
| කාර්මික ගණිතය පිළිබඳ විද්‍යාපති උපාධිය | 12 |
| කාර්මික කාබනික රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය | 23 |
| පොලිමර් විද්‍යාව සහ තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය | 57 |
| දත්ත විද්‍යාව සහ කෘතිම බුද්ධිය පිළිබඳ විද්‍යාපති උපාධිය | 137 |
| ව්‍යවහාරික සංඛ්‍යානය පිළිබඳ විද්‍යාපති උපාධිය | 49 |
| ප්‍රතිශක්ති විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය | 7 |
| දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ විද්‍යාපති උපාධිය | 175 |
| ව්‍යවහාරික මූල්‍ය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව / විද්‍යාපති උපාධිය | 78 |
| කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණපති/ විද්‍යාපති උපාධිය | 124 |
| ව්‍යවහාරික මූල්‍ය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව / විද්‍යාපති උපාධිය | 33 |
| | 7 |
| ව්‍යාපාර ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 33 |

| | |
|---|---|
| ව්‍යවසායකත්වය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (MEntr) | 10 |
| දේපළ වෙළඳාම් කළමනාකරණය සහ තක්සේරුකරණය පිළිබඳ / විද්‍යාපති උපාධිය | 38 |
| වෘත්තීය ගිණුම්කරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (MPAcc) | 9 |
| රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 5 |
| MAR/MAQ/MAT පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 04 |
| | |
| | |
| දර්ශනපති උපාධිය ( MPhil) | 344 |
| | |
| | |
| දර්ශනශූරී උපාධිය ( PhD) | 322 |
| | |
| මුලු එකතුව | 2415 |

## උපාධිධාරී නිමැවුම - පශ්චාත් උපාධි වැඩසටහන්

| අධ්‍යයන වැඩසටහනේ නම | උපාධිය | උපාධිධාරීන් ප්‍රමාණය | | |
|---|---|---|---|---|
| | | පිරිමි | කාන්තා | එකතුව |
| **දර්ශනශූරී උපාධිය** | දර්ශනශූරී | 12 | 16 | 28 |
| **දර්ශනපති උපාධිය** | දර්ශනපති | 8 | 18 | 26 |
| **ව්‍යාපාර ආර්ථික විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය** | | 2 | 2 | 4 |
| ආහාර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය | විද්‍යාපති | 2 | 9 | 11 |
| කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය | | 1 | 8 | 9 |
| කාර්මික විශ්ලේෂණ රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය | | 2 | 1 | 3 |
| දත්ත විද්‍යාව සහ කෘත්‍රිම බුද්ධිය පිළිබඳ විද්‍යාපති උපාධිය | | 5 | 8 | 13 |
| දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | | 0 | 11 | 11 |

| | | | | |
|---|---|---|---|---|
| නිශ්චල දේපල කළමනාකරණය සහ තක්සේරුව පිළිබඳ විද්‍යාපති උපාධිය | | 3 | 2 | 5 |
| පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය | | 3 | 4 | 7 |
| පොලිමර් විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය | | 10 | 1 | 11 |
| GIS සහ දුරස්ථ සංවේදනය පිළිබඳ විද්‍යාපති උපාධිය | | 6 | 9 | 15 |
| වන විද්‍යාව සහ පාරිසරික කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය | | 8 | 14 | 22 |
| ව්‍යවහාරික මූල්‍ය පිළිබඳ විද්‍යාපති උපාධිය | | 1 | 2 | 3 |
| ව්‍යවහාරික සංඛ්‍යානය පිළිබඳ විද්‍යාපති උපාධිය | | 3 | 8 | 11 |
| ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය | | 6 | 14 | 20 |
| රාජ්‍ය ප්‍රතිපත්ති කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය | | 2 | 8 | 10 |
| රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | ශාස්ත්‍රපති | 3 | 1 | 4 |
| ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (වීන බඳවා ගැනීම) | | 18 | 16 | 34 |
| ව්‍යවසායකත්වය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | | 10 | 8 | 18 |
| සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | | 39 | 63 | 102 |
| ව්‍යවහාරික සංඛ්‍යාලේඛන පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | | 0 | 3 | 3 |
| දත්ත විද්‍යාව සහ කෘතිම බුද්ධිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | | 0 | 1 | 1 |
| කාර්මික විශ්ලේෂණ රසායන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | ප.උ. ඩිප්ලෝමා | 3 | 2 | 5 |
| දත්ත විද්‍යාව සහ කෘතිම බුද්ධිය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | | 2 | 0 | 2 |
| දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | | 0 | 6 | 6 |
| පොලිමර් විද්‍යාව සහ තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | | 7 | 4 | 11 |
| ව්‍යවසායකත්වය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | | 1 | 0 | 1 |
| ව්‍යවහාරික මූල්‍ය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | | 1 | 1 | 2 |
| ව්‍යවහාරික සංඛ්‍යානය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | | 1 | 2 | 3 |

| | | | | |
|---|---|---|---|---|
| දත්ත විද්‍යාව සහ කෘතිම බුද්ධිය පිළිබඳ පශ්චාත් උපාධි සහතිකපත්‍ර පාඨමාලාව | ප.උ. සහතිකපත්‍ර | 0 | 1 | 1 |
| **එකතුව** | | **159** | **243** | **402** |

## පර්යේශන සහ ප්‍රකාශන

### බහු-විෂයාත්මක ප්‍රවේශයන් පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපාධි අධ්‍යයන පීඨයේ 10 වැනි බහු-විෂයාත්මක ප්‍රවේශයන් පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (iCMA) 2024 පෙබරවාරි 6 වන දින විශ්වවිද්‍යාල පරිශ්‍රයේදී පවත්වන ලදී.

**"බහු-විෂයාත්මක පර්යේෂණ තුළින් ගෝලීය දැනුම කරා"** යන්න තේමාව වූ එම සම්මන්ත්‍රණයේ සමාරම්භක උත්සවය විශ්වවිද්‍යාලයේ සනාතන සභා රැස්වීම් ශාලාවේදී පැවැත්විණි.

මෙම සම්මන්ත්‍රණයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපති, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එම්. එම්. පත්මලාල් මහතා සහභාගී වූ අතර, සමාරම්භක උළෙල කොළඹ විශ්වවිද්‍යාලයේ ජනවිකාස විද්‍යාව පිළිබඳ සම්මානිත මහාචාර්ය ඉන්ද්‍රලාල් ද සිල්වා මහතාගේ ප්‍රධාන දේශනයෙන් ආලෝකවත් විය. 10 වන බහු-විෂයාත්මක ප්‍රවේශයන් පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය 2024 හි සභාපතීත්වය දරනු ලැබුවේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපති, මහාචාර්ය පී. පී. රසිකා පෙරේරා මහත්මිය විසිනි.

10 වන බහු-විෂයාත්මක ප්‍රවේශයන් පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය සඳහා විද්‍යාත්මක සාරාංශ 110ක් ලැබී තිබුණ අතර, ඒවා අධ්‍යයන සමුළු කමිටුව විසින් පරීක්ෂාවට ලක් කරන ලදී. විශේෂඥයින් විසින් එම සාරාංශ ඇගයීමට ලක් කිරීමෙන් අනතුරුව පර්යේෂණ පත්‍රිකා 90ක් ප්‍රකාශයට පත් කිරීම සඳහා තෝරා ගන්නා ලදී. පිළිගත් පත්‍රිකා පහත ලැයිස්තුගත කර ඇති තේමාත්මක අධ්‍යයන මාතෘකා හයට අදාළ වේ.

1. ඉංජිනේරු, තාක්ෂණ සහ භෞතික විද්‍යා
2. පාරිසරික දූෂණය සහ ස්වභාවික සම්පත් කළමනාකරණය
3. සෞඛ්‍ය විද්‍යා සහ පෝෂණය
4. මානව ශාස්ත්‍ර, සමාජ විද්‍යා සහ අධ්‍යාපනය
5. කළමනාකරණය, වාණිජ්‍යය, පාලනය සහ කර්මාන්ත සංවර්ධනය
6. ස්වාභාවික සහ ජීව විද්‍යා

උපාධි අධ්‍යයන පීඨයේ ජර්නලය

## බහු-විෂයාත්මක අධ්‍යයන පිළිබඳ ජාත්‍යන්තර ජර්නලය

බහු-විෂයාත්මක අධ්‍යයන පිළිබඳ ජාත්‍යන්තර ජර්නලය යනු ශ්‍රී ලංකාවේ, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපාධි අධ්‍යයන පීඨය විසින් නිකුත් කරනු ලබන නිල ඉංග්‍රීසි භාෂා ජර්නලය වන අතර, එය බහුවිධ විෂය ක්ෂේත්‍ර නියෝජනය කරමින් මුල් ලිපි සහ සමාලෝචන ලිපි ප්‍රකාශයට පත් කරයි.

බහු-විෂයාත්මක අධ්‍යයන පිළිබඳ ජාත්‍යන්තර ජර්නලය මගින් පර්යේෂකයන්ට ඔවුන්ගේ බහු-විෂයාත්මක පර්යේෂණ සොයාගැනීම් බෙදාහදා ගැනීමට වේදිකාවක් සපයයි. බහු-විෂයාත්මක අධ්‍යයන පිළිබඳ ජාත්‍යන්තර ජර්නලය සම-සමාලෝචනයට භාජනය වන ජර්නලයකි. එය සෑම වසරකම කලාප දෙකකින් සමන්විත වන ද්වි-වාර්ෂික ප්‍රකාශනයකි. එහි 11 වන වෙළුම 2024 දී කලාප දෙකකින් ප්‍රකාශයට පත් කරන ලදී.

## පීඨයේ තත්ත්ව සහතිකකරණ ඒකකය

උපාධි අධ්‍යයන පීඨයේ තත්ත්ව සහතික කිරීමේ ඒකකය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ස්ථාපිත කරන ලද තත්ත්ව සහතික කිරීමේ ක්‍රමවේදයට අනුකූලව ස්ථාපිත කර ඇත. මෙය උපාධි අධ්‍යයන පීඨය විසින් පිරිනමනු ලබන සහ විශ්වවිද්‍යාලයේ අනෙකුත් පීඨ මගින් පවත්වනු ලබන පශ්චාත් උපාධි වැඩසටහන්වල ගුණාත්මකභාවය සහ ප්‍රමිතීන් පවත්වා ගැනීම සඳහා ස්ථාපිත කර ඇත. තත්ත්ව සහතික කිරීමේ ඒකකය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානයේ සාමාජිකයෙකු ලෙස ක්‍රියාත්මක වේ. එහි කාර්යයන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සහ උපාධි අධ්‍යයන පීඨයේ දැක්ම සහ මෙහෙවර මගින් මෙහෙයවනු ලැබේ. තත්ත්ව සහතික කිරීමේ ඒකකයේ මූලික අරමුණ වන්නේ ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF) සහ අදාළ විෂය මිණුම් සලකුණු මගින් සපයනු ලබන මාර්ගෝපදේශවලට අනුකූල වෙමින් ඵලදායී ඉගෙනුම් පරිසරයන් ප්‍රවර්ධනය කිරීම, පවත්වාගෙන යාම, අධීක්ෂණය කිරීම සහ සහතික කිරීමයි.

## තාක්ෂණ පීඨය



2013 දී ශ්‍රී ලංකා රජය විසින් හඳුන්වා දෙනු ලැබූ අ.පො.ස උසස් පෙළ තාක්ෂණවේදය විෂය ධාරාවේ සිසුන් සඳහා, රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ තාක්ෂණ පීඨයක් ස්ථාපිත කළ ප්‍රථම ආයතනය බවට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය පත්විය. යෝජිත තාක්ෂණ විෂය මාලාව සඳහා 2015 සැප්තැම්බර් 23 වන දින සනාතන සභාවේ අනුමැතිය හිමි වූ අතර, අනතුරුව 2015 ඔක්තෝබර් 8 වන දින විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් නිර්දේශ කරන ලදී. ඉන් අනතුරුව, විශේෂීකරණයන් නවයක් ඇතුළත් යෝජිත තාක්ෂණ වැඩසටහන් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2015 නොවැම්බර් 19 වන දින අනුමැතිය ලබා දෙන ලදී.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ හිටපු උපකුලපති මහාචාර්ය සම්පත් අමරතුංග මහතාගේ සහ ඔහුගේ කැපවූ කණ්ඩායම්වල අනුපමේය කැපවීම, දැක්ම සහ නොපසුබස්නා උත්සාහය මත මෙම සන්ධිස්ථානය සැබෑ කර ගැනීමට හැකි විය. ඔවුන්ගේ දායකත්වයේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය විසින් තාක්ෂණ පීඨය පිහිටුවීම නිල වශයෙන් ප්‍රකාශයට පත් කරන ලදී. මෙම ඓතිහාසික තීරණය 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ 2016 ජනවාරි 8 වන දින ප්‍රකාශයට පත් කරන ලද අංක 1948/59 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ලේඛනගත කර ඇත.

තාක්ෂණ පීඨය පිටිපන, ටෙක්නෝ පාර්ක් හි ස්ථිර ස්ථානයකට ගෙන යාමට පෙර මුලින්ම නුගේගොඩ තාවකාලික පරිශ්‍රයක ස්ථාපිත කරන ලදී. සම්පූර්ණයෙන් සංවර්ධනය කරන ලද නව පීඨ පරිශ්‍රය 2020 ජූනි 8 වන දින අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් නිල වශයෙන් විවෘත කරන ලදී.

2024 වර්ෂය තුළ පීඨාධිපති සහ අදාළ අධ්‍යයනාංශවල අංශ ප්‍රධානීන් පහත පරිදි වේ;

පීඨාධිපති **මහාචාර්ය ඒ. එච්. එල්. ආර්. නිල්මිණි මහත්මිය**

| **අධ්‍යයනාංශය** | **අංශ ප්‍රධානී** |
|---|---|
| ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යයනාංශය | මහාචාර්ය එල්. ජයතුංග |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යයනාංශය | ආචාර්ය පී.එල්.එම්. ප්‍රභානි |
| සිවිල් හා පාරිසරික තාක්ෂණ අධ්‍යයනාංශය | ආචාර්ය ඩබ්ලිව්.ජී. සකුරා |
| ද්‍රව්‍ය හා යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනාංශය | ඉංජිනේරු ඩබ්ලිව්. ආර්. ද මෙල් |
| තාක්ෂණවේද විද්‍යා අධ්‍යයනාංශය | ආචාර්ය ජී. ජයකොඩි |

**ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යයනාංශය (BST)** විසින් ජෛව පද්ධති තාක්ෂණවේදී (ගෞරව) (BBST) උපාධි පාඨමාලා පවත්වනු ලබයි. ජෛව පද්ධති තාක්ෂණවේදී ගෞරව උපාධි පාඨමාලාව ශ්‍රී ලංකාවේ ජාතික ජෛව තාක්ෂණ කර්මාන්ත සංගමය (NBIA) විසින් ප්‍රතීතනය කරනු ලැබේ. ජෛව පද්ධති තාක්ෂණවේදී වැඩසටහන මඟින් ආහාර සැකසුම් තාක්ෂණය, කෘෂිකර්ම සහ පාරිසරික තාක්ෂණය, සහ කාර්මික ජෛව පද්ධති තාක්ෂණය යන ප්‍රධාන ක්ෂේත්‍ර තුනක් යටතේ නිපුණතා සහිත උපාධිධාරීන් බිහි කරනු ලැබේ.

**තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යයනාංශය** විසින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී (ගෞරව) උපාධි පාඨමාලාව පවත්වාගෙන යනු ලැබේ. මෙම උපාධි පාඨමාලාව ශ්‍රී ලංකා පරිගණක සංගමය (CSSL) විසින් ප්‍රතීතනය කරනු ලැබේ. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ වැඩසටහන මඟින් මෘදුකාංග තාක්ෂණය, බහුමාධ්‍ය තාක්ෂණය, සහ ජාල තාක්ෂණය යන විශේෂීකරණයන් තුනක් යටතේ නිපුණතා සහිත උපාධිධාරීන් බිහි කෙරේ.

**සිවිල් හා පාරිසරික තාක්ෂණ අධ්‍යයනාංශය** ලෝක මට්ටමේ සිවිල් හා පාරිසරික තාක්ෂණ භාවිතයන් සඳහා අවශ්‍ය දැනුම හා කුසලතා සිසුන්ට ලබා දීම අරමුණුකොට ගෙන 2020 දී ස්ථාපිත කරන ලදී. මෙම අධ්‍යයනාංශය විසින් ඉංජිනේරු තාක්ෂණවේදී (ගෞරව) උපාධි පාඨමාලාව පිරිනමනු ලබයි. ඉංජිනේරු තාක්ෂණවේදී වැඩසටහන මඟින් ඉදිකිරීම් සහ ගොඩනැගිලි සේවා තාක්ෂණය, බලශක්ති සහ පාරිසරික තාක්ෂණය, සහ භූ තාක්ෂණය යන විශේෂීකරණයන් තුනක් යටතේ නිපුණතා සහිත උපාධිධාරීන් බිහි කරනු ඇත. මෙහි විෂය මාලාවන් සිඩ්නි ගිවිසුමට අනුව ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) ඉංජිනේරු තාක්ෂණවේදී උපාධි පාඨමාලා පිළිගැනීමේ අත්පොත මඟින් මෙහෙයවනු ලැබේ.

**ද්‍රව්‍ය හා යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනාංශය** 2020 දී ස්ථාපිත කරන ලදී. මෙම අධ්‍යයනාංශය ඉංජිනේරු තාක්ෂණවේදී (ගෞරව) උපාධි පාඨමාලාව පිරිනමයි. ඉංජිනේරු තාක්ෂණවේදී වැඩසටහන මඟින් යාන්ත්‍ර විද්‍යුත් තාක්ෂණය, මෝටර් රථ තාක්ෂණය, සහ පොලිමර් සැකසුම් තාක්ෂණය යන විශේෂීකරණයන් තුනක් යටතේ නිපුණතා සහිත උපාධිධාරීන් බිහි කරනු ලැබේ. මෙහි විෂය මාලාවන් සිඩ්නි ගිවිසුමට අනුව ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ඉංජිනේරු තාක්ෂණවේදී උපාධි පාඨමාලා පිළිගැනීමේ අත්පොත මගින් මෙහෙයවනු ලැබේ.

**තාක්ෂණවේද විද්‍යා අධ්‍යයනාංශය** උපාධි පාඨමාලා තුනේම පළමු සහ දෙවන අධ්‍යයන වාර සඳහා අදාළ සියලුම වැඩසටහන් පැවැත්වීම කෙරෙහි අවධානය යොමු කරමින් 2020 දී ස්ථාපිත කරන ලදී. අධ්‍යයන කාලයේ පළමු වසර දෙක ප්‍රධාන වශයෙන් රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ ගණිතය යන විෂයයන්ගෙන් මෙන්ම මූලික පරිගණක කුසලතා, ඉංග්‍රීසි සහ කළමනාකරණ විෂයයන්ගෙන් සමන්විත වේ. ප්‍රතීතන අත්පොත්වල මාර්ගෝපදේශ අනුව, සිසුන් ඔවුන්ගේ පළමු වසරේ අධ්‍යයන කාලය තුළ කුඩා ව්‍යාපෘතියක නිරත විය යුතුය. දේශන පැවැත්වීමට අමතරව, පළමු වසරේ සිසුන් සඳහා කුඩා ව්‍යාපෘති පැවැත්වීමේ වගකීම ද තාක්ෂණවේද විද්‍යා අධ්‍යයනාංශය සතු වේ.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ අටවන ශිෂ්‍ය කණ්ඩායම සඳහා වන පිළිගැනීමේ වැඩසටහන 2024 ජූලි 29 වන දින පිටිපන, තාක්ෂණ පීඨයේදී ආරම්භ විය.

## පීඨය විසින් පිරිනමනු ලබන උපාධි සහ ඩිප්ලෝමා

### උපාධි

- ඉංජිනේරු තාක්ෂණවේදී (ගෞරව) උපාධි පාඨමාලාව
- ජෛව පද්ධති තාක්ෂණවේදී (ගෞරව) උපාධි පාඨමාලාව
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී (ගෞරව) උපාධි පාඨමාලාව

### ඩිප්ලෝමා

- පොලිමර් සැකසුම් තාක්ෂණය සහ ක්‍රියාවලි විශ්ලේෂණය පිළිබඳ ඩිප්ලෝමාව
- රූපලාවන්‍ය තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව

පීඨය විසින් ද්‍රව්‍ය හා යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනාංශයෙන් "පොලිමර් සැකසුම් තාක්ෂණය සහ ක්‍රියාවලි විශ්ලේෂණය පිළිබඳ ඩිප්ලෝමාව" සහ ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යයනාංශයෙන් "රූපලාවන්‍ය තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව" වශයෙන් නව ඩිප්ලෝමා පාඨමාලා දෙකක් හඳුන්වා දී ඇත.

## පොලිමර් සැකසුම් තාක්ෂණය සහ ක්‍රියාවලි විශ්ලේෂණය පිළිබඳ ඩිප්ලෝමාව

ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ ද්‍රව්‍ය හා යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනාංශය, සිය පොලිමර් සැකසුම් තාක්ෂණ අධ්‍යයන ක්ෂේත්‍රය හරහා වසරක ඩිප්ලෝමා පාඨමාලාවක් (SLQF 03) පිරිනමයි. මෙම පාඨමාලාව, න්‍යායාත්මක සහ ප්‍රායෝගික සැසි හරහා පොලිමර් සැකසුම් තාක්ෂණයන් සහ උසස් තාක්ෂණික පොලිමර් උපකරණ විශ්ලේෂණය පිළිබඳ මූලික අවබෝධයක් ලබා දීමට සැලසුම් කර ඇත. න්‍යායාත්මක කොටස් මඟින් පොලිමර් තාක්ෂණයේ මූලික දැනුම ආවරණය කරන අතර, රසායනාගාර ප්‍රායෝගික සැසි මඟින් උසස් තාක්ෂණික උපකරණ භාවිතයෙන් පොලිමර් සැකසීම සහ ගුණාංග විශ්ලේෂණය පිළිබඳ සවිස්තරාත්මක අවබෝධයක් ලබා දීම කෙරෙහි අවධානය යොමු කරයි.

"පොලිමර් සැකසුම් තාක්ෂණය සහ ක්‍රියාවලි විශ්ලේෂණය" පාඨමාලාවේ 2022/2023 කණ්ඩායමේ පළමු ශිෂ්‍ය කණ්ඩායම සඳහා සහතික පත්‍ර ප්‍රදානෝත්සවය 2024 සැප්තැම්බර් 29 වන දින සාර්ථකව පවත්වන ලදී.

## රූපලාවන්‍ය තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව

රූපලාවන්‍ය තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (SLQF 03) ආසන්න වශයෙන් පැය 390ක පාඨමාලා (න්‍යායාත්මක ඒකක 26) සහ පැය 90ක ප්‍රායෝගික පන්ති, නිබන්ධන, කර්මාන්තශාලා චාරිකා, කුඩා පර්යේෂණ ව්‍යාපෘති, පුද්ගල සහ කණ්ඩායම් ඉදිරිපත් කිරීම් ආදිය හරහා ශක්තිමත් න්‍යායාත්මක පදනමක් සපයයි. මෙය ශ්‍රී ලාංකික විශ්වවිද්‍යාලයක් විසින් පිරිනමනු ලබන එකම රූපලාවන්‍ය තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව වන අතර එය තාක්ෂණ පීඨයේ කොටසකි.

රූපලාවන්‍ය තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ දෙවන කණ්ඩායමේ අධ්‍යයන කටයුතු 2024 අප්‍රේල් 27 වන දින ආරම්භ විය.



ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨය විසින් සංවිධානය කරන ලද සිව්වන "නවෝත්පාදන සහ නැගී එන තාක්ෂණයන් පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය 2024" (ICIET 2024), **"උසස් තාක්ෂණයන් තුළින් අනාගතයට සූදානම් විසඳුම්"** යන තේමාව යටතේ 2024 නොවැම්බර් 21 සහ 22 යන දිනවලදී

මාර්ගගත ක්‍රමය ඔස්සේ පවත්වන ලදී. එම ICIET 2024 හි කොටසක් ලෙස පූර්ව-සම්මන්ත්‍රණ වැඩමුළු ද සංවිධානය කරන ලදී.

- **"Becoming an Influencer in Your Field"**: යන තේමාව යටතේ මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ ආයතනයේ ආචාර්ය රුචිර එන්. විජේසේන මහතා විසින්, 2024 නොවැම්බර් 20 දින පැවැති වැඩමුළුව.
- **"Photovoltaic OPTIVERTER – A Novel Hybrid MLPE Technology for Residential and Small Commercial Photovoltaic Applications"**: යන තේමාව යටතේ ටැලින් තාක්ෂණ විශ්වවිද්‍යාලයේ මහාචාර්ය දිමිත්‍රි විනිකොව් මහතා විසින්, 2024 නොවැම්බර් 20 දින පැවැති වැඩමුළුව.
- **"Partial Power Energy Processing: A New Toolbox for Efficient DC Microgrids"**: යන තේමාව යටතේ ටැලින් තාක්ෂණ විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂක, මහාචාර්ය ඇන්ඩ්‍රි චබ් මහතා විසින් පවත්වන ලද වැඩමුළුව.
- **"Innovations in Molecular Biology, Gene Editing & Protein Workflows"** යන තේමාව යටතේ ඉන්දියාවේ, චන්දිගාර් සහ බැංගලෝර් හි විද්‍යාගාර සේවා කළමනාකරු, ආචාර්ය අන්කුර් ගෞතම් සහ Merck Life Science (නවදිල්ලි, ඉන්දියාව) හි වාණිජ අලෙවි කළමනාකරු, ආචාර්ය සුමීර් රයිනා විසින්, 2024 නොවැම්බර් 20 දින පැවැති වැඩමුළුව.
- **"Material Valorization Following Circular Economy Principles and Life Cycle Thinking"** යන තේමාව යටතේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය මහේෂි දන්තුරේබණ්ඩාර මහත්මිය විසින්, 2024 නොවැම්බර් 20 දින පැවැති වැඩමුළුව.
- **"Current Status and the Future of Battery Thermal Management in EVs"** යන තේමාව යටතේ සරේ විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු දෙලිකා එම්. වේරගොඩ මහත්මිය විසින් පවත්වන ලද වැඩමුළුව.
- **"Managing Your EV"**: යන තේමාව යටතේ Nokia ශ්‍රී ලංකා සහ මාලදිවයින් හි හිටපු මෙහෙයුම් කළමනාකරු, ඉංජිනේරු ජානක විමලධර්ම මහතා විසින් පවත්වන ලද වැඩමුළුව.
- **"Prompt Engineering: Unlocking the Power of AI Communication"**: යන තේමාව යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ), හිරාන් විජේසිංහ මහතා විසින් පවත්වන ලද වැඩමුළුව.
- **"Wearable Biosystems for Healthcare: Enhancing Human Performance through Integrated Technologies"**: යන තේමාව යටතේ මාස් හොල්ඩින්ග්

Softmatter අංශයේ උපායමාර්ගික මෙහෙයුම් සහ තාක්ෂණ ප්‍රධානී, ආචාර්ය ඇන්ජලෝ කරුණාරත්න මහතා විසින් පවත්වන ලද වැඩමුළුව.

- **"Exploring the True Potential of Underutilized Bioresources of Sri Lanka"**: යන තේමාව යටතේ ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ මහාචාර්ය සිරිමල් ප්‍රේමකුමාර සහ වයඹ විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ප්‍රසන්න පී. ගුණතිලක යන මහත්වරුන් විසින් පවත්වන ලද වැඩමුළුව.
- **"Abstract Writing Workshop"**: යන තේමාව යටතේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ ආචාර්ය අසංක සංජීව සහ ආචාර්ය ධනුෂ්ක උදයංග යන මහත්වරුන් විසින් පවත්වන ලද වැඩමුළුව.

**කාර්ය මණ්ඩල පර්යේෂණ**

1. මහාචාර්ය ලසන්ති ජයතුංග සහ ආචාර්ය ධනුෂිකා මානතුංග යන මහත්මීන්ට ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව (SLCARP) වෙතින් "Characterization of encapsulated rice bran peptide and development of rice bran incorporated new food product using traditional and improved rice varieties in Sri Lanka" යන පර්යේෂණය සිදුකිරීම සඳහා පර්යේෂණ ප්‍රදානයක් හිමිවිය.
2. ආචාර්ය කේ. කේ. ඒ. සංජීව මහතා, වඩාත්ම උපුටා දැක්වීමට ලක්වූ පර්යේෂණ ඉදිරිපත් කළ පර්යේෂකයින් අතර ඉහළම 2% තුළ සිටින පර්යේෂකයෙකු ලෙස (Elsevier BV සහ ස්ටැන්ෆර්ඩ් විශ්වවිද්‍යාල විසින් පිළිගත්) තෙවන වරටත් සම්මානයට පාත්‍ර විය.
3. ආචාර්ය ධනුෂිකා මානතුංග මහත්මිය ශ්‍රී ලංකා ජීව විද්‍යා ආයතනයෙන් (IOBSL) පිරිනමන තරුණ විද්‍යාඥ සම්මානය ලබා ගත්තාය.
4. ආචාර්ය එච්. කේ. බී. එස්. චාමර මහතා, ජාත්‍යන්තර සහල් පර්යේෂණ ආයතනය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය අතර විද්‍යාත්මක පර්යේෂණ සඳහා වන ප්‍රදාන ගිවිසුමකට අත්සන් තැබීය.

## ජර්නල

**Advances in Technology (Adv. Technol.)** යනු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨය විසින් 2021 දී ආරම්භ කරන ලද, සැමට ප්‍රවේශ විය හැකි සම-සමාලෝචනයට ලක්වූ පර්යේෂණ

ජර්නලයකි. මෙම ජර්නලය ව්‍යවහාරික විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව සහ අධ්‍යාපනය වැනි ක්ෂේත්‍රවල තාක්ෂණයේ භාවිතය සහ දැනුම සම්බන්ධ න්‍යායාත්මක සහ පර්යේෂණාත්මක අධ්‍යයන කෙරෙහි අවධානය යොමු කරයි. එහි ISSN අංකය 2773-7098 වේ. ඇඩ්වාන්ස් ඉන් ටෙක්නොලොජි ජර්නලය වාර්ෂිකව අවම වශයෙන් කලාප තුනක් ප්‍රකාශයට පත් කරනු ලබන අතර, මූලික පර්යේෂණවල සිට ව්‍යවහාරික පර්යේෂණ දක්වා තාක්ෂණික පර්යේෂණවල වැදගත්කම ඉස්මතු කරන ලිපි ඒවාට ඇතුළත් වේ.

## අධ්‍යාපනය සහ රැකියා නිපුණතා සංවර්ධනය

- කාර්මික ජෛව පද්ධති තාක්ෂණය (IBST) පාඨමාලාවේ තෙවන සහ සිව්වන වසරේ සිසුන් විසින් සංවිධානය කරන ලද NANOVA 24 – නැනෝ දින ප්‍රදර්ශනය 2024 මාර්තු 15 වන දින පීඨ පරිශ්‍රයේදී සාර්ථකව පවත්වන ලදී.
- ද්‍රව්‍ය හා යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනාංශයේ යාන්ත්‍ර විද්‍යුත් තාක්ෂණ ශිෂ්‍ය සංගමය විසින් සංවිධානය කරන ලද Electro Combat Robot Battle 2024, වැඩසටහන 2024 අගෝස්තු 3 වන දින සාර්ථකව පවත්වන ලදී.
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යයනාංශය "The Cybersphere 24" සයිබර් ආරක්ෂණ දැනුවත් කිරීමේ දින වැඩසටහන සාර්ථකව පවත්වන ලදී.
- 2024 අගෝස්තු මාසයේදී පීඨයේ ආදි ශිෂ්‍ය සංගමය ස්ථාපිත කරන ලදී.

## 2023 හා 2024 වසර වල ප්‍රතිඵල සැසඳීම

| උපාධි පාඨමාලාව | පළමු පෙළ | | දෙවන පෙළ ඉහළ | | දෙවන පෙළ පහළ | | සමත් | | මුළු සමත් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2023 | 2024 | 2023 | 2024 | 2023 | 2024 | 2023 | 2024 | 2023 | 2024 |
| ජෛව පද්ධති තාක්ෂණ උපාධිය | 4 | 9 | 27 | 33 | 25 | 21 | 22 | 18 | 78 | 81 |
| සිවිල් හා ඉංජිනේරු තාක්ෂණ උපාධිය | 4 | 15 | 39 | 57 | 51 | 37 | 45 | 20 | 139 | 129 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපාධිය | 5 | 5 | 18 | 21 | 12 | 24 | 27 | 22 | 62 | 72 |
| **මුළු සංඛ්‍යාව** | **13** | **29** | **84** | **111** | **88** | **82** | **94** | **60** | **279** | **282** |

## ශිෂ්‍ය සම්පත් විස්තරය 2024

| අධ්‍යයනාංශය | මුළු සිසුන් | අධ්‍යයන කාර්යය මණ්ඩලය | | අනධ්‍යයන කාර්යය මණ්ඩලය |
|---|---|---|---|---|
| | | ස්ථිර | කොන්ත්‍රාත් | |
| ජෛව පද්ධති තාක්ෂණ දෙපාර්තමේන්තුව | 385 | 19 | 61 | 62 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දෙපාර්තමේන්තුව | 428 | 8 | | |
| සිවිල් හා පරිසර තාක්ෂණ දෙපාර්තමේන්තුව | 260 | 14 | | |
| ද්‍රව්‍ය හා යාන්ත්‍රික තාක්ෂණ දෙපාර්තමේන්තුව | 260 | 14 | | |
| තාක්ෂණ විද්‍යාව සඳහා විද්‍යා දෙපාර්තමේන්තුව | 473 | 5 | | |
| පීඨ කාර්යාලය | - | | | |
| **එකතුව** | **1806** | **60** | **61** | **62** |

## අධ්‍යයන කාර්යය මණ්ඩලය

| අධ්‍යයනාංශය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II | ආධුනික කථිකාචාර්ය | මුළු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යනාංශය | - | 3 | - | 17 | | 20 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යනාංශය | - | - | | 5 | 3 | 8 |
| සිවිල් හා ඉංජිනේරු තාක්ෂණ අධ්‍යයනාංශය | - | | 2 | 8 | 4 | 14 |
| ද්‍රව්‍ය හා යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනාංශය | - | 1 | 1 | 9 | 3 | 14 |
| තාක්ෂණ විද්‍යා අධ්‍යයනාංශය | - | - | 1 | 3 | 1 | 5 |
| **මුළු සංඛ්‍යාව** | **0** | **4** | **4** | **42** | **11** | **61** |

## පර්යේෂණ නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු - 2024

| | ප්‍රකාශන කාණ්ඩය | | සංඛ්‍යාව | | වෙනත් |
|---|---|---|---|---|---|
| | | | දේශියව ප්‍රකාශයට පත් කරන ලද | විදේශියව ප්‍රකාශයට පත් කරන ලද | |
| 1 | තීරක සුවිගත ජර්නල ප්‍රකාශන ගණන | | | 25 | |
| 2 | තීරක නොවන සුවිගත ජර්නල ප්‍රකාශන ගණන | | 3 | 4 | |
| 3 | සම්මන්ත්‍රණ කටයුතු | 3.1 සම්පූර්ණ පත්‍රිකා | 3 | 8 | |
| | | 3.2 සාරාංශ | 32 | 19 | |
| 4 | ප්‍රකාශිත පොත් පරිච්ඡේද ගණන | | 5 | 6 | |
| 5 | ප්‍රකාශිත පොත්/පෙළ පොත් ගණන | 5.1 ප්‍රකාශකයා විසින් | 3 | 2 | |
| | | 5.2 කතුවරයා විසින් | | | |
| | මුළු සංඛ්‍යාව | | 46 | 64 | |

# ඉන්ජිනේරු පීඨය




ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවතින රාජ්‍ය විශ්වවිද්‍යාලය සතු නවතම ඉංජිනේරු පීඨය වේ. 2016 ජනවාරි මස පිහිටුවන ලද, එය ඉංජිනේරු විද්‍යාව පිළිබඳ අධ්‍යයන වැඩසටහන් පිරිනැමීමේ වරමක් සහිත අධ්‍යයන දෙපාර්තමේන්තු පහකින් සමන්විත වන අතර එමඟින් "ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධිය " ප්‍රදානය කෙරේ.

මෙම ඉංජිනේරු පීඨය පහත සඳහන් පරිදි අධ්‍යයන දෙපාර්තමේන්තු පහකින් සමන්විත වේ

| | |
|---|---|
| **පීඨාධිපති** | **අචාර්යය එම්.එන්.ධර්මවීර** |

| **අධ්‍යයනාංශ** | **අධ්‍යයනාංශ ප්‍රධාන** |
|---|---|
| 1. සිවිල් ඉන්ජිනේරු අධ්‍යනාංශය | ආචාර්යය ජී.එන් සමරසේකර මහත්මිය |
| 2. පරිගණක ඉන්ජිනේරු අධ්‍යනාංශය | අචාර්යය යූ.කේ. විජේනායක |
| 3. විදුලි හා විද්‍යුත් ඉන්ජිනේරු අධ්‍යනාංශය | ආචාර්ය යූ.එල්. විජේවර්ධන |
| 4. යාන්ත්‍රික ඉන්ජිනේරු අධ්‍යනාංශය | ආචාර්යය එච්.එම්.ඩී.ඩී.වයි.මුදුන්කොටුව |
| 5. විෂයාන්තර අධ්‍යයන අධ්‍යනාංශය | ආචාර්යය ඒ.එච්.ටී.එස්. කුලරත්න |

## පීඨය මඟින් ප්‍රදානය කරනු ලබන උපාධි

**උපාධි**

1. විද්‍යාවේදි ගෞරව ඉන්ජිනේරු උපාධිය

ඉංජිනේරු පීඨය සිසුන් සඳහා හොඳම ඉගෙනුම් අත්දැකීමක් ලබා දීම සඳහා යටිතල පහසුකම්, සුදුසුකම් ලත් අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය නවීන විද්‍යාගර උපකරණ එක් කර ගැනීම අතින් අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කර ඇත. ආසියානු සංවර්ධන බැංකුවේ සහාය ඇතිව ශක්තිමත් පදනමක් ස්ථාපිත කිරීමේ ප්‍රවේශයක් දැනටමත් ආරම්භ කර ඇති පීඨයේ නවීන පහසුකම්වලින් සමන්විත නව පීඨ සංකීර්ණයේ වැඩ කටයුතු 2025 වන විට සම්පූර්ණ කිරීමට නියමිතය. මෙම සංවර්ධනය සිසුන්ගේ අධ්‍යාපනික අත්දැකීම බෙහෙවින් වැඩිදියුණු කරනු ඇත. ඒ අනුව, කොට්ටාව, මත්තේගොඩ පිහිටි නව පීඨ ගොඩනැගිල්ලේ ශිෂ්‍ය ප්‍රවේශය 170 සිට 400 දක්වා වැඩි කිරීමට විශ්වවිද්‍යාලය සැලසුම් කර ඇත.

2024 උපාධි ප්‍රදානෝත්සවයේදී, ඉංජිනේරු පීඨයෙන් සිසුන් 111 දෙනෙකුට උපාධි පිරිනැමූ අතර, ඊට පළමු පන්තියේ ගෞරව සාමාර්ථ ලාභීන් 15 දෙනෙකු, දෙවන පන්තියේ (ඉහළ) ගෞරව සාමාර්ථ ලාභීන් 59 දෙනෙකු, දෙවන පන්තියේ (පහළ) ගෞරව සාමාර්ථ ලාභීන් 30 දෙනෙකු සහ සාමාන්‍ය සාමාර්ථ ලාභීන් 7 දෙනෙකු ඇතුළත් විය. මීට අමතරව, සිවිල් ඉංජිනේරු, විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු, පරිගණක ඉංජිනේරු සහ අන්තර් විෂය අධ්‍යයන යන එක් එක් විශේෂිත ක්ෂේත්‍රවල විශිෂ්ටත්වය සඳහා රන් පදක්කම් හතරක් සහ සමස්ත පීඨ රන් පදක්කමක් ද පිරිනමන ලදී.

## 2023 හා 2024 වසර වල ප්‍රතිඵල සැසඳීම

| උපාධි පාඨමාලාව | පළමු පෙළ | | දෙවන පෙළ ඉහළ | | දෙවන පෙළ පහළ | | සමත් | | මුළු සමත් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | **2023** | **2024** | **2023** | **2024** | **2023** | **2024** | **2023** | **2024** | **2023** | **2024** |
| විද්‍යාවේදී ගෞරව ඉන්ජිනේරු උපාධිය | 12 | 15 | 48 | 59 | 40 | 30 | 8 | 7 | 108 | 111 |

## ශිෂ්‍ය සම්පත් විස්තරය

| උපාධි පාඨමාලාව | මුළු සිසුන් සංඛ්‍යාව | අධ්‍යයන කාර්යය මණ්ඩලය | | අනධ්‍යයන කාර්යය මණ්ඩලය |
|---|---|---|---|---|
| | | ස්ථිර | කොන්ත්‍රාත් | |
| විද්‍යාවේදී ගෞරව ඉන්ජිනේරු උපාධිය | 646 | 20 | 42 | 43 |

## දේශිය සිසුන් පිළිබඳ විස්තරය

| උපාධි පාඨමාලාව | මාධ්‍යය | ශිෂ්‍ය ලියාපදිංචිය | | | | | ශිෂ්‍ය ලියාපදිංචිය |
|---|---|---|---|---|---|---|---|
| | | 1st | 2nd | 3rd | 4th | මුළු ගණන | |
| විද්‍යාවේදි ගෞරව ඉන්ජිනේරු උපාධිය | ඉංග්‍රීසි | 169 | 159 | 151 | 167 | 646 | 111 |
| **මුළු සංඛ්‍යාව** | | **169** | **159** | **151** | **167** | **646** | **111** |

## අධ්‍යයන කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තරය

| අධ්‍යයනාංශය | මහාචාර්යය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය I වන ශ්‍රේණිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය II වන ශ්‍රේණිය | කථිකාචාර්යය / කථිකාචාර්යය | මුළු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| සිවිල් ඉන්ජිනේරු | 1 | 1 | 4 | - | 6 |
| පරිගණක ඉන්ජිනේරු | - | 1 | 3 | - | 4 |
| විදුලි හා විද්‍යුත් ඉන්ජිනේරු | - | 1 | 3 | 1 | 5 |
| යාන්ත්‍රික ඉන්ජිනේරු | - | - | 3 | - | 3 |
| අන්තර් විෂය අධ්‍යයන | - | - | 2 | - | 2 |
| **මුළු සංඛ්‍යාව** | 1 | 3 | 15 | 1 | 20 |

## පර්යේෂණ නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ විස්තර - 2024

| | **ප්‍රකාශන කාණ්ඩය** | | සංඛ්‍යාව | | වෙනත් |
|---|---|---|---|---|---|
| | | | දේශියව ප්‍රකාශයට පත් කරන ලද | විදේශියව ප්‍රකාශයට පත් කරන ලද | |
| 1 | තීරක සුවිගත ජර්නල ප්‍රකාශන ගණන | | 2 | 18 | |
| 2 | තීරක නොවන සුවිගත ජර්නල ප්‍රකාශන ගණන | | 6 | 4 | |
| 3 | සම්මන්ත්‍රණ කටයුතු | 3.1 සම්පූර්ණ පත්‍රිකා | 24 | 20 | |
| | | 3.2 සාරාංශ | 19 | | |
| 4 | ප්‍රකාශිත පොත් පරිච්ඡේද ගණන | | | | |
| 5 | ප්‍රකාශිත පොත්/පෙළ පොත් ගණන | 5.1 ප්‍රකාශකයකු විසින් | | 1 | |
| | | 5.2 කතුවරයකු විසින් | | 1 | |
| | **මුළු සංඛ්‍යාව** | | 51 | 44 | |



ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨය වර්ෂ 2019 දී ආරම්භ කරන ලද්දේ ජාතික සහ ජාත්‍යන්තර සෞඛ්‍ය සේවා සැපයුම් පද්ධතියේ, සම සෞඛ්‍ය සේවා වෘත්තිකයින් සඳහා වැඩිවෙමින් පවතින ඉල්ලුම සපුරාලීමට සහ සම සෞඛ්‍ය විද්‍යා අධ්‍යාපනය පුළුල් කිරීමේ අරමුණිනි. සම සෞඛ්‍ය විද්‍යා පීඨය යටතේ හෙද විද්‍යා හා සූතිකා අධ්‍යනාංශය, ඖෂධවේදී හා ඖෂධ විද්‍යා අධ්‍යනාංශය, වෛද්‍ය රසායනාගාර විද්‍යා අධ්‍යනාංශ, මූලික විද්‍යා අධ්‍යනාංශය සහ දෘෂ්ටිමිතික අධ්‍යනාංශය ලෙස අධ්‍යනාංශ 05ක් පවත්වාගෙන යනු ලබන අතර එහි අලුතින්ම ආරම්භ වූ අධ්‍යනාංශය දෘෂ්ටිමිතික අධ්‍යනාංශයයි. දැනට සම සෞඛ්‍ය විද්‍යා පීඨය විසින් අදාළ ක්ෂේත්‍ර සහ වෘත්තීය සංවිධාන විසින් සම්මත කර ඇති ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව, විද්‍යාවේදී හෙද (ගෞරව) උපාධිය, ඖෂධවේදී (ගෞරව) උපාධිය, විද්‍යාවේදී වෛද්‍ය රසායනාගාර විද්‍යා (ගෞරව) උපාධිය සහ විද්‍යාවේදී දෘෂ්ටිමිතිය (ගෞරව) උපාධිය ලෙස වසර හතරක කාලයක් තුල පැවැත්වෙන ගෞරව උපාධි 04ක් පිරිනමනු ලබයි.

| | |
|---|---|
| **පීඨාධිපති** | **මහාචාර්යය ඩී.අයි.උළුවඩුගේ** |
| **නියෝජ්‍ය ලේඛකාධිකාරී** | **එන්.ටී. කුරුප්පුආරච්චි මහතා** |
| **ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී** | **කේ.එම්.ජේ.නන්දන මහතමයා** |

සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ වත්මන් අධ්‍යනාංශ සහ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් පහත පරිදි වේ.

| **අධ්‍යනාංශය** | **අධ්‍යනාංශ ප්‍රධාන** |
|---|---|
| හෙද විද්‍යා හා සූතිකා අධ්‍යනාංශය | අචාර්යය එම්.ආර්.එස්.ජයතිලක |
| ඖෂධවේදී හා ඖෂධ විද්‍යා අධ්‍යනාංශය | මහාචාර්යය එන්. ආර්.සමරනායක |
| වෛද්‍ය රසායනාගාර විද්‍යා අධ්‍යනාංශය | මහාචාර්යය ඒ.එම්.බී. ප්‍රියදර්ශනි |
| මූලික විද්‍යා අධ්‍යනාංශය | ආචාර්යය එම්.එන්. පහළගෙදර |
| දෘෂ්ටිමිතික අධ්‍යනාංශය | අචාර්යය එච්.එම්.ඩී.ආර් හේරත් |

## පීඨය මගින් පිරිනමනු ලබන උපාධි පාඨමාලා

1. විද්‍යාවේදී හෙද (ගෞරව) උපාධිය
2. ඖෂධවේදී (ගෞරව) උපාධිය
3. විද්‍යාවේදී වෛද්‍ය රසායනාගාර විද්‍යා (ගෞරව) උපාධිය
4. විද්‍යාවේදී දෘෂ්ටිමිතිය (ගෞරව) උපාධිය

## පර්යේෂණ හා ප්‍රකාශන

**සෞඛ්‍ය විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව - 2024**

සම සෞඛ්‍ය විද්‍යා පීඨය විසින් සංවිධානය කරන ලද සෞඛ්‍ය විද්‍යා ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව (IRCHS 2024) "තිරසාර සෞඛ්‍ය සමානාත්මතාවය සමඟ සෞඛ්‍ය සේවා නවෝත්පාදන සඳහා ඩිජිටල් සෞඛ්‍යයේ ප්‍රවණතා ගවේෂණය කිරීම" යන තේමාව යටතේ දෙමුහුන් ක්‍රමවේදය යටතේ අඛණ්ඩව සිව්වන වරටත් 2024 මාර්තු 29 වන දින පැවැත්විණි. IRCHS 2024, අධ්‍යයන කටයුතු, උපාධි අපේක්ෂකයින්, පශ්චාත් උපාධි අපේක්ෂකයින් සහ වෘත්තිකයන් සඳහා ඔවුන්ගේ පර්යේෂණ ප්‍රදර්ශනය කිරීමට සහ ඔවුන්ගේ දැනුම බෙදා ගැනීමට ගෝලීය වේදිකාවක් විය. ඊට අමතරව, එය විවිධ ක්ෂේත්‍රයන්හි පරියේෂකයන්ගෙන් යුතු ප්‍රජාවන් එක් කළ අතර, අන්තර් විෂය සහයෝගීතාවය ඇති කර ගැනීමට ද ඉවහල් විය. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ ඖෂධවේදී හා ඖෂධ විද්‍යා අධ්‍යයනාංශයේ ඖෂධවේදී හා ඖෂධ විද්‍යාව පිළිබද මහාචාර්ය නිතුෂි සමරනායක මහත්මිය විසින් ආරම්භක දේශනය පවත්වන ලදී. ප්‍රධාන දේශනය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ හෙද විද්‍යා සහ සූතිකා අධ්‍යයනාංශයේ හෙද විද්‍යා සහ සූතිකා පිළිබඳ මහාචාර්ය ඒ.ඒ.ටී.ඩී. අමරසේකර මහත්මිය විසින් පවත්වන ලදී. ඔවුන්ගේ විශේෂඥතාව සහ තීක්ෂණ අවබෝධය අපගේ වැඩසටහන සැලකිය යුතු ලෙස ඉහළ නැංවූ අතර, නව පර්යේෂණ දිශාවන් කෙරෙහි නැවුම් නැඹුරුවක් ඇති කිරීමේ සමත් විය.

IRCHS 2024 සඳහා හෙද විද්‍යා සහ සූතිකා විද්‍යා අධ්‍යයනාංශය, ඖෂධවේදී හා ඖෂධ විද්‍යා අධ්‍යයනාංශය සහ වෛද්‍ය රසායනාගාර විද්‍යා අධ්‍යයනාංශය විසින් සංවිධානය කර සාර්ථකව නිම කරන ලද පූර්ව සම්මන්ත්‍රණ වැඩමුළු මාලාවක් ද ඇතුළත් විය. පර්යේෂණ සමුළුවේදී හෙද, රසායනාගාර විද්‍යාවන් සහ පිළිකා විද්‍යාව පිළිබඳ විශේෂඥ ජාත්‍යන්තර කථිකයන් තිදෙනෙකු විසින් මෙහෙයවන ලද "තිරසාර සෞඛ්‍ය සමානාත්මතාවය සමඟ සෞඛ්‍ය සේවා නවෝත්පාදන සඳහා ඩිජිටල් සෞඛ්‍යයේ ප්‍රවණතා" යන මාතෘකාව යටතේ සම්මන්ත්‍රණයක් ද ඇතුළත් විය. සෞඛ්‍ය විද්‍යාව පිළිබඳ තරුණ නවෝත්පාදක සම්මානය අපගේ පීඨය විසින් අඛණ්ඩව සිව්වන වරටත් සංවිධානය කරන ලද අතර, එහිදී 2024 සෞඛ්‍ය විද්‍යාවන්හි හොඳම තරුණ නවෝත්පාදකයා සහ 1 වන සහ 2 වන අනුශූරතා සම්මාන විශේෂඥ සමාලෝචකයින් 11 දෙනෙකුගෙන් යුත් මණ්ඩලයක් හරහා තෝරා ගන්නා ලදී. IRCHS 2024 සඳහා සෞඛ්‍ය විද්‍යාවන්හි විවිධ ක්ෂේත්‍රවලට අදාළ සාරාංශ පත්‍රිකා 130 කට වඩා ලැබුණු අතර, ඉන් 106 ක් දැඩි සමාලෝචන ක්‍රියාවලියකින් පසුව පිළිගනු ලැබීය. 'ස්වාභාවික නිෂ්පාදන පිළිබඳ පර්යේෂණ', 'ඖෂධ ආරක්ෂාව සහ මහජන සෞඛ්‍යය', 'රසායනාගාර රෝග විනිශ්චයේ වත්මන් ප්‍රවණතා', 'හෙද කළමනාකරණය සහ සෞඛ්‍ය ප්‍රවර්ධනය', 'නව සූත්‍රගත කිරීම' සහ 'ප්‍රජනක, මාතෘ හා ළමා සෞඛ්‍යය' යන තේමාවන් යටතේ අදාළ සාරාංශයන් ඉදිරිපත් කරන ලදී.

**සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ නිල පර්යේෂණ සඟරාව**

සෞඛ්‍ය විද්‍යා හා නවෝත්පාදන පර්යේෂණ සඟරාවේ 5 වන වෙළුමේ 1 සහ 2 කලාප 2024 වසරේදී ප්‍රකාශයට පත් කරන ලදී.

## ශිෂ්‍ය හා සම්පත් විස්තරය 2024

| අධ්‍යයනාංශය | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | අධ්‍යයන කාර්යය මණ්ඩලය) | | අනධ්‍යයන කාර්යය මණ්ඩලය) |
|---|---|---|---|---|
| | | ස්ථිර | තාවකාලික | |
| හෙද විද්‍යා හා සූතිකා අධ්‍යනාංශය | 160 | 13 | | |
| ඖෂධවේදී අධ්‍යයනාංශය | 169 | 12 | | |
| වෛද්‍ය රසායනාගාර විද්‍යා අධ්‍යයනාංශය | 161 | 6 | 18 | 37 |
| මූලික විද්‍යා | 196 | 5 | | |
| දෘෂ්ටිමිති අධ්‍යයනාංශය | 110 | 2 | | |
| පීඨ කාර්යයාලය | - | - | - | |
| **මුළු සංඛ්‍යාව** | **796** | **38** | **18** | **37** |

## දේශිය සිසුන් පිළිබඳ විස්තරය

| පාඨමාලාව | මාධ්‍යය | උපාධිධාරීන් සංඛ්‍යාව | | | | | උපාධිධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| | | පළමු වසර | දෙවන වසර | තෙවන වසර | සිව් වන වසර | මුළු සංඛ්‍යාව | |
| විද්‍යාවේදී හෙද විද්‍යා හා සූතිකා | ඉංග්‍රීසි | 53 | 62 | 53 | 45 | 213 | 28 |
| ඖෂධවේදී | | 45 | 57 | 61 | 51 | 214 | 22 |
| විද්‍යාවේදී වෛද්‍ය රසායනාගාර විද්‍යා | | 53 | 57 | 56 | 48 | 214 | 28 |
| විද්‍යාවේදී (ගෞරව) දෘෂ්ටිමිති | | 45 | 55 | 55 | | 155 | - |
| **මුළු සංඛ්‍යාව** | | **196** | **231** | **225** | **144** | **796** | **78** |

## අධ්‍යයන කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තරය 2024

| අධ්‍යයනාංශය | මහාචාර්යය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 වන ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II වන ය | කථිකාචාර්ය ය /කථිකාචාර්ය | මුළු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| හෙද විද්‍යා හා සූතිකා අධ්‍යනාංශය | 2 | 1 | 2 | 8 | 13 |
| ඖෂධවේදී අධ්‍යයනාංශය | 3 | 3 | 1 | 5 | 12 |
| වෛද්‍ය රසායනාගාර විද්‍යා අධ්‍යයනාංශය | 2 | 1 | 2 | 1 | 6 |
| මූලික විද්‍යා | 1 | | 4 | | 5 |
| දෘෂ්ටිමිති අධ්‍යයනාංශය | | | 1 | 1 | 2 |
| **මුළු සංඛ්‍යාව** | 8 | 5 | 10 | 15 | 38 |

## පර්යේෂණ නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු - 2024

| | ප්‍රකාශන කාණ්ඩය | | සංඛ්‍යාව | | වෙනත් |
|---|---|---|---|---|---|
| | | | දේශිය ප්‍රකාශිත | විදේශිය ප්‍රකාශිත | |
| 1 | තීරක සුවිගත ජර්නල ප්‍රකාශන ගණන | | 1 | 25 | |
| 2 | තීරක නොවන සුවිගත ජර්නල ප්‍රකාශන ගණන | | 2 | 1 | |
| 3 | සම්මන්ත්‍රණ කටයුතු | 3.1 සම්පූර්ණ පත්‍රිකා | 2 | 0 | |
| | | 3.2 / සාරාංශ | 42 | 47 | |
| 4 | ප්‍රකාශිත පොත් පරිච්ඡේද ගණන | | - | - | |
| 5 | ප්‍රකාශිත පොත්/පෙළ පොත් ගණන | 5.1 ප්‍රකාශකයකු විසින් | - | - | |
| | | 5.2 කතුවරයා විසින් | - | - | |
| | **මුළු සංඛ්‍යාව** | | 47 | **73** | |

# දන්ත වෛද්‍ය විද්‍යා පීඨය






ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ (USJ) දන්ත වෛද්‍ය විද්‍යා පීඨය (FDS) ශ්‍රී ලංකාවේ දෙවන දන්ත වෛද්‍ය පීඨය ලෙසත් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ හි නවවන පීඨය ලෙසත් 08/12 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ අංක 2257/28 මගින් ස්ථාපිත කරන ලදී. 2021. “අධ්‍යාපනය තුළින් සෞභාග්‍යවත් ජීවිතයක්” යන විශ්වවිද්‍යාල දැක්මට අනුව දන්ත තාක්ෂණිකව දියුණු නොමසුරුව ජනතාවට සේවය කිරීමට පෙළඹෙන දන්ත වෛද්‍ය වෘත්තියේ ඉදිරි පරම්පරාව සඳහා ඉහළම මට්ටමේ දන්ත වෛද්‍ය අධ්‍යාපන වැඩසටහනක් ලබාදීමට පීඨය බලාපොරොත්තු වේ.

පීඨය විසින් පවත්වනු ලබන දන්ත ශල්‍ය වෛද්‍ය උපාධි වැඩසටහන දන්ත වෛද්‍ය අධ්‍යාපනයේ ගෝලීය ප්‍රමිතීන්ට සමගාමීව පස් අවුරුදු වැඩසටහනකි. ඉගෙනුම් සහ ශිෂ්‍ය කේන්ද්‍රීය අත්දැකීම් සඳහා වේදිකාවක් සපයමින් සිසුන්ට ඔවුන්ගේ තනි ඉගෙනුම් ශෛලීන් අනුව විශිෂ්ටත්වය දැක්වීමට පහසුකම් සැලසීම සඳහා සමමුහුර්ත පද්ධතිය පදනම් කරගත් විෂයමාලා බෙදාහැරීම් සහ විෂය පදනම් ඇගයීම් සැලසුම් කර ඇත. පූර්ව සායනික අදියර (BDS I) වෛද්‍ය විද්‍යා පීඨයේ වෛද්‍ය සිසුන් සමඟ එක්ව උගන්වනු ලැබේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ බඳවා ගැනීම් වර්ෂ 2020/21 යටතේ 2022 ජනවාරි මාසයේ පළමු කණ්ඩායම ලෙස දන්ත වෛද්‍ය සිසුන් 32ක් බඳවා ගන්නා ලදී.

පීඨය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් (DGHS) වෛද්‍ය අසේල ගුණවර්ධන මහතා සමඟ සාකච්ඡා කර සිසුන්ගේ සායනික පුහුණුව සඳහා ශ්‍රී ලංකා ජාතික දන්ත රෝහල (NDHSL) සහ දකුණු කොළඹ ශික්ෂණ රෝහල වෙත සිසුන් යැවීමට අනුමැතිය ලබාගෙන ඇත. මෙම රෝහල් දන්ත වෛද්‍ය පීඨයේ ශික්ෂණ රෝහල් ලෙස සලකනු ලැබේ

දන්ත වෛද්‍ය පීඨය අධයයනාංශ 09 කින් සමන්විත වන අතර ඒවා පහතින් දැක්වේ

| | |
|---|---|
| **පීඨාධිපති** | **ජ්‍යෙෂ්ඨ මහචාර්යය එස්.ජී.යසවර්ධන මහත්මිය** |
| **අධ්‍යයනාංශය** | **අධ්‍යයනාංශ ප්‍රධාන** |
| 1. මූලික විද්‍යා අධ්‍යයනාංශය | වෛද්‍ය කේ.එම්.ආර්.එල්.කුලසේකර |
| 2. සමාජ දන්ත සෞඛ්‍ය අධ්‍යයනාංශය | මහාචාර්යය ඒ.ඒ.එච්.කේ. අමරසිංහ |
| 3. පරිපූර්ණ සහ වෘද්ධ දන්ත වෛද්‍ය අධ්‍යයනාංශය | මහාචාර්ය අයි.ඩබ්ලිව්.ඒ.පී.ඩී.පලිපාන (වැඩ බලන) |
| 4. මුඛ සෞඛ්‍ය සහ පරිදන්ත වෛද්‍ය අධ්‍යයනාංශය | වෛද්‍ය. ආර්.එම්.ඒ.එස්. රත්නායක |

(වැඩ බලන)

5. මුඛ ව්‍යාධිවේද අධ්‍යයනාංශය — වෛද්‍ය ආර්.පී.ඒකනායක
6. මුඛ ශල්‍ය වෛද්‍ය අධ්‍යයනාංශය — වෛද්‍ය එස්. ෂන්මුගනාදන්
7. පරිපූරක සායනික විද්‍යා අධ්‍යයනාංශය — වෛද්‍ය ආර්.පී.ඒකනායක (වැඩ බලන)
8. කෘතිම දන්ත වෛද්‍ය අධ්‍යයනාංශය — වෛද්‍ය. ඒ. රාජ්ගනේෂ් (වැඩබලන)
9. දන්ත සංරක්ෂණ අධ්‍යයනාංශය — මහාචාර්ය අයි.ඩබ්ලිව්.ඒ.පී.ඩී.පලිපාන

## පීඨය මඟින් පිරිනමනු ලබන උපාධි

**උපාධි**

1. දන්ත ශෛල්‍ය වෛද්‍ය විද්‍යා

## පර්යේෂණ නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ විස්තර - 2024

| | ප්‍රකාශන කාණ්ඩය | | සංඛ්‍යාව | | වෙනත් |
|---|---|---|---|---|---|
| | | | දේශීයව ප්‍රකාශයට පත් කරන ලද | විදේශීයව ප්‍රකාශයට පත් කරන ලද | |
| 1 | තීරක සුවිගත ජර්නල ප්‍රකාශන ගණන | | | 2 | |
| 2 | තීරක නොවන සුවිගත ජර්නල ප්‍රකාශන ගණන | | 1 | 4 | |
| 3 | සම්මන්ත්‍රණ කටයුතු | 3.1 සම්පූර්ණ පත්‍රිකා | 1 | 1 | |
| | | 3.2 සාරාංශ | 1 | | |
| 4 | ප්‍රකාශිත පොත් පරිච්ඡේද ගණන | | | | |
| 5 | ප්‍රකාශිත පොත්/පෙළ පොත් ගණන | 5.1 ප්‍රකාශකයකු විසින් | | | |
| | | 5.2 කතුවරයා විසින් | | | |
| | **මුළු සංඛ්‍යාව** | | **3** | **7** | |

## නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨය



නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨය (FUAB) යනු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 10 වන පීඨය වන අතර, අතිශයින් අවශ්‍ය ජෛව ආර්ථිකයක් සඳහා ඉදිරියේ ඇති අභියෝගවලට මුහුණ දීම සඳහා නීල හරිත සංකල්පය කෙරෙහි අවධානය යොමු කරමින්,වෘත්තීය සුදුසුකම් ලත් උපාධිධාරීන් සහ පශ්චාත් උපාධි ශ්‍රම බලකායක් බිහි කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත.

පීඨයේ වත්මන් පරිපාලන සංයුතිය පහත පරිදි වේ:

**පීඨාධිපති** — **ජ්‍යෙෂ්ඨ මහාචාර්යය ප්‍රදීප් ජයවීර**

| අධ්‍යයනාංශය | **අධ්‍යයනාංශපති** |
|---|---|
| 1. ජලජ ජෛව සම්පත් අධ්‍යයනාංශය | අචාර්යය එරන්දි පතිරණ |
| 2. නාගරික ජෛව සම්පත් අධ්‍යයනාංශය | අචාර්යය ජේ.ඒ.සුරනි චතුරිකා |
| 3. බහුවිධ අධ්‍යයන අධ්‍යයනාංශය | අචාර්යය ජනිත් කේ වල්පිට |

### පීඨය මඟින් පිරිනමනු ලබන උපාධි

1. ජලජ ජෛව සම්පත් පිළිබඳ විද්‍යාවේදී උපාධිය
2. ජලජ ජෛව සම්පත් පිළිබඳ විද්‍යාවේදී උපාධිය (ගෞරව)
3. නාගරික ජෛව සම්පත් පිළිබඳ විද්‍යාවේදී උපාධිය
4. නාගරික ජෛව සම්පත් පිළිබඳ විද්‍යාවේදී උපාධිය (ගෞරව)

වර්තමානයේ ජලජ ජෛව සම්පත් පිළිබඳ BSc උපාධි වැඩසටහන සහ නාගරික ජෛව සම්පත් පිළිබඳ BSc උපාධි වැඩසටහන යන දෙකම සිසුන් කණ්ඩායම් තුනකට (2020/2021, 2021/2022 සහ 2022/2023 කණ්ඩායම) පහසුකම් සපයයි.

## අධ්‍යයන වැඩසටහන්

බහුවිධ විෂය අධ්‍යයන අංශය විසින් 'සුහුරු ගොවිතැන සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය' (ICT for Smart Farming) නමින් නව විකල්ප පාඨමාලා ඒකකයක් හඳුන්වා දෙනු ලැබූ අතර එමගින් සුහුරු ගොවිතැන් සංකල්ප, ස්මාර්ට් සංවේදනය, අයිතමවල අන්තර්ජාලය (IoT) සහ යන්ත්‍ර අතර සන්නිවේදනය (M2M) වැනි ක්ෂේත්‍ර පිළිබඳව පීඨයේ සිසුන් දැනුවත් කිරීම අරමුණුකොට තිබුණි. මෙම පාඨමාලාව මගින් ස්මාර්ට් ගොවිතැන පිළිබඳ හැඳින්වීමක් සහ ක්ෂුද්‍ර පාලක වැනි අංශ ආවරණය කරයි.

## පර්යේෂණ හා බාහිර ක්‍රියාකාරකම්

ජලජ ජෛව සම්පත් අධ්‍යයන අංශයේ ආචාර්ය එරන්දි පතිරණ විසින් ලෝක විද්‍යා ඇකඩමියෙන් (TWAS) තරඟකාරී පර්යේෂණ ප්‍රදානයක් ලෙස හිමිකරගත් අරමුදල් මගින් ක්‍රියාත්මක වූ Characterizing the microbiome of Crassostrea madrasensis and its estuarine environment for healthy and sustainable oyster farming in Sri Lanka යන පර්යේෂණ ව්‍යාපෘතිය හරහා ඉන්දියානු බෙල්ලන්ගේ (Crassostrea madrasensis) ක්ෂුද්‍රජීවී ගහනය සාර්ථකව ගුනාංගීකරණය කරන ලදී. පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙකු ප්‍රධාන විමර්ශක ලෙස විදේශීය අරමුදල් සපයන ආයතනයකින් ලබාගත් පළමු පර්යේෂණ ප්‍රදානය මෙය විය.

OREL කෝපරේෂන් ආයතනය සමඟ සහයෝගයෙන් යුතුව Evaluation of the growth and quality of Lactuca Sativa (Lettuce) under IoT-based fully automated controlled environmental system යන්න පිළිබඳ පර්යේෂණ අධ්‍යයනයක් පවත්වන ලදී. නාගරික ජෛව සම්පත් අධ්‍යයන අංශයේ ආචාර්ය සුරනි චතුරිකා සහ ආචාර්ය උදාරි රත්නතුංග මෙම උපාධි අපේක්ෂක පර්යේෂණයේ පර්යේෂණ අධීක්ෂකවරුන් ලෙස කටයුතු කළහ.

## ජාත්‍යන්තර සහයෝගිතා

කෘෂිකර්ම විද්‍යාලය සමඟ එකඟතා ගිවිසුමකට අත්සන් තැබීය. මෙයිජි විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම අධ්‍යයන අංශයේ මහාචාර්ය සහ කෘෂිකර්ම විද්‍යාලයේ සහකාර පීඨාධිපති මහාචාර්ය තකාෂි ඉකෙඩා 2023 වසරේ මුලදී පීඨයේ සංචාරයක නිරත වූ අතර, එහිදී ආයතන දෙක අතර සහයෝගීතාවට මුලපුරන ලදී.

ජලජ ජෛව සම්පත් අධ්‍යයන අංශය, ඕස්ට්‍රේලියානු රජය විසින් අරමුදල් සපයනු ලබන KLIE ප්‍රදාන වැඩසටහන යටතේ ශ්‍රී ලංකාවේ සමුද්‍ර කෘෂිකර්මය සංවර්ධනය කිරීම සඳහා ඕස්ට්‍රේලියාවේ සිඩ්නි විශ්ව විද්‍යාලය සමඟ ක්‍රියාකාරීව සහයෝගයෙන් කටයුතු කරයි. විෂය පථ අධ්‍යයනය සාර්ථකව නිම කිරීමෙන් පසුව, මෙම ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකාවේ ආසියානු සී බාස් (Asian sea bass), ඉන්දියානු බෙල්ලන් (Indian oyster) සහ මුහුදු පැලෑටි (seaweeds) වාණිජමය වශයෙන් වගා කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. ජලජ සත්ත්ව සෞඛ්‍ය සහ නිෂ්පාදන පිළිබඳ සහකාර මහාචාර්ය, මහාචාර්ය ජෝයි බෙකර් සහ

ඕස්ට්‍රේලියාවේ නව දකුණු වේල්ස් ප්‍රාථමික කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ ප්‍රධාන පර්යේෂණ විද්‍යාඥ, ආචාර්ය වේන් ඕ'කොනර් යන මහත්ම මහත්මීන් විශ්වවිද්‍යාලයේ සංචාරයක නිරත වූ අතර, එමගින් ශ්‍රී ලංකාවේ සමුද්‍ර කෘෂිකර්ම සංවර්ධනයේ අනාගත මාර්ග සිතියම් පිළිබඳ ඵලදායී සාකච්ඡාවක නියැලීමට සහ අවබෝධයක් ලබා ගැනීමට අවස්ථාව උදාවිය.

## ප්‍රජාව/සමාජයීය වගකීම හා ජාතික දායකත්වය

ජලජ ජෛව සම්පත් අධ්‍යයන අංශය, බස්නාහිර පළාත් සභාව මගින් පරිපාලනය කරනු ලබන මීගමුව, පිටිපන හි පිහිටි ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානය සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹුණි. එම මධ්‍යස්ථානය මගින් පීඨයේ උපාධි අපේක්ෂකයින් සඳහා ජලජීවී වගාව පිළිබඳ ක්ෂේත්‍ර පුහුණුව සහ පර්යේෂණ පහසුකම් සපයනු ලබන අතර, අධ්‍යයන අංශය විසින් ජලජ සත්ත්ව සෞඛ්‍ය කළමනාකරණය, පෝෂණ කළමනාකරණය සහ එම මධ්‍යස්ථානයේ නව ජලජීවී වගා මෙහෙයුම් ස්ථාපිත කිරීම සඳහා තාක්ෂණික විශේෂඥතාව ලබා දෙනු ඇත.

නාගරික ජෛව සම්පත් අධ්‍යයන අංශය, Innovations by Orel ආයතනය සමඟ සහයෝගයෙන් IoT-පාදක ස්මාර්ට් ගොවිතැන් තාක්ෂණය පිළිබඳ නියමු ව්‍යාපෘතියක් සාර්ථකව නිම කරන ලදී. මෙම ව්‍යාපෘතිය මගින් සංවර්ධනය කරන ලද IoT-පාදක පොහොර සම්පාදන පද්ධතිය, ශාකයේ අවශ්‍යතාවය අනුව නියමිත කාලයේදී අවශ්‍ය පෝෂක සපයයි.

## පර්යේෂණ නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ විස්තර - 2024

| | ප්‍රකාශන කාණ්ඩය | | සංඛ්‍යාව | | වෙනත් |
|---|---|---|---|---|---|
| | | | දේශියව ප්‍රකාශයට පත් කරන ලද | විදේශියව ප්‍රකාශයට පත් කරන ලද | |
| 1 | තීරක සුවිගත ජර්නල ප්‍රකාශන ගණන | | | 14 | |
| 2 | තීරක නොවන සුවිගත ජර්නල ප්‍රකාශන ගණන | | | | |
| 3 | සම්මන්ත්‍රණ කටයුතු | 3.1 සම්පූර්ණ පත්‍රිකා | | | |
| | | 3.2 සාරාංශ | | 24 | |
| 4 | ප්‍රකාශිත පොත් පරිච්ඡේද ගණන | | | 4 | |
| 5 | ප්‍රකාශිත පොත්/පෙළ පොත් ගණන | 5.1 ප්‍රකාශකයකු විසින් | | | |
| | | 5.2 කතුවරයා විසින් | | | |
| | මුළු සංඛ්‍යාව | | 0 | 42 | |

## පරිගණක පීඨය



පරිගණක පීඨය (FoC) යනු ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ විශ්වවිද්‍යාල අතර නැගී එන පරිගණකකරණය සහ ඒ ආශ්‍රිත විෂයයන් සඳහා පමණක් කැප වූ නවතම සහ පළමු පීඨයයි. එය කීර්තිමත් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 11 වන පීඨය ලෙස ස්ථාපිත කරන ලදී. ජාතික අපනයන උපාය මාර්ගයට අනුකූලව සහ තොරතුරු යුගයේ කුසලතා සහිත ශ්‍රම බලකායක් අඛණ්ඩව සැපයීම සඳහා IT සහ BPO සේවා අංශයෙන් නිරන්තරයෙන් වැඩිවන ඉල්ලුමට ප්‍රතිචාර දක්වමින්, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය FoC පිහිටුවීමේ අභියෝගය භාර ගත්තේය.

2024 වර්ෂය තුළ FoC හි අධ්‍යයන දෙපාර්තමේන්තු තුන සහ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් පහත පරිදි වේ.

| | |
|---|---|
| **පීඨාධිපති** | **මහාචාර්ය පී.එම්. ජයවීර** |
| **අධ්‍යයනාංශය** | **අධ්‍යයනාංශ ප්‍රධාන** |
| විද්‍යාත්මක පරිගණක අධ්‍යයනාංශය | ආචාර්ය ඩී.ජී.එන්.ඩී. ජයරත්න |
| දැනුම ඉංජිනේරු සහ සන්නිවේදන අධ්‍යයනාංශය | ආචාර්ය එම්.ඩී.එස්. සෙනෙවිරත්න |
| තොරතුරු පද්ධති ඉංජිනේරු සහ තොරතුරු විද්‍යා අධ්‍යයනාංශය | ආචාර්ය එම්.ඩී.පී.පෙරිස් |

## පීඨය විසින් පිරිනමනු ලබන උපාධි

පරිගණකකරණය සහ ඒ ආශ්‍රිත උප විෂයයන් 21 වන සියවසේ ප්‍රධාන විෂය ක්ෂේත්‍ර ලෙස ඉස්මතු වෙමින් පවතී. නිපුණ ශ්‍රම බලකායක් සඳහා වන ගෝලීය ඉල්ලුම සපුරාලීම සඳහා, පරිගණක පීඨය ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට, පහත ලැයිස්තුගත කර ඇති පරිදි, සුවිශේෂී පරිගණකකරණ ගෞරව උපාධි වැඩසටහන් තුනක් සැලසුම් කර පිරිනමනු ලබයි. මෙම වැඩසටහන් මගින් අති නවීන පරිගණකකරණ සහ ඒ ආශ්‍රිත දැනුම් ක්ෂේත්‍ර ඇතුළුව සියලුම ප්‍රධාන ක්ෂේත්‍ර ආවරණය කරන අතර, උපාධිධාරීන්ට නවීනතම තාක්ෂණයන් පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ද ලබා දෙයි.

- පරිගණක විද්‍යාව පිළිබඳ පරිගණකවේදී ගෞරව උපාධිය
- මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පරිගණකවේදී ගෞරව උපාධිය
- තොරතුරු පද්ධති පිළිබඳ පරිගණකවේදී ගෞරව උපාධිය

### බාහිර උපාධි වැඩසටහන

පරිගණක පීඨය නුදුරේදීම බාහිර උපාධි වැඩසටහනක් ආරම්භ කිරීමට ද අපේක්ෂා කරයි. බාහිර උපාධි වැඩසටහන සඳහා වන යෝජනාව සහ පාඨමාලා දළ සැකැස්ම ආචාර්ය ඩී.ජී.එන්.ඩී. ජයරත්න මහතා විසින් පීඨ මණ්ඩලයට ඉදිරිපත් කරන ලද අතර, ඒවා වැඩිදුරටත් සංශෝධනය කිරීම සඳහා පසුව සාකච්ඡා කරන ලදී. වැඩසටහන සූදානම් කර තිබුණද, පීඨයේ ප්‍රමාණවත් අධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු සංඛ්‍යාවක් පිරවීමෙන් අනතුරුව මෙම වැඩසටහන ඉදිරියට පවත්වා ගෙන යන ලෙසට විශ්වවිද්‍යාල සනාතන සභාව පරිගණක පීඨයට උපදෙස් ලබා දී ඇත.

## ඉගෙනුම්, අධ්‍යාපන සහ සේවා නියුක්ති කුසලතා සංවර්ධනය

### 2022/2023 නව අධ්‍යයන වර්ෂය සඳහා වන පරිගණක පීඨයේ නවක සිසුන් පිළිගැනීමේ වැඩසටහන

පරිගණක පීඨයේ නවක සිසුන් (2024) සඳහා වූ පිළිගැනීමේ වැඩසටහනේ සමාරම්භක උත්සවය 2024 අප්‍රේල් 22 වන දින පවත්වන ලදී. මෙම වැඩසටහන මගින් සිසුන් 150 දෙනෙකුගෙන් යුත් පීඨයේ දෙවන කණ්ඩායම පිළිගත් අතර එය 2024 මැයි 02 වන දින දක්වා සම්පූර්ණ දින 8 ක කාලයක් පුරා පැවැත්විණි. එම වැඩසටහනට ඉහත කී සමාරම්භක උත්සවය, විශ්වවිද්‍යාල චාරිකාවක්, ආරාධිත දේශන, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් දෙපාර්තමේන්තුවේ මගපෙන්වීම යටතේ පැවති සංගීත හා නර්තන ප්‍රසංග මෙන්ම භාවනා සැසි ඇතුළු විවිධ ක්‍රියාකාරකම් ඇතුළත් විය. නවක සිසුන්ට පරිපූර්ණ සහ පොහොසත් අත්දැකීමක් ලබා දීම සහ විශ්වවිද්‍යාල පරිසරය සහ එහි ක්‍රියාකාරකම් පිළිබඳව

ඔවුන්ව හුරු කරවීම අරමුණු කරගෙන මෙම වැඩසටහන් සංවිධානය කරන ලදී. සමස්ත පීඨ කාර්ය මණ්ඩලයේ සහාය ඇතිව මෙම පිළිගැනීමේ වැඩසටහන ආචාර්ය ඩී.ජී.එන්.ඩී. ජයරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.

**කාර්ය මණ්ඩල සංවර්ධන පුහුණු වැඩසටහන 2024**

පරිගණක පීඨය විසින් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ සහාය ඇතිව, 2024 සැප්තැම්බර් 17 සහ 18 යන දෙදින තුළ සබරගමුව විශ්වවිද්‍යාලයේදී සහ ඔහිය හි පිහිටි ඌව කළමනාකරණ පුහුණු මධ්‍යස්ථානයේදී දෙදින පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

## යටිතල පහසුකම් සංවර්ධනය

### AHEAD ප්‍රදානය

පරිගණක විද්‍යාගාරයකට අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට පරිගණක පීඨයට AHEAD ව්‍යාපෘතියෙන් රුපියල් මිලියන තිස් පහක (35) ප්‍රදානයක් ලැබී ඇත. මෙම පරිගණක විද්‍යාගාරය මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ නව ගොඩනැගිල්ලේ (විමලධර්ම මැදුරේ) තාවකාලිකව ස්ථාපිත කර ඇත.

**ශිෂ්‍ය තොරතුරු පද්ධතිය සහ ශිෂ්‍ය ඇගයීම් සහ විභාග ප්‍රතිඵල පද්ධතිය**

පරිගණක පීඨයේ ශිෂ්‍ය තොරතුරු පද්ධතිය සහ ශිෂ්‍ය ඇගයීම් සහ විභාග ප්‍රතිඵල පද්ධතියේ අභ්‍යන්තර සංවර්ධන කටයුතු, උපදේශක කේ.ඩී.ටී. රංගන මහතා (කොන්ත්‍රාත් පදනම මත) විසින් සම්පූර්ණ කර ඇත.

**පරිගණක සේවා මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම**

ආචාර්ය එම්.ඩී.පී. පීරිස් මහතා විසින් සංකල්පයක් ලෙස යෝජනා කරන ලද පරිගණක සේවා මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමේ කටයුතු ආරම්භ කිරීමට පරිගණක පීඨය සමත් වී ඇත. පරිගණක සේවා සහ මෘදුකාංග නිෂ්පාදන සංවර්ධනයේ ප්‍රමුඛ සැපයුම්කරුවෙකු වීම පරිගණක සේවා මධ්‍යස්ථානයෙහි මූලික අරමුණයි. පරිගණක සේවා මධ්‍යස්ථානය මගින් උසස් තාක්ෂණයන් සහ මෘදුකාංග ඉංජිනේරු විද්‍යාවේ හොඳම භාවිතයන් උපයෝගී කර ගනිමින්, සිය සේවාදායකයින්ගේ නිශ්චිත අවශ්‍යතා සපුරාලන විසඳුම් ලබා දීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත. මීට අමතරව, පරිගණක සේවා මධ්‍යස්ථානය කර්මාන්ත විශේෂඥයින්, ශාස්ත්‍රීය පර්යේෂකයන් සහ සිසුන් අතර සහයෝගීතාව වර්ධනය කරන නවෝත්පාදන කේන්ද්‍රස්ථානයක් ලෙස ද ක්‍රියා කරනු ඇත.

පරිගණක සේවා මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම, පරිගණක පීඨය පරිගණක සේවා සහ මෘදුකාංග සංවර්ධන සැපයීමේ ප්‍රමුඛයෙකු ලෙස ස්ථානගත කිරීමේ උපායමාර්ගික ප්‍රවේශයක් වේ. මෙම සේවාවන් සඳහා වන ඉහළ යන ඉල්ලුමෙන් ප්‍රයෝජන ගනිමින්, පරිගණක සේවා මධ්‍යස්ථානය මගින් සැලකිය යුතු ආදායමක් උපයා ගැනීම සිදුවනවා පමණක් නොව, එමගින් ශ්‍රී ලංකාවේ තාක්ෂණයේ සහ නවෝත්පාදනයේ දියුණුව සඳහා ද දායකත්වයක් ලබා දෙනු ඇත.

## කර්මාන්ත සහයෝගිතා

**කර්මාන්ත ක්ෂෙත්‍රෙය් නියැලි කීර්තිමත් සමාගම් තුළ සිදුකෙරුනු ක්ෂේත්‍ර චාරිකා**

සිසුන්ගේ දැනුවත්භාවය වැඩි කිරීමට සහ තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ අංශය පිළිබඳව ශිෂ්‍යයින්ට වැඩි අවබෝධයක් ලබා දීම සඳහා, පරිගණක පීඨයේ කාර්ය මණ්ඩලය විසින් පීඨයේ සිසුන් සඳහා කර්මාන්ත ක්ෂේත්‍ර චාරිකා කිහිපයක් සංවිධානය කරන ලදී. මෙම චාරිකා නිසැකවම කාර්ය මණ්ඩලය මෙන්ම පීඨය සමඟ සහයෝගයෙන් කටයුතු කරන කර්මාන්තකරුවන් සමඟ සිසුන්ගේ භෞතික සම්බන්ධතාවය වැඩි දියුණු කරයි. 2024 දී සංවිධානය කරන ලද කර්මාන්ත ක්ෂේත්‍ර චාරිකා පහත පරිදි වේ.

| | **සමාගම / ස්ථානය** | **දිනය** | **සටහන්** |
|---|---|---|---|
| **1** | හම්බන්තොට වරාය සහ EWIS පරිගණක නිෂ්පාදන කම්හල, සූරියවැව | 2024 මාර්තු 27 | පරිගණක පීඨයේ උපාධි වැඩසටහන් 3 හි පළමු කණ්ඩායමේ සිසුන් 88 දෙනෙකු |
| **2** | Zone24x7 (පුද්ගලික) සමාගම, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ | 2024 ජූනි 26 | |
| **3** | IFS R&D ඉන්ටර්නැෂනල් (පුද්) සමාගම, ඔරියන් සිටි, කොළඹ 09 | 2024 ජූලි 12 | පරිගණක පීඨයේ පරිගණක විද්‍යා වැඩසටහනේ දෙවන කණ්ඩායමේ සිසුන් 50 දෙනෙකු |
| **4** | LSEG (ලන්ඩන් ස්ටොක් එක්ස්චේන්ජ් පීඑල්සී), මාලබේ | 2024 ජූලි 26 | පරිගණක පීඨයේ සිසුන් 46 දෙනෙකු |
| **5** | කෝඩ්ජෙන් ඇන්ඩ් වේගා ඉනොවේෂන්, මරදාන | 2024 ජූලි 26 | පරිගණක පීඨයේ සිසුන් 70 දෙනෙකු |
| **6** | කැම්බියෝ සොෆ්ට්වෙයාර් ඉංජිනියරින්, කොළඹ 03 | 2024 අගෝස්තු 01 | පරිගණක පීඨයේ සිසුන් 30 දෙනෙකු |

## පරිගණක පීඨය හච්සන් ටෙලිකොමිනිකේෂන් ශ්‍රී ලංකා ආයතනය සමඟ සහයෝගීතාවක් ඇතිකර ගැනීම

පරිගණක පීඨය විසින් සිසුන් සඳහා කර්මාන්ත සැසි මාලාවක් පැවැත්වීම පිණිස හච්සන් ටෙලිකොමිනිකේෂන් ශ්‍රී ලංකා (Hutch) ආයතනය සමඟ සහයෝගීතාවක් ඇතිකර ගන්නා ලදී. තොරතුරු තාක්ෂණ හා ජාලකරණ ක්ෂේත්‍රයේ මීළඟ පරම්පරාවේ වෘත්තිකයන් සමඟ තම කර්මාන්තය පිළිබඳ තොරතුරු සහ ප්‍රායෝගික දැනුම බෙදා ගැනීමට ඔවුන් දැඩි උනන්දුවක් දක්වා ඇත. මෙම වැඩසටහන ආචාර්ය එස්. මජුරන් මිය විසින් සම්බන්ධීකරණය කරන ලදී.

ජාල ආරක්ෂණයේ නැගී එන ප්‍රවණතා, තොරතුරු තාක්ෂණ/ජාලකරණ භාවිතයන් පිළිබඳ ප්‍රායෝගික වැඩමුළු, 'ටෙලිකොම්' ආයතනයක් 'ටෙක්නො' ආයතනයක් බවට පත්වීම සහ තාක්ෂණික කර්මාන්තයේ වෘත්තීය සංවර්ධනය වැනි මාතෘකා කෙරෙහි අවධානය යොමු කරමින් අන්තර්ක්‍රියාකාරී සැසි මාලාවක් පැවැත්වීමට හච් ආයතනය යෝජනා කළේය. මෙම සැසිවාර පරිගණක පීඨයේ පවතින විෂය නිර්දේශයට අනුපූරකයක් ලෙස සහ සිසුන්ට ප්‍රායෝගික, සැබෑ ලෝකයේ අවබෝධයක් ලබා දීම සඳහා සකස් කරනු ලැබේ.

### සිසුන් සඳහා ලැබෙන ප්‍රධාන ප්‍රතිලාභ

- **සැබෑ ලෝකයේ අවබෝධය:** වර්තමාන කර්මාන්ත භාවිතයන් සහ අභියෝග පිළිබඳව අවබෝධයක් ලැබීම.
- **වෘත්තීය මාර්ගෝපදේශනය:** වෘත්තීය අවස්ථා සහ කර්මාන්ත අපේක්ෂාවන් පිළිබඳ තොරතුරු සැපයීම.

මේවන විට, පරිගණක පීඨය පහත සඳහන් කරුණු සඳහා සහාය ලබා ගැනීම පිණිස දිගුකාලීන හවුල්කාරිත්වයක් සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමේ ක්‍රියාවලියක නිරතව සිටී:

- පාඨමාලා පැවැත්වීම සඳහා සහාය වීම
- කර්මාන්ත චාරිකා
- කාර්මික පුහුණුව
- ව්‍යාපෘති සඳහා උපදේශකත්වය
- පර්යේෂණ ව්‍යාපෘති

## පරිගණක පීඨය H2O.ai ආයතනය සමඟ සහයෝගීතාවක් ගොඩනගා ගැනීම

පරිගණක පීඨය යන්ත්‍ර පිළිබඳ ඉගෙනුම, ස්වයංක්‍රීය යන්ත්‍ර පිළිබඳ ඉගෙනුම, AI අතරමැදි මෘදුකාංග, යෙදුම් සහ AI යෙදුම් ගබඩා පිළිබඳ ප්‍රමුඛ පෙළේ AI සමාගමක් වන H2O.ai සමඟ සහයෝගීතාවක් ගොඩනගාගෙන කටයුතු කිරීමට එකඟ විය. H2O.ai ආයතනය පහත සඳහන් අංශ සම්බන්ධයෙන් පරිගණක පීඨය සමඟ සමීපව කටයුතු කරනු ඇත.

- **පාඨමාලා පැවැත්වීම සඳහා සහාය වීම**
    - යන්ත්‍ර පිළිබඳ ඉගෙනුම, ශීඝ්‍ර යෙදුම් සංවර්ධනය, කෘත්‍රිම බුද්ධිය සහ වෙබ් තාක්ෂණයන් හඳුන්වා දීම.
- **කාර්මික පුහුණුව**
    - වෘත්තීය ජීවිතය ගොඩනැගීමට සහභාගී වීමට H2O.ai ආයතනය කටයුතු කරන අතර සිසුන් පුහුණුව සඳහා බඳවා ගැනීමට අවස්ථා ලබා දෙනු ඇත.
- **පර්යේෂණ ව්‍යාපෘති**
    - H2O.ai ආයතනය පර්යේෂණ ව්‍යාපෘතිවලට සම්බන්ධ වන අතර අවසන් වසරේ සිසුන්ට උපදේශකත්වය ලබා දෙනු ඇත.

## මාස් ඉනොවේෂන් සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුමකට එළඹීම

අන්‍යෝන්‍ය වශයෙන් වැදගත් වන ක්ෂේත්‍ර තුළ විවිධ ව්‍යාපෘති පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධන කටයුතුවල නිරත වීම සඳහා වන අවබෝධතා ගිවිසුමක් මාස් ඉනොවේෂන් (පුද්ගලික) සමාගම සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය අතර 2024 ඔක්තෝබර් 01 වන දින අත්සන් තබන ලදී.

## නෙක්ස්ට් ජෙන් ස්කිල්ස් වැඩමුළු මාලාව

ශිල්ප සයුර පදනම, මහාචාර්ය පී.එම්. ජයවීර මහතා සමඟ එක්ව, පරිගණක පීඨයේ උපාධි අපේක්ෂකයින් සඳහා **නෙක්ස්ට් ජෙන් ස්කිල්ස්**: කාර්මික කුසලතා සංවර්ධන වැඩමුළුව' නමින් වැඩමුළු මාලාවක් පැවැත්වීමට යෝජනා කර ඇත. සිසුන්ගේ කාර්මික කුසලතා වැඩි දියුණු කිරීම මෙම වැඩමුළුවල අරමුණ වන අතර, සිසුන්ගේ පහසුව සඳහා නිවාඩු දිනවල සහ සති අන්තවලදී ඒවා පැවැත්වීමට සැලසුම් කර ඇත. එහි පළමු සැසිවාරය 2024 නොවැම්බර් 30 සහ දෙසැම්බර් 01 යන දිනවල පරිගණක පීඨයේ පරිගණක විද්‍යාගාරයේදී, පළමු සහ දෙවන කණ්ඩායම් දෙකෙහිම සිසුන් 120 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී. එය ස්ක්‍රැච් කෝඩින්, ක්‍රමලේඛන සංකල්ප, ඇල්ගොරිතම සංවර්ධනය සහ ක්‍රමලේඛනය සඳහා කෘතිම බුද්ධිය ඇතුළුව

ස්ක්‍රැච් භාවිතයෙන් මූලික ක්‍රමලේඛන නිර්මාණය කිරීම පිළිබඳව විය. වැඩමුළුවේ අන්තර්ගතය ඉතා ආකර්ෂණීය සහ අදාළ බව පවසමින් සිසුහු වැඩමුළුව සම්බන්ධයෙන් සිය ප්‍රශංසාව පළ කළහ.

**පර්යේෂණ සහ සංවර්ධන**

## පර්යේෂණ සහ සංවර්ධන

සමාජ-ආර්ථික හා ජාතික සංවර්ධනයට වැඩි දායකත්වයක් ලබා දිය හැකි, නැගී එන පරිගණක ක්ෂේත්‍ර සහ ඒ ආශ්‍රිත උප විෂයයන්හි උපාධි සහ පශ්චාත් උපාධි අධ්‍යාපනය මෙන්ම පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති යන සන්දර්භයන් තුළ අති නවීන පර්යේෂණ දියත් කිරීමට ද පරිගණක පීඨය අපේක්ෂා කරයි.

## පරිගණක පීඨයේ පර්යේෂණ සංවාද මණ්ඩපයක් සඳහා යෝජනාවක් ඉදිරිපත් කිරීම

ආචාර්ය එම්.ඩී.එස්. සෙනෙවිරත්න මහත්මිය විසින් පීඨය තුළ පර්යේෂණ සහ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා පර්යේෂණ සංවාද මණ්ඩපය පිළිබඳ යෝජනාවක් ඉදිරිපත් කරන ලදී. පරිගණක පීඨයේ සියලුම අධ්‍යයන සාමාජිකයින් සමඟ පර්යේෂණ පිළිබඳ විශේෂඥතාව සහ දැනුම බෙදා ගැනීම සඳහා සැසි මාලාවක් සැලසුම් කරන ලද අතර, පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පූර්ණ සහභාගීත්වයෙන් පහත සඳහන් සැසිවාරය පවත්වන ලදී.

| කථිකයා | දිනය | මාතෘකාව |
|---|---|---|
| මහාචාර්ය ප්‍රසාද් එම් ජයවීර | 2024.10.18 | දැනුම නිර්මාණය, ව්‍යාප්තිය සහ පර්යේෂණ ප්‍රකාශ ඉදිරිපත් කිරීම |

**ශිෂ්‍ය ක්‍රියාකාරකම් සහ ජයග්‍රහණ**

## පරිගණක ශිෂ්‍ය සංගමය විසින් සංවිධානය කළ අන්තර්-පීඨ හැකතන් (CODEFUSE’24) තරඟාවලිය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පරිගණක ශිෂ්‍ය සංගමය විසින් IEEE Extreme වැනි තරඟකාරී ක්‍රමලේඛන ඉසව් සඳහා සිසුන් දිරිමත් කිරීම සහ ඔවුන්ගේ සහභාගීත්වය වැඩි කිරීම අරමුණු කරගනිමින්,

CODEFUSE’24 නමින් අන්තර්-පීය හැකතන් තරඟාවලියක් 2024 ජූලි 27 වන දින පවත්වන ලදී. මෙම හැකතන් තරඟාවලියට පෙර, WSO2 ආයතනයේ තාක්ෂණික ප්‍රධානී, රුවන්ග කරුණාරත්න මහතාගේ සම්පත් දායකත්වයෙන්, 2024 ජූලි 21 වන දින “තරඟකාරී ක්‍රමලේඛන ලෝකය විවෘත කිරීම” යන මාතෘකාව යටතේ දැනුම බෙදාගැනීමේ මාර්ගගත සැසියක් පවත්වන ලදී.

## පරිගණක ශිෂ්‍ය සංගමය විසින් “Connect by EduACS” සම්මන්ත්‍රණ මාලාව සංවිධානය කිරීම

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පරිගණක ශිෂ්‍ය සංගමය (ACS) විසින් “Connect by EduACS” නමින් සංවිධානය කරන ලද සම්මන්ත්‍රණ මාලාවක්, 2024 ඔක්තෝබර් 22 වන දින කුරුණෑගල මලියදේව විද්‍යාලයේ සහ 2025 ජනවාරි 6 වන දින හෝමාගම මහින්ද රාජපක්ෂ විද්‍යාලයේ උ.පෙළ සහ සා.පෙළ සිසුන් සඳහා භෞතිකව පවත්වන ලදී. මෙම මාලාවේ එක් අරමුණක් වූයේ පරිගණක පීඨය සහ එහි දක්ෂ සිසුන් වෘත්තීය ලෝකයට සෘජුවම ප්‍රවර්ධනය කිරීමයි. පරිගණක පීඨයේ උපාධි අපේක්ෂකයින් සමඟ තම විශේෂඥතාව සහ අත්දැකීම් බෙදාගත් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් කිහිප දෙනෙකු ද මෙම සම්මන්ත්‍රණ මාලාවට සහභාගී විය.

## “හීන ඉගිලෙන රෑ” සංගීත ප්‍රසංගය

පරිගණක පීඨයේ සිසුන් විසින් 2024 දෙසැම්බර් 12 වන දින ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඇහැළ වල පරිශ්‍රයේදී “හීන ඉගිලෙන රෑ” නමින් සංගීත ප්‍රසංගයක් සංවිධානය කරන ලද අතර, එමගින් සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට එකසේ උද්යෝගයෙන් යුතුව සංගීත රාත්‍රියක් අත්විඳීමට අවස්ථාව සැලසිණි. සිසුන් සහ කාර්ය මණ්ඩලය යන දෙපාර්ශ්වයම ගායනයෙහි නිරත වූ අතර, ඉතා ප්‍රීතියෙන් යුතුව සුහද නර්තනයකින් අනතුරුව උත්සවයේ සමාප්තිය සටහන් විය.

| උපාධි පාඨමාලාව | මුළු සිසුන් සංඛ්‍යා | අධ්‍යයන කාර්යය මණ්ඩලය | | අනධ්‍යයන සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | ස්ථිර | තාවකාලික | |
| පරිගණක විද්‍යාව පිළිබඳ පරිගණකවේදී ගෞරව උපාධිය | 97 | | | |
| මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පරිගණකවේදී ගෞරව උපාධිය | 102 | 8 | 6 | 2 |
| තොරතුරු පද්ධති පිළිබඳ පරිගණකවේදී ගෞරව උපාධිය | 92 | | | |
| **මුළු සංඛ්‍යාව** | 291 | | | |

## පර්යේෂණ නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ විස්තර - 2024

| | ප්‍රකාශන කාණ්ඩය | | සංඛ්‍යාව | | වෙනත් |
|---|---|---|---|---|---|
| | | | දේශියව ප්‍රකාශයට පත් කරන ලද | විදේශියව ප්‍රකාශයට පත් කරන ලද | |
| 1 | තීරක සුවිගත ජර්නල ප්‍රකාශන ගණන | | | 2 | |
| 2 | තීරක නොවන සුවිගත ජර්නල ප්‍රකාශන ගණන | | 1 | 1 | |
| 3 | සම්මන්ත්‍රණ කටයුතු | 3.1 සම්පූර්ණ පත්‍රිකා | | | |
| | | 3.2 සාරාංශ | 3 | | |
| 4 | ප්‍රකාශිත පොත් පරිච්ඡේද ගණන | | | | |
| 5 | ප්‍රකාශිත පොත්/පෙළ පොත් ගණන | 5.1 ප්‍රකාශකයකු විසින් | | | |
| | | 5.2 කතුවරයා විසින් | | | |
| | **මුළු සංඛ්‍යාව** | | 4 | 3 | |

## ශාරීරික අධ්‍යාපන අංශය

**හැඳින්වීම**

විශ්වවිද්‍යාල සිසුන් සඳහා ක්‍රීඩා කටයුතු සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම, ක්‍රීඩා ඉසව් 39ක් සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණු කිරීම සහ ක්‍රීඩා වැඩසටහන් සංවිධානය කිරීම ශාරීරික අධ්‍යාපන ඒකකයේ ප්‍රධාන කාර්යයන් වේ. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා උළෙල, ජාතික හෝ ජාත්‍යන්තර ක්‍රීඩා සංගම් මගින් සංවිධානය කරනු ලබන තරගාවලි සඳහා විධිමත් පුහුණුවක් ලබා දීම, විවිධ ක්‍රීඩා සඳහා ක්‍රීඩාංගණ පරිපාලනය හා නඩත්තු කිරීම ශාරීරික අධ්‍යාපන ඒකකයේ අනෙකුත් කාර්යයන්ට අයත් වේ.
වර්තමාන ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂවරිය වන්නේ එන්. නිශාන්ති විදානගේ මහත්මියයි. රමණී කුලතිලක මහත්මිය සහ එච්.එල්. ලහිරු දිලංකාර මහතා ස්ථිර ක්‍රීඩා උපදේශකවරුන් ලෙස කටයුතු කරති. ඊ.ඩී. ප්‍රියදර්ශනී, එන්. කරුණාරත්න, එන්. ගිනිගේ, පී.ඩී. පසිඳු මිහිරංග, ජී.එච්.ඩී.එස්. ධනංජය, සහ ඊ.එම්.එන්.ඩී.ටී. ඒකනායක යන මහත්ම මහත්මීන් මෙහි තාවකාලික ක්‍රීඩා උපදේශකවරුන් ලෙස සේවය කරති.

### ශාරීරික අධ්‍යාපන අංශයේ අරමුණු

**ශාරීරික අධ්‍යාපන අංශයේ අරමුණු**

1. විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර සිසුන්ට ශාරීරික අධ්‍යාපනයේ වටිනාකම් පිළිබඳ අවබෝධයක් ලබා දීම සහ මානසික සංවර්ධනය තුළින් ඔවුන්ගේ ශාරීරික සංවර්ධනය ඇතිකිරීම.
2. ක්‍රීඩා කටයුතු සහ කුසලතා වැඩි දියුණු කර ගැනීමට අවස්ථාව සැලසීම.
3. අභ්‍යන්තර හා බාහිර ක්‍රීඩා ආයතන සමඟ තරගාවලි ක්‍රීඩා කිරීම මගින් ක්‍රීඩා සහභාගීත්වය දිරිමත් කිරීම.
4. සිසුන් අතර ක්‍රීඩා කටයුතු දිරිගැන්වීම මගින් ඔවුන්ගේ විනය සංවර්ධනය කිරීම.

අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින්ගෙන් සමන්විත ක්‍රීඩා උපදේශක මණ්ඩලයක් ඇත.

ක්‍රීඩා සභාව සියලුම ක්‍රීඩාවල නායකයින්ගෙන් සහ උප නායකයින්ගෙන් සමන්විත වන අතර සෑම වසරක් පාසාම සභාපතිවරයා සහ විධායක කමිටු සාමාජිකයින් තෝරා පත් කර ගනු ලැබේ.

## ක්‍රීඩා උපදේශක මණ්ඩලය

ක්‍රීඩා උපදේශක මණ්ඩලය පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත වේ.

1. උපකුලපති විසින් පත් කරනු ලබන, ක්‍රීඩාව කෙරෙහි උනන්දුවක් දක්වන ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් දහසය දෙනෙක්.
2. ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂ.

3. ස්ථිර ශාරීරික අධ්‍යාපන උපදේශකවරුන් අතුරින් සාමාජිකයින් අට දෙනෙක් (ඉන් එක් අයෙකු උපදේශිකාවක් විය යුතුය).
4. ක්‍රීඩා සභාවේ සම-සභාපතිවරුන් දෙදෙනා, ලේකම්, උප-සභාපති සහ තවත් නියෝජිතයෙක් (එක් අයෙකු ක්‍රීඩිකාවක් විය යුතුය).
5. විශ්වවිද්‍යාල ප්‍රධාන වෛද්‍ය නිලධාරී හෝ ඔහුගේ නියෝජිතයෙක් (විශ්වවිද්‍යාලයේ වෛද්‍ය නිලධාරියෙකු විය යුතුය).
6. ශිෂ්‍ය කටයුතු අධ්‍යක්ෂ.
7. ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (ශිෂ්‍ය සුබසාධන) හෝ ඔහුගේ හෝ ඇයගේ නියෝජිතයෙක්.
8. මූල්‍යාධිකාරී හෝ ඔහුගේ හෝ ඇයගේ නියෝජිතයෙක්.
9. වැඩ ඉංජිනේරු හෝ ඔහුගේ නියෝජිතයෙක්.
10. සහකාර ලේඛකාධිකාරී (ප්‍රාග්ධන වැඩ අංශය).

### ක්‍රීඩා සභාව

විශ්වවිද්‍යාල ක්‍රීඩා සභාව විවිධ ක්‍රීඩා කණ්ඩායම්වල නායකයින්ගෙන් සහ උප නායකයින්ගෙන් සමන්විත වේ. එය සභාපති, සෑම පීඨයකින්ම උප සභාපතිවරුන්, ලේකම්, සහකාර ලේකම්, කනිෂ්ඨ භාණ්ඩාගාරික, සංස්කාරකවරුන් දෙදෙනෙකු සහ කමිටු සාමාජිකයින් දෙදෙනෙකුගෙන් සමන්විත වේ.

## ක්‍රීඩා ක්‍රියාකාරකම්

විශ්වවිද්‍යාලයේ ශාරීරික අධ්‍යාපන ඒකකයේ පහත සඳහන් ශාරීරික අධ්‍යාපන උපදේශකවරුන් ඔවුන්ගේ අධීක්ෂණය යටතේ පහත සඳහන් ක්‍රීඩා සඳහා පහසුකම් සහ පුහුණුව ලබා දී ඇත:

| | | |
|---|---|---|
| එන්. නිශාන්ති විදානගේ මිය.<br>(ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂ) | ජේ. එම්. රමණී කුලතිලක මිය.<br>(ශාරීරික අධ්‍යාපන උපදේශිකා)<br><br>වොලිබෝල් (කාන්තා/පිරිමි) වෙස් (කාන්තා/පිරිමි) දැල්පන්දු (කාන්තා) හොකී (කාන්තා/පිරිමි) | එච්. එල්. ලහිරු දිලංකාර මයා.<br>(ශාරීරික අධ්‍යාපන උපදේශක)<br><br>මලල ක්‍රීඩා (කාන්තා/පිරිමි) මාර්ග ධාවන තරඟ (කාන්තා/පිරිමි) කැරම් (කාන්තා/පිරිමි) පිහිනුම් (කාන්තා/පිරිමි) |

| | | |
|---|---|---|
| ඊ. ඩී. ප්‍රියදර්ශනී මිය. (ශාරීරික අධ්‍යාපන උපදේශිකා)<br><br>කරාටේ (කාන්තා/පිරිමි) ටයිකොන්ඩෝ (කාන්තා/පිරිමි) කබඩි බොක්සිං | එන්. කරුණාරත්න මිය. (ශාරීරික අධ්‍යාපන උපදේශිකා)<br><br>බැඩ්මින්ටන් (කාන්තා/පිරිමි) ටෙනිස් (කාන්තා/පිරිමි) එල්ලේ (කාන්තා/පිරිමි) රග්බි (පිරිමි) | එන්. ගිනිගේ මයා. (ව්‍යායාම ශාලා උපදේශක)<br><br>ක්‍රිකට් පාපන්දු මේස පන්දු (කාන්තා/පිරිමි) |
| පී. ඩී. පසිඳු මිහිරංග මයා. (ශාරීරික අධ්‍යාපන උපදේශක)<br><br>බාස්කට්බෝල් (පිරිමි/කාන්තා) බේස්බෝල් (පිරිමි/කාන්තා) | ජී. එච්. ඩී. එස්. ධනංජය මයා. (ශාරීරික අධ්‍යාපන උපදේශක)<br><br>බර ඉසිලීම (පිරිමි/කාන්තා) මල්ලවපොර | ජී. එච්. ඩී. එස්. ධනංජය මයා. (ශාරීරික අධ්‍යාපන උපදේශක)<br><br>හොකී (පිරිමි/කාන්තා) |

ශාරීරික අධ්‍යාපන ඒකකය පහත සඳහන් තරගාවලි සංවිධානය කරයි.

1. අන්තර් පීය නවක/ප්‍රවේශ තරගාවලි
2. අන්තර් පීය ක්‍රීඩා උළෙල
3. ආරාධිත සහ සුහද තරගාවලි
4. අන්තර් විශ්වවිද්‍යාල තරගාවලි
5. කාර්ය මණ්ඩල තරගාවලි

මීට අමතරව, අපි බාහිර කණ්ඩායම් සමඟ සුහද තරග, අන්තර් විශ්වවිද්‍යාල ශූරතා සහ ඒකාබද්ධ විශ්වවිද්‍යාල කණ්ඩායම් ක්‍රීඩා සංවිධානය කරමු.

එමෙන්ම ජාතික ශූරතා, ලෝක විශ්වවිද්‍යාල ක්‍රීඩා උළෙල සහ ශූරතා සඳහා සියලුම විශ්වවිද්‍යාල වලින් තෝරාගත් ඒකාබද්ධ විශ්වවිද්‍යාල ක්‍රීඩා කණ්ඩායම් සඳහා අපගේ සිසුන් සහභාගී වේ.

විශ්වවිද්‍යාල කිහිපයක් විසින් සංවිධානය කරනු ලබන අන්තර් විශ්වවිද්‍යාල ක්‍රීඩා උළෙල සෑම වසරකම පැවැත්වෙන අතර, වසර තුනකට වරක් එක් විශ්වවිද්‍යාලයක් විසින් කුඩා ඔලිම්පික් උළෙලක් (Mini Olympics) සංවිධානය කරනු ලැබේ.

2024 වසරේ දී අප විසින් සංවිධානය කරන ලද වැඩසටහන් පහත දැක්වේ.

- ටෙනිස් කණ්ඩායම, ශාරීරික අධ්‍යාපන ඒකකය සමඟ එක්ව Tennis Ten's – 2024 ක්‍රීඩා තරගාවලිය සංවිධානය කිරීම.

- බැඩ්මින්ටන් කණ්ඩායම, ශාරීරික අධ්‍යාපන ඒකකය සමඟ එක්ව SMASHES වයස් කාණ්ඩ සමස්ත ලංකා බැඩ්මින්ටන් ශූරතා 2024 තරගාවලිය සංවිධානය කිරීම.
- සියලුම පීඨ සඳහා දිශානති වැඩසටහන් පවත්වන ලදී.
- අන්තර් විශ්වවිද්‍යාල පිහිනුම් සහ කැරම් ශූරතාව - 2024 සංවිධානය කිරීම.
- 2024 අන්තර් විශ්වවිද්‍යාල ශූරතාවලිය සඳහා සහභාගී වීම.
- අප කණ්ඩායම පිරිමි ශූරතාව, කාන්තා ශූරතාව සහ සමස්ත ශූරතාව දිනා ගන්නා ලදී.

❖ අප කණ්ඩායම පිරිමි ශූරතාව, කාන්තා ශූරතාව සහ සමස්ත ශූරතාව දිනා ගන්නා ලදී.

## වර්ණ ප්‍රදානය

සෑම වසරක් අවසානයේම ශාරීරික අධ්‍යාපන ඒකකය සහ ක්‍රීඩා සභාව එක්ව වර්ණ ප්‍රදානෝත්සවයක් සංවිධානය කරනු ලබයි. උපදේශක මණ්ඩලයේ අනුමැතිය ඇතිව, අනුමත නිර්ණායක යටතේ අවශ්‍ය ප්‍රමිතියට ළඟා වූ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට වර්ණ ප්‍රදානය කරනු ලැබේ. මෙම සම්මාන සඳහා වන නිර්ණායක සහ වැඩිදුර විස්තර ශාරීරික අධ්‍යාපන ඒකකයෙන් ලබා ගත හැක. ඊට අමතරව, අන්තර් විශ්වවිද්‍යාල ශූරතාවලියේ සහ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා උළෙලේ දක්ෂතා දක්වන ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා සංගමයේ වර්ණ ප්‍රදානය කෙරේ.

2023 වර්ෂයේදී, 46 වන වර්ණ ප්‍රදානෝත්සවය 2023 මාර්තු 27 වන දින මීගොඩ Grand Mondo හෝටල් පරිශ්‍රයේදී පැවැත්විණි. එහි ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පද්මලාල් එම්. මාන්නගේ - උපකුලපතිතුමා සහභාගී වූ අතර ගෞරවනීය ආරාධිත අමුත්තා ලෙස සුජීව රාජපක්ෂ මහතා ඊට සහභාගී විය.

වසරේ විශිෂ්ටතම ක්‍රීඩිකාව ලෙස ශ්‍රීමාලි සමරකෝන් සහ වසරේ විශිෂ්ටතම ක්‍රීඩකයා ලෙස විරුණක හෙන්දහේව මෙහිදී සම්මානයට පාත්‍ර විය.

## ක්‍රීඩා පහසුකම්

කීර්තිමත් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ක්‍රීඩා පාලක මණ්ඩලය වන ශාරීරික අධ්‍යාපන අංශය, සුවිශේෂී ක්‍රීඩා පහසුකම් රැසකින් සමන්විතය.

ගෘහස්ථ

ශාරීරික අධ්‍යාපන අංශය සතුව කරාතේ, ටයිකොන්ඩෝ, කබඩි, බොක්සිං සහ මේස පන්දු ඇතුළු විවිධ ක්‍රීඩා සඳහා භාවිතා කරන ප්‍රධාන ව්‍යායාම ශාලාවක් ඇත. ඊට අමතරව, මෙම පහසුකමට පහත සඳහන් අංගවලින් සමන්විත වේ:

- බර ඉසිලීමේ ශාලාව
- මල්ලවපොර ශාලාව
- ශක්තිය සහ සමනමාත්‍යතා වර්ධන ශාලාව
- කැරම් ක්‍රීඩා ගාරය


බර ඉසිලීමේ ශාලාව




කැරම් ක්‍රීඩා ගාරය



**ශක්තිය සහ සමනමාත්‍යතා වර්ධන ශාලාව**





**<u>එළිමහන්</u>**

**වොලිබෝල් පිටි**

විශ්වවිද්‍යාලයේ එළිමහන් වොලිබෝල් පිටි පිහිනුම් තටාකය අසල පිහිටා ඇති අතර, මැටි ආශ්‍රිත පෘෂ්ඨයකින් යුත් පිටි දෙකකින් සමන්විත වේ. මේවා විශ්වවිද්‍යාල සිසුන් සහ කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා භාවිත කළ හැකිය.



## පැසිපන්දු ක්‍රීඩාංගණය

එළිමහන් පැසිපන්දු ක්‍රීඩාංගණය වොලිබෝල් පිටිවලට යාබදව පිහිටා ඇති අතර, එය ප්‍රධාන වශයෙන් තාර යෙදූ දෘඪ පෘෂ්ඨයකින් සමන්විත වේ. මේවා විශ්වවිද්‍යාල සිසුන් සහ කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා භාවිත කළ හැකිය.






ටෙනිස් පිටි

ටෙනිස් පිටි කෘත්‍රිම සින්තටික් පෘෂ්ඨයකින් සමන්විත වන අතර හොඳින් නඩත්තු කරනු ලැබේ. මේවා විශ්වවිද්‍යාල සිසුන්, කාර්ය මණ්ඩල සාමාජිකයින් සහ බාහිර පාර්ශ්ව සඳහා ද විවෘතය.



## පිහිනුම් තටාක සංකීර්ණය

මෙම පිහිනුම් තටාකය මීටර් 50ක සම්මත ප්‍රමාණයකින් යුක්ත වන අතර, එය පිහිනුම් මංතීරු 10කින් සමන්විත වේ. එහි නොගැඹුරු කොටස මීටර් 1.5ක ගැඹුරකින් යුක්ත වන අතර, ගැඹුරු කොටසේ ගැඹුර මීටර් 5.5ක් වේ. පිහිනුම් තටාකයට යාබදව, පිහිනුම්කරුවන් සඳහා ඇඳුම් මාරු කිරීමේ සහ ස්නානනය කිරීම සඳහා වන

කාමරවලින් සමන්විත දෙමහල් ගොඩනැගිල්ලක් පිහිටා ඇත. මෙම තටාකය, විශ්වවිද්‍යාල සිසුන්, කාර්ය මණ්ඩල සාමාජිකයින් මෙන්ම, ඉල්ලීමක් මත බාහිර පුද්ගලයින් සඳහාද භාවිත කිරීමට අවස්ථාව සලසා ඇත.



**ක්‍රීඩාංගණ**

ක්‍රිකට් ඇතුළු සියලුම එළිමහන් ක්‍රීඩා සඳහා භාවිතා වන ක්‍රීඩාංගණ දෙකක් ඇත. ඉහළ ක්‍රීඩාංගණයේ එක් මැටින් තණතීරුවක් ඇති අතර, ඊට යාබදව එක් මහලකින් යුත් ක්‍රීඩා මණ්ඩපයක් ඇති අතර ඊට සම්බන්ධ නාන කාමර සහිත ඇඳුම් මාරු කරන කාමර ද පිහිටා ඇත.

මීට අමතරව, විශ්වවිද්‍යාලයේ ශාරීරික අධ්‍යාපන අංශය සියලුම විශ්වවිද්‍යාල සිසුන් සහ කාර්ය මණ්ඩලය සඳහා ගෘහස්ථ යෝග, Zumba සහ Aerobics ව්‍යායාම වැඩසටහන් සඳහා ද පහසුකම් සලසයි.





ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය 2015 වසරේ සිට 2024 වසර දක්වා අඛණ්ඩව අන්තර් විශ්වවිද්‍යාල ක්‍රීඩා උළෙලේ ශූරතාව දිනාගෙන ඇත. ඊට අමතරව, වසර තුනකට වරක් පවත්වනු ලබන ශ්‍රී ලංකා අන්තර් විශ්වවිද්‍යාල ක්‍රීඩා උළෙලේ (SLUG) ශූරතාව ද පිළිවෙලින් 2016, 2019 සහ 2023 යන වසරවලදී දිනා ගැනීමට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සමත් විය.

## අන්තර් විශ්වවිද්‍යාල ශූරතාව 2024

කාන්තා සමස්ත ශූරතාව, පිරිමි සමස්ත ශූරතාව, සමස්ත ශූරතාව

## ආරාධිත තරගාවලි

- ශ්‍රී ලංකාවේ කාන්තා බේස්බෝල් ක්‍රීඩා - 2024 මාර්තු 23 වන දින පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සත්කාරකත්වයෙන් පැවති 1 වන ආරාධිත අන්තර් විශ්වවිද්‍යාල කාන්තා බේස්බෝල් ශූරතාවලියේ ජයග්‍රහණය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් දිනා ගන්නා ලදී.

## සංවිධානය කළ ක්‍රීඩා ඉසව්

- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බැඩ්මින්ටන් කණ්ඩායම විසින් සංවිධානය කරන ලද "SMASHES 2024" බැඩ්මින්ටන් තරගාවලිය 2024 මැයි 3 වන දින සිට 7 වන දින දක්වා මර්කන්ටයිල් බැඩ්මින්ටන් සංගමයේ ගෘහස්ථ ක්‍රීඩාංගණ පරිශ්‍රයේදී පවත්වන ලදී.

- "J’pura Tennis 10s" තරගාවලිය 2024 මාර්තු 29 සිට 31 දක්වා පවත්වන ලදී. විශ්වවිද්‍යාලයේ ටෙනිස් කණ්ඩායම විසින් ඉමහත් උනන්දුවෙන් සහ ක්‍රමවත්ව සංවිධානය කරන ලද මෙම ඉසව්ව, ශ්‍රී ලංකාව පුරා කනිෂ්ඨ ටෙනිස් ක්‍රීඩකයින් 120කට අධික සංඛ්‍යාවක් ආකර්ෂණය කර ගනිමින් පැවති අති සාර්ථක ඉසව්වක් බවට පත් විය.

**ජාතික මට්ටමේ තරග සඳහා සහභාගීත්වය**

**බොක්සිං**

- ජී.පී.යූ. මිහිරන් - 2024 වර්ෂයේ ජාතික ශූරයා (රන් පදක්කම්ලාභී සහ වසරේ විශිෂ්ටතම බොක්සිං ක්‍රීඩකයා)

**චෙස්**

- ඩබ්ලිව්.එෆ්.එම්.ඩී.එච්. මෙන්ඩිස් - ශ්‍රී ලංකා ජාතික Blitz කණ්ඩායම් චෙස් ශූරතාව 2024 - 2 වන ස්ථානය.

  ශ්‍රී ලංකා ජාතික Rapid කණ්ඩායම් චෙස් ශූරතා තරගාවලිය 2024 - ශූරතාව.

**කරාතේ**

- ටී.ඩී.එස්.වයි.පෙරේරා - ශ්‍රී ලංකා ජාතික කරාතේ ශූරතාව - 2024 (වයස 21න් ඉහළ කාන්තා කරාතේ -කි.ග්‍රෑ.50 බර බාණ්ඩයේ 2 වන ස්ථානය)
- බී.ටී.ටී. පෙරේරා - ශ්‍රී ලංකා ජාතික කරාතේ ශූරතාව - 2024 (වයස 21න් ඉහළ කාන්තා කුමිතේ - කි.ග්‍රෑ.61 බර බාණ්ඩයේ 3 වන ස්ථානය)
- පී. චාරුණී අභිමානි - ශ්‍රී ලංකා ජාතික කරාතේ ශූරතාව - 2024 (වයස 21න් ඉහළ කාන්තා කුමිතේ කි.ග්‍රෑ.50 බර බාණ්ඩයේ 3 වන ස්ථානය)
- ආර්. තුසන්තන් - ශ්‍රී ලංකා ජාතික කරාතේ ශූරතාව - 2024 (වයස 21න් ඉහළ පිරිමි කුමිතේ - කි.ග්‍රෑ.55 බර බාණ්ඩයේ 1 වන ස්ථානය), ශ්‍රී ලංකා ජාතික කරාතේ ශූරතාව - 2024 (ජ්‍යෙෂ්ඨ පිරිමි කරාතේ 1 වන ස්ථානය)
- ඒ.කේ.එම්. හස්නාත් - ශ්‍රී ලංකා ජාතික කරාතේ ශූරතාව - 2024 (ජ්‍යෙෂ්ඨ පිරිමි කරාතේ 3 වන ස්ථානය)

**වෙඩි තැබීම**

- යූ.කේ.ඩී. තිසංගි ගීත්මා - ශ්‍රී ලංකා ජාතික වෙඩි තැබීමේ ක්‍රීඩා සම්මේලනය සංවිධානය කළ රයිෆල්/පිස්තෝල විවෘත ශූරතාව (25m Fire Pistol කාන්තා කනිෂ්ඨ) – 1 වන ස්ථානය, NSSF – SL රයිෆල්/පිස්තෝල විවෘත ශූරතාව (10m Air Pistol කාන්තා කනිෂ්ඨ) – 1 වන ස්ථානය

- ඩබ්ලිව්.එච්.ඒ.වයි. නෙහාෂා වීරසිංහ - ශ්‍රී ලංකා ජාතික වෙඩි තැබීමේ ක්‍රීඩා සම්මේලනය සංවිධානය කළ රයිෆල්/පිස්තෝල විවෘත ශූරතාව (10m Air Pistol කාන්තා ජොෂ්ය) – 3 වන ස්ථානය

## ටෙනිස්

- දිල්වන් හේරත් - ශ්‍රී ලංකාවේ පිරිමි යුගල අංශයේ අංක 01 ශ්‍රේණිගත කිරීම, 109 වන ශ්‍රී ලංකා ජාතික ශූරතාව 2024 (මිශ්‍ර යුගල) – අනුශූරතාව
- ජී.වී.එස්.ඩී. ජයසිංහ - 109 වන ශ්‍රී ලංකා ජාතික ශූරතාව 2024 (මිශ්‍ර යුගල) – අනුශූරතාව.

## මලල ක්‍රීඩා

බී.ඩබ්ලිව්.එන්. සෙව්වන්දි -102 වන ජාතික ශූරතාව -2024 (මීටර් 5000 කාන්තා -3 වන ස්ථානය(

## ටයිකොන්ඩෝ

- එන්.ඩබ්ලිව්.එම්. උෂානි සංදීපනි - 48 වන ජාතික ක්‍රීඩා උළෙල 2024 ( කි.ග්‍රෑ.46 – 49 බර බාණ්ඩයේ) – 1 වන ස්ථානය, ජාතික Kyorugi ටයිකොන්ඩෝ ශූරතාව (කි.ග්‍රෑ.46 – 49 බර බාණ්ඩයේ කාන්තා) – 2 වන ස්ථානය
- කේ.ඩී.එන්.පී. කුමාර - ජාතික Kyorugi ටයිකොන්ඩෝ ශූරතාව (කි.ග්‍රෑ 57 – 62 බර බාණ්ඩයේ කාන්තා) – 3 වන ස්ථානය
- එච්.සී. ගංගොඩවිල - 48 වන ජාතික ක්‍රීඩා උළෙල 2024 (කි.ග්‍රෑ 57 – 62 සැහැල්ලු බර බාණ්ඩයේ ) – 1 වන ස්ථානය, ජාතික Kyorugi ටයිකොන්ඩෝ ශූරතාව (කි.ග්‍රෑ 57 – 62 බර බාණ්ඩයේ කාන්තා) – 3 වන ස්ථානය

## ජාත්‍යන්තර මට්ටමේ තරග සඳහා සහභාගීත්වය

## කැරම්

- තාරුෂි හිමහංසිකා වීරසේකර - 6 වන කැරම් ලෝක කුසලානය (කාන්තා යුගල) – 3 වන ස්ථානය, 6 වන කැරම් ලෝක කුසලානය (කාන්තා කණ්ඩායම) – අනුශූරතාව

## සෙස්ටෝබෝල්

- කේ.එන්. නිසංසලා - 1 වන දකුණු ආසියානු සෙස්ටෝබෝල් ශූරතාව – 2024 සඳහා සහභාගී විය.

**පාපන්දු**

ජාතික කණ්ඩායමේ සාමාජිකාවන් ලෙස පහත  සඳහන් ක්‍රීඩිකාවන් නේපාලයේ කත්මණ්ඩු නුවරදී 2024 ඔක්තෝබර් 17 සිට 30 දක්වා පැවති SAFF කාන්තා ශූරතාවලිය 2024 සඳහා සහභාගී විය.

- පී. ෂානු
- එස්. ගෞරි
- ඩබ්ලිව්.එම්.කේ.ඉමේෂා

**කරාතේ**

- ජී.එම්.දිමුතු - දකුණු ආසියානු කරාතේ ශූරතාව (කරාතේ කේවල - කාන්තා) – දෙවන ස්ථානය
- අතුකෝරාල, රන්දෙව්, නෙවිල් - දකුණු ආසියානු කරාතේ ශූරතාව - 2024 (කුමිතේ, තනි) (කණ්ඩායම්) – තෙවන ස්ථානය
- ආර්. තුසන්තන් - ආසියානු කරාතේ ශූරතා තරගාවලිය – 2024 සඳහා සහභාගී විය.

**ලෝක විශ්වවිද්‍යාල වෙඩි තැබීමේ ශූරතාව 2024**

- ඩබ්ලිව්.එච්.ඒ.වයි. නෙහාෂා වීරසිංහ - FISU ලෝක විශ්වවිද්‍යාල වෙඩි තැබීමේ ශූරතා තරගාවලිය (10m air pistol) සඳහා සහභාගී විය.

**මලල ක්‍රීඩා**

- එම්.ඒ. නිෂේන්ද්‍ර හර්ෂණී ප්‍රනාන්දු - 1 වන ආසියානු සහය දිවීමේ ශූරතාව (400m) - 4 වන ස්ථානය දිනා ගන්නා ලදී.

තොරතුරු තාක්ෂණ සේවා මධ්‍යස්ථානය (CITS) යනු විශ්වවිද්‍යාලය පුරා දිවෙන තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්, අන්තර්ජාල සහ විද්‍යුත් තැපැල් පහසුකම්, සර්වර් පරිපාලනය, සහ විද්‍යුත් සේවා සහ යෙදුම් නඩත්තු කිරීම මෙන්ම විශ්වවිද්‍යාල සිසුන් සහ කාර්ය මණ්ඩලය සඳහා තොරතුරු තාක්ෂණික සහාය සහ විසඳුම් ලබා දීම සිදු කරන විශ්වවිද්‍යාලයේ ප්‍රධානතම ආයතනය වේ. එසේම, USJNet Sphere, විශ්වවිද්‍යාල වැටුප් පද්ධතිය, ශිෂ්‍ය ලියාපදිංචි කිරීමේ පද්ධතිය, ශිෂ්‍ය තොරතුරු කළමනාකරණ පද්ධතිය, ගෙවීම් පද්ධතිය, මානව සම්පත් කළමනාකරණ පද්ධතිය (USJHRMS) සහ උපාධි අධ්‍යයන පීඨයෙහි ක්‍රියාත්මක කරන ලද කළමනාකරණ තොරතුරු පද්ධතිය ඇතුළුව වෙබ්-පාදක පද්ධති කිහිපයක් ද තොරතුරු තාක්ෂණ සේවා මධ්‍යස්ථානය මගින් සංවර්ධනය කර නඩත්තු කරනු ලබයි.

2022 පෙබරවාරි මාසයේදී, මහාචාර්ය ආර්.ජී.එන්. මීගම මහතා තොරතුරු තාක්ෂණ සේවා මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා ලෙස පත් කරන ලදී. හර්ෂ මුණසිංහ මහතා තොරතුරු පද්ධති කළමනාකරු වශයෙන්ද, වජිර ප්‍රේමදාස මහතා සහ නෙත්සිරි ජයවීර මහතා පරිගණක උපදේශකවරුන් ලෙස ද කටයුතු කළහ. සහකාර ජාල කළමනාකරු ලෙස සුරේෂ් නානායක්කාර මහතා ද, අශේලා නිල්මිණි මෙනෙවිය වැඩසටහන් සම්පාදක සහ පද්ධති විශ්ලේෂක ලෙස ද සේවය කළහ. රනුක එදිරිසූරිය, තරිඳු චතුරංග, ශානක එදිරිසිංහ, නිපුන් සචින්ද සහ වී. සබේතන් යන මහත්වරු පරිගණක වැඩසටහන් සම්පාදකවරුන් ලෙස කටයුතු කළහ. සුනේර කණ්ඩම්බි මහතා තාක්ෂණික නිලධාරී (ශ්‍රව්‍ය දෘශ්‍ය) ලෙස කණ්ඩායමට එක් වූ අතර, මධුෂාන් දේශාංග, සඳුන් අධිකාරි සහ චාමර දයාරත්න යන මහත්වරු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරීන් ලෙස සේවය කරති. බණ්ඩාර යාපා මහතා විද්‍යාගාර සහායක ලෙසත්, ශාන්ත කුමාර මහතා කාර්ය සහායක ලෙසත් සේවය කළහ.

තොරතුරු තාක්ෂණ සේවා මධ්‍යස්ථානය විසින් සපයනු ලබන මූලික සේවාවන් පහත පරිදි වේ.

- විශ්වවිද්‍යාල විද්‍යුත් තැපැල් සේවාව කළමනාකරණය කිරීම
- අන්තර්ජාල පහසුකම් කළමනාකරණය සහ සැපයීම
- සර්වර් පරිපාලනය සහ විද්‍යුත් සේවා සහ යෙදුම් නඩත්තු කිරීම
- කළමනාකරණ තොරතුරු පද්ධති සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම
- මෘදුකාංග සංවර්ධනය සහ විද්‍යුත් විසඳුම්
- පුද්ගලික ක්ලවුඩ් පද්ධතිය නඩත්තු කිරීම
- ෆයිබර් ඔප්ටික් ජාල පද්ධතිය සංවර්ධනය සහ නඩත්තු කිරීම
- දේශීය ජාල (Local Area Networks) සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- වයි ෆයි ජාලය සංවර්ධනය සහ නඩත්තු කිරීම

- විශ්වවිද්‍යාල වෙබ් අඩවි සංවර්ධනය සහ නඩත්තු කිරීම
- අන්තර්සම්බන්ධතා පද්ධතිය (Intercom) ස්ථාපනය, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම අධීක්ෂණය කිරීම
- VoIP පද්ධතිය ස්ථාපනය, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම පරිපාලනය කිරීම
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපකරණ දෝෂ නිරාකරණය සහ නඩත්තු කිරීම
- මෘදුකාංග ස්ථාපනය කිරීම සහ ආරක්ෂක මෘදුකාංග සැපයීම
- පිරිවිතර සකස් කිරීම සහ තාක්ෂණික ඇගයීම්
- විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අවශ්‍යතා සඳහා සහාය වීම
- සිසුන් සඳහා උපදේශන සේවා සහ තාක්ෂණික සහාය ලබා දීම

පුස්තකාලාධිපති, ආචාර්ය නයනා විජයසුන්දර මහත්මියගේ මඟ පෙන්වීම යටතේ, එක් නියෝජ්‍ය පුස්තකාලාධිපතිවරයෙකු, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිපති (I ශ්‍රේණිය) නිලධාරීන් 04 දෙනෙකු, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිපතිවරුන් (II ශ්‍රේණිය) 04 දෙනෙකු, සහකාර පුස්තකාලාධිපතිවරුන් 02 දෙනෙකු, එක් සහකාර ජාල කළමනාකරුවෙකු, සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 40 දෙනෙකු (කොන්ත්‍රාත් පදනම මත එක් අයෙකු ද ඇතුළුව) 2024 වර්ෂයේදී පුස්තකාලයේ රාජකාරිවල නිරත වූහ. 2024 දෙසැම්බර් මාසයේදී, කාර්ය මණ්ඩල සාමාජිකයින් 13 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත පුස්තකාලයට බඳවා ගත් අතර, ඒ අනුව අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ මුළු සංඛ්‍යාව 53ක් බවට පත් විය.

2024 වර්ෂය තුළ, වාර්ෂික ප්‍රතිපාදන වලින් රු. 1,679,019.41 ක වියදමින් ග්‍රන්ථ නාම 173ක් (පිටපත් 355) මිල දී ගන්නා ලදී. දේශීය වාර සඟරාවක් (මුද්‍රිත) රු. 3000.00 ක වියදමින් මිල දී ගන්නා ලදී. JSTOR (රු. මිලියන 1.31ක වියදමින්) සහ Research4Life දත්ත සමුදාය (රු. මිලියන 0.46ක වියදමින්) යන පූර්ණ-පෙළ විද්‍යුත් දත්ත සමුදායන් දෙකක් මිල දී ගන්නා ලදී. ස්කූපස් දත්ත සමුදාය රු. මිලියන 6.91ක වියදමින් මිලදී ගන්නා ලදී. වටිනාකම රු. 3,771,070.99 ක්වූ ග්‍රන්ථ නාම 1055ක පිටපත් 1667ක් සහ වටිනාකම රු. 99,902.34ක් වූ දේශීය හා විදේශීය වාර සඟරා නාම 35ක පිටපත් 115ක් පරිත්‍යාග ලෙස ලැබුණි. මීට අමතරව, Emerald, Taylor & Francis, Oxford University Press Journals යන අනෙකුත් විද්‍යුත් දත්ත සමුදායන් 03කට ප්‍රවේශය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ CONSAL සම්මුතිය හරහා පරිශීලකයින්ට ලබා දෙන ලදී. එමෙන්ම, බ්‍රිතාන්‍ය පුස්තකාලයේ ලේඛන සැපයීමේ සේවාව CONSAL හරහා පාඨකයින් සඳහා සපයන ලදී. EBSCOhost දත්ත සමුදායට ප්‍රවේශය කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධන මෙහෙයුම වේගවත් කිරීමේ ව්‍යාපෘතිය මගින් සපයන ලදී.

2024 වර්ෂය තුළ ග්‍රන්ථ නාම 848ක පිටපත් 1199ක් සැකසුම් අංශය සහ පීඨ පුස්තකාල මගින් සකසන ලදී. එම ප්‍රමාණය ලංකා එකතුව සඳහා පිටපත් 71කින් ද, ස්ථිර විමර්ශන එකතුව සඳහා පිටපත් 79කින් ද, කාලසටහන්ගත විමර්ශන එකතුව සඳහා පිටපත් 111කින් ද, සහ ග්‍රන්ථ බැහැර දීමේ එකතුව සඳහා පිටපත් 938කින් ද සමන්විත විය. 2024 වසර අවසානය වන විට පුස්කොළ පොත් දහඅටක් (18) සංරක්ෂණය කිරීමෙන් අනතුරුව පුස්කොළ පොත් ලේඛනයේ ලේඛනගත කරන ලදී.

2024 වර්ෂය තුළ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 31දෙනෙකු, අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 11 දෙනෙකු, උපාධි අපේක්ෂක සිසුන් 4237 දෙනෙකු සහ පශ්චාත් උපාධි සිසුන් 209 දෙනෙකු ඇතුළුව පාඨකයින් 4488ක් පමණ ලියාපදිංචි වී ඇති අතර ඒ සමඟින් ලියාපදිංචි පරිශීලකයින්ගේ මුළු සංඛ්‍යාව 21,550ක් විය.

අන්තර්-පුස්තකාල බැහැරදීම් ඉල්ලීම් ඉටු කිරීමේ අනුපාතය 87.6%ක් විය. 2024 වර්ෂයේදී පරිශීලකයින් 140 දෙනෙකු විසින් ලැප්ටොප් බැහැර දීමේ සේවාව භාවිතා කරන ලදී. පුස්තකාලය මෙම සේවාව සඳහා ලැප්ටොප් පරිගණක 30ක් වෙන් කර තිබුණ ද, ක්‍රියාකාරී තත්ත්වයේ ඇත්තේ 21ක් පමණි. විශ්වවිද්‍යාල ප්‍රකාශන සඳහා ISBN අංක 14 ක් සහ ISSN අංක 15ක් ලබා ගන්නා ලදී.

ප්‍රධාන පුස්තකාලයේ ආසන ධාරිතාවය 643කි. වෛද්‍ය පීඨ පුස්තකාලයේ ආසන ධාරිතාව 100ක් ද, තාක්ෂණ පීඨ පුස්තකාලයේ 55ක් ද, ඉංජිනේරු පීඨ පුස්තකාලයේ 50ක් ද විය.

ස්කොලර් බැන්ක් (ඩිජිටල් ගබඩාව) හි මුළු ඇතුළත් කිරීම් සංඛ්‍යාව 11,317ක් වූ අතර, 2024 අවසානය වන විට පුවත්පත් ලිපි දත්ත සමුදාය තෝරාගත් පුවත්පත් ලිපි 10,200කින් සමන්විත විය. වර්ෂය තුළ පුස්කොළ පොත් තිස් හතක් ස්කොලර් බැන්ක් වෙත ඇතුළත් කරන ලදී. තොරතුරු සම්පත් සහ තොරතුරු සාක්ෂරතා කුසලතා පිළිබඳ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම සඳහා පුස්තකාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් විද්වතුන් සහ සිසුන් සඳහා වැඩමුළු එකොළහක් පවත්වන ලදී. තවද, 2024 වර්ෂය තුළ පුස්තකාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් සම සමාලෝචිත සුචිගත සඟරා ලිපියක් 01ක්, සම සමාලෝචිත සුචිගත නොකළ සඟරා ලිපි 02ක්, සම්මන්ත්‍රණ පූර්ණ පත්‍රිකා 02ක් සහ සම්මන්ත්‍රණ සාරාංශ 6ක් ප්‍රකාශයට පත් කරන ලදී.

සහකාර පුස්තකාලාධිපතිවරුන් දෙදෙනෙකු විසින් ශාස්ත්‍රපති උපාධි හදාරනු ලැබූ අතර, පුස්තකාල තොරතුරු සහායකයින් දෙදෙනෙකු පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරමින් සිටියහ. 2024 දී, පුස්තකාල ශාස්ත්‍රීය කාර්ය මණ්ඩලයේ 04 දෙනෙකු සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 01 අයෙකු විශ්වවිද්‍යාල පුස්තකාලාධිපතිවරුන්ගේ සංගමය විසින් සංවිධානය කරන ලද වැඩමුළු දෙකකට සහභාගී වූහ.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි සහ විස්තීරණ පාඨමාලා ඒකකය, වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව ආරම්භ කිරීමත් සමඟ 1979 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. අනතුරුව ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව, විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධිය සහ විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය (බාහිර) උපාධිය යන පාඨමාලා ද ආරම්භ කරන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 932 දරන චක්‍රලේඛය ප්‍රකාරව 2010 දී බාහිර උපාධි ඒකකය, බාහිර උපාධි සහ විස්තීරණ පාඨමාලා ඒකකය ලෙස පරිවර්තනය විය. ඉන් අනතුරුව පරිසර සහ සංවර්ධන අධ්‍යයනය පිළිබඳ සමාජ විද්‍යාවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය 2014 දී ආරම්භ කරන ලද අතර විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධිය 2021 දී ආරම්භ කරන ලදී.

මෙම ඒකකය විශ්වවිද්‍යාලයේ සභාව විසින් පත් කරනු ලබන අධ්‍යක්ෂවරයෙකු විසින් මෙහෙයවනු ලබයි. වර්තමානයේ, මහාචාර්ය ජී. ඩී. වී. රූපිකා සේනාධීර මහත්මිය බාහිර උපාධි සහ විස්තීරණ පාඨමාලා ඒකකයෙහි අධ්‍යක්ෂවරිය වේ. ඊට අමතරව, මෙම ඒකකය ඉගෙනුම් සම්පත් අංශය, ඇගයීම් සහ ශිෂ්‍ය සහාය අංශය සහ ලියාපදිංචි කිරීම් සහ විභාග අංශය ලෙස මනාව අර්ථදක්වන ලද උප අංශ තුනකින් සමන්විත වේ. සෑම අංශයකම ප්‍රධානත්වය දරනු ලබන්නේ සම්බන්ධීකාරකවරයෙකු විසිනි. මෙම ඒකකය විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමාගේ සභාපතිත්වයෙන් යුත් කළමනාකරණ කමිටුවක් මගින් පාලනය වේ. ශාස්ත්‍රීය වැඩසටහන් පැවැත්වීම සඳහා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය සහ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය යටතේ බාහිර උපාධි සහ විස්තීරණ පාඨමාලා ඒකකයෙහි වෙනම අධ්‍යයන මණ්ඩල දෙකක් ස්ථාපිත කර ඇත.

### උපාධි පාඨමාලා

වර්තමානයේ, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය මගින් බාහිර උපාධි පාඨමාලා හතරක් සහ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය මගින් බාහිර උපාධි පාඨමාලා හතරක් පිරිනමනු ලැබේ.

## 1. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය විසින් පිරිනමනු ලබන උපාධි

- ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය
- ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය
- පරිසර සහ සංවර්ධන අධ්‍යයනය පිළිබඳ සමාජ විද්‍යාවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය
- ව්‍යවහාරික පොලිස් අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය

## 2. කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය විසින් පිරිනමනු ලබන උපාධි

- වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය
- විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය (බාහිර) උපාධිය
- විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධිය
- විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධිය

### ශිෂ්‍ය ලියාපදිංචිය

2024/2025 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 3827 දෙනෙකු ලියාපදිංචි වී ඇත. ඔවුන් අතරින් සිසුන් 2843 දෙනෙකු මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයට අයත් වන අතර සිසුන් 1133 දෙනෙකු කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයට අයත් වේ. විෂය නිර්දේශ සංශෝධන ක්‍රියාවලිය හේතුවෙන් 2024 අධ්‍යයන වර්ෂය සඳහා ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය සඳහා සිසුන් ලියාපදිංචි කර නොමැත. උපාධිය අවසන් කර ඇති බැවින් 2017 අධ්‍යයන වර්ෂයෙන් පසුව විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහර උපාධිය සඳහා සිසුන් ලියාපදිංචි කර නොමැත.

| උපාධි වැඩසටහන | **2024 අධ්‍යයන වර්ෂය සඳහා ලියාපදිංචි මුළු සිසුන් සංඛ්‍යාව** |
|---|---|
| ශාස්ත්‍රවේදී උපාධිය (සාමාන්‍ය) බාහිර උපාධිය | 2577 |
| පාරිසරික හා සංවර්ධන අධ්‍යයනයන් පිළිබඳ සමාජ විද්‍යාවේදී බාහිර උපාධිය ( සාමාන්‍ය ) | 116 |
| වාණිජ විද්‍යාවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | 462 |
| විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය (බාහිර) උපාධිය | 457 |
| ව්‍යාපාර අධ්‍යයනයන් පිළිබඳ විද්‍යාවේදී ( සාමාන්‍ය ) බාහිර උපාධිය | 214 |
| පොලිස් අධ්‍යනයන් පිළිබඳ ශාස්ත්‍රවේදී ( සාමාන්‍ය ) උපාධිය | 150 |
| **2024 අධ්‍යයන වර්ෂය සඳහා ලියාපදිංචි මුළු සිසුන් සංඛ්‍යාව** | **3976** |

2024/12/31 දිනට ලියාපදිංචි වූ මුළු සිසුන් සංඛ්‍යාව 50171 කි.

මූලාශ්‍රය: බාහිර විභාග පද්ධතිය

2024 වර්ෂය සඳහා බාහිර උපාධි ශිෂ්‍යයින්ගෙන් ලැබුණු මුදල්

| පාඨමාලාව | ලැබුණු මුදල් ප්‍රමාණය |
|---|---|
| ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ විද්‍යාවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | 48,109,849.80 |
| ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | 628,456,090.00 |
| ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | 14,815,715.00 |
| වානිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | 159,207,940.00 |
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | 28,215,000.00 |
| ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | 7,859,230.00 |
| කළමනාකරණය (රාජ්‍ය) පිළිබඳ (සාමාන්‍ය) බාහිර උපාධිය | 114,432,450.00 |
| පාරිසරික හා සංවර්ධන අධ්‍යයනයන් පිළිබඳ සමාජ විද්‍යාවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | 25,664,000.00 |

මූලාශ්‍රය: බාහිර විභාග පද්ධතිය

## <u>දිශානති වැඩසටහන්</u>

ලියාපදිංචිය, සම්මන්ත්‍රණ, විභාග ක්‍රියාවලිය, විභාග නීති රීති පිළිබඳ සියලු තොරතුරු දිශානති වැඩසටහනේදී සහ බාහිර උපාධි සහ විස්තීරණ පාඨමාලා ඒකකයේ වෙබ් අඩවිය හරහා සිසුන්ට දැනුම් දෙන ලදී. බාහිර උපාධි සහ විස්තීරණ පාඨමාලා ඒකකය මගින් 2024 වර්ෂයේදී එක් එක් උපාධි පාඨමාලාව සඳහා වෙනම දිශානති වැඩසටහන් හයක් පවත්වන ලද අතර, එහි පටිගත කිරීම් EDECU වෙබ් අඩවියෙන් ලබාගත හැක. 2024 දී පවත්වන ලද දිශානති වැඩසටහන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

මූලාශ්‍රය: බාහිර විභාග පද්ධතිය

| දිශානති වැඩසටහන | පවත්වන ලද දිනය |
|---|---|
| ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | 2024.12.22 |
| පාරිසරික හා සංවර්ධන අධ්‍යයනයන් පිළිබඳ සමාජ විද්‍යාවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | |
| වානිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | 2024.12.21 |
| කළමනාකරණය (රාජ්‍ය) පිළිබඳ විද්‍යාවේදී සාමාන්‍ය (බාහිර) උපාධිය | |
| ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ විද්‍යාවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | |

## සම්මන්ත්‍රණ

කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය සහ විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි සහ විස්තීරණ පාඨමාලා ඒකකය සමඟ සහයෝගයෙන් යුතුව අදාළ අධ්‍යයනාංශ මගින් උපාධි පාඨමාලා සඳහා සම්මන්ත්‍රණ මාලාවක් සහ ශාස්ත්‍රීය මඟ පෙන්වීම් සිදු කරනු ලබයි. 2024 වර්ෂය තුළ එක් එක් උපාධි පාඨමාලාව සඳහා පවත්වන ලද සම්මන්ත්‍රණ පිළිබඳ විස්තර පහත දැක්වේ.

### 2024 වර්ෂය සඳහා වූ සම්මන්ත්‍රණ සැසි පිළිබඳ සාරාංශය

| උපාධිය | 2024 දී පවත්වන ලද සම්මන්ත්‍රණ ගණන |
|---|---|
| ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | 1311 |
| ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | 250 |
| පාරිසරික හා සංවර්ධන අධ්‍යයනයන් පිළිබඳ සමාජ විද්‍යාවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | 134 |
| ව්‍යවහාරික පොලිස් අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | 72 |
| වානිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | 356 |
| කළමනාකරණය (රාජ්‍ය) පිළිබඳ විද්‍යාවේදී සාමාන්‍ය (බාහිර) උපාධිය | 380 |
| ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ විද්‍යාවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | 720 |
| **2024 දී පවත්වන ලද මුළු සම්මන්ත්‍රණ ගණන** | **3223** |

මූලාශ්‍රය: තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකය – බා.උ.වි.පා. ඒකකය

## විභාග

2024 වර්ෂය තුළ බාහිර උපාධි සහ විස්තීරණ පාඨමාලා ඒකකය විසින් එක් එක් උපාධි පාඨමාලාව සඳහා පවත්වන ලද විභාග පිළිබඳ විස්තර පහත දැක්වේ.

### බාහිර උපාධි සහ විස්තීරණ පාඨමාලා ඒකකය මගින් පවත්වනු ලබන විභාග පිළිබඳ විස්තර

| උපාධි වැඩසටහන | 2024 දී පවත්වන ලද විභාග ගණන | | |
|---|---|---|---|
| | **I** වන කොටස | **II** වන කොටස | **III**වන කොටස |
| ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය ( නව විෂය නිර්දේශය ) | 2 | 1 | 1 |

| | | | |
|---|---|---|---|
| පාරිසරික හා සංවර්ධන අධ්‍යයනයන් පිළිබඳ සමාජ විද්‍යාවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | 1 | 1 | 1 |
| ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | 1 | 1 | 1 |
| ව්‍යවහාරික පොලිස් අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | I වන සෙමෙස්තරය | - | - |
| වානිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය ( නව විෂය නිර්දේශය ) | 2 | 1 | 1 |
| කළමනාකරණය (රාජ්‍ය) පිළිබඳ විද්‍යාවේදී සාමාන්‍ය (බාහිර) උපාධිය | 1 | 2 | 1 |
| ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | 2 | 2 | 2 |
| ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ විද්‍යාවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | I වන සෙමෙස්තරය | I වන සෙමෙස්තරය | I වන සෙමෙස්තරය |
| | II වන සෙමෙස්තරය | II වන සෙමෙස්තරය 1 | II වන සෙමෙස්තරය 1 |
| එක් එක් කොටස සඳහා පවත්වන ලද මුළු විභාග සංඛ්‍යාව | 12 | 10 | 09 |
| **2024** දී පවත්වන ලද මුළු විභාග සංඛ්‍යාව | **31** | | |

මූලාශ්‍රය: විභාග ඒකකයේ වාර්තා – බා.උ.වි.පා. ඒකකය

පහත සඳහන් උපාධි ලියාපදිංචි කිරීමේ කාලය පහත පරිදි අවසන් විය.

| **උපාධි වැඩසටහන** | **අධ්‍යයන වර්ෂය** | **ලියාපදිංචිය අවසන් වූ දිනය** |
|---|---|---|
| ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | 2011 | 31.12.2018 |
| | 2014 | 31.08.2021 |
| | 2016 | 31.10.2023 |
| වානිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | 2015 | 28.02.2023 |
| කළමනාකරණය (රාජ්‍ය) පිළිබඳ විද්‍යාවේදී සාමාන්‍ය (බාහිර) උපාධිය | 2015 | 30.04.2023 |
| ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | 2014 | 31.07.2021 |
| පාරිසරික හා සංවර්ධන අධ්‍යයනයන් පිළිබඳ විද්‍යාවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | 2014 | 31.08.2021 |

අවසාන විභාග 2024 වර්ෂයේදී පවත්වන ලදී.

විභාග ඒකකයේ වාර්තා – බා.උ.වි.පා. ඒකකය

## අධීක්ෂණය කරන ලද මාර්ගගත (Online) විභාග

බාහිර උපාධි සහ විස්තීරණ පාඨමාලා ඒකකය විසින් 2024 දී ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (LMS) හරහා විදේශීය සිසුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා අධීක්ෂණය කරන ලද මාර්ගගත විභාග සාර්ථකව පවත්වන ලදී. අධීක්ෂණය කරන ලද මාර්ගගත විභාගවල සාරාංශය පහත පරිදි වේ.

ඉහත සඳහන් කළ අධීක්ෂණය කරන ලද මාර්ගගත විභාගවලින් ඇමරිකානු ඩොලර් 12,236.81ක් උපයා ඇත.

| උපාධි නාමය | උපාධියේ අදාළ කොටස | විභාග ගණන |
|---|---|---|
| ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය සහ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාව පිළිබඳ බාහිර (සාමාන්‍ය) උපාධිය | I | 01 |
| | II | 01 |
| | III | 01 |
| ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | I | 01 |
| | II | 01 |
| | III | 01 |
| පාරිසරික හා සංවර්ධන අධ්‍යයනයන් පිළිබඳ සමාජ විද්‍යාවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | I | 01 |
| ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | I | 01 |
| | II | 01 |
| | III | 01 |
| වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | I | 01 |
| | II | 01 |
| | III | 01 |
| කළමනාකරණය (රාජ්‍ය) පිළිබඳ විද්‍යාවේදී සාමාන්‍ය (බාහිර) උපාධිය | I | 01 |
| | II | 01 |
| ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ විද්‍යාවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | Part II වන සෙමෙස්තරය I | 01 |
| **මුළු විභාග ගණන** | | **16** |

විභාග ඒකකයේ වාර්තා – බා.උ.වි.පා. ඒකකය

## උපාධි ප්‍රදානෝත්සවය

18 වන බාහිර උපාධි ප්‍රදානෝත්සවය 2025 ජනවාරි 11 වන දින පවත්වන ලදී.

| **උපාධි වැඩසටහන** | **මුළු උපාධිධාරීන්** |
|---|---|
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | 475 |
| ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | 292 |
| පාරිසරික හා සංවර්ධන අධ්‍යයනයන් පිළිබඳ සමාජ විද්‍යාවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | 62 |
| ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | 153 |
| වානිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | 394 |
| කළමනාකරණය (රාජ්‍ය) පිළිබඳ විද්‍යාවේදී සාමාන්‍ය (බාහිර) උපාධිය | 264 |
| ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | 265 |
| ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ විද්‍යාවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | 42 |
| **මුළු උපාධිධාරීන් සංඛ්‍යාව** | **1947** |

විභාග ඒකකයේ වාර්තා – බා.උ.වි.පා. ඒකකය

## වැඩසටහන් සමාලෝචනය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතික කිරීමේ සහ ප්‍රතීතන සභාව (QAAC) විසින් ලබා දුන් මගපෙන්වීම අනුව, භාහිර උපාධි සහ විස්තීර්ණ පාඨමාලා ඒකකයෙහි තත්ව සහතික කිරීමේ ඒකකය විසින් බාහිර උපාධි වැඩසටහන් පහක් සඳහා වැඩසටහන් සමාලෝචනයක් පවත්වන ලදී.

- වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය
- කළමනාකරණවේදී (රාජ්‍ය) සාමාන්‍ය (බාහිර) උපාධිය
- ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය
- සමාජ විද්‍යාවේදී පරිසර සහ සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධිය
- මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා (සාමාන්‍ය) බාහිර උපාධිය

ඉහත උපාධි වැඩසටහන් අතරින්, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා (සාමාන්‍ය) බාහිර උපාධිය, සමාජ විද්‍යාවේදී පරිසර සහ සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධිය සහ ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි (සාමාන්‍ය) බාහිර උපාධිය සඳහා 2023 වර්ෂයේදීත්, වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය සඳහා 2024 වර්ෂයේදීත් ක්ෂේත්‍ර චාරිකා පවත්වන ලදී.

| උපාධි වැඩසටහන | අවසාන ප්‍රතිඵලය |
|---|---|
| මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා )සාමාන්‍ය (බාහිර උපාධිය | "A" ශ්‍රේණිය |
| වාණිජවේදී )සාමාන්‍ය (බාහිර උපාධිය | "A" ශ්‍රේණිය |
| සමාජ විද්‍යාවේදී පරිසර සහ සංවර්ධන අධ්‍යයන )සාමාන්‍ය (බාහිර උපාධිය | "B" ශ්‍රේණිය |
| ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි )සාමාන්‍ය (බාහිර උපාධිය | "C" ශ්‍රේණිය |

## කමිටු රැස්වීම්

භාහිර උපාධි සහ විස්තීර්ණ පාඨමාලා ඒකකය මගින් 2024 වර්ෂයේදී කළමනාකරණ කමිටු රැස්වීම් 11ක්, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය සඳහා අධ්‍යයන මණ්ඩල රැස්වීම් 10ක් සහ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය සඳහා අධ්‍යයන මණ්ඩල රැස්වීම් 09ක් පවත්වන ලදී.

## විශ්වවිද්‍යාල වෛද්‍ය මධ්‍යස්ථානය

විශ්වවිද්‍යාල වෛද්‍ය මධ්‍යස්ථානය මගින් විශ්වවිද්‍යාල ප්‍රජාවගේ වෛද්‍ය ගැටලු පිළිබඳව සොයා බලනු ලැබේ. 15,000 ක පමණ වන මෙම ප්‍රජාව සඳහා සිසුන්ට, කාර්ය මණ්ඩලයට සහ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ පවුල්වල සාමාජිකයින්ට ප්‍රතිකාර කිරීම, අඛණ්ඩ සත්කාර, නිවාරණ සත්කාර සහ උපදේශන සේවා සැපයීම ඊට ඇතුළත් වේ. මහජන සෞඛ්‍ය පරීක්ෂක අංශය මගින් විශ්වවිද්‍යාලය තුළ ඩෙංගු මර්දන, ජලභීතිකා මර්දන වැඩසටහන්, පලිබෝධ පාලනය සහ ආහාර තත්ත්ව පාලනය සිදු කරනු ලබයි.

සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට මානසික සහය සහ උපදෙස් ලබා දෙමින් උපදේශකවරුන් විශ්වවිද්‍යාලය පුරා විසිරී සේවය සපයයි. ව්‍යවහාරික විද්‍යා පීඨයේ උපදේශකවරුන් දෙදෙනෙකු, කළමනාකරණ පීඨයේ තිදෙනෙකු සහ ඉංජිනේරු හා තාක්ෂණ පීඨ සඳහා එක් අයෙකු බැගින් සිටී. ඔවුන්ගේ කාලසටහන සහ සම්බන්ධතා අංක විශ්වවිද්‍යාල වෙබ් අඩවියේ වෛද්‍ය මධ්‍යස්ථානය යටතේ ලබා ගත හැක.

වෛද්‍ය මධ්‍යස්ථානය, රෝගීන් ලියාපදිංචි කිරීම, වේලාවන් වෙන්කරවා ගැනීම සහ ඖෂධ නිකුත් කිරීම දක්වා විහිදුනු පූර්ණ ඉලෙක්ට්‍රොනික සෞඛ්‍ය වාර්තා සේවාවකින් සමන්විත වේ. මෙය ඩිජිටල්කරණයට ලක්වූ ප්‍රථම විශ්වවිද්‍යාල වෛද්‍ය මධ්‍යස්ථානයයි. 2023 වර්ෂයේදී අපගේ වෛද්‍ය මධ්‍යස්ථානය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් පිරිනමනු ලබන තත්ත්ව කළමනාකරණය සඳහා වන ISO 9001:2015 ප්‍රමිතිය ලබාගත් ශ්‍රී ලංකාවේ ප්‍රථම වෛද්‍ය මධ්‍යස්ථානය බවට පත් විය.

2024 වර්ෂය තුළ වෛද්‍ය එස්. ද සිල්වා මහත්මිය ස්ථාන භාර වෛද්‍ය නිලධාරී ලෙස සේවය කළාය. වෛද්‍ය ඩී.එම්.එල්.ආර්.එච්. පෙරේරා මහත්මිය වෛද්‍ය නිලධාරිනියක ලෙසත්, වෛද්‍ය ඩී.පී.ඩී. අසලගේ මහතා දන්ත ශල්‍ය වෛද්‍යවරයකු ලෙසත් සේවය කළහ. වෛද්‍ය කේ.ජී.එන්. සෙනෙවිරත්න, වෛද්‍ය අනෝමා අරංගල සහ වෛද්‍ය එස්.එම්.ඩී.ජී.එස්. පෙරේරා යන මහත්ම මහත්මීන් ආදේශක වෛද්‍ය නිලධාරීන් ලෙස සේවය කළහ.

*සංඛ්‍යාලේඛන*

| සාමාන්‍ය වෛද්‍ය ප්‍රතිකාර ගත් රෝගීන් සංඛ්‍යාව | ෆාමසිය වෙත යොමු කළ බෙහෙත් වට්ටෝරු සංඛ්‍යාව | දන්ත ප්‍රතිකාර ගත් රෝගීන් සංඛ්‍යාව |
|---|---|---|
| 22449 | 13682 | 607 |

2024 වර්ෂයේදී වෛද්‍ය මධ්‍යස්ථානය විසින් පහත සඳහන් වැඩසටහන් පවත්වන ලදී:

- 2024 මාර්තු 20 වන දින ලෝක මුඛ සෞඛ්‍ය දිනය – වෛද්‍ය මධ්‍යස්ථානය සහ දන්ත වෛද්‍ය පීඨය විසින් වෛද්‍ය මධ්‍යස්ථාන පරිශ්‍රයේදී පවත්වන ලදී.
- 2024 නොවැම්බර් 10 වන දින අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන – වෛද්‍ය මධ්‍යස්ථානය සහ කළමනාකරණ පීඨයේ විශ්‍රාමික ආදි ශිෂ්‍ය කාර්ය මණ්ඩලය විසින් පවත්වන ලදී.
- 2024 නොවැම්බර් 22 වන දින මහරගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය සමඟ එක්ව සරම්ප/රුබෙල්ලා සඳහා එන්නත් කිරීමේ වැඩසටහන.
- 2024 ඔක්තෝබර් 15 වන දින නේවාසිකාගාර භාරකරුවන් සඳහා ප්‍රථමාධාර වැඩසටහන්

# පර්යේෂණ සභාව

**හැඳින්වීම**

උසස් තත්ත්වයේ පර්යේෂණ සඳහා පහසුකම් සැලසීම, ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් ජනනය කරන ලද දැනුම ව්‍යාප්ත කිරීම ප්‍රවර්ධනය කිරීම සහ ජාතික සංවර්ධනයට සැලකිය යුතු දායකත්වයක් ලබා දීම යන අරමුණු පෙරදැරි කරගෙන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සභාව (RC-USJ) 2016 දී පිහිටුවන ලදී. එකී සභාවේ ක්‍රියාකාරකම් ඉලක්ක කර ඇත්තේ විශ්වවිද්‍යාලයේ විද්වතුන්, විධායක නිලධාරීන් සහ සිසුන් උසස් තත්ත්වයේ පර්යේෂණවල නිරත වීමට දිරිමත් කිරීමයි.

යටිතල පහසුකම් සංවර්ධනයට පහසුකම් සැලසීම, පර්යේෂණ සඳහා අරමුදල් ලබා දීම, දැනුම ව්‍යාප්ත කිරීමට පහසුකම් සැලසීම සහ ජාතික හා ජාත්‍යන්තර සහයෝගීතාව දිරිමත් කිරීම තුළින් විශ්වවිද්‍යාලය තුළ පර්යේෂණ සංස්කෘතියක් වර්ධනය කිරීමට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සභාව අපේක්ෂා කරයි. පර්යේෂණ ප්‍රදාන ක්‍රමවේදයක් මගින් පර්යේෂකයන්ගේ කාර්යයන් ඇගයීම සහ ඔවුන්ට ත්‍යාග පිරිනැමීම තුළින් ඔවුන්ව ප්‍රවර්ධනය කිරීම ද ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සභාවෙහි අරමුණයි

## මෙහෙවර

වර්තමාන සහ අනාගත පරම්පරාවේ යහපැවැත්ම උදෙසා, පාරිසරික, සමාජීය, ආර්ථික පදනම්වල ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා විශිෂ්ටත්වය සහ සාර්ථක පර්යේෂණ හා සංවර්ධනය මත පදනම් වූ දියුණුවක් ළඟා කර ගැනීමට හැකි වාතාවරණයක් නිර්මාණය කිරීම සහ පහසුකම් සැලසීම මගින් අරමුදල් සහ යටිතල පහසුකම් සඳහා ප්‍රවේශය පුළුල් කිරීම තුළින් පර්යේෂණ හා සංවර්ධනය පෝෂණය කිරීම, ඒ සමඟම ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ප්‍රජාව විසින් දේශීය හා ජාත්‍යන්තර පාර්ශ්වකාර ආයතන සමඟ තිරසාර හවුල්කාරිත්වයන් ගොඩනැගීම.

## අරමුණු

1. ජාතික හා ගෝලීය අවශ්‍යතාවලට සරිලන පරිදි ජාතික හා ජාත්‍යන්තර වැදගත්කමක් ඇති පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම
2. විශ්වවිද්‍යාලය තුළ හිතකර පර්යේෂණ සංස්කෘතියක් නිර්මාණය කිරීම
3. පර්යේෂණ ක්ෂේත්‍රයේ ස්වයං-තිරසාර විශිෂ්ටතා මධ්‍යස්ථාන පිහිටුවීම
4. ගුණාත්මක පර්යේෂණ සඳහා සහයෝගයෙන් කටයුතු කිරීමට පර්යේෂකයන්ට පහසුකම් සැලසීම
5. පර්යේෂකයන්ගේ කුසලතා වැඩි දියුණු කිරීම
6. පර්යේෂණ ක්‍රියාවලිය සුමට කිරීම
7. ජාතික හා ජාත්‍යන්තර වශයෙන් තම දැනුම ව්‍යාප්ත කිරීමට පර්යේෂකයන්ට පහසුකම් සැලසීම
8. කර්මාන්ත සබඳතා ප්‍රවර්ධනය කිරීම සහ පර්යේෂණ උපදේශන සඳහා පහසුකම් සැලසීම
9. උසස් තත්ත්වයේ ශිෂ්‍ය පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම
10. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සභාවෙහි සාමාජික ආයතනවල පර්යේෂණ මෙහෙයුම්වල කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම
11. පර්යේෂණ සහ එහි පරිපාලනය සම්බන්ධ අනෙකුත් සංවිධාන සමඟ සබඳතා ඇති කර ගැනීම සහ පවත්වාගෙන යාම

# නිලධාරීන්

| නම | තනතුර |
|---|---|
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එම්. පත්මලාල් | උපකුලපති /විධායක සභාපති - පර්යේෂණ සභාව |
| මහාචාර්ය රොෂාන් අජ්වඩ් | සමසභාපති |
| මහාචාර්ය ප්‍රදීපා ජයවර්ධන | සමසභාපති |
| ආචාර්ය ආර්. එම්. ඒ. යූ. රාජපක්ෂ | මහ ලේකම් |

**උපදේශක මණ්ඩලය )පීඨාධිපතිවරු(**

| | |
|---|---|
| මහාචාර්ය ශිරන්ත හීන්කෙන්ද | පීඨාධිපති- මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය |
| මහාචාර්ය එස් එම් සී යූ පී සුබසිංහ | පීඨාධිපති - ව්‍යවහාරික විද්‍යා පීඨය |
| මහාචාර්ය දූෂාන් ජයවික්‍රම | කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය |
| මහාචාර්ය මනෝරි ගමගේ | පීඨාධිපති – වෛද්‍ය විද්‍යා පීඨය |
| මහාචාර්ය පී. පී. ආර්. පෙරේරා | පීඨාධිපති – උපාධි අධ්‍යයන පීඨය |
| මහාචාර්ය නිල්මිණි ලියනගේ | පීඨාධිපති – තාක්ෂණ පීඨය |
| ආචාර්ය එම්. එන්. ධර්මවීර | පීඨාධිපති – ඉංජිනේරු පීඨය |
| මහාචාර්ය ඩී. අයි. උළුවඩුගේ | පීඨාධිපති – සම සෞඛ්‍ය විද්‍යා පීඨය |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුරංගි යසවර්ධන | පීඨාධිපති – දන්ත වෛද්‍ය විද්‍යා පීඨය |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පී.පී.එම්. ජයවීර | පීඨාධිපති – නාගරික සහ ජලජ ජෛව සම්පත් පීඨය |
| මහාචාර්ය ප්‍රසාද් එම් .ජයවීර | පීඨාධිපති – පරිගණක පීඨය |

**සභාපතිවරු –පීඨ පර්යේෂණ කමිටු**

| | |
|---|---|
| මහාචාර්ය ටී .එම් .එස් .පී .කේ .තෙන්නකෝන් | මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය |
| මහාචාර්ය බී. එම්. එස්. ජී. බන්නැහැක | ව්‍යවහාරික විද්‍යා පීඨය |
| මහාචාර්ය කේ. පී. එල්. චන්ද්‍රලාල් | කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය |
| ආචාර්ය ගුවනි ලියනගේ | වෛද්‍ය විද්‍යා පීඨය |
| ආචාර්ය කේ කේ ඒ සංජීව | තාක්ෂණ පීඨය |
| ආචාර්ය නදීකා ජයසූරිය | ඉංජිනේරු පීඨය |
| ආචාර්ය එන්. ඩී. විතානගේ | සම සෞඛ්‍ය විද්‍යා පීඨය |

**පීඨ නියෝජිතයින්**

| නම | තනතුර |
|---|---|
| ගරු මහාචාර්ය පින්නවල සංඝසුමන හිමි | මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය |
| මහාචාර්ය සී .ඒ .ඩී .නාහල්ලගේ | මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ආර්. එල්. එස්. ප්‍රනාන්දු | කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය |
| මහාචාර්ය ටී. එස්. එම්. අමරසේන | කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය |
| ආචාර්ය රොහාන් දසනායක | තාක්ෂණ පීඨය |
| ආචාර්ය ගයාන් ප්‍රියදර්ශන | තාක්ෂණ පීඨය |
| ආචාර්ය යූ. කේ. විජේනායක | ඉංජිනේරු පීඨය |
| ආචාර්ය ජනිතා වල්පිට | නාගරික සහ ජලජ ජෛව සම්පත් පීඨය |
| ආචාර්ය ජේ.ඒ.එස්. චතුරිකා | නාගරික සහ ජලජ ජෛව සම්පත් පීඨය |

| | |
|---|---|
| මහාචාර්ය හිරාන් අමරසේකර | ප්‍රධානී – විශ්වවිද්‍යාල වෙබ් කණ්ඩායම |
| මහාචාර්ය එස්.ටී.ඩබ්ලිව්.එස්. යාපා | අධ්‍යක්ෂ – කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ලලිත් කරුණානායක | ආරාධිත |
| මහාචාර්ය මෙත්තිකා විතානගේ | ආරාධිත |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එච් එච් ඩී එන් පී ඔපාත | ආරාධිත |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කේ. ඩී. ගුණවර්ධන | ආරාධිත |
| ආචාර්ය චමීර උඩවත්ත | ආරාධිත /අධ්‍යක්ෂ (වි.ව්‍යා.ජාලය) |
| ආචාර්ය ඒ කේ එල් ජයවර්ධන | ආරාධිත –PIM |
| ආචාර්ය ඩබ් .ජී .එස් .කැලුම් )ජනවාරි – ජුනි( | අධ්‍යක්ෂ -PIM |
| ආචාර්ය අසංග රණසිංහ )ජුලි – මේ දක්වා( | අධ්‍යක්ෂ -PIM |
| ඒ. බී. වැලිවිට මහතා | ලේඛකාධිකාරී |
| ආචාර්ය ඩබ්ලිව්.ඒ.එන්.ඩී. විජේතිලක | පුස්තකාලාධිපති |
| කේ ටී සී ප්‍රියංගනී මිය | මූල්‍යාධිකාරී |
| සී ජී බාලසූරිය මිය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී – උපකුලපති කාර්යාලය |

## විශ්වවිද්‍යාලයීය පර්යේෂණ ප්‍රදාන

**2015 - 2024 වර්ෂය තුළ පිරිනමන ලද පර්යේෂණ ප්‍රදාන සංඛ්‍යාව**

| පීඨය/වර්ෂය | **2015** | **2016** | **2017** | **2018** | **2019** | **2021** | **2022** | **2024** |
|---|---|---|---|---|---|---|---|---|
| මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා | 05 | 10 | 09 | 12 | 09 | 05 | 10 | 09 |
| ව්‍යවහාරික විද්‍යා | 16 | 31 | 32 | 36 | 27 | 38 | 31 | 32 |
| කළමනාකරණ අධ්‍යයන හා වාණිජ | 13 | 04 | 10 | 07 | 08 | 11 | 05 | 07 |
| වෛද්‍ය විද්‍යා | 21 | 33 | 26 | 19 | 17 | 11 | 12 | 11 |
| තාක්ෂණ | - | - | 06 | 01 | 07 | 19 | 25 | 32 |
| ඉංජිනේරු | - | - | 01 | - | 01 | 02 | 05 | 04 |
| සම සෞඛ්‍ය විද්‍යා | - | - | - | - | 04 | 06 | 05 | 05 |
| නාගරික හා ජලජ ජෛව සම්පත් | - | - | - | - | - | - | - | 03 |
| පුස්තකාලය | - | - | - | - | 01 | - | - | - |
| එකතුව | **55** | **78** | **84** | **75** | **74** | **93** | **93** | **103** |

**2015 – 2024 වර්ෂය තුළ පර්යේෂණ ප්‍රදාන සඳහා වෙන් කරන ලද අරමුදල් (රු. මිලියන)**

| පීඨය/වර්ෂය | **2015** | **2016** | **2017** | **2018** | **2019** | **2021** | **2022** | **2024** |
|---|---|---|---|---|---|---|---|---|
| මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා | 7.24 | 19.51 | 13.67 | 17.37 | 15.42 | 8.96 | 18.01 | 13.39 |
| ව්‍යවහාරික විද්‍යා | 28.07 | 63.22 | 78.29 | 85.14 | 58.49 | 89.56 | 77.61 | 77.39 |
| කළමනාකරණ අධ්‍යයන හා වාණිජ | 8.92 | 3.23 | 9.06 | 3.33 | 9.28 | 10.34 | 8.09 | 7.4 |
| වෛද්‍ය විද්‍යා | 24.95 | 45.53 | 40.63 | 47.03 | 35.21 | 25.48 | 22.53 | 22.67 |
| තාක්ෂණ | - | - | 19.21 | 1.49 | 19.18 | 47.75 | 70.77 | 75.78 |
| ඉංජිනේරු | - | - | 2.14 | - | 2.46 | 5.9 | 8.20 | 9.34 |
| සම සෞඛ්‍ය විද්‍යා | - | - | - | - | 7.41 | 9.36 | 0.39 | 10.54 |
| නාගරික හා ජලජ ජෛව සම්පත් | - | - | - | - | - | - | - | 7.5 |
| පුස්තකාලය | - | - | - | - | 0.53 | - | - | - |
| එකතුව | **69.18** | **131.49** | **163.00** | **154.35** | **144.98** | **197.74** | **220.73** | **224.00** |

2025 පෙබරවාරි 19 වන දින වන විට පර්යේෂණ සභාව යටතේ පර්යේෂණ මධ්‍යස්ථාන විසි එකක් ක්‍රියාත්මක වේ. මෙම මධ්‍යස්ථාන ශක්තිමත් පර්යේෂණ පසුබිමක් ඇති කැපවීමෙන් හා උනන්දුවෙන් කටයුතු කරන ශාස්ත්‍රඥයින් විසින් අදාළ පීඨයන් තුළ ආරම්භ කර ඇත. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය පර්යේෂණ සභාව පිහිටුවීමත් සමඟ, එවැනි සියලුම මධ්‍යස්ථාන එහි අධීක්ෂණයට ලක් කර, හමුවීම් සහ සහයෝගීතාව සඳහා පොදු පර්යේෂණ, සංවර්ධන සහ නවෝත්පාදන වේදිකාවක් නිර්මාණය කර ඇත.

**පර්යේෂණ මධ්‍යස්ථාන පහත පරිදි වේ:**

| | පර්යේෂණ මධ්‍යස්ථානය | අධ්‍යක්ෂ |
|---|---|---|
| 1 | ජලයේ ගුණාත්මකභාවය සහ ඇල්ගී පර්යේෂණ මධ්‍යස්ථානය | ආචාර්ය එෆ් .එස් .ඉඩ්රූස් |
| 2 | වකුගඩු පර්යේෂණ මධ්‍යස්ථානය (CKD) – පර්යේෂණ | මහාචාර්ය පී .පී .ආර් .පෙරේරා |
| 3 | ජෛව තාක්‍ෂණය සහ ස්නායු විද්‍යාවේ නවෝත්පාදන සඳහා අන්තර් විෂය මධ්‍යස්ථානය | ආචාර්ය එම් .ආර් .පී .එච් .ලියනගේ |
| 4 | බහු-විෂය පර්යේෂණ මධ්‍යස්ථානය | මහාචාර්ය ටී .එම් .එස් .පී .කේ . තෙන්නකෝන් |
| 5 | කළමනාකරණ අධ්‍යයන හා වාණිජ මධ්‍යස්ථානය | ආචාර්ය නුවන් ගුණරත්න |
| 6 | පිළිකා පර්යේෂණ මධ්‍යස්ථානය (CCR) | ආචාර්ය කේ .එල් .එම් .ඩී .සෙනෙවිවික්‍රම |
| 7 | උසස් ද්‍රව්‍ය පර්යේෂණ මධ්‍යස්ථානය (නැනෝ තාක්ෂණය) | ආචාර්ය සී .ජේ .නාරංගොඩ |
| 8 | ජෛව තාක්ෂණ මධ්‍යස්ථානය | ආචාර්ය සචිනි ප්‍රනාන්දු |
| 9 | වන විද්‍යා හා පරිසර මධ්‍යස්ථානය | මහාචාර්ය දහම් ජයවර්ධන |
| 10 | රොබෝ විද්‍යාව සහ බුද්ධිමත් පද්ධති සඳහා නවෝත්පාදන මධ්‍යස්ථානය | ආචාර්ය පී .ආර් .එස් .ද සිල්වා |
| 11 | ඇපල් පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය | ආචාර්ය ඩී .ඩී .ඒ .ගාමිණී |
| 12 | නිශ්චල දේපළ අධ්‍යයන මධ්‍යස්ථානය | ආචාර්ය ටී .ජී .යූ .පී .පෙරේරා |
| 13 | පාලනය සහ රාජ්‍ය ප්‍රතිපත්ති සඳහා වූ පර්යේෂණ මධ්‍යස්ථානය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ආර් .එල් .එස් . ප්‍රනාන්දු |
| 14 | ශාක ද්‍රව්‍ය සහ ශාකසාර නිෂ්පාදන පර්යේෂණ මධ්‍යස්ථානය | ආචාර්ය එම් .එල් .ඒ .එම් .එස් .මුණසිංහ |
| 15 | පරිසර ගෝලයේ ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ පර්යේෂණ මධ්‍යස්ථානය | ආචාර්ය ආර් .එම් .ඒ .යූ .රාජපක්ෂ |
| 16 | බෝ නොවන රෝග පර්යේෂණ මධ්‍යස්ථානය (NCDRC) | මහාචාර්ය සී .එස් .ඊ .ගුණවර්ධන |
| 17 | සතිය පදනම් කරගත් පර්යේෂණ සහ භාවිතයන් සඳහා වූ | ආචාර්ය සනත් මහවිතානගේ |
| 18 | සමුද්‍ර විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය (CMST) | මහාචාර්ය ආර් .ආර් .එම් .කේ .පී . |
| 19 | විද්‍යාත්මක පරිගණකනය සහ උසස් ඖෂධ සොයාගැනීම් සඳහා වූ මධ්‍යස්ථානය | ආචාර්ය ආර් .එස් .ජයකොඩි |
| 20 | නැනෝ සංයුක්ත පර්යේෂණ මධ්‍යස්ථානය | ආචාර්ය ටී .එන් .බී .එටම්පාවල |
| 21 | ව්‍යාපාර පරිපාලනය සඳහා වූ පර්යේෂණ මධ්‍යස්ථානය (RCBA) | මහාචාර්ය එම් .ඩී .පුෂ්පකුමාරි |

**2024 වර්ෂයේ පර්යේෂණ මධ්‍යස්ථාන සඳහා වූ වියදම්**

| පර්යේෂණ ව්‍යාපෘතියේ නම | පීඨය | 2024 වර්ෂය සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන | 2024.12.31 දක්වා නිදහස් කර ඇති ප්‍රමාණය |
|---|---|---|---|
| ජෛවගෝලීය ස්ථාවරත්ව පර්යේෂණ මධ්‍යස්ථානය | FAS | 600,000.00 | 500,000.00 |
| ජලයේ ගුණාත්මකභාවය සහ ඇල්ගී පර්යේෂණ මධ්‍යස්ථානය | FAS | 600,000.00 | 550,000.00 |
| ජාත්‍යන්තර බහුවිධ විෂය පර්යේෂණ මධ්‍යස්ථානය | FHSS | 600,000.00 | 600,000.00 |
| ශාක ද්‍රව්‍ය සහ ශාකසාර නිෂ්පාදන පර්යේෂණ මධ්‍යස්ථානය | FAS | 600,000.00 | 0 |
| ජෛව තාක්ෂණ මධ්‍යස්ථානය | FAS | 600,000.00 | 550,000.00 |
| දේපළ කළමනාකරණ අධ්‍යයන මධ්‍යස්ථානය | FMSC | 600,000.00 | 600,000.00 |
| පිළිකා පර්යේෂණ මධ්‍යස්ථානය (CCR) | FMS | 600,000.00 | 591,935.48 |
| වන විද්‍යා හා පරිසර මධ්‍යස්ථානය | FAS | 300,000.00 | 450,000.00 |
| නැනෝ සංයුක්ත පර්යේෂණ මධ්‍යස්ථානය | FAS | 300,000.00 | 500,000.00 |
| වැඩිදියුණුකළ ද්‍රව්‍ය පර්යේෂණ මධ්‍යස්ථානය (නැනෝ තාක්‍ෂණය) | FAS | 600,000.00 | 300,000.00 |
| වකුගඩු පර්යේෂණ මධ්‍යස්ථානය (CKD - පර්යේෂණ) | FMS | 600,000.00 | 595,161.29 |
| බෝ නොවන රෝග පර්යේෂණ මධ්‍යස්ථානය (NCDRC) | FMS | 600,000.00 | 583,548.00 |
| සාගර විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය (CMST) | FAS | 600,000.00 | 550,000.00 |
| පාලනය සහ රාජ්‍ය ප්‍රතිපත්ති මධ්‍යස්ථානය | FMSC | 600,000.00 | 600,000.00 |
| කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ මධ්‍යස්ථානය | FMSC | 600,000.00 | 600,000.00 |
| ව්‍යාපාර පරිපාලන මධ්‍යස්ථානය | FMSC | 0 | 0 |
| විද්‍යාත්මක පරිගණනය සහ උසස් ඖෂධ සොයාගැනීමේ මධ්‍යස්ථානය | FAS | 600,000.00 | 600,000.00 |
| ඇපල් පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය | FAS | 600,000.00 | 400,000 |
| සතිය පදනම් කරගත් පර්යේෂණ සහ භාවිතයන් සඳහා වූ මධ්‍යස්ථානය | FMS | 0 | 0 |
| රොබෝ විද්‍යාව සහ බුද්ධිමත් පද්ධති සඳහා නවෝත්පාදන මධ්‍යස්ථානය | FAS | 0 | 0 |

| | | | |
|---|---|---|---|
| ජෛව තාක්ෂණය සහ ස්නායු විද්‍යාවේ නවෝත්පාදන සඳහා වූ අන්තර් විෂය මධ්‍යස්ථානය | FMS | 600,000.00 | 588,709.68 |
| උපකරණ මධ්‍යස්ථානය | FAS | 300,000.00 | 427,986.00 |

## විද්‍යාත්මක පර්යේෂණ සඳහා වන ජනාධිපති සහ වෙනත් සම්මාන

ශාස්ත්‍රඥයින් ඔවුන්ගේ ප්‍රධාන කාර්යය වන ඉගැන්වීමට අමතරව පර්යේෂණ සහ ප්‍රකාශන ක්‍රියාකාරකම්වල නිරත වේ. උසස් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නංවන ඔවුන්ගේ ශාස්ත්‍රීය ඉලක්ක සපුරා ගැනීම සඳහා විශ්වවිද්‍යාලය මූල්‍ය හා සියලු යටිතල පහසුකම් සපයයි. 2024 වර්ෂය තුළ අපගේ ශාස්ත්‍රඥයින් විසින් දිනාගත් සම්මාන පහත දැක්වේ.

**2021/2022/2023 වර්ෂ සඳහා විශ්වවිද්‍යාලයීය පර්යේෂණ සභාව විසින් පිරිනමන ලද පර්යේෂණ සම්මාන**

| ප්‍රවර්ග අංකය | විස්තරය | සම්මානලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | වසරකට අවම වශයෙන් කලාප දෙකක්වත් ප්‍රකාශයට පත් කරන විද්වත් සමාලෝචිත සඟරාවක පළ වූ පූර්ණ පර්යේෂණ පත්‍රිකාවක් | 218 |
| 2 | Q1, Q2, Q3, Q4 SCImago සඟරා කාර්තු ශ්‍රේණිගත කිරීම්වල ශ්‍රේණිගත කළ සුචිගත කළ සඟරාවක පළ වූ පූර්ණ පර්යේෂණ පත්‍රිකාවක් | 258 |
| 3 | ඉදිරිපත් කරන දිනය වන විට ඉහළ Google Scholar h-දර්ශකයක් ඇති පර්යේෂකයින්. | 42 |
| 4 | පිළිගත් සුචිගත කළ සඟරාවල වසරකට පූර්ණ පර්යේෂණ පත්‍රිකා 5ක් හෝ ඊට වැඩි ගණනක් ප්‍රකාශයට පත් කළ පර්යේෂකයින් | 36 |
| 5 | උපාධි අධ්‍යයන පීඨයෙහි ලියාපදිංචි වී 2021-2023 වර්ෂයේදී දර්ශනශූරී/දර්ශනපති| උපාධි සාර්ථකව අධීක්ෂණය කර සම්පූර්ණ කළ පර්යේෂකයින් | 35 |
| 6 | 2021, 2022, 2023 වර්ෂවලදී බාහිර පර්යේෂණ ප්‍රදාන ලබා ගත් පර්යේෂකයින් | 40 |
| 7 | එල්සෙවියර්/ස්ටැන්ෆර්ඩ් ලැයිස්තුවට අනුව -ලෝකයේ ඉහළම 2% විද්‍යාඥයින් අතරට නම් වූ පර්යේෂකයින් | 5 |
| 8 | 2021, 2022, සහ 2023 වර්ෂවලදී පේටන්ට් බලපත්‍ර ලබා ගත් පර්යේෂකයින් | 9 |
| 9 | ඉදිරිපත් කරන දිනය වන විට ඉහළ Google Scholar උපුටා දැක්වීම් සංඛ්‍යාවක් ලබා ගත් පර්යේෂකයින් | 18 |
| 10 | වයස අවුරුදු 40 හෝ ඊට අඩු, අඛණ්ඩව වසර 3ක් පුරා 2 වන ප්‍රවර්ගයේ අවම | 15 |

| | | |
|---|---|---|
| | වශයෙන් එක් ප්‍රකාශනයක් හෝ පළ කර ඇති පර්යේෂකයින් | |
| 11 | මුල් වෘත්තීය පර්යේෂක සම්මානය | 4 |
| 12 | උපකුලපති සම්මානය | 1 |

## 2024 වර්ෂයේදී ලැබුණු ජනාධිපති සම්මාන

### ව්‍යවහාරික විද්‍යා පීඨය

- මහාචාර්ය ඉන්දිරා වික්‍රමසිංහ - ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය
- මහාචාර්ය ජගත් වන්සපාල - ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය
- ආචාර්ය ආර්. එස්. දියබලනගේ - පීඨාධිපති කාර්යාලය

### කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨය

- ආචාර්ය චමීර උඩවත්ත - වතු කළමනාකරණ හා තක්සේරු අධ්‍යයනාංශය

### වෛද්‍ය විද්‍යා පීඨය

- මහාචාර්ය නීලිකා මලවිගේ - ප්‍රතිශක්ති විද්‍යා හා අණුක වෛද්‍ය අධ්‍යයනාංශය
- මහාචාර්ය චන්දිම ජීවන්දර - ප්‍රතිශක්ති විද්‍යා හා අණුක වෛද්‍ය අධ්‍යයනාංශය

### තාක්ෂණ පීඨය


- ආචාර්ය රජිත ගුණරත්න - ද්‍රව්‍ය හා යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනාංශය
- ආචාර්ය ගයාන් ප්‍රියදර්ශන - ද්‍රව්‍ය හා යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනාංශය

## 2024 වර්ෂයේ පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තරය

### පුනරාවර්ථන වියදම් පිලිබඳ විස්තර 2024

රු '000

| විෂය | මුදල |
|---|---|
| සේවක වැටුප් | 5,645,123 |
| ප්‍රවාහන | 21,428 |
| සැපයීම් | 146,639 |
| නඩත්තු වියදම් | 58,157 |
| කොන්ත්‍රාත් සේවා | 855,401 |
| අනෙකුත් | 912,807 |
| **මුළු එකතුව** | **7,639,555** |



## මූල්‍ය කාර්ය සාධන විශ්ලේෂණය - පීඨය ශිෂ්‍ය අනුව 2024 (උපාධි නොලත් අභ්‍යන්තර සිසුන්)

රු.

| පීඨය | මුළු වියදම (රු.) | 2024 වර්ෂය සඳහා මුළු සිසුන් ගණන | සිසුවකු සඳහා වියදම (රු.) |
|---|---|---|---|
| a. ව්‍යවහාරික විද්‍යා පීඨය | 1,378,422,452 | 2,758 | 499,790.59 |
| b. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය | 1,436,687,282 | 4,080 | 352,129.24 |
| C. වෛද්‍ය පීඨය | 937,607,882 | 1,162 | 806,891.46 |
| D. කළමණාකරණ හා වාණිජ විද්‍යා පීඨය | 1,770,249,238 | 5,205 | 340,105.52 |
| E. ඉංජිනේරු පීඨය | 350,166,401 | 646 | 542,053.25 |
| F. තාක්ෂණ පීඨය | 689,141,587 | 1,806 | 381,584.49 |
| G. සම සෞඛ්‍ය පීඨය | 324,335,775 | 796 | 407,457.00 |
| H. නාගරික හා ජලජ ජෛව පීඨය | 73,551,374 | 278 | 264,573.29 |
| I. දන්ත වෛද්‍ය පීඨය | 67,397,195 | 113 | 596,435.36 |
| J. පරිගණක පීඨය | 65,071,900 | 291 | 223,614.78 |
| | **7,092,631,086** | **17,135** | |

## ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර 2021 - 2024

**Rs'000**

| විෂය | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|
| a.වත්කම් අත්පත් කර ගැනීම | 98,638 | 120,256 | 184,087 | 241,735 |
| b.ගොඩනැගිලි හා ව්‍යුහයන් අත්පත් කර ගැනීම | 500,118 | 471,952 | 1,128,535 | 1,039,715 |
| c.පුස්තකාල පොත් | 10,263 | 13,958 | 3,630 | 11,599 |
| d.මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘති | 3,847 | 10,432 | 3,789 | 2,683 |
| e.පර්යේෂණ දිරිමත්කරණය | 99,759 | 148,411 | 157,417 | 85,008 |
| f.අනෙකුත් (ප්‍රතිසංස්කරණ) | 240,665 | 95,380 | 186,808 | 114,781 |
| මුළු එකතුව | **953,290** | **860,389** | **1,664,266** | **1,495,521** |

## මූල්‍ය කාර්යය සාධන විශ්ලේෂණය - 2024

**Rs '000**


| විෂය | සූත්‍රය | එක් සිසුවකු සඳහා වියදම |
|---|---|---|
| a.එක් සිසුවකු සඳහා වන පුනරාවර්ථන වියදම (RE) | පුනරාවර්ථන වියදම/ මුළු සිසු ගණන | 446 |
| b.එක් සිසුවකු සඳහා වන ප්‍රාග්ධන වියදම (CE) | ප්‍රාග්ධන වියදම/ මුළු සිසු ගණන | 87 |

## පෙර වසර 05 තුල කැපී පෙනෙන මූල්‍යමය අවස්ථා (අගයන් රුපියල් වලින් දක්වා ඇත රු.'000)

| විෂය | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|
| 1. පුද්ගල / සේවක වැටුප් | 4,362,927 | 4,591,970 | 5,046,488 | 4,916,669 | 5,645,123 |
| 2. ප්‍රවාහන | 3,757 | 3,864 | 23,380 | 20,847 | 21,428 |
| 3. සැපයීම් | 98,479 | 81,237 | 156,162 | 178,235 | 146,639 |
| 4. නඩත්තු වියදම් | 32,441 | 38,462 | 56,427 | 65,053 | 58,157 |
| 5. කොන්ත්‍රාත් සේවා | 548,886 | 442,433 | 617,815 | 865,205 | 855,401 |
| 6. අනෙතුක් | 292,028 | 383,178 | 758,835 | 907,974 | 912,807 |
| 7. පර්යේෂණ හා සංවර්ධන | 1,902 | 3,925 | 1,514 | - | - |
| 8. විශ්වවිද්‍යාල නගර ව්‍යාපෘකි හා වෙනත් | 396,948 | 250,727 | - | - | - |
| **මුළු එකුතව** | **5,737,368** | **5,795,796** | **6,660,621** | **6,953,983** | **7,639,555** |


## පෙර වසර 05 තුල කැපී පෙනෙන මූල්‍යමය අවස්ථා (අගයන් රුපියල් වලින් දක්වා ඇත රු.'000)

| විෂය | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධන ප්‍රදාන | 1,919,000 | 949,000 | 520,000 | 1,372,500 | 1,295,457 |
| පුනරාවර්ථන ප්‍රදාන | 4,975,000 | 5,395,000 | 5,715,000 | 5,810,000 | 6,659,500 |




**පෙර වසර 05 තුල කැපී පෙනෙන මූල්‍යමය අවස්ථා (අගයන් රුපියල් වලින් දක්වා ඇත රු.'000)**

| විෂය | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධන ප්‍රදාන | 1,914,465 | 953,290 | 860,389 | 1,664,266 | 1,495,521 |
| පුනරාවර්ථන ප්‍රදාන | 5,737,368 | 5,795,796 | 6,660,621 | 6,953,983 | 7,639,555 |



**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

## මූල්‍ය කාර්යය සාදනය සඳහා වන ප්‍රකාශය

**2024 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා**

**(ශ්‍රී ලංකාවූ රුපියල්)**

| | සටහන් | 2024 | 2023 |
|---|---|---|---|
| **මෙහෙයුම් ආදායම්** | | | |
| **විනිමය නොවන ගනුදෙනු වලින් ලැබෙන ආදායම්** | | | |
| **පුනරාවර්තන** | | | |
| රජයේ ප්‍රදාන - පුනරාවර්තන | | 6,659,500,000 | 5,810,000,000 |
| ප්‍රදාන - ශිෂ්‍යත්ව | | 89,948,000 | 87,372,000 |
| අභ්‍යන්තර ආදායම් | 1 | 1,710,971 | 3,698,921 |
| | | **6,751,158,971** | **5,901,070,921** |
| **ප්‍රාග්ධන** | | | |
| ප්‍රාග්ධන මාරුකිරීම් | 2 | 1,295,457,000 | 1,372,500,000 |
| ප්‍රාග්ධන මාරුකිරීම්- විශ්වවිද්‍යාල අරමුදල | 2 | 200,063,712 | 291,766,866 |
| තෑගි, පරිත්‍යාග - දේශීය සහ විදේශීය | 2 | 3,526,744,045 | 2,758,277,472 |
| | | **5,022,264,757** | **4,422,544,338** |
| | | **11,773,423,728** | **10,323,615,259** |
| **විනිමය ගනුදෙනු වලින් ලැබෙන ආදායම්** | | | |
| **පුනරාවර්තන** | | | |
| අභ්‍යන්තර ආදායම් | 1 | 1,779,507,032 | 1,779,068,681 |
| | | **1,779,507,032** | **1,779,068,681** |
| **මුළු මෙහෙයුම් ආදායම්** | | **13,552,930,761** | **12,102,683,940** |
| | | | |
| **මෙහෙයුම් ප්‍රතිඵල** | | | |
| **පුනරාවර්තන මෙහෙයුම්** | | | |
| විනිමය නොවන ගනුදෙනු වලින් ලැබෙන ආදායම් | | 6,751,158,971 | 5,901,070,921 |
| විනිමය ගනුදෙනු වලින් ලැබෙන ආදායම් | | 1,779,507,032 | 1,779,068,681 |
| **මුළු පුනරාවර්තන මෙහෙයුම්** | | **8,530,666,004** | **7,680,139,602** |

| | | 2024 | 2023 |
|---|---|---|---|
| **පුනරාවර්තන වියදම් (මූලධන නොවන)** | | | |
| පුද්ගල වැටුප් | 3.1 | 5,645,122,467 | 4,916,669,446 |
| ගමන් වියදම් | 3.2 | 21,428,347 | 20,846,519 |
| සැපයීම් | 3.3 | 146,638,850 | 178,235,329 |
| නඩත්තු වියදම් | 3.4 | 58,157,000 | 65,052,812 |
| කොන්ත්‍රාත් සේවා | 3.5 | 855,400,641 | 865,204,745 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 3.6 | 912,807,075 | 907,974,007 |
| අපේක්ෂිත ඇති ප්‍රතිලාභ පිරිවැය ( වත්මන් සේවා පිරිවැය) | 22 | 127,811,742 | 99,436,840 |
| නිශ්චිත ප්‍රතිලාභ | 22 | 74,661,992 | 58,080,140 |
| අපේක්ෂිත ඇති ප්‍රතිලාභ බැඳීම මත පොලී පිරිවැය | 22 | 242,038,714 | 275,922,324 |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභය/ පාඩුව | 4 | (432,285) | 526,584 |
| වියදම් - ශිෂ්‍යත්ව | | 89,948,000 | 87,372,000 |
| චලනය නොවන බඩු තොග සඳහා ප්‍රතිපාදන | 11 | 1,502,116 | (626,097) |
| විනිමය පාඩු | | 34,606,837 | 45,533,204 |
| **මුළු පුනරාවර්තන වියදම්** | | **8,209,691,497** | **7,520,227,853** |
| **කාල සීමාව සඳහා පුනරාවර්තන අතිරික්තය / හිඟය** | | **320,974,507** | **159,911,749** |
| | | | |
| **මෙහෙයුම් නොවන ප්‍රතිඵල** | | | |
| **ප්‍රාග්ධන ආදායම්** | | | |
| විනිමය නොවන ආදායම්-ප්‍රාග්ධන ප්‍රදාන | | 5,022,264,757 | 4,422,544,338 |
| | | **5,022,264,757** | **4,422,544,338** |
| **ප්‍රාග්ධන වියදම්** | | | |
| ක්ෂයවීම් | 5-6 | 1,387,843,222 | 1,312,547,985 |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂ කිරීම | 8 | 20,597,300 | 25,316,374 |
| පර්යේෂණ සහ මානව ප්‍රාග්ධන සංවර්ධනය ශක්තිමත් කිරීම | 10 | 182,299,331 | 528,895,568 |
| **මුළු ප්‍රාග්ධන වියදම්** | | **1,590,739,852** | **1,866,759,927** |
| | | | |
| **කාල සීමාව සඳහා ප්‍රාග්ධන අතිරික්තය / හිඟය** | | **3,431,524,905** | **2,555,784,411** |
| | | | |
| **ප්‍රාග්ධන ප්‍රදාන සඳහා ගිනුම්ගත කිරීමෙන් පසු කාල සීමාව සඳහා සම්පූර්ණ අතිරික්තය / හිඟය** | | **3,752,499,412** | **2,715,696,160** |

කාල සීමාව සඳහා සම්පූර්ණ අතිරික්තය / (හිඟය) පහත දැක්වෙන කාල සීමාව සඳහා පුනරාවර්තන සහ ප්‍රාග්ධන අතිරික්තය හෝ (හිඟය) ඇතුළත් වේ.

| | 2024 | 2023 |
|---|---|---|
| **කාල සීමාව සඳහා පුනරාවර්තන අතිරික්තය / හිඟය** | **320,974,507** | **159,911,749** |
| **කාල සීමාව සඳහා ප්‍රාග්ධන අතිරික්තය / හිඟය** | **3,431,524,905** | **2,555,784,411** |
| | **3,752,499,413** | **2,715,696,160** |

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

# මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

**2023 දෙසැම්බර් 31 දිනට**

**(ශ්‍රී ලංකා රුපියල්)**

| දෙසැම්බර් 31 දිනට | සටහන් | 2024 | 2023 |
|---|---|---|---|
| | | | නැවත ප්‍රකාශ කරන ලද |
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත හා උපකරණ | 5 | 20,272,141,261 | 20,683,820,868 |
| පුස්තකාල පොත් සහ උපාධි ලෝගු | 6 | 46,014,926 | 33,682,756 |
| කෙරීගෙන යන වැඩ සහ ඉදිකිරීම් | 7 | 9,294,790,502 | 4,841,440,994 |
| අස්පෘශ්‍ය වත්කම් | 8 | 60,662,082 | 49,927,182 |
| කාර්ය මණ්ඩල සඳහා ණය | 9 | 70,748,078 | 80,547,013 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **29,744,356,849** | **25,689,418,813** |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 11 | 117,255,629 | 124,671,894 |
| මූල්‍ය වත්කම් | 12 | 5,662,606,766 | 4,335,515,946 |
| විවිධ ණයගැතියෝ හා ලැබිය යුතු මුදල් | 13 | 718,106,601 | 782,306,474 |
| අනෙකුත් මූල්‍ය වත්කම් | | | |
| සේවකයන් සඳහා දුන් අත්තිකාරම් | 14 | 241,700 | 310,232 |
| අත්තිකාරම් හා පෙර ගෙවීම් | 15 | 679,440,589 | 1,438,025,242 |
| මුදල් හා මුදල් සමාන දෑ | 16 | 1,442,189,579 | 1,263,254,510 |
| **මුළු ජංගම වත්කම්** | | **8,619,840,864** | **7,944,084,298** |
| **මුළු වත්කම්** | | **38,364,197,709** | **33,633,503,110** |

| | | | |
|---|---|---|---|
| **කොටස් සහ වගකීම්** | | | |
| **කොටස් සහ වගකීම්** | | | |
| සමුච්චිත අරමුදල් - ප්‍රාග්ධන | 17 | 20,632,225,849 | 17,198,997,465 |
| ප්‍රාග්ධන ප්‍රදාන - වියදම් නොකල | | - | 1,773,329 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | 12,481,260,991 | 12,481,260,991 |
| රඳවාගත් ඉපයුම් | | (3,098,969,273) | (3,275,522,833) |
| | | **30,014,517,568** | **26,406,508,952** |
| **සංචිත සහ සීමා සහිත අරමුදල්** | | | |
| අභ්‍යන්තරව සීමාකල මුදල් | 18 | 2,141,219,184 | 1,833,023,477 |
| පරිත්‍යාග අරමුදල් | 19 | 52,063,025 | 48,822,748 |
| බාහිර පර්යේෂණ ආධාර සහ උපදේශන | 20 | 314,994,242 | 197,566,940 |
| විලම්බිත ආදායම් - දිගු කාලීන වැඩසටහන් | 21 | 2,209,367,304 | 1,883,194,230 |
| | | **4,717,643,754** | **3,962,607,396** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| අර්ථදක්වා ඇති ප්‍රතිලාභ සඳහා ප්‍රතිපාදන | 22 | 2,162,615,825 | 1,861,836,260 |
| | | **2,162,615,825** | **1,861,836,260** |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| ආපසු ගෙවිය හැකි තැන්පතු | 23 | 85,202,047 | 53,551,636 |
| උපචිත වියදම් හා අනෙකුත් ගෙවිය යුතු දේ | 24 | 1,384,218,516 | 1,348,998,862 |
| **මුළු ජංගම වගකීම්** | | **1,469,420,563** | **1,402,550,498** |
| **මුළු කොටස් සහ වගකීම** | | **38,364,197,709** | **33,633,503,110** |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS) අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කර ඇත.

කේ.ටී.සී.ප්‍රියංගනී
මූල්‍යාධිකාරී

ඒ.බී.වැලිවිට
ලේඛකාධිකාරී

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා විශ්වවිද්‍යාල කළමනාකාරිත්වය වගකීම දරයි.

පාලක සභාව වෙනුවෙන් අත්සන් කරනු ලැබුවේ

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එම් එම් පත්මලාල්
උපකුලපති

සුජීව රාජපක්ෂ මහතා
පාලක සභා නියෝජිත

**අත්සන් ඉංග්‍රීසි පිටපතෙහි දැක්වේ.**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීමේ ප්‍රකාශනය**

**2023 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා**

**(ශ්‍රී ලංකා රුපියල් වලින්)**

| විස්තරය | රඳවා ගත් ඉපයීම් | ප්‍රත්‍යාගණන අතිරික්තය | වියදම් නොකල ප්‍රාග්ධන ප්‍රදාන | සම්මුචිත අරමුදල් - ප්‍රාග්ධන | මුළු එකතුව |
|---|---|---|---|---|---|
| **2023 ජනවාරි 01 දිනට ශේෂය** | **(3,255,055,273)** | **12,479,318,927** | **2,381,696** | **14,643,213,055** | **23,869,858,406** |
| පෙර වසර්යේ අප්පසු ගෙවිය යුතු ටෙන්ඩර් තුන්පතු ගෙවීම | (50,000) | - | - | - | **(50,000)** |
| විගණන කළමණාකරන කමිටුවට අනුව ජීවන වියදම් හිඟ මුදල් සාමාන්‍ය සංචිතයට මාරු කරන ලදි. | 1,222,859 | - | - | - | **1,222,859** |
| විගණන කළමණාකරන කමිටුවට අනුව වෙනස් නොවූ ලෙජර ශේෂයන් සාමාන්‍ය සංචිතයට මාරු කරන ලදි | 1,699,698 | - | - | - | **1,699,698** |
| අපර්සාදක අරමුදල් දෝෂ නිවැරදි කිරීම | (31,295) | - | - | - | **(31,295)** |
| වැඩිපුර ගණන් කළ තැපැල් වියදම් දෝෂ නිවැරදි කිරීම | 95,900 | - | - | - | **95,900** |
| පොලි ආදායම් සංවර්ධන අරමුදලට බැර කෙරේ | (131,215,242) | | - | - | **(131,215,242)** |
| අරමුදල් - ශිෂ්‍යත්ව කඩවීම් | (52,101,230) | - | - | - | **(52,101,230)** |
| නැවත තක්සේරු අතිරික්තය | - | 1,942,063 | - | - | **1,942,063** |
| 2023 වර් ෂය සඳහා අතිරික්තය/(හිඟය) | 159,911,749 | - | - | 2,555,784,411 | **2,715,696,161** |
| වර් ෂය තුල ප්‍රාග්ධන ප්‍රදාන වැය කිරීම් | - | - | (1,664,266,866) | - | **(1,664,266,866)** |
| වර් ෂය තුල ලද අරමුදල් ලැබීම් | - | - | 1,664,266,866 | - | **1,664,266,866** |
| වර් ෂය තුල වියදම් නොකල අරමුදල් | - | - | (608,367) | - | **(608,367)** |
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **(3,275,522,833)** | **12,481,260,991** | **1,773,329** | **17,198,997,465** | **26,406,508,952** |

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීමේ ප්‍රකාශනය

**2024 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා**

(ශ්‍රී ලංකා රුපියල් වලින්)

| විස්තරය | රඳවා ගත් ඉපයීම් | ප්‍රත්‍යාගණන අතිරික්තය | වියදම් නොකල ප්‍රාග්ධන ප්‍රදාන | සම්මුචිත අරමුදල් - ප්‍රාග්ධන | මුළු එකතුව |
|---|---|---|---|---|---|
| **2024 ජනවාරි 01 දිනට ශේෂය** | **(3,275,522,833)** | **12,481,260,991** | **1,773,329** | **17,198,997,465** | **26,406,508,953** |
| ඇස්තමේන්තුවේ වෙනස්කම් හේතුවෙන් ක්ෂය වීමට ගැලපීම | 27,627,060 | - | - | - | **27,627,060** |
| පොලී ආදායම සංවර්ධන අරමුදලට බැර කෙරේ | (79,781,658) | | - | - | **(79,781,658)** |
| පොලී ආදායම බැඳුම්කර උල්ලංඝනය කිරීමේ අරමුදලට බැර කෙරේ | (24,753,828) | | | | **(24,753,828)** |
| අරමුදල් - ශිෂ්‍යත්ව කඩවීම | (125,321,671) | - | - | - | **(125,321,671)** |
| 2024 වර්ෂය සඳහා අතිරික්තය/(හිඟය) | 320,974,507 | - | - | 3,431,524,905 | **3,752,499,412** |
| වසර තුල වියදම් කල ප්‍රාග්ධන ප්‍රදාන | - | - | (1,495,520,712) | - | **(1,495,520,712)** |
| වසර තුල ලැබුණු අරමුදල් | - | - | 1,495,520,712 | - | **1,495,520,712** |
| වසර තුල වියදම් නොකල | - | - | (69,850) | - | **(69,850)** |
| පෙර වසරේ ස්වයං මූල්‍ය පාඨමාලා ආදායම් ගැලපීම | 57,809,150 | | | | **57,809,150** |
| වියදම් නොකල ප්‍රදානයෙන් මාරු කිරීම | - | - | (1,703,479) | 1,703,479 | - |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **(3,098,969,273)** | **12,481,260,991** | - | **20,632,225,849** | **30,014,517,568** |

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**2024 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා**

**(ශ්‍රී ලංකා රුපියල්)**

| **දෙසැම්බර් 31 දිනට** | **2024** | **2023 Restated** |
|---|---|---|
| **මෙහෙයුම් කටයුතු වලින් මුදල් ගලා යාම** | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් අතිරික්තය / (හිඟය) | 3,752,499,413 | 2,715,696,160 |
| **ගැලපීම්** | | |
| ක්ෂය වීම් | 1,387,843,222 | 1,312,547,985 |
| ආයෝජන වලින් පොලී | (528,454,539) | (706,128,699) |
| අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ බැඳීම (වත්මන් සේවා පිරිවැය) | 127,811,742 | 99,436,840 |
| අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ බැඳීම මත පොලී පිරිවැය | 242,038,714 | 275,922,324 |
| නිශ්චිත ප්‍රතිලාභ බැඳීම මත ආයුගණක ලාභය / අලාභය | 74,661,992 | 58,080,140 |
| චලනය නොවන තොග සඳහා ප්‍රතිපාදන | 1,502,116 | (626,097) |
| විනිමය පාඩු | 34,606,837 | 45,533,204 |
| වත්කම් බැහැර කිරීමේදී ලාභය / අලාභය | (432,285) | 526,584 |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීම | 20,597,300 | 25,316,374 |
| පර්යේෂණ සහ මානව ප්‍රාග්ධන සංවර්ධනය ශක්තිමත් කිරීම | 182,299,331 | 528,895,568 |
| තෑගි, පරිත්‍යාග, භාණ්ඩ - දේශීය සහ විදේශීය | (5,022,264,757) | (4,422,544,338) |
| පෙර වර්ෂයේ ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු ගෙවීම | - | (50,000) |
| විගණන හා කළමණාකරණ කමිටු තීරණ අනුව චලනය නොවන ලෙජර් ශේෂයන් සාමාන්‍ය සංචිතයට මාරු කරන ලදී. | - | 1,222,859 |
| විගණන හා කළමණාකරණ කමිටු තීරණ අනුව ජීවන වියදම් හිඟ මුදල් සාමාන්‍ය සංචිතයට මාරු කරන ලදී. | - | 1,699,698 |
| සේවක අර්ථ සාධක අරමුදල් දෝෂ නිවැරදි කිරීම | - | (31,295) |
| වැඩිපුර ගණන් කළ තැපැල් වියදම් දෝෂ නිවැරදි කිරීම | - | 95,900 |
| ඇස්තමේන්තුවේ වෙනස්කම් හේතුවෙන් ක්ෂය වීමට ගැලපීම | (27,627,060) | - |
| පෙර වසරේ ස්වයං මූල්‍ය පාඨමාලා ආදායම් ගැලපීම | 57,809,150 | - |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | **302,891,174** | **(64,406,794)** |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය (සකස් කරන ලදී)** | **302,891,174** | **(64,406,794)** |
| තොග (වැඩි වීම) / අඩුවීම | 7,416,265 | 12,283,717 |
| විවිධ ණයගැතියන් සහ ලැබිය යුතු මුදල් (වැඩිවීම) / අඩුවීම | 64,199,873 | (31,112,504) |
| කාර්ය මණ්ඩලයට ණය සහ අත්තිකාරම් (වැඩිවීම) / අඩුවීම | 10,740,320 | 1,057,465 |
| අත්තිකාරම් සහ පෙරගෙවුම් (වැඩි වීම) / අඩුවීම | 758,584,653 | (341,434,538) |
| උපචිත සහ අනෙකුත් ගෙවිය යුතු වියදම්වල වැඩිවීම / (අඩුවීම) | 35,219,654 | (653,686,031) |
| ආපසු ගෙවිය යුතු තැන්පතු වැඩි කිරීම / (අඩු කිරීම) | 31,650,411 | 14,845,951 |
| විවිධ ආදායම් - වැඩසටහන්වල වැඩිවීම / (අඩුවීම) | 326,173,074 | 332,781,927 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම් වලින් පසු මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබෙන ශුද්ධ මුදල් ප්‍රවාහය** | **1,536,875,424** | **(729,670,806)** |
| පාරිතෝෂිත ගෙවීම | (143,732,883) | (104,504,845) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබෙන ශුද්ධ මුදල් ප්‍රවාහය** | **1,393,142,541** | **(834,175,651)** |

contd.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**2024 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා**

**(ශ්‍රී ලංකාතු රුපියල්)**

| දෙසැම්බර් 31 දිනට | 2024 | 2023 Restated |
|---|---|---|
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ගලා ඒම** | | |
| දේපළ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ මිලදී ගැනීම | (816,295,649) | (202,952,212) |
| දේපළ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ විකිණීමෙන් ලැබෙන | 606,817 | (526,584) |
| ආයෝජන වලින් පොලී | 324,706,815 | 334,036,404 |
| ප්‍රාග්ධන ඉදිකිරීම් - කෙරී ගෙන යන වැඩ | (4,645,394,940) | (1,153,729,416) |
| ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර ඇති අරමුදල් | (1,573,454,953) | (2,742,529,658) |
| ස්ථාවර තැන්පතු ආපසු ගැනීම | 242,801,049 | 1,502,000,097 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලැබෙන ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(6,467,030,860)** | **(2,263,701,368)** |
| **මූල්‍ය කටයුතු වලින් ලැබෙන මුදල් ප්‍රවාහයන්** | | |
| රජයේ ප්‍රදානය - ප්‍රාග්ධනය | 1,295,457,000 | 1,372,500,000 |
| ප්‍රාග්ධන ප්‍රදාන - විශ්වවිද්‍යාල අරමුදල | 200,063,712 | 291,766,866 |
| ප්‍රතිශක්තිකරණ හා අණුක වෛද්‍ය විද්‍යාව ගොඩනැගිල්ල | 445,688,559 | 137,326,023 |
| පරිත්‍යාග අරමුදල භාවිතා කිරීම | 3,240,277 | 3,687,067 |
| බාහිර අරමුදල් භාවිතය | 3,112,607,990 | 746,793,651 |
| අභ්‍යන්තරව සීමා කරන ලද අරමුදල් | 78,338,549 | 547,451,369 |
| පර් යේෂණ ප්‍රදාන | 117,427,302 | (2,761,305) |
| **මූල්‍ය කටයුතු වලින් ලැබෙන ශුද්ධ මුදල් ප්‍රවාහය** | **5,252,823,388** | **3,096,763,671** |
| මුදල් සහ මුදල් සමානකම්වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | 178,935,068 | (1,113,348) |
| වසර ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දේ | 1,263,254,510 | 1,264,367,859 |
| **වසර අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ** | **1,442,189,578** | **1,263,254,510** |

## මූල්‍ය ප්‍රකාශන වලට අදාළ වන ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 1. ආයතනික තොරතුරු

#### 1.1 නීතිමයානුකූලබව හා ව්‍යවස්ථානුකූලබව

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය (විශ්වවිද්‍යාල) 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත හා එහි සංශෝධන යටතේ සංස්ථා ගත කර ඇත. විශ්වවිද්‍යාලය පීඨ 11 කින් හා බාහිර විභාග හා විස්තාරිත පාඨමාලා ඒකකයකින් සමන්විත වේ. විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පරිපාලන ස්ථානය ශ්‍රී ලංකාවේ ගංගොඩවිල, නුගේගොඩ යන ස්ථානය වන අතර තාක්ෂණ පීඨය හා ඉංජිනේරු පීඨය පිළිවලින් මාහේනවත්ත, පිටිපන, හෝමාගම සහ අංක 41,ලුම්බිණි මාවත රත්මලාන ශ්‍රී ලංකාව යන ස්ථානයන්හි පිහිටා ඇත. විශ්වවිද්‍යාලය අධ්‍යාපනය අමාත්‍යංශයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විෂය පථය යටතේ පවතී. මූල්‍ය මෙහෙයුම් පීඨ තුල විමධ්‍යගත කර මූල්‍ය ප්‍රකාශන සියලුම පීඨ වල මූල්‍ය තොරතුරු ඒකාබද්ධ කර සකස් කරනු ලැබේ.

#### 1.2 මූලධර්ම ක්‍රියාකාරකම් සහ ක්‍රියාකාරීත්වයේ ස්භාවය

ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය දියුණු කිරිම සඳහා අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින් හා පශ්වාද් උපාධි අපේක්ෂක සිසුන් සඳහා වන ඉගැන්වීම් සහ ඉගෙනීම් තුලින් දැනුම බෙදාහැරීම විශ්වවිද්‍යාලයේ ප්‍රධාන ක්‍රියාකාරකම වේ. විශ්වවිද්‍යාලය මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා, ව්‍යවහාරික විද්‍යා, කළමනාකරණ හා වාණිජ විද්‍යා, වෛද්‍ය විද්‍යාව, සම සෞඛ්‍ය විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, තාක්ෂණ, නාගරික හා ජලජ ජෛව, විද්‍යාව හා පරිගණක විද්‍යාව යන ක්ෂේත්‍ර වල පීඨ 11 කින් සමන්විත වේ.

#### 1.3 මානව සම්පත් හා ශිෂ්‍ය සංඛ්‍යාව.

2024 දෙසැම්බර් 31 වන විට විශ්වවිද්‍යාලයේ කාර්යය මණ්ඩලය පහත පරිදි වේ. .

| | අනුමත සේවක සංඛ්‍යාව | සිටින සේවක සංඛ්‍යාව |
|---|---|---|
| අධ්‍යයන | 1,414 | 1,192 |
| අනධ්‍යයන | 1,340 | 1,142 |
| මුළු එකතුව | 2,754 | 2,334 |

2024 දෙසැම්බර් 31 දින වන විට විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින් 17,135 ක් සහ බාහිර උපාධි අපේක්ෂකයින් 50,171 ක් සිටියහ.

### 1.4 නිකුත් කිරීම සඳහා අවසර දුන් දිනය

2025/07/11 දින පැවති පාලක සභාව විසින් විශ්වවිද්‍යාලයේ නැවත ප්‍රකාශිත මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අවසර දෙන ලදී.

### 1.5 වාර්තාකරණ කාලය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ (විශ්වවිද්‍යාලයේ) මූලය කාලසීමාව 2024 ජනවාරි 01 සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා වේ.

## 2 සකස් කිරීමේ පදනම

### 2.1 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS) අනුකූලව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කර ඇත. කෙසේ වෙතත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් නොමැති අවස්ථාවලද භාවිතා කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශනවලට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, කොටස්වල වෙනස්වීම් සහ මූල්‍ය ප්‍රකාශනවල සටහන් ඇතුළත් වේ.

### 2.2 මිනුම් පදනම

විශ්වවිද්‍යාල මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත සකස් කර ඇති අතර අඛණ්ඩව ක්‍රියාත්මක වේ. උද්ධමන සාධක සඳහා ගැලපීම් සිදු කර නොමැත. මූල්‍ය ගනුදෙනුව ඓතිහාසික පිරිවැය මත සටහන් කර ඇති අතර 3.1.1 හි වාර්තා කර ඇති පරිදි වත්කම් නැවත තක්සේරු කිරීමේ පදනම මත පසුව හඳුනා ගැනීම සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශයේ 3.2.4 හි විශ්‍රාම ප්‍රතිලාභ හැර වාර්තා කර ඇත.

### 2.3 සංසන්දනාත්මක තොරතුරු

විශ්වවිද්‍යාලය විසින් අනුගමනය කරන ලද සියලුම ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර වසරේ ප්‍රතිපත්තිවලට අනුකූලව අදාළ වන අතර, වත්මන් වර්ෂයේ තොරතුරු ඉදිරිපත් කිරීමේදී අවශ්‍ය සංසන්දනාත්මක තොරතුරු වෙනස්කම්වලට අනුකූල වන පරිදි සකස් කර ඇත.

වඩා හොඳ ඉදිරිපත් කිරීමක් සැපයීම සඳහා වත්මන් වසරේ ඉදිරිපත් කිරීම සමඟ තහවුරු කිරීමට අවශ්‍ය විටෙක සංසන්දනාත්මක තොරතුරු නැවත වර්ගීකරණය කෙරේ.

## 2.4 ද්‍රව්‍යමය අයිතමයන් සහ එකතු කිරීම්

මූල්‍ය ප්‍රකාශන වල සමාන අයිතම වල සෑම ද්‍රව්‍යමය පන්තියක්ම වෙ වෙනම ඉදිරිපත් කර ඇත. අසමාන ස්භාවයක් හෝ ක්‍රියාකාරීත්වයක් ඇති අයිතම, ඒවා නොසැලකිය හැකි නම් වෙන වෙනම ඉදිරිපත් කර ඇත.

## 2.5 හිලව් කිරීම්

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති විසින් අවශ්‍ය හෝ අවසර දී ඇත්නම් මිස වත්කම් සහ වගකීම්, ආදායම් සහ වියදම් පියවා නැත.

## 2.6 ඉදිරියට රැගෙන යාම

විශ්වවිද්‍යාලය අඛණ්ඩ පැවැත්මක් ලෙස පවත්වා ගෙන යාමේ හැකියාව තක්සේරු කර ඇත. විශ්වවිද්‍යාලය සතුව ඉදිරි කාලය සඳහා මෙහෙයුම් පැවැත්ම දිගටම පවත්වා ගෙන යාම සඳහා ප්‍රමාණවත් සම්පත් ඇති බව විශ්වවිද්‍යාලයේ පාලක සභාවෙහි සාධාරණ අපේක්ෂාවක් ඇත. අනාගතය පිළිබඳ පවතින සියලු තොරතුරු සැලකිල්ලට ගනිමින් විශ්වවිද්‍යාලය ඈවර කිරීමේ හෝ මෙහෙයුම් නැවැත්වීමේ අවශ්‍යතාවයක් පුරෝකථනය නොකරයි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී විශ්වවිද්‍යාලය අඛණ්ඩ පැවැත්මේ පදනම අනුගමනය කරයි.

## 2.7 වාර්තාකරණ කාලයෙන් පසු සිදුවීම්

වාර්තාකරණ දිනයෙන් පසු සිදුවීම් යනු වාර්තාකරණයේ දිනය සහ මූල්‍ය ප්‍රකාශනය නිකුත් කිරීම සඳහා අවසර දී ඇති දිනය අතර සිදු වන හිතකර හා අහිතකර සිදුවීම් වේ. සිදුවීම් වර්ග දෙකක් හඳුනා ගත හැකිය.

**a.** එම සිදුවීම් වාර්තාකරණයේ දී පැවති තත්වයන් පිළිබඳ සාක්ෂි සපයයි (වාර්තා කරන දිනයෙන් පසු සිදු වන ගැලපීම්)

**b.** ඒවා වාර්තාකරණ දිනයෙන් පසු ඇතිවූ තත්වය පෙන්නුම් කරයි (වාර්තාකරණ දිනයෙන් පසු ගැලපීම් සිදු නොවන සිදුවීම්)

වාර්තා කරන දිනට පසුව ඇති සියලුම වැදගත් සිදුවීම් සලකා බලා ඇති අතර මූල්‍ය ප්‍රකාශනවල සුදුසු ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කර ඇත.

## 2.8 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් වර්ගය

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් අයිතම මනිනු ලබන්නේ විශ්වවිද්‍යාලය ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරයේ මුදල් ඒකකය (ක්‍රියාකාරී මුදල් ඒකකය) භාවිතා කරමිනි. මෙම මූලය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කරනු ලබන්නේ විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වන "ශ්‍රී ලංකා රුපියල්" (LKR) වලිනි.

## 2.9 විදේශ මුදල් ගනුදෙනු හා ශේෂයන්

විදේශ මුදල් ගනුදෙනු, ගනුදෙනු සිදු වූ දිනවල දී හෝ තක්සේරු කිරීමේ දී පවතින විනිමය අනුපාත භාවිතා කරමින් ක්‍රියාකාරී මුදල් බවට පරිවර්තනය කරනු ලැබේ. එවැනි ගනුදෙනු පියවීමෙන් සහ වසර අවසානයේ විදේශ මුදල් වලින් නම් කර ඇති මුදල් වත්කම් සහ වගකීම් වල විනිමය අනුපාත පරිවර්තනයෙන් ලැබෙන විදේශ විනිමය ලාභ සහ අලාභ ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ.

## 2.10 වැටයීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් මඟින් අවසර දී ඇති පරිදි වෙනත් ආකාරයකින් දක්වා ඇති අවස්ථා හැර, මූල්‍ය ප්‍රකාශනවල මුදල් ප්‍රමාණයන් ආසන්නතම රුපියලට වටයා ඇත.

## 2.11 අයවැය පාලනයන්

විශ්වවිද්‍යාලයේ වැඩසටහන් අයවැය භාණ්ඩාගාර හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් නිකුත් කරන ලද මූල්‍ය රෙගුලාසි සහ මාර්ගෝපදේශයන්ට අනුකූලව විශ්වවිද්‍යාලයේ අයවැය සකස් කර ඇත. විශ්ව විද්‍යාලයේ ආයතනික සැලැස්මට අනුව සත්‍ය අවශ්‍යතාවය වෙනුවට භාණ්ඩාගාරයෙන් ලබා දෙන ප්‍රතිපාදන කොටස් වලට විශ්වවිද්‍යාලය දැඩි ලෙස සීමා කර ඇත. විශ්වවිද්‍යාලයට යම් වර්ෂයක් සඳහා අරමුදල්වල සැබෑ අවශ්‍යතාවය ලබා දිය නොහැක. එබැවින්, වර්ෂය තුළ අතිරේක අයවැය ප්‍රතිපාදන හෝ මුදල් වර්ෂයේ අවසානය සඳහා වියදම් සඳහා අවශ්‍යතා ඇති විය හැක.

අයවැය මගින් 2024 ජනවාරි 1 සිට 2024 දෙසැම්බර් 31 දක්වා මූල්‍ය කාලය ආවරණය කරයි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුකූලව සකස් කරයි. අයවැය සහ සත්‍ය අයවැය අමුණා ඇත.

## 2.12 බදු

**ආදායම් බදු.**

2017 අංක 24 දරණ දේශිය ආදායම් පනත සහ එහි සංශෝධන අනුව විශ්වවිද්‍යාලය නිදහස් සංවිධානයක් ලෙස සලකනු ලැබෙන බැවින්, සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී අතිරික්තය සඳහා විශ්වවිද්‍යාලය ආදායම් බදු ගෙවීමට බැඳී නොමැත.

**පුද්ගල ආදායම් මත අත්තිකාරම් බද්ද (APIT) / අත්තිකාරම් ආදායම් බදු**

විශ්වවිද්‍යාලය ප්‍රාථමික ආදායම සහ ද්විතීයික ආදායම මත සේවකයාගේ කැමැත්ත පරිදි අත්තිකාරම් පුද්ගලික ආදායම් බද්ද (APIT) අඩු කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අඩු කළ මුදල ප්‍රේෂණය කරයි. තවදුරටත් අත්තිකාරම් ආදායම් බද්ද (AIT) කුලී හිමිකරුවන්ගේ හෝ සැපයුම්කරුවන්ගේ ඉල්ලීම පරිදි කුලී ගෙවීමෙන් හෝ වෙනත් සේවාවන්ගෙන් අඩු කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අඩු කළ මුදල ප්‍රේෂණය කරයි.

**මුද්දර ගාස්තු**

මුද්දර ගාස්තු පනතට අනුව ගෙවීම් මත මුද්දර ගාස්තු අඩු කරනු ලබන අතර අඩු කරන ලද ගාස්තු දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කරනු ලැබේ.

විශ්වවිද්‍යාලයේ රටේ බදු නීතිවල වෙනස්කම් වලට අනුකූල වන අතර ඒ අනුව බදු අය කෙරේ.

**සමාජ ආරක්ෂණ දායක බද්ද (SSCL)**

සමාජ ආරක්ෂණ දායක මුදල් අය කිරීමේ පනත යටතේ (SSCL) 2022.10.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි 2022 අංක 25 දරණ වාර්ෂික බදු පිරිවැටුම රුපියල් මිලියන 60 ඉක්මවන අය සඳහා 2.5% ක සමාජ ආරක්ෂණ බද්දක් පනවා ඇත. ඒ අනුව විශ්වවිද්‍යාල වගකීම් ආදායම මත සමාජ ආරක්ෂණ දායක බද්ද ගෙවයි.

**රඳවා ගැනීමේ බද්ද (WHT)**

2022 අංක 45 දේශීය ආදායම් (සංශෝධන) පනතට අනුව කුලී සහ අනෙකුත් නිශ්චිත ගාස්තු ගෙවන විට රුපියල් 100,000/- ඉක්මවූ මුදල මත 10% ක රඳවා ගැනීමේ බද්දක් අඩු කර ඇත.

## 2.13 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් 02 අනුකූලව වක්‍ර ක්‍රමය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඇති අතර එමඟින් මෙහෙයුම් ක්‍රියාකාරකම්, මූල්‍ය ක්‍රියාකාරකම් සහ ආයෝජන ක්‍රියාකාරකම්වල දළ මුදල් ලැබීම් සහ දළ මුදල් ගෙවීම් හඳුනාගෙන ඇත මුදල් සහ මුදල් සමානකම් කෙටි කාලීන, ඉතා ද්‍රවශීල ආයෝජන වලින් සමන්විත වන අතර ඒවා දන්නා මුදල්

ප්‍රමාණයට පහසුවෙන් පරිවර්තනය කළ හැකි අතර වටිනාකමේ වෙනස්වීම් වල නොසැලකිය යුතු අවදානමකට යටත් වේ.

## 2.14 ගිණුම්කරණ ප්‍රතිපත්ති/ඇස්තමේන්තු සහ හෙළිදරව් කිරීම් වල වෙනස්කම්

**a) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 10 (විනිමය ගනුදෙනු වලින් ආදායම) සහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 11 (විනිමය නොවන ගනුදෙනු වලින් ආදායම).**

විශ්ව විද්‍යාලය 2022 දෙසැම්බර් 31 වැනි දින සහ ඉන් පසුව මූල්‍ය කාලසීමාව සඳහා බලපැවැත්වෙන ඇතැම් ගිණුම්කරණ ප්‍රමිතීන් සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කර ඇත. විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 10 (විනිමය ගනුදෙනුවලින් ආදායම) සහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 11 (විනිමය නොවන ගනුදෙනුවලින් ලැබෙන ආදායම) අනුගත කර නොමැත.

2022 මූල්‍ය වර්ෂයේ සිට ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 10 (විනිමය ගනුදෙනු වලින් ආදායම) සහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 11 (විනිමය නොවන ගනුදෙනු වලින් ලැබෙන ආදායම) හි ස්ථාපිත නිර්ණායක අනුව විශ්වවිද්‍යාලය ආදායම හඳුනා ගනී.

**b) භාණ්ඩ තොග, වීදුරු භාණ්ඩ හා රසායන ද්‍රව්‍ය හඳුනා ගැනීම සහ වලනය නොවන තොග අයිතම සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම.**

රසායන ද්‍රව්‍ය සහ වීදුරු භාණ්ඩ තොග විශ්වවිද්‍යාලය 2024 වර්ෂයෙදී අදාළ ගිණුම් වලට සකස් කර ඇති අතර, විශ්වවිද්‍යාලයේ වෛද්‍ය මධ්‍යස්ථානයේ ඇති ඖෂධ අයිතමද ආරම්භක වර්ෂය ලෙස 2024/12/31 දිනට සත්‍යාපනය කරන ලදී.

2024 වර්ෂයේදී නඩත්තු බඩු තොගයේ වලනය නොවන අයිතම සඳහා ප්‍රතිපාදන සලසා ඇත.

**c) පරිත්‍යාග ලෙස ලැබුණු වත්කම් ක්ෂය වීම**

එම වත්කම් පරිහරණය කිරීමේ අයිතිය ලැබීමෙන් පසු වාර්තා කරන ලද පරිත්‍යාග මගින් ලැබෙන වත්කම්. විශ්ව විද්‍යාලය සෑම වසරකම ජූනි 30 සහ දෙසැම්බර් 31 යන දිනවලදී පරිත්‍යාග කරන ලද වත්කම් අගය කරන අතර පරිත්‍යාග කරන ලද වත්කම් ප්‍රාග්ධනීකරණය කරයි.

**d)** හඳුනා නොගත් තැන්පතු වසර 03 කාලයකට පසු ආදායමක් ලෙස පිළිගනු ලැබේ.

## 3. හඳුනා ගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශය

### 3.1 වත්කම් සහ ඒවායේ තක්සේරු කිරීමේ පදනම.

#### 3.1.1 දේපළ, පිරියත හා උපකරණ (PPE)

විශ්වවිද්‍යාලයේ දේපළ පිරියත සහ උපකරණ (PPE) සඳහා ඉඩම, ගොඩනැගිලි, රසායනාගාර සහ ඉගැන්වීම් උපකරණ, කාර්යාල උපකරණ, ගෘහ භාණ්ඩ සහ උපාංග, පුස්තකාල පොත් සහ වාර සටහන්, මෝටර් රථ, සළු, ක්‍රීඩා භාණ්ඩ සහ වෙනත් වත්කම් ඇතුළත් වේ.

**a. හඳුනා ගැනීමේ පදනම**

දේපළ, පිරියත හා උපකරණ නිසි පරිදි හඳුනා ගෙන ඇත්නම් අයිතමය හා සම්බන්ධ අනාගත ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමේ සම්භාවිතාවක් තිබේ නම් අයිතමයේ පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකිවේ.

**b. මිනුම් පදනම**

දේපළ, පිරියත හා උපකරණ මුලින් හඳුනා ගනු ලබන්නේ මිලදී ගැනීමේ පිරිවැය සහ වත්කම් එහි අපේක්ෂිත භාවිතය සඳහා එහි සේවා තත්වයට ගෙන ඒමේදී සිදුවන ඕනෑම අහඹු වියදමක් ඇතුළු පිරිවැයට. මූලික හඳුනාගැනීමෙන් පසු සහ දේපළ, පිරියත හා උපකරණ ගණනය කරනු ලබන්නේ සමමුච්ත ක්ෂය වීම් සහ සමමුච්ත අලාභ හානි අඩු කරමිනි.

අත්පත් කරගත් දිනට එහි සාධාරණ වටිනාකමින් පිළිගත් විනිමය නොවන ගනුදෙනු හරහා ලබාගත් වත්කම්. දේපල, පිරියත සහ උපකරණ රජයේ ප්‍රදාන, ව්‍යාපෘති, පර්යේෂණ ප්‍රදාන, අභ්‍යන්තරව ජනනය කරන ලද අරමුදල් සහ පරිත්‍යාග හරහා වත්කම් ලෙස ඇතුළත් වේ. SLPSAS 11 ප්‍රකාර මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දේපල, පිරියත සහ උපකරණ හෝ තෑගි සහ පරිත්‍යාග අත්පත් කර ගැනීම සඳහා වූ අරමුදල් ලැබීම්, විනිමය නොවන ගනුදෙනු වලින් ලැබෙන ආදායම ලෙස හඳුනාගෙන ඇත.

**a. පවතින දේපළ, පිරියත හා උපකරණ සඳහා පසුකාලීන වියදම (PPE)**

ස්පෘශ්‍ය දේපළ පිරියත හා උපකරණ සඳහා දරන ලද වියදම් පහත සඳහන් නිර්ණායක වලින් එකක් හෝ සපුරාලන්නේ නම් පමණක් එය දරන කාල සීමාව තුල මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය හි දක්වයි. එම අවස්ථාවේදී එය ප්‍රාග්ධනීකරනය කර අදාළ ප්‍රයෝජනවත් ආයු කාලය තුල ක්ෂය කරනු ලැබේ.

- වත්කමේ ධාරිතාවය වැඩි වීම.
- නිමැවුමේ ගුණාත්මකභාවය සැලකිය යුතු ලෙස වැඩිදියුණු කිරීම හෝ මෙහෙයුම් පිරිවැය අඩු කිරීම.
- අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම මඟින් තහවුරු කරන ලද කාලයෙන් ඔබ්බට වත්කම් වල ප්‍රයෝජනවත් ආයු කාලය සැලකිය යුතු ලෙස දීර්ඝ වීම.
- දේපල, පිරියත හා උපකරණ වල වෙළඳපළ වටිනාකම පසුව වැඩිවීම
- මුලින් තක්සේරු කරන ලද කාර්ය සාධන ප්‍රමිතියෙන් බලාපොරොත්තු වන අනාගත ආර්ථික ප්‍රතිලාභ ප්‍රතිෂ්ඨාපනය කිරීම හෝ පවත්වාගෙන යාම සඳහා දේපල, පිරියත හා උපකරණ අලුත්වැඩියා කිරීම හෝ නඩත්තු කිරීම සඳහා දරන ලද වියදම, දැරූ

  විට වියදමක් ලෙස පිළිගැනේ.

### c. හඳුනා ගැනීමෙන් පසු තක්සේරු කිරීම.

- පිරිවැය ආකෘතිය

  හඳුනාගැනීමෙන් පසු ඉඩම්, ගොඩනැගිලි, මෝටර් රථ, රසායනාගාර සහ ඉගැන්වීම් උපකරණ, ක්‍රීඩා භාණ්ඩ, අනෙකුත් උපකරණ සහ ගෘහ භාණ්ඩ සහ උපාංග යන පන්ති හැර අනෙකුත් සියලුම දේපල, පිරියත හා උපකරණ එහි පිරිවැය අඩු සමුච්චිත ක්ෂයවීම් යටතේ ගෙන යනු ලැබේ.

- **නැවත ඇගයීමේ ආකෘතිය**

  මූලික හඳුනා ගැනීමෙන් පසු විශ්වාසදායක ලෙස සාධාරන වටිනාකම මැනිය හැකි දේපල, පිරියත හා උපකරණ කාණ්ඩ පහත පරිදි නැවත තක්සේරු කරන ලද ප්‍රමානවලින් සිදුකර ඇති අතර, එය නැවත තක්සේරු කරන දිනයේදී සාධාරණ වටිනාකමක් වන අතර පසුව සම්මුචිත ක්ෂය වීම් සහ සම්මුචිත හානි අලාබ අඩු කරනු ලැබේ

### b. ක්ෂය වීම්

සින්නක්කර ඉඩමක් හැර වෙනත් දේපළ, පිරියත හා උපකරණ අයිතමයක එක් එක් අංගයක් සඳහා සරල රේඛීය පදනමක් මත මූලා කාර්ය සාධන ප්‍රකාශයේ ක්ෂයවීම් හඳුනාගෙන ඇති අතර, එය භාවිතය සඳහා පවතින විට සහ එම වත්කම විකිණීමට තබා ඇති ලෙස වර්ගීකරණය කර ඇති දිනට පෙර දිනෙන් අවසන් වේ.
ඇස්තමේන්තු ගත ප්‍රයෝජනවත් ආයු කාලයන් පහත පරිදි වේ.

| වත්කම් කාණ්ඩය | ඇස්තමේන්තු ගත ප්‍රයෝජනවත් ආයු කාලය |
|---|---|
| ගොඩනැගිලි | අවුරුදු 20 |
| ගෘහ භාණ්ඩ සහ උපාංග | අවුරුදු 10 |
| රසායනාගාර හා ඉගැන්වීමේ උපකරණ | අවුරුදු 05 |
| කාර්යාල උපකරණ | අවුරුදු 05 |
| මොටර් රථවාහන | අවුරුදු 05 |
| පරිගණක සහ උපාංග | අවුරුදු 05 |
| ක්‍රීඩා උපකරණ | අවුරුදු 04 |
| අනෙකුත් වත්කම්) | අවුරුදු 10 |
| (දුරකථන වතුර සහ විදුලිය ඇතුළුව | |
| වෙන්කිරීම් හා ඇතුළත නිමවුම් | අවුරුදු 05 |
| භූමිය | අවුරුදු 05 |
| මාර්ගගත සඟරා | අවුරුදු 01 |
| පරිගණක මෘදුකාංග | අවුරුදු 05 හෝ පවතින ජීව කාලය |
| පුස්තකාල පොත් | අවුරුදු 05 |
| උපාධි ලෝගු | අවුරුදු 05 |
| මාර්ගගත පොත් | වලංගු කාලය දක්වා |

වත්කම් වල අවශේෂ වටිනාකම් සහ ප්‍රයෝජනවත් ආයු කාලයන් සමාලෝචනය කරනු ලබන අතර, සුදුසු නම් එක් එක් වාර්තාකරණ කාලච්ඡේදය අවසානයේදී වත්කම් දරන මුදල එහි වත්කම රැගෙන යාමේ මුදල් අඩු නම් හෝ වැඩි නම් අයකර ගත හැකි මුදලට සකස් කරනු ලැබේ.

බැහැර කිරීම් මත ලැබෙන ලාභ හෝ අලාභ තීරණය කරනු ලබන්නේ ආදායමේ ධාරණ මුදල සමඟ සංසන්දනය කිරීමෙන් වන අතර ආදායම් ප්‍රකාශ වල ලාභය / අලාභය හඳුනා ගැනේ.

**c. හඳුනා නොගත් අයිතම**

දේපළ, පිරියත හා උපකරණ රැගෙන යන ප්‍රමාණය බැහැර කිරීමේදී හෝ එය භාවිතයෙන් හෝ බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා විභවයක් අපේක්ෂා නොකරන විට හඳුනා නොගනී. හඳුනාගැනීමෙන් ඇතිවන ලාභය හෝ අලාභය අයිතමය හඳුනා නොගත් විට අතිරික්ත හෝ හිඟයට ඇතුළත් කළ යුතුය.

**d. පුස්තකාල පොත්**

පුස්තකාල පොත් වල පිරිවැය වසර 05 ක කාලයක් තුළ සරල රේඛීය පදනමක් මත ක්ෂය කරනු ලැබේ. සම්පූර්ණයෙන්ම ක්ෂය වූ පුස්තකාල පොත් සහ වාර සඟරා වල ධාරණ වටිනාකම 506,717,557 කි. අත්පත් කර ගැනීමෙන් පසු ඉතිරි ප්‍රයෝජනවත් ආයු කාලය සහ පුස්තකාල

පොත්වල පසු කාලීන වටිනාකම තක්සේරු කිරීමේ දුෂ්කරතා හේතුවෙන් 2024 ජනවාරි 31 දිනැති ලිපියක් මඟින් ලංකා මහජන මූල්‍ය ගිණුම්කරුවන්ගේ සංගමය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශන්ට අනුව ශූන්‍ය අවශේෂ අගය රැගෙන යාම ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත 07 හි විධිවිධාන වලට අනුකූල වේ.

**e.** බාහිර පාර්ශවයන් සඳහා කුලියට දුන් ගොඩනැගිලි

විශ්වවිද්‍යාලය විසින් ගොඩනැගිලි වලින් කොටසක් ශිෂ්‍ය ආපනශාලා සහ අනෙකුත් ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා බාහිර පාර්ශවයන්ට කුලියට දී ඇත. මෙම දේපළ ආයෝජන දේපළ ලෙස වර්ගීකරණය කර නොමැත. මෙම දේපල කුලියට ගැනීම හෝ ප්‍රාග්ධන අගය වැඩි කිරීම සඳහා තබා නොගන්නා අතර විශ්වවිද්‍යාලයේ ප්‍රදාන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කුලියට දී ඇති බැවින් ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 13 මඟින් ආයෝජන දේපළ විශ්වවිද්‍යාලය විසින් යොදවා නොමැත. ඒ නිසා මූල්‍ය ප්‍රකාශන වල මෙය දේපල, පිරියත හා උපකරණ ලෙස වර්ගීකරණය කර ඇත.

**f. මූල්‍ය කල්බදු**

කල්බදු නියමයන් මඟින් හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස බදුකරුට මාරු කරන විට කල්බදු මූල්‍ය කල්බදු ලෙස වර්ගීකරණය කෙරේ. 2024 වර්ෂය තුල, මූල්‍ය කල්බදු වලින් පැන නගින කිසිඳු ප්‍රාග්ධන බැඳීමක් නොතිබුණි. අධ්‍යයන කටයුතු සඳහා සහ අධ්‍යයන කටයුතු සඳහා පහසුකම් සැලසීම සඳහා විශ්වවිද්‍යාලය ගොඩනැගිලි ලබා ගනී. කුලී කාලය අවසානයේ විශ්වවිද්‍යාලයට සියලු අවදානම් හිමිකාරිත්වය මාරු නොකරන අතර කුලී කාලයෙන් පසුව ලබා කිසිඳු අදහසක් නොමැත.

සුළු වියදම් දරනු ලබන්නේ ඇතුළත් කරන ලද කුලී ගිවිසුම් මත වන අතර අනෙකුත් සියලුම වියදම් ගොඩනැගිලි හිමිකරු විසින් දරනු ලැබේ. විශ්වවිද්‍යාලය විසින් ශ්‍රී ලංකා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කරමින් ගොඩනැගිලි තෝරා ගෙන වසරක කාලයක් සඳහා කුලියට ගත් කාලයකට ඇතුළත් මාසික ගාස්තුවක් කුලිය ලෙස ගෙවන ලදී. මෙම කුලී වියදම් කුලී වියදම් ලෙස හඳුනා ගෙන ඇති අතර ගනුදෙනුවේ

ස්භාවය මූල්‍ය කල්බදු අර්ථ දැක්වීම යටතේ ආවරණය නොවන බැවින් විස්තීරන ප්‍රකාශ සඳහා සලකා බලනු ලැබේ.

කුලියට ගත් ගොඩනැගිල්ලේ දේශන සහ භාවිතය සඳහා දේශන ශාලා සහ අනෙකුත් අත්‍යවශ්‍ය අවශ්‍යතා සඳහා කොටස් කිරීමේ කටයුතු සඳහා විශ්වවිද්‍යාලය පිරිවැය දරනු ලබන අතර ස්ථිර පදනමක් මත පිරිවැයක් දැරීමට සිදු නොවේ. ගොඩනැගිලි හිමිකරුට භාර දුන් විට මෙම සියලු අමතරව සවිකර ඇති වත්කම් ඉවත් කරනු ලබන අතර එම වත්කම් විශ්වවිද්‍යාලයට අයත් වේ. පාලනය සහ ප්‍රතිලාභ විශ්වවිද්‍යාලයට අයත් වන අතර ඒවායේ ප්‍රයෝජනවත් ආයු කාලය අනුව ක්ෂය වන බැවින් කුලී පරිශ්‍රයට අමතරව සවිකර ඇති වත්කම් වත්කම් ලෙස සැලකේ.

### 3.1.2 කෙරී ගෙන යන වැඩ - ප්‍රාග්ධන ඉදිකිරීම්

වාර්තාකරණ දිනය වන විට සම්පූර්ණ කර නොමැති දේපළ, පිරියත හා උපකරණ සඳහා දරන ලද ප්‍රාග්ධන වියදම්, ප්‍රගතියේ පවතින ප්‍රාග්ධන වැඩ ලෙස දක්වා ඇති අතර, ප්‍රගතියේ පවතින ප්‍රාග්ධන වැඩ සඳහා දරන ලද පිරිවැය, භාවිතයට ගත හැකි වූ විට දේපළ, පිරියත හා උපකරණ වෙත මාරු කරනු ලැබේ. මෙම ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ගෙවන ලද අත්තිකාරම්, සමානුපාතික මුදල් බිල්පත් වලින් කපා හරින තෙක් අත්තිකාරම් ලෙස පෙන්වනු ලැබේ.

### 3.1.3 අස්පෘශ්‍ය වත්කම්

පරිගණක මෘදුකාංග, මාර්ගගත සඟරා සහ විද්‍යුත් පොත් අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනාගෙන ඇත්තේ, වත්කම්වලට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ ව්‍යවසායයට ගලා ඒමට සහ වත්කමේ පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි විටය. අත්පත් කරගත් අස්පෘශ්‍ය වත්කම්, සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානි අලාභ අඩු පිරිවැයකින් ප්‍රකාශ කර ඇත. මෙම පිරිවැය ඒවායේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලයන් මත ක්‍රමක්ෂය කරනු ලැබේ. සෑම වාර්තාකරණ දිනකම ප්‍රයෝජනවත් ආයු කාලයන් සහ අවශේෂ අගයන් සමාලෝචනය කර සුදුසු නම් සකස් කරනු ලැබේ.

**a) පේටන්ට් බලපත්‍රය**

විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා ජාලය (UBL- Cell) හරහා විශ්වවිද්‍යාලයේ නවෝත්පාදනයන්, ඒවා ලබා ගත් පසු පේටන්ට් බලපත්‍ර ලෙස පිළිගනු ලබන අතර වටිනාකම විශ්වාසදායක ලෙස මැනිය හැකිය. නිෂ්පාදන වාණිජකරණයෙන් ජනනය වන ආදායම, විශ්වවිද්‍යාලය විසින් තෙවන පාර්ශවයක් සමඟ ඇති කර ගත් ගිවිසුමේ ස්වභාවය අනුව, විස්තීර්ණ ප්‍රකාශන ප්‍රකාශය ලෙස පිළිගනු ලැබේ.

**b) පරිගණක මෘදුකාංග**

පරිගණක මෘදුකාංග බලපත්‍ර ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ අත්පත් කර ගැනීමට සහ භාවිතයට ගෙන ඒමට දරන පිරිවැය පදනම් කරගෙන ය. මෙම පිරිවැය සරල රේඛීය පදනමක් මත හෝ භාවිතයට ඇති ආයු කාලය මත ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය වන අවුරුදු පහ (5) තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ.

### 3.1.4 ඉන්වෙන්ට්‍රි අයිතම

පරිභෝජනය සඳහා සහ නැවත විකිණීම සඳහා නොවන ඉන්වෙන්ටරි අයිතම පිරිවැය අනුව ප්‍රකාශ කර ඇති අතර පෙර ඇතුළු පෙර පිට (FIFO) පදනම මත තීරණය වේ. විශ්ව විද්‍යාලයේ ඉන්වෙන්ටරියේ ලිපි ද්‍රව්‍ය, රසායනික ද්‍රව්‍ය, පරිභෝජන ද්‍රව්‍ය, ඖෂධ අයිතම සහ නඩත්තු අයිතම ඇතුළත් වේ. යල් පැන ගිය සහ මන්දගාමී චලනය වන අයිතම සඳහා නිසි දීමනා ලබා දීමෙන් පසු, පිරිවැයෙන් අඩුවෙන් සහ ශුද්ධ උපලබ්ධි කළ හැකි වටිනාකමට ඉන්වෙන්ටරි අයිතම තක්සේරු කරනු ලැබේ.

2024 දෙසැම්බර් 31 වන දිනට පෙර පිට පෙර ඇතුළු (FIFO) පදනම මත විශ්වවිද්‍යාලයේ රසායනික ද්‍රව්‍ය සහ වීදුරු භාණ්ඩ ඇතුළුව ඉන්වෙන්ටරි අයිතම භෞතිකව සත්‍යාපනය කර පිරිවැයට තක්සේරු කර ඇත.

රසායනික ද්‍රව්‍ය සහ වීදුරු භාණ්ඩ මිලදී ගැනීමේ පිරිවැය මූල්‍ය කාර්ය සාධනය සඳහා සම්පූර්ණයෙන්ම අය කරනු ලැබේ, නැතහොත් පර්යේෂණ ප්‍රදාන වලින් මිලදී ගන්නේ නම්, මිලදී ගැනීමේදී වියදම් ලෙස අදාළ පර්යේෂණ ප්‍රදාන වෙත සම්පූර්ණයෙන්ම අය කරනු ලැබේ. වසර

අවසානයේ ඉතිරිව ඇති ඉන්වෙන්ටරි අයිතම ශේෂය භෞතිකව සත්‍යාපනය කර අදාළ ගිණුම්වලට සකස් කරන ලදී.

### 3.1.5 මූල්‍ය වත්කම්

**ආයෝජන**

ආයෝජන යනු ස්ථාවර තැන්පතු සහ ඉතුරුම් ගිණුම්වල ආයෝජන නියෝජනය කරයි. මෙම ආයෝජන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 09(SLFRS 09) ට අනුකූලව ගිණුම් ගත කර ඇත. ස්ථාවර තැන්පතු සහ ඉතුරුම් ගිණුම්වල ආයෝජන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 09 SLFRS 09 ට අනුව ක්‍රමක්ෂය කළ පිරිවැය යටතේ වර්ගීකරණය කර ඇත.

**කාර්යය මණ්ඩල ණය**

සේවක ණය සඳහා ආපදා ණය, පරිගණක ණය, ප්‍රකාශන ණය, වාහන ණය සහ අනෙකුත් කාර්ය මණ්ඩල ණය ඇතුළත් වේ. ආයෝජන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 09 SLFRS 09 අනුව කාර්ය මණ්ඩල ණය ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත. ආයෝජන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 09 SLFRS 09 හි නියම කර ඇති පරිදි අපේක්ෂිත පාඩු ක්‍රමය මත ඕනෑම කාර්ය මණ්ඩල ණයක් තුළ ඇති වන හානි පාඩු හඳුනාගෙන ඇත. විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් සේවකයින්ට ලබා දෙන ණය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සෘජුවම පරිපාලනය කරනු ලැබේ. එබැවින්, එය විශ්වවිද්‍යාල ගිණුමට ඇතුළත් නොවේ. පොලී අනුපාතය භාණ්ඩාගාරය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ මත පදනම් වේ.

### 3.1.6 විවිධ ණයගැතියන් සහ ලැබිය යුතු දේ

වාර්තාකරණ දිනයෙන් පසු මාස 12ක් ඇතුළත ලැබිය යුතු සහ ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS 01) අනුව සඳහන් කර ඇති විවිධ ණයගැතියන් සහ ලැබිය යුතු මුදල්. සැක සහිත ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදන සලසා නොමැත.

### 3.1.7 ජංගම වත්කම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වර්ගීකරණය කර ඇති ජංගම වත්කම් යනු විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ උපයා ගැනීමට හෝ පරිභෝජනය කිරීමට අපේක්ෂා කරන, මුදල් හෝ මුදල් සමාන මුදලක් මත වාර්තා කිරීමේ දිනයෙන් පසු මාස දොළහක් ඇතුළත උපයා ගැනීමට අපේක්ෂා කරන ඒවා වේ.

### 3.1.8 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ යනු අතේ ඇති මුදල්, ඉල්ලුම් තැන්පතු සහ කෙටි කාලීන ඉතා ද්‍රවශීල ආයෝජන ලෙස අර්ථ දක්වා ඇති අතර ඒවා දන්නා මුදල් ප්‍රමාණයන්ට පහසුවෙන් පරිවර්තනය කළ හැකි අතර වටිනාකම වෙනස් වීමේ නොසැලකිය හැකි අවදානමකට යටත් වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ අරමුණ සඳහා, මුදල් සහ මුදල් සමාන දෑ වලට අතේ ඇති මුදල් සහ බැංකුවල තැන්පතු ඇතුළත් වේ. අත්පත් කර ගත් දින සිට මාස තුනක් හෝ ඊට අඩු කෙටි කාලීන පරිණතභාවයක් සහිත ආයෝජන ද මුදල් සමාන දෑ ලෙස සලකනු ලැබේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශය වක්‍ර ක්‍රමය මත පදනම්ව සකස් කර ඇත.

## 3.2 කොටස් හා වගකීම්

### 3.2.1 අභ්‍යන්තරව සීමා කරන ලද අරමුදල්

අභ්‍යන්තරව සීමා කරන ලද අරමුදල්වලට නිශ්චිත අරමුණක් සඳහා කැප කරන ලද අරමුදල් ඇතුළත් වේ. පීඨ සංවර්ධන අරමුදල් යනු වසර අවසානයේ ශුද්ධ වියදම් නොකළ ශේෂයන් සහිත පීඨ/දෙපාර්තමේන්තු අරමුදල්වල සමුච්චිත තත්ත්වය නියෝජනය කරයි.

<u>අභ්‍යන්තරව සීමා කරන ලද අරමුදල් වල සිදු වූ වෙනස්කම් – 2024</u>

රු.

| | |
|---|---|
| ආරම්භක වැය නොකල ශේෂය | 1,833,023,477 |
| මුළු ලැබීම් | 1,017,396,204 |
| මුළු වියදම් | (586,185,372) |
| වියදම් නොකල ශේෂය | 2,264,234,309 |

### 3.2.2 ත්‍යාග හා පරිත්‍යාග ලැබීම් අරමුදල්

පරිත්‍යාග අරමුදල්වලට විශ්වවිද්‍යාලයට ලැබෙන සීමිත පරිත්‍යාග ඇතුළත් වේ. පරිත්‍යාගශීලීන් විසින් ස්ථාපිත කරන ලද විවිධ අරමුණු වලට අනුකූලව පරිත්‍යාගශීලී අරමුදල් වලින් ජනනය වන ආයෝජන ප්‍රතිලාභ භාවිතා කරනු ලැබේ.

<u>ත්‍යාග සහ පරිත්‍යාග අරමුදලේ සිදු වූ වෙනස්කම් – 2024</u>

රු.

| | |
|---|---:|
| ආරම්භක වැය නොකල ශේෂය | 48,822,748 |
| මුළු ලැබීම් | 17,423,135 |
| මුළු වියදම් | (14,182,858) |
| වියදම් නොකල ශේෂය | 52,063,025 |

### 3.2.3 බාහිර පර්යේෂණ ප්‍රදාන

පර්යේෂණ කටයුතු සඳහා ලැබෙන විවිධ ප්‍රදාන වාර්තා කර සලකා බලනු ලැබේ. වෙනම ව්‍යාපෘතියක් ලෙස. අරමුදල් පරිත්‍යාගශීලී ආයතනය සහ විශ්වවිද්‍යාල පාලක මණ්ඩලය සමඟ ඇති කර ගත් ගිවිසුමට අනුව භාවිතා කෙරේ. මූල්‍ය ප්‍රකාශනවල වගකීම යටතේ පර්යේෂණ ව්‍යාපෘති හෙළිදරව් කර ඇත. පර්යේෂණය අවසන් වූ පසු ඉතිරි අරමුදල් තිබේ නම්, පරිත්‍යාගශීලියාට ප්‍රේෂණය කරනු ලැබේ හෝ පිළි නොගන්නේ නම්, ඉතිරි මුදල වසර තුනක් සම්පූර්ණ කිරීමෙන් හෝ වෙන් කිරීමෙන් පසු අවශ්‍ය පරිදි විශ්ව විද්‍යාල ආදායමක් හෝ පොදු පර්යේෂණ ප්‍රදානයක් ලෙස සලකනු ලැබේ.

<u>බාහිර පර්යේෂණ ප්‍රදාන වල සිදු වූ වෙනස්කම් – 2024</u>

රු.

| | |
|---|---:|
| ආරම්භක වැය නොකල ශේෂය | 197,566,940 |
| මුළු ලැබීම් | 328,464,939 |
| මුළු වියදම් | (211,037,637) |
| වියදම් නොකල ශේෂය | 314,994,242 |

### 3.2.4 සේවක ප්‍රතිලාභ

**a)** අර්ථ දක්වා ඇති දායකත්ව සැලසුම්

සේවකයින් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් (UPF) දායක මුදල්, සේවක භාර අරමුදල (ETF) සහ විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල සඳහා සුදුසුකම් ලබයි. දායකත්වයන් අදාළ ප්‍රඥප්ති සහ රෙගුලාසිවලට අනුකූල වේ. විශ්වවිද්‍යාලය විසින් ජීවන වියදම් දීමනා, අධ්‍යයන දීමනා සහ සේවකයින්ගේ මාසික වන්දි දීමනා ඇතුළුව විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට ස්ථාවර දායක මුදල් ගෙවන අතර සේවක භාර අරමුදලට, විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලට තවදුරටත් මුදල් ගෙවීමට නීතිමය හෝ ඵලදායී බැදීමක් නොමැත. මෙම වගකීම රැකියා ප්‍රතිලාභ පිළිබඳ අර්ථ දක්වා ඇති දායකත්ව සැලැස්මේ ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ 19 (SLPSAS 19) හි විෂය පථයට අයත් වේ. දායකත්ව සැලැස්ම නිර්වචනය කිරීම සඳහා දායකත්වය සඳහා ඇති බැදීම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ පිළිගනු ලැබේ, මන්ද අදාළ සේවාව සපයනු ලැබේ.

**b)** අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ සැලසුම්

නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැලසුම් යනු නිර්වචනය කරන ලද දායකත්ව සැලසුම් හැර අනෙකුත් පසු සැලසුම් වේ. 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතට අනුව විශ්වවිද්‍යාලය පාරිතෝෂිකය ගෙවීමට බැදී සිටී.

**c)** අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ බැදීම්

1983 අංක 12 දරන පාරිතෝෂික පනතට අනුව, සේවකයින්ට අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ බැදීමක් සඳහා වගකීමක් පැන නගී. එවැනි අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ බැදීමක් යනු ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ SLPSAS 19 සේවක ප්‍රතිලාභයේ විෂය පථයට අයත් පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ බැදීමකි.

**d)** අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ බැදීම් මැනීම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හඳුනාගෙන ඇති වගකීම වාර්තාකරණ දිනයේදී අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකම වේ. ගණනය කිරීම වාර්ෂිකව සුදුසුකම් ලත් ආයුගණකයෙකු විසින් ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය (PUC) භාවිතා කරමින් සිදු කරනු ලැබේ. ආයුගණක ලාභ සහ අලාභ ඇතුළත් අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ වගකීම මැනීම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ වහාම හඳුනා ගනු ලැබේ. වර්ෂය තුළ සේවකයින් විසින් සපයනු ලබන සේවාවන් සඳහා අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ වගකීම් ගුණාංගයේ වැඩිවීම (වත්මන් සේවා පිරිවැය) ලාභ හෝ අලාභයෙන් පොලී වියදම් සමඟ විශ්වවිද්‍යාලය හඳුනා ගනී. රජයේ බැඳුම්කර වල ප්‍රතිලාභ සැලකිල්ලට ගනිමින් වට්ටම් අනුපාතය ව්‍යුත්පන්න කර ඇත. සමුච්චිත පාරිතෝෂික ප්‍රතිපාදන මූල්‍ය තත්ත්ව ප්‍රකාශවල දක්වා ඇති අතර වගකීම ඇති වූ විට ශ්‍රී ලංකාවේ පොදු භාණ්ඩාගාරය වගකීමට මුදල් සපයනු ඇත.

**e)** ගිණුම්කරණ ඇස්තමේන්තු

සත්‍ය තක්සේරුවට වට්ටම් අනුපාත, වත්කම් මත අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාත, අනාගත වැටුප් වැඩිවීම සහ මරණ අනුපාත පිළිබඳ උපකල්පන සිදු කිරීම ඇතුළත් වේ, බැඳීමේ දිගුකාලීන ස්වභාවය නිසා, එවැනි ඇස්තමේන්තු සැලකිය යුතු අවිනිශ්චිතතාවයකට යටත් වේ.

f) සේවකයින්ට ලබා දෙන ණය ගණනය කරනු ලබන්නේ භාණ්ඩාගාරය විසින් සපයනු ලබන පොලී අනුපාතය මත වන අතර එය වෙළඳපල පොලී අනුපාතය ලෙස සලකනු ලබන අතර පොලිය මත ප්‍රතිලාභයක් නොලැබේ.

### 3.2.5 ප්‍රතිපාදන සහ වගකීම්

a) **ප්‍රතිපාදන**

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස විශ්වවිද්‍යාලයට වර්තමාන බැඳීම් (නෛතික හා නිර්මාණාත්මක) ඇති විට, බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් පිටතට ගලා යාමක් අවශ්‍ය වන අතර බැඳීමේ ප්‍රමාණය පිළිබඳව විශ්වාසදායක ඇස්තමේන්තුවක් කළ හැකි විට ප්‍රතිපාදන හඳුනා ගැනේ.

b) **අසම්භාව්‍ය වත්කම් සහ අසම්භාව්‍ය වගකීම්**

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ 08 (SLPSAS 8) ට අනුකූලව අවිනිශ්චිත වත්කම් සහ වගකීම් ගිණුම්ගත කර ඇත. ඒ අනුව අවිනිශ්චිත වගකීමක් යනු වැඩසටහනේ පාලනයෙන් ඔබ්බට ඇති එක් හෝ වැඩි අවිනිශ්චිත අනාගත සිදුවීම් සිදුවීම හෝ නොපැවතීම මගින් හෝ බැඳීම පියවීම සඳහා සම්පත් පිටතට ගලා යාමක් අවශ්‍ය නොවන බව පිළිගත නොහැකි වර්තමාන බැඳීමක් මගින් පැවැත්ම දිගටම පවතින අතීත සිදුවීම් වලින් පැන නගින විය හැකි බැඳීමකි.

විශ්වාසනීය ලෙස මැනිය නොහැකි වගකීමක් ඇති අතිශය දුර්ලභ අවස්ථාවන්හිදී ද අසම්භාව්‍ය වගකීමක් පැන නගී. අවිනිශ්චිතතාවය අසම්භාව්‍ය වගකීමක් හඳුනා නොගන්නා නමුත් මූල්‍ය ප්‍රකාශනයේ එහි පැවැත්ම හෙළි කරයි.

අසම්භාව්‍ය වත්කමක් යනු අතීත සිදුවීම් වලින් පැන නගින විය හැකි වත්කමකි, එහි පැවැත්ම විශ්වවිද්‍යාලයේ පාලනයෙන් ඔබ්බට ඇති අවිනිශ්චිත අනාගත සිදුවීම් එකක් හෝ කිහිපයක් සිදුවීම හෝ නොපැවතීම මගින් තහවුරු වේ. විශ්වවිද්‍යාලය අසම්භාව්‍ය වත්කමක් හඳුනා නොගන්නා නමුත් ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම සිදුවිය හැකි නමුත් පාහේ නිශ්චිත නොවන තැන්වල එහි පැවැත්ම හෙළි කරයි.

### 3.3 ආදායම හඳුනාගැනීම

ආදායම යනු වසර තුළ විශ්වවිද්‍යාලයට ලැබුණු සහ ලැබිය යුතු ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා විභවයන්ගේ දළ ගලා ඒම් වන අතර එය ශුද්ධ වත්කම්/කොටස්වල වැඩිවීමක් නියෝජනය කරයි. විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ 10 (SLPSAS 10) (විනිමය ගනුදෙනු වලින් ලැබෙන ආදායම) සහ විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ 11 (SLPSAS 11) (විනිමය නොවන ගනුදෙනු වලින් ලැබෙන ආදායම) යන ස්ථාපිත නිර්ණායක අනුගමනය කරමින් ආදායම හඳුනා ගනී.

#### 3.3.1 හුවමාරු ගනුදෙනු වලින් ලැබෙන ආදායම

විනිමය ගනුදෙනු වලින් ලැබෙන ආදායම යනු එක් ආයතනයක් වත්කම් හෝ සේවා ලබා ගන්නා හෝ වගකීම් පියවා දමා ඇති අතර හුවමාරුවේදී තවත් ආයතනයකට ආසන්න වශයෙන් සමාන වටිනාකමක් සෘජුවම

ලබා දෙන ගනුදෙනුවකි. විශ්වවිද්‍යාලයේ විනිමය සංක්‍රාන්ති වලින් ලැබෙන ආදායම සටහන අංක 01 යටතේ අනාවරණය කර ඇත.

**(a) උපාධි අපේක්ෂක හා අනෙකුත් ආදායම්**

උපාධි අපේක්ෂක උපාධි වැඩසටහන් සහ අනෙකුත් අභ්‍යන්තර ආදායම් වලින් ලැබෙන සියලුම ආදායම්, මුදල් පදනම මත මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ පිළිගනු ලැබේ.

**(b) ස්වයං මූල්‍ය පාඨමාලා වලින් උපයන ආදායම්**

ස්වයං මූල්‍යකරණ ක්‍රියාකාරකම්වල ආදායම, එම මූල්‍ය වර්ෂයේ සිදු කරන ලද සේවාව දක්වා කාලය සඳහා වියදම් ප්‍රමාණයට හඳුනාගෙන ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපත්තිය සිසුන්ට සේවය සැපයීමට පෙර වාරික පදනමක් මත හෝ සම්පූර්ණයෙන් පාඨමාලා ගාස්තුව කල්තියා ලබා ගන්නා බැවින්, අනාගත වියදම් සහ සංවර්ධන සඳහා දායකත්වය කල් දැමූ ආදායම යටතේ දක්වා ඇත. කෙසේ වෙතත්, ගනුදෙනුව අවසන් කිරීමේ අදියර වාර්තා කරන දිනට සිදුවී නොමැති බැවින්, අනාගත සේවාවන් සඳහා ලැබිය යුතු පාඨමාලා ගාස්තුව හඳුනා නොගනී. මුළු පාඨමාලා ගාස්තුවෙන් ඉතිරි ශේෂය සිසුන්ට සේවා සැපයීමේදී හඳුනා ගනු ලැබේ.

**(c) පාඨමාලා ගාස්තුවේ අනාගත වාරික**

විශ්වවිද්‍යාලය විසින් සේවා සැපයීමට පෙර, අනාගත කාල සීමාව සඳහා ලැබිය යුතු වාරික ලැබිය යුතු ලෙස හඳුනා නොගනු ඇත. අනාගත වාරික ලැබීම් පිළිබඳ අවිනිශ්චිතතාවයක් පවතින බැවින්, අනාගත මුදල් ප්‍රවාහය ලැබීම ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත 07 අනුව වත්කම් ලෙස වර්ගීකරණය නොකෙරේ.

**(d) ස්වයං මූල්‍ය පාඨමාලා වසා දැමීම.**

විශ්වවිද්‍යාලයේ ප්‍රතිපත්තිය වන්නේ පහත සඳහන් නිර්ණායක මත පදනම්ව ස්වයං මූල්‍ය පාඨමාලා වසා දැමීමයි.

- පාඨමාලා ආදායම උපාධිය මත සමානුපාතිකව හඳුනා ගනු ලබන අතර, ඉතිරි සිසුන් සඳහා ඉතිරි වටිනාකම ඉදිරියට ගෙනයන ආදායමක් ලෙස තබා ගනු ලැබේ, මන්ද නියමිත පාඨමාලා කාලයෙන් ඔබ්බට අධ්‍යයන අධ්‍යයන වැඩසටහන මත පදනම්ව දීර්ඝ කාල සීමාවක් ලබා දෙනු ලැබේ. ඩිප්ලෝමා, බාහිර උපාධි සහ පශ්චාත් උපාධි සඳහා දීර්ඝ කරන

ලද කාල සීමාවන් පිළිවෙලින් වසර 3, අවුරුදු 6 සහ අවුරුදු 5 වේ. කෙසේ වෙතත්, සමහර ප්‍රායෝගික ගැටළු හේතුවෙන් පාඨමාලා වසා දැමීම සඳහා පාඨමාලා සම්බන්ධීකාරකගේ නිර්දේශය සලකා බලනු ලැබේ.

**(e) පොලී ආදායම්**

බාහිරව සීමා කරන ලද අරමුදල්, නම් කරන ලද අරමුදල් සහ රක්ෂණ අරමුදල් සහ පරිත්‍යාග අරමුදල් වලින් උපයන ලද ආයෝජන ආදායම හැර, කාල සීමාව සඳහා ලැබුණු පොලී ආදායම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ විනිමය ආදායම ලෙස සටහන් වේ. එම අරමුදල් වලින් උපයන ලද ආයෝජන ආදායම වියදමට වඩා අතිරික්ත වූ විට, අතිරික්තය අදාළ අරමුදලේ ඍජු වැඩිවීමක් ලෙස සටහන් වන අතර සමුච්චිත සංචිත සහ ප්‍රදාන යටතේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුළත් වේ. රන් පදක්කම් සහ ශිෂ්‍යත්ව අරමුදල් ආයෝජනය සඳහා වන පොලිය ගිණුම්කරණ කාලය තුළ පරිණත නොවන්නේ නම් මුදල් පදනම මත ගිණුම්ගත කෙරේ.

**(f) කුලී ආදායම**

විශ්වවිද්‍යාල වත්කම් කුලියට දීමෙන් ලැබෙන කුලී ආදායම හුවමාරු ගනුදෙනු ආදායම ලෙස පිළිගැනේ.

### 3.3.2 විනිමය නොවන ගනුදෙනු වලින් ලැබෙන ආදායම.

හුවමාරු නොවන ගනුදෙනු යනු විශ්වවිද්‍යාලය විසින් ආසන්න වශයෙන් සමාන වටිනාකමක් හුවමාරුවකින් ලබා නොදී වෙනත් ආයතනයකින් (උදා: මුදල් හෝ වෙනත් වත්කම්) වටිනාකම ලබා ගන්නා ගනුදෙනු වේ. වත්කමක අර්ථ දැක්වීම සපුරාලන, භාණ්ඩමය සේවාවන් හැර වෙනත් හුවමාරු නොවන ගනුදෙනු වලින් ලැබෙන සම්පත් ගලා ඒම් වත්කමක් ලෙස පිළිගනු ලබන්නේ:

- විශ්වවිද්‍යාලයට ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා විභවයක් ලැබීමට ඉඩ තිබේ; සහ
- සාධාරණ වටිනාකම විශ්වාසදායක ලෙස මැනිය හැකිය.

වත්කම් ලෙස හඳුනාගෙන ඇති හුවමාරු නොවන ගනුදෙනු වලින් ලැබෙන සම්පත් ගලා ඒම, එම ගලා ඒමට අදාළව වගකීමක් හඳුනා නොගන්නා තාක් දුරට, හුවමාරු නොවන ආදායම ලෙස හඳුනා ගැනේ. විශ්වවිද්‍යාල හුවමාරු නොවන ගනුදෙනුවට අදාළව නිශ්චිත පිළිගැනීමේ නිර්ණායක පහත දැක්වේ.

**විනිමය නොවන ගනුදෙනු වලින් ලැබෙන ආදායම හඳුනා ගැනීම.**

- වත්කමක් ලෙස හඳුනාගෙන ඇති හුවමාරු නොවන ගනුදෙනුවකින් සම්පත් ගලා ඒමක් ආදායමක් ලෙස හඳුනාගත යුතු අතර, එම ගලා ඒම සම්බන්ධයෙන් වගකීමක් ද ලෙස හඳුනාගෙන ඇති ප්‍රමාණය හැර.
- වත්කමක් ලෙස හඳුනාගෙන ඇති හුවමාරු නොවන ගනුදෙනුවකින් සම්පත් ගලා ඒමක් සම්බන්ධයෙන් වගකීමක් ලෙස හඳුනාගෙන ඇති වර්තමාන බැඳීමක් ආයතනයක් සපුරාලන බැවින්, එය හඳුනාගෙන ඇති වගකීමේ ධාරණ ප්‍රමාණය අඩු කර එම අඩු කිරීමට සමාන ආදායම් ප්‍රමාණයක් හඳුනා ගත යුතුය.

**විනිමය නොවන ගනුදෙනු වලින් ලැබෙන ආදායම මැනීම.**

විනිමය නොවන ගනුදෙනු වලින් ලැබෙන ආදායම, ආයතන විසින් හඳුනා ගෙන ඇති ශුද්ධ වත්කම් වල වැඩිවීමේ ප්‍රමානයෙන් මනිනු ලැබේ.

**රජයේ ප්‍රදාන / මාරුකිරීම්**

රජයේ ප්‍රදාන වලින් ලැබෙන වත්කම් සහ ආදායම හඳුනා ගනු ලබන්නේ හුවමාරු සඳහා වන ගිවිසුම සාධාරණ වටිනාකමට බැඳී ඇති කාල සීමාව තුලය. හුවමාරුවක් කොන්දේසි වලට යටත් වන විට සහ හුවමාරු නොවන ගනුදෙනුවේ ප්‍රතිඵලයක් ලෙස වර්තමාන බැඳීමක් ඇති වි, කොන්දේසි සපුරාලන තෙක් විශ්වවිද්‍යාලය වගකීමක් හඳුනා ගනී. රජයේ ප්‍රදාන වලින් ලැබෙන වත්කම් සහ ආදායම් හඳුනා ගැනීමේ දිනයේ ඇති සාධාරණ වටිනාකමට මනිනු ලැබේ. මුදල් වත්කම් ඒවායේ නාමික වටිනාකමට මනිනු ලැබේ.

**පුනරාවර්තන ප්‍රදාන**

පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු රජයේ ප්‍රදාන, විනිමය නොවන ගනුදෙනු යටතේ මූල්‍ය කාර්ය සාදන ප්‍රකාශයේ හඳුනා ගෙන ඇත 2024

වර්ෂය සඳහා පුනරාවර්තන ප්‍රදාන ලෙස රු. 6,700,503,327 ක රජයේ ප්‍රදාන ලැබුණි.

| **විස්තරය** | **මුදල (රු)** |
|---|---|
| රජයේ ප්‍රදාන | 6,659,500,000 |
| ආසියානු සංවර්ධන බැංකු ප්‍රදාන | 41,003,327 |
| මුළු මුදල | **6,700,503,327** |

**ප්‍රාග්ධන ප්‍රදාන හා අනෙකුත් මාරු කිරීම්**

2022 මූල්‍ය වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් 11 අනුව විනිමය නොවන ගනුදෙනු වලින් ලැබෙන ආදායමේ අවශ්‍යතාවයන්ට අනුකූලව, ප්‍රාග්ධන වියදම සඳහා ලැබුණු රජයේ ප්‍රදාන සහ අනෙකුත් ප්‍රදාන ප්‍රාග්ධන මාරු කිරීම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

**තෑගි, පරිත්‍යාග හා ද්‍රව්‍යමය වශයෙන් ලැබුණු භාණ්ඩ**

ත්‍යාග පරිත්‍යාග යනු විශ්වවිද්‍යාලයට ලැබෙන මුදල් හෝ වෙනත් මූල්‍යමය වත්කම් සහ භාණ්ඩ ඇතුළු වත්කම් ස්වෙච්ඡාවෙන් මාරු කිරීමකි. ඒවා කොන්දේසි වලින් තොරය. අනාගත ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා විභවයන් විශ්වවිද්‍යාලය තුලට ගලා ඒමට ඉඩ ඇති විට සහ වත්කම් වල සාධාරණ වටිනාකම විශ්වාසදායක ලෙස මැනිය හැක. තෑගි හා පරිත්‍යාග ලැබුණු භාණ්ඩ එහි සාධාරණ වටිනාකමට හුවමාරු නොවන ආදායමක් ලෙස පිළිගනු ලැබේ.

## 3.4 වියදම් හඳුනා ගැනීම

විශ්වවිද්‍යාලයේ සියලුම ක්‍රියාකාරකම් සිදු කිරීමේදී දරණ ලද වියදම් උපචිත පදනමක් මත හඳුනා ගෙන මූල්‍ය කාර්යය සාදන ප්‍රකාශයට ඇතුළත් කරනු ලැබේ.

වියදම් වැඩසටහන්/ව්‍යාපෘති අනුව විශ්ලේෂණය කර ඇති අතර එම කාලය අතර තුල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ මත පොදු වාර්තාකරණ ආකෘතියට අනුකූල වීම මත පදනම්ව විවිධ මාතෘකා යටතේ විශ්ලේෂණය වර්ගීකරණය කරන ලදී. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් 11 අනුව වියදම් ප්‍රාග්ධන හා පුනරාවර්තන ලෙස නැවත වර්ගීකරණය කරන ලදී

### 3.5 ණය ගැනීමේ පිරිවැය

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් 4 අනුව විශ්වවිද්‍යාලයට නය වගකීමක් නොමැති බැවින් ණය ගැනීමේ පිරිවැය අදාළ නොවේ. .

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

අභ්‍යන්තර ආදායම්

සටහන 01

| අනු අංකය. | සටහන | පොදු රු. | වෛද්‍ය විද්‍යා පීඨය රු. | බාහිර විභාග රු. | පශ්චාද් උපාධි පීඨය රු. | කළමනාකරණ හා වාණිජ විද්‍යා පීඨය රු. | මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය රු. | ව්‍යවහාර විද්‍යා පීඨය රු. | තාක්ෂණ පීඨය රු. | මුළු මුදල 2024 රු. | මුළු මුදල 2023 රු. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රාග්ධන නොවන | | | | | | | | | | | |
| 1 | දඩ මුදල් /ප්‍රමාද ගාස්තු | 198,481 | - | 15,850 | - | - | - | - | - | 214,331 | 154,145 |
| 2 | ගොඩනැගිලි ප්‍රමාද වී ඉදි කිරීම් වලට අදාල දඩ ගාස්තු | 560,652 | - | - | - | - | - | - | - | 560,652 | 3,215,752 |
| 3 | පුස්තකාල දඩ | 935,989 | - | - | - | - | - | - | - | 935,989 | 329,024 |
| | **මුළු එකතුව** | **1,695,121** | - | **15,850** | - | - | - | - | - | **1,710,971** | **3,698,921** |

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
### අභ්‍යන්තර ආදායම්

සටහන 01

| අනු අංකය. | සටහන | පොදු රු. | වෛද්‍ය විද්‍යා පීඨය රු. | බාහිර විභාග රු. | පශ්චාද් උපාධි පීඨය රු. | කළමනාකරණ හා වාණිජ විද්‍යා පීඨය රු. | මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය රු. | ව්‍යවහාර විද්‍යා පීඨය රු. | තාක්ෂණ පීඨය රු. | මුළු මුදල 2024 රු. | මුළු මුදල 2023 රු. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | ආදායම් | | | | | | |
| 5 | බැඳුම්කර කඩ කිරීමෙන් වූ ගුවන් ගමන් ගාස්තු | 19,577,220 | - | - | - | - | - | - | - | 19,577,220 | 11,437,733 |
| 6 | අයදුම්පත් ගාස්තු | 561,170 | - | 17,312,625 | - | - | - | - | - | 17,873,795 | 20,607,630 |
| 7 | බැඳුම්කර හා බැඳුම්කර කඩකිරීම් | 125,321,671 | - | - | - | - | - | - | - | 125,321,671 | 52,101,230 |
| 8 | සහතිකපත් ගාස්තු | 3,312,866 | 3,469,379 | 5,037,409 | 225,018 | - | - | - | - | 12,044,672 | 5,742,699 |
| 9 | උපාධි ලෝගු කුලී ගාස්තු | 293,925 | - | - | 301,250 | - | - | - | - | 595,175 | 1,109,700 |
| 10 | පරිගණක භාවිතය | 998,248 | - | - | - | - | - | - | - | 998,248 | 289,239 |
| 11 | උපාධිප්‍රදානෝත්සව ගාස්තු | 30,906,950 | - | - | - | - | - | - | - | 30,906,950 | 31,416,278 |
| 12 | පාඨමාලා ගාස්තු | - | - | - | 13,642,760 | - | - | - | - | 13,642,760 | 12,310,104 |
| 13 | පාඨමාලා ගාස්තු - විදේශ සිසුන් | - | - | - | - | - | - | - | - | - | 13,955,348 |
| 14 | Dialogue Income | - | | | | | 299,100 | | | 299,100 | - |
| 15 | විභාග ගාස්තු | 1,590,032 | - | - | 4,126,975 | - | - | - | - | 5,717,007 | 5,411,221 |
| 16 | ක්‍රීඩාපිටි වෙන්කිරීම් | 456,850 | - | - | - | - | - | - | - | 456,850 | 342,125 |
| 17 | ගබඩා කිරීමේ ගාස්තු | 300,000 | | | | | | | | 300,000 | - |
| 18 | සිසු හැඳුනුම්පත් - නැවත පිටපත් නිකුත් කිරීම | 797,321 | - | - | - | - | - | - | - | 797,321 | 239,827 |
| 19 | ආයෝජන මත පොලී | 246,579,602 | 36,042,025 | 142,181,847 | 59,911,432 | 34,069,272 | 5,390,713 | 4,279,648 | - | 528,454,539 | 707,484,470 |
| 20 | ණය පොලී | 4,133,264 | - | - | - | - | - | - | - | 4,133,264 | 4,890,242 |
| 21 | රසායනාගාර ගාස්තු | 1,481,670 | - | - | - | - | - | - | - | 1,481,670 | 1,694,683 |
| 22 | පුස්තකාල ආදායම - නැවත ... | - | - | - | 2,194,531 | - | - | - | - | 2,194,531 | 3,351,750 |
| 23 | වෛද්‍ය ගාස්තු | 831,706 | - | - | - | - | - | - | - | 831,706 | 722,028 |
| 24 | අනෙකුත් ආදායම් | 10,043,727 | - | - | - | - | - | - | - | 10,043,727 | 7,301,228 |
| 25 | පෙර පාසල් හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන ආදායම් | 1,301,736 | - | - | - | - | - | - | - | 1,301,736 | 1,757,281 |

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
### අභ්‍යන්තර ආදායම්

සටහන 01

| අනු අංකය. | සටහන | පොදු රු. | වෛද්‍ය විද්‍යා පීඨය රු. | බාහිර විභාග රු. | පශ්චාද් උපාධි පීඨය රු. | කළමනාකරණ හා වාණිජ විද්‍යා පීඨය රු. | මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය රු. | ව්‍යවහාර විද්‍යා පීඨය රු. | තාක්ෂණ පීඨය රු. | මුළු මුදල 2024 රු. | මුළු මුදල 2023 රු. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | භුවමාරු | | | | | | |
| 26 | ලියාපදිංචි ගාස්තු | 22,345,200 | - | 69,079,787 | 1,645,056 | - | - | - | - | 93,070,043 | 28,605,629 |
| 27 | සැපයුම්කරුවන් ලියාපදිංචිය | 2,589,000 | - | - | - | - | - | - | - | 2,589,000 | 675,800 |
| 28 | නේවාසිකාගාර කුලී | 6,667,561 | - | - | - | - | - | - | - | 6,667,561 | 4,683,086 |
| 29 | දේපල කුලී | 4,325,250 | - | - | - | - | - | - | - | 4,325,250 | 3,165,200 |
| 30 | පිහිනුම් තටාකය මඟින් කුලී | 3,848,150 | - | - | - | - | - | - | - | 3,848,150 | 4,376,950 |
| 31 | යගිරල නේවාසිකාගාර කුලී | 6,230 | - | - | - | - | - | - | - | 6,230 | 10,170 |
| 32 | කුලී සහ කුලී රථ ගාස්තු | 1,478,432 | - | - | - | - | - | - | - | 1,478,432 | 1,881,413 |
| 33 | පැරණි තොග විකුණුම් | - | - | - | - | - | - | - | - | - | 21,120 |
| 34 | ප්‍රකාශන විකුණුම් | 7,200 | - | - | - | - | - | - | - | 7,200 | - |
| 35 | ස්වයං මූල්‍ය ආදායම් | - | 11,719,644 | 491,480,648 | 68,303,958 | 140,484,966 | 40,745,952 | - | 3,465,376 | 756,200,543 | 723,631,354 |
| 36 | ක්‍රීඩා සඳහා ලියාපදිංචිය | 383,000 | - | - | - | - | - | - | - | 383,000 | 617,800 |
| 37 | ක්‍රීඩා පුහුණු සැසි සඳහා බාහිර ආයතන ගෙවීම් | 183,000 | - | - | - | - | - | - | - | 183,000 | 18,000 |
| 38 | ශිෂ්‍ය වාතර්‍ා පොත් ගාස්තු | 86,800 | - | 80,925 | - | - | - | - | - | 167,725 | 99,875 |
| 39 | ටෙන්ඩර් ගාස්තු | 973,500 | - | - | - | - | - | - | - | 973,500 | 1,171,000 |
| 40 | ප්‍රාග්ධන ගිණුමට මුදල් මාරු කිරීම | - | - | - | - | - | - | - | - | - | (15,000,000) |
| 41 | ස්වයං මූල්‍ය අරමුදලට මාරු කිරීම | - | - | - | - | - | - | - | - | - | (3,358,430) |
| 42 | විශ්වවිද්‍යාල අරමුදල් - ස්වයං මූල්‍ය පාඨමාලා | 132,635,455 | - | - | - | - | - | - | - | 132,635,455 | 146,304,899 |
| | **උප එකතුව** | **624,016,735** | **51,231,048** | **725,173,242** | **150,350,980** | **174,554,238** | **46,435,765** | **4,279,648** | **3,465,376** | **1,779,507,032** | **1,779,068,681** |
| | | | | | | | | | | | |
| | **මුළු එකතුව** | **625,711,857** | **51,231,048** | **725,189,092** | **150,350,980** | **174,554,238** | **46,435,765** | **4,279,648** | **3,465,376** | **1,781,218,004** | **1,782,767,602** |

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

### විනිමය නොවන ගණුදෙනු වලින් ලැබෙන ආදායම් - ප්‍රාග්ධන

සටහන 02

| විස්තරය | 2024 | 2023 |
|---|---|---|
| ප්‍රාග්ධන මාරුකිරීම් - රජයේ අරමුදල් | 1,295,457,000 | 1,372,500,000 |
| ප්‍රාග්ධන මාරුකිරීම් - විශ්වවිද්‍යාල අරමුදල් | 200,063,712 | 291,766,866 |
| AHEAD ව්‍යාපෘතියේ ප්‍රදාන | 114,400,888 | 523,429,543 |
| ADB ව්‍යාපෘතියේ ප්‍රදාන | 2,777,943,670 | 840,517,548 |
| ප්‍රතිශක්ති හා ජෛව ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ප්‍රදාන | 445,688,559 | 137,326,023 |
| පර්යේෂණ ප්‍රදාන සහ වෙනත් ජනනය කරන ලද අරමුදල් වලින් ප්‍රාග්ධන වියදම් සඳහා දායකත්වය | 141,547,239 | 74,614,868 |
| පරිත්‍යාග - පුස්තකාල පොත් | 3,945,439 | 2,733,370 |
| පරිත්‍යාග කරන ලද උපකරණ - වෛද්‍ය විද්‍යා පීඨය | 11,980,000 | 58,753,874 |
| පරිත්‍යාග- සම සෞඛ්‍ය විද්‍යා පීඨය | 14,038,250 | 55,178 |
| පරිත්‍යාග - මත්තේගොඩ ඉඩම විශ්වවිද්‍යාලය සඳහා ඉඩම් අමාත්‍යාංශය විසින් අත්පත් කරගන්නා ලදී | - | 1,120,847,069 |
| පරිත්‍යාග - මෝටර් රථ | 17,200,000 | - |
| **මුළු එකතුව** | **5,022,264,757** | **4,422,544,338** |

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මූල්‍ය ප්‍රකාශන 2024

පුනරාවර්තන වියදම් - 2024 - සාරාංශය

සටහන 03

| විෂය කේතය | වර් ගය / විෂය / මාතෘකාව | වැඩසටහන 01 | වැඩසටහන 02 | වැඩසටහන 03 | වැඩසටහන 04 | වැඩසටහන 05 | වැඩසටහන 07 | වැඩසටහන 08 | 2024 මුළු මුදල (රු) | 2023 මුළු මුදල (රු) |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සාමාන්‍ය පාලන හා සේවා | පීඨ | ඉගැන්වීම් සම්පත් | සුබසාධන සේවා | ගොඩනැගිලි හා ඉඩම් නඩත්තුව | බාහිර විභාග | නේවාසිකාගාර | | |
| 3.1 | **සේවක වැටුප්** | | | | | | | | | |
| 1001-01 | වැටුප් හා වේතන | 132,971,094 | 1,458,667,354 | 49,052,621 | 36,084,052 | 40,576,921 | 48,571,556 | 6,241,050 | 1,772,164,649 | 1,689,011,889 |
| 1001-02 | විශ්වවිද්‍යාල අර්ථසාධක දායක අරමුදල | 18,746,193 | 340,660,048 | 8,568,029 | 5,066,878 | 6,367,522 | 7,442,598 | 976,575 | 387,827,843 | 328,385,277 |
| 1001-03 | විශ්‍රාම වැටුප් | 13,123,929 | 185,279,538 | 7,114,226 | 3,131,514 | 5,381,068 | 1,844,011 | 570,105 | 216,444,391 | 184,882,747 |
| 1001-04 | සේවක භාරකාර දායක අරමුදල | 6,232,325 | 104,565,040 | 3,101,700 | 1,620,090 | 2,329,955 | 1,444,208 | 309,336 | 119,602,654 | 101,382,390 |
| 1001-05 | වැඩබැලීම් සඳහා වූ ගෙවීම් | 1,072,527 | 683,803 | 157,280 | 74,536 | - | - | 103,579 | 2,091,725 | 1,773,479 |
| 1001-06 | බාහිර කර්කාචාර්ය ගෙවීම් / උපදේශක [illegible] | - | 30,607,448 | - | 6,506,613 | - | - | - | 37,114,060 | 36,054,044 |
| 1001-07 | විශේෂ දීමනා | 12,036 | 2,035,932 | - | - | - | - | - | 2,047,969 | 970,996 |
| 1001-08 | සංග්‍රහ දීමනා | 669,343 | 9,388,186 | - | 1,125,930 | - | - | - | 11,183,459 | 10,079,769 |
| 1001-10 | අතිරේක මාසික දීමනාව 20% | 20,515,916 | 222,348,342 | 9,299,520 | 4,187,446 | 7,997,100 | 2,903,409 | 1,126,901 | 268,378,634 | 269,523,111 |
| 1001-11 | අන්තර් දීමනාව | 42,333 | 1,497,613 | - | - | - | - | - | 1,539,946 | 3,130,380 |
| 1001-12 | මාසික හිලව් දීමනාව 45% | 45,569,570 | 111,228,762 | 14,519,169 | 11,958,478 | 18,001,646 | 6,532,670 | 2,768,581 | 210,578,876 | 222,334,923 |
| 1001-13 | මාසික දීමනාව රු. 5,000.00 | 12,622,715 | 94,483,185 | 4,620,769 | 3,158,779 | 5,914,194 | 1,740,000 | 420,000 | 122,959,642 | 126,176,299 |
| 1001-20 | දේපළ ණය පොලී | 760,357 | 3,588,566 | 83,947 | 106,674 | 101,532 | 121,137 | 11,836 | 4,774,049 | 5,477,817 |
| 1002-01 | අතිකාල | 34,630,008 | 40,101,375 | 8,349,010 | 6,178,690 | 7,517,559 | 2,285,541 | - | 99,062,183 | 127,419,293 |
| 1002-02 | නිවාඩුදින දීමනාව | 51,888 | 456,030 | - | - | 5,405 | 6,618 | - | 519,941 | 984,601 |
| 1003-02 | අධ්‍යයන දීමනාව | 4,012,377 | 1,634,234,863 | 26,650,524 | - | - | - | - | 1,664,897,764 | 1,301,734,905 |
| 1003-03 | සම්බන්ධීකරණ දීමනාව | - | - | - | 156,348 | - | - | - | 156,348 | 156,348 |
| 1003-04 | ජීවන වියදම් දීමනාව | 42,121,703 | 310,645,672 | 15,313,192 | 10,840,847 | 19,607,279 | 5,759,400 | 1,390,200 | 405,678,294 | 197,662,389 |
| 1003-05 | අනෙකුත් දීමනා | 553,059 | 8,011,950 | 155,015 | 847,166 | 52,200 | 5,594,763 | 1,177,184 | 16,391,337 | 17,148,433 |
| 1003-07 | පර් යේෂණ ප්‍රදාන | 3,799,715 | 283,928,225 | 5,489,789 | - | - | 412,301 | - | 293,630,030 | 286,166,382 |
| 1003-08 | ගමන් දීමනාව | - | 1,422,374 | - | 283,304 | 23,163 | - | - | 1,728,841 | 1,794,719 |
| 1003-09 | ඉන්ධන සහ ලිහිසි තෙල් දීමනාව | 1,160,655 | 5,189,179 | - | - | - | - | - | 6,349,834 | 4,419,255 |
| | **උප එකතුව** | **338,667,744** | **4,849,023,484** | **152,474,792** | **91,327,345** | **113,875,543** | **84,658,213** | **15,095,346** | **5,645,122,467** | **4,916,669,446** |
| 3.2 | **ගමන් වියදම්** | | | | | | | | | |
| 1101 | දේශීය | 1,600,848 | 605,685 | - | 101,470 | 5,236 | 7,968 | 58,919 | 2,380,127 | 2,763,267 |
| 1102 | විදේශීය | - | 19,048,220 | - | - | - | - | - | 19,048,220 | 18,083,251 |
| | **උප එකතුව** | **1,600,848** | **19,653,905** | - | **101,470** | **5,236** | **7,968** | **58,919** | **21,428,347** | **20,846,519** |

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මූල්‍ය ප්‍රකාශන 2024

පුනරාවර්තන වියදම් - 2024 - සාරාංශය

සටහන 03

| විෂය ක්ෂේත්‍රය | වර් ගය / විෂය / මාතෘකාව | වැඩසටහන 01 | වැඩසටහන 02 | වැඩසටහන 03 | වැඩසටහන 04 | වැඩසටහන 05 | වැඩසටහන 07 | වැඩසටහන 08 | 2024 මුළු මුදල (රු) | 2023 මුළු මුදල (රු) |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සාමාන්‍ය පාලන හා සේවා | පීඨ | ඉගැන්වීම් සම්පත් | සුබසාධන සේවා | ගොඩනැගිලි හා ඉඩම් නඩත්තුව | බාහිර විභාග | නේවාසිකාගාර | | |
| 3.3 | සැපයීම් | | | | | | | | | |
| 1201 | ලිපිද්‍රව්‍ය හා කාර් යාල අවශ්‍යතා | 9,786,124 | 42,612,327 | 1,818,411 | 2,115,134 | 474,839 | 2,366,767 | 110,233 | 59,283,835 | 66,884,624 |
| 1202 | ඉන්ධන හා ලිහිසි තෙල් | 28,793,403 | 3,262,475 | - | 164,355 | 692,950 | 64,704 | - | 32,977,887 | 42,606,244 |
| 1205-01 | නිල ඇඳුම් | 2,472,471 | 2,620,174 | 162,787 | 389,849 | 846,361 | - | - | 6,491,641 | 11,177,291 |
| 1205-02 | යාන්ත්‍රික හා විදුලි භාණ්ඩ | - | 2,152,195 | 4,700 | - | 196,388 | - | 1,743 | 2,355,026 | 1,526,273 |
| 1205-03 | රසායන ද්‍රව්‍ය හා විදුරු භාණ්ඩ | 131,832 | 21,992,639 | 5,890 | 42,767 | - | 3,431 | 6,481 | 22,183,040 | 19,132,251 |
| 1205-04 | ඖෂධ සැපයීම් | - | 726,343 | - | 1,401,778 | - | - | - | 2,128,121 | 4,665,329 |
| 1205-05 | අනෙකුත් | 2,740,062 | 7,091,090 | 240,380 | 7,414,679 | 1,050,125 | 2,551,983 | 130,982 | 21,219,301 | 32,243,317 |
| | **උප එකතුව** | **43,923,892** | **80,457,242** | **2,232,169** | **11,528,562** | **3,260,663** | **4,986,885** | **249,438** | **146,638,850** | **178,235,329** |
| 3.4 | නඩත්තු වියදම් | | | | | | | | | |
| 1301 | වාහන | 13,043,901 | 245,995 | - | - | 2,000 | 874,018 | - | 14,165,914 | 13,693,150 |
| 1302 | පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපකරණ | 13,162,341 | 24,638,007 | 747,357 | 863,269 | 2,016,358 | 633,423 | 829,090 | 42,889,846 | 41,798,561 |
| 1303 | ගොඩනැගිලි සහ ව්‍යුහයන් | - | 345,000 | - | - | 181,828 | 11,706 | - | 538,534 | 8,062,637 |
| 1304 | ලී බඩු | - | - | 81,250 | 27,150 | 3,750 | - | 108,300 | 220,450 | 471,850 |
| 1305 | අනෙකුත් | 2,000 | 313,778 | - | - | 24,100 | 2,379 | - | 342,257 | 1,026,615 |
| | **උප එකතුව** | **26,208,242** | **25,542,780** | **828,607** | **890,419** | **2,228,036** | **1,521,526** | **937,390** | **58,157,000** | **65,052,812** |
| 3.5 | කොන්ත්‍රාත් සේවා | | | | | | | | | |
| 1401 | ප්‍රවාහන | 152,693 | 625,268 | - | - | 90,000 | 17,480 | 10,644 | 896,085 | 630,762 |
| 1402 | තැපැල් හා සන්නිවේදන | 38,358,210 | 16,864,317 | 30,896 | 143,152 | 146,720 | 1,049,231 | 54,508 | 56,647,034 | 49,468,494 |
| 1403 | විදුලිය සහ ජලය | - | 35,232,673 | - | - | 272,615,916 | 6,002,951 | - | 313,851,539 | 315,329,076 |
| 1404 | කුලී සහ දේශිය බදු | 6,634,682 | 596,516 | - | - | - | 155,520 | - | 7,386,718 | 4,818,022 |
| 1405 | කුලී සහ කුලී ගාස්තු ගොඩනැගිලි | 158,589 | 45,723,576 | - | - | - | 11,869,278 | 67,964,953 | 125,716,396 | 121,387,784 |
| 1405-01 | ආරක්ෂක සේවා | 67,695,414 | - | - | - | - | - | - | 67,695,414 | 96,291,208 |
| 1405-02 | පිරිසිදුකිරීම් සේවා | 120,324,179 | 50,355,082 | 826,288 | 1,744,960 | 550,977 | 546,508 | 86,429,912 | 260,777,904 | 261,989,534 |
| 1405-03 | මුද්‍රණය හා ප්‍රචාරණය | 5,239,022 | 2,420,522 | - | - | - | 330,925 | 1,306 | 7,991,775 | 11,140,800 |
| 1405-04 | අනෙකුත් | 595,555 | 13,507,922 | 122,470 | 1,680 | 150,150 | 60,000 | - | 14,437,777 | 4,149,067 |
| | **උප එකතුව** | **239,158,343** | **165,325,875** | **979,654** | **1,889,791** | **273,553,763** | **20,031,893** | **154,461,323** | **855,400,641** | **865,204,745** |

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මූල්‍ය ප්‍රකාශන 2024

පුනරාවර්තන වියදම් - 2024 - සාරාංශය

සටහන 03

| විෂය කේතය | වර් ගය / විෂය / මාතෘකාව | වැඩසටහන 01 සාමාන්‍ය පාලන හා සේවා | වැඩසටහන 02 පීඨ | වැඩසටහන 03 ඉගැන්වීම් සම්පත් | වැඩසටහන 04 සුබසාදන සේවා | වැඩසටහන 05 ගොඩනැගිලි හා ඉඩම් නඩත්තුව | වැඩසටහන 07 බාහිර විභාග | වැඩසටහන 08 නේවාසිකාගාර | 2024 මුළු මුදල (රු) | 2023 මුළු මුදල (රු) |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 3.6 | අනෙකුත් පුනරාවර්තන වියදම් | | | | | | | | | |
| 1501-01 | විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට සංචාරක ප්‍රදාන | - | - | - | - | - | - | - | - | 23,660 |
| 1501-02 | විශේෂ සේවා -පාලක සභාව සහ අනෙකුත් [illegible] | 3,108,850 | 276,300 | - | - | 2,000 | 3,207,448 | - | 6,594,598 | 6,524,686 |
| 1501-03 | වෘත්තිය සහ වෙනත් ගාස්තු | 10,325,039 | 940,700 | 33,750 | 138,799 | - | 1,300,000 | - | 12,738,287 | 5,223,396 |
| 1501-04 | වැඩමුළු සහ සම්මන්ත්‍රණ | 27,000 | 1,372,086 | - | - | - | 5,937,574 | - | 7,336,660 | 1,623,549 |
| 1501-05 | අධ්‍යයන පර් යේ ෂ ණ හා ප්‍රකාශන | - | 188,000 | - | - | - | - | - | 188,000 | 295,000 |
| 1501-06 | කා ර් ය ම ණ්ඩල සංවර්ධන (ගුරු පරිපාලකයින් සහ අනෙකුත් සේවකයින් [illegible] | 6,928,436 | 2,818,912 | - | 1,500 | - | 80,540 | - | 9,829,389 | 9,456,377 |
| 1501-07 | පශ්චාද් උපාධි සහ ශිෂ්‍යත්ව | - | 50,000 | - | - | - | - | - | 50,000 | - |
| 1501-08 | සිසුන් සඳහා ලිපිද්‍රව්‍ය හා ඉගෙනුම් තත්වකට වැඩිදියුණු කිරීම | 8,000 | 589,890 | - | - | - | - | - | 597,890 | 1,191,771 |
| 1501-09 | වෘත්තිය සීමාවාසික පුහුණු, ප්‍රායෝගික හා වෘත්තිය මා ර් ගෝ පදේශ | - | 6,507,488 | - | - | - | - | - | 6,507,488 | 6,650,549 |
| 1501-10 | ශිෂ්‍ය සංවර්ධන සහ ප්‍රජා සබඳතා | 992,549 | 10,953,294 | - | - | - | 911,635 | - | 12,857,478 | 9,250,058 |
| 1501-11 | විශ්වවිද්‍යාල ක්‍රීඩා කටයුතු | 10,770 | - | - | 17,193,181 | - | - | - | 17,203,951 | 10,584,246 |
| 1501-12 | ශිෂ්‍ය සුභසාධන, සේවක සුභසාධන, ශිෂ්‍ය සබා සහ සමාජ සමිතිය | 13,080 | 25,665 | - | 440,500 | - | - | - | 479,245 | 1,706,520 |
| 1501-15 | නිවාඩු වරෙන්තු, වාර ප්‍රවේශපත් | 2,370,171 | 2,813,921 | 296,377 | 247,858 | 413,985 | 202,261 | - | 6,344,574 | 9,748,380 |
| 1501-16 | සංග්‍රහ වියදම් | 2,280,514 | 7,981,951 | 45,670 | 118,931 | 14,205 | 1,483,774 | - | 11,925,045 | 11,707,804 |
| 1501-17 | බැංකු ගාස්තු | 39,152 | 11,615 | - | - | - | 131 | - | 50,897 | 164,732 |
| 1501-18 | සම්මාන සහ වන්දි | 26,445 | 24,700 | 5,000 | - | - | 2,500 | - | 58,645 | 2,200 |
| 1501-19 | දායකත්ව සහ සාමාජික ගාස්තු | 2,774,263 | 235,500 | - | - | - | - | - | 3,009,763 | 372,523 |
| 1501-20 | උපාධි ප්‍රදානෝත්සව | 11,504,575 | 6,941,622 | - | - | - | - | - | 18,446,197 | 21,536,500 |
| 1501-21 | විභාග ගාස්තු | - | 43,611,373 | - | - | - | 3,628,535 | - | 47,239,908 | 81,105,111 |
| 1501-22 | ව්‍යාපෘති / පශ්චාද් උපාධි පාඨමාලා ගාස්තු වියදම් | - | 186,806,604 | - | - | - | 491,480,648 | - | 678,287,252 | 584,018,415 |
| 1501-23 | පශ්චාද් උපාධි පාඨමාලා ගාස්තු | - | 68,303,958 | - | - | - | - | - | 68,303,958 | 139,688,439 |
| 1501-24 | අනෙකුත් | 1,658,575 | 2,313,664 | 434,930 | 171,875 | 68,800 | - | 110,006 | 4,757,850 | 7,099,850 |
| | **උප එකතුව** | **42,067,419** | **342,767,244** | **815,727** | **18,312,643** | **498,990** | **508,235,045** | **110,006** | **912,807,075** | **907,974,007** |
| | **මුළු පුනරාවර්තන වියදම්** | **691,626,488** | **5,482,770,530** | **157,330,949** | **124,050,231** | **393,422,231** | **619,441,529** | **170,912,422** | **7,639,554,380** | **6,953,982,858** |

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## දේපළ, උපකරණ සහ පුස්තකාල පොත් බැහැර කිරීමේ ලාභය

**සටහන 04**

| විස්තරය | මුදල රු. | | මුදල රු. | |
|---|---|---|---|---|
| | 2024 | | 2023 | |
| විකුණුම් | | 606,817 | | 3,936,974 |
| **මුළු මුදල** | | **606,817** | | **3,936,974** |
| **අඩුකලා - ඉදිරියට ගෙන ආ ශුද්ධ අගය** | | | | |
| වියදම | 497,667 | | 6,850,947 | |
| සමුච්චිත ක්ෂය | 323,135 | 174,532 | 2,387,389 | 4,463,558 |
| **අතිරික්තය / අලාභය** | | **432,285** | | **(526,584)** |

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

දේපල, පිරියත සහ උපකරණ

සටහන 05

| විස්තරය | ඉඩම් | ගොඩනැගිලි හා ව්‍යුහයන් | රසායනාගාර හා ඉගැන්වීම් උපකරණ | කාර් යාල උපකරණ | පරිගණක සහ උපාංග | මෝටර් වාහන | ගෘහ භාණ්ඩ සහ උපකරණ | ක්‍රීඩා භාණ්ඩ | ජල සම්පාදන, විදුලිය හා දුරකථන | දුරකථන | අනෙකුත් උපකරණ | වෙන් කිරීම් හා අභ්‍යන්තර නිමරුණක රණයන් | නාම පුවරු හා භූමි අලංකරණය | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Rs. | Rs. | Rs. | Rs. | Rs. | Rs. | Rs. | Rs. | Rs. | | Rs. | Rs. | Rs. | Rs. |
| **2024 ජනවාරි 01 දිනට පිරිවැය / ප්‍රත්‍යාගණනය කරන ලද** | **9,095,247,069** | **9,741,766,807** | **1,887,799,894** | **636,439,923** | **966,299,277** | **153,281,767** | **903,434,951** | **41,799,625** | **28,149,565** | **6,413,490** | **190,338,386** | **56,929,096** | **21,686,709** | **23,729,586,559** |
| එකතු කලා - අත්පත්කර ගැනීම් | 110,000,000 | 166,946,991 | 428,818,254 | 23,218,186 | 149,741,109 | 19,116,268 | 24,602,415 | 1,849,987 | - | 11,346,907 | 19,372,676 | - | - | **955,012,794** |
| වත්කම් බැහැර කිරීම | - | - | - | - | (377,600) | - | - | - | - | - | - | - | - | **(377,600)** |
| ප්‍රතිපාදන ගැලපුම්ව වඩා ගෙවිය යුතු | - | (897,051) | - | - | - | - | - | - | - | - | - | - | - | **(897,051)** |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **9,205,247,069** | **9,907,816,747** | **2,316,618,148** | **659,658,109** | **1,115,662,786** | **172,398,035** | **928,037,366** | **43,649,612** | **28,149,565** | **17,760,397** | **209,711,062** | **56,929,096** | **21,686,709** | **24,683,324,702** |
| **2024 ජනවාරි 1 වන දිනට සමුච්චිත ක්ෂයවීම් ශේෂය** | - | **1,388,506,055** | **682,136,918** | **224,022,578** | **334,089,784** | **122,437,567** | **167,666,435** | **14,221,159** | **18,763,010** | **635,833** | **18,385,099** | **54,915,349** | **19,985,903** | **3,045,765,691** |
| වර් ෂය සඳහා ක්ෂය කිරීම් | - | 495,293,371 | 386,065,296 | 128,236,397 | 198,136,245 | 31,670,378 | 92,051,247 | 10,762,248 | 1,438,239 | 641,548 | 19,148,474 | 1,595,772 | 582,956 | **1,365,622,172** |
| වත්කම් ඉවත්කිරීම් | - | - | - | - | (204,421) | - | - | - | - | - | - | - | - | **(204,421)** |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | - | **1,883,799,426** | **1,068,202,214** | **352,258,975** | **532,021,607** | **154,107,945** | **259,717,682** | **24,983,406** | **20,201,250** | **1,277,381** | **37,533,574** | **56,511,121** | **20,568,860** | **4,411,183,441** |
| **2024 දෙසැම්බර් 31 දිනට ගෙන යා හැකි ශුද්ධ අගය** | **9,205,247,069** | **8,024,017,321** | **1,248,415,935** | **307,399,134** | **583,641,179** | **18,290,090** | **668,319,684** | **18,666,206** | **7,948,315** | **16,483,016** | **172,177,488** | **417,975** | **1,117,849** | **20,272,141,261** |
| **2023 දෙසැම්බර් 31 දිනට ගෙන යා හැකි ශුද්ධ අගය** | **9,095,247,069** | **8,353,260,752** | **1,205,662,976** | **412,417,345** | **632,209,494** | **30,844,200** | **735,768,516** | **27,578,466** | **9,386,555** | **5,777,657** | **171,953,287** | **2,013,748** | **1,700,805** | **20,683,820,868** |

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## පුස්තකාල පොත් හා උපාධි ලෝගු

සටහන 06

| විස්තරය | පුස්තකාල පොත් හා වාර පුකාශ රු. | ලෝගු රු. | මුළු මුදල රු. |
|---|---|---|---|
| **2024 ජනවාරි 1 වන දිනට පිරිවැය / ප්‍රත්‍යාගණනය කළ ශේෂය** | 547,381,568 | 52,937,000 | **600,318,568** |
| එකතු කිරීම් | 5,327,514 | 1,600,000 | **6,927,514** |
| බැහැර කිරීම් | (120,067) | - | **(120,067)** |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **552,589,015** | **54,537,000** | **607,126,015** |
| **2024/12/31 දිනට සමුච්චිත ක්ෂය වීම් ශේෂය** | 546,999,798 | 19,636,015 | **566,635,813** |
| වර්ෂය සඳහා ක්ෂයවීම් | 11,621,410 | 10,599,640 | **22,221,050** |
| බැහැර කිරීම් සඳහා ක්ෂයවීම් | (118,714) | - | **(118,714)** |
| ක්ෂය වීම් සඳහා ගැලපීම | (27,627,060) | - | **(27,627,060)** |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **530,875,434** | **30,235,655** | **561,111,089** |
| **2024 දෙසැම්බර් 31 දිනට ඉදිරියට ගෙන යන මුදල** | **21,713,581** | **24,301,345** | **46,014,926** |
| **2023 දෙසැම්බර් 31 දිනට ඉදිරියට ගෙන යන මුදල** | **381,770** | **33,300,985** | **33,682,756** |

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## කෙරීගෙන යන වැඩ - ප්‍රාග්ධන

සටහන 07

| අනු අංකය | විස්තරය | 2024/01/01 දිනට ශේෂය | ගැලපීම් | වර්ෂය තුළ එකතු කිරීම් | ප්‍රාග්ධනීත කරන ලද මුදල | 2024/12/31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| 1 | ඉංජිනේරු පීඨය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 1,548,524,880 | - | 2,774,862,506 | - | 4,323,387,386 |
| 2 | තඩත්තු අංශය සඳහා නව ගොඩනැගිල්ල | 59,894,295 | - | 4,261,902 | - | 64,156,198 |
| 3 | ස්වර්ණ ජයන්ති සැමරුම් ශ්‍රවණාගාරය | 5,794,676 | - | - | - | 5,794,676 |
| 4 | බහුවිධ කායර්ය ගොඩනැගිල්ල - කළමනාකරණ හා වාණිජවිද්‍යා පීඨය | 1,426,416,673 | - | 696,578,475 | - | 2,122,995,148 |
| 5 | බහුවිධ කායර්ය ගොඩනැගිල්ල - මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය | 1,559,062,521 | - | 279,753,832 | - | 1,838,816,353 |
| 6 | ව්‍යාවසාය සම්පත් කළමනාකරණ මෘදුකාංගය | 8,901,594 | - | - | 8,901,594 | - |
| 7 | දත්ත පද්ධති අධියර II - තාක්ෂණ පීඨය | 18,779,909 | (7,534,287) | - | 11,245,622 | - |
| 8 | කැලේ කඩේ ව්‍යාපෘතිය I අදියර | 19,009,106 | - | - | - | 19,009,106 |
| 9 | කැලේ කඩේ ව්‍යාපෘතිය II අදියර | 13,218,489 | - | - | - | 13,218,489 |
| 10 | කැලේ කඩේ ව්‍යාපෘතිය III අදියර | 19,016,747 | - | - | - | 19,016,747 |
| 11 | කැලේ කඩේ ව්‍යාපෘතිය IV අදියර | 3,709,844 | (2,107,747) | 29,728 | - | 1,631,825 |
| 12 | කෙරී ගෙන යන වැඩ - ව්‍යාවහාර විද්‍යා පීඨ ගොඩනැගිල්ලේ 06 සහ 07 මහල් ඉදිකිරීම | 5,691,438 | - | 7,129,719 | - | 12,821,157 |
| 13 | කෙරී ගෙන යන වැඩ--ශිෂ්‍ය ලියාපදිංචිය සහ විභාග පද්ධතිය (මානව ශාස්ත්‍ර පීඨය) | 480,000 | - | 120,000 | 600,000 | - |
| 14 | ස්මාර්ට් පන්ති කාමර - (මානව ශාස්ත්‍ර පීඨය) (AHEAD ව්‍යාපෘතිය ) | 19,403,771 | - | 1,022,221 | 20,425,992 | - |
| 15 | ආසාත්මිකතා ප්‍රතිජීව සෛල වෛද්‍ය ඒකකය ස්තාපිත කිරීම | 528,600 | - | 613,422,958 | - | 613,951,558 |
| 16 | සුමංගල සහ ඥානේෂ්වර ගොඩනැගිල්ල සඳහා වායු සමීකරණ ඒකක (මානව ශාස්ත්‍ර පීඨය) | 568,912 | - | - | 568,912 | - |
| 17 | කොහුවල තක්ෂිලා ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය | 25,922,017 | - | 163,070,507 | - | 188,992,524 |
| 18 | කෙරී ගෙන යන වැඩ -නව ව්‍යූහ විද්‍යා පීඨය 03 වන මහල ගොඩනැගීම | 105,917,522 | - | 8,398,400 | 114,315,921 | - |
| 19 | සුමංගල ගොඩනැගිල්ලේ ව්‍යූහාත්මක ස්ථාවරත්වය - මොරටුව විශ්වවිද්‍යාලය | 600,000 | - | - | - | 600,000 |
| 20 | අපද්‍රව්‍ය පවිත්‍රාගාරයට බැහැර කිරීම පූළුල් කිරීම - තාක්ෂණ පීඨය | - | - | 2,749,386 | - | 2,749,386 |
| 21 | කෙරී ගෙන යන වැඩ -බහුකායර් ගොඩනැගිලි 02 සඳහා වන යෝජිත ELV පද්ධතිය | - | - | 36,578,426 | - | 36,578,426 |
| 22 | කෙරී ගෙන යන වැඩ - නව නඩත්තු අංශ ගොඩනැගිල්ලේ වැඩ අවසන් කිරීම | - | - | 64,684 | - | 64,684 |
| 23 | කැලේ කඩේ ව්‍යාපෘතිය V අදියර | - | - | 5,908,051 | - | 5,908,051 |
| 24 | කෙරී ගෙන යන වැඩ - කොහුවල ගොඩලැගිග්ගේ ප්‍රතිසංසකරණ කටයුතු නාගරික විද්‍යා පීඨය | - | - | 3,602,714 | - | 3,602,714 |
| 25 | කෙරී ගෙන යන වැඩ -සූර් යය බලශක්ති ව්‍යාපෘතිය - 2024 | - | - | 41,300 | - | 41,300 |
| 26 | කෙරී ගෙන යන වැඩ - ව්‍යාවහාර විද්‍යා පීඨ ගොඩනැගිල්ලේ 06 සහ 07 මහල් ඉදිකිරීම | - | - | 10,040,203 | - | 10,040,203 |
| 27 | කෙරී ගෙන යන වැඩ- පිහිනුම් තටාකයට ඇතුල් වීමේ ගේට්ටුව සහ පාර පිලිසකර කිරීම | - | - | 872,200 | 872,200 | - |
| 28 | WIP-රතනසාර ගොඩනැගිල්ලේ වහලය හා බාහිර තීන්ත ආලේප කිරීම | - | - | 3,215,755 | - | 3,215,755 |
| 29 | කෙරී ගෙන යන වැඩ-විමලධර්ම නේවාසිකාගාරයේ වැසිකිලි ප්‍රතිසංස්කරණය අදියර 01 | - | - | 3,448,326 | - | 3,448,326 |
| 30 | කෙරී ගෙන යන වැඩ- මායිම් තාප්පය ඉදි කිරීම තාක්ෂණ පීඨය | - | - | 24,420,239 | 24,420,239 | - |
| 31 | පරිගණක මධ්‍යස්ථානය CDEPD අංශය සඳහා - සුමංගල ගොඩනැගිල්ල | - | - | 38,953 | 38,953 | - |
| 32 | තිරසාර සංවර්ධන කේන්ද්‍රය සඳහා වන ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය - ව්‍යාවහාර විද්‍යා පීඨය | - | - | 939,606 | 939,606 | - |
| 33 | WIP-තාක්ෂණ පීඨයේ නේවාසිකාගාර ආපනශාලාව හා මුළුතැන්ගෙය ප්‍රතිසංස්කරණය | - | - | 74,359 | 74,359 | - |
| 34 | කෙරී ගෙන යන වැඩ-ජීව විද්‍යා ඒකකය සඳහා උද්භිද විද්‍යා ගොඩනැගිල්ලේ කොටස ප්‍රතිසංස්කරණය කිරීම. | - | - | 4,750,492 | - | 4,750,492 |
| | **මුළු එකතුව** | **4,841,440,994** | **(9,642,034)** | **4,645,394,940** | **182,403,398** | **9,294,790,502** |

### ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

### අස්පෘශ්‍ය වත්කම්

සටහන 08

| විස්තරය | පරිගණක මෘදුකාංග | මාර්ගගත ජර්නල | රු. |
|---|---|---|---|
| **2024 ජනවාරි 1 වන දිනට පිරිවැය/ ප්‍රත්‍යාගණනය කළ ශේෂය** | **61,311,098** | **50,208,310** | **111,519,408** |
| වර්ෂය තුළ සිදුකල එකතු කිරීම් | 21,941,931 | 9,390,269 | **31,332,199** |
| **2024/12/31 දිනට ශේෂය** | **83,253,028** | **59,598,579** | **142,851,607** |
| **2024 ජනවාරි 01 දිනට සමුච්චිත ක්‍රමක්ෂය ශේෂය** | **11,659,793** | **49,932,432** | **61,592,226** |
| වර්ෂය සඳහා ක්ෂය කිරීම් | 12,485,982 | 8,111,318 | **20,597,300** |
| **2024/12/31 දිනට ශේෂය** | **24,145,775** | **58,043,751** | **82,189,526** |
| **2024 දෙසැම්බර් 31 දිනට ඉදිරියට ගෙන යන මුදල** | **59,107,254** | **1,554,828** | **60,662,082** |
| **2023 දෙසැම්බර් 31 දිනට ඉදිරියට ගෙන යන මුදල** | **49,651,305** | **275,878** | **49,927,182** |

### ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

### සේවකයින් සඳහා ණය

සටහන 09

| Serial no | විස්තරය | 2024/12/31 දිනට | 2023/12/31 දිනට |
|---|---|---|---|
| | | රු. | රු. |
| 1 | පරිගණක ණය | 288,500 | 350,000 |
| 2 | ආපදා ණය | 70,371,773 | 80,079,612 |
| 3 | සේවක ණය | 31,160 | 33,200 |
| 4 | වාහන ණය | 56,645 | 84,201 |
| **මුළු එකතුව** | | **70,748,078** | **80,547,013** |

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

### ප්‍රාග්ධන වියදම් - වෙනත් පුනරාවර්තන වියදම්

සටහන 10

| විස්තරය | 2024 | 2023 |
|---|---|---|
| | රු. | රු. |
| ප්‍රාග්ධන වත්කම් ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීම | 58,887,200 | 60,081,036 |
| පර්යේෂණ / අධ්‍යයන ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම හා ශක්තිමත් කිරීම | 121,184,131 | 370,297,500 |
| පශ්චාත් උපාධි ආචාර්ය උපාධි ව්‍යාපෘති | 2,228,000 | 98,517,033 |
| **මුළු එකතුව** | **182,299,331** | **528,895,568** |

### තොග (ඉන්වෙනට්‍රි අයිතම)

සටහන 11

5

| අනු අංකය | විස්තරය | 2024/12/31 දිනට රු. | 2023/12/31 දිනට රු. |
|---|---|---|---|
| 1 | ප්‍රධාන ගබඩාව | 17,411,229 | 17,419,085 |
| 2 | උප ගබඩාව | 33,753,343 | 33,831,137 |
| 3 | රසායන ද්‍රව්‍ය | 69,869,745 | 76,329,752 |
| 4 | ඖෂධිය අයිතම | 631,508 | - |
| 5 | චලනය නොවන තොග සඳහා ප්‍රතිපාදන | (4,410,195) | (2,908,079) |
| **මුළු එකතුව** | | **117,255,629** | **124,671,894** |

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

### මූල්‍ය වත්කම්

සටහන 12

| අනු අංකය | විස්තරය | 2024/12/31 දිනට | 2023/12/31 දිනට |
|---|---|---|---|
| | | රු. | රු. |
| 1 | ආයෝජන - ස්ථාවර තැන්පතු | 5,630,401,762 | 4,302,438,088 |
| 2 | පරිගණක ණය | 195,000 | 254,500 |
| 3 | ආපදා ණය | 32,078,925 | 32,858,889 |
| 4 | සේවක ණය | 17,340 | 27,200 |
| 5 | වාහන ණය | 57,815 | 81,345 |
| 6 | ණය මත හානි හා පාඩු | (144,076) | (144,076) |
| | **මුළු එකතුව** | **5,662,606,766** | **4,335,515,946** |

### විවිධ ණයගැති හා ලැබිය යුතු ශේෂයන්

සටහන 13

| අනු අංකය | විස්තරය | 2024/12/31 දිනට | 2023/12/31 දිනට |
|---|---|---|---|
| | | රු. | රු. |
| 1 | වෙනත් විවිධ ලැබීම් | 202,546,641 | 207,309,734 |
| 2 | **ස්වයං මූල්‍ය පාඨමාලා මඟින් ලැබීම් | 272,226,749 | 168,110,865 |
| 3 | ආයෝජන මත ලැබිය යුතු පොලී | 203,789,680 | 372,134,251 |
| 4 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම මඟින් ලැබිය යුතු මුදල් | 39,543,530 | 34,751,624 |
| | **මුළු එකතුව** | **718,106,601** | **782,306,474** |

**මෙය ස්වයං මූල්‍ය පාඨමාලා සහ අනෙකුත් වියදම් සඳහා විශ්වවිද්‍යාල පීඨවලින් ලැබිය යුතු ශේෂය නියෝජනය කරයි.

### කාර්යමණ්ඩලය සඳහා අත්තිකාරම් ලබාදීම

සටහන 14

| අනු අංකය | විස්තරය | 2024/12/31 දිනට | 2023/12/31 දිනට |
|---|---|---|---|
| | | රු. | රු. |
| 1 | උත්සව අත්තිකාරම් | 183,150 | 195,650 |
| 2 | වැටුප් අත්තිකාරම් | 10,000 | 70,032 |
| 3 | විශේෂ අත්තිකාරම් | 48,550 | 44,550 |
| | **මුළු එකතුව** | **241,700** | **310,232** |

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## අත්තිකාරම් හා පෙර ගෙවීම්

සටහන 15

| අනු අංකය | විස්තරය | 2024/12/31 දිනට රු. | 2023/12/31 දිනට රු. |
|---|---|---|---|
| **14-01** | **විවිධ ණයහිමි අත්තිකාරම්** | **5,896,318** | **4,351,578** |
| **14-02** | **ප්‍රාග්ධන අත්තිකාරම්** | | |
| 1 | පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ ගොඩනැගිලි ඉදිකිරීම් අත්තිකාරම් | 1,764,013 | 2,989,040 |
| 2 | මෙත්සෙවන ඉඩම අත්පත් කරගැනීම | 74,000,000 | 74,000,000 |
| 3 | මූලධන අත්තිකාරම් - පුස්තකාල පොත් හා වාර ප්‍රකාශන | 23,527 | 4,312,198 |
| 4 | ප්‍රාග්ධන වත්කම් අත්තිකාරම්- ව්‍යවහාර විද්‍යා පීඨය | 285,990 | 291,417 |
| 5 | ප්‍රාග්ධන අත්තිකාරම් - වත්කම් | 52,400 | 285,500 |
| 6 | මූලධන අත්තිකාරම් - තාක්ෂණ පීඨය | 19,250 | 31,524 |
| 7 | විශ්වවිද්‍යාල පර්යේෂණ අත්තිකාරම් | 1,003,721 | 698,051 |
| 8 | පර්යේෂණ අත්තිකාරම් - වෛද්‍ය විද්‍යා පීඨය | - | 317,400 |
| 9 | ප්‍රතිසංස්කරණ අත්තිකාරම් - උපකරණ | - | 120,648 |
| 10 | පර්යේෂණ අත්තිකාරම් - තාක්ෂණ පීඨය | 325,914 | 80,250 |
| 11 | ඉඩම් තැන්පතු - එගොඩවත්ත ඉඩම | 13,000,000 | 13,000,000 |
| 12 | පර්යේෂණ අත්තිකාරම් - මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය | 59,600 | - |
| 13 | පර්යේෂණ අත්තිකාරම් -කළමනාකරණ හා වාණිජවිද්‍යා පීඨය | - | 19,000 |
| 14 | විවිධ අත්තිකාරම් - ප්‍රාග්ධන - දන්ත වෛද්‍ය පීඨය | 71,800 | - |
| 15 | ප්‍රාග්ධන අත්තිකාරම් - වෛද්‍ය විද්‍යා පීඨය | 14,000 | - |
| **14-03** | **අත්තිකාරම් මුදල් ගෙවීම්** | | |
| 16 | බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම - මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය | - | 19,036,188 |
| 17 | බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම - කළමනාකරණ හා වාණිජවිද්‍යා පීඨය | 46,842,618 | 104,573,228 |
| 18 | අත්තිකාරම් මුදල් ගෙවීම් - ඉංජිනේරු පීඨය - ADB ව්‍යාපෘතිය | 483,346,316 | 1,024,517,251 |
| 19 | අසාත්මිකතා ප්‍රතිශක්තිකරණ සහ සෛල ජීව විද්‍යා ඒකකය පිහිටුවීම සඳහා අත්තිකාරම් මුදල් ගෙවීම් | - | 137,326,023 |
| 20 | අත්තිකාරම් මුදල් ගෙවීම් - කොහුවල තක්ෂිලා ගොඩනැගිල්ල | 3,940,219 | 38,844,829 |
| 21 | අත්තිකාරම් මුදල් ගෙවීම් - දැනට පවතින ගොඩනැගිල්ලේ 6 වන මහලේ ව්‍යාප්ත කිරීම් - ව්‍යවහාර විද්‍යා පීඨය | 31,705,218 | - |
| **14-04** | **පෙර ගෙවීම්** | | |
| 22 | පෙර ගෙවීම් | 17,089,685 | 13,231,118 |
| | **මුළු මුදල** | **679,440,589** | **1,438,025,242** |

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මුදල් හා මුදල් සමාන දෑ

සටහන 16

| අනු අංකය. | විස්තරය | 31/12/2024 දිනට රු. | 31/12/2023 දිනට රු. |
|---|---|---|---|
| **මුදල් ශේෂය - භාණ්ඩාගාර අරමුදල්** | | | |
| 1 | 097-1-001-6-2315454 - පුනරාවර්තන ප්‍රදාන | 1,419,304 | 920,109 |
| 2 | 097-1-001-3-2315455 - ප්‍රාග්ධන ප්‍රදාන | 720,107 | 120,892 |
| 3 | 004-1-001-0-0210877 - විදේශ ශාඛාව | 64,710 | 64,735 |
| 4 | 097-1-001-9-2315457- වෛද්‍ය විද්‍යා පීඨය | 901,692 | 3,909,380 |
| **මුදල් ශේෂයන් - භාණ්ඩාගාර අරමුදල් නොවන** | | | |
| 5 | 097-1-001-8-2315467- පශ්චාද් උපාධි පීඨය | 2,112,507 | 8,580,237 |
| 6 | 097-1-001-8-2315472 - ශිෂ්‍ය සහන අරමුදල | 339,286 | 402,104 |
| 7 | 097-1-001-1-2315456 - බාහිර විභාග | 11,907,529 | 5,858,317 |
| 8 | 097-1-001-7-0000 629 - බහුමාධ්‍ය මධ්‍යස්ථානය | 31,920,800 | 873,052 |
| 9 | 097-1-001-4-0002229 - කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා පීඨය - සංවර්ධන අරමුදල | 909,113 | 1,470,092 |
| 10 | 097-1-001-5-0005005 - මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය - සංවර්ධන අරමුදල | 351,235 | 22,612 |
| 11 | 097-1-001-4-7709343 - වෛද්‍ය විද්‍යා පීඨය -සංවර්ධන අරමුදල (II) | 3,047,737 | 730,371 |
| 12 | 097-1-001-10010952 - වෛද්‍ය විද්‍යා පීඨය- ඩෙංගු පර් යේෂණ මධ්‍යස්ථානය | 736,160 | 736,160 |
| 13 | 097-1-001-7-0014075 - ව්‍යවහාර විද්‍යා පීඨය - පර් යේෂණ ගිණුම | 8,357,672 | 805,794 |
| 14 | 097-1-001-4-0012855 - වෛද්‍ය විද්‍යා පීඨය - පර් යේෂණ ගිණුම | 1,121,907 | 2,975,795 |
| 15 | 097 1002 5 2315454 - රැස්කිරීමේ ගිණුම | 16,568,725 | 1,430,315 |
| 16 | 097-2001-5-0014344 - ඉතුරුම් ගිණුම | 1,331,645 | 35,238 |
| 17 | 097-1-001-4-0021398 - වෛද්‍ය රක්ෂණ ආවරණ ගිණුම | 4,901,671 | 578,141 |
| 18 | 097-1--001-0-0020584 - මහපොළ හා ශිෂ්‍යාධාර ගිණුම | 1,337,678 | 33,678 |
| 19 | 097-1-001-6-0025164 - සම සෞඛ්‍ය විද්‍යා පීඨය | 311,881 | 129,881 |
| 20 | 097-1-001-90025450 - ආසාත්මිකතා ප්‍රතිජීව සෛල වෛද්‍ය ඒකකය | 568,629 | 2,431,490 |
| 21 | 097-1-001-2-0027004 - දන්ත වෛද්‍ය පීඨය | 1,041,431 | 568,948 |
| 22 | 097-4-021-0-0027104 - ආසාත්මිකතා ප්‍රතිජීව සෛල වෛද්‍ය ඒකකය - ඩොලර් ගිණුම | 105,755,439 | 34,930,005 |
| 23 | 097-4-021-6-2315454 - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - ඩොලර් ගිණුම | 25,142 | 83,768 |
| 24 | මුදල් පොත 097-1-003 - 4-2315454 - ඉංජිනේරු පීඨය | 835,770 | - |
| 25 | 097-1-001-6-0027653 - සංවර්ධන ගිණුම - තාක්ෂණ පීඨය | 584,890 | 905,858 |
| | **උප එකතුව** | **197,172,660** | **68,596,973** |
| **Investment in Fixed Deposits (less than 3 months) and Call Deposits** | | | |
| | **උප එකතුව** | **1,245,016,919** | **1,194,657,537** |
| | **මුළු එකතුව** | **1,442,189,579** | **1,263,254,510** |

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## සම්මුච්චිත අරමුදල් - ප්‍රාග්ධන

**සටහන 17**

| විස්තරය | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|
| සමුච්චිත ප්‍රාග්ධන අතිරික්තය - ආරම්භක ශේෂය | 17,198,997,465 | 14,643,213,055 |
| වර්ෂය සඳහා ප්‍රාග්ධන අතිරික්තය | 3,431,524,905 | 2,555,784,410 |
| වියදම් නොකල ප්‍රාග්ධන මාරු කිරීම | 1,703,479 | - |
| සමුච්චිත ප්‍රාග්ධන අතිරික්තය - අවසාන ශේෂය | **20,632,225,849** | **17,198,997,465** |

## අභ්‍යන්තරව සීමා කල අරමුදල්

**සටහන 18**

| අනු අංකය | විස්තරය | 2024/12/31 දිනට රු. | 2023/12/31 දිනට රු. |
|---|---|---|---|
| 1 | සංවර්ධන අරමුදල් | 2,094,033,087 | 1,804,055,434 |
| 2 | වෙනත් විශේෂිත සංචිත | 47,186,097 | 28,968,043 |
| **මුළු මුදල** | | **2,141,219,184** | **1,833,023,477** |

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

අනුස්මරණ අරමුදල්

සටහන 19

| අනු අංකය | විස්තරය | 2024/12/31 දිනට ශේෂය රු. | 2023/12/31 දිනට ශේෂය රු. |
|---|---|---|---|
| 1 | ස්වර්ණ මුද්‍රිකා-ආචාර්ය සුජාතා සෙනෙවිරත්න (097-60-01-00027529-5) | 515,432 | - |
| 2 | ස්වර්ණ මුද්‍රිකා - කාර් මීක ඉංජිනේරු අරමුදල | 139,331 | 127,242 |
| 3 | අතිපූජ්‍ය බලංගොඩ ආනන්ද මෛත්‍රී ස්වර්ණ මුද්‍රිකා අරමුදල | 185,166 | 174,665 |
| 4 | සිවිල් ඉංජිනේරු විද්‍යාව සඳහා ස්වර්ණ මුද්‍රිකා | 132,531 | 123,842 |
| 5 | විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යාව සඳහා රන් පදක්කම | 135,631 | 126,942 |
| 6 | පරිගණක ඉංජිනේරු විද්‍යාව සඳහා රන් පදක්කම | - | 1,200 |
| 7 | එස් ඇන්ඩ් ඩී රසායන ස්වර්ණ මුද්‍රිකා අරමුදල | 635,740 | 609,521 |
| 8 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ විශිෂ්ට කාර්ය සාධනය සඳහා රන් පදක්කම | 118,430 | 117,805 |
| 9 | ස්වර්ණ මුද්‍රිකාව සඳහා අනුග්‍රහය - Dipped නිෂ්පාදන ආයතනය | 130,542 | 124,430 |
| 10 | ආචාර්ය ශිරෝමි සමරසිංහ - හොඳම සිසුවාට හිමි ස්වර්ණ මුද්‍රිකාව - රසායන විද්‍යා ගෞරව උපාධිය | 117,050 | 117,264 |
| 11 | තාරකා ආරියදාස - ස්වර්ණ මුද්‍රිකා අරමුදල | 113,576 | 106,377 |
| 12 | ජෛව පද්ධති තාක්ෂණයේ විශිෂ්ට කාර්ය සාධනය සඳහා රන් පදක්කම | 127,531 | 123,842 |
| 13 | ස්වර්ණ මුද්‍රිකාව සඳහා අනුග්‍රහය Camso Loadstar පෞද්ගලික ආයතනය | 123,418 | 117,172 |
| 14 | අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් අනුග්‍රහය දක්වන රන් පදක්කම - තාක්ෂණ පීඨය | 1,500 | 1,500 |
| 15 | සායනික වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්ය කමනි වනිගසූරිය රන් පදක්කම | 668,923 | 631,127 |
| 16 | අරමුදල -සමාජ විද්‍යාව පිළිබඳ පශ්චාද් උපාධි සඳහා රන් පදක්කම 097-60-01-00022837-3 | 32,708 | 26,000 |
| 17 | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - පර් යේෂණ - 2022-1 097-60-01-00022819-5 | 56,684 | - |
| 18 | අරමුදල- විශිෂ්ටතම සිසුන් සඳහා රන් පදක්කම 097-60-01-00024683-4 | 107,424 | 41,918 |
| 19 | අරමුදල - ජාන විද්‍යාව සහ අණුක ජීව විද්‍යාව රන් සම්මාන2023 | 115,378 | 104,645 |
| 20 | අරමුදල-මහාචාර්ය ආතර් ක්ලෙමන්ට් ජස්ටින් වීරකෝන් සමරු රන් පදක්කම2023 | 110,583 | 105,195 |
| 21 | අරමුදල-පී නාගසුන්දරම් රන් පදක්කම1 2023 097-60-01-000258134 | 40,154 | 4,932 |
| 22 | මල්කාන්ති පවුලිස් මහත්මිය ශිෂ්‍යත්ව අරමුදල (097-60-01-00027877-3) | 1,016,704 | - |
| 23 | අනුස්මරණ අරමුදල - මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය - ඒකාබද්ධ කිරීම | 7,500 | 7,500 |
| 24 | හේමා විජේවර්ධන ශිෂ්‍යත්ව අරමුදල | 118,654 | 117,993 |
| 25 | ජී බී සේනානායක ශිෂ්‍යත්ව අරමුදල | 1,673 | 4,703 |
| 26 | ගනේගම ශ්‍රී සරණංකර ශිෂ්‍යත්ව අරමුදල | 204,387 | 202,382 |
| 27 | පී එල් පෙරේරා ශිෂ්‍යත්ව අරමුදල | 152,126 | 142,775 |
| 28 | එස් ටී සින්නදොරේ ශිෂ්‍යත්ව අරමුදල | 1,565,460 | 82,286 |
| 29 | ඒ ඩබ්ලිව් කළුආරච්චි ශිෂ්‍යත්ව අරමුදල | 97,010 | 96,656 |
| 30 | හේමා එල්ලාවල ශිෂ්‍යත්ව අරමුදල | 135,603 | 129,971 |
| 31 | අරුණසිරි ඇස්ලින් ධර්මවර්ධන ශිෂ්‍යත්ව අරමුදල | 736 | 736 |
| 32 | බෙල්ලන්විල සෝමරත්න ශිෂ්‍යත්ව අරමුදල | 33,982 | 52,472 |
| 33 | මහාචාර්ය ලිනුස් සිල්වා ස්වර්ණ මුද්‍රිකා අරමුදල (ව්‍යාපාර පරිපාලන) | 30,107 | 30,774 |

Contd.

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

**අනුස්මරණ අරමුදල්**

**සටහන 19**

| අනු අංකය | විස්තරය | 2024/12/31 දිනට ශේෂය<br>රු. | 2023/12/31 දිනට ශේෂය<br>රු. |
|---|---|---|---|
| 34 | බැද්දේගම විමලවංශ ශිෂ්‍යත්ව අරමුදල | 232,701 | 216,362 |
| 35 | විමල් බලගල්ලේ ශිෂ්‍යත්ව අරමුදල | 907,538 | 899,412 |
| 36 | ආර් එම් ඩිංගිරිමැණිකේ ශිෂ්‍යත්ව අරමුදල | 8,021 | 9,649 |
| 37 | ඩබ්ලිව් ඒ එම් වීරකෝන් ශිෂ්‍යත්ව අරමුදල | 72,246 | 69,817 |
| 38 | ශ්‍රීමතී වේවල ශිෂ්‍යත්ව අරමුදල | 380,568 | 357,690 |
| 39 | පැට්‍රික් මෙන්ඩිස් ශිෂ්‍යත්ව අරමුදල | 47,386 | 45,590 |
| 40 | කාන්ති සිල්වා ශිෂ්‍යත්ව අරමුදල | 55,627 | 54,135 |
| 41 | ඩබ්ලිව් ඊ රත්නායක ශිෂ්‍යත්ව අරමුදල | 135,355 | 138,046 |
| 42 | විමලේන්ද්‍ර වතුරගම ශිෂ්‍යත්ව අරමුදල | 63,244 | 60,422 |
| 43 | සි වී ආරියරත්න ශිෂ්‍යත්ව අරමුදල | 2,725 | 2,725 |
| 44 | හයිඩ්‍රාමණි ශිෂ්‍යත්ව අරමුදල | 270,832 | 263,146 |
| 45 | නන්දසේන රත්නපාල ශිෂ්‍යත්ව අරමුදල | 22,564 | 41,095 |
| 46 | ස්වර්ණ මුද්‍රිකා අරමුදල - ආහාර විද්‍යාව සහ තාක්ෂණය - 2010 | 167,980 | 160,262 |
| 47 | මහාචාර්ය එම්.එම්. කරුණානායක රන් පදක්කම් අරමුදල | 220,553 | 229,345 |
| 48 | මහාචාර්ය වාලි ද සිල්වා ශිෂ්‍යත්ව අරමුදල | 42,851 | 46,047 |
| 49 | කිංස්ලි සිල්වා ශිෂ්‍යත්ව අරමුදල | 276,501 | 272,123 |
| 50 | මහාචාර්ය ආරියපාල පෙරේරා රන් පදක්කම් අරමුදල | 151,886 | 141,616 |
| 51 | නගර සහ ග්‍රාමීය සැලසුම් තක්සේරු ශිෂ්‍යත්ව අරමුදල | 65,299 | 66,226 |
| 52 | සෙනක බිබිලේ ශිෂ්‍යත්ව අරමුදල | 203,433 | 203,362 |
| 53 | කළමනාකරණ සහ ඇගයීම් ශිෂ්‍යත්ව අරමුදල | 188,078 | 185,835 |
| 54 | වත්කම් කළමනාකරණ දෙපාතර්මේන්තුව සහ තක්සේරු අරමුදල | 236,910 | 222,838 |
| 55 | කුසලතා සම්මාන යෝජනා ක්‍රම අරමුදල | 54,683 | 165,582 |
| 56 | එල්.ඒ.සී. අලස් ශිෂ්‍යත්ව අරමුදල | 60,083 | 59,233 |
| 57 | ආර්.ඒ.ඒ. පෙරේරා ශිෂ්‍යත්ව අරමුදල | 92,769 | 92,608 |
| 58 | සී.අයි.සී. (කොළඹ) ශිෂ්‍යත්ව අරමුදල | 87,900 | 91,300 |
| 59 | ජයන්ත පත්බේරිය ශිෂ්‍යත්ව අරමුදල | 49,765 | 47,403 |
| 60 | වීරකෝන් මතුගල ශිෂ්‍යත්ව අරමුදල | 290,518 | 277,688 |
| 61 | නිරෝෂන් ශ්‍රී දේව ශිෂ්‍යත්ව අරමුදල | 316,570 | 311,071 |
| 62 | මහාචාර්ය දයාසිරි ප්‍රනාන්දු ශිෂ්‍යත්ව අරමුදල | 317,160 | 311,920 |
| 63 | එම්.ටී.එම්. ජෙෆ්රි ශිෂ්‍යත්ව අරමුදල | 282,503 | 277,768 |
| 64 | ව්‍යවහාරික විද්‍යා පීඨයේ හොඳම ශිෂ්‍යයා - කුසලතා සම්මාන | 453,624 | 434,021 |
| 65 | සායනික ළමා අරමුදල | 266,956 | 258,899 |
| 66 | මහාචාර්ය ධම්මික වනසිංහ රන් පදක්කම් අරමුදල | 262,449 | 272,097 |
| 67 | මහාචාර්ය පී විල්සන් රන් පදක්කම් අරමුදල | 237,001 | 246,760 |

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

**අනුස්මරණ අරමුදල්**

**සටහන 19**

| අනු අංකය | විස්තරය | 2024/12/31 දිනට ශේෂය රු. | 2023/12/31 දිනට ශේෂය රු. |
|---|---|---|---|
| 68 | මහාචාර්ය ඩී.එල් අබේවර්ධන රන් පදක්කම් අරමුදල | 694,063 | 658,730 |
| 69 | "Virtusa" ශාස්ත්‍රීය විශිෂ්ටතා සම්මාන අරමුදල | 226,907 | 231,360 |
| 70 | මහාචාර්ය. ඊ. ආර්. ජැන්ස් ජෛව රසායන විද්‍යා අරමුදල- රන් පදක්කම | 242,446 | 237,296 |
| 71 | "Ernst & Young' අනුස්මරන අරමුදල | 10,123,518 | 9,589,269 |
| 72 | මහාචාර්ය පියසිරි අබිලසිත් යාපා රන් පදක්කම් අරමුදල | 334,159 | 343,177 |
| 73 | N.I.B.M. ව්‍යාපාර ආර් ථික රන් පදක්කම් අරමුදල | 265,533 | 231,001 |
| 74 | ජයවර්ධනපුර "Canada Alumini" සංගමයේ ශිෂ්‍යත්ව අරමුදල | 1,241,440 | 35,466 |
| 75 | මහාචාර්ය ලීනස් සිල්වා ස්වර්ණ මුද්‍රිකා අරමුදල (රාජ්‍ය පරිපාලනය) | 35,786 | 35,991 |
| 76 | මහාචාර්ය ඩබ්ලිව්. පුනාන්දු රන් පදක්කම් අරමුදල - සංඛ්‍යාලේඛන සම්මානය | 210,178 | 200,194 |
| 77 | මහාචාර්ය ඩබ්ලිව්.එස් පුනාන්දු රන් පදක්කම් අරමුදල - භෞතික සහ අකාබනික රසායන විද්‍යාව | 265,765 | 232,281 |
| 78 | මහාචාර්ය එච් ජී නන්දදාස ස්වර්ණ මුද්‍රිකා අරමුදල | 206,288 | 210,166 |
| 79 | ශ්‍රී ලංකා ආරක්ෂක සහ විනිමය කොමිෂන් සභා රන් පදක්කම් අරමුදල | 109,807 | 108,207 |
| 80 | වන විද්‍යාව සහ පරිසර විද්‍යා රන් පදක්කම් අරමුදල | 292,992 | 258,250 |
| 81 | මයික්‍රොසොෆ්ට් රන් පදක්කම් අරමුදල | 353,770 | 310,793 |
| 82 | මාදන්වල ශ්‍රී ධර්මෝදය රන් පදක්කම් අරමුදල | 141,329 | 154,450 |
| 83 | මහාචාර්ය එස්.තිලකරත්න ආර්ථික විද්‍යා රන් පදක්කම් අරමුදල | 117,404 | 132,242 |
| 84 | මහාචාර්ය පී.සී.බී. පුනාන්දු රන් පදක්කම් අරමුදල | 222,375 | 214,714 |
| 85 | මහාචාර්ය ඩබ්ලිව්.ඒ ජයතිස්ස රන් පදක්කම් අරමුදල | 140,989 | 153,717 |
| 86 | මහාචාර්ය උපාලි වික්‍රමසිංහ රන් පදක්කම් අරමුදල | 169,398 | 159,199 |
| 87 | මහාචාර්ය ආර්.ඒ දයානන්ද රන් පදක්කම් අරමුදල | 192,525 | 188,586 |
| 88 | තීරණ විද්‍යා දෙපාර්තමේන්තුව - තොරතුරු තාක්ෂණ කළමනාකරණ (විශේෂ) රන් පදක්කම් අරමුදල | 117,944 | 123,780 |
| 89 | ශිෂ්‍යත්ව අරමුදල - හුණුපිටිය ගංගාරාම විහාරය මගින් | 6,000 | 6,000 |
| 90 | මහාචාර්ය ආතර් බමුණුආරච්චි රන් පදක්කම් අරමුදල | 202,643 | 190,456 |
| 91 | ගනේගම ශ්‍රී සරණංකර ශිෂ්‍යත්ව අරමුදල - II | 77,332 | 71,285 |
| 92 | Endowed KPMG Professor in Accountancy Fund | 9,582,948 | 12,039,431 |
| 93 | කලාශූරී පියසර ශිල්පාධිපති රන් පදක්කම් අරමුදල | 174,744 | 178,365 |
| 94 | එන්.ඩී.ඩබ්ලිව්. ලයනල් - ඖෂධවේද අරමුදලේ රන් පදක්කම | 197,922 | 186,073 |
| 95 | රමණී සමරතුංග රන් පදක්කම් අරමුදල | 158,204 | 152,991 |
| 96 | තිරසාර අරමුදල - වත්කම් කළමනාකරණ සහ තක්සේරු දෙපාර්තමේන්තුව | - | 828,245 |
| 97 | කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨයේ දුෂ්කරතා සහිත සිසුන් සඳහා වන අරමුදල | 5,051,628 | 4,404,580 |
| 98 | ස්වර්ණ මුද්‍රිකා අරමුදල - ව්‍යවහාරික විද්‍යාව පිළිබඳ උපාධිය (ගෞරව උපාධිය). | 188,672 | 184,162 |

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

**අනුස්මරණ අරමුදල්**

**සටහන 19**

| අනු අංකය | විස්තරය | 2024/12/31 දිනට ශේෂය රු. | 2023/12/31 දිනට ශේෂය රු. |
|---|---|---|---|
| 99 | බහු අවයව විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ හොඳම දක්ෂතා දක්වන සිසුන් සඳහා ස්වර්ණ මුද්‍රිකාව | 209,697 | 191,787 |
| 100 | මහාචාර්ය විශුලි ද සිල්වා ස්වර්ණ මුද්‍රිකා - විද්‍යාව හා තාක්ෂණවේදය සඳහා පශ්චාද් උපාධිය | 215,597 | 197,687 |
| 101 | මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨයේ දුෂ්කරතා ඇති සිසුන් සඳහා වන අරමුදල | 974,287 | 595,566 |
| 102 | මහාචාර්ය ඒ එම් අබේසේකර ස්වර්ණ මුද්‍රිකා පදක්කම - ව්‍යවහාර විද්‍යා පීඨය | 188,672 | 179,162 |
| 103 | වරලත් ගණකාධිකරණ ගෝලීය රන් පදක්කම | 109,422 | 91,662 |
| 104 | මහාචාර්ය මෙන්ඩිස් රෝහණධීර ශිෂ්‍යත්ව අරමුදල | 102,647 | 117,022 |
| 105 | මහාචාර්ය පී අතුකෝරල ස්වර්ණ මුද්‍රිකා පදක්කම - දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය | 116,071 | 129,946 |
| 106 | පූජ්‍ය. කුඩාකත්නෝරුවේ සිද්ධාර්ථ නායක හිමි - ස්වර්ණ මුද්‍රිකා පදක්කම | 114,645 | 129,021 |
| 107 | මහාචාර් ය සුනේත්‍රා වීරකෝන් ස්වර්ණ මුද්‍රිකා අරමුදල | 160,871 | 154,746 |
| 108 | මහාචාර් ය එස්.සී. විජේරත්න ස්වර්ණ මුද්‍රිකා පදක්කම | 142,520 | 147,421 |
| 109 | නන්දසේන රත්නපාල ස්වර්ණ මුද්‍රිකා පදක්කම | 124,448 | 138,791 |
| 110 | ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණ උපාධිය සඳහා ස්වර්ණ මුද්‍රිකා - ව්‍යවහාර විද්‍යා පීඨය | 153,648 | 147,991 |
| 111 | හොඳම කාර්යසාධන සිසුවාට හිමි පූජ්‍ය රාහුල වල්පොල රාහුල ස්වර්ණ මුද්‍රිකා සම්මාන - වෛද්‍ය විද්‍යා පීඨය | 134,375 | 127,882 |
| 112 | හොඳම කාර්යසාධන සිසුවාට හිමි පූජ්‍ය රාහුල වල්පොල රාහුල ස්වර්ණ මුද්‍රිකා සම්මාන - කළමණාකරණ හා වාණිජවිද්‍යා පීඨය | 136,616 | 129,946 |
| 113 | ව්‍යවසායකත්ව අධ්‍යයනාංශය සුවර්ණ මුද්‍රිකා පදක්කම | 150,814 | 145,009 |
| 114 | ඒ වී සුරවීර සුවර්ණ මුද්‍රිකා පදක්කම | 117,473 | 131,816 |
| 115 | මහාචාර්ය බී.ඒ.ටෙනිසන් පෙරේරා ස්වර්ණ මුද්‍රිකා | 106,566 | 120,663 |
| 116 | ආචාර්ය ටී ඩබ්ලිව් කේ රාජපක්ෂ අනුස්මරණ ස්වර්ණ මුද්‍රිකා සම්මාන | 640,512 | 608,743 |
| 117 | හික්කඩුවේ ශ්‍රී සුමංගල රන් පදක්කම | 186,144 | 166,898 |
| 118 | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එස්.ඒ.සී.ස්ටැන්ලි සිල්වා රන් පදක්කම | 651,850 | 630,127 |
| 119 | මහාචාර්ය බෙල්ලන්විල විමලරතන අනුනායක හිමි ස්වර්ණ මුද්‍රිකා | 105,247 | 119,622 |
| 120 | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජලජ ජෛව ශිෂ්‍ය සංගමය විසින් පිරිනමන රන් පදක්කම | 113,274 | 117,602 |
| 121 | මහාචා යර් මාලනී අඳගම ස්වර්ණ මුද්‍රිකා | 106,124 | 117,126 |
| 122 | මහාචාර්ය පී.විල්සන් ස්වර්ණ මුද්‍රිකා අරමුදල - වෛද්‍ය විද්‍යා පීඨය | 213,048 | 196,298 |
| 123 | මහාචාර්ය ඇන්ටොනෙට් පෙරේරා ස්වර්ණ මුද්‍රිකා - වෛද්‍ය විද්‍යා පීඨය | 206,172 | 191,662 |
| 124 | ෆාමසි අංශයේ දක්ෂතම ශිෂ්‍යාව වෙනුවෙන් ගීතා ප්‍රනාන්දු රන් පදක්කම | 158,648 | 152,991 |
| 125 | වෛද්‍ය විද්‍යා පීඨයේ පූරෝගාමී වෛද්‍යවරුන් විසින් පිරිනමනු ලබන රන් පදක්කම - 2018 | 98,700 | 98,700 |
| 126 | පූරෝගාමී වෛද්‍යවරුන් විසින් පිරිනමන ලද රන් පදක්කම | 28,692 | 22,943 |
| 127 | වෛද්‍ය විද්‍යා සඳහා 2 වන විභාගයේ හොඳම සිසුවා සඳහා රන් පදක්කම | 713,273 | 672,488 |
| 128 | ව්‍යුහ විද්‍යාව සඳහා මහාචාර්ය දයාසිරි ප්‍රනාන්දු මුදල් සම්මානය | 108,276 | 45,400 |
| 129 | මනෝ වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්ය එස්.ටී.කතිආරච්චි රන් පදක්කම | 634,044 | 569,616 |
| | **මුළු එකතුව** | **52,063,025** | **48,822,748** |

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## බාහිර පර්යේෂණ ප්‍රදාන සහ උපදේශන

සටහන 20

| අනු අංකය | විස්තරය | 2024/12/31 දිනට ශේෂය රු. | 2023/12/31 දිනට ශේෂය රු. |
|---|---|---|---|
| 1 | පීඨ පර්යේෂණ ශිෂ්‍යත්ව - සම සෞඛ්‍ය පීඨය - සංවර්ධන අරමුදල | 225,737 | - |
| 2 | නවෝත්පාදන සහ නැගී එන තාක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය - 2021 | 542,780 | 331,532 |
| 3 | තොරතුරු තාක්ෂණ පද්ධති වෙත ස්ථාන පාදක සේවා යෙදීම හරහා විෂයමාලා සුපෝෂණය | 1,460,515 | 2,974,658 |
| 4 | තනි භාවිත ප්ලාස්ටික් සහ එහි අපද්‍රව්‍ය-ආසියා පැසිෆික් රටවල් ව්‍යාපෘතියේ පරිසර හිතකාමී කළමනාකරණය | 403,839 | 1,051,669 |
| 5 | පුනර්ජනනීය බලශක්ති චක්‍ර ආර්ථිකය NORPART සඳහා පර්යේෂණ පදනම් වූ අධ්‍යාපන පද්ධතිය | 2,402,141 | 2,114,444 |
| 6 | 3D ආකෘති නිර්මාණය - තොරතුරු පද්ධති අධ්‍යාංශය - ඉංජිනේරු පීඨය | - | 260,941 |
| 7 | Renewable Energy Access for the Conversion of Tuktuks(REACT)-FOT | 265,799 | - |
| 8 | විද්‍යාත්මක පර්යේෂණ සඳහා ආධාර ප්‍රදානය - KAKENHI - තාක්ෂණ පීඨය | 2,928,945 | 1,846,414 |
| 9 | නිවුඩු සහල් සංවර්ධන ව්‍යාපෘතිය - SLCARP/BST/FOT | 82,424 | |
| 10 | සංජු බීජ සහල් සම්මේලනය - අරමුදල් IRRI-Philippine-Dep/BST | 1,727,595 | |
| 11 | ටුක්ටුක් පරිවර්තනය සඳහා පුනර්ජනනීය බලශක්ති ප්‍රවේශය (REACT) Tuktuks ව්‍යාපෘතිය 02 | 1,012,480 | - |
| 12 | ERRC- විවෘත විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකා- ව්‍යවහාරික විද්‍යා පීඨය | - | 22,800 |
| 13 | ERRC අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය- ව්‍යවහාරික විද්‍යා පීඨය | - | 45,952 |
| 14 | EU ප්‍රදාන ශිෂ්‍යත්ව (610012-EPP-1-2019-1-LK-EPPKA2) BRITAE | 1,684,828 | 2,164,828 |
| 15 | TWAS පර්යේෂණ ප්‍රදානයන් :19-237 RG/CHE/AS_G | 277,645 | 277,645 |
| 16 | පාරිසරික සංචාරක, වනජීවී සහ ස්වභාවධර්මය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව | 408,886 | 408,886 |
| 17 | ව්‍යාපෘතිය සඳහා උපදේශන සේවාව තේ වගාවේ භාවිතයේ ඇති ඉඩම් පිහුම් වැඩිදියුණු කිරීමේ අවස්ථා | 128,261 | 534,464 |
| 18 | අඩු ග්ලයිසමික් උක් සීනි සහ තිරිඟු පාන් ස්වභාවික ශාක අමුද්‍රව්‍ය සමඟ සංස්ථාගත කිරීම | 184,028 | 965,862 |
| 19 | නොරොච්චෝලේ සමුද්‍ර පරිසර විද්‍යා සමීක්ෂණය | - | 172,884 |
| 20 | උඩරට තේ භූ දර්ශනයේ ඉලක්ක නොවන තර්ජනාත්මක ක්ෂීරපායින් මත අවකාශීය තීව්‍රතාවය සහ උගුල් දඩයම් කිරීම | 402,688 | 271,132 |
| 21 | Technology transfer of "Sudarshana Suspension" | - | 312,018 |
| 22 | TPIC ව්‍යාපෘතිය 11 කොටස | 2,381,000 | 2,603,000 |
| 23 | CISRO- සමුද්‍ර සුන්බුන් නිරීක්ෂණ වැඩසටහන | 302,942 | 477,942 |
| 24 | පාරිසරික සහ සමාජ කළමනාකරණ පද්ධති - තිරසාරත්වය සඳහා මධ්‍යස්ථානය | 433,676 | 433,676 |
| 25 | පොදු පර්යේෂණ අරමුදල-ව්‍යවහාරික විද්‍යා පීඨය | 1,115,145 | 1,115,145 |
| 26 | ජාතික විද්‍යා පදනම - ප්‍රදානය RG/2021/AG/02 මහාචාර්ය මෙනිකා විදානගේ | 254,628 | 271,691 |
| 27 | පානීය ජලයේ ඇති සයනොටොක්සින් ඉවත් කිරීම සඳහා පරිමාණය කළ හැකි ජෛව පාදක විසඳුම් - ව්‍යවහාරික විද්‍යා පීඨය | 13,099 | 61,599 |
| 28 | චීනයේ භූ විද්‍යා විශ්ව විද්‍යාලය සහයෝගිතාව | 1,116,762 | 1,317,347 |
| 29 | ඉත්තෑපාන කඩොලාන මධ්‍යස්ථානය | 86,000 | 51,000 |
| 30 | DFST & Finagle Lanka (Pvt) Ltd සඳහා නිෂ්පාදන සංවර්ධනය | 343,893 | 343,893 |
| 31 | IEE වාර්තාව සඳහා උපදේශනය | 529,189 | 559,189 |
| 32 | වෘත්තීය පුහුණු වැඩමුළුව - ආචාර්ය සී.වික්‍රමාරච්චි | 460,794 | 460,794 |

Contd.

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

**බාහිර පර්යේෂණ ප්‍රදාන සහ උපදේශන**

**සටහන 20**

| අනු අංකය | විස්තරය | 2024/12/31 දිනට ශේෂය රු. | 2023/12/31 දිනට ශේෂය රු. |
|---|---|---|---|
| 33 | බාහිර පර්යේෂණ ප්‍රදාන-CAMR අරමුදල- ව්‍යවහාර විද්‍යා පීඨය | 1,762,669 | 2,044,761 |
| 34 | OWSD-වෛද්‍ය සමරවංශ - ජාන සහ අණුක ජීව විද්‍යා ඒකකය | 4,406,508 | 4,856,001 |
| 35 | පරිසර ගෝල ඔරොත්තු දීමේ සෙවීම් පර්යේෂණ මධ්‍යස්ථානයේ (ව්‍යවහාර විද්‍යා පීඨය) | 2,403,631 | 1,040,463 |
| 36 | Glow සම්මන්ත්‍රණය - බහු අවයවික විද්‍යාව - ව්‍යවහාර විද්‍යා පීඨය | 43,000 | 142,190 |
| 37 | CMST- UCLan ක්ෂුද්‍ර ප්ලාස්ටික් විශ්ලේෂණ ව්‍යාපෘතිය | 304,950 | 322,950 |
| 38 | විසිතුරු මත්ස්‍ය වගා වැඩමුළුව අරමුදල-සත්ත්ව විද්‍යා දෙපාතර්මේන්තුව | 3,946 | 200,000 |
| 39 | උසස් පෙළ සිසුන් සඳහා වැඩමුළුව CPMHPR- ව්‍යවහාර විද්‍යා පීඨය | 48,371 | - |
| 40 | OPCF- උභයජීවී ප්‍රදානය | 2,226,660 | 1,820,591 |
| 41 | ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය - භෞතික විද්‍යා දෙපාතර්මේන්තුව | - | 50,400 |
| 42 | භෞතික විද්‍යා ප්‍රායෝගික දෙපාතර්මේන්තුවේ ඉලෙක්ට්‍රොනික විද්‍යාව සඳහා උසස් පෙළ ගුරු පුහුණු වැඩමුළුව | - | 293,000 |
| 43 | උපදේශන සේවාව-Midas Safety (pvt) ltd-වෛද්‍ය නාරංගොඩ - ව්‍යවහාර විද්‍යා පීඨය | - | 159,300 |
| 44 | FAO උපදේශන ව්‍යාපෘතිය - ආචාර්ය ජේ.එම්.ජේ.කේ. ජයසිංහ - ව්‍යවහාර විද්‍යා පීඨය | 1,961,922 | - |
| 45 | NSF RG/2023/BS/01 ආචාර්ය ඉසුරි විරරත්න - ව්‍යවහාර විද්‍යා පීඨය | 599,904 | - |
| 46 | NSF RG/2023/BS/02 ආචාර්ය එම් මද්දුමආරච්චි - ව්‍යවහාර විද්‍යා පීඨය | 628,795 | - |
| 47 | පර්යේෂණ ප්‍රදාන අංක.RG/2024/BS/01 | 2,250,000 | - |
| 48 | පර්යේෂණ ප්‍රදාන අංක.NARP/2024/USJ/SC/01 | 628,598 | - |
| 49 | උසස් පෙළ සිසුන් සඳහා ජාන විද්‍යාව සහ අණුක ජීව විද්‍යා ශිල්පීය ක්‍රම පිළිබඳ වැඩමුළුව | 174,000 | - |
| 50 | විදේශීය විශ්ව විද්‍යාලයක ශිෂ්‍යයෙකු සඳහා ජාන විද්‍යාව සහ අණුක ජීව විද්‍යා ශිල්පීය ක්‍රම පිළිබඳ පුහුණුවක් | 69,600 | - |
| 51 | තිරසාර සංවර්ධන ව්‍යාපෘතිය - යශිරල - (කොමර්ෂල් බැංකුව) | 981,250 | - |
| 52 | වෙරළබඩ ජලයේ ගුණාත්මකභාවය සහ මුහුදු පිටාර ගැලීම් පරීක්ෂා කිරීම - 2024 | 727,600 | - |
| 53 | ටෝකියෝ සිමෙන්ති (ලංකා) පීඑල්සී අරමුදල් සපයන පර්යේෂණ ව්‍යාපෘතිය | 1,885,000 | - |
| 54 | පුද්ගලික අනතුරු ඇඟවීමේ තක්සේරු මෙවලම සංවර්ධනය කිරීම (PAAT) | 2,592,247 | |
| 55 | පර්යේෂණ ප්‍රදාන - ඉම්පීරියල් කොලේජ් ලන්ඩන් (AICBU) | 16,696,556 | - |
| 56 | Covid 19 සමඟ විශ්වවිද්‍යාල සිසුන්ගේ නවෝත්පාදන වැඩිදියුණු කිරීම | 160,000 | 160,000 |
| 57 | පොදු පර්යේෂණ ගිණුම | 32,814,791 | 29,652,424 |
| 58 | IRCGS - මානව සම්පත් හා සමාජ විද්‍යා පීඨය | 192,540 | 196,700 |
| 59 | අපරාධ සහ අපරාධ යුක්තිය පිළිබඳ ජාත්‍යන්තර සමුළුව (ICCCJ) - මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය | 27,697 | - |
| 60 | හෙරිටේජ් ප්ලස් තරඟය - මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය | 26,750 | - |
| 61 | NARESHA පර්යේෂණ ව්‍යාපෘතිය | - | 188,620 |
| 62 | ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ජාත්‍යන්තර සමුළුව | 2,958,879 | 3,170,066 |
| 63 | ආචාර්ය උපාධි පර්යේෂණ ප්‍රදාන | - | 371,381 |
| 64 | තානාපති ප්‍රදාන ඇමරිකා එක්සත් ජනපදය - ඓතිහාසික ලන්දේසි ගාල් බලකොටුව පිළිබඳ සවිස්තරාත්මක ලේඛනගත කිරීම | 10,120 | 10,120 |
| 65 | උසස් අධ්‍යාපනය පිළිබඳ ඉගැන්වීමේ සහතික පත්‍ර පාඨමාලාව (CTHE) | 19,147,721 | 17,784,486 |
| 66 | ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව 2012 (IRCSH) - මානව සම්පත් හා සමාජ විද්‍යා පීඨය | 994,403 | 503,000 |
| 67 | ඩෙංගු පර්යේෂණ මධ්‍යස්ථානයක් පිහිටුවීම - වෛද්‍ය විද්‍යා පීඨය | 204,864 | 204,864 |
| 68 | ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය - ව්‍යවහාරික විද්‍යා පීඨය | 1,394,610 | 1,579,542 |
| 69 | රජගල පුරාවිද්‍යා රක්ෂිතය - මානව සම්පත් හා සමාජ විද්‍යා පීඨය | 3,282,425 | 3,282,425 |

Contd.

## ශ්‍රී ජයවධර්නපුර විශ්වවිද්‍යාලය

## බාහිර පර්යේෂණ ප්‍රදාන සහ උපදේශන

සටහන 20

| අනු අංකය | විස්තරය | 2024/12/31 දිනට ශේෂය රු. | 2023/12/31 දිනට ශේෂය රු. |
|---|---|---|---|
| 70 | පශ්චාත් උපාධි පර්යේෂණ - ආචාර්ය කේ.එම්.ටී.ඩී. ගුණසේකර - රසායන විද්‍යා | - | 506,957 |
| 71 | තුල්හිරිය සිට පරිසර විද්‍යාව සහ සමාජ විද්‍යාව EE 132 KV සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය සඳහා උපදේශනය | - | 701,260 |
| 72 | 220 KV සම්ප්‍රේෂණ මාර්ගය මන්නාරම සිට වවුනියාව හරහා අනුරාධපුරය දක්වා | - | 1,249,196 |
| 73 | 132 KV සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය නඩුකුඩා සිට මන්නාරම දක්වා | - | 516,335 |
| 74 | වන විද්‍යාව සහ පරිසරය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය - ව්‍යවහාරික විද්‍යා පීඨය | 10,225 | 10,225 |
| 75 | පරිසර ආරක්ෂණ අංශයේ සිට VET සැලසුම් සංවර්ධනය සඳහා VET සැලැස්ම - ව්‍යවහාරික විද්‍යා පීඨය | - | 121,006 |
| 76 | සංස්කෘතික සංරක්ෂණය සඳහා තානාපති අරමුදල 2015 රජගල අසපුව | 5,831,236 | 5,831,236 |
| 77 | ආක්‍රමණශීලි ජලජ ශාක ව්‍යාප්තිය පාලනය කිරීම | 139,156 | 280,305 |
| 78 | මධ්‍යම උපකරණ පහසුකම් යටතේ රසායනාගාර පරීක්ෂණ ගාස්තු | 2,360,637 | 930,154 |
| 79 | අනුරාධපුර කුඩාවිලච්චිය වැව ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා EIA සඳහා උපදේශන සේවාව - ව්‍යවහාරික විද්‍යා පීඨය | - | 238,255 |
| 80 | වෙරළ ප්‍රවේශ ව්‍යාපෘතිය සිතියම්ගත කිරීම- භූගෝල විද්‍යා දෙපාර්තමේන්තුව | 4,642,937 | 2,589,317 |
| 81 | UNDP ව්‍යාපෘතිය 2020 -මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය | - | 2,218,200 |
| 82 | තුම්බෝවිල කරදියාන කුණු කන්දේ පරිසර දූෂණය අධීක්ෂණය හා අවම කිරීම | 21,559 | 21,559 |
| 83 | මාදින්නාගොඩ නාගරික තෙත්බිම සහ දියසරු වෙරළින් උද්‍යානය ප්‍රතිසංස්කරණය සහ තිරසාර කළමනාකරණය | 224,720 | 324,720 |
| 84 | ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනය (IWMI) ජල විශ්ලේෂණ ව්‍යාපෘතිය | 23,714 | 128,630 |
| 85 | වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ජල තත්ත්ව විශ්ලේෂණය | 83,362 | 213,400 |
| 86 | දැව ක්‍රියාවලි නවෝත්පාදන මධ්‍යස්ථානය (TPIC) | 7,277,383 | 7,377,383 |
| 87 | ජල තත්ත්ව සහ ඇල්ගී පර්යේෂණ පුහුණු වැඩසටහන සඳහා මධ්‍යස්ථානය | 146,150 | 146,150 |
| 88 | ගුරු පුහුණු වැඩසටහන - 2018 - ව්‍යවහාරික විද්‍යා පීඨය | 448,579 | 448,579 |
| 89 | IAEA ප්‍රදාන-ව්‍යවහාරික විද්‍යා පීඨය | 158,185 | 808,152 |
| 90 | OWSD - ECWS මිත්‍රත්ව- ව්‍යවහාරික විද්‍යා පීඨය | 45,180 | 77,325 |
| 91 | ICRP/NSF - NSFC/19/BS/01 | 5,714 | 603,494 |
| 92 | යෝජිත මාන්කුලම් නගරය සඳහා පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව ක්‍රියාත්මක කිරීම සඳහා උපදේශන සේවා සැපයීම | 2,688,071 | 339,261 |
| 93 | කරුවලගස්වැව හෙක්ටයාර 400ක වන ප්‍රතිසංස්කරණය | 38,549 | 38,549 |
| 94 | NHI ප්‍රදානය - මහාචාර්ය එන්.මලවිගේ | 2,825,769 | 2,125,898 |
| 95 | මැලිබන් ප්‍රොඩක්ට් ලිමිටඩ් -වෛද්‍ය විද්‍යා පීඨය විසින් බෙදා හරින ලද ග්ලයිසමික් දර්ශක පරීක්ෂණ "මැලිබන් මෝල්ට්" | - | 79,000 |
| 96 | කාර්මික තාක්ෂණ ආයතනය - වෛද්‍ය විද්‍යා පීඨය මගින් බහු ධාන්‍ය පාන් නිෂ්පාදනවල ග්ලයිසමික් දර්ශක පරීක්ෂාව | 6,358 | 6,358 |
| 97 | ජාතික විද්‍යා පදනම මගින් ප්‍රදාන (ICRP/NSF-NSFC/2019/HS/02) | - | 468,562 |
| 98 | මැලිබන් ප්‍රොඩක්ට් ලිමිටඩ් -වෛද්‍ය විද්‍යා පීඨය විසින් බෙදා හරින ලද ග්ලයිසමික් දර්ශක පරීක්ෂණ "මැලිබන් මෝල්ට්" | 17,461 | 79,000 |
| 99 | ලෝක සෞඛ්‍ය සංවිධානයේ පර්යේෂණ ව්‍යාපෘතිය - මහාචාර්ය. සාගරිකා ඒකනායක | 861,688 | 1,228,050 |
| 100 | NIHR ගෝලීය RECHARGE ව්‍යාපෘතිය | 1,679,348 | 2,325,688 |

Contd.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

බාහිර පර්යේෂණ ප්‍රදාන සහ උපදේශන

සටහන 20

| අනු අංකය | විස්තරය | 2024/12/31 දිනට ශේෂය<br>රු. | 2023/12/31 දිනට ශේෂය<br>රු. |
|---|---|---|---|
| 101 | සුං කියුන්ක්වාන් විශ්වවිද්‍යාල පර්යේෂණ - වෛද්‍ය විද්‍යා පීඨය | 2,399,695 | 2,421,588 |
| 102 | PATH ප්‍රදානය - මහාචාර්ය ගුවනි ලියනගේ | - | 682,697 |
| 103 | Arbovirus පර්යේෂණ සහ වැඩිදියුණු කළ නිරීක්ෂණ සඳහා ආසියානු ඇමරිකානු මධ්‍යස්ථාන (NIH) - ආසාත්මිකතා හා ප්‍රතිදේහ සෛල විද්‍යා ඒකකය | 55,366,732 | 33,512,732 |
| 104 | SARS-CoV-2 ප්‍රතිදේහජනක හඳුනාගැනීමේ වේගවත් රෝග විනිශ්චය පරීක්ෂණ ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය (ලෝක සෞඛ්‍ය සංවිධානය) - ආසාත්මිකතා හා ප්‍රතිදේහ සෛල විද්‍යා ඒකකය | 458,593 | 458,593 |
| 105 | ප්‍රෝමාල්ට් දියවැඩියා රෝගීන්ගේ ග්ලයිසමික් දර්ශක පරීක්ෂාව - වෛද්‍ය විද්‍යා පීඨය | 65,281 | 65,281 |
| 106 | පරිවෘත්තීය පරාමිතීන්ගේ සංගමය සහ මධ්‍යසාර නොවන මේද අක්මා රෝග - වෛද්‍ය විද්‍යා පීඨය | 39,954 | 80,954 |
| 107 | SARS-COV2 ආරක්ෂිත ප්‍රතිශක්තිකරණ ප්‍රතිචාර සහ රෝග ව්‍යාධිජනක හඳුනා ගැනීම | 28,054,443 | 102,600 |
| 108 | sars cov2 ආසාදනය සහ ඩෙංගු ආසාදනයේ සෙරෝප්‍රවේලනය | 8,187,391 | 8,187,391 |
| 109 | Remedium සහ ආසාත්මිකතා ප්‍රතිශකත්තිකරණ හා අණුක විද්‍යා ඒකකය අතර අවබෝධතා ගිවිසුම | 8,856,000 | 5,470,000 |
| 110 | පොදු ලෙපර් කේතය - වෛද්‍ය විද්‍යා පීඨය | 4,110,211 | 3,738,830 |
| 111 | Stongyloidiasis අධ්‍යයනය - වෛද්‍ය C.J.වීරසේකර | 524,820 | 494,820 |
| 112 | සිද්ධාලේප ව්‍යාපෘතිය මහාචාර්ය ටී එස් සුරේෂ් - වෛද්‍ය විද්‍යා පීඨය | 219,644 | 316,906 |
| 113 | Global Health ResPIRE 2 ව්‍යාපෘතිය (වෛද්‍ය විද්‍යා පීඨය) | 6,558,217 | 3,901,532 |
| 114 | ගල්ඔය ප්ලාන්ටේෂන් පුයිවට් ලිමිටඩ් හි නිපදවන ලද ක්‍රියාකාරී සීනි නිෂ්පාදනයක ග්ලයිසමික් දර්ශක පරීක්ෂාව | 1,031,758 | 378,466 |
| 115 | නවජ සෙප්සිස්, ක්ෂුද්‍ර ජීවී ප්‍රතිරෝධය - වෛද්‍ය විද්‍යා පීඨය | 1,807,838 | 2,077,838 |
| 116 | CRITIC ව්‍යාපෘතිය (පර්යේෂණ අරමුදල - වෛද්‍ය විද්‍යා පීඨය) | 39,202,616 | - |
| 117 | Cambridge Anastomosis සැත්කම් වැඩමුළුව (සංවර්ධන අරමුදල) | 180,000 | - |
| 118 | පළාත් පාලන ආයතන විසින් ආදායම් එකතු කිරීමේ කාර්යක්ෂමතාව | 235,559 | 235,559 |
| 119 | ශ්‍රී ලංකාවේ තාක්ෂණික-ආර්ථික-සමාජ තිරසාර සංවර්ධන පුහුණුව (TESS) ව්‍යාපෘතිය | 1,351,276 | 2,583,842 |
| 120 | ICREMV-(නිශ්චල දේපල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර සමුළුව 2020) | 259,920 | 1,128,484 |
| 121 | SECRA ERASMUS + ව්‍යාපෘතිය | 126,926 | 4,865,447 |
| 122 | සාම්ප්‍රදායික හා ග්‍රාමීය කර්මාන්තකරුවන් සඳහා අලෙවිකරණ මූලපිරීම් - කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ පීඨය | 36,679 | 411,679 |
| 123 | අත්හැර දැමූ ඇහලුම් කම්කරු ව්‍යාපෘතිය - කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ පීඨය | 63,360 | 574,755 |
| 124 | කළමනාකරණ භූමිකාව අනාවරණය කිරීම. චක්‍රලේඛ ආර්ථික ව්‍යාපාර ආකෘතීන් පිළිබඳ ගිණුම්කරණය : අරමුදල් සපයන ලද්දේ (CIMA-UK) | - | 274,833 |
| 125 | බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ (කළමනාකරණ හා වාණිජවිද්‍යා පීඨය) ස්ථාවර වත්කම් තක්සේරු කිරීමේ උපදේශන ව්‍යාපෘතිය | 428,532 | 210,629 |
| 126 | ORCID - පුහුණු ප්‍රජාවන් උත්ප්‍රේරක කිරීම | 1,872,564 | 3,874,599 |
| 127 | EI Toro Roofing Product LTD (CRES) සඳහා සිමෙන්ති ෆයිබර් පැතලි තහඩුව පිළිබඳ උපදේශන ව්‍යාපෘති පරීක්ෂණය | 234,000 | - |
| 128 | AASSREC පර්යේෂණ ප්‍රදාන - කළමණාකරන හා වාණිජ විද්‍යා පීඨය | 1,000,529 | - |
| | **Total** | **314,994,242** | **197,566,940** |

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## විලම්බිත ආදායම් - දිගුකාලීන වැඩසටහන්

**සටහන 21**

| අනු අංකය | විස්තරය | 2024/12/31 දිනට රු. | 2023/12/31 දිනට රු. |
|---|---|---|---|
| 1 | විලම්බිත ආදායම් - කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා පීඨය | 186,314,561 | 148,270,761 |
| 2 | විලම්බිත ආදායම් - පශ්චාද් උපාධි පීඨය | 142,222,067 | 137,672,897 |
| 3 | විලම්බිත ආදායම් - මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය | 52,970,931 | 35,693,808 |
| 4 | විලම්බිත ආදායම් - බාහිර විභාග | 1,818,254,509 | 1,550,862,283 |
| 5 | විලම්බිත ආදායම් -වෛද්‍ය විද්‍යා පීඨය | 2,831,085 | 6,169,953 |
| 6 | විලම්බිත ආදායම් -තාක්ෂණ පීඨය | 6,774,151 | 4,524,527 |
| **මුළු මුදල** | | **2,209,367,304** | **1,883,194,230** |

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

**නිශ්චිත ප්‍රතිලාභ වගකීම් සඳහා ප්‍රතිපාදන**

**සටහන 22**

| විස්තරය | As at 31.12.2024 Rs. | As at 31.12.2023 Rs. |
|---|---|---|
| ජනවාරි 01 දිනට ශේෂය | 1,861,836,260 | 1,532,901,801 |
| එකතු : ව ර් ෂ ය සඳහා ප්‍රතිපාදන (වත්මන් සේවා පිරිවැය) | 127,811,742 | 99,436,840 |
| එකතු : නිශ්චිත ප්‍රතිලාභ වගකීම් මත පොලී පිරිවැය | 242,038,714 | 275,922,324 |
| අඩු : නිශ්චිත ප්‍රතිලාභ මත ලාභය හෝ අලාභය | 74,661,992 | 58,080,140 |
| අඩු : වර් ෂය තුළ ගෙවීම් | (143,732,883) | (104,504,845) |
| 20 **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **2,162,615,825** | **1,861,836,260** |

**සටහන 22.01**

**වර්ෂය තුළ භාවිතා කරන ලද තක්සේරු උපකල්පන**

| | |
|---|---|
| මරණය | : 1967/70 මරණ වගුව |
| ආබාධිතභාවය | : මරණ වගුවෙන් 10%ක් |
| කාර්ය මණ්ඩල පිරිවැටුම් | : අධ්‍යයන කාර්ය මණ්ඩලය: වයස අවුරුදු 54 දක්වා වාර්ෂිකව 5% ක් සහ අධ්‍යයන නොවන කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂිකව 3% ක් සහ ඉන්පසු ශූන්‍ය වේ. |
| සාමාන්‍ය විශ්‍රාම වයස | : අධ්‍යයන කාර්ය මණ්ඩලය: අවුරුදු 65, අනධ්‍යයන කාර්ය මණ්ඩලය: අවුරුදු 60 |
| වට්ටම් අනුපාතය | : වසරකට 11% |
| වැටුප් වැඩි කිරීමේ අනුපාත | :මූලික වැටුප සහ දීමනා: අධ්‍යයන වර්ෂය සඳහා 12% අධ්‍යයන නොවන වර්ෂය සඳහා 10%, වැටුප් වර්ධක සෑම වසරකම පත්වීම් මාසයේ දී ගෙවිය යුතුය. |
| විශ්‍රාම පාරිතෝෂික සූත්‍රය | : අවම වශයෙන් වසර 5 ක සේවා කාලයක් ඇති අය සඳහා සම්පූර්ණ කරන ලද සෑම සේවා වසරක් සඳහාම මාස භාගයක වැටුප |

**සටහන 22.02**

**සංවේදිතා විශ්ලේෂණය 2024**

| උපකල්පන වෙනස්කම් | ප්‍රතිපාදන (රු.) |
|---|---|
| එක් ප්‍රතිශතයක වැඩිවීමක් (+1%) වට්ටම් අනුපාතය තුල | 2,021,571,903 |
| එක් ප්‍රතිශතයක වැඩිවීමක් (-1%) වට්ටම් අනුපාතය තුල | 2,322,536,842 |
| එක් ප්‍රතිශතයක වැඩිවීමක් (+1%) වැටුප් වර් ධක අනුපාතය අනුව | 2,324,081,372 |
| එක් ප්‍රතිශතයක වැඩිවීමක් (-1%) වැටුප් වර් ධක අනුපාතය අනුව | 2,017,840,313 |
| | |

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

**ආපසු ගෙවිතු ලබන තැන්පතු**

**සටහන 23**

| අනු අංකය | විස්තරය | 2024/12/31 දිනට රු. | 2023/12/31 දිනට රු. |
|---|---|---|---|
| 1 | විවිධ තැන්පතු | 22,442,865 | 7,445,454 |
| 2 | නැවත ගෙවන පූත්තකාල තැන්පතු හා විද්‍යාගාර තැන්පතු - පශ්චාද් උපාධි පීඨය | 20,391,200 | 20,433,700 |
| 3 | නැවත ගෙවන උපාධි ලෝගු තැන්පතු | 17,031,129 | 6,123,479 |
| 4 | ටෙන්ඩර් තැන්පතු | 18,047,853 | 14,659,003 |
| 5 | නැවත ගෙවන පූත්තකාල තැන්පතු - කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා පීඨය | 7,289,000 | 4,890,000 |
| **මුළු එකතුව** | | **85,202,047** | **53,551,636** |

**උපචිත වියදම් සහ අනෙකුත් වියදම්**

**සටහන 24**

| අනු අංකය | විස්තරය | 2024/12/31 දිනට රු. | 2023/12/31 දිනට රු. |
|---|---|---|---|
| 1 | විවිධ ණයහිමියන් | 402,594,188 | 546,311,809 |
| 2 | ගෙවිය යුතු මුදල් | 950,493,526 | 718,455,657 |
| 3 | දිගු කිරීමේ වැඩසටහන් | 31,130,802 | 84,231,396 |
| **මුළු මුදල** | | **1,384,218,516** | **1,348,998,862** |

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## පොදු සංචිතයට ගැලපීම.

**සටහන 25**

| | |
|---|---:|
| **2024 ජනවාරි 01 දිනට ශේෂය** | **(3,275,522,833)** |
| ඇස්තමේන්තුවේ වෙනස්කම් හේතුවෙන් ක්ෂය වීමට ගැලපීම | 27,627,060 |
| පොලී ආදායම සංවර්ධන අරමුදලට බැර කෙරේ | (79,781,658) |
| පොලී ආදායම බැඳුම්කර උල්ලංඝනය කිරීමේ අරමුදලට බැර කෙරේ | (24,753,828) |
| අරමුදල් - ගිවිසුම් කඩ කිරීම් | (125,321,671) |
| පෙර වසරේ ස්වයං මූල්‍ය පාඨමාලා ආදායම් ගැලපීම | 57,809,150 |
| 2024 වර්ෂය සඳහා පුනරාවර්තන අතිරික්තය | 320,974,507 |
| **2024/12/31 දිනට ශේෂය** | **(3,098,969,273)** |

## සටහන 26

**අසම්භාව්‍ය වත්කම් හා අසම්භාව්‍ය වගකීම්**

**සටහන 26.1 - බැඳුම්කර සහ ගිවිසුම් උල්ලංඝනය කිරීම මත අසම්භාව්‍ය වත්කම්.**

බැඳුම්කර සහ ගිවිසුම් උල්ලංඝනය කිරීම මත ගෙවිය යුතු වටිනාකම 2024/12/31 දිනට රු.205,243,107 ක් වන අතර එය අසම්භාව්‍ය වත්කම් ලෙස හඳුනා ගෙන ඇත.

රු.

| | |
|---|---|
| 2023/12/31 දිනට ලැබිය යුතු මුළු මුදල් (බැඳුම්කර උල්ලංඝනය කල සංඛ්‍යාව 39) | 190,605,580 |
| 2023/12/31 දිනට බැඳුම්කර වටිනාකම් මත පොලිය | 23,218,305 |
| 2024 දී අළුතින් එකතු කරන ලද උල්ලංඝනය කල බැඳුම්කර (15 දෙනෙකි) | 99,557,995 |
| 2024 වර්ෂය සඳහා මුළු ලැබීම් | (127,294,490) |
| 2024/12/31 දිනට බැඳුම්කර වටිනාකම මත පොලිය | 19,155,717 |
| 2024/12/31 දිනට ලැබිය යුතු මුළු මුදල් (බැඳුම්කර උල්ලංඝනය කර සංඛ්‍යාව 42) | 205,243,107 |

**සටහන 26.2 - ඉදිරි පාඨමාලා ගාස්තු වල වාරික මත අසම්භාව්‍ය වත්කම්.**

වාර්තාකරණ දිනට අනාගත ලැබීම් ලැබීමේ අවිනිශ්චිතතාවය හේතුවෙන් අනාගත කාල පරිච්ඡේදය සඳහා ලැබීමට නියමිත වාරික අසම්භාව්‍ය වත්කම් ලෙස හඳුනා ගැනේ.

**සටහන 26.3 - අසම්භාව්‍ය වගකීම්**
අවිනිශ්චිතතා හා කැපවීම් පහත පරිදි වේ.

**විශ්වවිද්‍යාලයෙන් හා විශ්වවිද්‍යාලයට එරෙහිව ඇති නඩු**

| අනු අංකය | නඩුවේ විස්තරය | ගැටලුව | අනෙකුත් සටහන් | කළමනාකරණ තීරණ |
|---|---|---|---|---|
| **1.** | හෝමාගම කම්කරු විනිශ්චය සභාව – 2018/1400/33<br>ජේ.වී.ටී.යූ.කේ. ජයසේකර මහතා විසින් ගොනු කරන ලද නඩුව – වැටුප් නැවත ලබා දෙන ලෙස ඉල්ලා පෙත්සමක්. | කම්කරු ගැටලු | 2025 පෙබරවාරි 13 වන දින තීන්දුව | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට පක්ෂව නඩු තීන්දුවක් ලබා දීම සඳහා කළමනාකාරිත්වය නිරන්තර අධීක්ෂණයක් පවත්වන අතර, නඩුවේ වත්මන් තත්ත්වය අනුව වන්දි වටිනාකම තක්සේරු කළ නොහැක. |
| **2.** | නුගේගොඩ දිසා අධිකරණය – M/3020/2018 බී.ආර්.එම්.එන්. රත්නායක මහත්මිය (බැඳුම්කර අයකර ගැනීම) ට එරෙහිව විශ්ව විද්‍යාලය විසින් ගොනු කරන ලද නඩුව වටිනාකම– රු.10,762,632.36 | බැඳුම්කර කඩකිරීම් | නඩු විභාගය 2025 මැයි 29 වන දින | |
| **3.** | නුගේගොඩ දිසා අධිකරණය – එම්/2949/2018<br>නව කලා රහහල. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය විසින් ගොනු කරන ලද නඩුව වටිනාකම - රු.1,065,229.27<br><br>ඊළඟ දින පියවර සහ පියවර | ගිවිසුම් අවසන් කිරීම් | 2024/05/22 දින ඉදිරිපත් කරන ලදී. | |

| | | | | |
|---|---|---|---|---|
| | | | | |
| **4.** | නුගේගොඩ දිසා අධිකරණය–<br>M/2950/2018<br>රසායන විද්‍යා ගොඩනැගිල්ල, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ගොනු කල නඩුව<br>මුදල-රු.720,010.56<br>ඊලඟ දිනය හා පියවර | ගිවිසුම් අවසන් කිරීම | ඉහත කාරණයේ නඩත්තු කිරීමේ හැකියාව පිළිබඳ ව නීතිපති දෙපාර්තමේන්තු වට ලිපියක් යවන ලදී | |
| **5.** | හෝමාගම මහාධිකරණය – ALT 10/2018 කම්කරු විනිශ්වය සභාවේ තීරණයට එරෙහිව විශ්ව විද්‍යාලය විසින් ගොනු කරන ලද නඩුව.<br><br>හෝමාගම මහාධිකරණය - ALT 11/2018 කම්කරු විනිශ්වය සභාවේ තීරණයට එරෙහිව රංග ප්‍රසාද් මහතා විසින් ගොනු කරන ලද නඩුව. විශ්වවිද්‍යාලය වගඋත්තරකරුවෙකු ලෙස නම් කර ඇත.<br><br>ශ්‍රේෂ්ඨාධිකරණය - SC/HC/14/2021/LA මහාධිකරණ තීන්දුවට එරෙහිව රංග ප්‍රසාද් මහතා විසින් ගොනු කරන ලද නඩුව. විශ්වවිද්‍යාලය වගඋත්තරකරුවෙකු ලෙස නම් කර ඇත. | අභියාචනා සම්බන්ධ ගැටලු | තීන්දුව ලබා දී ඇත - තැන්පතු මුදල ආපසු ගෙවන්න (රු.1,948,927.51 පමණ) | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට පක්ෂව නඩු තීන්දුවක් ලබා දීම සඳහා කළමනාකාරිත්වය නිරන්තර අධීක්ෂණයක් පවත්වන අතර, නඩුවේ වත්මන් තත්ත්වය අනුව වන්දි වටිනාකම තක්සේරු කළ නොහැක. |
| **6.** | හෝමාගම කම්කරු විනිශ්වය සභාව – 2020/1502/35<br>මනෝජ් උපශාන්ත විසින් ගොනු කරන ලද නඩුව – අභියාචනය – වැටුප් නැවත ලබා දෙන්න, ආපසු වැටුප්, අර්ධ වැටුප් | කම්කරු ගැටලු | 2024 ජුනි 10 වන දින තීන්දුව ලබා දෙන ලදී අයදුම්පත නිෂ්ප්‍රභ කරන ලදී 2025 ජනවාරි 20 වන දින කැඳවන ලද LT නියෝගයට එරෙහිව අයදුම්කරු මහාධිකරණයේ අභියාචනයක් ගොනු කළේය. | |
| **7.** | නුගේගොඩ දිසා අධිකරණය – 4379/2021/M<br>ආචාර්ය එස්.ආර්.එන්. කොළඹගේට එරෙහිව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය විසින් ගොනු කරන ලද නඩුව<br>වටිනාකම රු.6,998,145.89 | බැඳුම්කර කඩකිරීම් | 2025 ජනවාරි 27 වන දින DC (නුගේගොඩ) 4380/2021/M සම්බන්ධිත කාරණය සමඟ කැඳවීමට නියමිතය - කාරණා දෙකම සමථයකට පත් කිරීමට. | |

| | | | | |
|---|---|---|---|---|
| | නුගේගොඩ දිසා අධිකරණය – 4380/2021/M<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය විසින් ආචාර්ය එස්.ආර්.එන්. කොළඹගේගේ ඇපකරුවන්ට එරෙහිව ගොනු කරන ලද නඩුව.<br><br>වටිනාකම රු.6,998,145.89<br><br>ඊළඟ දිනය 2023.01.16 | | 2025.01.27 දින පූර්ව නඩු විභාගය සඳහා නියම කරන ලදී. මෙම මුදලට චෙක්පතක් නිකුත් කිරීමෙන් DC (නුගේගොඩ) 4379/M හි සම්බන්ධිත කාරණය සමඟ මෙම කාරණය විසඳනු ලැබේ. (පොරොත්තු) | |
| **8.** | ශ්‍රේෂ්ඨාධිකරණය – SC/FR/283/2020<br>මහාචාර්ය සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයට එරෙහිව ආචාර්ය සුනේත්‍රා කන්කන්මගේ විසින් ගොනු කරන ලද නඩුව | මූලික අයිතිවාසිකම් ගැටලු | 2025/04/03 දින තර්ක ඉදිරිපත් කිරීම | |
| **9.** | ශ්‍රේෂ්ඨාධිකරණය – SC/FR/216/2021<br>තම අනතුර සම්බන්ධයෙන් විශ්ව විද්‍යාලයට එරෙහිව පසිඳු හිරුෂාන් විසින් ගොනු කරන ලද නඩුව | මූලික අයිතිවාසිකම් ගැටලු | 2025.01.29 දින සඳහන් කිරීමට නියමිතයි (පළමු විනිසුරු නාමයෝජනා සඳහා) | |
| **10.** | ලිඛිත අයදුම්පත<br>ගොනු කරන ලද්දේ – N.W.A.R.W. නානායක්කාර මහත්මිය<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුවේ කථිකාචාර්ය තනතුර සම්බන්ධයෙන් | ලිවීමට | පොරොත්තු | |

**ප්‍රාග්ධන කැපවීම්.**

1. බොරලැස්ගමුව, එගොඩවත්ත පාරේ 04 වන පටුමගෙහි ඉඩම අත්පත් කර ගැනීම සඳහා විශ්වවිද්‍යාලය විසින් කැස්බෑව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ රුපියල් මිලියන 13ක් තැන්පත් කර ඇත. ඉඩමේ වටිනාකම රුපියල් මිලියන 52 ක් වන අතර එය අත්පත් කර ගැනිමේ කාර්යය සිදු කෙරෙමින් පවතී.

2. රත්තනපිටියේ මෙත්සෙවන නිවස මුල්ලේරියාවේ සන්ෆ්ලවර් ගම්මානයට ගෙනයාම සඳහා විශ්වවිද්‍යාලය විසින් බස්නාහිර පළාත් සභාවට රුපියල් මිලියන 74 ක් ගෙවා ඇත. මෙත්සෙවන

අක්කර 10 ක ඉඩමෙන්, විශ්වවිද්‍යාලයට පවරා දුන් අක්කර 4 ක් සහ වෛද්‍ය විද්‍යා පීඨය ස්ථාපිත කර ඇති අතර එය දැනටමත් ප්‍රාග්ධනීකරණය කර ඇත. මෙම ඉඩම දැනට විශ්වවිද්‍යාලයට භාවිතා කළ හැකි මට්ටමක නොමැති බැවින්, අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ ආරක්ෂක අමාත්‍යාංශයේ සහභාගීත්වයෙන් ඉතිරි ඉඩම අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය විශ්වවිද්‍යාලය ක්‍රියාත්මක වේ. ඒ අනුව ඉඩම අත්පත් කර ගැනීමට කටයුතු කර ඇති අතර විශ්වවිද්‍යාලය ඉඩම භාවිතා කරන විට එම ඉඩම විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනයේ වත්කමක් ලෙස සටහන් කරනු ලැබේ.

**සටහන 27**

**ශේෂ පත්‍ර දිනට හා වාර්තා කිරීමෙන් පසුව සිදු වන සිදුවීම් පල කිරීම .**

වාර්තාකරණ දිනයේ සිට, මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට අවසර දීමට පෙර, මූල්‍ය ප්‍රකාශන වල අපගේ හෙළිදරව් කිරීම් සඳහා ගැලපීම් අවශ්‍ය කරන කිසිදු තත්වයක් ඇති වී නොමැත.

**සටහන 28**

**අදාළ පාර්ශව සමඟ ගනුදෙනු**

**1.** උපකුලපතිතුමා, පීඨාධිපතිවරුන් සහ සනාතන සභාවේ සාමාජිකයන් දෙදෙනෙක් විශ්වවිද්‍යාල පාලක සභාවේ සාමාජිකයින් වෙති. 2024 වසර තුළ මේ සාමාජිකයන්ට ගෙවා ඇති වැටුප් සහ අනෙකුත් දීමනා රු. 129,737,808 වේ. විශ්වවිද්‍යාලයේ තීරණ ගැනීමේ ක්‍රියාවලියට සම්බන්ධ වීම සඳහා කිසිදු විශේෂ ගෙවීමක් සිදු කර නොමැත..

**2.** කොළඹ 08, ලෙස්ලී රණගල මාවත, අංක 28, දී පිහිටා ඇති කළමනාකරණ උපාධි පීඨය (PIM) යනු වෙන්වූ පනතක් මත ආඥාප්‍රාප්ත කර ඇති උපාධි පශ්චාත් ආයතනයක් වන අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සමඟ අනුබද්ධ ආයතනයකි. මෙම උපාධි පශ්චාත් ආයතනයේ අධ්‍යක්ෂවරයා විශ්වවිද්‍යාල සනාතන සභාවේ සාමාජිකයෙකු වන අතර අධ්‍යාපන ක්‍රියාකාරකම් සඳහා අවසර ලබාදීම සිදු කරනුයේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සනාතන සභාවෙනි. එහි මූල්‍ය ක්‍රියාකාරකම් ආයතනයේ කළමනාකරණ මණ්ඩලය මගින් පාලනය වේ. ඒ අනුව කළමනාකරණ උපාධි පීඨයේ මූල්‍ය ගනුදෙනු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය වෙත ලේඛනගත නොවේ.

**3.** විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ, මුදල් කමිටුවේ සාමාජිකයෙක් සහ විගණන හා කළමනාකරණ කමිටුවේ සභාපති සුජීව රාජපක්ෂ මහතා 2024 නොවැම්බර් 17 වන දින දක්වා මහජන බැංකුවේ සභාපතිවරයා ලෙස කටයුතු කල අතර, විශ්වවිද්‍යාලයේ ස්ථාවර තැන්පතු සඳහා රුපියල් මිලියන 6,876 ක් ආයෝජනය කර ඇති ජංගම ගිණුම් 30 ක් පවත්වා ගෙන යනු ලැබේ .ශ්‍රී

ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් මහජන බැංකුව සමඟ සිදු කරන ලද ගනුදෙනුව සම්බන්ධයෙන් ගැටුමක් ඇති ගැනීමට කිසිදු උනන්දුවක් නොමැති ගනුදෙනුව සාමාන්‍ය කාර්යයක් ලෙස සිදු වේ.

4. විශ්වවිද්‍යාලය ගනුදෙනු සඳහා ප්‍රධාන වශයෙන් අරමුදල් සපයනු ලබන්නේ ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාරය විසිනි ලැබුණු අරමුදල් ප්‍රමාණය හා දරන ලද වියදම් මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇත..

අනෙකුත් රජයේ සංවිධාන සමඟ සිදු කරන ලද ගනුදෙනු සීමිත දුරකින් සිදු වූ අතර විශ්වවිද්‍යාලය සමඟ සෘජු හෝ වක්‍ර පක්ෂපාතීත්වයක් නොතිබුනි.

අයවැය සකස් කරනු ලබන්නේ මහා භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන මත පදනම්වයි. .

**සටහන 29**

**මූල්‍ය ප්‍රකාශන වල අයවැය තොරතුරු ඉදිරිපත් කිරීම.**

අයවැය හා සත්‍ය පිරිවැය අතර සංසදානත්මක ප්‍රකාශය පහත පරිදි වේ. .

**අයවැය හා සත්‍ය තොරතුරු සංසන්දන ප්‍රකාශය**
**2024/12/31 අවසන් වසර සඳහා**

| 2024/12/31 අවසන් වසර සඳහා | අයවැය (රු.) | සත්‍ය වියදම් (රු.) | ලඟාවීම් (%) |
|---|---|---|---|
| **මෙහෙයුම් වියදම්** | | | |
| පුද්ගල වැටුප් | 5,962,925,000 | 5,788,393,246 | 97.07% |
| ගමන් | 24,200,000 | 21,428,347 | 88.55% |
| සැපයීම් සහ පරිබෝජන ද්‍රව්‍ය | 173,750,000 | 147,270,358 | 84.76% |
| නඩත්තු | 74,125,000 | 58,157,000 | 78.46% |
| කොන්ත්‍රාත් සේවා | 876,000,000 | 855,400,641 | 97.65% |
| වෙනත් මෙහෙයුම් වියදම් | 491,800,000 | 422,880,870 | 85.99% |
| **ක්ෂය ගණනයට පෙර මුළු මෙහෙයුම් වියදම්** | **7,602,800,000** | **7,293,530,462** | **95.93%** |

මහා භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන මත පදනම්ව අයවැය සකස් කෙරේ.

**සටහන 30**

**අනෙකුත් හෙළිදරව් කිරීම්**

1. දේපළ, පිරියත හා උපකරණ සඳහා වන ගැලපීම්.

පිටිපන පිහිටි රුපියල් මිලියන 960 වටිනා මාහේනවත්ත ඉඩම, ඉඩමේ භාවිතය සැලකිල්ලට ගනිමින් ප්‍රාග්ධනීකරණය කර ඇතත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අරමුදල් වෙනකර නොමැති බැවින් ඉඩමේ වටිනාකම නාගරික සංවර්ධන අධිකාරියට ලබා දී නොමැත. මෙම අත්පත් කර ගැනීම 2016

වර්ෂයට පෙර සිදු වී ඇති බැවින්, 2023 දී දේපළ, පිරියත හා උපකරණ සහ සම්මුචිත අරමුදලේ - ප්‍රාග්ධන ආරම්භක ශේෂයන් සකස් කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස 2023/12/31 දිනට මූල්‍ය ප්‍රකාශන වල නැවත ඉදිරිපත් කර ඇත.

ඉඩම් ( 01.01.2023 දිනට)

| | |
|---|---|
| දිනට ශේෂය (රු.) | 7,014,400,000 |
| පෙර වසර ගැලපුම් | 960,000,000 |
| ගලපන ලද ශේෂය | 7,974,400,000 |

සම්මුචිත අරමුදල – ප්‍රාග්ධන (දිනට 01.01.2023)

| | |
|---|---|
| දිනට ශේෂය (රු.) | 13,683,213,055 |
| පෙර වසර ගැලපුම් | 960,000,000 |
| ගලපන ලද ශේෂය | 14,643,213,055 |

2. ඇස්තමේන්තු වෙනස්වීම හේතුවෙන් පසුගිය වසරවල පුස්තකාල පොත්වල ක්ෂයවීම් වලට වඩා රු27,627,060 ක මුදලක් ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති 03 අනුව 2024 දී සාමාන්‍ය සංචිත වල ඉදිරිය ගැලපුම් කර ඇත. .
3. 2024/12/31 දිනට සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම් වල ධාරණ වටිනාකම පහත පරිදි වේ,

| | |
|---|---|
| ජල සම්පාදන යෝජනා ක්‍රමය | 12,621,189 |
| විදුලිය | 1,145,981 |
| වෙන් කිරීම් සහ අභ්‍යන්තර අලංකරණ | 52,931,789 |
| නාම පුවරු සහ භූමි අලංකරණය | 19,081,468 |
| මෝටර් වාහන | 152,671,766 |

4. 2024 වර්ෂය තුල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ මහපොළ බාර අරමුදල විසින් සපයන ලද අරමුදල් වලින් විශ්වවිද්‍යාල සිසුන් සඳහා මහපොළ ශිෂ්‍යත්වය ලෙස රුපියල් මිලියන 223 ගෙවා ඇත. විශ්වවිද්‍යාලය විසින් නිර්දේශ කරන ලද මුදල් ප්‍රමාණයන් මත පදනම්ව ගෙවීම් ඍජුවම සිසුන්ට ලබා දෙන ලදී.2024/12/31 අවසන් වසර සඳහා මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයෙහි එය ආවරණය කර නොමැත.

5. ආසියානු සංවර්ධන බැංකුව (ADB) අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඉංජිනේරු පීඨය සඳහා ගොඩනැගිලි

සංකීර්ණය සහ උපකරණ ඉදිකිරීම සඳහා ඩොලර් මිලියන 35 ක (ආසන්න වශයෙන් රු. බිලියන 06) ප්‍රදානයක් අනුමත කර ඇත. ඉංජිනේරු පීඨය සඳහා ගොඩනැගිලි හා යටිතල පහසුකම් සැලසුම් කිරීම සහ ඉදිකිරීම සඳහා වන ගිවිසුමක් 2021 වර්ෂයේ ජනවාරි මාසයේ "සන්කෙන් කන්සල්ටන්ට් (පුද්) සමාගම" සමඟ අත්සන් කර එය ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදල් මත විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයට ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 3625 ක (වැට් බද්දකින් තොරව )වටිනාකමකින් යුතු මුළු අරමුදලේ වටිනාකම රුපියල් 5,807,999,664.50 ක් ලෙසද පහත වටිනාකම් 2024 වර්ෂයේ හඳුනා ගන්නා ලදී.

| අයිතමය | මුළු එකතුව (රු.) |
|---|---|
| වත්කම් (ගෘහ භාණ්ඩ/උපකරණ) | 503,248,770 |
| වෘත්තීය මාර්ගෝපදේශ වියදම් | 30,000 |
| ව්‍යාපෘති කළමණාකරණ උපදේශන - ගොඩනැගිලි | 23,832,620 |
| කෙරී ගෙන යන වැඩ -ගොඩනැගිලි | 2,751,029,885 |
| සම්පත් දායකත්වයන් හා අනෙකුත් ව්‍යාපෘති වියදම් | 10,679,345 |
| කෙටි කාලීන පුහුණු | 8,513,258 |
| තරගකාරී පර්යේෂණ ප්‍රදාන | 21,780,723 |
| **මුළු එකතුව** | **3,319,114,601** |

6. STHRD ව්‍යාපෘතිය යටතේ 2024 මිල දී ගත් රු. 10,257,077ක් වටිනා රසායනාගාර සහ ඉගැන්වීමේ උපකරණ භාවිතය නොමැති බැවින් ඒවා ක්ෂය වී නොමැත .

7. විශ්වවිද්‍යාලයේ උසස් අධ්‍යාපන පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ ක්‍රියාත්මක වන උසස් අධ්‍යාපන ව්‍යාපෘති සංවර්ධනය හා වේගවත් කිරීම යන (AHEAD) ව්‍යාපෘතිය යටතේ විශ්වවිද්‍යාලයට ලෝක බැංකු ප්‍රදානයක් ලැබී ඇත. 2018 සිට 2024 දක්වා පහත සඳහන් ක්ෂේත්‍ර වැඩිදියුණු කිරීම සඳහා රු. 2,322,485,093.19 ක ලෝක බැංකු ප්‍රදානයක් ලැබී ඇත.

**ක්ෂේත්‍ර 01** - ආර්ථික සංවර්ධනය සඳහා ප්‍රමුඛතා විෂයන් යටතේ උසස් අධ්‍යාපනයට ඇතුළත් කර ගැනීම වැඩි කිරීම.

**ක්ෂේත්‍ර 02** - ඉගෙනීම, ඉගැන්වීම සහ එම කටයුතු සංවර්ධනය කිරීම සඳහා ඉංග්‍රීසි භාෂා කුසලතා වැඩි දියුණු කිරීම සහ මානව සම්පත් සංවර්ධනය.

**ක්ෂේත්‍ර 03** - පර්යේෂණ, සංවර්ධන, නවෝත්පාදන සහ වාණිජකරණය ප්‍රවර්ධනය

විවිධ ව්‍යාපෘති සඳහා ප්‍රදානයන් ලැබුණු අතර එම ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන වල හඳුනා ගෙන ඇත. .

8. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අයත් කළුබෝවිල පිහිටි රුපියල් මිලියන 347 ක් වටිනා ඉඩම හා ගොඩනැගිල්ල සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය විසින් භාවිතා කරන ලදී සෞන්දර්ය

විශ්වවිද්‍යාලයෙන් එම දේපල ආපසු ලබා ගැනීමට විශ්වවිද්‍යාලය විසින් පියවර ගන්නා ලද අතර ශේෂ පත්‍ර දිනය වන විට ප්‍රතිසංස්කරණ කටයුතු සිදු වන යන අතර එය කෙරී ගෙන වැඩ යටතේ පෙන්වා ඇත.

9. නුගේගොඩ සහ ගංගොඩවිල සෝරත මාවත පිහිටි හේමවිමන ඉඩම රුපියල් මිලියන 110 ක වටිනාකමකින් යුක්ත වන අතර, එය මහරගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ තැන්පත් කර ඇති රුපියල් මිලියන 100 ක අත්තිකාරම් මුදලක් සමඟ ප්‍රාග්ධනීකරනය කර ඇත ඉතිරි මුදල වාර්තා කරන දිනට ගෙවිය යුතු ලෙස ගිණුම් ගත කර ඇත නමුත් බේරුම්කරණය තවමත් සිදු වෙමින් පවතින බැවින් පොලිය ඇතුළුව සම්පූර්ණ ඉඩමේ වටිනාකම හෙළි කර නොමැත.

10. නාගරික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ජාත්‍යන්තර මට්ටමේ සම්මන්ත්‍රණ ශාලාවක්, ව්‍යායාම ශාලාවක්, ව්‍යායාම ශාලාවක් සහ පිහිනුම් තටාකයක් සහිත ක්‍රීඩාංගණයක් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 618 ක ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා 2014 පෙබරවාරි 13 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී. උපදේශන ගාස්තු සහ සැලසුම් සකස් කිරීම සඳහා මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයට (CECB) 2016 වර්ෂයේ දී රු. 5,794,696.00 ක ගෙවීමක් සිදු කර ඇත. ව්‍යාපෘතියට අයවැය ප්‍රතිපාදන ලැබී නොමැති අතර ආරම්භ කිරීමට නොහැකි විය. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අයවැය ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාලය අඛණ්ඩ පසු විපරමක් සිදු කරන ඇති ගෙවන ලද වටිනාකම ක්‍රියාකාරී කාර්යයන් ලෙස දැක්වේ.

11. 2024/12/31 දින ශ්‍රේෂ පත්‍ර දිනය දක්වා විශ්වවිද්‍යාලය විසින් රසායන ද්‍රව්‍ය  සහ වීදුරු භාණ්ඩ තොග සමීක්ෂණය සිදු කරනු ලබන අතර තොග වටිනාකම 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලට අනුව සකස් කර ඇත. .

12. ඉන්වෙන්ටරි භාණ්ඩ අතර දිගුකාලීනව භාවිතයට නොගෙන ඇති භාණ්ඩ සඳහා 2024 වසරේදී වෙන්කිරීමක් සිදු කරන ලදී.

13. ප්‍රධාන මූල්‍ය අංශය හා වෛද්‍ය විද්‍යා පීඨය හරහා පවත්වා ගෙන යනු ලැබූ ඇමරිකානු ඩොලර් ස්ථාවර තැන්පතු සහ ඩොලර් ජංගම ගිණුම්වලට අදාළ ඇතිවූ විනිමය හානිය රු. මිලියන 34 ක් වන අතර. වාර්තා කිරීමේ දිනයේදී ස්ථානික විනිමය අනුපාතය වන 297.016 (USD/LKR) අනුව ඇමරිකානු ඩොලර් ජංගම ගිණුම් සහ ස්ථාවර තැන්පතු මුදල් වෙත පරිවර්තනය කර ඇත.

14. විශ්වවිද්‍යාලය යගිරල ප්‍රදේශයේ වනාන්තර ක්ෂේත්‍ර පර්යේෂණ මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කරයි. එම භූමි භාවිතය ශ්‍රී ලංකා වන හා පාරිසරික විද්‍යා දෙපාර්තමේන්තුවට අයත් වන අතර, පර්යේෂණ කටයුතු සඳහා වියදම් වූ සියලුම පිරිවැය විශ්වවිද්‍යාලය විසින් භාරගෙන ඇත.

15. විශ්වවිද්‍යාලයට අයත් දේපළ සම්බන්ධව පහත සිදුවීම් දෙක වාර්තා වී ඇති අතර, එහි දී පහත පරිදි ක්‍රියාමාර්ග ගෙන ඇත.

a) 2024 අගෝස්තු මාසයේදී ආපනශාලාවේ (කලේ කඩේ IV) විදුලි කම්බි සහ අමතර උපකරණ සොරකම් කර ඇති බව වැඩබලන ඉංජිනේරු නිලධාරියා විසින් අනාවරණය කර විශ්වවිද්‍යාල පරිපාලනය වෙත වාර්තා කරන ලදී. ඉතිරි වී ඇති විදුලි කම්බි සහ උපකරණ සම්බන්ධව වැඩබලන ඉංජිනේරු නිලධාරියා ලබාදුන් වියදම් ඇස්තමේන්තුව ඇගයීම අනුව මූල්‍ය බලපෑම වාර්තා කිරීමේ දිනය වන විට ගිණුම්ගත කර ඇත. කාර්ය සාධන බැඳුම්කර මඟින් මුදල් ලබා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, ආරක්ෂක බිල්පත් වලින් එම හානිය ආවරණය කර ගැනීම සඳහා වෙන්කිරීම්ද සිදු කර ඇත.

b) 2025 ජනවාරි මාසයේදී අසාත්මිකතා ප්‍රතිශක්තිකරණ හා සෛල ජීව විද්‍යා ඒකකයේ (AICBU) දෛනික මුදල් එකතු තැන්පතු කිරීමේදී අක්‍රමිකතාවක් වාර්තා වී ඇති අතර, ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් දැනට ක්‍රියාවලියෙහි පවතී. පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව මූල්‍ය බලපෑම ගිණුම් ගත කරනු ලැබේ.

16. විශ්වවිද්‍යාලය රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත අංක 44 වැනි 2024 පනත් මඟින් ත්‍යාග හා ශිෂ්‍යත්ව අරමුදල්, බාහිර පර්යේෂණ අරමුදල්, වෛද්‍ය රක්ෂණ අරමුදල් ආදිය පවත්වාගෙන යයි.

17. සෙලාන් බැංකුව සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව සඳහා ස්වයංක්‍රීය මුදල් ආපසු ගැනීමේ යන්ත්‍ර (ATM) දෙකක් ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය ඉඩකඩ සපයා ඇති අතර ඒ වෙනුවෙන් විශ්වවිද්‍යාලය නිසි ඇගයීමකින් ඒ වෙනුවෙන් කුලි ආදායම් ලබා ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇත., ඒ අනුව 2024 වසර සඳහා ලැබිය යුතු කුලී ආදායම සම්බන්ධව කිසිදු වෙන්කිරීමක් (provision) සිදු කර නැත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. HED/D/USJ/FA/24/04 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2025 අගෝස්තු 25 දින

උපකුලපති,

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

සහතික කරන ලද ගිණුම සහ යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.ජී.ඒ. ෆොන්සේකා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් :- 01. ලේකම් - අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
02. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
03. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

මගේ අංකය / எனது இல. / My No. HED/D/USJ/FA/24/04 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2025 අගෝස්තු 25 දින

උපකුලපති,

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා සමන්විත, 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.3 විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන විශ්වවිද්‍යාලයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

විශ්වවිද්‍යාලයේ 2024 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලයේ ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත්

3

නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලය සම්බන්ධ වී ඇති යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව යම් සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධිවිධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති / විධානයට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ IX පරිච්ඡේදයේ 3.1 වගන්තිය | සෑම උසස් අධ්‍යාපන ආයතනයකම සේවයේ නියුක්ත තැනැත්තෙක්ම පැමිණෙන වේලාව සහ පිටවන වේලාව පැමිණීමේ ලේඛණයක සටහන් කල යුතු වුවද, අධ්‍යයන කාර්යමණ්ඩලයේ පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය සඳහා රු.3448,606,465 ක වැටුප් හා දීමනා ගෙවීම් කර තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 571(2) මුදල් රෙගුලාසිය | වර්ෂ 03 ඉක්ම වූ එකතුව රු.1,301,438 ක් වූ ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු 62 ක් හා වර්ෂ 2 ඉක්මවූ වටිනාකම රු. 622,875 ක ටෙන්ඩර් තැන්පතු 31 ක් නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 1978 දෙසැම්බර් 19 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 842 | විශ්වවිද්‍යාලය විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. එහෙත් ස්ථාවර වත්කම් සඳහා වෙනම මෘදුකාංගයක් භාවිතා කර ඇති නමුත් එකී මෘදුකාංගය තුළ ඉවත් කළ වත්කම්වල පිරිවැය සමුච්චිත ක්ෂය, වර්ෂයේ ක්ෂය, ශුද්ධ පොත් අගය ආදී තොරතුරු ඇතුළත් වී නොතිබුණි. |
| (ඈ) | 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 ජාතික අයවැය චක්‍රලේඛයේ 03 (viii) | අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර නොමැති කිසිදු දීමනාවක්, සුභසාධන වැඩසටහන්, සංවර්ධන සහායන් හෝ සහනාධාර ලබාදීම් නතර කළ යුතු බවට සඳහන් කර ඇතත්, සමාලෝචිත වර්ෂය තුළ සේවක අභ්‍යන්තර රක්ෂණ ක්‍රමයක් සඳහා රු.38,228,040 ක් රක්ෂණ ආයතනයක් වෙත තිබුණි. |
| (ඉ) | 2015 මැයි 07 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ UGC/AC/AQ/Gen දරණ චක්‍රලේඛය | පීඨ 11 ක අධ්‍යනාංශ 95 ක උපාධි පාඨමාලා 126 ක් සඳහා දේශන ප්‍රතිමාන සැලැස්ම (lecture norms plan) වර්ෂාවසානය වන විටත් සකස් කර නොතිබුණි. |
| (ඊ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 7.1.4 හා 7.1.5ඡේද | පශ්චාත් උපාධි පාඨමාලා, පර්යේෂණ හා සංවර්ධන කටයුතු හා උපදේශක සේවා මඟින් ලබන ආදායමින් සියයට 20-35 අතර ප්‍රතිශතයක් විශ්වවිද්‍යාලයේ යටිතල |

පහසුකම් සංවර්ධන කටයුතු සඳහා වෙන් කළ හැකි අතර, එසේ වෙන් කරන ලද මුදල් පාර්ලිමේන්තුවේ අනුමත නීතියක් මගින් පිහිටුවා ඇති විශ්වවිද්‍යාල අරමුදල් වෙත පමණක් ප්‍රේෂණය කළ යුතු වුවත්, ව්‍යවස්ථාපිත නොවන අරමුදල් 117 ක් වෙත විධිමත් අනුමැතියකින් තොරව රු.980,460,355 ක මුදලක් ප්‍රවර්තන වර්ෂය තුළ බැර කර තිබුණි.

| | | |
|---|---|---|
| (උ) | 2023 ජනවාරි 18 දිනැති අංක BD/HRD/126/214/19/2023 දරන භාණ්ඩාගාර ලේකම්ගේ ලිපිය | ගිවිසුම් හා බැඳුම්කර කඩකිරීම වෙනුවෙන් අයකර ගනු ලබන මුදල් අයකර ගත් වහාම භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළදී අයකර ගත් මුදලින් ගුවන් ටිකට් වියදම් අඩුකර ශුද්ධ රු.125,321,671 ක මුදල භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඌ) | 2019 ජුලි 25 දිනැති අංක SC&PMU/Grant/19 හා 2020 අගෝස්තු 14 දිනැති අංක SC&PMU/Grant/20 දරන විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපි සහ 2020 ඔක්තෝබර් 02 දිනැති අංක ERD/AE/GEN/16 දිනැති මුදල් අමාත්‍යාංශ ලිපි | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුදැනුම හා එකඟතාවයකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී අවස්ථා 13කදී විදේශ පර්යේෂණ ප්‍රදාන ලෙස රු.185,118,451ක් ලැබී තිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යායේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව,

6

## 2.3 වෙනත් කරුණු

(අ) 2018 සිට 2020 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල කොන්ත්‍රාත් වැඩ 59 ක එකතුව රු.48,908,053 ක් වූ අතරැදවුම් මුදල්, අදාළ කොන්ත්‍රාත්වල වර්තමාන තත්ත්වය පරීක්ෂා කර නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) නිලධාරීන් 23 දෙනෙකු විසින් ලබාගෙන තිබූ එකතු වටිනාකම රු.1,851,567 ක් වූ ආපදා ණය, කාර්යයමණ්ඩල ණය හා වාහන ණය ශේෂ වසර 1 සිට වසර 6 දක්වා කාලයක් ගතවී ඇතත් එකී ණය ශේෂ අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) වර්ෂ 2 කට පෙර සිට ලැබී ඇති රු.22,146,926 ක් වූ පර්යේෂණ ප්‍රදාන අදාල අරමුණු වෙනුවෙන් උපයෝජනය නොකර නිෂ්කාර්යව පැවතුණි.

(ඈ) 2011 වර්ෂයේදී පෞද්ගලික ආයතනයක් වෙත ගෙවන ලද රු.1,764,013 ක්වූ ප්‍රාග්ධන අත්තිකාරම් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ආසියානු සංවර්ධන බැංකු (ADB) ණය යටතේ ක්‍රියාත්මක කර තිබූ විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය (STHRD) මගින් 2024 වර්ෂයේදී මිලදීගෙන තිබූ රු.10,257,078 ක් වටිනාකමැති රසායනාගාර හා ඉගැන්වීම් - උපකරණ (Lab & Teaching Equipment) වර්ෂාවසානය වන විටත් භාවිතයට ගෙන නොතිබුණි.

ජී.එච්.ඩී.ධර්මපාල
විගණකාධිපති (වැ.බ.)

7

# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

## UNIVERSITY OF SRI JAYEWARDENEPURA, SRI LANKA


දුරකථනය
Telephone } 2802695, 2802696
2803191, 2803192

ෆැක්ස්
Fax } 2801604

E. Mail } unisj@sjp ac.lk

නුගේගොඩ
ශ්‍රී ලංකාව
NUGEGODA
SRI LANKA.

තැපැල් පෙට්ටිය - 6 - නුගේගොඩ.
Post office box - 6 - Nugegoda.


මගේ අංකය
My Number }

ඔබේ අංකය
You're Number } HED/D/USJ/FA/24/04

2025.09.17

විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය,
306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල.

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

---

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ අංක HED/D/USJ/FA/24/04 හා 2025 අගෝස්තු 25 දිනැති මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපති වාර්තාව හා බැඳේ.

එහිදී යථෝක්ත වාර්තාවට අදාල පිළිතුරු මේ සමඟ ඉදිරිපත් කරමි.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එම්.එම්. පත්මලාල්
උපකුලපති

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එම්. එම්. පත්මලාල්
උපකුලපති
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

| නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණ | |
|---|---|---|
| (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතනන සංග්‍රහයේ IX පරිච්ඡේදයේ 3.1 වගන්තිය | සෑම උසස් අධ්‍යාපන ආයතනයකම සේවයේ නියුක්ත තැනැත්තෙක්ම පැමිණෙන වේලාව සහ පිටවන වේලාව පැමිණීමේ ලේඛණයක සටහන් කල යුතු වුවද අධ්‍යයන කාර්යමණ්ඩලයේ පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය සඳහා රු.3,448,606,465 ක වැටුප් හා දීමනා ගෙවීම් කර තිබුණි. | අධ්‍යයන කාර්යය මණ්ඩල පැමිණීම හා පිටවීම සටහන් නොකරන අතර මේ පිළිබඳ චක්‍රලේඛයක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නිකුත් කිරීමට අවශ්‍ය වේ. එසේ වුවත් වැටුප් සකස් කිරීමේදී සෑම අධ්‍යයන නිළධාරියෙකුම පිළිබඳ අංශ ප්‍රධාන සහතික කිරීමක් සේවයේ නිරත වීම පිළිබඳ ලබා ගන්නා අතර අදාළ තහවුරු කිරීමෙන් පසුව වැටුප් ගෙවා ඇත. |
| (ආ)ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්රෙගුලාසි සංග්‍රහයේ 571 (2) මුදල් රෙගුලාසිය | වර්ෂ 03 ඉක්ම වූ එකතුව රු.1,301,438 ක් වූ ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු 62 ක් හා වර්ෂ 2 ඉක්මවූ වටිනාකම රු. 622,875 ක ටෙන්ඩර් තැන්පතු 31 ක් නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | විශ්වවිද්‍යාලයේ ප්‍රතිපත්තිය අනුව වර්ෂ 03 ක් ඉක්ම වූ ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු ආදායමට හඳුනාගෙන ගිණුම්ගත කර ඇති අතර ඇතැම් තැන්පතු අදාල සේවා සැපයුම්කරුවන්ගේ ඉල්ලීම මත තවදුරටත් පවත්වා ගෙන යනු ලබයි. එවැනි තැන්පතු තවදුරටත් පවතින අතර සේවා අවසන් වීම මත ඉදිරියේ දී නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කරනු ඇත. |

| | | |
|---|---|---|
| (ඇ) 1978 දෙසැම්බර් 19 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 842 | විශ්වවිද්‍යාලය විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. එහෙත් ස්ථාවර වත්කම් සඳහා වෙනම මෘදුකාංගයක් භාවිතා කර ඇති නමුත් එකී මෘදුකාංගය තුළ ඉවත් කළ වත්කම්වල පිරිවැය සමුච්චිත ක්ෂය, වර්ෂයේ ක්ෂය, ශුද්ධ පොත් අගය ආදී තොරතුරු ඇතුළත් වී නොතිබුණි. | දැනට පවතින මෘදුකාංගයේ සියලුම තොරතුරු ඇතුලත් කල නොහැකි බැවින් නව මෘදුකාංගය යටතේ ඉදිරි වර්ෂවලදී සියලුම තොරතුරු යාවත්කාලීනව ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. එසේ වුවත් භාණ්ඩාගාර චක්‍රලේඛ 842 අනුව, සෑම අංශයක් තුලම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යනු ලැබේ. |
| (ඈ) 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 ජාතික අයවැය චක්‍රලේඛයේ 03 (viii) | අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර නොමැති කිසිදු දීමනාවක්, සුභසාධන වැඩසටහන්, සංවර්ධන සහායන් හෝ සහනාධාර ලබාදීම් නතර කළ යුතු බවට සඳහන් කර ඇතත්, සමාලෝචිත වර්ෂය තුළ සේවක අභ්‍යන්තර රක්ෂණ ක්‍රමයක් සඳහා රු. 38,228,040 ක් රක්ෂණ ආයතනයක් වෙත ගෙවා තිබුණි. | විශ්වවිද්‍යාල කාර්යය මණ්ඩලය සඳහා රජයේ කාර්යමණ්ඩලයට ලබාදෙන අග්‍රහාර රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක නොවන අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සේවක කාර්යය මණ්ඩලය සඳහා පාලක සභා අනුමැති යටතේ 2018 වසරේ ආරම්භ වූ රක්ෂණ ආවරණ ක්‍රමයක් ක්‍රියාත්මක වේ. මෙම රක්ෂණ ක්‍රමය නව රක්ෂණ ක්‍රමයක් නොවන අතර පෙර වර්ෂයන්හි සිට ක්‍රියාත්මක වී තවදුරටත් පවතී. මෙය විශ්වවිද්‍යාලය මඟින් මූලික රක්ෂණාවරණයක් පමණක් විශ්වවිද්‍යාලයෙහි උපයා ගත් අරමුදල් ආයෝජන පොලී මඟින් ගෙවීම් සිදුකරනු ලබයි. මෙය පොදු මූල්‍ය චක්‍රලේඛ 06/2019 හා විශ්විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් චක්‍රලේඛ 718 යටතේ ආරම්භ කර පවත්වාගෙන යනු ලබයි. මූලික රක්ෂණ ආවරණය ඉක්මවා ලබාගෙන ඇති සියලුම රක්ෂණ ආවරණ සඳහා කාර්යය මණ්ඩලය විසින් ගෙවීම් සිදු කරනු ලබයි. තවදුරටත් විගණන |

Page 2 of 8

| | | |
|---|---|---|
| | | නිර්දේශ පරිදි අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ඇත. |
| (ඉ) 2015 මැයි 07 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ UGC/AC/AQ/Gen දරණ චක්‍රලේඛය | පීය 11 ක අධ්‍යනාංශ 95 ක උපාධි පාඨමාලා 126 ක් සඳහා දේශන ප්‍රතිමාන සැලැස්ම (lecture norms plan) වර්ෂාවසානය වන විටත් සකස් කර නොතිබුණි. | විශ්වවිද්‍යාල පීය 11 හි අධ්‍යයන විෂයපථයන්හි ස්වාභාවයන් මත එක් දේශන ප්‍රතිමාන සැලැස්මක් සකස් කිරීම ප්‍රායෝගික දුෂ්කර කාර්යක් බැවින් පහත පරිදි අධ්‍යයන කාර්ය මණ්ඩලයේ අචාරධර්ම, අධ්‍යයන වගවීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය ප්‍රකාශන කිහිපයක් ඉදිරිපත් කර ඇත.<br>1. 2014 වර්ෂයේ සකස් කරන ලද මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යාපීඨයේ අචාර්යවරුන්ගේ දේශන ප්‍රතිමාන සැලැස්මක් ඇත. (lecture norms plan)<br>2. 2022 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන තත්ත්ව සහතිකකරන ඒකකය මඟින් විශ්වවිද්‍යාලය සඳහා සකස් කරන ලද අධ්‍යයන අචාරධර්ම, අධ්‍යයන වගවීම සම්බන්ධ ප්‍රතිපත්තිමය රාමුවක් ඇත.<br>3. විශ්වවිද්‍යාලය සඳහා කෙටුම්පත් කරමින් පවතින වැඩබර ප්‍රකාශන පත්‍රයක්ද (Workload Declaration Form) ඇත. |
| (ඊ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ 7.1.4 හා 7.1.5 ඡේද | පශ්චාත් උපාධි පාඨමාලා, පර්යේෂණ හා සංවර්ධන කටයුතු හා උපදේශක සේවා මඟින් ලබන ආදායමින් සියයට 20-35 අතර ප්‍රතිශතයක් විශ්වවිද්‍යාලයේ යටිතල පහසුකම් | විශ්වවිද්‍යාල පනතේ 99 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාල අරමුදල පවත්වා ගත හැකි අතර එය ව්‍යවස්ථාපිත අරමුදලක් වන අතර නිශ්චිත කාර්යන් මත ගිණුම් පවත්වා ගැනීමට බලය දී ඇත. විශ්වවිද්‍යාලයේ අනෙකුත් සියලුම අරමුදල් වැය ශීර්ෂ (votes) වන අතර විශ්වවිද්‍යාල අරමුදල යටතේ පවතී. මේ පිළිබඳව විශ්වවිද්‍යාල |

| | | |
|---|---|---|
| | සංවර්ධන කටයුතු සඳහා වෙන් කළ හැකි අතර, එසේ වෙන් කරන ලද මුදල් පාර්ලිමේන්තුවේ අනුමත නීතියක් මඟින් පිහිටුවා ඇති විශ්වවිද්‍යාල අරමුදල් වෙත පමණක් ප්‍රේෂණය කළ යුතු වුවත්, ව්‍යවස්ථාපිත නොවන අරමුදල් 117 ක් වෙත විධිමත් අනුමැතියකින් තොරව රු.980,460,355 ක මුදලක් ප්‍රවර්තන වර්ෂය තුළ බැර කර තිබුණි. | ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් මාර්ගෝපදේශ සැපයීමට කටයුතු කරමින් සිටින අතර මෙම අරමුදල් ව්‍යවස්ථාපිත අරමුදල් වන බැවින් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා ඇත. |
| (ඇ) 2023 ජනවාරි 18 දිනැති අංක BD/HRD/126/214/19/2023 දරන භාණ්ඩාගාර ලේකම්ගේ ලිපිය | ගිවිසුම් හා බැඳුම්කර කඩකිරීම වෙනුවෙන් අයකර ගනු ලබන මුදල් අයකර ගත් වහාම භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළදී අයකර ගත් මුදලින් ගුවන් ටිකට් වියදම් අඩුකර ශුද්ධ රු.125,321,671 ක මුදල භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර නොතිබුණි. | බැඳුම්කර අරමුදල් උපයෝජනය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 737 අනුව<br>1. කෙටිකාලීන පුහුණු වැඩ සටහන්/ වැඩමුළු<br>2. සමුළුවක දී පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කර ගැනීම සඳහා<br>3. පර්යේෂණ සිදු කිරීමට සහ පර්යේෂණ ප්‍රසිද්ධ කිරීම සඳහා<br>4. මෙරට දී සමුළුවක්, සම්මන්ත්‍රණයක්, වැඩමුළුවක් සංවිධානය කිරීම වෙනුවෙන්, කටයුතු කරයි.<br>තවද උසස් අධ්‍යාපන අමාත්‍යංශයෙහි අංක HE/UD/01/Letter-01 දරණ 2023.04.20 දිනැති ලිපියෙහි උපදෙස් පරිදි බැඳුම්කර අරමුදල් අගයන්, කාර්යමණ්ඩලයේ සජත වාර්ෂික නිවාඩු ගුවන් ටිකට්පත් ලබාගැනීමේ වියදම් ලබාගැනීමට උපදෙස් දී ඇති අතර රඳවා ගත |

| | | |
|---|---|---|
| | | යුතු මුදල ගණනය කිරීමද ප්‍රායෝගිකව අපහසු කරුණක් වන නමුත් සප්තවාර්ෂික නිවාඩු ගුවන් ටිකට්පත් සඳහා වැය කිරීමට අපේක්ෂිත ඇස්තමේන්තු මුදල ගණනය කිරීම සඳහා අධ්‍යයන ආයතනය අංශය දැනුවත් කර ඇති අතර එම ඇස්තමේන්තුව අනුව අපේක්ෂිත වියදම් මුදල රඳවාගැනීමෙන් පසු අතිරික්ත මුදල් මහා භාණ්ඩාගාරය වෙත යොමු කිරීමට කටයුතු කරනු ඇත. |
| (ඌ) 2019 ජූලි 25 දිනැති අංක SC&PMU/Grant/19 හා 2020 අගෝස්තු 14 දිනැති අංක SC&PMU/Grant/20 දරන විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපි සහ 2020 ඔක්තෝබර් 02 දිනැති අංක ERD/AE/GEN/16 දිනැති මුදල් අමාත්‍යාංශ ලිපි | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුදැනුම හා එකඟතාවයකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී අවස්ථා 13 කදී විදේශ පර්යේෂණ ප්‍රදාන ලෙස රු.185,118,451 ක් ලැබී තිබුණි. | 2024 වසරේ සිට අවශ්‍ය අනුමැතීන් මහා භාණ්ඩාගාරයෙන් ලබා ගැනීමට කටයුතු කර ඇත. තවදුරටත් මේ පිළිබඳ අවශ්‍ය අනුමැතීන් ලබාගැනීමට කටයුතු සිදු කරනු ලබන අතර සාපේක්ෂව අඩු වටිනාකමකින් යුතු පර්යේෂණ ප්‍රදාන සඳහා අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීම පිළිබඳ ව සුදුසු තීරණයක් ලබා දෙන මෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට යොමු කිරීමට කටයුතු කරනු ඇත. |
| **2.3 වෙනත් කරුණු** | | |
| (අ) 2018 සිට 2020 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල කොන්ත්‍රාත් වැඩ 59 ක එකතුව රු. 48,908,053 ක් වූ අතුරුදවුම් මුදල්, අදාළ කොන්ත්‍රාත්වල වර්තමාන තත්ත්වය පරීක්ෂා කර නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | | විශ්වවිද්‍යාල විගණන කමිටුවේ නිර්දේශය මත 2017 වසර වනතෙක් රඳවාගෙන තිබූ මුදල් ආදායමට ගෙන ඇත.දැනට පවතින රඳවාගත් මුදල් වාර්ෂිකව පරීක්ෂා කර බලා ආදායමට ගැනීම නිශ්චය කිරීම මත ගිණුම්වලට ගලපනු ලැබේ. |

Page 5 of 8

| | |
|---|---|
| (ආ) නිලධාරින් 23 දෙනෙකු විසින් ලබාගෙන තිබූ එකතු වටිනාකම රු.1,851,567 ක් වූ ආපදා ණය, කාර්යයමණ්ඩල ණය හා වාහන ණය ශේෂ වසර 1 සිට වසර 6 දක්වා කාලයක් ගතවී ඇතත් එකී ණය ශේෂ අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | <u>ආපදා ණය</u><br>1. නිලධාරින් 14 දෙනෙකු සේවයෙන් ඉවත් වුවද ඔවුන්ගේ අර්ථ සාධක අරමුදල් නිදහස් කර නොමැති අතර අර්ථසාධන අරමුදල් නිදහස් කරන අවස්ථාවේදී එකතු වටිනාකම රු 1,379,886/66 ක් වූ ආපදා ණය මුදල අය කර ගැනීමට කටයුතු කරනු ඇත.<br>2. නිලධාරින් 5 දෙනෙකු 2025.08.31 දින වන විටත් රු. 377,910/- ක් වූ ආපදා ණය මුදල ගෙවා අවසන් කර ඇත.<br>3. එක් නිලධාරි මහතෙක් මේ වන විට මිය ගොස් ඇති අතර ඔහු විසින් ගෙවීමට ඇති රු 46,860/- ක මුදල කපා හැරීමට කටයුතු කරමින් සිටියි.<br><u>සේවක ණය</u><br>1. එක් සේවක මහතා ලබාගත් රු 2,210/- සේවක ණය මුදල ගෙවා අවසන් කර ඇත.<br>2. අනෙක් සේවක මහතා ලබාගත් රු 1,920/- සේවක ණය මුදලක් ඔහුගේ අර්ථසාධක අරමුදල නිදහස් කරන අස්ථාවේදී අය කර ගැනීමට කටයුතු කරනු ඇත. |

| | |
|---|---|
| | <u>වාහන ණය</u><br>1. නිලධාරීන් දෙදෙනෙකුගේ රු 42,780/- වාහන ණය මුදල ඔවුන් දෙදෙනා මේ වන විටත් සේවයෙන් ඉවත් වී ඇති නමුත් අර්ථසාධක නිදහස් කර නොමැති බැවින් අර්ථසාධක අරමුදල නිදහස් කරන අවස්ථාවේදී අය කර ගැනීමට කටයුතු කරනු ඇත. |
| (ඇ) වර්ෂ 2 කට පෙර සිට ලැබී ඇති රු.22,146,926 ක් වූ පර්යේෂණ ප්‍රදාන අදාළ අරමුණු වෙනුවෙන් උපයෝජනය නොකර නිෂ්කාර්යව පැවතුණි. | මෙම පර්යේෂණ ප්‍රදාන ලබා දීමේ දී නිශ්චිත කාලයක් හා අරමුණු ලබා දේ.ඒ අනුව පර්යේෂණ ක්‍රියාත්මක වන අතර ඒ මත මුදල් උපයෝජනය කරනු ලබයි. එසේම වසර 3 ක් ඌන උපයෝජනය වී ඇති පර්යේෂණ ප්‍රදාන පොදු පර්යේෂණ ගිණුමකට මාරු කර වසර 3 කින් අදායමට ගැනීමට කටයුතු කරනු ඇත. |
| (ඈ) 2011 වර්ෂයේදී පෞද්ගලික ආයතනයක් වෙත ගෙවන ලද රු.1,764,013 ක්වූ ප්‍රාග්ධන අත්තිකාරම් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ සමාගම් අධ්‍යක්ෂකවරු සහ ලේකම්වරු විත්තිකරුවන් ලෙස ඇතුලත් කරමින් නුගේගොඩ දිසා අධිකරණය මඟින් එම 2949/18 හා එම 2950/18 යන නඩු 2024.05.22 හා 2024.05.02 යන දිනයන් වල සිතාසි නිකුත් කර ඇති අතර අදාල පුද්ගලයන් එම ස්ථානවල නොමැතිකම හේතුවෙන් නුගේගොඩ දිසා අධිකරණය මඟින් එම නඩුව බහාතබා ඇත.<br><br>තවද 2025.04.24 දිනැති ලිපිය මඟින් මෙම නඩු සම්බන්ධව කඩිනම් උපදෙස් ලබා දෙන මෙන් නීතිපති දෙපාර්තමේන්තුව වෙත විශ්වවිද්‍යාලය විසින් දන්වා ඇති අතර එම ලිපියට ප්‍රතිචාර ලෙස 2025.05.30 දින නීතිපති දෙපාර්තමේන්තුව සමඟ පැවති |

Page 7 of 8

| | |
|---|---|
| | සාකච්ඡාවේදී මෙම සමාගම වාර්ෂික වාර්තා සමාගම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය වෙත ලබාදී යාවත්කාලීක කිරීම සිදුවී ඇතිද යන්න පරීක්ෂාකර දන්වන ලෙස කරන ලද ඉල්ලීමට අනුව සමාගම්මැදුරේ එම සමාගමට අයත් ලිපිගොනුව පරීක්ෂා කල අතර වාර්ෂික වාර්තා ලබා දීමක් සිදු වී නොමැති අතර ලිපිනයන් පෙර පරිදිම වූ බවට නීතිපති දෙපාර්තමේන්තුවට අදාල සහතිකකල පිටපත් සමඟ යොමු කරන ලදී. |
| (ඉ) ආසියානු සංවර්ධන බැංකු (ADB) ණය යටතේ ක්‍රියාත්මක කර තිබූ විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය (STHRD) මගින් 2024 වර්ෂයේ මිලදීගෙන තිබූ රු.10,257,078 ක් වටිනාකමැති රසායනාගාර හා ඉගැන්වීම් - උපකරණ (Lab & Teaching Equipment) වර්ෂාවසානය වන විටත් භාවිතයට ගෙන නොතිබුණි. | ඉංජිනේරු පීඨයේ නව ගොඩනැගිලි ඉදිකිරීම්වල සිදු වූ කොන්ත්‍රාත් ප්‍රමාදයන් නිසා මිල දී ගත් මෙම උපකරණ සවිකිරීම වර්ෂය අවසාන වන විට ප්‍රමාද වී තිබුණි. කෙසේ වෙතත් නව ගොඩනැගිලි ඉදිකිරීම මේ වන විට අවසන්ව ඇති නිසා සියලුම උපකරණ නව පරිශ්‍රය වෙත ගෙන ගොස් සවිකර ඇත. |
| (අත්සන)<br>ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එම්.එම්. පත්මලාල්<br>උපකුලපති<br><br>ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එම්. එම්. පත්මලාල්<br>උපකුලපති<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්ව... | |

Page 8 of 8